330 වන කාණ්ඩය - 06 වන කලාපය
தொகுதி 330 - இல. 06
Volume 330 - No. 06

2026 ඔක්තෝබර් 21වන බදාදා
2026 ஒக்ரோபர் 21, புதன்கிழமை
Wednesday, 21st October, 2025



පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES
(HANSARD)

නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:

ශ්‍රී ලංකා ක්‍රිකට් පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් [තිරුව 1005]

ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් [තිරුව 1005]

ආගමන පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් [තිරුව 1006]

නව සමූහ රක්ෂණය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන [තිරුව 1006]

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව [තිරුව 1008]

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා [තිරුව 1008]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තිරු 1010-1042]

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:

නීතිවිරෝධී මත්පැන් භාවිතය පාලනය කිරීම [තිරුව 1042]

ත්‍රස්තවාදය ප්‍රවර්ධනය කරන ක්‍රියාකාරකම්වලට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම [තිරුව 1047]

යුද සමයේ උතුරු සහ නැඟෙනහිර සිදු වූ අතුරුදහන්වීම් සහ ඝාතන පිළිබඳ විමර්ශනවල ප්‍රගතිය:

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තිරුව 1055]

මුස්ලිම් නම්වලින් ව්‍යාජ සමාජ මාධ්‍ය ගිණුම් නිර්මාණය කරමින් ජාතිවාදී අදහස් පැතිරවීම:

මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය [තිරුව 1059]

භාර (සංශෝධන) පනත් කෙටුම්පත:

පළමුවන වර කියවන ලදී [තිරුව 1061]

රාජ්‍ය ණය කළමනාකරණ පනත:

යෝජනාව [තිරු 1062-1167]

පරිපූරක මුදල:

ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සවිබලගැන්වීම සඳහා ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම [තිරුව 1167]

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය:

වාර්ෂික වාර්තාව (2021) [තිරුව 1168]

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය:

වාර්ෂික වාර්තාව (2022) [තිරුව 1168]

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය:

වාර්ෂික වාර්තාව (2023) [තිරුව 1169]

බී සී සී ලංකා ලිමිටඩ් සමාගම:

වාර්ෂික වාර්තාව (2021/2022) [තිරුව 1169]

බී සී සී ලංකා ලිමිටඩ් සමාගම:

වාර්ෂික වාර්තාව (2022/2023) [තිරුව 1170]

ජාතික ලුණු සමාගම:

වාර්ෂික වාර්තාව සහ ගිණුම් (2021/2022) [තිරුව 1170]

ජාතික ලුණු සමාගම:

වාර්ෂික වාර්තාව සහ ගිණුම් (2022/2023) [තිරුව 1171]

ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය:

වාර්ෂික වාර්තාව (2022) [තිරුව 1171]

ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය:

වාර්ෂික වාර්තාව (2023) [තිරුව 1172]

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය:

වාර්ෂික වාර්තාව (2023) [තිරුව 1172]

කල්තැබීමේ ප්‍රශ්න [තිරු 1173-1181]

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු [තිරු 1181-1196]

பிரதான உள்ளடக்கம்

அறிவிப்புகள்:

இலங்கைக் கிரிக்கெட் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள் [ப: 1005]

பயங்கரவாதத்திலிருந்து அரசைப் பாதுகாப்பதற்கான சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள் [ப: 1005]

குடிவரவு சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு [ப: 1006]

புதிய குழுக் காப்புறுதித் திட்டம் குறித்து கௌரவ உறுப்பினர்களுக்கு அறிவுறுத்தும் நிகழ்ச்சி [ப: 1006]

அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை [ப: 1008]

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள் [ப: 1008]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப: 1010-1042]

தனி அறிவித்தல் மூல வினா:

சட்டவிரோத மதுபான நுகர்வைக் கட்டுப்படுத்தல் [ப: 1042]

பயங்கரவாதத்தை ஊக்குவிக்கும் செயற்பாடுகளுக்கு எதிராக சட்டத்தை அமுல்படுத்தல் [ப: 1047]

யுத்தத்தின்போது வடக்கு மற்றும் கிழக்கில் காணாமல் போனோர் மற்றும் கொலைகள் குறித்த விசாரணைகளின் முன்னேற்றம்:

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரினது கூற்று [ப: 1055]

சமூக வலைத்தளங்களில் முஸ்லிம் பெயர்களில் போலி கணக்குகளை உருவாக்கி இனவாதக் கருத்துகளைப் பரப்புதல்:

பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரினது கூற்று [ப: 1059]

நம்பிக்கைப் பொறுப்புக்கள் (திருத்தம்) சட்டமூலம்:

முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 1061]

பொதுத் தனிசு முகாமைத்துவச் சட்டம்:

பிரேரணை [ப: 1062 - 1167]

குறைநிரப்புத் தொகை:

நுண், சிறிய மற்றும் நடுத்தர அளவிலான தொழில்முயற்சித் துறையை வலுவூட்டுவதற்கு கடன் திட்டங்களைச் செயல்படுத்துதல் [ப: 1167]

இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சபை:

வருடாந்த அறிக்கை (2021) [ப: 1168]

இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சபை:

வருடாந்த அறிக்கை (2022) [ப: 1168]

இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சபை:

வருடாந்த அறிக்கை (2023) [ப: 1169]

பீ.சீ.சீ. லங்கா லிமிட்டட் கம்பனி:

வருடாந்த அறிக்கை (2021/2022) [ப: 1169]

பீ.சீ.சீ. லங்கா லிமிட்டட் கம்பனி:

வருடாந்த அறிக்கை (2022/2023) [ப: 1170]

தேசிய உப்பு நிறுவனம்:

வருடாந்த அறிக்கையும் கணக்குகளும் (2021/2022) [ப: 1170]

தேசிய உப்பு நிறுவனம்:

வருடாந்த அறிக்கையும் கணக்குகளும் (2022/2023) [ப: 1171]

தேசிய இரத்தினக்கல் மற்றும் ஆபரண அதிகாரசபை:

வருடாந்த அறிக்கை (2022) [ப: 1171]

தேசிய இரத்தினக்கல் மற்றும் ஆபரண அதிகாரசபை:

வருடாந்த அறிக்கை (2023) [ப: 1172]

இரத்தினக்கல் மற்றும் ஆபரண ஆராய்ச்சி மற்றும் பயிற்சி நிறுவகம்:

வருடாந்த அறிக்கை (2023) [ப: 1172]

ஒத்திவைப்பு வினாக்கள் [ப: 1173-1181]

வினாக்களுக்கு எழுத்துமூல விடைகள் [ப: 1181-1196]

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
- Sri Lanka Cricket Bill: Petitions to the Supreme Court [Col. 1005]
- Protection of the State from Terrorism Bill: Petitions to the Supreme Court [Col. 1005]
- Immigration Bill: Petition to the Supreme Court [Col. 1006]
- Awareness Programme on New Group Insurance Scheme [Col. 1006]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 1008]

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS [Col. 1008]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 1010-1042]

QUESTION BY PRIVATE NOTICE:
- Control of Consumption of Illicit Liquor [Col. 1042]
- Enforcement of Law against Activities Propagating Terrorism [Col. 1047]

PROGRESS OF INVESTIGATIONS INTO DISAPPEARANCES AND KILLINGS IN NORTH AND EAST DURING WAR:
- Statement by Minister of Public Security and Parliamentary Affairs [Col. 1055]

SPREAD OF COMMUNAL HATRED CREATING FAKE SOCIAL MEDIA ACCOUNTS USING MUSLIM NAMES:
- Statement by Minister of Public Security and Parliamentary Affairs [Col. 1059]

TRUSTS (AMENDMENT) BILL:
- Read the First time [Col. 1061]

PUBLIC DEBT MANAGEMENT ACT:
- Resolution [Cols. 1062-1167]

SUPPLEMENTARY SUM:
- Implementation of Loan Schemes to Empower Micro, Small and Medium Enterprises [Col. 1167]

SRI LANKA EXPORT DEVELOPMENT BOARD:
- Annual Report (2021) [Col. 1168]

SRI LANKA EXPORT DEVELOPMENT BOARD:
- Annual Report (2022) [Col. 1168]

SRI LANKA EXPORT DEVELOPMENT BOARD:
- Annual Report (2023) [Col. 1169]

BCC LANKA LIMITED:
- Annual Report (2021/2022) [Col. 1169]

BCC LANKA LIMITED:
- Annual Report (2022/2023) [Col. 1170]

NATIONAL SALT LIMITED:
- Annual Report and Accounts (2021/2022) [Col. 1170]

NATIONAL SALT LIMITED:
- Annual Report and Accounts (2022/2023) [Col. 1171]

NATIONAL GEM AND JEWELLERY AUTHORITY:
- Annual Report (2022) [Col. 1171]

NATIONAL GEM AND JEWELLERY AUTHORITY:
- Annual Report (2023) [Col. 1172]

GEM AND JEWELLERY RESEARCH AND TRAINING INSTITUTE:
- Annual Report (2023) [Col. 1172]

ADJOURNMENT QUESTIONS [Cols. 1173-1181]

WRITTEN ANSWERS TO QUESTIONS [Cols. 1181-1196]

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2026 ඔක්තෝබර් 21වන බදාදා
2026 ඔක්ටோபர் 21, புதன்கிழமை
Wednesday, 21st October, 2026

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.

පාරාළුමන්ற්ம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

නිවේදන
அறிவிப்புகள்
ANNOUNCEMENTS

ශ්‍රී ලංකා ක්‍රිකට් පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
இலங்கைக் கிரிக்கெட் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்
SRI LANKA CRICKET BILL: PETITIONS TO THE SUPREME COURT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2026 ඔක්තෝබර් 20 දිනැති මාගේ නිවේදනයේ සඳහන් පෙත්සම් තිහට අමතරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "ශ්‍රී ලංකා ක්‍රිකට්" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සම් තුනක පිටපත් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

II

ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
பயங்கரவாதத்திலிருந்து அரசைப் பாதுகாப்பதற்கான சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்
PROTECTION OF THE STATE FROM TERRORISM BILL: PETITIONS TO THE SUPREME COURT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2026 ඔක්තෝබර් 07, 08 සහ 20 දිනැති නිවේදනවල සඳහන් පෙත්සම් විසිපහට අමතරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සම් එකොළහක පිටපත්, මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

III

ආගමන පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්
குடிவரவு சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு
IMMIGRATION BILL: PETITION TO THE SUPREME COURT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "ආගමන" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක්, මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

IV

නව සමූහ රක්ෂණය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන
புதிய குழுக் காப்புறுதித் திட்டம் குறித்து கௌரவ உறுப்பினர்களுக்கு அறிவுறுத்தும் நிகழ்ச்சி
AWARENESS PROGRAMME ON NEW GROUP INSURANCE SCHEME

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් සඳහා 2026 ඔක්තෝබර් 09 දින සිට ක්‍රියාත්මක වන නව සමූහ රක්ෂණය සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් 2026 ඔක්තෝබර් 21 දින, එනම් අද දින පෙරවරු 11.00 සිට පෙරවරු 11.45 දක්වා සහ මධ්‍යාහ්න 12.00 සිට පස්වරු 12.45 දක්වා සැසිවාර දෙකක් වශයෙන් කාරක සභා කාමර අංක 2 හිදී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති බව දන්වනු කැමැත්තෙමි.

මෙම සැසිවාර දෙකෙන් පහසු සැසිවාරයකට සහභාගි වන ලෙස ගරු මන්ත්‍රීවරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the Performance Report of the Public Debt Management Office for the year 2025.

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

I move that this Report be referred to the Sectoral Oversight Committee on Economic Development and International Relations.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, I present the Report on the observations and steps taken in terms of the Standing Order No. 119(4) of the Parliament with regard to the matters mentioned on the Ministry of Digital Economy and the then Ministry of Technology in the Report of the Committee on Public Accounts, which was presented to Parliament.

I move that this Report be referred to the Committee on Public Accounts.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2025 වර්ෂය සඳහා දකුණු පළාත් සභාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ බස්නාහිර පළාත් සභාව සහ ඒ යටතේ පවතින ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 (4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
PUBLIC FINANCE COMMITTEE REPORT

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, එම කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලද -

(i) 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ යෝජනාව; සහ

(ii) 2026 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2026 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා 2025 අංක 23 දරන විසර්ජන පනතේ

ශීර්ෂය 243 - වැඩසටහන 02 යටතේ පරිපූරක මුදල

සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු හෙක්ටර් අප්පුහාමී මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, "ඉඩම් ක්ෂේත්‍රයට අයත් රාජ්‍ය ආයතනවල කාර්යයන් සහ එම ආයතන අතර පවතින ගැටලු" සම්බන්ධයෙන් වූ පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු හෙක්ටර් අප්පුහාමී මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, මට පොඩි වේලාවක් දෙන්න, මේ සම්බන්ධව කරුණු කීපයක් කියන්න.

ගරු කථානායකතුමනි, ඉඩම් සම්බන්ධව අපේ කමිටුවේ සාකච්ඡා කරද්දී විශේෂයෙන් දැනගන්න ලැබුණු කරුණු කාරණා කිහිපයක් තිබෙනවා. ඒ කරුණු පාර්ලිමේන්තුවටත්, රටේ ජනතාවටත් ඉතාම වැදගත් කියලා මම හිතනවා. හේතුව, අතීතයේ ඉඳන් එන ඉඩම් ඔප්පු ප්‍රමාණය බැලුවාම, ලංකාවේ තිබෙන ඔප්පු ප්‍රමාණයට ඉඩම් ලබා දෙන්න ලංකාව වාගේ දෙගුණයක ඉඩම් ප්‍රමාණයක් ඕනෑ වෙනවා. ඉන්දියාවේත් කෑල්ලක් ගන්න වෙයි, ඒ ඔප්පු ප්‍රමාණයට ඉඩම් ප්‍රමාණය වෙන් කරනවා නම්. මම ඒකට උදාහරණයක් කියන්නම්. LRC එකේ අක්කර 500ක ඉඩමක් තිබෙන්න පුළුවන්. ඒ අක්කර 500ට අදාළවම වතු සමාගමකටත් ඔප්පුවක් තිබෙනවා. එතකොට ඔප්පු දෙකයි. ඊළඟට, ඒ ඉඩම ඇතුළේ බෙදීම් කරලා පදිංචි වෙලා හරි, යම් ආකාරයක අයිතියක්

නිර්මාණය වෙලා තිබෙනවා නම්, ඒකටත් ඔප්පුවක් තිබෙනවා. එතකොට සමහර වෙලාවට බිමේ ඉඩම් හැටියට තිබෙන්නේ අක්කර 500යි. හැබැයි, අක්කර 1,500කට අදාළ ඔප්පු තිබෙනවා. එහෙම කාරණාවක් මහ පොළොවේ තිබෙනවා. හැබැයි, ඩිජිටල්කරණය හරහා "බිම් සවිය" වැඩසටහන තවත් ශක්තිමත් කරන්න ඊළඟ අය වැයෙන් හරි සල්ලි වෙන් කරලා, ලංකාවේ ඉඩම් ප්‍රමාණය ඩිජිටල්කරණය කරනවා නම්, ඉස්සෙල්ලාම ඉඩම් සම්බන්ධව නඩු තිබෙන අධිකරණ ටික වහන්න පුළුවන්. එතකොට ඒ අධිකරණ වෙනත් වැඩවලට ගන්න පුළුවන්. මොකද, ඒවා සම්පූර්ණයෙන්ම බෙරෙනවා. ඊට පස්සේ කාටවත් වැටවල් එහාට මෙහාට කරන්න බැහැ. අනුන්ගේ ඉඩම්වලට අයිතිවාසිකම් කියන්න බැහැ.

ඊළඟට, මේ තුළින් රාජ්‍ය ආයතනවලට තිබෙන ඉඩම් ප්‍රමාණය ප්‍රායෝගිකව නිශ්චිත වශයෙන් හඳුනා ගන්න හැකි වෙනවා. අපි සමහර වෙලාවට කියනවා, මෙච්චර ඉඩම් ප්‍රමාණයක් ආණ්ඩුවට තිබෙනවා කියලා. හැබැයි, ආණ්ඩුව එම ඉඩම් ප්‍රමාණය තිබෙනවාද, නැද්ද කියන එක දන්නේ නැහැ. ඒක නිර්ණය කර ගන්නත් පුළුවන්. ඒ නිසා අපි දැක්ක අඩුපාඩු සහ යෝජනා ටික තමයි මේ ඉදිරිපත් කරන්නේ. අපිට කමිටුවෙනුත් යම්කිසි නිර්දේශ දෙන්න පුළුවන්. මෙහිදී අපි නිර්දේශ ප්‍රමාණයක් දීලා තිබෙනවා. මේ වාර්තාව කියවන්න කියලා මම ඉල්ලීමක් කරනවා. මේ වැඩසටහනට අවශ්‍ය කරන මුදල් ප්‍රතිපාදන ලබා දීලා, මේක ශක්තිමත් කරන්න කියලාත් විශේෂයෙන් මම ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු කථානායකතුමනි, බදුල්ල, මහියංගන පාර, අංක 169/7 යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.එස්. ලලින් කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අර්කම් ඉල්යාස් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

ගරු කථානායකතුමනි, උඩුගම, උඩුගම නැහෙනහිර, වැලිවිටිය වත්ත යන ලිපිනයෙහි පදිංචි ඒ.එල්.ජී. ජගත් විමලසිරි මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ක්‍රීඩා විෂය භාර අමාත්‍යාංශය: 2018 සිට පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම්
விளையாட்டுத்துறைக்குப் பொறுப்பான அமைச்சு: 2018இலிருந்து ஏற்பட்ட மீண்டெழும் மற்றும் மூலதனச் செலவுகள்
MINISTRY IN CHARGE OF SPORTS: RECURRENT AND CAPITAL EXPENDITURES INCURRED SINCE 2018

33/2024

1. ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi, Attorney-at-Law)

තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2018 වර්ෂයේ සිට මේ දක්වා ක්‍රීඩා විෂයය භාර අමාත්‍යාංශයේ පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම්, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ක්‍රීඩකයින්ගේ අභිවෘද්ධිය සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණය සහ එහි ප්‍රතිශතය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ක්‍රීඩකයින්ගේ අභිවෘද්ධිය උදෙසා වෙන් කරන මුදල් ප්‍රමාණය ඉහළ නැංවීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2018ஆம் ஆண்டு தொடக்கம் தற்போது வரை விளையாட்டு எனும் விடயத்துக்குப் பொறுப்பான அமைச்சின் மீண்டெழும் மற்றும் மூலதனச் செலவுகள் ஆண்டு வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(ii) விளையாட்டு வீரர்களின் முன்னேற்றத்துக்காக ஒதுக்கப்பட்ட நிதியின் அளவு மற்றும் அதன் சதவீதம் ஆண்டு வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(iii) விளையாட்டு வீரர்களின் முன்னேற்றத்துக்காக ஒதுக்கப்படும் நிதியின் அளவை அதிகரிப்பதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Youth Affairs and Sports:

(a) Will he inform this House the -

(i) Recurrent Expenditure and Capital Expenditure incurred by the Ministry having the purview of the subject of sports, separately for each year from the year 2018 to date;

[ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි]

(ii) amount of money allocated for the betterment of sports personnel and that amount as a percentage of the total allocation, separately for each year; and

(iii) measures that will be taken to increase the amount of money allocated for the betterment of sports personnel?

(b) If not, why?

ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)

වර්ෂය	ආයතනය	පුනරාවර්තන වියදම (රුපියල් මිලියන)	ප්‍රාග්ධන වියදම (රුපියල් මිලියන)
2018	තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය	430.25	988.76
	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	971.72	1,068.22
	සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය	297.99	223.06
	ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය	113.26	31.65
2019	තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය	1,135.97	990.44
	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	1,096.25	774.76
	සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය	335.88	219.07
	ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය	104.13	32.47
2020	තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය	2,612.32	1,506.87
	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	581.71	792.20
	සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය	271.58	198.93
	ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය	28.69	28.78
2021	තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය	2,921.28	1,745.33
	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	620.28	900.10
	සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය	302.39	46.05
	ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය	13.29	36.37
2022	තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය	3,314.77	791.46
	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	620.47	181.04
	සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය	330.14	20.84
	ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය	20.20	42.31
2023	තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය	3,674.79	1,285.04
	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	812.93	372.89
	සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය	402.72	24.32
	ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය	30.06	45.94
2024	තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය	4,139.75	2,185.61
	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	1,487.57	1,022.19
	සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය	405.56	26.29
	ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය	35.59	48.87
2025	තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය	3,706.86	1,290.44
	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	1,577.41	1,499.99
	සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය	441.46	104.36
	ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය	28.36	57.17

වර්ෂය	ආයතනය	පුනරාවර්තන වියදම (රුපියල් මිලියන) **(2026.07.31 දක්වා)**	ප්‍රාග්ධන වියදම (රුපියල් මිලියන)
2026	තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය	2,268.77	287.54
	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	834.11	331.46
	සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය	261.37	97.77
	ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය	9.72	38.81

(ii)

වර්ෂය	ආයතනය	වෙන් කරන ලද මුදල් ප්‍රමාණය (රුපියල් මිලියන)	ප්‍රතිශතය
2018	තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය	988.76	69.68%
	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	1,350.00	89%
	සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය	1,191.85	90.59%
	ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය	"ක්‍රීඩකයින්ගේ අභිවෘද්ධිය" යනුවෙන් වෙනම මුදල් වෙන් කිරීමක් නොකරයි	

වර්ෂය	ආයතනය	වෙන් කරන ලද මුදල් ප්‍රමාණය (රුපියල් මිලියන)	ප්‍රතිශතය
2019	තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය	990.44	46.58%
	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	1,350.00	97%
	සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය	683.00	76.28%
	ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය	"ක්‍රීඩකයින්ගේ අභිවෘද්ධිය" යනුවෙන් වෙනම මුදල් වෙන් කිරීමක් නොකරයි	
2020	තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය	1,506.87	36.58%
	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	410.45	98%
	සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය	497.00	86.72%
	ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය	"ක්‍රීඩකයින්ගේ අභිවෘද්ධිය" යනුවෙන් වෙනම මුදල් වෙන් කිරීමක් නොකරයි	
2021	තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය	1,745.33	37.40%
	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	978.83	28%
	සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය	174.00	100%
	ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය	"ක්‍රීඩකයින්ගේ අභිවෘද්ධිය" යනුවෙන් වෙනම මුදල් වෙන් කිරීමක් නොකරයි	
2022	තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය	791.46	19.27%
	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	370.45	74%
	සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය	200.00	100%
	ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය	"ක්‍රීඩකයින්ගේ අභිවෘද්ධිය" යනුවෙන් වෙනම මුදල් වෙන් කිරීමක් නොකරයි	
2023	තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය	1,285.04	25.91%
	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	835.00	48%
	සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය	398.00	70.48%
	ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය	"ක්‍රීඩකයින්ගේ අභිවෘද්ධිය" යනුවෙන් වෙනම මුදල් වෙන් කිරීමක් නොකරයි	
2024	තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය	2,185.61	34.55%
	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	979.48	96%
	සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය	398.00	84.92%
	ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය	"ක්‍රීඩකයින්ගේ අභිවෘද්ධිය" යනුවෙන් වෙනම මුදල් වෙන් කිරීමක් නොකරයි	
2025	තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය	1,290.44	25.82%
	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	1,600.00	56%
	සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය	1,000.00	98.78%
	ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය	"ක්‍රීඩකයින්ගේ අභිවෘද්ධිය" යනුවෙන් වෙනම මුදල් වෙන් කිරීමක් නොකරයි	
2026	තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය	287.54	11.25%
	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව	1,513.00	48%
	සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය	970.00	99.22%
	ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය	"ක්‍රීඩකයින්ගේ අභිවෘද්ධිය" යනුවෙන්වෙනම මුදල් වෙන් කිරීමක් නොකරයි	

(iii)
- 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත ප්‍රකාරව ඉදිරි වර්ෂයන් තුළ ක්‍රියාත්මක කිරීමට හඳුනා ගනු ලබන නව ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලබා ගැනීමට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ එකඟතාව සහිතව රාජ්‍ය ආයෝජන වැඩසටහනට ඇතුළත් කර ගැනීම අනිවාර්යය වන බැවින් 2027 වර්ෂයේ සිට 2029 වර්ෂය දක්වා කාල රාමුව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 6,111.15ක වටිනාකමින් යුත් ව්‍යාපෘති යෝජනා 37ක් මේ වනවිටත් අමාත්‍යාංශය මඟින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ එකඟතාව ලබා ගැනීම සඳහා යොමු කර ඇත.
- High Performance Category 04 යටතේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ලබා දෙන දීමනා වැඩි කර ඇත.
- ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අවශ්‍ය පෝෂණ දීමනා වැඩි කිරීම සහ වැඩි ක්‍රීඩක ක්‍රීඩිකාවන් සංඛ්‍යාවකට පෝෂණ දීමනාව ලබා දීම.

[ගරු සුනිල් කුමාර ගමගේ මහතා]

- "ක්‍රීඩා ශක්ති" මඟින් දක්ෂතා ඇති පාසල් දරුවන් තෝරාගෙන, ඔවුන් වෙත මාසිකව රුපියල් 10,000ක පෝෂණ දීමනාවක් ලබා දීම.

  ගරු මන්ත්‍රීතුමනි, පසුගිය අවුරුද්දේ රුපියල් 750ක්ව තිබුණු මෙම දීමනාව, අපි මේ අවුරුද්දේ රුපියල් 1,500ක් කළා.

- ජාත්‍යන්තර තරග සඳහා තෝරා ගත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම. ගුවන් ප්‍රවේශපත්‍ර, visa, නවාතැන් පහසුකම් වැනි සියලු වියදම් ඒ යටතට වැටෙනවා.

- ජාතික මහා ක්‍රීඩා උළෙලට සමගාමීව ප්‍රාදේශීය, දිස්ත්‍රික් සහ පළාත් මට්ටමින් තරග පැවැත්වීම මෙන්ම, ජාත්‍යන්තර අත්දැකීම් වැඩි වශයෙන් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීම.

- Colombo Marathon, ලංකා සවාරි වැනි තරග හඳුන්වා දීම.

- ක්‍රීඩා සංස්කෘතිය මඟින් ක්‍රීඩාවේ නව්‍යකරණයක් ඇති කර, ක්‍රීඩකයන් තුළ නව බලාපොරොත්තු ඇති කිරීම.

(ආ) පැන නොනඟී.

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi, Attorney -at-Law)

ගරු කථානායකතුමනි, මම ගරු ඇමතිතුමාගෙන් අසනු ලබන පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ආණ්ඩු බලයට පැමිණි මුල් කාල සීමාවේදී ක්‍රිකට් ක්‍රීඩාව පිළිබඳව ඔබතුමන්ලා දිගින් දිගටම ප්‍රශ්න කළා. ක්‍රිකට් ක්‍රීඩාවට අත් වෙලා තිබෙන ඉරණමෙන් ක්‍රිකට් ක්‍රීඩාව ගොඩදමන්න ඔබතුමා යම් කාල සීමාවක් ඉල්ලුවා. මේ වෙනකොට ඒ කාල සීමාව ගෙවී ගොස් තිබෙනවා. මෑත කාලයේදී ඔබතුමා ප්‍රකාශයක් කළා, අපට අවුරුද්දකින් හෝ දෙකකින් ක්‍රිකට් ක්‍රීඩකයෝ හදන්න බැහැ කියලා. ඔබතුමා එවැනි ප්‍රකාශයක් කරනවා මම දැක්කේ මාධ්‍යයෙන්.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා ක්‍රිකට් එන්න එන්නම නරක තැනකට යනවා කියලා අපට පෙනෙනවා. ගරු ඇමතිතුමනි, එදා අපි ෂම්මි සිල්වාට විරුද්ධව ඔබතුමාත් එක්ක කථා කළා. ෂම්මි සිල්වා පාලනය කරපු අවධියේ තිබුණු තැනට වැඩිය නරක තැනකට අද ශ්‍රී ලංකා ක්‍රිකට් පත්වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේ සම්බන්ධයෙන් අපි ඔබතුමාට ඍජුව චෝදනා කරනවා නොවෙයි. මේකට උත්තරයක් සෙවිය යුතු වගකිව යුත්තා ඔබතුමා.

අද වන විට ඉරාන් වික්‍රමරත්න මැතිතුමා ඇතුළු කීර්තිමත් ක්‍රිකට් ක්‍රීඩකයෝ ටිකක් එකතු වෙලා මේ සම්බන්ධයෙන් යම්කිසි ක්‍රියාදාමයක නිරත වනවා. නමුත්, මේ ප්‍රශ්නයට උත්තරයක් සොයා ගන්න බැරිවෙලා තිබෙනවා. ඉස්සරහට ඔබතුමාට තිබෙන්නේ තව පොඩි කාලයක්. ශ්‍රී ලංකා ක්‍රිකට් ඉවර වෙන තැනට, ප්‍රේක්ෂකයෝ ක්‍රිකට් අත් හැර දමන තත්ත්වයට දැන් පැමිණ තිබෙන නිසා මෙම තත්ත්වයෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ගොඩ ගන්න නව වැඩ පිළිවෙළක් හදන්න කටයුතු කරනවා ද කියලා මම ඔබතුමාගෙන් අහනවා. එහෙම නැතිව ක්ෂණිකව මේ සඳහා උත්තර හොයන්න කඩිනම් වැඩසටහනකට අවතීර්ණ වෙන්න අමාත්‍යාංශයට හැකියාව තිබෙනවා ද? එහෙම නැති වුණොත් මේ යන විධියටම ගිහිල්ලා අනාගතයේ අපේ ක්‍රිකට් ක්‍රීඩාව විනාශ වෙලා යයි. ඔබතුමන්ලා ක්‍රීඩාව වෙනුවෙන් හඳුන්වා දී තිබෙන ඔය කියපු පහසුකම් පිළිබඳව සෑහීමකට පත්වනවා නම් ක්‍රීඩකයින් ක්‍රීඩාව අත් හැර යන්නේ නැහැ. නමුත් සමහර ක්‍රීඩකයින් අද ක්‍රීඩාව අත් හැර යනවා, ඔවුන්ට අවශ්‍ය පහසුකම් නැහැ කියලා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඍජුව අහනවා, ශ්‍රී ලංකා ක්‍රිකට් මෙතැනින් ඉවර වෙයිද, නැත්නම් මෙතැනින් එහාට මේක ගොඩ ගන්න යම්කිසි සැලසුමක් තිබෙනවා ද කියලා. අපි අය වැය විවාදය තුළදී අනෙක් ක්‍රීඩා ගැන කථා කරමු.

ගරු සුනිල් කුමාර ගමගේ මහතා
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)

ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා ක්‍රිකට් මෙතැනින් ඉවර වෙන්නේ නැහැ. ඔබතුමා ඇසූ ප්‍රශ්නයට ඍජුම පිළිතුර එයයි. එසේ ඉවර නොවෙන්න තමයි අපි මේ වනකොට ආණ්ඩු ගණනාවකට කරගන්න බැරි වෙච්ච වැඩේ කරලා තිබෙන්නේ. අපි ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් පනත් කෙටුම්පතක් - Bill එකක් - හදලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. මම හිතන විධියට, ගරු කථානායකතුමා අද උදේත් මේ ගැන සඳහන් කළා. ඒක ඊළඟ stage එකේ තිබෙන්නේ. ඒ කියන්නේ, පාර්ලිමේන්තුවේ විවාද කර අනුමත කර ගැනීම. මම හිතන විධියට ඔබතුමන්ලාත් එවැනි දෙයක් ඉල්ලමින් සිටියේ. මොකද, අපේ ක්‍රිකට් හදන්න නම් මේ දේවල් වෙනස් වෙන්න ඕනෑය කියලා ඔබතුමන්ලාත් කිව්වා. අපි ඒ වැඩේ කරලා තිබෙනවා. ඒකට කාලයක් ගතවනවා. මොකද, ඒ සඳහා පාර්ලිමේන්තුවේ ක්‍රියාවලියක් තිබෙනවා. ඒ නිසා තමයි මේකට යම්කිසි කාලයක් ගතවන්නේ. අපි විශ්වාස කරනවා, ඒ ක්‍රියාවලිය ඉවර වනකොට අපි බලාපොරොත්තු වන ජයග්‍රහණ ලබාගන්න පුළුවන් මට්ටමට ලංකාවේ ක්‍රිකට් නැවත හදාගන්න පුළුවන් වෙයි කියලා. ගරු මන්ත්‍රීතුමනි, ඒ ක්‍රියාවලිය අපේ ආණ්ඩුවෙන් තමයි පටන් ගත්තේ. කලින් තිබුණු ආණ්ඩු ඒක කරන්න ගොඩක් try කළා. නමුත්, ඒ හිටපු ඇමතිවරුන්ට ගෙදර යන්න පවා සිද්ධ වුණා. හැබැයි, අපට එහෙම වුණේ නැහැ. මම තවම ඉන්නවා. Bill එක පාර්ලිමේන්තුවේ තිබෙනවා. ඔබතුමන්ලාත් ඒකට උදව් කරනවා. අපි මේකෙන් ඉස්සරහට ක්‍රිකට් හදාගන්න බලමු. ඒක තමයි මට කියන්න තිබෙන්නේ. අපි ක්‍රිකට් වැටෙන්නවත්, ඉවර වෙන්නවත්, නැති වෙන්නවත් දෙන්නේ නැහැ.

ගරු නීතිඥ හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹேஷா விதானகே அங்கும்புர ஆரச்சி)
(The Hon. Hesha Withanage Ankumbura Arachchi, Attorney -at-Law)

ගරු කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු විපක්ෂ නායකතුමා අහනවා.

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

මම ක්‍රීඩා ඇමතිතුමාගෙන් දෙවැනි අතුරු ප්‍රශ්නය අහනවා. ආසියානු තරගාවලියේත් - Asian Gamesවලත්, පොදු රාජ්‍ය මණ්ඩලීය තරගාවලියේත් - Commonwealth Gamesවලත් -

හෙල්ල විසිකිරීමේ තරගයෙන් - javelin throw එකෙන් - පතිරගේ රුමේෂ් තරංග තරුණයා අපේ රටට විශාල කීර්තියක් ගෙනාවා. ඔහු තමයි හෙල්ල විසිකිරීමේ තරගයෙන් දැනට වැඩිම දුර ප්‍රමාණය වන මීටර් 92.62 වාර්තා කරලා තිබෙන්නේ. ඔහු ලෝකයෙන්ම අංක එක -World No. 1- බවට පත්වෙලා තිබෙනවා, ශ්‍රේණිගත කිරීම් අනුව. ඒ වාගේම post එකක් දාලා තිබුණා, රුපියල් ලක්ෂ 80ක් වියදම් කරලා ඔහුගේ ගෙදරට යන පාර හදනවා කියලා. නමුත්, තවම ඒ පාර හදලා නැහැ. ඒක තවම සමාජ මාධ්‍යයේ තිබෙන post එකක් පමණයි.

මේ වාගේ තරගාවලි ජයග්‍රහණය කරනකොට රජයේ නියමිත චක්‍රලේඛ අනුව ඒ ක්‍රීඩකයාට ලැබෙන්නට ඕනෑ, රුපියල් කෝටි 5ක මුදලක්. ඒ ක්‍රීඩකයා ආසියානු තරගාවලියෙනුත්, පොදු රාජ්‍ය මණ්ඩලීය තරගාවලියෙනුත් අංක එකට ජයග්‍රහණය කළත්, තවම ඒ රුපියල් කෝටි 5ක මුදල ගෙවලා නැහැ. ඒ නිසා මම විශේෂයෙන්ම ක්‍රීඩා ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, ඒ රීති, රෙගුලාසි සහ චක්‍රලේඛ අනුව පතිරගේ රුමේෂ් තරංග තරුණයාට ඒ මුදල ගෙවන්නේ කවදාද කියලා. අපේ රටට විශේෂිත වූ කීර්තියක් ලබා දුන් ඒ තරුණයාට World Athletics Championships එකේදීත්, ඒ වාගේම Olympicsවලදීත් Gold medal එක ලබාගන්නට හැකි වේවා කියා අපි ප්‍රාර්ථනා කරනවා. නිකම් නොවෙයි, Jan Železný තබා තිබෙන ලෝක වාර්තාවත් බිඳ හෙළා ඔහු එම ජයග්‍රහණය ලබා ගනිවි කියා අපි බලාපොරොත්තු වනවා. මේ වාගේ ජයග්‍රහණ ලබපු ඒ විශිෂ්ට තරුණයාට ගෙවිය යුතු රුපියල් කෝටි 5ක මුදල ගෙවීම ප්‍රමාද ඇයි කියා මම දැනගන්න කැමැතියි.

ගරු ඇමතිතුමනි, මොකක් හෝ විශේෂ චක්‍රලේඛයක් ගෙනැල්ලා ඒ ගෙවන්න තිබෙන මුදල අඩු කරනවාය කියලා දැන් කථාවක් යනවා. මම දන්නේ නැහැ, ඒක ඇත්තද, බොරුද කියලා. නමුත්, මේ ප්‍රශ්නය මතු කිරීමත් සමඟ ක්‍රීඩා ඇමතිතුමාට මම යෝජනාවක් මෙන්ම ඉල්ලීමක් කරනවා, ඒ දරුවාට අමතර ශක්තියක් ලැබෙන්න ඒ ගෙවන්න තිබෙන රුපියල් කෝටි 5ක මුදල ගෙවන්න කියලා.

ගරු සුනිල් කුමාර ගමගේ මහතා
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)

ඔබතුමාගේ ගැටලුව පැහැදිලියි, ගරු විපක්ෂ නායකතුමනි. රුපියල් කෝටි 5ක් දෙන්න කියලා සඳහන් කර තිබෙන චක්‍රලේඛය මොකක්ද කියලා මට කියන්න පුළුවන්ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔය කාරණය පිළිබඳව විවාදයකට පැටලෙන්න එපා. කාලය පිළිබඳව සැලකිලිමත් වන්න.

ගරු සුනිල් කුමාර ගමගේ මහතා
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)

ගරු කථානායකතුමනි, මේක සම්පූර්ණ නොමඟ යැවීමක්. රුපියල් කෝටි 5ක් ගෙවන්න කියපු එහෙම චක්‍රලේඛයක් අපේ අමාත්‍යාංශයේ නැහැ. කලින් එහෙම එකක් තිබිලා තිබෙනවා. ඒක චක්‍රලේඛයක් විධියට නොවෙයි, National Sports Council එකෙන් දුන් note එකක්. ඒකට එවකට තිබුණු Cabinet එකෙන් approval එක දීලා තිබෙනවා, ඒ අවුරුද්දේ විතරක් ගෙවන්න කියලා. එතකොට මෙතුමා සඳහන් කරන විධියේ චක්‍රලේඛයක් දැනට අපේ අමාත්‍යාංශයේ නැහැ, ගරු කථානායකතුමනි. 2024, 2025ටත් අපි ගෙවිවේ අලුතින් එකක් හදලා Cabinet approval එකක් අරගෙන. එහෙම කළේ 2024, 2025ට එහෙම එකක් තිබුණේ නැති නිසා. දැන් අපි 2026ට අලුතින් Cabinet approval එකක් ගන්න චක්‍රලේඛය හදලා තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 2 -143/2024- (1), ගරු චමින්ද විජේසිරි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමනි, ඊට අදාළ ප්‍රශ්නයට ගැටලුවක් නැහැ. මොකද, ඒක වැරදියි. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා point of Order එක හරියට කියන්න.

ගරු සජිත් ප්‍රේමදාස මහතා
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා කිව්වා, මම සභාව නොමඟ යැව්වා කියලා. මම අහන්නේ චක්‍රලේඛය තිබුණත් නැතත්,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විපක්ෂ නායකතුමනි, මේක විවාදයක් නොවෙයි. *[බාධා කිරීම්]*

ප්‍රශ්න අංක 3 -2298/2026- (1), ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

මඩකලපුව දිස්ත්‍රික්කයේ පාලම් ඉදිකිරීම: වර්තමාන තත්ත්වය
மட்டக்களப்பு மாவட்டத்தில் நிர்மாணிக்கப்படும் பாலங்கள்: தற்போதைய நிலை
CONSTRUCTION OF BRIDGES IN BATTICALOA DISTRICT: CURRENT STATUS

2300/2026

4. ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ නරිපුල් තෝට්ටම්, කින්නයඩි, සන්දිවෙලි, මණ්ඩූර්, අම්බිලාන්තුරෙයි සහ කාන්ජිරන් කුඩා යන ප්‍රදේශවල පාලම් ඉදිකිරීමට යෝජනා වී ඇති බවත්;

(ii) එම පාලම් ඉදිකිරීම පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් වගකීමක් වන බවත්;

(iii) ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් මෙතෙක් එම පාලම් ඉදිකර නොමැති බවත්;

එතුමා දන්නේද?

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

(ආ) එසේ නම්, එම පාලම් ඉදිකිරීම මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් පවරා ගැනීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) නරිපුල්තෝට්ටම් පාලම සඳහා ශක්‍යතා අධ්‍යයනය සහ විදුම් සිදුරු පරීක්ෂණ අවසන් කර තිබේද;

(ii) එසේ නම්, එම පාලම ඉදිකිරීමට කටයුතු කරන්නේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත පිරිවැය වන රුපියල් මිලියන 850ක් කොටසක් හෝ 2027 අය වැයෙන් වෙන් කිරීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மட்டக்களப்பு மாவட்டத்திலுள்ள நரிப்புல் தோட்டம், கிண்ணையடி, சந்திவெளி, மண்டூர், அம்பிளாந்துறை, காஞ்சிரன் குடா ஆகிய பகுதிகளில் பாலங்களை நிர்மாணிப்பதற்கு முன்மொழியப்பட்டுள்ளது என்பதையும்;

(ii) மேற்படி பாலங்களை நிர்மாணிப்பது, மாகாண வீதி அபிவிருத்தித் திணைக்களத்தின் பொறுப்பாகும் என்பதையும்;

(iii) போதிய நிதி ஒதுக்கீடுகள் இல்லாததன் காரணமாக மேற்படி பாலங்கள் இதுவரையிலும் நிர்மாணிக்கப்படவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) ஆமெனில், வீதி அபிவிருத்தி அதிகாரசபையால் மேற்படி பாலங்களை நிர்மாணிக்கும் பணியை பொறுப்பேற்றுக் கொள்வதற்குரிய நடவடிக்கைகள் எடுக்கப்படுமா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) நரிப்புல் தோட்டம் பாலத்துக்கான சாத்தியக்கூறு ஆய்வும், ஆழ்துளைச் சோதனைகளும் நிறைவடைந்துவிட்டனவா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி பாலத்தை நிர்மாணிப்பதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

(iii) அதற்கான மதிப்பீட்டுத் தொகையாகிய 850 மில்லியன் ரூபாயில் ஒரு பகுதியையேனும் 2027ஆம் ஆண்டுக்குரிய வரவு செலவுத்திட்டத்தின் ஊடாக ஒதுக்கீடு செய்வதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Is he aware that -

(i) proposals have been made to construct bridges in Naripul Thottam, Kinnaiyadi, Sandiveli, Mandur, Ambilanthurai and Kanjiran Kuda areas in the Batticaloa District;

(ii) the construction of the said bridges is the responsibility of the Provincial Road Development Department; and

(iii) the said bridges have not been constructed so far due to the lack of adequate allocations?

(b) If so, will he inform this House whether actions will be taken by the Road Development Authority to take over the construction of the said bridges?

(c) Will he also inform this House -

(i) whether the feasibility study and borehole investigation for the Naripul Thottam bridge have been completed;

(ii) if so, whether actions will be taken to construct the said bridge; and

(iii) whether actions will be taken to allocate at least a portion of the estimated cost of Rs. 850 million for that purpose from the Budget, 2027?

(d) If not, why?

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා (ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)

(The Hon. (Dr.) Prasanna Gunasena - Deputy Minister of Transport and Highways)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

ගරු කථානායකතුමනි, ඇත්තටම මේ ප්‍රශ්නයේ පොඩි කොටසක් තමයි මාර්ග සංවර්ධන අධිකාරියට අදාළ වෙන්නේ. ඒක අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන කොටසක්. හැබැයි, ප්‍රශ්නයේ වැඩි හරියක්ම අන්තර්ගත වෙලා තිබෙන්නේ, විමසන්නේ, පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අදාළ ගැටලු ටිකක්. අපි මේ ප්‍රශ්නයට උත්තරය හදනකොට අදාළ පළාතේ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියෙන් යම්කිසි උපදෙස් ටිකක් අරගෙන තමයි එය හදලා තිබෙන්නේ. ඇත්තටම මේ ප්‍රශ්නය යොමු විය යුතු වන්නේ පළාත් පාලන කටයුතු කරන පළාත් මාර්ග සංවර්ධන අධිකාරියටයි. කෙසේ නමුත්, මම මෙම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙන්නම්.

(අ) (i) ඔව්.

නැඟෙනහිර පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් තොරතුරු විමසීමේදී මෙම පාලම් ඉදි කිරීමට යෝජනා වී ඇති බව දැනුම් දී තිබේ.

(ii) පහත දැක්වෙන පාලම් තුන පමණක් පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ - PRDDහි - විෂය පථයට අයත් වන බවත්,

1. මන්දූර් - කුරුමන්වේලි පාලම

2. අම්පිලන්තුරෙයි - කුරුකල්මඩම් පාලම

3. කංචිරන්කුඩා පාලම

සෙසු පාලම් තුන අදාළ ප්‍රාදේශීය සභාවල විෂය පථයට අයත් වන බවත්, නැඟෙනහිර පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් විමසීමේදී දැනුම් දී තිබේ.

(iii) ඔව්. නැහෙනහිර පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් තොරතුරු විමසීමේදී මේ බව දැනුම් දී තිබේ.

(ආ) එම පාලම මාර්ග සංවර්ධන අධිකාරියට පවරා ගැනීමට දැනට තීරණයක් ගෙන නොමැත.

(ඇ) (i) ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොමැත.

(ii) නැත.

(iii) 2027 වර්ෂය සඳහා මාර්ග ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති මේ වනවිටත් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මඟින් රාජ්‍ය ආයෝජන වැඩසටහන, 2027 - Public Investment Programme, PIP - යටතේ ප්‍රකාශයට පත් කර ඇති බැවින් මෙම පාලම ඉදි කිරීමේ කටයුතු සඳහා 2027 වර්ෂයේ අය වැය මඟින් ප්‍රතිපාදන වෙන් කිරීමට හැකියාවක් නොමැත.

(ඈ) අදාළ නොවේ.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, வீதி அபிவிருத்தித் திணைக்களத்துக்கு ஒதுக்கப்படுகின்ற நிதி மிக மிகக் குறைவாக இருக்கின்றபடியால், அதனால் அல்லது மாகாண சபையால் இப்பாலங்கள் அமைக்கப்படுவதற்கான சாத்தியம் மிகக் குறைவாகவே இருக்கின்றது. நரிப்புல்தோட்டம் பாலம் PRDDக்குச் சொந்தமானது என்றுதான் எங்களுக்கு அறிவிக்கப்பட்டது. ஆனால், நீங்கள் சொல்கின்றீர்கள், இது உள்ளூராட்சி சபைக்குரிய பாலம் என்று. உள்ளூராட்சி சபையால் 135 மீற்றர் நீளமுள்ள இந்தப் பாலத்தை அமைப்பது என்பது சாத்தியமில்லை. இது உண்மையிலே PRDDக்கு உரியது. PRDDஆல் மேற்படி ஆறு பாலங்களும் இதுவரை அமைக்கப்படவில்லை. அதன் காரணமாகத்தான் RDA மூலமாக இந்தப் பாலத்தை அமைக்குமாறு நாங்கள் உங்களிடம் வேண்டுகோள் விடுக்கின்றோம்.

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

ඔව්, ඒක තමයි අපි පිළිතුර ලබා දුන්නේ. පාලම හෝ පාර අයිති ආයතනයට තමයි එය හැදීමේ බලය සහ මුදල් යෙදවීමේ හැකියාව තිබෙන්නේ. මාර්ග සංවර්ධන අධිකාරියට අයිති නැති පාරක් හදන්න, අයිති නැති පාලමක් හදන්න එම අධිකාරියෙන් මුදල් වෙන් කරන්න බැහැ. නමුත් ඒ සඳහා ක්‍රමවේදයක් තිබෙනවා. එහෙම හැකියාවක් නැත්නම් අදාළ ක්‍රමවේදය හරහා මාර්ග සංවර්ධන අධිකාරියට යොමු කරන්න පුළුවන්, ඉදි කරලා දෙන්න කියලා. ඒ වාගේ programmes කිහිපයකුත් අපි කරගෙන ගිහිල්ලා තිබෙනවා. ඒ හරහා තමයි මුදල් වෙන් කිරීමේ හැකියාව තිබෙන්නේ.

උදාහරණයක් විධියට ගත්තොත්, පාරවල් හදනවා නම් ඒ සඳහා අපේ "පුනරුදයට මඟ" කියලා programme එකක් තිබෙනවා. පළාත් පාලන ආයතනවලට, ඒ කියන්නේ පහළම තිබෙන unit එකට - ප්‍රාදේශීය සභාවලට, නගර සභාවලට - අයිති පාරවල් ඒගොල්ලන්ට හැදීමේ හැකියාවක් නැත්නම්, ඒ සඳහා මූල්‍ය හැකියාවක් නැත්නම්, "පුනරුදයට මඟ" වැඩසටහන යටතේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ඇතිව එය හදලා දෙන්න කියලා ඉදිරිපත් කරන්න පුළුවන්. මාර්ග සංවර්ධන අධිකාරියට, නැත්නම් අමාත්‍යාංශයේ ලේකම්ට ලිඛිතව දැනුම් දුන්නාට පස්සේ ඒ තොරතුරු ඇතුළත් කරලා, මුදල් වෙන් කරලා ඒ පාරවල් හදලා නැවත භාර දීමේ හැකියාවක් තිබෙනවා. ඒක තමයි ක්‍රමවේදය. ඊට අමතරව තවත් programmes කිහිපයක් තිබෙනවා, අමාත්‍යාංශය යටතේ කරන. උදාහරණයක් හැටියට පාලම් සඳහා තිබෙන Weak Bridges Programme එක ගනිමු. ඒ හරහා Eastern Province එකට අපි 2026 වසර සඳහා දළ වශයෙන් වෙන් කරලා තිබෙනවා, පාලම් 8ක් සඳහා රුපියල් මිලියන 28.9ක්. ඒ තොරතුරු සඳහන් ලේඛනය මම **table*** කරනවා.

ඒ වාගේම Widening and Improvement Programme එක යටතේත් නැහෙනහිර පළාතේ පාරවල් කිහිපයක් සංවර්ධනය වෙනවා. ඒ තොරතුරු සඳහන් ලේඛනයත් මම **table*** කරනවා.

ඒත් එක්කම Rural Road Programme එක යටතේත් වෙන් වෙනවා, දළ වශයෙන් මිලියන 1,045ක වාගේ ප්‍රමාණයක්. ඒ තොරතුරු සඳහන් ලේඛනයත් මම **table*** කරනවා.

ඊළඟට Bridge Development Status - Eastern Province කියන ලේඛනය ගත්තොත්, ප්‍රධාන වශයෙන් පාලම් 8ක් සඳහන් වෙලා තිබෙනවා. පළමුවෙනි එක Kiran Bridge එක, මීටර් 250ක් දිගයි. එහි Technical Evaluation එක මිලියන 2,000ක් වෙනවා. මේකේ present status එක, "At the tender evaluation stage for the Feasibility Study" කියා සඳහන් වනවා. ඊළඟට, Pondukachcheni Bridge එක, මීටර් 100ක් දිගයි. ඒ වෙනුවෙන් සාමාන්‍යයෙන් රුපියල් මිලියන 750ක් විතර යනවා. ඒකත් "At the tender evaluation stage for the Feasibility Study". ඊළඟට, තුන්වෙනි එක, Mandoor-Kurumanveli Bridge එක. එය මීටර් 660ක් දිගයි. ඒ සඳහා මිලියන 5,000ක් - බිලියන 5ක් වාගේ - යනවා. ඒකේ "The Feasibility Study is to be tendered. Under the direction of the Hon. President, the balance allocation available for the Kiran Bridge Feasibility Study can be utilized for this purpose" කියා සඳහන් වනවා. අර balance allocation එක use කරන්න පුළුවන් කියලායි කියන්නේ. හතරවෙනි එක තමයි, Ampilanthurai-Kurukalmadam Bridge එක. එය මීටර් 900ක් දිගයි. වියදම මිලියන 6,500ක් වාගේ යනවා. ඒකෙත් "Proposal forwarded through the DDG (Structural Design) to the DG, RDA on 13.08.2026" කියා සඳහන් වනවා. අගෝස්තු 13වෙනි දා යවලා තිබෙනවා. ඊට පස්සේ පස්වෙනි එක තමයි, Thihilivaddai- Santhiveli Bridge එක. එය මීටර් 260ක් දිගයි. වියදම මිලියන 2,000ක් විතර යනවා. ඒකෙත් "Proposal forwarded through the DDG (Structural Design) to the DG, RDA on 13.08.2026" කියා සඳහන් වනවා. Proposal එක forward කරනවා DDG (Structural Design)ට RDA එක විසින් අගෝස්තු 13වෙනි දා. හයවෙනි එක Naripulthoddam-Pankudavely Bridge එක. එය මීටර් 130ක් දිගයි. එහි වියදම ගත්තොත්, දළ වශයෙන් මිලියන 1,000ක් වාගේ යනවා. මේකත් ඒ විධියටම ඒ දිනයේදීම DDG (Structural Design)ට යවලා තිබෙනවා. ඊට පස්සේ Kanjirankuda Bridge එක. ඇත්තටම ඒක non- RDA bridge එකක්. එය මීටර් 300ක් දිගයි, මිලියන 2,000ක් වෙන් වෙනවා. ඒකෙත් " Feasibility Study to be done. Funds to be allocated" කියා සඳහන් වනවා. ඊට පස්සේ Kinnayadi Bridge එක. ඒකත් non-RDA - RDA එකට අයිති නැති - එකක්. අවසාන bridge එක ගත්තොත්, ඒක මීටර් 260ක් දිගයි; වියදම රුපියල් මිලියන 2,000ක් විතර වෙනවා. මේකෙත් "Feasibility study to be done. Funds to be allocated".

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, பதில் வழங்கியமைக்கு நன்றிகளைத் தெரிவித்துக்கொள்கின்றேன்.

கடந்த முறை நாங்கள் மாண்புமிகு சனாதிபதி அவர்களைச் சந்தித்தபோது, இந்த நரிப்புல் தோட்டம் பாலம் பற்றி கூறினோம். அப்போது அவர், 2027ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் அதற்குரிய நடவடிக்கை எடுப்பதாகக் குறிப்பிட்டிருந்தார். நான் நினைக்கின்றேன், ஆக 135 மீற்றர் நீளமுடைய இந்தப் பாலத்துக்குரிய borehole testing 2018ஆம் ஆண்டில் முடிவடைந்து இருக்கிறது என்று. இந்தச் சிறிய பாலத்தை அமைப்பதற்குரிய நிதி, இந்த முறை வரவு செலவுத்திட்டத்தில் ஒதுக்கப்படாதுவிட்டாலும், அடுத்த முறையாவது - 2028ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டத்திலாவது - ஒதுக்கப்படுவதற்கு நடவடிக்கை எடுக்கப்படுமா? எனக் கேட்கின்றேன்.

ගරු (වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා
(மாண்புமிகு (வைத்தியர்) பிரசன்ன குணசேன)
(The Hon. (Dr.) Prasanna Gunasena)

ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් 2027 අය වැයට මුදල් වෙන් කරනකොට, 2027 අය වැය සඳහා මුදල් වෙන් වෙන්නේ මොන මොන පාරවල් හදන්නද, මොන මොන පාලම් හදන්නද කියන එක අපි මැයි 15වැනි දාට කලින් යෝජනා කරනවා. ඒ කියන්නේ 2026 මැයි 15වැනි දාට කලින් තමයි 2027 Budget එකට අපි යෝජනා කරලා තිබෙන්නේ. එතකොට 2027 Budget එකට - උත්තරය ලැබුණෙත් ඒකයි - දැන් මුදල් වෙන් වෙලා ඉවරයි.

එම නිසා ඔබතුමා කියන කාරණය ලබන අවුරුද්ද සඳහා යෝජනා කරනවා නම් අනිවාර්යයෙන්ම අපි සලකා බලන්නම්. ඒක හරි විධියට එන්න ඕනෑ. මොකද, RDA එකට අයිති නැති පාලමක් නම් අපට ඒකට දාගන්න පුළුවන්. එතකොට ලබන අවුරුද්දේ, ඒ කියන්නේ 2027 මැයි 15වැනි දාට කලින් අපි ඒ යෝජනාව ඉදිරිපත් කළාම 2028 අවුරුද්දට මුදල් වෙන් වෙනවා. එතකොට අපට ඉදිකිරීම් සඳහා මුදල් වෙන් කරලා ඉදිකිරීම් පටන් ගැනීමේ හැකියාව තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා හරියට ආවොත් අපට තවත් හැකියාවක් තිබෙනවා. ඒකේ ශක්‍යතා අධ්‍යයනය කරන්න, designs ටික කරන්න මුදල් වෙන් වෙන්නම අවශ්‍ය නැහැ. ඔක්කෝම වැඩ ටික කරලා ඉවර වෙලා tender එක call කරලා, පිරිනමන්නේ නැතිව - award කරන්නේ නැතුව - අපට තියාගන්න පුළුවන්, මුදල් වෙන් වෙනකල්. ඒ කියන්නේ, 2028 ජනවාරි 1වැනි දා, 2වැනි දා වෙනකල් අපට සියලු වැඩකටයුතු, කරන්න තිබෙන homework ටික ඔක්කෝම කරලා ඉවර වෙලා ටෙන්ඩරය පිරිනමන්නේ නැතුව තියා ගැනීමේ හැකියාව තිබෙනවා. අපට ඒ නිදහස තිබෙනවා. ඒ ටික අපට කරගෙන යන්න පුළුවන්. ඔබතුමන්ලා DCC එකේ අනුමැතිය ඇතුව යෝජනා කරන්න. අපි ඒ පිළිබඳව සලකා බලා ඒ කටයුත්ත කරමු.

බන්ධනාගාරවල සිටින සැකකරුවන් සහ සිරකරුවන්: විස්තර
சிறைச்சாலைகளில் தடுத்து வைக்கப்பட்டுள்ள சந்தேக நபர்கள் மற்றும் கைதிகள்: விபரம்
REMAND SUSPECTS AND CONVICTED PRISONERS: DETAILS

2326/2026

5. ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2026.08.12 දින වනවිට සියලුම බන්ධනාගාරවල සිටින සැකකරුවන් සහ සිරකරුවන් සංඛ්‍යාව;

(ii) වයස අවුරුදු 20-30 අතර, 30-40 අතර, 40-50 අතර, 50-60 අතර, 60-70 අතර සහ 80ට වැඩි යන වයස් කාණ්ඩ අනුව සිටින සිරකරුවන් සංඛ්‍යාව;

(iii) එම සිරකරුවන් අතරින් රු.10,000, රු.15,000, රු.25,000, රු.50,000 සහ රු.100,000 ඉක්මවන දඩ මුදල් ගෙවීමට නොහැකිව බන්ධනාගාරගතව සිටින සිරකරුවන් සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මැගසින්, මහර, කුරුවිට සහ පල්ලන්සේන බන්ධනාගාරවල ඇතිවූ ගැටුම්වලින් මියගිය බන්ධනාගාර නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම නිලධාරීන්ගේ නම්, තනතුරු සහ ලිපින කවරේද;

(iii) එම නිලධාරීන් වෙනුවෙන් රජය විසින් වන්දි ලබාදී තිබේද;

(iv) එසේ නම්, එක් එක් නිලධාරියා සඳහා ලබාදී ඇති වන්දි මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම ගැටුම්වලින් මේ වනවිට මියගොස් ඇති සිරකරුවන් සහ සැකකරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2026.08.12ஆம் திகதியளவில் அனைத்து சிறைச்சாலைகளிலும் தடுத்து வைக்கப்பட்டிருந்த சந்தேக நபர்கள் மற்றும் கைதிகளின் எண்ணிக்கை;

(ii) 20-30, 30-40, 40-50, 50-60, 60-70 மற்றும் 80 வயதுக்கு மேற்பட்ட வயதுப் பிரிவுகளின்படி உள்ள கைதிகளின் எண்ணிக்கை;

(iii) மேற்படி கைதிகளில், ரூ. 10,000, ரூ. 15,000, ரூ. 25,000, ரூ. 50,000 மற்றும் ரூ.100,000 ஆகிய தொகைகளை விஞ்சிய அபராதத் தொகைகளைச் செலுத்த முடியாத நிலையில் சிறையில் தடுத்து வைக்கப்பட்டுள்ள கைதிகளின் எண்ணிக்கை ;

வெவ்வேறாக யாது என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மகசின், மஹர, குருவிட்ட மற்றும் பல்லன்சேன சிறைச்சாலைகளில் ஏற்பட்ட மோதல்கள் காரணமாக உயிரிழந்த சிறைச்சாலை உத்தியோகத்தர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

(ii) அவ்வுத்தியோகத்தர்களின் பெயர்கள், பதவிகள் மற்றும் முகவரிகள் யாவை என்பதையும்;

(iii) அவ்வுத்தியோகத்தர்களுக்காக அரசாங்கத்தால் இழப்பீடு வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(iv) அவ்வாறாயின், ஒவ்வோர் உத்தியோகத்தருக்கும் வழங்கப்பட்ட இழப்பீட்டுத் தொகை வெவ்வேறாக யாது என்பதையும்;

(v) மேற்படி மோதல்கள் காரணமாக இதுவரை உயிரிழந்துள்ள கைதிகள் மற்றும் சந்தேக நபர்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Justice and National Integration:

(a) Will he inform this House, separately, -

(i) the total number of remand suspects and convicted prisoners in all prisons across the Island, as of 12.08.2026;

(ii) the number of prisoners categorized according to the age groups of 20-30, 30-40, 40-50, 50-60, 60-70 and over 80 years; and

(iii) the number of prisoners among them who are currently imprisoned due to the inability to pay fines exceeding Rs. 10,000, Rs. 15,000, Rs. 25,000, Rs. 50,000 and Rs. 100,000?

(b) Will he also inform this House -

(i) separately, the number of prison officers who died during the clashes that occurred at the Magazine, Mahara, Kuruwita, and Pallansena Prisons;

(ii) the names, designations, and addresses of the said officers;

(iii) whether compensation has been paid by the Government to the families of the said officers;

(iv) if so, separately, the amount of compensation paid for each officer; and

(v) separately, the number of prisoners and remand suspects who have died in the said clashes to date?

(c) If not, why?

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)

(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)

(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

(අ) (i) සිරකරුවන් සංඛ්‍යාව - 10,611

සැකකරුවන් සංඛ්‍යාව - 28,408

(ii)

වයස් පරතරය අවුරුදු	20-30 අතර	30-40 අතර	40-50 අතර	50-60 අතර	60-70 අතර	70-80 අතර	80ට වැඩි	එකතුව
සිරකරුවන් ප්‍රමාණය	2,160	3,423	2,860	1,561	601	150	11	10,766

(iii)

ගෙවීමට ඇති දඩ මුදල රුපියල්	10000-15000	15000-25000	25000-50000	50000-100000	100000 ට වැඩි	එකතුව
සිරකරුවන් ප්‍රමාණය	421	220	361	245	207	1,454

(ආ) (i) මැගසින්, මහර, කුරුවිට සහ පල්ලන්සේන බන්ධනාගාරවල ඇතිවූ ගැටුම්වලින් බන්ධනාගාර නිලධාරීන් මියගොස් නැත.

(ii) ඉහත (i) පිළිතුර හා සබැඳේ.

(iii) ඉහත (i) පිළිතුර හා සබැඳේ.

(iv) ඉහත (i) පිළිතුර හා සබැඳේ.

(v)

මැගසින්	මහර	කුරුවිට	පල්ලන්සේන
01	01	02	නැත

(ඇ) පැන නොනඟී.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)

(The Hon. Rohitha Abeygunawardhana)

ගරු ඇමතිතුමනි, විශේෂයෙන් ඔබතුමාගේ පිළිතුරට අනුව අවුරුදු 20-30, 30-40 ආදි වශයෙන් ඒ ඒ කාණ්ඩවලට අදාළව දඩ ගෙවා ගැනීමට නොහැකි සංඛ්‍යාව එකතු කළාම සෑහෙන ප්‍රමාණයක් ඉන්නවා.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා

(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)

(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු මන්ත්‍රීතුමනි, (අ) (ii) පිළිතුරෙහි කියා තිබෙන්නේ දඩ ගෙවන්න බැරි කට්ටිය ගැන නොවෙයි. එහි දීලා තිබෙන්නේ ඒ ඒ වයස් සීමාව අනුව හිරේ ඉන්න කට්ටියගේ සංඛ්‍යායි. දඩ ගැන මම පැහැදිලි කරලා තිබෙන්නේ මෙහෙමයි. රුපියල් 10,000-15,000 අතර දඩ ගෙවා ගන්න බැරි සිරකරුවන් 421ක් ඉන්නවා. රුපියල් 15,000-25,000 අතර දඩ ගෙවා ගන්න බැරි සිරකරුවන් 220ක් ඉන්නවා. රුපියල් 25,000-50,000 අතර දඩ ගෙවා ගන්න බැරි සිරකරුවන් 361ක් ඉන්නවා. රුපියල් 50,000-100,000 අතර දඩ ගෙවා ගන්න බැරි සිරකරුවන් 245ක් ඉන්නවා. රුපියල් 100,000ට වැඩි දඩ ගෙවා ගන්න බැරි සිරකරුවන් 207ක් ඉන්නවා. ඒ සමස්ත එකතුව 1,454යි. මම එතැන වයස් සීමාවක් දාලා නැහැ.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)

(The Hon. Rohitha Abeygunawardhana)

ගරු ඇමතිතුමනි, ඒ දඩ මුදල් ගෙවිවොත් ඒ අය එක්දහස් ගණන නිදහස් වෙනවා නේ. ඔබතුමාටත් තිබෙන ප්‍රශ්නයක් නේ, හිර ගෙවල්වල තිබෙන තදබදය. ඒ අයට සාමාන්‍ය දඩ මුදල් නේ, ගෙවන්න තිබෙන්නේ. යම් විධියකින් නීතියට එකඟව එක්කෝ රජයෙන්, එහෙම නැත්නම් රාජ්‍ය නොවන සංවිධානයකින් ඒ දඩ මුදල් ගෙවලා ඒ අය එළියට ගන්න මොකක් හෝ ක්‍රමවේදයක් හදන්න. ඒ අය දැන් වන විට සෑහෙන්න කාලයක් හිරේත් ඉඳලා නේ, ගරු ඇමතිතුමා. ඒ දඩ මුදල්වල ප්‍රමාණය ගත්තාම, මා හිතන විධියට ඒවා ලොකු වරදවල් වෙන්න බැහැ. ඔබතුමා නීතිඥ මහත්මයෙකු නිසා මට වඩා හොඳින් මේ ගැන දන්නවා. ඒ අයගේ දඬුවම් කාලය දිහා බලලා, ඒ කියන්නේ ඒ අවුරුදු ගණන කොච්චරක්ද කියා බලලා, එම දඩ මුදල් ගෙවන වැඩ පිළිවෙළක් යොදලා ඒ අය එළියට ගන්න පුළුවන් නම් හිර ගෙවල්වලින් සිරකරුවන් එක්දහස් පන්සිය ගණනක් එළියට එනවා, ගරු ඇමතිතුමනි. එහෙම වැඩ පිළිවෙළක් තිබෙනවාද කියලා මම ඔබතුමාගෙන් අහනවා.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා

(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)

(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු මන්ත්‍රීතුමා, ඒක ඉතාම සාධාරණ යෝජනාවක් සහ සාධාරණ ප්‍රශ්නයක්. දඩයක් ගෙවන්න බැරිව ඇතුළේ ඉන්නවා කියන්නේම, ලොකු වරදක් වෙන්න බැහැ නේ. දඩය ගෙවන්න

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා]

බැරිකමටයි ඔවුන් ඇතුළේ ඉන්නේ. දැන් වනකොටත් නොයෙකුත් සංවිධාන සහ ආයතන විසින් තෝරා ගත් සිරකරුවන් වෙනුවෙන් අදාළ දඩ මුදල් ගෙවලා ඉවත් කර ගැනීමේ වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒ වාගේම ඉදිරියේදීත් ඕනෑම රාජ්‍ය ආයතනයකට හෝ රාජ්‍ය නොවන ආයතනයකට හෝ ඕනෑම කෙනෙකුට අදාළ දඩ මුදල් ගෙවලා ඒ කට්ටිය එළියට ගන්න පුළුවන්. ඒකට බන්ධනාගාරයෙන් කිසි තහනමක් නැහැ. ඒ වාගේම Release of Remand Prisoners Act එකේ ප්‍රතිපාදන යටතේත් මේවා ගැන සොයා බලනවා. ඒ සම්බන්ධව දැනටත් වැඩ පිළිවෙළක් තිබෙනවා. ඉදිරියේදීත් තවත් කට්ටියට එම දඩ මුදල් ගෙවීමට සම්බන්ධ වෙන්න ඕනෑ නම් ඒකට කිසි බාධාවක් නැහැ. අදාළ දඩ මුදල ගෙවලා එළියට ගන්න පුළුවන්. එයට අපේ සම්පූර්ණ සහාය තිබෙනවා.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(මාණ්පුමිකු රෝහිත්ත අබේකුණවර්තන)
(The Hon. Rohitha Abeygunawardhana)

ගරු ඇමතිතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය ඒ ප්‍රශ්නයේම කොටසකට අදාළයි. ඔබතුමාගේ පිළිතුරේ සඳහන් වුණා, වයස අවුරුදු 70ට වැඩි සිරකරුවන් 150දෙනෙක් ඉන්න බව. හිර ගෙදර ඒ අය ඉන්න වාට්ටුවට නමක් දාලා තිබෙනවා, "චමින්ද වාට්ටුව" කියලා. ගරු ඇමතිතුමාත් දන්නවා මේවා. "චමින්ද වාට්ටුව" කියලායි ඒකට කියන්නේ. අපි අහලා තිබෙන විධියට, එහි ඉන්න සිරකරුවන්ගෙන් - 150දෙනාගෙන් - සමහරුන්ට එක්කෝ ඇවිද ගන්න බැහැ; එක්කෝ වැසිකිළියට යන්න බැහැ. ඒ අය එහි විශාල කාලයක් - අවුරුදු ගණනක් - ඉන්නවා. අපි දඩුවම ගැන කථා කරන්නේ නැහැ. හැබැයි, දැන් ඒ සමහර අය නාඩි වැටෙන හින්දා තමයි ජීවත් වෙලා ඉන්නවා කියන්නේ. අන්න ඒ අය ගැන ඔබතුමා විශේෂ අවධානයක් යොමු කරන්න. මම කියන්නේ නීතිය පැත්තෙන් නොවෙයි, මානුෂීය පැත්තෙන්.

ඒත් එක්කම තවත් කාරණයක් කියන්න තිබෙනවා, ගරු ඇමතිතුමනි. යම් කෙනෙකු වරදක් කරලා වසර 10කට සිරගත කරනවා කියා හිතමු. එවිට ඔහු සිරකරුවකු හැටියට appeal එකක් කළා කියා හිතමු. Appeal එකට අදාළවත් එම තීන්දුවම එනවා කියා හිතමු. ඔහු දැනටමත් අවුරුදු 5ක් තිස්සේ හිරගෙදර ඉන්නවා කියා හිතමු. අවුරුදු 10කට තමයි සිරගත වෙන්නේ. හැබැයි ගරු ඇමතිතුමා, දැනට අවුරුදු 5ක් ඉඳලා තිබියදී ආයෙත් එම තීන්දුවම ආවාම එම තීන්දුව ආපු දවසේ ඉඳලා ආපහු අවුරුදු 10ක් ඔහු හිරගෙදර ඉන්න ඕනෑ. මම මීට ඉස්සෙල්ලා දවසකත් ගරු ඇමතිතුමා එක්ක මේ ගැන පෞද්ගලිකවත් කථා කළා. ඔබතුමා මේ ගැන විශේෂ අවධානයක් යොමු කළොත් හොඳයි. ඒ කියන්නේ ඉහත උදාහරණය අනුව අවුරුදු 10ක සිර දඬුවමක් ලබපු, මේ වන විටත් අවුරුදු 5ක් දඬුවම විඳපු කෙනාට appeal එකෙන් පසුව ආපහු අවුරුදු 10ක් ඉන්න වෙනවා; ඒ කියන්නේ අවුරුදු 15ක් ඉන්න වෙනවා. මෙන්න මේකට සහ මම කියපු අනෙක් කාරණයට අදාළව ඔබතුමා මොකක් හරි වැඩ පිළිවෙළක් මේ වන විට යොදලා තිබෙනවාද කියා මම දැනගන්න කැමැතියි.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(මාණ්පුමිකු චට්ටත්තරණි හර්ෂන නාණායක්කාර)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ඔබතුමා ඔය කියපු වයස අවුරුදු 70ට වැඩි කට්ටිය ගත්තොත්, වයස වැඩිවීම මතම ඒ අය මුදා හැරීමේ හැකියාවක් නැහැ. මොකද, සමහර අය වැරදිකාරයන් වෙලා එන්නේ වයස අවුරුදු 68න්, 69න් නම්, අවුරුදු 70 පැන්නා කියලා ඔවුන්ව එළියට දමන්න බැහැ. නමුත්, ඔවුන්ගේ සෞඛ්‍ය තත්ත්වය අනුව Medical Boardsවලට යොමු කිරීමේ හැකියාව තිබෙනවා. ඒ Medical Boardsවලින් recommendations ආවොත් ඒ කටයුත්ත කිරීමට ප්‍රතිපාදනයක් දැනටමත් තිබෙනවා. අපි ඒක තවත් සක්‍රිය කර ගන්න ඕනෑ කියා මා විශ්වාස කරනවා. ඒ තිබෙන ක්‍රමයම සක්‍රිය කර ගන්න ඕනෑ. ඒ Medical Boards මීට වඩා සක්‍රිය කර ගන්න ඕනෑ. මම ඒක පිළිගන්නවා.

අන්තිමට ඔබතුමා අහපු ප්‍රශ්නය රිමාන්ඩ් කාලය ගැනයි. ඒක පිළිබඳව යම් නීති සංශෝධනයක් ගැන සලකා බලන්න වෙනවා. අපි ටිකක් ඒ ගැන හොයලා බලමු; ඒ යෝජනාව ගැන හොයලා බලමු.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 6 -2353/2026- (1), ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා.

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා
(මාණ්පුමිකු මයිල්වාකනම් ජෙකතීස්වරන්)
(The Hon. Mayilvaganam Jegatheeswaran)

கௌரவ சபாநாயகர் அவர்களே, நான் அந்த வினாவைக் கேட்கின்றேன்.

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු (වෛද්‍යර්) මදුර චෙනෙවිරත්න - කල්වි, උයර් කල්විප් පිරති අමෛච්චර්)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 7 -2402/2026- (1), ගරු තිළිණ සමරකෝන් මහතා.

ගරු තිළිණ සමරකෝන් මහතා
(මාණ්පුමිකු තිලිණ චමරක්කෝන්)
(The Hon. Thilina Samarakoon)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු නාමල් කරුණාරත්න - කමත්තොළිල් මට්‌රුම් කාල්නටෙ වළංකළ් පිරති අමෛච්චර්)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ පිහිටි UDA එකට අයත් ඉඩම්: වෙන් කිරීම සහ පැවරීම්

பத்தரமுல்லை, டென்சில் கொப்பேகடுவ மாவத்தையிலுள்ள நகர அபிவிருத்தி அதிகார சபைக்குச் சொந்தமான காணி: ஒதுக்குதலும் கைமாற்றலும்

UDA-OWNED LAND ALONG DENZIL KOBBEKADUWA MAWATHA, BATTARAMULLA: ALLOCATION AND TRANSFER

2413/2026

8. ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා
(මාණ්පුමිකු අසිත නිරோෂණ எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ රාජ්‍ය ආයතන සඳහා වෙන් කරන ලද, නාගරික සංවර්ධන අධිකාරියට අයත්ව තිබූ මුළු ඉඩම් ප්‍රමාණය සහ ඉඩම් කැබලි සංඛ්‍යාව කොපමණද;

(ii) 2026.07.01 දින වන විට විවිධ ආයතන සඳහා ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය සහ ඉඩම් කැබලි සංඛ්‍යාව එක් එක් ආයතනය අනුව වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ රජයට අයත් ඉඩම් කැබලි පෞද්ගලික පාර්ශ්වයන්ට පවරා දී තිබේද;

(ii) එසේ නම්, එම පැවරීම් සඳහා පදනම, ඉඩම් ප්‍රමාණය, වටිනාකම සහ කාල සීමාව කවරේද;

(iii) නො එසේ නම්, එම ඉඩම් සින්නක්කරව පවරා දී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) රාජ්‍ය කටයුතු සඳහා පවරා ගත් ඉඩම් පෞද්ගලික පාර්ශ්වයන්ට පැවරීමේ නීතිමය තත්ත්වය කවරේද;

(ii) එවැනි පැවරීම් නීති විරෝධී බව තහවුරු වුවහොත් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரச நிறுவனங்களுக்காக ஒதுக்கப்பட்ட பத்தரமுல்லை, டென்சில் கொப்பேகடுவ மாவத்தையில் நகர அபிவிருத்தி அதிகார சபைக்குச் சொந்தமாகக் காணப்பட்ட மொத்தக் காணியின் விஸ்தீரணம் மற்றும் காணித் துண்டுகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) 2026.07.01ஆம் திகதியில் பல்வேறு நிறுவனங் களுக்காக வழங்கப்பட்டுள்ள காணியின் விஸ்தீரணம் மற்றும் காணித்துண்டுகளின் எண்ணிக்கை நிறுவன ரீதியாக வெவ்வேறாக யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) அரசாங்கத்துக்குச் சொந்தமான காணித் துண்டுகள் டென்சில் கொப்பேகடுவ மாவத்தை யில் தனியார் தரப்பினர்களுக்குச் சாட்டுதல் செய்யப்பட்டுள்ளனவா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி சாட்டுதல் செய்வதற்கான அடிப்படை, காணியின் விஸ்தீரணம், பெறுமதி மற்றும் காலப்பகுதி யாது என்பதையும்;

(iii) இன்றேல், மேற்படி காணிகள் அறுதி உறுதியாகச் சாட்டுதல் செய்யப்பட்டுள்ளனவா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) அரச அலுவல்களுக்காக சுவீகரிக்கப்பட்ட காணிகள் தனியார் தரப்பினர்களுக்குச் சாட்டுதல் செய்வதற்கான சட்ட ரீதியான அடிப்படை யாது என்பதையும்;

(ii) அவ்வாறான சாட்டுதல்கள் சட்டத்துக்கு முரணானது என்பது உறுதிப்படுத்தப்பட்டால் மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Transport, Highways and Urban Development:

(a) Will he inform this House -
  (i) the total extent of land and the number of land plots along Denzil Kobbekaduwa Mawatha, Battaramulla owned by the Urban Development Authority and allocated to State institutions; and
  (ii) separately, the extent of land and the number of land plots allocated to various institutions, for each institution, as of 01.07.2026?

(b) Will he also inform this House -
  (i) whether any State-owned land plots along Denzil Kobbekaduwa Mawatha have been transferred to private parties;
  (ii) if so, the basis of such transfers, extent of land, value, and duration; and
  (iii) if not, whether the aforesaid lands have been transferred on a freehold basis?

(c) Will he further inform this House the -
  (i) legal position regarding the transfer of lands, which were originally acquired for State purposes, to private parties; and
  (ii) measures that will be taken if such transfers are found to be unlawful?

(d) If not, why?

ගරු එරංග ගුණසේකර මහතා (නාගරික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எரங்க குணசேகர - நகர அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Eranga Gunasekara - Deputy Minister of Urban Development)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඉඩම් ප්‍රමාණය - අක්කර 14 රූඩ් 2 පර්චස් 20.51යි.
ඉඩම් කැබලි සංඛ්‍යාව - 21

(ii) රාජ්‍ය ආයතන සඳහා බැහැර කර ඇති ඉඩම් පිළිබඳ විස්තර ඇමුණුම 01හි දක්වා ඇත.

[ගරු එරංග ගුණසේකර මහතා]

ඇමුණුම 01:

රාජ්‍ය ආයතන සඳහා බැහැර කර ඇති ඉඩම් කොටස් සම්බන්ධ විස්තර

Se. No.	File No.	Plan No.	Lot No.	Extent	Name of the allottee
01	10/8/877	12/91	01	0A 1R 21.65P	Water Supply and Drainage Board
02	10/8/1946	390	10 & 18	1A 2R 25.65P	Western Provincial Council
03	10/8/1850	5834	1 to 4	0A 1R 07.36P	Additional land to Western Provincial Council
04	10/8/1856	P P Co.7969	1A	0A 2R 09.88P	Additional land to Central Environment Authority
05	10/8/3283	P P Co 7969	1A	0A 0R 20.00P	Ceylon Electricity Board
06	10/8/1493	P P Co.7969	4	2A 0R 11.98P	Central Environment Authority
07	10/8/2349	P P Co.7969	5	1A 1R 05.59P	R D A Maga Naguma
08	10/8/1846	P P Co.7969	7	1A 0R 06.60P	Foreign Employment Bureau
09	10/8/1831	P P Co.7969	9	0 A 2R 02.20P	Register General Department
10	10/8/1859	P P Co.7969	10	0 A 1R 29.55P	Dept. of Law Commission
11	10/8/3686	P P Co.7969	11	0 A 0R 32.00P	Condominium Management Authority (Processing)
12	10/8/1733	P P Co.7969	13	0A 0R 35.56P	Coconut Cultivation Board
13	10/8/2946	P P Co.7969	14,15 & 16	1A 1R 18.17P	RDA Parking
14	10/8/1807	P P Co.7969	17 & 18 (Part)	2A 0R 38.20P	Reserved For Sethsiripaya Stage IV
15	10/8/3298	P P Co.7969	18 (Part)	1A 0R 00.12P	Samurdhi Development Authority
16		P P Co.7969	18 (Part)	0A 0R 76.00P	Reserved For Auditor General Department
17	10/8/3755	P P Co.7969	18 (Part)	0A 2R 00.00P	Additional Land to Sri Lanka Bureau of Foreign Employment
18	10/8/3266	P P Co.7969	24	0 A 0R 40.00P	Water Resources Board

(ආ) (i) ඔව්.
සංවර්ධන කටයුතු සඳහා බැහැර කිරීමට වෙන් කරන ලද ඉඩම් කොටස් සම්බන්ධව පෞද්ගලික පාර්ශ්වයන්/ආයතන විසින් සිදු කරන ලද ඉල්ලීම් සැලකිල්ලට ගෙන අදාළ අනුමැතීන්ට යටත්ව බදු පදනම යටතේ එම ඉඩම් කොටස් පෞද්ගලික පාර්ශ්වයන් හා ආයතන වෙත බැහැර කර ඇත.

(ii) ඒවා පවරා දී ඇති පෞද්ගලික පාර්ශ්ව ගැනයි අහලා තිබෙන්නේ. ආයතන 3කට භාර දීලා තිබෙනවා. ඒ පිළිබඳ විස්තර ඇමුණුම 02හි දක්වා ඇත.

ඇමුණුම 02:

අනු අංකය	පුද්ගලයාගේ/ ආයතනයේ නම	පැවරීම සඳහා පදනම	සැලසුම් අංකය හා කැබලි අංකය	බිම් ප්‍රමාණය	වටිනාකම	කාල සීමාව
01	නමරා දිසානායක මිය	අදාල පාර්ශවය විසින් සිදු කරන ලද ඉල්ලීම් සැලකිල්ලට ගනිමින් රථවාහන නැවතුම් ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා බදු පදනමින් ලබා දී ඇත.	මු.පි.කො. 7969 කැ.අ. 19A	පර් 25.05	රු. 16,460,000.00 (රජයේ ප්‍රධාන නක්ෂේරුකරු විසින් නිරණය කරන ලද 30 අවුරුදු බදු වටිනාකම)	අවුරුදු 30
02	ධර්මායතනය ආරක්ෂක සභාව	ධර්මායතනය ආරක්ෂක සභාව විසින් සිදු කරන ලද ඉල්ලීමක් සැලකිල්ලට ගෙන ලක්විරු සෙවන ආබාධිත රණවිරු වෘත්තිය පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා බදු පදනමින් ලබා දී ඇත.	මු.පි.කො. 7969 කැ.අ. 20	පර් 41.83	රු.50,000.00 (එවකට මෙම අධිකාරිය විසින් අනුගමනය කරනු ලැබූ සහනදායී ගෙවීම් පදනම මත වාර්ෂික නාමික බදු කුලිය)	අවුරුදු 30
03	ඩී ඒ රාජපක්ෂ අනුස්මරණ අධ්‍යාපන සංස්කෘතික සහ සමාජ සුභසාධන පදනම	ඩී ඒ රාජපක්ෂ අනුස්මරණ අධ්‍යාපන සංස්කෘතික සහ සමාජ සුභසාධන පදනම විසින් සිදු කරන ලද ඉල්ලීමක් සැලකිල්ලට ගෙන වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා බදු පදනමින් ලබා දී ඇත.	මු.පි.කො. 7969 කැ.අ. 22	පර් 27.87	රු. 163,125.00 (එවකට මෙම අධිකාරිය විසින් අනුගමනය කරනු ලැබූ සහනදායී ගෙවීම් පදනම මත වාර්ෂික නාමික බදු කුලිය)	අවුරුදු 30
			2016 වසරේදී බදු ගිවිසුම අවලංගු කොට සත්තකය ලබා ගැනීමට කටයුතු කර ඇත. එහෙත් ඊට එරෙහිව ඩී ඒ රාජපක්ෂ අනුස්මරණ පදනම විසින් අභියාචනාධිකරණයේ නඩු පවරා ඇති අතර එම නඩුව විභාග වෙමින් පවතී. (CA Writ 58/2017)			

(iii) නැත.
උක්ත ඉඩම් කොටස් සින්නක්කර පදනම යටතේ බැහැර කර නොමැත. (එම ඉඩම් කොටස් 30 අවුරුදු බදු පදනමින් පමණක් බැහැර කර ඇත.)

(ඇ) (i) මෙම ඉඩම් පවරා ගැනීමේ කොන්දේසි යටතේ නාගරික සංවර්ධන අධිකාරියේ අවශ්‍යතා සඳහා යොදාගත හැකි ලෙස ඉඩම් අත්කර ගැනීමේ පනතේ 44 වන වගන්තිය යටතේ බලය පැවරීමක් කර ඇත. (44 වන පැවරුම් සහතිකය ඇමුණුම 03 ලෙස දක්වා ඇත.)

ඇමුණුම 03 **සභාගත*** කරමි.

නාගරික සංවර්ධන කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත අත්පත් කරගෙන ඇති ඉඩම් කොටස් 2018 වර්ෂයට පෙර රාජ්‍ය/අර්ධ රාජ්‍ය/පෞද්ගලික ආයතන හෝ පෞද්ගලික පාර්ශ්වයන් විසින් සිදු කරන ලද ඉල්ලීම් සැලකිල්ලට ගෙන අධිකාරියේ කළමනාකරණ මණ්ඩල අනුමැතිය සහ විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ඉල්ලුම් කරන ලද ඉඩම් කොටස් සංවර්ධන කටයුතු සඳහා බදු පදනම යටතේ බැහැර කර ඇත.

ඒ අනුව, ඇමුණුම 02හි දක්වා ඇති පෞද්ගලික පාර්ශ්වයන් සඳහා ඔවුන්ගේ ඉල්ලීම පරිදි ඉඩම් කොටස් 3ක් එවකට නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩල අනුමැතිය සහ විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය සහිතව බැහැර කර ඇත.

(ii) සංවර්ධන කටයුතු සඳහා පෞද්ගලික පාර්ශ්වයන් වෙත/ආයතන වෙත ඉඩම් බැහැර කිරීමේදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් එවකට අනුගමනය කරන ලද ඉඩම් බැහැර කිරීමේ ප්‍රතිපත්ති ප්‍රකාරව නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩල තීරණයන් හා විෂය භාර ගරු අමාත්‍යතුමාගේ අනුමැතීන් ලබා ගැනීමෙන් අනතුරුව අදාළ ඉඩම් බැහැර කිරීම් සිදු කර ඇත.

කෙසේ වෙතත්, එම බැහැර කිරීම් නීති විරෝධී බවට තීරණයක් ලදහොත් එම තීරණය පරිදි ඉදිරි කටයුතු සිදු කළ හැක.

(ඈ) ඉහත (ඇ) (ii)ට අදාළ පිළිතුරෙහි සඳහන් පරිදි කටයුතු කරනු ලැබේ.

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාත් දන්නවා, බත්තරමුල්ල ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත කියන්නේ, අධික ඉඩම් වටිනාකමක් තිබෙන ප්‍රදේශයක් බව. ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත සහ ඊට යාබද රාජ්‍ය ආයතන පරිශ්‍රය නිර්මාණය කිරීම සඳහාම තමයි - මේ ඉඩම් සංවර්ධනය කිරීම සඳහා - එවකට පැවැති රජය විසින් 80-90 දශකයේ මුල මේ තීන්දුව අරගෙන කටයුතු කරලා තිබෙන්නේ. මෙහි මූලික අරමුණ වෙලා තිබෙන්නේ, පෞද්ගලික පාර්ශ්වයන්ට තිබුණු මේ ඉඩම් රජයට පවරා ගෙන රජයේ පොදු කටයුත්තක් සඳහා යොදා ගැනීමයි. ඒ

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

කියන්නේ, රාජ්‍ය ආයතන ඉදිකිරීම සඳහා තමයි මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබෙන්නේ. නමුත් ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ පිළිතුරෙන් පෙනී යනවා යම්, යම් අවස්ථාවල නාගරික සංවර්ධන අධිකාරියේ එවකට සිටි විෂය භාර අමාත්‍යතුමා සහ කළමනාකරණ මණ්ඩලය විසින් පෞද්ගලික අරමුණු සඳහා මේ ඉඩම් යම් ප්‍රමාණයක් බැහැර කර තිබෙන බව. එහිදී ගරු නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කළ පරිදි තමාරා දිසානායක මහත්මියට පර්චස් 25ක ඉඩම් ප්‍රමාණයක් රුපියල් මිලියන 16ක මුදලකට බැහැර කරලා තිබෙනවා, අවුරුදු 30ක බදු පදනමින්. ගරු කථානායකතුමනි, ඊට අමතරව ඩී.ඒ. රාජපක්ෂ අනුස්මරණ අධ්‍යාපන සංස්කෘතික හා සමාජ සුබසාධන පදනමට පර්චස් 27.87ක් වෙන් කරලා තිබෙනවා. සහනදායී ක්‍රමයට රුපියල් 163,000කට තමයි මේ පර්චස් 27ම බැහැර කරලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, ඊට අමතරව තවත් ආයතනයක් තිබෙනවා.

මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන අතුරු ප්‍රශ්නය මෙයයි. පෞද්ගලිකව පරිහරණය කරපු ගොඩ ඉඩම් හෝ කුඹුරු ඉඩම් රාජ්‍යයේ පොදු කටයුත්තක් සඳහා පවරා ගෙන රජයේ ගොඩනැඟිලි සඳහා, රජයේ පොදු කාර්යයන් සඳහා වෙන් කළාම, එම ඉඩම් නාගරික සංවර්ධන අධිකාරිය බැහැර කළේ කුමන පදනමකින්ද? මා දන්නා පරිදි තමාරා දිසානායක මහත්මිය එස්.බී. දිසානායක මහතාගේ බිරිඳ. ඒ ඉඩම දැනට ඔවුන්ගේ රථ ගාලක් විධියට පාවිච්චි කරන්න තමයි යොදාගෙන තිබෙන්නේ. එතැන ඉඩම් මිල අධිකයි. ගරු කථානායකතුමනි, මේ ස්ථානයේ පර්චස් එකක වටිනාකම රුපියල් මිලියන 10ක් විතර වෙනවා. ඒත් එතැන විකුණන්න ඉඩම් නැහැ. එතකොට රජයේ පොදු කටයුත්තක් සඳහා වෙන් කරපු මේ ඉඩම් ටික යම් හිටපු ඇමතිවරුන්ගේ කටයුතුවලට යොදාගෙන තිබෙනවා. මා දන්නා පරිදි ඩී.ඒ. රාජපක්ෂ පදනමට ලබා දුන් මෙම ඉඩම තමයි CSN නාළිකාව සඳහා වෙන් කරපු ඉඩම් කොටස විධියට පසුගිය කාලයේ තිබුණේ. ඒක cancel කරන්න තීන්දු කළාට පස්සේ ඔවුන් අධිකරණයට ගිහිල්ලාත් තිබෙනවා. එතකොට පොදු අරමුණක් වෙනුවෙන් වෙන් කරපු ඉඩම් ටික නාගරික සංවර්ධන අධිකාරිය එස්.බී. දිසානායක මහත්මයාගේ රථගාලකටත්, ඩී.ඒ. රාජපක්ෂ පදනම යටතේ CSN නාළිකාව සඳහාත් වෙන් කරන්න තීරණය කළේ මොන පදනමකින්ද?

ගරු එරංග ගුණසේකර මහතා
(மாண்புமிகு எரங்க குணசேகர)
(The Hon. Eranga Gunasekara)

ගරු මන්ත්‍රීතුමනි, නාගරික සංවර්ධන අධිකාරියට අදාළව ගත්තොත්, ඔබතුමා පැහැදිලි කළා වාගේ මීට වසර ගණනාවකට පෙර අපි ඉන්න මේ පාර්ලිමේන්තු පරිශ්‍රය අයත් භූමියත්, බත්තරමුල්ල කලාපයත් පරිපාලන නගරයක් බවට පත් කරන්න අක්කර දහස් ගණනක් අත්පත් කරගෙන තිබෙනවා. ඒ ක්‍රියාවලිය තමයි එකින් එකට ඇවිල්ලා තිබෙන්නේ. එවකට සිටි දේශපාලනඥයන් මේ අත්පත් කරගැනීම කරද්දී, සාමාන්‍ය ජනතාවට එක හැන්දකිනුත්, දේශපාලන බලය තිබෙන පිරිසට තව හැන්දකිනුත් බෙදලා තිබෙනවා. ඒවාට UDA එකත් සම්බන්ධ කරගෙන තිබෙනවා. හිටපු ඇමතිවරුත් ඒවාට සම්බන්ධ වෙලා තිබෙනවා. මෙතැනදී ඔබතුමා මතු කරන නිශ්චිත ඉඩම් කොටස් දෙකට අදාළව ගත්තොත්, තමාරා දිසානායක මහත්මියට මීට අවුරුදු පහකට පෙර බදු පදනම මත තමයි මේ ඉඩම දීලා තිබෙන්නේ. නාගරික සංවර්ධන අධිකාරිය පවරා ගත්ත ඉඩම් නැවත තවත් ආයතනයකට බදු දෙන්න පුළුවන්කම තිබෙනවා. ඒත් කොන්දේසියක් තිබෙනවා.

අධ්‍යාපනික හෝ යම් විශේෂ අවශ්‍යතාවක් මත තමයි එහෙම අවසර දෙන්න පුළුවන්කම තිබෙන්නේ. ගරු අසිත නිරෝෂණ මන්ත්‍රීතුමා ඇහුවා වාගේම එවකට හිටපු ඇමතිවරුන් සහ ඒ හිටපු පිරිස විශේෂ අවශ්‍යතාව ලෙස කල්පනා කරලා තිබෙන්නේ ධනවත්, බලවත් දේශපාලනඥයන්ගේ අවශ්‍යතාව. ඒ නිසා ඒ වෙනුවෙන් තමයි මේක දීලා තිබෙන්නේ. තමාරා දිසානායක මහත්මියට මේ වෙද්දී අවුරුදු 30කට ලබා දී තිබෙනවා. තිබෙන රෙගුලාසි අනුව, නීත්‍යානුකූලව, ඒ පූර්ණ මුදල් ටික ලබා දීලා ඒ අනුව තමයි කටයුතු සිදු වෙමින් තිබෙන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහපු දෙවැනි කාරණය ගත්තොත්, ඩී.ඒ. රාජපක්ෂ අනුස්මරණ අධ්‍යාපන සංස්කෘතික සහ සමාජ සුබසාධන පදනම කියන්නේ අවසර ගන්න දාපු නම. හැබැයි, අවසර අරගෙන කරපු දේ තමයි CSN නාළිකාව සඳහා දීපු එක. ඉතින් අදාළ කර්තව්‍යයෙන් එළියට ගිහිල්ලා කටයුතු කර තිබෙන නිසා ඒක නැවත පවරා ගැනීම සඳහා කටයුතු කරමින් ඉන්නවා. ඒකට නැවතත් එම ආයතනය අධිකරණයේ නඩුවක් පවරා තිබෙනවා. ඒ නිසා ගරු මන්ත්‍රීතුමා කියපු දේ හරි. නමුත්, අපි වර්තමාන රජය විධියට කිසිදු බැහැර කිරීමක්, එක එක කෝණවලින් කරන්නේ නැහැ. ඉදිරියේදීත් එවැන්නක් සිදු නොවන බවට අපේ පැත්තෙන් සහතික වෙමින් ඒක නතර කරලා තිබෙනවා. නමුත්, පසුගිය කාලයේ කරපු දේවල් සම්බන්ධයෙන් සමහර නීති රීති, රෙගුලාසි එක්ක යම් පටලැවිල්ලක් තිබෙනවා. නමුත්, සමහර බෙරා ගන්න පුළුවන් දේවල් ජනතාව පැත්තෙන් හිතලා බෙරන්න උපරිම වශයෙන් මැදිහත් වෙනවා.

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)

ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමාට යොමු කරන මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ ඉඩම් සංවර්ධනය කිරීමේදී, ඔබතුමාගේ පිළිතුරට අන්තර්ගත වෙලා නැති තවත් ඉඩම් කොටස් තිබෙනවා. ඒවා සාම්ප්‍රදායිකව ඒ ගම්වල පදිංචි ජනතාවගේ ඉඩම්. ඒ සංවර්ධන ව්‍යාපෘතියට මුවා වෙලා 1994දී තිබුණු රජයේ සිටි අනුරාධපුර දිස්ත්‍රික්කයේ විශේෂ ඇමතිවරයෙක් මේ කටයුතු සඳහා මැදිහත් වෙලා තිබෙනවා. මේ වන විට ඒ ඉඩම්වල යම් නෛතිකමය ගැටලු ප්‍රමාණයකුත් මතු වෙලා තිබෙනවා. ඒ නිසා ඔබතුමාගේ පිළිතුරට අන්තර්ගත වෙලා නැති ඉඩම් කොටසක් මේකේ අන්තර්ගත වෙලා තිබෙනවා කියන එක තමයි, භෞතිකව නිරීක්ෂණයේදී පෙනී යන්නේ. ඒ සම්බන්ධයෙනුත් නාගරික සංවර්ධන අධිකාරියේ යම් විමර්ශන ක්‍රියාවලියක් ආරම්භ කරන ලෙස ඉල්ලා සිටිනවා.

ඒ වාගේම දැනට රාජ්‍ය ආයතන සඳහා බැහැර කර තිබෙන ඉඩම් ඌන උපයෝජනයක් සහිතව තමයි ක්‍රියාත්මක වෙන්නේ. ඒ නිසා සමහර ඉඩම්වල විශාල ලෙස කැලෑ වැවිලා තිබෙනවා. ඒ හේතුවෙන් පරිපාලන නගරයට අවලස්සනකුත් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා රජයේ ආයතන සඳහා බැහැර කරපු ඉඩම්, ඒ ඇත්ත අරමුණින් පරිහරණය කිරීම සඳහා වූ යම් ක්‍රමවේදයක් නාගරික සංවර්ධන අධිකාරියෙන් අනුගමනය කළ යුතුව තිබෙනවා. ඒ නිසා ඔබතුමාගෙන් අහනවා, ඉදිරියේදී මේ පරිපාලන නගරයේ සංවර්ධන සැලැස්මත් එක්ක එක පැත්තකින් අනීතිකව බැහැර කරලා තිබෙන මේ ඉඩම් පවරා ගැනීම සඳහා කුමන ආකාරයෙන් කටයුතු කරනවාද කියලා. ඒ වාගේම රජයේ ආයතන සඳහා බැහැර කරපු ඉඩම්, ඌන උපයෝජනයක් සහිතව ක්‍රියාත්මක වෙන ඉඩම්, නිවැරැදි සංවර්ධන ක්‍රියාවලියක් සඳහා යොදවා ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ නගර සැලසුම් ක්‍රියාවලිය සඳහා මොන ආකාරයෙන් පාවිච්චි කරන්න බලාපොරොත්තු වෙනවාද කියන එකත් ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

ගරු එරංග ගුණසේකර මහතා
(மாண்புமிகு எரங்க குணசேகர)
(The Hon. Eranga Gunasekara)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නයේ පළමුවැනි කොටසට මම මුලින් පිළිතුරු ලබා දෙන්නම්. බත්තරමුල්ල සම්පූර්ණ පරිපාලන නගරයක් ලෙස පවරා ගැනීමේදී අක්කර දහසක පමණ ප්‍රමාණයක් පවරා ගෙන තිබෙනවා. නමුත් ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ තවත් යම් ඉඩම් ප්‍රමාණයක් තිබෙනවා. නාගරික සංවර්ධන අධිකාරිය යටතේ දැනට තිබෙන නිල ලේඛන අනුව ඒවා නාගරික සංවර්ධන කොටසට අයිති වෙලා නැහැ. බැලූ බැල්මට පෙනී යන්නේ එම ඉඩම් කොටස් අත්පත් නොවුණේ ඇයි කියන කාරණයයි. නමුත් නිල ලේඛනවල තිබෙන ආකාරයට එම ඉඩම් ටික නාගරික සංවර්ධන කොටසට අයිති නැහැ. ඒ, පළමු කොටසට පිළිතුර.

දෙවනුව ගරු මන්ත්‍රීතුමා ඇසුවේ, එම පරිපාලන නගරයේ ඉතුරු ඉඩම් ටික කළමනාකරණය කරන්නේ කෙසේද කියලායි. බත්තරමුල්ල පරිපාලන නගරය වෙනුවෙන් අපි විශේෂ මැදිහත්වීමක් කරමින් තිබෙනවා. ඒ අනුව අපි සෙත්සිරිපායේ Stage III වැඩ කටයුතු ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම ගරු ජනාධිපතිතුමා අපව දැනුවත් කර තිබෙනවා, 4වැනි අදියරේ කටයුතුත් පටන් ගන්න කියලා. ඒ නිසා තානාපති කාර්යාලවලත්, රජයේ ආයතනවල තව තිබෙන අවශ්‍යතා අනුවත් අපි ඉතුරු ඉඩම් ටික භාවිත කරනවා. ඒ වාගේම පරිපාලන නගරයේ සනීපාරක්ෂක කටයුතු, ජනතාවට ඒ තුළ තිබෙන සුව පහසුව සම්බන්ධයෙන් වන විධිමත් අධ්‍යයනයක් ද කරමින් පවතිනවා. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, ඉතුරු ඉඩම් ටිකත් නිශ්චිත උපයෝගීතාවට පාවිච්චි කරමින් ජනතාවට පහසුවෙන් එම පරිපාලන නගරය තුළට සම්බන්ධවීමට අදාළ කරන වැඩ පිළිවෙළ සකස් කරන්න. ගරු මන්ත්‍රීතුමනි, අපට එම වැඩ පිළිවෙළ ලබන වසරේදී ක්‍රියාත්මක කිරීමට පුළුවන් වෙනවා.

වතු ආශ්‍රිත පාසල්: විස්තර
தோட்டப்புற பாடசாலைகள்: விபரம்
SCHOOLS IN ESTATE SECTOR: DETAILS

2456/2026

9. ගරු ධනුෂ්ක රංගනාත් මහතා
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ වතු ආශ්‍රිත පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව එක් එක් පාසල් වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පාසල්වල පවතින ශිෂ්‍ය-ගුරු අනුපාතය කවරේද;

(iv) එම පාසල්වල අධ්‍යාපනය ලබන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) වතු ආශ්‍රිත පාසල්වලට වාර්ෂිකව පළමු ශ්‍රේණිය සඳහා ඇතුළත් වන සිසුන් සංඛ්‍යාවේ සාමාන්‍යය කොපමණද;

(ii) 2026 වර්ෂයේ පළමු ශ්‍රේණිය සඳහා ඇතුළත් කරන ලද සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iii) වතු ආශ්‍රිත පාසල්වලින් 2025 වර්ෂයේ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටි සිසුන් ප්‍රතිශතය කොපමණද;

(iv) එම විභාගයෙන් සමත් වූ සිසුන් ප්‍රතිශතය කොපමණද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையிலுள்ள தோட்டப்புற பாடசாலைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி எண்ணிக்கை ஒவ்வொரு பாடசாலை வகைப்படுத்தலுக்கு அமைவாக வெவ்வேறாக யாது என்பதையும்;

(iii) மேற்படி பாடசாலைகளில் காணப்படுகின்ற மாணவர் - ஆசிரியர் விகிதம் யாது என்பதையும்;

(iv) மேற்படி பாடசாலைகளில் கல்வி கற்கும் மாணவர்களின் மொத்த எண்ணிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) தோட்டப்புற பாடசாலைகளுக்கு வருடாந்தம் முதலாம் தரத்துக்கு அனுமதிக்கப்படும் மாணவர்களின் சராசரி எண்ணிக்கை யாது என்பதையும்;

(ii) 2026ஆம் ஆண்டில் முதலாம் தரத்துக்கு அனுமதிக்கப்பட்ட மாணவர்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(iii) தோட்டப்புற பாடசாலைகளில் இருந்து 2025ஆம் ஆண்டில் க.பொ.த. (சாதாரண தரம்) பரீட்சைக்குத் தோற்றிய மாணவர்களின் சதவீதம் யாது என்பதையும்;

(iv) மேற்படி பரீட்சையில் சித்தியடைந்த மாணவர்களின் சதவீதம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -
  (i) the number of schools situated in the estate sector in Sri Lanka;
  (ii) the breakdown of the aforesaid number, separately by each school type;
  (iii) the student-teacher ratio existing in the aforesaid schools; and
  (iv) the total number of students studying in the aforesaid schools?

(b) Will she also inform this House -
  (i) the average number of students admitted annually to Grade 1 in estate schools;
  (ii) the number of students admitted to Grade 1 in the year 2026;
  (iii) the percentage of students from estate schools, who sat for the G.C.E. (Ordinary Level) Examination in the year 2025; and
  (iv) percentage of students who passed the aforesaid examination?

(c) If not, why?

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ශ්‍රී ලංකාවේ වතු ආශ්‍රිත පාසල් සංඛ්‍යාව 849කි.

(ii)

පාසල් වර්ගය	පාසල් සංඛ්‍යාව
Type 3	402
Type 2	268
1C	148
1AB	31
Total	**849**

(iii) එම පාසල්වල පවතින ශිෂ්‍ය-ගුරු අනුපාතය ආසන්න වශයෙන් 14:1ක් වෙනවා.

(iv) එම පාසල්වල අධ්‍යාපනය ලබන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව - 191,522යි.

(ආ) (i) වතු ආශ්‍රිත පාසල්වලට වාර්ෂිකව පළමු ශ්‍රේණිය සඳහා ඇතුළත් වන සිසුන් සංඛ්‍යාවේ සාමාන්‍යය 14,320යි. මෙම ගණනය කිරීම කරලා තිබෙන්නේ, ඒ ඒ වතු පාසල් සංඛ්‍යාව සඳහා සාමාන්‍යය විධියට නොවෙයි, සියලු වතු පාසල් සඳහා අවුරුදු 5ක කාල සීමාවක සාමාන්‍යය විධියටයි.

(ii) 2026 වර්ෂයේ පළමු ශ්‍රේණිය සඳහා ඇතුළත් කරන සිසුන් සංඛ්‍යාව 13,531යි.

(iii) වතු ආශ්‍රිත පාසල්වලින් 2025 වර්ෂයේ අ.පොෂ. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව ආසන්න වශයෙන් සියයට 4.25යි. 2025 වර්ෂයේ අ.පොෂ. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටි මුළු සිසුන් සංඛ්‍යාව 308,562යි. 2025 වර්ෂයේ අ.පොෂ. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටි වතු පාසල් සිසුන් සංඛ්‍යාව 13,375යි.

(iv) එම විභාගයෙන් සමත්ව අ.පොෂ. (උසස් පෙළ) සඳහා සුදුසුකම් ලැබූ වතු පාසල් සිසුන් සංඛ්‍යාව සියයට 65.3යි. අ.පොෂ. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව අ.පොෂ. (උසස් පෙළ) සඳහා සුදුසුකම් ලැබූ මුළු වතු පාසල් සිසුන් සංඛ්‍යාව 8,734යි. ජාතික මට්ටමෙන් අ.පොෂ. (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව අ.පොෂ. (උසස් පෙළ) සඳහා සුදුසුකම් ලැබූ මුළු සිසුන් සංඛ්‍යාව සියයට 73.16යි.

(ඇ) අදාළ නොවේ.

ගරු ධනුෂ්ක රංගනාත් මහතා
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)

ගරු කථානායකතුමනි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා වෙත යොමු කරන මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ ප්‍රශ්නය ඔබතුමා වෙත යොමු කළ හේතුව මම කියන්නම්. විශේෂයෙන්ම වතු ආශ්‍රිත පාසල්වල ඉගෙනුම ලබන දරුවන්ගේ භෞතික පහසුකම් සම්බන්ධයෙන් පසුගිය කාලය වන විට දැඩි අර්බුදකාරී තත්ත්වයක් පැන නැඟී තිබුණා. වත්මන් ආණ්ඩුව ඉදිරියේදී ගෙන එනු ලබන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය තුළ සියලු දරුවන්ට අධ්‍යාපනය සඳහා සමාන අයිතිවාසිකම් තහවුරු වන පරිදි කටයුතු කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කර තිබෙනවා. අධ්‍යාපන ප්‍රවේශයේදී එම සම අයිතිය තහවුරු කිරීමේදී වතු ආශ්‍රිත පාසල්වලට විශේෂයක් කොට සලකන්නට වෙනවා. අපි දන්නවා, එම පාසල් බොහොමයක් පළාත් පාසල් විධියටයි පවත්වාගෙන යන්නේ කියලා. එබැවින්, එම පාසල් සම්බන්ධයෙන් ජාතික මට්ටමේ වැඩ පිළිවෙළකුත් අවශ්‍ය වනවා.

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, දරුවන් ඉගෙන ගන්නා වතු ආශ්‍රිත පාසල්වල තිබෙන භෞතික පහසුකම් වැඩිදියුණු කිරීම, විශේෂයෙන්ම පන්ති කාමරවල පවතින ගැටලු විසඳීම, විද්‍යාගාර පහසුකම් වැඩිදියුණු කිරීම, පරිගණක විද්‍යාගාර සහ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍ය වනවා. ඒවාට අදාළ කටයුතු සිදු කරන්න බලාපොරොත්තු වනවාද කියන ප්‍රශ්නය මම ඔබතුමාට යොමු කරන්න කැමැතියි.

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි අතුරු ප්‍රශ්නයක් ඇසීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඔව්, විශේෂයෙන්ම පසුගිය කාලයේ වතු පාසල් සම්බන්ධයෙන් සුවිශේෂී ප්‍රශ්න කිහිපයක් පැන නැඟිලා තිබුණා. විශේෂයෙන්ම ඔබතුමා සඳහන් කළ පරිදි, භෞතික සම්පත් සම්බන්ධයෙන් කථා කරද්දි පන්ති කාමර සහිත ගොඩනැඟිලි, සනීපාරක්ෂක පහසුකම්, අනෙකුත් අවශ්‍ය මෙවලම් සහ උපාංග සම්බන්ධයෙන් ප්‍රශ්න තිබුණා. මෙහිදී මම සඳහන් කරන්න ඕනෑ, මේ වතු පාසල්වල භෞතික සම්පත් සම්බන්ධයෙන් විශේෂ වැඩසටහනක් දියත් වෙලා තිබෙන බව. ඒ අනුව දැනට නව ඉදිකිරීම්, අඛණ්ඩතාවක් ඇති ඉදිකිරීම් සම්බන්ධයෙන් රුපියල් මිලියන 500කුත්, නඩත්තු කටයුතු සඳහා රුපියල් මිලියන 100කුත් වශයෙන් යෙදවී තිබෙනවා. ඒ වාගේම ඉන්දියානු ආධාරවලින් පාසල් සංවර්ධනය කිරීම සඳහා පාසල් 9කට අදාළව මේ වෙද්දි මුදල් නිකුත් වෙලා තිබෙනවා. ඊට අමතරව GEMP කියන ව්‍යාපෘතිය තුළින් පාසල්වල සනීපාරක්ෂක කටයුතු සඳහා තමයි මූලිකත්වය දෙන්නේ. විශේෂයෙන්ම වැසිකිළි සහ පානීය ජල පහසුකම් සඳහා මේ ව්‍යාපෘතියෙන් මුදල් යෙදවෙනවා. ඒ වාගේම smart classrooms සහ උපකරණ සඳහාත්, ඩිජිටල්කරණය සම්බන්ධයෙනුත් වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේත් යම්කිසි මැදිහත්වීමක් තිබෙන අතර, ද්විතීයික පාසල් සියල්ලගේම මේ කටයුතු නිමා කරන නිසා විශේෂයෙන්ම වතු පාසල්වලටත් මේ තුළින් පහසුකමක් සැපයෙනවා.

ඊළඟට, ගුරුවරුන් රඳවා තබා ගැනීම සඳහා වැදගත්කමක් තිබෙන දෙයක් තමයි, ගුරු නිවාස. වතු පාසල් ආශ්‍රිතව ගුරු නිවාසවලත් අඩුවක් තිබුණා. දැන් ගුරු නිවාස 14ක විතර ප්‍රමාණයක් වතු පාසල් ආශ්‍රිතව නිර්මාණය කිරීම සඳහා මුදල් වෙන් වෙලා තිබෙනවා. මේ වතු ආශ්‍රිත පාසල්වල යටිතල පහසුකම් සහ භෞතික සම්පත් දියුණු කිරීම සඳහා ඒකත් ලොකු සහනයක් වෙයි කියලා අපි හිතනවා. මේ කාරණා තමයි මෙහිදී සුවිශේෂී කාරණා වන්නේ.

ඊට අමතරව ගත්තොත්, පොදුවේ ලංකාවටම වැදගත් දෙයක් තමයි, ප්‍රාථමික පාසල් දියුණු කරන වැඩසටහනක් ක්‍රියාත්මක වෙමින් පැවතීම. එතැනදීත් අපට වතු පාසල් නම් වනවා. ඒ සම්බන්ධයෙනුත් අපි අවධානය යොමු කරනවා. ඊට අමතරව ඩිජිටල්කරණය ගත්තොත්, ලංකාව පුරාම ක්‍රියාත්මක වන මෙවලම් ලබා දීම කියන කොටසේදීත් වතු පාසල් නම් වනවා. එම නිසා අපි පොදුවේ ගත්තොත්, වතු පාසල් සම්බන්ධවත් මෙහිදී සුවිශේෂී ලෙස සලකනවා. ඒ වාගේම පොදුවේ ලංකාවටම තිබෙන ප්‍රතිලාභ වතු පාසල්වලටත් ලැබෙන බව මේ අවස්ථාවේදී මා සඳහන් කරන්න කැමැතියි.

ගරු ධනුෂ්ක රංගනාත් මහතා
(மாண்புமிகு தனுஷ்க ரங்கநாத்)
(The Hon. Danushka Ranganath)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මා ඔබතුමාට යොමු කරන දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මේ වතු පාසල්වලට අදාළවම අපි දකින දෙයක් තමයි, මේ පාසල්වල පවතින ගුරු හිඟය. විශේෂයෙන්ම විද්‍යාව, ගණිතය, ඉංග්‍රීසි, තාක්ෂණවේදය වැනි විෂයයන් සඳහා වතු ආශ්‍රිතව දෙමළ භාෂාවෙන් එම විෂයයන් උගන්වන ගුරුවරුන්ගේ හිඟයක් පවතිනවා. කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත ආසනයේ තිබෙන වතු ආශ්‍රිත පාසල්වලට උගන්වන්න එන්නේ නුවරඑළිය වාගේ දුර ප්‍රදේශවලින් ආපු ගුරුවරුන්. සමහර ගුරුවරුන්ට අවුරුදු 10ක්, 12ක් තිස්සේ එකම පාසලකට උගන්වන්න සිද්ධ වෙලා තිබෙනවා, දමිළ භාෂාවෙන් උගන්වන ගුරුවරුන්ගේ හිඟය නිසා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, උපාධිධාරී ගුරුවරුන් බඳවා ගැනීමක් මේ වන විට සිදු වනවා. ඒ වාගේම අවම ලකුණු ප්‍රමාණයකින් විශ්වවිද්‍යාලයට යන්න බැරිවුණු අය ස්වේච්ඡාවෙන් උගන්වන පාසලුත් තිබෙනවා. ඒ නිසා, මේ පාසල්වල පවතින ගුරු හිඟය, ගුරු පුරප්පාඩු අවම කර ගැනීම සඳහා වූ යම් ක්‍රමවේදයක් තිබෙනවාද? ඒ වාගේම විශ්වවිද්‍යාලයට ගිහිල්ලා උපාධියක් ගන්න බැරිවුණත්, ඒ තරමට සුදුසුකම් තිබෙන අයවලුන්ට ගුරුවරයෙකු විධියට මේ ක්ෂේත්‍රයට පැමිණිය හැකි කුමන හෝ වැඩ පිළිවෙළක් තිබෙනවාද කියලාත් ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, එතුමා සඳහන් කරන්නේ වතු ආශ්‍රිතව ගැඹුරින් තිබෙන ප්‍රශ්නයක් පිළිබඳවයි. මානව සම්පත් හිඟය, ගුරු ක්ෂේත්‍රයට අදාළව ගොඩක් තිබුණා. විශේෂයෙන්ම උසස් පෙළ සමහර විෂය ධාරා වතු පාසල්වල තිබුණේ ම නැති අවස්ථා තිබෙනවා. විශේෂයෙන්ම උසස් පෙළ විද්‍යා, ගණිත විෂය ධාරා සහ සාමාන්‍ය පෙළ ඉංග්‍රීසි සහ අනෙකුත් විෂයයන් දෙමළ මාධ්‍යයෙන් උගන්වන ගුරුවරුන් හිටියේ නැහැ. මේකට මූලික හේතුවක් තිබෙනවා. මෙවර අප කරන බඳවා ගැනීම් ප්‍රමාණයක් තිබෙනවා. උපාධිධාරීන් 23,300කට ආසන්න ප්‍රමාණයක්, විද්‍යාපීඨවලින් 6,000කට ආසන්න ප්‍රමාණයක් අපි බඳවා ගන්නවා. ඊළඟට අධ්‍යාපනවේදී - B.Ed. - උපාධිධාරීන් බඳවා ගන්නත් යෝජනා වෙලා තිබෙනවා. ඒ ප්‍රමාණයත් එක්ක නිශ්චිත සංඛ්‍යාවක් ගණනය කරලා තමයි අදාළ පාසල්වලට මේ ගුරුවරුන් ස්ථානගත කරන්නේ.

අපි මේ අය විෂයානුබද්ධව ස්ථානගත කරන නිසා අපට සෑහීමකට පත් විය හැකි ප්‍රමාණයක් ස්ථානගත කරන්න පුළුවන් කියලා අපි හිතනවා. අනෙක් කාරණය, මෙම ගුරුවරුන් රැඳී සිටින බව නිශ්චිත වීම. මොකද, අපි පළාත්බදව තමයි මේ උපාධිධාරීන් බඳවා ගන්නේ. ජාතික මට්ටමින් බඳවා ගන්නා පිරිසෙන් යම්කිසි ප්‍රමාණයක් ජාතික පාසල්වලට එයි. නමුත් අපි පළාත්බදව සිදුකරන බඳවා ගැනීම් නිශ්චිතවම විෂයානුබද්ධව තමයි ස්ථානගත කරන්නේ. ඒ නිසා අපට ඔවුන්ව රඳවා ගැනීම සම්බන්ධයෙන් විශ්වාසයක් තබා ගන්න පුළුවන්. විද්‍යාපීඨ බඳවා ගැනීමත් ඒ විධියටම කරන නිසා - දිස්ත්‍රික් මට්ටමින් සහ ජාතික මට්ටමින් කරන නිසා - ඒ ප්‍රදේශයට අදාළව යම්කිසි ගුරුවරුන් ප්‍රමාණයක් රඳවා ගන්න හැකියාවක් තිබේවි කියලා අපි විශ්වාස කරනවා. මේ විධියට තමයි විශේෂයෙන් වතු ආශ්‍රිතව තිබෙන ගුරු හිඟය පියවා ගන්න අපි බලාපොරොත්තු වන්නේ.

ගරු කථානායකතුමනි, එතුමා සඳහන් කළා, දෙවැනි කාරණාවක්. දැනටත් යම්කිසි ප්‍රමාණයක් ඔය ප්‍රදේශවල ස්වේච්ඡාවෙන් රාජකාරි කටයුතු කරනවා. ඇත්තටම මේ සම්බන්ධයෙන් නිශ්චිත නීතිමය ප්‍රතිපාදන දැනට නැහැ. ගුරු සහායක පිරිසක් සම්බන්ධයෙන් මේ වෙද්දී නඩුවකුත් තිබෙනවා. ඒ නිසා නීතිමය කාරණාවකුත් මෙතැන තිබෙනවා. නමුත්, මෙතැනදී යම්කිසි මට්ටමක මැදිහත්වීමක් මෙම ස්වේච්ඡාවෙන් උගන්වන පිරිස කරපු බව අපි පිළිගන්නවා. ඒ නිසා එම නීතිමය කාරණාවටත් අවධානය යොමු කරමින් සාධාරණ මැදිහත්වීමක් කිරීමට අපි බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

ප්‍රශ්න අංක 2 -143/2024- (1), ගරු චමින්ද විජේසිරි මහතා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

ගරු කථානායකතුමනි, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා මම සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

2025 වසරේ වනඅලි මරණ සහ වනඅලි ප්‍රහාර: විස්තර
2025இல் காட்டு யானைகளின் இறப்புகள் மற்றும் காட்டு யானைகளின் தாக்குதல்கள்: விபரம்
WILD ELEPHANT DEATHS AND ATTACKS IN 2025: DETAILS

2298/2026

3. ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා (ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා වෙනුවට)
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ - மாண்புமிகு (பேராசிரியர்) எல்.எம். அபேவிக்ரம சார்பாக)
(The Hon. Darmapriya Wijesinghe on behalf of the Hon. (Prof.) L.M. Abeywickrama)

පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2025 වර්ෂය තුළ ශ්‍රී ලංකාවෙන් වාර්තා වූ වනඅලි මරණ සංඛ්‍යාව;

(ii) එම වර්ෂය තුළ සිදු වූ වනඅලි ප්‍රහාර සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ වනඅලි සංක්‍රමණික තීරු (අලිමංකඩ) සහ ඒ ආශ්‍රිත ප්‍රදේශ ආවරණය වන පරිදි මේ වනවිට පවතින විදුලි වැටවල මුළු දිග කිලෝමීටර කොපමණද;

(ii) 2025 වර්ෂය තුළ විදුලි වැටවල් ඉදිකිරීම සහ නඩත්තු කිරීම සඳහා වැය කරන ලද මුළු පිරිවැය කොපමණද;

(iii) අලි-මිනිස් ගැටුමට සහ වනඅලි තර්ජනයට විසඳුම් සෙවීම සඳහා 2026 වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් සකස් කර ඇති සැලැස්ම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2025ஆம் ஆண்டில் இலங்கையில் பதிவாகிய காட்டு யானைகளின் மரணங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி ஆண்டில் இடம்பெற்ற காட்டு யானைகளின் தாக்குதல்களின் எண்ணிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இலங்கையிலுள்ள காட்டு யானைகளின் வழித்தடங்கள் (யானைக் கடவைகள்) மற்றும் அது சார்ந்த பகுதிகளை உள்ளடக்கியதாக தற்போது காணப்படும் மின்சார வேலிகளின் மொத்த நீளம் கிலோமீற்றர்களில் யாது என்பதையும்;

(ii) 2025ஆம் ஆண்டில் மின்சார வேலிகளை அமைப்பதற்கும் பராமரிப்பதற்கும் செலவிடப்பட்ட மொத்தச் செலவு யாது என்பதையும்;

(iii) யானை - மனித மோதல்கள் மற்றும் காட்டு யானைகளின் அச்சுறுத்தலுக்குத் தீர்வு காண்பதற்கு 2026ஆம் ஆண்டுக்காக அமைச்சு தயாரித்துள்ள திட்டம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House the -

(i) number of wild elephant deaths reported in Sri Lanka during the year 2025; and

(ii) number of wild elephant attacks that occurred during that year?

(b) Will he also inform this House the -

(i) total length in kilometres of the existing electric fences covering wild elephant migratory corridors (elephant corridors) and their associated areas in Sri Lanka;

(ii) total cost incurred for the construction and maintenance of electric fences during the year 2025; and

(iii) plan formulated by the Ministry for the year 2026 to find solutions to the human-elephant conflict and wild elephant threats?

(c) If not, why?

ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මම **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 455යි.

(ii) ඔව්.

වනඇලි ප්‍රහාර ලෙස වෙනම දත්ත වාර්තා කිරීමක් සිදු නොකරන අතර, එම වර්ෂය තුළ සිදු වන මිනිස් මරණ, ශාරීරික හානි වනඇලි ප්‍රහාර ලෙස සලකා බලනු ලැබේ. ඒ අනුව 2025 වර්ෂයේ සිදු වී ඇති මිනිස් මරණ හා ශාරීරික හානි පහත පරිදි දැක්වේ.

මිනිස් මරණ සංඛ්‍යාව - 160

ශාරීරික හානි සංඛ්‍යාව - 211

(ආ) (i) බොහෝ විට විදුලි වැට ඉදිකිරීම අදාළ ප්‍රදේශයන්හි පවතින භෞතික තත්ත්වයන් අනුව රක්ෂිත මායිම් ආශ්‍රිතව ඉදිකිරීම සිදු වේ. ඒ අනුව මේ වනවිට පවතින විදුලි වැටෙහි මුළු දිග ප්‍රමාණය කිලෝමීටර් 5787.89කි.

(ii) 2025 වර්ෂය තුළ විදුලි වැටවල් ඉදිකිරීම හා නඩත්තු කිරීම සඳහා වැය වී ඇති මුළු මුදල රුපියල් මිලියන 618.89කි. එම වියදම පහත පරිදි වේ.

විදුලි වැට ඉදිකිරීම	- රු.මි. 57.11
මුර කුටි ඉදිකිරීම	- රු.මි. 40.68
විදුලි වැට උපකරණ මිලදී ගැනීම	- රු.මි. 174.78
සිවිල් ආරක්ෂක භටයින්ගේ ආහාර දීමනා හා විදුලි වැට නඩත්තු ඉන්ධන	- රු.මි. 293.20
නඩත්තු උපකරණ	- රු.මි. 2.40
විදුලි වැට නඩත්තු සඳහා වියදම	- රු.මි. 50.72

(iii) 2026 සැලසුම සකස් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව 27දෙනෙකුගෙන් යුක්ත කමිටුවක් පත්කර ඇති අතර එම කමිටුව මඟින් මේ වනවිට අදාළ සැකැස්ම සකස් කරමින් පවතී.

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

නීතිවිරෝධී මත්පැන් භාවිතය පාලනය කිරීම
சட்டவிரோத மதுபான நுகர்வை கட்டுப்படுத்தல்
CONTROL OF CONSUMPTION OF ILLICIT LIQUOR

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා පහත සඳහන් ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

නීති විරෝධී මත්පැන් නිෂ්පාදනය හා පරිභෝජනය, එහි සෞඛ්‍ය බලපෑම් සහ මත්පැන් බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳ මහජන වැදගත්කමකින් යුත් කරුණක් ඉදිරිපත් කරමි.

නීත්‍යානුකූල මත්පැන් සඳහා පනවා ඇති ඉහළ බදු හේතුවෙන් ඒවායේ මිල ඉහළ ගොස්, අඩු ආදායම්ලාභීන් මිල අඩු, නීති විරෝධී මත්පැන් වෙත යොමු වන බවට කනස්සල්ලක් පවතී. එවැනි මත්පැන් නිසා විෂවීම්, ස්ථිර ආබාධ සහ මරණ සිදු විය හැකි අතර, ප්‍රතිකාර සඳහා රජයට අමතර වියදම් දැරීමට සිදු වේ.

[ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

මත්පැන් බදු ආදායම හා මත්පැන් ආශ්‍රිත සෞඛ්‍ය වියදම් සැසඳීමද වැදගත්ය.

ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා, ගරු වාමර සම්පත් මන්ත්‍රීතුමාත් මේ පාර්ලිමේන්තුවේ දිගටම මේ ගැන කියා තිබෙන බව. එතුමා ගල් බෝතලයේ මිල අඩු කරන්න කියලා කියනකොට සමහර අය ඒක විහිළුවක් හැටියට ගත්තා. ගරු සෞඛ්‍ය ඇමතිතුමාත් මේ අවස්ථාවේදී සභාවේ සිටිනවා. බදුවලින් අපට ලැබෙන ආදායමට වඩා නීති විරෝධී මත්පැන් පානය කිරීම නිසා ලෙඩ හැදෙන අයට බෙහෙත් ගන්න යන වියදම වැඩියි. ඒ නිසායි බදු ආදායම සමඟ මේක සසඳන්න කියලා අපි කියන්නේ.

යාපනය සහ කිලිනොච්චි දිස්ත්‍රික්කවල යෝජිත නව මත්පැන් අලෙවිසැල් සම්බන්ධයෙන් ප්‍රාදේශීය විරෝධතා මතු වී තිබේ. එසේම හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ පාලන සමයේ 2024දී නිකුත් කළ බවට අනාවරණය වූ මත්පැන් බලපත්‍ර 361ක් පිළිබඳව දේශපාලන අනුග්‍රහය සහ අල්ලස් සම්බන්ධ චෝදනා එල්ල විය. ඒවා විමර්ශනය කර අදාළ නම් හෙළිදරව් කරන බවට වත්මන් රජය දුන් පොරොන්දුවේ ප්‍රගතිය පැහැදිලි කළ යුතුය.

ගරු කථානායකතුමනි, අපේ කැබිනට් මාධ්‍ය ප්‍රකාශකතුමා මේ ලැයිස්තුව පාර්ලිමේන්තුවේ ඉදිරිපත් කළා. මේවා ගැන කටයුතු කරනවාය කියලා එතුමා කිව්වා. ඒ ගැන තමයි මේ ප්‍රශ්න අහන්නේ.

ඒ අනුව, මා පහත ප්‍රශ්න යොමු කරමි.

1. නීති විරෝධී මත්පැන් සම්බන්ධව වැරදි කරන පුද්ගලයන්ට දඬුවම් වැඩි කිරීම සඳහා නීති සංශෝධනය කිරීමට සුරාබදු දෙපාර්තමේන්තුවට නිශ්චිත වැඩ පිළිවෙළක් තිබේද?

ගරු අධිකරණ ඇමතිතුමාත් මේ වෙලාවේ සභාවේ සිටිනවා. ගරු අධිකරණ ඇමතිතුමනි, නීති විරෝධී මත්පැන්, ඒ කියන්නේ කසිප්පු වාගේ දෙයක් ගත්තොත්, දැන් තිබෙන පනත අනුව කසිප්පු බෝතලය අහු වුණා, ගියා, දඩය ගැහුවා, ගෙදර ආවා. මේක තමයි තත්ත්වය. කසිප්පුවලට - නීති විරෝධී මත්පැන් සඳහා - තිබෙන දඩ මුදල කිසිසේත්ම ප්‍රමාණවත් නැහැ. ඒකට නඩු ක්‍රියාමාර්ගයක් යන්නෙත් නැහැ, ඒකට දඬුවම් දෙන ක්‍රමවේදයකුත් හරියට නැහැ.

2. සුරාබදු දෙපාර්තමේන්තුව මඟින් 2025දී සහ 2026 මේ දක්වා දිස්ත්‍රික්ක අනුව පවරා ඇති නඩු සංඛ්‍යාව, නැවත වැරදි කළ පුද්ගලයන් සංඛ්‍යාව සහ අත්අඩංගුවට ගත් මත්පැන් ප්‍රමාණය කොපමණද?
3. ඉහළ බදු හේතුවෙන් නීති විරෝධී මත්පැන් භාවිතය වැඩි වී තිබේදැයි අධ්‍යයනය කර තිබේද? වාර්ෂික මත්පැන් බදු ආදායම, මත්පැන් ආශ්‍රිත රෝහල් ගතවීම්, මරණ සහ රජයේ ප්‍රතිකාර වියදම් කොපමණද?
4. 2024 සැප්තැම්බර් සිට යාපනය සහ කිලිනොච්චියේ යෝජිත, අනුමත හා නිකුත් කළ නව බලපත්‍ර සංඛ්‍යාව, ස්ථාන සහ වත්මන් තත්ත්වය කුමක්ද? ප්‍රජා විරෝධතා සලකා බලන්නේද?

කෞරව සභානායකතුමනි, තව්පොළුතු යාෆ්පාණත්තිල් පුතිතාක නාන්කු මතුපානසාලෙකළුක්කු අනුමති වළංකුවතර්කාන නටවටික්කෙකළ් එටුක්කප්පට්ටු වරුකින්රන. අතර්කු මක්කළ් මත්තියිල් එතිර්ප්පු ඉරුක්කින්රතු. තේසිය මක්කළ් සක්තියින් පාරාළුමන්ර උරුප්පිනර්කළුම් ඉතර්කු එතිරාක ඉරුප්පතාක නාන් කේල්විප්පට්ටේන්.

අතේපෝල්, කිලිනොච්චි මාවට්ටත්තිලුම් පුතිතාක ඉරණ්ටු මතුපානසාලෙකළුක්කු අනුමති වළංකප්පටප් පෝකින්රතු. මේර්කුරිත්ත නාන්කු මතුපානසාලෙකළුම් වන්තාල්, යාෆ්ප්පාණත්තිලුළ්ළ මතුපානසාලෙකළින් එණ්ණික්කෙ 65ඉලිරුන්තු 69ආක අතිකරික්කුම්. අතාවතු, 10,000 පේරුක්කු ඔරු මතුපානසාලෙ එන්ර අටිප්පටෙයිල් ඉරුක්කුම්. එර්කනවේ, කිලිනොච්චියිල් 4,000 පේරුක්කු ඔරු මතුපානසාලෙ එන්ර අටිප්පටෙයිල් ඉරුක්කින්රතු. මේර්පටි ඉරණ්ටු මතුපානසාලෙකළුම් වන්තාල්, 3,500 පේරුක්කු ඔරු මතුපානසාලෙ එන්ර අටිප්පටෙයිල් ඉරුක්කුම්.

5. 2024දී හෙළි කළ බලපත්‍ර 361හි වත්මන් තත්ත්වය කුමක්ද? ඒවා නිර්දේශ කළ දේශපාලනඥයන්, බලපත්‍රලාභීන්, විමර්ශන ප්‍රතිඵල සහ අවලංගු කළ බලපත්‍ර පිළිබඳ ලැයිස්තුවක් සභාගත කරන්නේද?

මෙය, ජාතික ජන බලවේගය මැතිවරණයට කලින් දේශපාලන වෙදිකාවල දුන් පොරොන්දුවක්. දේශපාලන අල්ලසක් ලෙස දුන්නා, මේවාට අපි ක්‍රියාමාර්ග ගන්නවා කියලා.

6. දේශපාලන අල්ලස් ලෙස බලපත්‍ර ලබා දුන් බවට වූ චෝදනා සම්බන්ධයෙන් ගත් පියවර මොනවාද? පොරොන්දු වූ තොරතුරු මෙතෙක් සම්පූර්ණයෙන් හෙළි නොකළේ ඇයි?

මෙම ප්‍රශ්නවලට සවිස්තරාත්මක පිළිතුරක් ලබා දෙන ලෙස මා ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා.

කෞරව සභානායකර් අවර්කළේ, මික මුක්කියමාන ඔරු පිරච්සිනෙ තොටර්පාකච් චොල්ල වේන්ටුම්. තර්පෝතු යාෆ්ප්පාණම්, කිලිනොච්චි මාවට්ටඞ්කළිල් පුතිතාක මතුපානසාලෙකළ් අමෙප්පතර්කාන අනුමති වළංකප්පටප් පෝවතාකක් කේල්විප්පට්ටේන්. ඉතු සම්පන්තමාක මක්කළ් මත්තියිල් පාරිය එතිර්ප්පු ඉරුක්කින්රතු. කුරිප්පාක, ආලයංකළ්, පාටචාලෙකළ් ඉරුක්කින්ර පිරතේසංකළුක්කු අණ්මිත්ත පිරතේසංකළිල් ඉන්ත මතුපානසාලෙකළෙ අමෙක්කප්පෝවතාකච් චොල්ලප්පටුකින්රතු. ඉතර්කු අනුමති වළංකුමාරු පිරතේස චෙයලාළර්කළුක්කුම් අළුත්තම් වළංකප්පටුවතාකච් චොල්ලප්පටුකින්රතු. ඉතු මිකවුම් මෝචමාන ඔරු චෙයර්පාටාකුම්. වටක්කු මාකාණ අපිවිරුත්තියින් අම්චමාක පුතිය මතුපානසාලෙකළෙ උරුවාක්කුවතර්කාන තිට්ටම් තේචිය මක්කළ් චක්ති අරචාංකත්තින්කීළ් නටෙපෙරක්කූටාතු. ඉතු වන්මෙයාකක් කණ්ටික්කප්පට වේන්ටිය විටයමාකුම්.

කෞරව සභානායකර් අවර්කළේ, එංකළුටෙය කෞරව පාරාළුමන්ර උරුප්පිනර් ශ්‍රීනේචන් අවර්කළ් පෙයරුටන් චුට්ටික්කාට්ටිය විටයම් චම්පන්තමාකවුම් කුරිප්පිට විරුම්පුකිරේන්. තිරාය්මටු පෝන්ර ඉටංකළිල් තර්ෂන් එන්ර ඔරු කුරිප්පිට්ට නපර්, පකිරංකමාක පොතු ඉටංකළිල් වටිචාරාරාය්මම් විර්පනෙ චෙය්තු වරුකිරාර්. අවරුක්කු එතිරාක එන්තවොරු නටවටික්කෙයුම් එටුක්කප්පටුවතිල්ලෙ. මට්ටක්කළප්පු මාවට්ටත්තෙ එටුත්තුක්කොණ්ටාල්, අන්ත මාවට්ටම් මුළුවතුම් වටිචාරාරායත්තාල් එංකළුටෙය මක්කළින් වාෆ්වාතාරම් මුළුමෙයාක අෆික්කප්පටුකින්රතු. ඉතර්කුක් කාරණම්, වටිචාරාරායම් විර්පවර්කළුක්කු, කටත්තුපවර්කළුක්කු අල්ලතු උර්පත්তි චෙය්පවර්කළුක්කු එතිරාක වළංකප්පටුකින්ර තණ්ටනෙ පෝතුමානතාක ඉල්ලෙ. ආකවේ, ඉව්වාරාන චෙයර්පාටුකළෙක් කට්టුප්පටුත්තුම් වකෙයිල් චට්ටත්තෙ මාර්රියමෙක්ක වේන්ටුම්. ඉතු තොටර්පිලේ එනතු කේල්විකළෙ මුන්වෛක්කින්රේන්. නන්රි.

තවත් කාරණයක් කියන්න තිබෙනවා, ගරු කථානායකතුමනි. ඊයේ දවසේදී මම කිව්වේ ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න ඇසීම සම්බන්ධයෙන් අපිටත් වේලාව දෙන්න කියලා මිසක්, කාටවත් වේලාව දෙන්න එපා කියලා නොවෙයි. ඔබතුමා මේ සභාවේදී කිව්වා, රාසමාණික්කම් මන්ත්‍රීතුමාත් එහෙම කිව්වාය කියලා. මම කිව්වේ අපිටත් වේලාව දෙන්න කියන කාරණය විතරයි කියන එකත් මේ අවස්ථාවේදී කියන්න ඕනෑ.

බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නිශාන්ත ජයවීර නියෝජ්‍ය අමාත්‍යතුමා.

ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)

ගරු කථානායකතුමනි, ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. වැරදි කරන පුද්ගලයන්ට දඩුවම් වැඩි කිරීම සඳහා සුරාබදු ආඥාපනතට සංශෝධන ගෙන ඒමට දැනටමත් කෙටුම්පතක් සකස් කර ඇති අතර, ඊට අදාළ ක්‍රියාවලිය මේ වනකොටත් ආරම්භ කර තිබෙනවා.

   ගරු මන්ත්‍රීතුමනි, දැනට තිබෙන සුරාබදු ආඥාපනත සංශෝධනය කරලා, ඔබතුමා බලාපොරොත්තු වන නීති සංශෝධන ඉදිරියේදී ඒකට ඇතුළත් වෙලා, ඉතාම කෙටි කාලයක් තුළ එම පනත් කෙටුම්පත සම්මත කරගන්න අපි බලාපොරොත්තු වෙනවා. මොකද, දැනට තිබෙන සුරාබදු ආඥාපනතේ අඩුපාඩු හඳුනාගෙන ඒවා නිවැරදි කරලා, සුරාබදු ආඥාපනතට නව සංශෝධන ඇතුළත් වෙලා ඉදිරියේදී පාර්ලිමේන්තුවේදී ඒවා සම්මත වෙයි.

2. 2025, 2026 වසර පිළිවෙළින් ගත්තොත්, 2025 වසරේ ග්‍රහණ 34,945කුත්, 2026 වසරේ ග්‍රහණ 26,992කුත් සිදු කර ඇති අතර දිස්ත්‍රික්ක අනුව මේ පිළිබඳව වැඩිදුර තොරතුරු ඇමුණුම 01හි දක්වා ඇත.

3. 2023 වසරේ සිට 2025 වසර දක්වා මත්පැන් මත සුරා බද්ද නොකඩවා වැඩි කර ඇති අතර ස්ටිකර් හා වාර්ෂික බදු ඉහළ දැමීම මඟින් විනිවිදභාවය හා වගවීම ඉහළ නැංවීම හේතුවෙන් සමස්ත මත්පැන් නිෂ්පාදනය 2023 වසරේ වූ ලීටර් මිලියන 34 සිට ලීටර් මිලියන 37.5ක් දක්වා වැඩි වීමෙන් පෙන්නුම් කරන්නේ නීති විරෝධී මත්පැන් භාවිතය යම් ප්‍රමාණයකට අඩු වී ඇති බවයි.

   වාර්ෂික සුරාබදු ආදායම 2023 වසරේදී රුපියල් බිලියන 170.3 සිට 2025 වසරේදී රුපියල් බිලියන 231.5ක් දක්වා සියයට 36කින් වැඩි වී ඇත.

   මත්පැන් ආශ්‍රිත රෝහල්ගතවීම්, මරණ සහ රජයේ ප්‍රතිකාර වියදම් ගණනය කිරීම සම්බන්ධයෙන් මේ වනවිටත් සාකච්ඡා වට කිහිපයක් පවත්වා ඇති අතර ඉදිරියේදී එම තොරතුරුද ලබා දීමට හැකි වනු ඇත.

4. ඇමුණුම 02හි දක්වා ඇත.

   ඊට අමතරව ප්‍රජා විරෝධතා පැනනැඟුණොත් පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද 2024.01.12 දිනැති අංක 2366/39 අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ වූ සුරාබදු නිවේදන අංක 02/2024හි (සුරාබදු බලපත්‍ර නිකුත් කිරීමේ මාර්ගෝපදේශ හා කොන්දේසි) රීති අංක 13 යටතේ විරෝධතා පරීක්ෂණයක් පවත්වා රීති අංක 15 යටතේ සුරාබදු කොමසාරිස්වරයා විසින් තීරණයක් ගනු ලබනවා.

5. 2024 වර්ෂයේදී සුරාබදු බලපත්‍ර 356ක් ලබා දී ඇති අතර, ඒ පිළිබඳ තොරතුරු ඇමුණුම 03හි දක්වා ඇත.

   මෙතෙක් අවලංගු කළ බලපත්‍ර නොමැත. සුරාබදු ආඥාපනතේ 28අ.(1) වගන්තිය අනුව බලපත්‍රයක් ප්‍රදානය කරන අධිකාරියට බලපත්‍රයක් ප්‍රදානය කිරීමට, අලුත් කිරීමට හෝ අවලංගු කිරීමට විධානය කරනු ලැබිය හැක.

6. දේශපාලන අල්ලස් ලෙස හා විනිවිදභාවයකින් තොරව බලපත්‍ර ලබා දුන් බවට චෝදනා කරමින් නව ර.බී 04 බලපත්‍ර නිකුත් කිරීමට අදාළව මූලික අයිතිවාසිකම් පෙත්සම් 06ක් ඉදිරිපත් කර ඇති අතර, ඉන් 04ක් විභාගයට ගෙන මෙතෙක් තීන්දු ලබා දී නොමැත. පෙත්සම් දෙකක් විභාගයට ගැනීමට නියමිතය.

   ඇමුණුම් 01, 02 සහ 03 **සභාගත*** කරමි.

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

පිළිතුර ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. අපි අගය කරනවා, ඔබතුමන්ලා සුරාබදු ආඥාපනත amend කරලා පාර්ලිමේන්තුවට ගෙනාවොත්, අපිත් අත් දෙකම ඔසවලා ඒකට අපේ සහයෝගය ලබා දෙනවා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, සුරාබදු ආඥාපනත amend කරනකල්, ඉතාම ඉක්මනින් අවධානය යොමු කරන්න ඕනෑ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා මම ඉල්ලා සිටිනවා, සුරාබදු විෂයය අයත් වන මුදල් අමාත්‍යාංශය, ඒ වාගේම පොලීසිය හාර අමාත්‍යාංශය සහ අධිකරණ අමාත්‍යාංශය යන අමාත්‍යාංශ තුනම එකතු වෙලා, නීති විරෝධී මත්පැන් සම්බන්ධයෙන් වහාම ක්‍රියාමාර්ගයක් ගන්න කියලා. පොලීසියත් අසරණ වෙලා ඉන්නේ. මොකද, ඒ අදාළ ප්‍රදේශය ඇතුළත sentries දමලා තිබෙන්නේ. වැලි ඡාවාරම වාගේම තමයි. කසිප්පු විකුණන ස්ථානයට යන පාර දෙපැත්තේ sentries දෙදෙනෙක් දමනවා. පොලීසියෙන් පාරට එනවා කියලා දැන ගත්ත ගමන් කසිප්පු ටික ඔක්කෝම විසි කරලා, කොහේ හරි ගිහිල්ලා හැංගෙනවා. ඊට පස්සේ, ආපහු ඇවිල්ලා කසිප්පු විකුණනවා. කසිප්පු බීලා මිනිස්සු පාරේ; සමහර වෙලාවට සිහියත් නැහැ. හරිම අමාරුයි. අපටත් ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීම්වලට, ප්‍රාදේශීය සංවර්ධන කමිටු රැස්වීම්වලට ගියාම කාන්තාවෝ කියනවා, කසිප්පු නවත්වන්න, ඉන්න අමාරුයි කියලා. පිරිමි කට්ටිය කියනවා, කසිප්පු නවත්වනවා නම් අරක්කුවල මිල අඩු කරන්න, නැත්නම් කසිප්පු නවත්වන්න එපා කියලා. ඒක ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ අපටත්. මේකෙන් ප්‍රායෝගික, සමාජයීය ගැටලුවකුත් එනවා. ඒ නිසා මම දැන් කියපු විධියට, අමාත්‍යාංශ තුන එකතු වෙලා ඒ සඳහා කඩිනම් පියවරක් ගන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම දේශපාලන අල්ලස් ලෙස දීපු බලපත්‍ර පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තිබෙනවාය කිව්වාට, යම් ප්‍රමාණයකට තමයි ඒ තිබෙන්නේ. ඒ නඩුවලින් ඔක්කෝටම බාර් සම්බන්ධ ගැටලුවක් තිබෙනවාද කියලා දන්නේ නැහැ. නමුත් ඔබතුමන්ලා දුන් පොරොන්දුව ඉෂ්ට කරන්න කියන එක තමයි මගේ ඉල්ලීම. ඊළඟට, අලුතෙන් විවෘත කරන බාර් හය පිළිබඳවත් කියන්න ඕනෑ. ඒකෙන් කිලිනොච්චියේ දෙකයි, යාපනයේ දෙකයි වහාම

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ඡාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා]

නවත්වන්න කියලා ඉල්ලා සිටිනවා. මොකද, යාපනයේ සහ කිලිනොච්චියේ තිබෙන බාර් ප්‍රමාණය දැනටමත් වැඩියි. ඒ නිසා ඒ ප්‍රදේශයේ ජනතාව ජීවනෝපාය මාර්ගවලින් හොයා ගන්නා මුදල් ඒ බාර් හරහා විනාශ වෙමින් පවතින බවත් මා කියන්න ඕනෑ.

ගරු නිශාන්ත ජයවීර මහතා
(මාණ්පුමිකු නිසාන්ත ජයවීර)
(The Hon. Nishantha Jayaweera)

ගරු මන්ත්‍රීතුමනි, නව රජය බලයට පත් වුණාට පස්සේ බාර් එකකටවත් ජනාධිපතිතුමා අලුතින් බලපත්‍ර ලබා දීලා නැහැ. ර.බී 04 බලපත්‍රයක්, ඒ කියන්නේ බාර් බලපත්‍රයක් නව මුදල් අමාත්‍යවරයා විධියට ජනාධිපතිතුමා විසින් ලබා දීලා නැහැ. යාපනයට ඇවිල්ලා තිබෙන ඔය බලපත්‍ර කලින් අවසරය දීලා, සුරාබදු දෙපාර්තමේන්තුව ඒ වෙනකොටත් බලපත්‍ර දීලා තිබුණේ නැති ඒවා සම්බන්ධව උසාවියට ගිහිල්ලා උසාවි තීන්දු මඟින් එන ඒවා. එහෙම ආවා වුණත් ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රදේශයේ ප්‍රජා විරෝධතාවක් තිබෙනවා නම් ඒ විරෝධතාව සලකා බලා ඒ අනුව කටයුතු කිරීමේ බලය කොමසාරිස් ජෙනරාල්වරයාට තිබෙනවා. මම හිතන විධියට, අපේ ගරු රාමලිංගම් වන්ද්‍රසේකර් අමාත්‍යවරයාත් මේ වෙනුවෙන් මැදිහත් වුණා. සුරාබදු දෙපාර්තමේන්තුව දැනුවත් කරලා, ප්‍රදේශයේ තිබෙන විරෝධතා පිළිබඳව පරීක්ෂණ පවත්වලා, ඒ අනුව ඉදිරි කටයුතු සිද්ධ වෙයි.

ඔබතුමා කිව්වා වාගේ, පැහැදිලිවම නීති විරෝධී මත්පැන් සමාජයට ලොකු පිළිලයක්. ඒක නවත්වන්න මේ තිබෙන අණ පනත් ඇතුළේ පවතින නීති රීති ප්‍රමාණවත් නැති බවත් අපි පිළිගන්නවා. ඒ වාගේම හිහ බදු අය කර ගැනීමේ ක්‍රියාමාර්ග තිබුණු ආඥාපනත ඇතුළේ නැහැ. ඒ අඩුපාඩු දැකලා ඒ සියලු කාරණා ඇතුළත් කරමින්, නව නීති රීති ඇතුළත් කරමින් සුරාබදු ආඥා පනත සංශෝධනය කරන්න අපි කටයුතු කරනවා.

ඊටත් අමතරව, නව රජය පත් වුණාට පස්සේ සුරාබදු දෙපාර්තමේන්තුවේ සියලු බදු පරිපාලනය ක්‍රියාත්මක කරන්න විශේෂ අඩුපාඩුවක් විධියට තිබුණු තොරතුරු තාක්ෂණ පද්ධතියක් කඩිනමින් සකස් කරන්න අවශ්‍ය වැඩ කටයුතු ආරම්භ කරලා මේ වන විට එය ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා.

II

ත්‍රස්තවාදය ප්‍රවර්ධනය කරන ක්‍රියාකාරකම්වලට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම

பயங்கரவாதத்தை ஊக்குவிக்கும் செயற்பாடுகளுக்கு எதிராக சட்டத்தை அமுல்படுத்துதல்

ENFORCEMENT OF LAW AGAINST ACTIVITIES PROPERGATING TERRORISM

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

නන්දි, කෞරව සභානායකර් අවර්කළේ! නිලෙයියර් කට්ටළෙ 27(2)ඉන්ගීළ් පොදුමක්කළ් පාදුකාප්පු මට්රුම් පාරාළුමන්ර අලුවල්කළ් අමෙච්චර් ආනන්ද විජේපාල අවර්කළිඩම් කේල්විකළෛක් කේට්කිරේන්.

கௌரவ அமைச்சர் அவர்களே, தமிழர் பூர்வீகத் தாயகப் பிரதேசமாகிய வடக்கு, கிழக்கில் நவம்பர் மாதம் இந்திய அரசாங்கத்துக்கு எதிராக அஹிம்சை வழியில் உண்ணாவிரதம் இருந்து உயிர்நீத்த தியாகி இராசையா பார்த்திபன் திலீபன் அவர்களின் fibre சிலை ஒன்று, நல்லூர் பின் வீதியிலுள்ள திலீபன் அண்ணாவின் நினைவுத் திடலில் அகில இலங்கை தமிழ் காங்கிரஸ் கட்சியினால் நிறுவப்பட்டு, நினைவு தினம் அனுஷ்டிக்கப்பட்டிருந்தது. அதன்பின்னர், இலங்கைப் பொலிஸாரால் அந்தச் சிலை பலாத்காரமாக அகற்றப்பட்டு, ஓர் உன்னதப் போராளி அவமானப்படுத்தப்பட்ட சம்பவம் தமிழ் மக்கள் மத்தியில் மிகுந்த மன உளைச்சலையும் கவலையையும் ஏற்படுத்தியிருக்கிறது.

அது தொடர்பாக யாழ். நீதிமன்றத்தில் AR வழக்கு ஒன்றும் பதியப்பட்டிருக்கிறது. ஆனால், குற்றவாளிகள் அல்லது அந்தக் குற்றத்தைச் செய்த நபர்கள் இதுவரை இனங்காணப் படவில்லை என நீதிமன்றத்தில் தெரிவிக்கப்பட்டு இருக்கிறது. ஆகவே, இது தொடர்பாக தமிழ் மக்கள் தெளிவாகும் விதத்தில் பின்வரும் கேள்விகளைக் கேட்க விரும்புகிறேன்.

1. நேரடியாகவோ அல்லது மறைமுகமாகவோ பயங்கரவாதத்தைத் தூண்டும் செயற்பாடுகளை சட்டத்தை மீறும் செயற்பாடுகளாக பொலிஸ் திணைக்களம் கருதுகிறதா?

2. பயங்கரவாதத்தை ஊக்குவிக்கும் நோக்கில் சமூக வலைத்தளங்களிலும் ஊடகங்களிலும் கருத்துத் தெரிவிப்பவர்களைப் பயங்கரவாதத் தடைச் சட்டத்தின்கீழ், நீதியின் முன்னால் நிறுத்த பொலிஸ் திணைக்களம் நடவடிக்கை எடுக்கிறதா?

3. அப்படியெனில், திலீபனின் நினைவேந்தல் நிகழ்வில் பங்கேற்ற அரசியல் பிரதிநிதிகளுக்கு எதிராக நீதிமன்றச் செயற்பாடுகளை முன்னனெடுக்க பொலிஸ் திணைக்களம் நடவடிக்கை எடுக்காதது ஏன்? மேலும், அவர்களைச் சட்டத்தின் முன் நிறுத்துவது எப்போது?

4. இதுபோன்ற குற்றச்சாட்டுகளுக்காகவே -

[இலாஸனயේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

கௌரவ சபாநாயகர் அவர்களே, திலீபன் அண்ணாவின் சிலை என்பது எங்களுடைய தமிழ் மக்களைப் பொறுத்தவரையில் உணர்வுபூர்வமான ஒரு விடயமாகும். ஆனால், இங்கே குற்றச்செயல்களைத் தூண்டியவர்கள் ஒருபோதுமே சட்டத்தின் முன் நிறுத்தப்படுவதில்லை. ஆனால், அப்பாவிப் பொதுமக்கள் சட்டத்தின் முன் நிறுத்தப்படுகிறார்கள். கௌரவ சபாநாயகர் அவர்களே! நாட்டில் ஒரு சட்டம் நடைமுறையில் இருப்பதாகவிருந்தால், அரசியலுக்காக அந்தச் சட்டத்தை வளைத்துக் கொடுக்க முடியாது என்பது தங்களுக்கு நன்றாகவே தெரியும். கௌரவ பாதுகாப்பு அமைச்சர் அவர்களுக்கு இந்த விடயம் நன்றாகத் தெரிந்திருந்தும் சம்பந்தப்பட்ட அரசியல்வாதிகள் பொதுமக்கள் -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඉවර කරනවා. විනාඩි පහකට කලින් ඉවර කරනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ලබා දීලා තිබෙන ප්‍රශ්නය කියවලා ඉවරයි.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
නැහැ, නැහැ, මේක ඉවර කරනවා. තව තත්පර 20ක් දෙන්න, මම ඉවර කරන්නම්. අනෙක් අයට විනාඩි 16ක්, 18ක් දෙනවා. අපට දෙන්නකෝ, විනාඩි දෙකක්වත්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම කිව්වේ, ඔබතුමා කියවපු එකයි, ඔබතුමා භාර දීලා මේ මා අතේ තිබෙන එකයි දෙකක් කියන එක.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඒකේ වාක්‍ය ප්‍රමාණය කෙටි කරන්න කියලා කිව්වා. ඒ නිසා මම ඒක කපලා කොටලා දැම්මා. හැබැයි, මම පොඩ්ඩක් පැහැදිලි කරන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙත් මගේ අතේ තිබෙන content එකයි, ඔබතුමා කියපු එකයි පරස්පර විරෝධියි; දෙකක් තිබෙන්නේ.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් අනෙක් අයට ප්‍රශ්නය කියවන්න ඉඩ දෙනවා. මටත් එහෙම අවස්ථාවක් දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා මට ස්ථාවර නියෝග 27 (2) යටතේ දීලා තිබෙන ප්‍රශ්න මාලාවක් තිබෙනවා නේ. මම ඒක බලන ගමන් ඉන්නේ. ඒකයි, ඔබතුමා කියවපු එකයි දෙකක්. ඒකයි මම මේ කියන්නේ.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
නැහැ, නැහැ. ස්ථාවර නියෝග 27(2) සමහර ඒවා,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මගේ අතට ලැබිලා තිබෙන දේ,-

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාට පොඩ්ඩක්,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා දැන් අවසන් කරන්න.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ඔබතුමාට මම Standing Orders පොඩ්ඩක් කියවන්න,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Standing Orders නොවෙයි. ඔබතුමා ලබා දුන් ප්‍රශ්න මගේ table එකට ඇවිල්ලා තිබෙනවා නේ. ඔය ඒක නොවෙයි. හරි, ඔබතුමා දැන් අවසන් කරන්න.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Hon. Speaker, මම අවසන් කරනවා. මට තත්පරයක් දෙන්න.

Standing Order No. 83(1)හි කියනවා, "... පෞද්ගලික පැවැත්ම පූර්ණ යෝජනාවකින් හැර මතු කරන්න බැහැ" කියලා. මම කවදාවත් පෞද්ගලික,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් මේ කාරණාවෙන් පිට නේ යන්නේ. ඔබතුමාගේ ප්‍රශ්නයට අදාළ දේවල් විතරක් ප්‍රශ්න කරන්න.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
හරි, මම point of Order එක පස්සේ මතු කරන්නම්.

கௌரவ பாதுகாப்பு அமைச்சர் அவர்களே, இந்தச் சமூகத்திலே குற்றச்செயல்களைத் தூண்டுகிறவர்கள் ஒருபோதுமே அக்குற்றச்செயல்களுக்குப் பொறுப்பு ஏற்பது இல்லை. ஆனால், அப்பாவி மக்கள்தான் அதனால் பாதிக்கப்படுகிறார்கள். ஆகவே, அந்த நபர்கள் ஏன் வழக்கு நடவடிக்கைகளுக்கு உட்படுத்தப்படவில்லை? என்பதை தங்களிடம் அன்பாகக் கேட்டுக்கொள்கின்றேன்.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා.

ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ අප වෙත ඉදිරිපත් කර තිබෙන ප්‍රශ්න නොවෙයි ගරු අර්ච්චුනා මන්ත්‍රීතුමා මේ වෙලාවේ ඉදිරිපත් කළේ. ගරු කථානායකතුමනි, ඊයේ දිනයේදී අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට විතරයි මට හැකියාව තිබෙන්නේ. මොකද, දැන් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කාරණා නොවෙයි මෙහි තිබෙන්නේ, ඊට පරස්පර දේවල්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථානායකතුමාට ලිඛිතව භාර දීලා, කථානායකතුමා විසින් අමාත්‍යාංශ ලේකම්වරයා වෙත ඉදිරිපත් කරපු ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නවලට පමණයි මට පිළිතුරු ලබා දීමට හැකියාව ලැබෙන්නේ. එම නිසා ඔබතුමාට ඊට වැඩිමනත් පිළිතුරු අවශ්‍ය නම් වෙනත් දවසක ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න ඉදිරිපත් කරලා පිළිතුරු ලබා ගන්න කියලා ආරම්භයේදීම ඉල්ලීමක් කරනවා.

ගරු කථානායකතුමනි, ගරු රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

1. 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 27වන වගන්තිය ප්‍රකාරව සාදා ඇති නියෝග වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1721/2 (2011.08.29), 2123/3 (2019.05.13) සහ 2342/27 (2023 ජූලි මස 26 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය සමඟ කියවෙන) 2223/3 (2021.04.13) දරන අතිවිශේෂ ගැසට් පත්‍රවලින් විග්‍රහ කර ඇති ආකාරයෙන්, ඍජුව හෝ වක්‍රව එහි සඳහන් ත්‍රස්තවාදී සංවිධානයක් ප්‍රවර්ධනය කරන්නේ නම්, එය නීතිය උල්ලංඝනය කිරීමක් ලෙස ශ්‍රී ලංකා පොලිසිය සලකනු ලබයි.

   ඔබතුමා අහලා තිබෙන්නේ ඍජුව හෝ වක්‍රව ත්‍රස්තවාදය ප්‍රවර්ධනය කරන ක්‍රියාකාරකම් නීතිය උල්ලංඝනය කිරීමක් ලෙස පොලිස් දෙපාර්තමේන්තුව සලකනවාද කියලායි. ඒකට උත්තරය තමයි ඒක.

2. ඔව්.

   ඉහත අනු අංක 1ට අදාළ වන ආකාරයෙන් සමාජ මාධ්‍ය හා ජනමාධ්‍ය තුළ ත්‍රස්තවාදය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් අදහස් පළ කරන පුද්ගලයන්ගෙන් නීතිය ක්‍රියාත්මක කිරීමට පොලිසිය කටයුතු කරනු ලබනවා.

3. ඔබතුමා තිලීපන්ගේ පිළිරුව ගැනයි ප්‍රශ්නය අහලා තිබුණේ.

   - මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලිසිය විමර්ශන ආරම්භ කර තිබෙනවා.

   දැනට රාසයියා පාර්තිපන් නොහොත් තිලීපන් යන අය LTTE සාමාජිකයෙකු බවට විමර්ශන මඟින් කරුණු අනාවරණය කරගෙන ඇති අතර, ඔහු සැමරීම සඳහා යොදා ගන්නා ලද ෆයිබර්වලින් සාදන ලද උඩුකය සහිත පිළිරුව පොලිස් භාරයට ගෙන නඩු භාණ්ඩ ලෙස අධිකරණයට ඉදිරිපත් කර ඇත. එලෙසම මෙම සැමරුම් උත්සවයේ පිළිරුව සෑදූ, මුදල් යෙදවූ හා ප්‍රවර්ධන කටයුතු සිදු කළ දේශපාලනඥයන් ඇතුළු ඊට සම්බන්ධ පුද්ගලයින් 14දෙනෙකුගෙන් දැනටමත් ප්‍රකාශ සටහන් කරගෙන ඇති අතර, ඒ පිළිබඳව ගොනු සකස්කොට නීතිපති උපදෙස් අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා කටයුතු කරමින් ඉන්නවා.

4. ගරු මන්ත්‍රීතුමනි, මෙහි ඔබතුමා අහලා තිබෙන්නේ, මෙවැනිම චෝදනා සඳහා අභිංසක දෙමළ ජනතාව, විශේෂයෙන්ම ආනන්ද සුදාකරන් වැනි අය මෙතෙක් නඩු විභාගයකින් තොරව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රඳවා තබාගෙන සිටින්නේ ඇයිද කියලායි. ඔබතුමා දැන් වාචිකව අහපු ප්‍රශ්නයේ ඒක තිබුණේ නැහැ. ලිඛිත ප්‍රශ්නයේයි එය තිබෙන්නේ. මා පිළිතුර කියවන්නම්.

   පිළියන්දල නගරයේ බස් රථයක් තුළ බෝම්බයක් පුපුරුවා හැර මනුෂ්‍ය ඝාතන සිදු කිරීමට අදාළව 2008.04.25වන දින ගල්කිස්ස පොලිස් කොට්ඨාසය මඟින් සච්චිතානන්දන් ආනන්දන් සුදාකරන් - ජා.හැ. අංකය 810584858V - යන අය අත්අඩංගුවට ගෙන, කොළඹ මහාධිකරණයේ 6656/13 දරන නඩු අංකය යටතේ චෝදනා 92ක් ගොනු කර, 2017.11.08වන දින සෑම චෝදනාවක් සඳහාම ජීවිතාන්තය දක්වා සිර දඬුවම් නියම කර නඩු කටයුතු අවසන් කර, නව මැගසින් බන්ධනාගාරයේ සිර අංක V 19970 යටතේ සිර දඬුවම් ලබන බවට වාර්තා කර තිබෙනවා.

5. ඔව්.

   1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ සඳහන් සියලු මූලික අයිතිවාසිකම් සහතික කොට පිළිගෙන ඇති බැවින්, එකී අයිතිවාසිකම්වලට අවනතව, 15වන ව්‍යවස්ථාවේ සඳහන් අයිතිවාසිකම් සීමා කිරීම්වලට යටත්ව එය ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා පොලීසිය බැඳී සිටී.

6. ඔව්.

   ඔක තමයි පිළිතුර, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Hon. Member, you may now seek your additional clarification.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Hon. Speaker, clarification එකට කලින් ස්ථාවර නියෝග 83 කියවන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. පසුව මම ඒකට point of Order එකක් අහන්නම්. ඒ නිසා තමයි අර questionවල පරස්පරතාවක් ආවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මට ලබා දීලා තිබෙන ප්‍රශ්නය නොවෙයි ඔබතුමා කියෙව්වේ. ගරු ඇමතිතුමා අමාත්‍යාංශයට යවලා තිබෙන්නේත් මට දීපු එකමයි. ඔබතුමා ඉතාම විනයගරුකව සහ මේ තිබෙන ප්‍රතිපත්තිවලට අනුකූලව වැඩ කිරීමට ලැහැස්ති වුණා නම් ගොඩක් හොඳයි කියලායි මට මේ අවස්ථාවේ ඔබතුමාට කියන්න තිබෙන්නේ.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

ඒක තේරෙනවා, ගරු කථානායකතුමනි. හැබැයි තිබෙන ප්‍රශ්නය මේකයි. මම නම සඳහන් කරලා ලියුමක් දුන්නාම ලේකම් මණ්ඩලය ඒක කපලා කොටලා දුන්නා. නම සඳහන් කරන්න බැහැ කියලා, ස්ථාවර නියෝග 83 බලන්න කිව්වා. ස්ථාවර නියෝග 83හි පැහැදිලිවම කියන්නේ, Member of Parliamentගේ personal affairs ගැන අහන්න බැහැ කියලායි. මම personal affairs ගැන ඇහුවේ නැහැ නේ. මම ඇහුවේ දේශපාලනික ප්‍රශ්නයක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මා වෙත ලබා දී තිබෙන මෙහි පිටපතක් ඔබතුමාටත් ලැබිලා තිබෙනවා ඇති. ඒ අනුව වැඩ කටයුතු කරන්න. කරුණාකර මේ සභාව නොමඟ යැවීමට කටයුතු නොකරන ලෙස ඉල්ලා සිටිනවා. අනෙක් මන්ත්‍රීවරුන්ගේ කාලයත් කා දමන්න එපා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

පැහැදිලියි, ගරු කථානායකතුමනි. මම ඔබතුමාට පළමුවැනි සැරේම දීපු එකේ තමයි සම්පූර්ණ detail තිබුණේ. ලේකම් මණ්ඩලය ඔක්කෝම කපලා කොටලා දැම්මා කියලා මට වගකීම ගන්න බැහැ නේ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නැවත වතාවක් එය ලැබෙන්න ඇති නේ. එය ලැබුණාට පසුව ඒ අනුව වැඩ කටයුතු කරන්න ඕනෑ. ලේකම් මණ්ඩලය වැඩ කරන්නේ ඒ තිබෙන සම්ප්‍රදායයන්ට සහ Standing Ordersවලට අනුවයි. ඒ නිසා ලේකම් මණ්ඩලය කියපු දෙය තේරුම් ගෙන කටයුතු කරන ලෙස ගරු මන්ත්‍රීතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, මේ ගැන මීට වඩා වැඩි අවධානයක් යොමු කරන්න ඕනෑ කියලා මම හිතනවා. ගරු මන්ත්‍රීවරයෙක් මොනවා මොනවා හෝ ලියා දීලා, ලේකම් මණ්ඩලය එය අනුමත කරන්නේ නැතිව තිබියදී, එය මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා නම් ස්ථාවර නියෝග 27(2) සම්බන්ධයෙන් ප්‍රශ්නයක් පැන නඟිනවා. ඔබතුමාට මෙය තේරෙනවා ඇති, ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි. ගරු කථානායකතුමනි, ඔබතුමා අතේ තිබෙන ප්‍රශ්නය තමයි ගරු මන්ත්‍රීවරයා කියවිය යුතු වන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පැහැදිලිවම.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

වෙනත් ඕනෑ ඕනෑ දේවල් ලියන්න පුළුවන්. නමුත්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග රීතිය අනුව ඔබතුමා පිළිගන්නා එකට තමයි අපි පිළිතුරු දීමට බැඳී සිටින්නේ, ගරු කථානායකතුමනි. ඒ නිසා කරුණාකර එම සම්ප්‍රදාය අනුගමනය කරන්න. මේක මේ අවස්ථාවේ පමණක් විය යුතුයි. මින් ඉදිරියට මෙවැන්නක් නොවිය යුතුයි. ගරු කථානායකතුමනි, මා කියන්නේ, ඇත්තටම එම ප්‍රකාශය කිරීමට ඔබතුමා අවසර නොදෙන්නයි තිබුණේ, එය මැදින් නවත්වන්නයි තිබුණේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා, විනය සහ මේ කාරණාව සම්බන්ධව ඔබතුමා හොඳින් තේරුම් ගන්න. ඔබතුමාට නැවත නැවත කියන්න අවශ්‍යතාවක් නැහැ. ඔබතුමාගේ clarification එක අහන්න. එහෙම නැත්නම්, අවසන් කරන්න.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

ගරු නලින්ද ජයතිස්ස අමාත්‍යතුමනි, ඒකෙන් මගේ නම කපලා,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා,- *[බාධා කිරීමක්]* අපි ඊළඟ වැඩකටයුතුවලට යන්න අවශ්‍යයි.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

ඉවර කරන්න. කිසි අවුලක් නැහැ. ඔව්වරයි ඔයගොල්ලන්ගේ Government එක,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන.

මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය ගරු ආනන්ද විජේපාල මහතා 2026.08.07වන දින ගරු ගරු ඡාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා සහ 2026.10.09වන දින ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීම.

යුද සමයේ උතුරු සහ නැඟෙනහිර සිදු වූ අතුරුදහන්වීම් සහ ඝාතන පිළිබඳ විමර්ශනවල ප්‍රගතිය: මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය

யுத்தத்தின்போது வடக்கு மற்றும் கிழக்கில் காணாமல்போனோர் மற்றும் கொலைகள் குறித்த விசாரணைகளின் முன்னேற்றம்: பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரினது கூற்று

PROGRESS OF INVESTIGATIONS INTO DISAPPEARANCES AND KILLINGS IN NORTH AND EAST DURING WAR: STATEMENT BY MINISTER OF PUBLIC SECURITY AND PARLIAMENTARY AFFAIRS

ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු කථානායකතුමනි, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා විසින් 2026.08.07වන දින ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නය යොමු කර තිබෙන්නේ වසර 40කට ආසන්න පැරණි කාරණා පිළිබඳවයි.

(අ) 1990.09.09වන දින කොකුවිල් පොලිස් වසමේ පුද්ගලයන් 186 දෙනෙකු පැහැරගෙන ගොස් ඝාතනය කර ඇති බව සඳහන් කරමින්, අංක 37 සතුරු කොන්ඩාන්, මඩකලපුව යන ලිපිනයේ පදිංචි වයිරමුත්තු කුලන්ද වඩිවේල් යන අය විසින් පොලිස්පති වෙත ඉදිරිපත් කර ඇති පැමිණිල්ල අනුව, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මනුෂ්‍ය ඝාතන හා සංවිධානාත්මක අපරාධ විමර්ශන අංශයේ මනුෂ්‍ය ඝාතන විමර්ශන අංශය මඟින් විමර්ශන කටයුතු සිදු කරගෙන යනු ලබනවා.

මෙම පැමිණිල්ල ලැබිලා තිබෙන්නේ 2025.09.27වන දින කොකුවිල් පොලීසියටයි. කොකුවිල් පොලීසියට ලැබුණු ඒ පැමිණිල්ල 2025.11.21වන දින ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නැඟෙනහිර විසින් පොලිස්පතිතුමාට යොමු කිරීමෙන් අනතුරුව පොලිස්පතිතුමා 2025.12.06වන දින CID එකට එය යොමු කර තිබෙනවා. ඒ, 1990දී වූ එම සිද්ධිය සම්බන්ධයෙනුයි. වසර 37කට පස්සේ තමයි එම පැමිණිල්ල ලැබෙන්නේ. ඒ පිළිබඳව විමර්ශනයක් ආරම්භ කර තිබෙනවා. එම සිද්ධිය 1990.09.09වන දින සිදු වී ඇති බවට පැමිණිලිකරු විසින් විස්තර ලබා දී ඇති බැවින්, එම සිද්ධිය පිළිබඳව මඩකලපුව පොලිස් ස්ථානය වෙත වාර්තා වී ඇති පැමිණිල්ල සම්බන්ධව වාර්තාවක් ලබා ගැනීම සඳහා මඩකලපුව කොට්ඨාස අපරාධ විමර්ශන අංශය වෙත පණිවුඩයක් යොමු කර ඇති අතර, එම වාර්තාව මේ වන තෙක් ලැබී නැහැ. එබැවින් පැමිණිලිකරු කැඳවා ඔහු සතුව ඇති තොරතුරු අනාවරණය කර ගැනීම සඳහා ක්‍රියා කිරීමට දුරකථන පණිවුඩ කිහිපයක් ලබා දෙමින් 2026.07.24වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ මනුෂ්‍ය ඝාතන විමර්ශන අංශය වෙත පැමිණෙන ලෙස දැනුම් දී ඇතත් එම දැනුම් දීම්වලට අනුව ඔහු පැමිණ නැහැ. යළිත් වයිරමුත්තු කුලන්ද වඩිවේල් යන අය 2026.08.14වන දින ද පොලිස් ස්ථානයේ පෙනී නොසිටි බැවින් 2026.08.20වන දින ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා මඩකලපුව පොලිස් ස්ථානයේ පිහිටි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අංශය වෙත පැමිණෙන ලෙසට කොකුවිල් පොලිස් ස්ථානය මඟින් පණිවුඩයක් යැවිවත් ඔහු පැමිණ නැහැ. සිදුවීම සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කරනු ලබන පොලිස් කොස්තාපල් 97029 සජීව් නමැති නිලධාරියා පැමිණිලිකරු වන වයිරමුත්තු කුලන්ද වඩිවේල් යන අය වෙත ගොස් ප්‍රකාශයක් සටහන් කරගෙන තිබෙනවා. ඒ ප්‍රකාශය අනුව ඉදිරි විමර්ශන කටයුතු තවදුරටත් සිදු වෙමින් තිබෙනවා.

(ආ)

1979 සිට 2009 දක්වා යුද සමයේ සිදුවීම්		
අනු අංක	සිදුවීමේ ස්වභාවය	සිදුවීම් ගණන
1	අතුරුදන් වීම්	148
2	මනුෂ්‍ය ඝාතන	1,104
3	සමූහ මනුෂ්‍ය ඝාතන	413
4	වෙනත් බරපතළ	139
	එකතුව	**1,804**

(ඇ) සහ (ඈ) ප්‍රශ්න සඳහා පිළිතුරු පහත පරිදි ඇමුණුම්ගත කරනවා.

1. අතුරුදන් වීම් - ඇමුණුම 01
2. මනුෂ්‍ය ඝාතන - ඇමුණුම 02
3. සමූහ මනුෂ්‍ය ඝාතන - ඇමුණුම 03
4. වෙනත් බරපතළ ගණයේ වැරදි - ඇමුණුම 04

ඉහත ඇමුණුම් 01, 02, 03 සහ 04 මම **සභාගත*** කරනවා.

(ඉ) උතුරු හා නැඟෙනහිර පළාත්වල පැවැති සන්නද්ධ ගැටුම් සමයේ "Channel 4" වාර්තාමය වැඩසටහන් මඟින් ඉදිරිපත් කර ඇති චෝදනා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලීසිය/ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් විමර්ශන කිසිවක් සිදු කර නැහැ.

කරුණු එසේ වුවද, 1979 වර්ෂයේ සිට මේ දක්වා වසර 47කට ආසන්න කාලයක් ගත වී ඇති බැවින්, යුද සමයේ සිදු වූ මෙම සිදුවීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලීසියේ මේ වන විට පවතින ලේඛන හා වාර්තා පරීක්ෂා කර, එමඟින් අනාවරණය කරගත හැකි දත්ත හා තොරතුරු මත පදනම්ව 1979 සිට 2009 දක්වා කාලයට අදාළව, දිවයිනම ආවරණය වන පරිදි වාර්තාව සකස් කිරීමට කටයුතු කර තිබෙනවා. එම වාර්තාවේ විස්තර මේ ආකාරයටයි තිබෙන්නේ.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

1979 සිට 2009 දක්වා යුද සමයේ සිදුවීම්					
අනු අංකය	වරද	සිදුවීම් සංඛ්‍යාව	විමර්ශනය වෙමින් පවතින සංඛ්‍යාව	නඩු පවරා ඇති සංඛ්‍යාව	නඩු පැවරීමකින් තොරව අවසන් කර ඇති විමර්ශන සංඛ්‍යාව
1	අතුරුදහන් වීම්	148	95	34	19
2	මනුෂ්‍ය ඝාතන	1,104	541	94	469
3	සමූහ මනුෂ්‍ය ඝාතන	413	397	13	03
4	වෙනත් බරපතළ වැරදි	139	123	06	10
	එකතුව	**1,804**	**1,156**	**147**	**501**

ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳ සවිස්තර, සම්පූර්ණ වාර්තා මම ඉහතින් සභාගත කළා.

ගරු කථානායකතුමනි, විශේෂයෙන් මේ සිදුවීම්වලට අදාළ තොරතුරු මීට වසර 47ක් තරම් පැරණි කාලයක සිට 2009 දක්වා යුද සමයේ සිදුවීම්වලට අදාළ තොරතුරුයි. ඒ ලබාගත් ලේඛන ආශ්‍රයෙනුයි මම ඉහත කී තොරතුරු සභාගත කිරීමට කටයුතු කළේ.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

கௌரவ அமைச்சர் அவர்களே, மிக முக்கியமாக இந்த சத்துருகொண்டான் படுகொலைச் சம்பவம் சுமார் 35 ஆண்டுகளுக்கு முன்னர் நடந்தது. நான் பிறந்தது 1990ஆம் ஆண்டு செப்ரெம்பர் மாதம் 20ஆம் திகதி. நான் பிறப்பதற்கு 11 நாளைக்கு முன்னர்தான் இந்தச் சம்பவம் நடந்தது. ஆனால், இதுவரை காலத்திலே எந்தவோர் அரசும் இந்த விடயங்களை விசாரிக்கும் என்ற எந்த நம்பிக்கையும் எங்களுக்கு இல்லை. இன்று வரைக்கும் சர்வதேச விசாரணையைத்தான் நாங்கள் கோருகின்றோம். இலங்கை அரசாங்கத்தில் இருக்கின்ற பொலிஸ் பிரிவுக்குக்கீழே 2025ஆம் ஆண்டு பதிவு செய்யப்பட்ட ஒரு முறைப்பாட்டின் பிரகாரம், குழந்தை வடிவேலு என்ற நபர் 2026ஆம் ஆண்டில் விசாரணைக்கு அழைக்கப்பட்டபடியால்தான் இந்தக் கேள்வியை நான் எழுப்பினேன். சுமார் 35 ஆண்டுகளுக்கு முன்னர் நடைபெற்ற ஒரு விஷயத்தை இப்போது கேட்பதாக நீங்கள் கருதக்கூடாது. குழந்தை வடிவேலு என்ற இந்த நபர் நேரடியாக அந்த நேரத்திலே வர்ணகுலசூரிய என்று அழைக்கப்படுகின்ற இராணுவத் தளபதிதான் இதற்குப் பின்னணியிலே இருந்தார் என்று தன்னுடைய வாக்குமூலத்திலேயும் கொடுத்திருக்கிறார். அந்த வகையில், வர்ணகுலசூரியவைக் கூப்பிட்டு விசாரிப்பதை விட்டுவிட்டு, குழந்தை வடிவேலுவையும் அவருடைய சகோதரர்களையும் விசாரிப்பதன் காரணத்தினால்தான் நான் இந்தக் கேள்வியை எழுப்பினேன்.

அதுமாத்திரமல்ல, கௌரவ அமைச்சர் அவர்களே, "Channel 4" ஊடகத்தில் ஒளிபரப்பான 'ஈஸ்டர்' குண்டுத் தாக்குதல் தொடர்பான ஆவணப்படத்தில் அசாத் மௌலானா தெரிவித்த சர்ச்சைக்குரிய குற்றச்சாட்டுகள் குறித்த வாக்குமூலம் சம்பந்தமாக விசாரிக்கின்றீர்கள். அதேபோல, மனித உரிமை மீறல் என்ற அடிப்படையில், மக்களுக்கு எதிராக நடந்த அநீதிக்கு எதிராகவும், அங்கு நடந்த இனப்படுகொலை மற்றும் அதனோடு சம்பந்தப்பட்ட விடயங்களுக்கு எதிராகவும் நீங்கள் ஏன் விசாரிக்க முடியாது என்பதுதான் எனது அடுத்த கேள்வி.

அதுமாத்திரமல்ல, வடக்கு, கிழக்கிலே இதுவரை காலத்திலே எத்தனையோ கொலைகள் நடந்திருக்கின்றன. நீங்கள் அந்த விசாரணைகளைச் செய்வீர்கள் என்ற நம்பிக்கையிலேதான் உங்களிடம் கேட்கிறோம். மட்டக்களப்பிலே வந்தாறுமூலையாக இருக்கட்டும், கொக்கட்டிச்சோலையாக இருக்கட்டும்! திருகோணமலையிலே பன்குளமாக இருக்கட்டும்! குமுதினிப் படகிலே நடைபெற்ற படுகொலையாக இருக்கட்டும்! இப்படியாக நடைபெற்ற ஏராளமான படுகொலைகளைப் பற்றி சொல்லலாம். இவை சம்பந்தமாக கண்ணால் கண்ட சாட்சிகள் மற்றும் சம்பந்தப்பட்ட சாட்சிகள் இப்பொழுதும் உயிரோடு இருக்கிறார்கள். இப்படுகொலைச் சம்பவங்கள் சம்பந்தமாக அவர்களிடம் விசாரித்தால் நாங்கள் ஒரு முடிவைக் காணலாம். சிலநேரத்திலே குற்றவாளிகளைக் கண்டுபிடிக்க முடியாமல்போனாலும், மக்களுக்கு நிம்மதியாவது கிடைக்கும். At least, the people will have a closure, Hon. Minister.

Thank you.

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු කථානායකතුමනි, මම ආරම්භයේදීත් කියූ පරිදි වසර 37කට පසුව තමයි මේ පැමිණිල්ල පොලිසියට පැමිණිල්ලක් හැටියට ලැබෙන්නේ කියලා. මම මේ පිළිතුර ආරම්භයේදීම කිව්වා, මේ ලැබුණු පැමිණිල්ල පොලිස්පතිවරයා විසින් 2025 දෙසැම්බර් මාසයේ CID එකට පවරා තිබෙනවා කියලා. ඒ පුද්ගලයාට අවස්ථා කිහිපයකදී මේ පිළිබඳ ප්‍රකාශයක් ලබා දෙන්න ඉදිරිපත් වෙන්න කිව්වත් ඉදිරිපත් වෙලා නැහැ. පොලීසිය ගිහිල්ලා තමයි ඔහුගෙන් ප්‍රකාශයක් ලබා ගන්නේ. කට උත්තරයේ,- *[බාධා කිරීමක්]* මම කියන්නේ මේකයි. අවස්ථා දෙකකදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට, පොලීසියට ඔහු පැමිණිලා නැහැ. ඒ නින්දා පොලීසිය නිවසට ගිහිල්ලා කටඋත්තරයක් ගන්නවා. *[බාධා කිරීමක්]* ඒක තමයි. නිවසට ගිහිල්ලා කටඋත්තරයක් අරගෙන විමර්ශන ආරම්භ කරලා තිබෙනවා. යුද සමයේ නොයෙකුත් අවාසනාවන්ත සිදුවීම් වෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි. දීර්ඝ කාලයක් මේ රටේ පැවැති යුද තත්ත්වය යටතේ සිදු වුණු අවාසනාවන්ත සිද්ධීන් අපි අනුමත කරනවා කියන එක නොවෙයි මේ කියන්නේ. සිද්ධීන් වෙලා තිබෙනවා. රජයන් ඒ ඒ වකවානුවල තිබ්ලා තියෙනවා. අවුරුදු 37කට පස්සේ දැන් ඒ ප්‍රශ්නය විමසන කොට ඒවායේ විමර්ශනත් ඒ ආකාරයෙන්ම තමයි සිද්ධ කරන්න වෙන්නේ. අවුරුදු 37කට පසුව සාක්ෂිකරුවන් සොයාගෙන විමර්ශන පවත්වන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා මෙවැනි විමර්ශනයක තිබෙන අසීරුතාව ගැන. මෙය, වසර 37කට පස්සේ එන පැමිණිල්ලක් සම්බන්ධයෙන් කරන්න තිබෙන විමර්ශනයක්. අනෙක් අතට, ඒ සාමාන්‍ය වකවානුවක් තුළත් නොවෙයි. යුද තත්ත්වයක් තුළ ඇති වෙච්ච ගැටීම් ඇතුළේ සිදු වෙච්ච ඝාතන සම්බන්ධයෙන් තමයි මේ ප්‍රශ්න කරන්නේ. ඉතින් අපි ඔබතුමාට කියන්නේ, ඉතාම සාධාරණ අයුරින් මේ පිළිබඳව කරුණු සොයා බලා, ලේඛන ආශ්‍රයෙන් ඒ තොරතුරු අරගෙන විමර්ශනයක් ආරම්භ කර තිබෙන බවයි. ඒක දැනටත් සිද්ධ වෙමින් පවතිනවා. ඉතින් ඒකට අවශ්‍ය සාක්ෂි ඒ පාර්ශ්වවලින් ලැබුණාම විමර්ශන කටයුතු ඉදිරියට කරගෙන යන්න පුළුවන්. ඊට එහා ගිය කාරණයක් මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න හැකියාවක් ලැබෙන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි.

ගරු කථානායකතුමනි, මම දැන් ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන්නම්.

මුස්ලිම් නම්වලින් ව්‍යාජ සමාජ මාධ්‍ය ගිණුම් නිර්මාණය කරමින් ජාතිවාදී අදහස් පැතිරවීම: මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය

சமூக வலைத்தளங்களில் முஸ்லிம் பெயர்களில் போலி கணக்குகளை உருவாக்கி இனவாதக் கருத்துகளைப் பரப்புதல்: பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரினது கூற்று

SPREAD OF COMMUNAL HATRED CREATING FAKE SOCIAL MEDIA ACCOUNTS USING MUSLIM NAMES: STATEMENT BY MINISTER OF PUBLIC SECURITY AND PARLIAMENTARY AFFAIRS

ගරු ආනන්ද විජේපාල මහතා
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු කථානායකතුමනි, ගරු ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා විසින් 2026.10.09වන දින ස්ථාවර නියෝග 27(2) යටතේ යොමු කරන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

මුස්ලිම්වරුන් නමින් ව්‍යාජ ගිණුම් සාදා අනෙකුත් සමාජයන්ට එරෙහිව වෛරී ප්‍රකාශන පතුරුවාලීමේ පිටුපස සැලසුම් සහගත සංවිධාන හෝ කණ්ඩායම් ක්‍රියාත්මක වීම් පිළිබඳව රජය පරීක්ෂණ පවත්වනවා.

2026.09.27වන දින බුදුරජාණන් වහන්සේට අගෞරව වන අන්දමින් WhatsApp සමූහයක් නිර්මාණය කර එහි 2026.11.19වන දින දළ දා මාලිගාව, ථූපාරාමය, ශ්‍රී මහා බෝධිය, දඹුලු විහාරය ඇතුළු ස්ථාන රාශියකට ප්‍රහාරයක් දියත් කිරීම අපගේ එකම අරමුණයි යන ලෙස ප්‍රචාරය කිරීමේ සිදුවීමට අදාළව පැමිණිලි 5ක් ලැබී ඇති බව සඳහන් කර ඇති අතර, අදාළ සමූහයන් පරීක්ෂා කර එම සමූහයන් නිර්මාණය කරන ලද කිරිබමුණ, ඉබ්බාගමුව ලිපිනයේ පදිංචි, ජාතික හැඳුනුම්පත් අංක 200509503365 හිමි, වයස අවුරුදු 21ක් වන අතපත්තු මුදියන්සේලාගේ අමෝද්‍යා මතීශ ජයශ්‍රී අතපත්තු යන සැකකරු 2026.09.30වන දින අත්අඩංගුවට ගෙන තිබෙනවා. එම සැකකරු 2026.10.01වන දින කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණයේ අංක B/91502/01/26 යටතේ අධිකරණයට ඉදිරිපත් කර 2026.10.16 දින දක්වා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට කටයුතු කර තිබුණා. මීට අමතරව, මේ සම්බන්ධයෙන් ඉදිරි විමර්ශන කටයුතු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, බුද්ධි අංශ සහ අනෙකුත් සම්බන්ධිත විමර්ශන ඒකක මඟින් ඒකාබද්ධව සිදු කරනු ලබනවා.

මෙම අත්අඩංගුවට ගන්නා ලද සැකකරු මුස්ලිම් ජාතිකයන්ගේ නම් ව්‍යාජ ලෙස භාවිත කරමින් ව්‍යාජ සමාජ මාධ්‍ය ගිණුම් නිර්මාණය කර මෙම ප්‍රචාරණ කටයුතු සිදු කර ඇති බව විමර්ශනවලදී අනාවරණය වෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, පසුගිය වසර 10ක කාලය තුළ විවිධ ජාතීන් අතර අසමගිය ඇති වන ආකාරයේ වෛරී ප්‍රකාශන සමාජ මාධ්‍ය ඔස්සේ නිකුත් කිරීමට අදාළව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ ත්‍රස්ත මර්දන සහ විමර්ශන කොට්ඨාසය වෙත වාර්තා වූ පැමිණිලි 6ක් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා.

එසේ වුවද, සමාජ මාධ්‍ය හෝ වෙනත් මාධ්‍ය හරහා ජාතිවාදී, ආගම්වාදී වෛරී ප්‍රකාශ නිකුත් කරන තැනැත්තන් සම්බන්ධයෙන් පැමිණිලි ලද විගස ඒ සම්බන්ධයෙන් නීත්‍යානුකූලව පියවර ගනු ලබන අතර, එහිදී එම ප්‍රකාශ නිකුත් කරනු ලැබූ පුද්ගලයන්ගේ ජාතිකත්වය හෝ ආගම පිළිබඳව සැලකිල්ලට නොගෙන ඔවුන් විසින් කරන ලද ක්‍රියාව සම්බන්ධයෙන් අපරාධ වර්ගීකරණයට ලක් කරන බව වැඩිදුරටත් සඳහන් කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, යම් පුද්ගලයෙක් අත්අඩංගුවට ගෙන ඔහු කරන අපරාධ ක්‍රියාව පිළිබඳව සොයා බලනවා විනා ඔහු කවර ජාතිකයෙක්ද, කවර ආගමිකයෙක්ද කියන කාරණය පිළිබඳව වර්ග කිරීමක් සිද්ධ කරන්නේ නැහැ. මොන ගණයට වැටෙන අපරාධද ද කියලා බෙදීමක් සහ විමර්ශනයක් තමයි සිද්ධ කරනු ලබන්නේ.

ගරු කථානායකතුමනි, යම් යම් අවස්ථාවලදී විවිධ ගිණුම් හරහා එවැනි ආකාරයට ප්‍රචාරණයන් නිරීක්ෂණය වුවද, පහත සඳහන් හේතු මත ඒවා විමර්ශනය කිරීම ගැටලු සහගත වෙලා තිබෙනවා.

- සමහර සමාජ මාධ්‍ය පළ කිරීම් - posts - ප්‍රචාරණය පිළිබඳ පැමිණිලි හැටියට ලැබී නැහැ, පළ කිරීම් හැටියට තිබෙනවා.
- වර්තමානයේදී කෘත්‍රිම බුද්ධිය - artificial Intelligence - යොදා ගනිමින් ජාතීන් හා ආගම් අතර සහජීවනයට බාධා වන පරිදි සිදු කරනු ලබන පළ කිරීම් ක්‍රමිකව ඉහළ ගොස් තිබීම.
- ගිණුම් හසුරුවන්නන් - Admins - විදේශගතව සිටිමින් ක්‍රියාත්මක වීම.
- මෙවැනි ආකාරයේ ක්‍රියාදාමවල නිරතවන්නන් තම සැබෑ අනන්‍යතාව හඳුනා ගැනීම සීමා වන පරිදි තම ගිණුම් සකස් කරගෙන තිබීම.
- වර්තමානයේ මෙරට තුළ පවතින නීතිමය තත්ත්වයන් මෙම ප්‍රචාරණයන් ආවරණය වන පරිදි සකස් වී නොමැති වීම නිසා ඉදිරියේදී අණ පනත් ප්‍රතිසංස්කරණයකුත් අවශ්‍ය වනවා.
- මෙම පළ කිරීම් සිදු කරනු ලබන සමාජ මාධ්‍යවලට අයත් සමාගම් මෙරට තුළ ස්ථාපිතව නොතිබීම හේතුවෙන් විමර්ශනවලදී දුෂ්කරතාවලට මුහුණ දීමට සිදුවීම.

ගරු කථානායකතුමනි, කෙසේ වෙතත් විමර්ශන හා බුද්ධි අංශ දැඩි පරිශ්‍රමයක් දරමින් එම ගිණුම් හඳුනා ගැනීමේ කටයුතු මේ වනකොට සිද්ධ කරමින් පවතිනවා. එවැනි ක්‍රියාකාරකම් සඳහා මූල්‍යමය හෝ වෙනත් යම් ආධාරයක් ලැබෙන්නේද යන්න පිළිබඳව මේ වනකොට විමර්ශනයක් ආරම්භ කර තිබෙනවා. එවැනි තත්ත්වයක් මෙතෙක් අනාවරණය වී නැහැ. මේ සඳහා යම් සංවිධානාත්මක කණ්ඩායම් මූල්‍ය අනුග්‍රහය දක්වන බවට වාර්තා වෙලා නැහැ. කෙසේ වෙතත් තවදුරටත් පෙර වාර්තා කළ සිදුවීම් පිළිබඳ විමර්ශන කරමින් පවතිනවා.

එතුමා ඊළඟට අහනවා, මෙවැනි ව්‍යාජ ගිණුම් සහ වෛරී ප්‍රචාරයන් හඳුනාගෙන ඒවා වැළැක්වීමටත්, ඊට සම්බන්ධ පුද්ගලයන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමටත් රජය පියවර ගන්නවාද කියලා. ශ්‍රී ලංකා පොලීසිය වෙත වාර්තා වන හෝ මහජන සාමය කඩවීමට හා ජාතීන් අතර නොඝන්සුන්කාරී තත්ත්වයක් හඳුනා ගනු ලබන ඕනෑම අවස්ථාවකදී ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වී අවශ්‍ය නීතිමය පියවර කඩිනම්ව ගන්නවා, ගරු කථානායකතුමනි.

වර්තමානයේ සමාජ මාධ්‍ය භාවිතය ශ්‍රී ලාංකීය ජනතාව අතර ඉතා ශීඝ්‍රයෙන් වර්ධනය වන ප්‍රවණතාවක් දැකිය හැකි අතර, එම වාතාවරණය ප්‍රයෝජනයට ගෙන ව්‍යාජ සමාජ මාධ්‍ය ගිණුම් භාවිත කර ජාතීන් අතර අසමගිය සහ ආගම් අතර අසමගිය ඇති කිරීමට උත්සාහ කිරීම මෙන්ම, සයිබර් අවකාශය උපයෝගී කරගෙන මූල්‍ය අපරාධ සිදු කිරීමේ වර්ධනයක් ද ඇති වී තිබෙන බවට නිරීක්ෂණය වනවා.

ගරු කථානායකතුමනි, මේ සමහර කණ්ඩායම් පිළිබඳව අපි මේ වෙලාවේ කරුණු හෙළි කරන්න අදහස් කරන්නේ නැහැ. කෙසේ වෙතත් ඒ සම්බන්ධව වැඩිදුරටත් විමර්ශන සිදු කරමින් පවතිනවා. විශේෂයෙන් ජාතීන් අතර අසමගිය ඇති කරන්න සමාජ මාධ්‍ය හරහා ගෙන යන විවිධ වෛරී ප්‍රකාශ වාගේම අසත්‍ය ප්‍රකාශ පිළිබඳව රජය දැඩි අවධානය යොමු කර තිබෙන බවත් මේ අවස්ථාවේ මා ප්‍රකාශ කර සිටිනවා, ගරු කථානායකතුමනි.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

භාර (සංශෝධන) පනත් කෙටුම්පත
நம்பிக்கைப் பொறுப்புக்கள் (திருத்தம்) சட்டமூலம்
TRUSTS (AMENDMENT) BILL

"(87 වන අධිකාරය වූ) භාර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා වෙනුවට ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා විසිනි.

2026 නොවැම්බර් 04වන බදාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர் சார்பாக மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2026 நவம்பர் 04, புதன்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆணுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. (Dr.) Nalinda Jayatissa on behalf of the Minister of Justice and National Integration; to be read a Second time upon Wednesday, 04th November, 2026 and to be printed; and to be referred to the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection.

පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 2 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේ දී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27හි විධිවිධානවලින් නිදහස් විය යුතු ය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සහ 2 අනුමත කිරීම සඳහා ඉදිරිපත් කිරීම, ගරු (ආචාර්ය) අනිල් ජයන්ත අමාත්‍යතුමා.

රාජ්‍ය ණය කළමනාකරණ පනත: යෝජනාව
பொதுத் தனிசு முகாமைத்துவச் சட்டம்: பிரேரணை
PUBLIC DEBT MANAGEMENT ACT: RESOLUTION

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ව්‍යාපාර ධාරිතාව ඉහළ නැංවීම, මූල්‍ය ප්‍රවේශය වැඩිදියුණු කිරීම, තාක්ෂණයට අනුගතවීම ප්‍රවර්ධනය කිරීම සහ වෙළෙඳ පොළ අවස්ථා පුළුල් කිරීම මඟින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME) අංශය ශක්තිමත් කිරීමේ අරමුණින් රජය විසින් 'ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන' (මෙතැන් සිට 'SDP' ලෙස හඳුන්වනු ලැබේ) ආරම්භ කර ඇති හෙයින් ද;

සහභාගිත්ව මූල්‍ය ආයතන හරහා සහනදායී මූල්‍ය පහසුකම් සැපයීම මඟින් කෘෂිකාර්මික හා කෘෂි ව්‍යාපාරික අංශ ශක්තිමත් කිරීමේ අරමුණින් රජය විසින් 'කෘෂිකාර්මික අගය දාම මූල්‍යකරණය හා වාණිජකරණ ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන' (මෙතැන් සිට 'AVC' ලෙස හඳුන්වනු ලැබේ) ආරම්භ කර ඇති හෙයින් ද;

එකී 'SDP' වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන සියයක (ඇ.එ.ජ. ඩොලර් මිලියන 100) ප්‍රතිපත්ති පාදක ණයක් (Policy-Based Loan - PBL) සහ ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන සියයක (ඇ.එ.ජ. ඩොලර් මිලියන 100) මූල්‍ය අතරමැදි ණයක් (Financial Intermediation Loan - FIL) ද, එකී 'AVC' වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන තිහක (ඇ.එ.ජ. ඩොලර් මිලියන 30) ප්‍රතිපත්ති පාදක ණයක් (PBL) සහ ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන හැත්තෑවක (ඇ.එ.ජ. ඩොලර් මිලියන 70) මූල්‍ය අතරමැදි ණයක් (FIL) ද ඇතුළත් මූල්‍ය සහාය සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව (ADB) එකඟ වී ඇති හෙයින් ද;

'SDP' වැඩසටහනට අදාළ ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන සියයක (ඇ.එ.ජ. ඩොලර් මිලියන 100ක) ප්‍රමාණයකින් යුත් මූල්‍ය අතරමැදි ණය සංරචකය ද, 'AVC' වැඩසටහනට අදාළ ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන හැත්තෑවක (ඇ.එ.ජ. ඩොලර් මිලියන 70ක) ප්‍රමාණයකින් යුත් මූල්‍ය අතරමැදි ණය සංරචකය ද, අවශ්‍ය නිසි විමර්ශනයන් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව හඳුනාගනු ලබන මූල්‍ය ආයතන හරහා සුදුසුකම් ලත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් වෙත ණය වශයෙන් ලබා දීමට අපේක්ෂා කරන බැවින් ද, එම මූල්‍ය ආයතන එම අරමුදල් නිකුත් කිරීමේ දී මූල්‍ය අතරමැදියන් ලෙස කටයුතු කරනු ලබන හෙයින් ද;

2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ 39 වගන්තිය සමඟ කියවිය යුතු 20 වගන්තියේ (2) උපවගන්තිය ප්‍රකාරව, රාජ්‍ය ව්‍යවසායයක් නොවන යම් ආයතනයක බැඳීම්වලට අදාළව අරමුදල් ණය වශයෙන් ලබා දීම සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය අවශ්‍ය වන හෙයින් ද;

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

ඊට අනුකූලව, 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ 20 වගන්තියේ (2) උපවගන්තිය සහ 39 වගන්තිය ප්‍රකාරව, අවශ්‍ය නිසි විමර්ශනයන්ගෙන් අනතුරුව පහත සඳහන් රාජ්‍ය බැංකු හරහා, 'ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන' ('SDP') සහ 'කෘෂිකාර්මික අගය දාම මූල්‍යකරණය හා වාණිජකරණ ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහන' ('AVC') යන වැඩසටහන්වලට අදාළව සහ ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය වැඩසටහන් යටතේ මූල්‍ය අතරමැදි ණය ලබා දීමට අවශ්‍ය අරමුදල් ලබා දීම අනුමත කළ යුතු බවටත්, 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ සහ අනෙකුත් අදාළ ලිඛිත නීතිවල විධිවිධානවලට අනුකූලව, මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන පියවර ගැනීමට මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාට බලය පැවරිය යුතු බවටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

1. මහජන බැංකුව;
2. ලංකා බැංකුව;
3. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව;
4. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව; සහ
5. නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ඊට අමතරව, න්‍යාය පත්‍රයේ විෂය අංක 2 - පරිපූරක මුදල - ශීර්ෂය 243 - වැඩසටහන 02 ද අනුමැතිය සඳහා මා ඉදිරිපත් කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

To start the Debate, the Hon. Nishantha Jayaweera. You have 12 minutes.

[පූ.භා. 11.14]

ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)

ගරු කථානායකතුමනි, අද දින 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ වන යෝජනාවක් සහ 2026 අංක 6 දරන පරිපූරක ඇස්තමේන්තුව පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කර තිබෙනවා. රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ ඉදිරිපත් කර තිබෙන යෝජනාවෙන් ප්‍රධාන වශයෙන් බලාපොරොත්තු වන්නේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්ට - MSME - අවශ්‍ය ණය පහසුකම් ලබා දීලා එක පැත්තකින් ඔවුන්ගේ ව්‍යාපාරවල ධාරිතාව වර්ධනය කිරීමත්, අනෙක් පැත්තෙන් ඔවුන්ගේ මූල්‍ය ප්‍රවේශය වැඩිදියුණු කිරීම, තාක්ෂණයට අනුගත වීමේ ප්‍රවේශය වැඩිදියුණු කිරීම සහ ඔවුන්ට අවශ්‍ය වෙළෙඳ පොළ අවස්ථා පුළුල් කිරීමයි. මේ සියල්ල මඟින් අපි බලාපොරොත්තු වන්නේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් නහාසිටුවා ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීමයි. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් අපේ දළ ජාතික නිෂ්පාදනයට සියයට 50කට වැඩි ශ්‍රම දායකත්වයක් මෙන්ම වටිනාකමක් විධියට විශාල දායකත්වයක් ලබා දෙනවා. ඔවුන් නහාසිටුවා අපේ ආර්ථිකය ඉහළට අරගෙන සමාජය සවිබලගැන්වීමට මෙම යෝජනාව ප්‍රධාන රුකුලක් වනවා.

මේ සඳහා ආසියානු සංවර්ධන බැංකුව යටතේ ණය යෝජනා ක්‍රම දෙකක් ඉදිරිපත්කොට තිබෙනවා. එක ණය යෝජනා ක්‍රමයකට ඩොලර් මිලියන 100ක මුදලක් ලැබෙනවා. මේ ඩොලර් මිලියන 100ක මුදල විශේෂයෙන්ම යොදවන්න බලාපොරොත්තු වන්නේ වෙළෙඳාම, කල්බදු සහ කුලියට දීමේ ව්‍යාපාර හැර අනෙක් සියලුම ව්‍යාපාර - අපනයන අභිමුඛ - export-oriented - කාන්තා මූලික සහ නව ව්‍යාපාර - වෙනුවෙනුයි. ඩොලර් මිලියන 100ක මුදල 2026-2028 දක්වා වසර තුනක කාල පරිච්ඡේදයක් තුළ තමයි මුදාහරිනු ලබන්නේ. ඒකෙන් ව්‍යවසායකයෙකුට ලබා ගන්න පුළුවන් උපරිම ණය සීමාව රුපියල් මිලියන 75ක් පමණ වනවා. මේ රුපියල් මිලියන 75 ක ණය මුදල සහන පොලී පදනමකට ලැබෙන අතර, එය ආපසු ගෙවන්න වසර 10ක කාලයක් සහ තවත් වසර දෙකක සහන කාලයකුත් ලබා දෙනවා. මේ යටතේ 2026 දෙසැම්බර් මාසයට පෙර රුපියල් මිලියන 7,750ක් නිකුත් කරන්න අපි බලාපොරොත්තු වනවා.

ඒත් එක්කම කෘෂිකාර්මික අගය දාම මූල්‍යකරණය හා වාණිජකරණ ක්ෂේත්‍ර සංවර්ධන වැඩසටහනට ආසියානු සංවර්ධන බැංකුව මඟින් ලබා දෙන ණය මුදල යොදා ගන්නේ රබර්, තේ, කුළු බඩු, පොල්, උද්‍යාන වගාව, ජලජීවී වගාව, සත්ව ආහාර අගය දාම වාගේ වැඩසටහන් සඳහායි. මේ සඳහා වෙන් කර තිබෙනවා, ඇමෙරිකානු ඩොලර් මිලියන 70ක මුදලක්. මේකත් අවුරුදු තුනක කාල සීමාවක් තුළ තමයි නිකුත් කරනු ලබන්නේ. මෙතැනදි ලබා ගන්න පුළුවන් උපරිම ණය සීමාව රුපියල් මිලියන 75ක් වනවා. මේ ණය මුදල ආපසු ගෙවන්න වසර 10ක කාල සීමාවක් සහ වසර තුනක සහන කාල සීමාවක් ලැබෙනවා. මේ යටතේ 2026 අවුරුද්දේ රුපියල් මිලියන 6,200ක් නිකුත් කරන්න අපි බලාපොරොත්තු වනවා. නමුත් මේ රුපියල් මිලියන 6,200ක මුදල මේ 2026 අවුරුද්දේ නිකුත් කර ගැනීමට හැකියාවක් නැති නින්දා අපි මේ වෙලාවේ විදේශ ණය මූල්‍යකරණය යටතේ පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් රුපියල් මිලියන 6,000ක් - රුපියල් බිලියන හයක මුදලක් - සම්මත කරගන්න බලාපොරොත්තු වනවා. හැබැයි, මේ රුපියල් මිලියන 6,000 - රුපියල් බිලියන හය - කියන මුදල පිටින් ණය ගන්නේ නැතිව - බාහිරින් ණය ගන්නේ නැතිව - ඇතුළතින්ම කළමනාකරණය කරලා වෙන් කරගන්න අපි බලාපොරොත්තු වනවා.

අපේ රජය බලයට පත් වෙලා ඉදිරිපත් කරපු දෙවැනි අය වැයෙන් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වෙනුවෙන් රුපියල් බිලියන 95ක ණය යෝජනා ක්‍රමයක් ඉදිරිපත් කළා. ගරු කථානායකතුමනි, මේ වනකොටත් ඒ මුදලින් රුපියල් බිලියන 81ක වාගේ මුදල් ප්‍රමාණයක් නිකුත් වෙලා තිබෙනවා; උපයෝජනය වෙලා තිබෙනවා. ඒ කියන්නේ, මුළු ප්‍රමාණයෙන් සියයට 85ක් විතර. තව රුපියල් බිලියන14ක් වාගේ ප්‍රමාණයක් තමයි ඉදිරියේදී නිකුත් වෙන්න තිබෙන්නේ.

මේ වනවිටත් බැංකු හා ඒ අදාළ මූල්‍ය ආයතන වෙත ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයන් අයදුම්පත් විශාල ප්‍රමාණයක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ අයදුම්පත්වල වටිනාකම රුපියල් බිලියන 13කට වැඩි ප්‍රමාණයක් වෙනවා.

මෙතැනදී අපි මේ පරිපූරක ඇස්තමේන්තුව මඟින් වෙන් කර ගන්නා රුපියල් බිලියන 6ක මුදලක් සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ පොලී සහනාධාරයෙන් ඉතිරි වෙච්ච රුපියල් බිලියන 1.5ක මුදලක් තිබෙනවා. ඒකත් ඇතුළුව රුපියල් බිලියන 7.5ක මුදල සහ ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබා දෙන රුපියල් මිලියන 7,750ත් එකතුව රුපියල් බිලියන 15ක වාගේ මුදල් ප්‍රමාණයක්. මේ අවුරුද්දේ දෙසැම්බර් 31 වනකොට මේ ණය අයදුම්පත් ඉදිරිපත් කර තිබෙන ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයන්ට ණය ලබා දීම සඳහා ඒ වාගේ මුදල් ප්‍රමාණයක් යොදවන්න අපි බලාපොරොත්තු වෙනවා.

අපේ වැඩසටහනේ ප්‍රගතිය කොහොමද කියලා බැලුවොත්, RE-MSME Plus Loan Scheme එක යටතේ වෙන් කර ඇති රුපියල් බිලියන 95න්, රුපියල් මිලියන 25,700ක් ව්‍යවසායකයන් 2,612කට නිකුත් කරලා තිබුණා. ඒ අනුව මේ වනකොටත් ව්‍යවසායකයන් 2,612කට සියයට 101ක ප්‍රමාණයක් නිකුත් කරලා තිබෙනවා. ඊට අමතරව Extended Disaster Relief Loan Scheme එක යටතේ රුපියල් මිලියන 9,300ක මුදලක් වෙන් කරලා තිබුණා. එතැනින් මේ වනකොට රුපියල් මිලියන 8,061ක්, ඒ කියන්නේ සියයට 87ක ප්‍රමාණයක් ව්‍යවසායකයන් 3,968කට නිකුත් කරලා තිබෙනවා. ඒ වාගේම Farming System Sustainability Programme එක යටතේ සියයට 78ක ප්‍රගතියක් ලබා ගෙන තිබෙනවා. ඊට අමතරව ADB funded loan scheme එක යටතේ සියයට 83ක ප්‍රගතියකුත් ලබා ගෙන තිබෙනවා. ඊටත් අමතරව Pledge Loan Scheme එක යටතේ රුපියල් බිලියන 15ක් වෙන් කරලා තිබුණා. ව්‍යවසායකයන් 554දෙනෙකුට ඒ රුපියල් බිලියන 15ම මේ වනකොට ලබා දීලා තිබෙනවා. ඊට අමතරව New Comprehensive Rural Credit Scheme එක යටතේ රුපියල් බිලියන 25ක් වෙන් කරලා තිබුණා. ඒ රුපියල් බිලියන 25 සම්පූර්ණයෙන්ම ව්‍යවසායකයන් 57,255කට මේ වනකොට රජය විසින් නිකුත් කරලා තිබෙනවා. එතකොට රුපියල් බිලියන 95ක ණය යෝජනා ක්‍රමය යටතේ ව්‍යවසායකයන් 65,005කට රුපියල් බිලියන 81,534ක මුදලක්, ඒ කියන්නේ රුපියල් බිලියන 95ක මුදලින් සියයට 85ක පමණ මුදල් ප්‍රමාණයක් මේ වනකොට උපයෝජනය කරලා තිබෙනවා. ඊට අමතරව ඉතිරි මුදල් ප්‍රමාණය සම්පාදනය කර ගන්න තමයි අවශ්‍ය නීතිමය කටයුතු කරමින්, අද දින මේ පාර්ලිමේන්තුවේදී අනුමැතිය සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ අනුමැතිය ලැබීමත් එක්කම අපි මේ වසර තුළදී ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයන් නහාසිටුවීම සඳහා රුපියල් බිලියන 95ක සම්පූර්ණ ණය මුදල් ප්‍රමාණයම, අප පොරොන්දු වුණු විධියට ඔවුන්ට ලබා දෙන්න පැහැදිලිවම කටයුතු කරනවා.

ඒත් එක්කම අපි දිස්ත්‍රික්ක විධියට ගත්තොත්, මීට කලින් ක්‍රියාත්මක වුණු මේ වාගේ ණය යෝජනා ක්‍රමවලදී ගොඩක් ණය බෙදිලා ගියේ ගම්පහ සහ කොළඹ වාගේ දිස්ත්‍රික්කවලට. නමුත්, මෙතැනදී දිස්ත්‍රික්ක 25ම ආවරණය වන පරිදි මේ ණය මුදල බෙදී යන විධියට තමයි අපි කටයුතු කරලා තිබෙන්නේ. මේ ණය ලබා දීමේ සංඛ්‍යා ලේඛන විශ්ලේෂණය කරලා බැලුවාම, අපි ලබා දීපු මුළු ණය ප්‍රමාණයෙන් සියයට 70කට වැඩි ප්‍රමාණයක් බස්නාහිර පළාතෙන් පිට පළාත්වලට තමයි ගිහිල්ලා තිබෙන්නේ. ඒක ඉතාම හොඳ ලක්ෂණයක්. ඒ ලබා ගත්ත ණයවලින් වැඩි ප්‍රමාණයක් අනුරාධපුරය, පොළොන්නරුව, යාපනය, හම්බන්තොට වාගේ දිස්ත්‍රික්කවලටත් ගිහිල්ලා තිබෙනවා. බස්නාහිර පළාතෙන් පිට අනෙක් පළාත් සඳහා සියයට 70කට වැඩි මුදල් ප්‍රමාණයක් බෙදිලා ගිහිල්ලා තිබෙනවා. එලෙස බෙදිලා ගිහිල්ලා තිබෙන මුදල් ප්‍රමාණයන් අනුව බලනකොට, සාමාන්‍යයෙන් වැඩියෙන්ම බෙදිලා ගිහිල්ලා තිබෙන්නේ අම්පාර දිස්ත්‍රික්කයට. ඒ ප්‍රමාණය සියයට 15ක්. ඒ ආදී වශයෙන් සම්පූර්ණ මුදල් ප්‍රමාණයම මේ දිස්ත්‍රික්ක හරහා බෙදිලා ගිහිල්ලා තිබෙනවා. විශේෂ කාරණය මෙකයි. මීට කලින් තිබුණු ණය යෝජනා ක්‍රමවල ප්‍රතිලාභ විශාල ප්‍රමාණයක් බස්නාහිර පළාතටයි බෙදී ගොස් තිබුණේ.

නමුත් මේ අවස්ථාවේදී බස්නාහිර පළාතෙන් පිටත වෙනත් පළාත්වල ඉන්න ව්‍යවසායකයින් නහාසිටුවීම සඳහාත් මේ මුදල් ගලාගෙන ගිහින් තිබෙනවා. අපි 2026 අවුරුද්දට රුපියල් බිලියන 95ක ණය යෝජනා ක්‍රමයක් ඉදිරිපත් කළා. පැහැදිලිවම ඒ මුදල බෙදා හැර තිබෙනවා. දෙසැම්බර් 31 වෙනකොට සම්පූර්ණ මුදලම බෙදා හරිනවා.

ඊට අමතරව අපි ලබන වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වන අය වැයෙන් මීට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් නහාසිටුවීම සඳහා වන සහන ණය යෝජනා ක්‍රම වෙනුවෙන් නිකුත් කරන්නත් බලාපොරොත්තු වෙනවා. මොකද අපි කවුරුත් දන්නවා, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් නහාසිටුවීම තුළ තමයි අපට වැඩි ආර්ථික වර්ධන වේගයක් අත්පත් කරගන්න අවශ්‍ය පරිසරය සකස් වෙන්නේත්, අපට ආර්ථිකය ඒ දිශානතියට ගෙනයන්න හැකියාව ලැබෙන්නේත් කියන කාරණය. මොකද, අපේ මධ්‍ය කාලීන ප්‍රතිපත්තිය වන්නේ සියයට හතක ආර්ථික වර්ධන වේගයක් අත්පත් කර ගැනීමයි. එතැනට යන ගමනේදී ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් නහාසිටුවීම කියන්නේ සුවිශේෂී කාරණයක්. අපිට වැඩි ආර්ථික වර්ධන වේගයක් අත්පත් කර ගන්නට ඔවුන්ගේ දායකත්වය සුවිශේෂී විධියට වැදගත් වෙනවා. එම කාරණය ගැනත් සඳහන් කරන ගමන් මා කියන්න කැමැතියි, ඉදිරියේදී අපි ඉදිරිපත් කරන අය වැයෙන් ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් රුපියල් ට්‍රිලියන දෙකක වාගේ අතිවිශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරන්නට බලාපොරොත්තු වන බව. මම හිතන විධියට ඉතිහාසය තුළ ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් රජයක් විධියට වියදම් කරන වැඩිම මුදල් ප්‍රමාණය ඒකයි. එවැනි මුදල් ප්‍රමාණයක් මුදා හරින්න අපි බලාපොරොත්තු වෙනවා, ඉදිරි අය වැයේදී. මොකද, ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් වැඩි මුදලක් වෙන් කරනවා කියන්නේ යටිතල පහසුකම් දියුණු කිරීම ඇතුළත ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ සියලුම ව්‍යවසායකයින්ට තම ව්‍යාපාරික අවස්ථා පුළුල් කරගන්න එය පිටුවහලක් වෙනවා කියන එකයි. රජයක් විධියට අපි මේ රට මේ තිබෙන තත්ත්වයෙන් වඩාත් ඉහළට ගෙනියන්න යන ගමනේදී රටේ ජනතාවට අදාළ ප්‍රතිලාභ ලබා දෙන්න නම් මේ ආර්ථිකය පුළුල් කරගන්න ඕනෑ. එතැනට යන්න අවශ්‍ය පියවර, උපාය මාර්ග ඉදිරියටත් ගන්නා ගමන්ම, වැඩි ආර්ථික වර්ධන වේගයක් අත්පත් කරගන්න අවශ්‍ය සුවිශේෂී ක්‍රියාමාර්ග රාශියක් ඉදිරි අය වැය තුළින් ගන්නත් අපි බලාපොරොත්තු වන බව සඳහන් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Next, the Hon. Arjuna Sujeewa Senasinghe. You have 12 minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වී සාලි මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

[පූ.භා. 11.26]

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම හිතන විධියට, ආර්ථිකය තුළින් බලාපොරොත්තු වන ධනාත්මක ස්වභාවය කෙසේද යන්න ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ කථාව තුළ සඳහන් කළා.

[ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ]

මම මතක් කර දෙන්න කැමැතියි, ඇත්තටම රට බංකොලොත් - bankrupt - වීමෙන් පසුව ඉතා කෙටි කාලයක් තුළ පත් වුණු රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුව සියයට 5.5ක ආර්ථික වර්ධන වේගයක් අත්පත් කර ගනිමින්, ඩොලර් බිලියන 6.8ක සංචිතයක් පවත්වා ගෙන යමින්, උද්ධමනය ඍණ 0.5ක වාගේ ප්‍රමාණයකට ගෙන ගිය බව. අපේ ආණ්ඩුවක් නොවුණත් ඒ වෙලාවේ පත් වුණු ඒ ආණ්ඩුවට අපේ රට එවැනි ඉතා සාධනීය තත්ත්වයකට පත් කරගන්න අවස්ථාව ලැබුණා. ඒ තත්ත්වය ලෝකය - ජාත්‍යන්තරය - දැක්කා. ඒ අනුව ඉතා ඉක්මනින්ම රට සාමාන්‍ය තත්ත්වයට පත් කළා කියන මතය මුළු ලෝකයේම පැතිරෙන්න පටන් ගත්තා. අපි ඒක පිළිගන්න ඕනෑ. එවැනි ආර්ථිකයක් සහිත රටක් තමයි නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කළ මේ ආණ්ඩුවට ලැබුණේ.

දැන් මේ ආර්ථික වර්ධන වේගය වැඩි වෙන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා වෘත්තීමය වශයෙන් වෛද්‍යවරයෙක් බව මම දන්නවා. බංකොලොත්භාවයෙන් පසුව සියයට 5.5ක ආර්ථික වර්ධන වේගයක් අත්පත් කර ගත්තා නම්, දැන් මේ ආර්ථික වර්ධන වේගය වැඩි වෙන්න ඕනෑ, සියයට 6.5, සියයට 7.5 යනාදී වශයෙන්. ලෝක බැංකුව අපෙන් බලාපොරොත්තු වෙන්නේ ඒකයි. මොකද, වැටී තිබුණු ආර්ථිකය තමයි උඩට එන්නේ. ජපානය වාගේ දියුණු රටවල්වලින් ඒ වාගේ ආර්ථික වර්ධනයක් බලාපොරොත්තු වෙන්න බැහැ. මොකද, දියුණු මට්ටමේ තිබෙනකොට ඒ මට්ටම සාමාන්‍යයෙන් සියයට 3.5 හෝ 4 වාගේ මට්ටමක තමයි තිබෙන්නේ. ඒ නිසා ඇමෙරිකාව වාගේ රටවල්වල එහෙම තිබුණාට කමක් නැහැ. හැබැයි, ඉන්දියාව තවම සියයට 6කට වැඩි ආර්ථික වර්ධන වේගයක් පවත්වා ගෙන යනවා. චීනයේ එම තත්ත්වය පොඩ්ඩක් අඩු වෙලා තිබෙනවා. චීනයේ සියයට 8ක ආර්ථික වර්ධන වේගයක් තිබුණේ. දැන් එය සියයට 6, සියයට 7 වාගේ මට්ටමක තිබෙන්නේ.

ලංකාව මේ ණය උගුලෙන් බේරෙන්න නම් අනිවාර්යයෙන්ම ඒ වාගේ ආර්ථික වර්ධන වේගයක් පවතින තත්ත්වයකට එන්න ඕනෑ. හැබැයි, තවම ඒ වාගේ තත්ත්වයකට අපි ඇවිල්ලා නැහැ. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා කියන ඒ සිහින ලෝකයට යන්න තවම හිතන්නවත් බැහැ. දැන් ආර්ථික වර්ධන වේගය පහළට එන්නේ. සියයට 5.5ක තිබුණු ආර්ථික වර්ධන වේගය දැන් සියයට 4 මට්ටමේ තිබෙන්නේ. ලෝක බැංකුව සහ IMF එක කියනවා, ඊළඟ අවුරුද්ද වෙනකොට මේක සියයට 3.5, සියයට 3.7 වාගේ මට්ටමට එන්න පුළුවන් කියලා. මේක ඉතාම අහිතකර තත්ත්වයක්. මම දේශපාලනික වශයෙන් ඔබතුමන්ලාට අභියෝග කරන්න කියන දෙයක් නොවෙයි, මේක.

රටක් වශයෙන් ඔබතුමන්ලා වෙනත් පැත්තකින් මේ තත්ත්වය පිළිබඳව හිතන්න ඕනෑ. අද රාජ්‍ය ආයතන ගණනාවක් පාඩු ලබනවා. ශ්‍රීලන්කන් ගුවන් සේවය පාඩු ලබනවා, සතොස පාඩු ලබනවා, සීනි කර්මාන්තශාලා පාඩු ලබනවා, SLTB එක පාඩු ලබනවා. මේ ආකාරයෙන් රාජ්‍ය ආයතන ගණනාවක් විශාල වශයෙන් පාඩු ලබමින් සිටිනවා.

ඊළඟට විශේෂයෙන්ම රජයේ ණය සම්බන්ධයෙන් මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ආණ්ඩුව ඇමෙරිකානු ඩොලර් බිලියන අටක ණය ගෙවූ බවට කියන ප්‍රබන්ධය ගත්තොත්, එහිදී ණය rollover කිරීමක් වෙන්නේ. එමෙන්ම, භාණ්ඩාගාර බිල්පත් ඇතුළු වෙනත් මූලාශ්‍ර හරහා ඩොලර් බිලියන 6ක වාගේ ණය ප්‍රමාණයක් ඔබතුමන්ලා ලබා ගන්නවා. එවැනි තත්ත්වයක් තුළ, රජය සතු මුදල්වලින් පාරවල් හදන බව ප්‍රකාශ කළත්, ඒක අමූලික බොරුවක්. ගෙවීමට ඇති ණය ප්‍රමාණයට සමාන ණය ප්‍රමාණයක් ඔබතුමන්ලා නැවත ලබා ගන්නවා. ගරු ඇමතිතුමනි, මේ විස්තර මම ඔබතුමාට ලබා දෙන්නම්. 2024 වසර අවසානයේ පැවති තත්ත්වයට සාපේක්ෂව 2026 මාර්තු 31 දින වන විට සැබෑ දේශීය ණය ප්‍රමාණය රුපියල් බිලියන 490කින් සහ විදේශීය ණය ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් මිලියන 788කින් පැහැදිලිව ඉහළ ගොස් ඇති බව මෙහි සඳහන් වෙනවා.

එමෙන්ම, 2026 වසර තුළ ශ්‍රී ලංකා රජය බහුපාර්ශ්වික හා ද්විපාර්ශ්වික ණය හිමියන් වෙත ඩොලර් බිලියන 2.7ක් ගෙවිය යුතු අතර, ජූනි මාසය දක්වා ගෙවා තිබෙන්නේ ඩොලර් බිලියන 1.3ක් පමණයි. ඒ අනුව, වසරේ ඉතිරි මාස හය තුළ තවත් ඩොලර් බිලියන 1.4ක් ගෙවීමට ඇති බැවින්, මෙවැනි තත්ත්වයක් තුළ දේශීය මෙන්ම විදේශීය ණය ප්‍රමාණයන් ඉහළ යමින්, පවතින සැබෑ ආර්ථික අවදානම වසන් කර, හුදු ඉලක්කම් සන්නිවේදනය කිරීම හරහා රටේ මූලික ස්ථාවරත්වය මැනිය නොහැකි බව ස්වාධීන ආර්ථික විශේෂඥයින් විසින් ප්‍රකාශ කරනවා.

ගරු අමාත්‍යතුමනි, ඩොලර් බිලියන 8ක ණය ගෙවූ බව ආණ්ඩුව ප්‍රකාශ කළත්, ඩොලර් බිලියන 5යි දශම ගණනක් පමණයි ගෙවලා තිබෙන්නේ. රුපියල්වලින් ගෙවූ ණය ප්‍රමාණය ඩොලර්වලට හරවලා IMF එකට පෙන්නුවා. එතකොට විශාල තෙරපුමක් තමයි ඇති වෙන්නේ.

Advocata Institute එක දේශපාලනමය වශයෙන් ඔබතුමන්ලාට සාධනීය අදහසක් ඉදිරිපත් කළා. නමුත්, එම ආයතනය කියනවා, ආර්ථිකමය අතින් රට ඉතාම භයානක තැනකට යන්න පුළුවන් කියලා. පළමු කාර්තුවේ ආර්ථික වර්ධන වේගය සියයට 5යි. මෙවර සියයට 4යි. ඊළඟට, සියයට 3.7 දක්වා වුණත් ඒක පහළට වැටෙන්න පුළුවන් කියලා කියනවා. එමෙන්ම, කෘෂි කර්මාන්තය සියයට 2.3කින් සංකෝචනය වෙලා තිබෙනවා. විශේෂයෙන්ම වී නිෂ්පාදනය සියයට 15කින් පහත වැටිලා තිබෙනවා. වී නිෂ්පාදනය කරන අපේ ගොවීන් කම්මුතුයි. ගොවීන්ට ජීවත් වෙන්න බැරි තත්ත්වයක් ඇතිවෙලා තිබෙන්නේ. කන්න දෙකක වී විකුණා ගන්න බැහැ. ගරු අමාත්‍යතුමනි, ඔබතුමන්ලා ගොවීන්ගේ කර මතින් බලයට ආවේ. ඒ කාලයේ නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමන්ලා අමුඩ ගහගෙන, ලාල් කාන්ත ඇමතිතුමන්ලා වීදි සටන්වල නිරත වෙමින්, ජනතාව අවුස්සමින්, උද්ඝෝෂණ කරමින්, වී කිලෝවක් සඳහා ගොවි ජනතාවට රුපියල් 150ක සහතික මිලක් ලබාදෙන බව කියමින් තමයි බලයට ආවේ. නමුත්, අද තෙත වී කිලෝවක් සඳහා අඩුම ගණනේ රුපියල් 85ක්වත් ගෙවාගන්න බැහැ. වී කිලෝවක් නිෂ්පාදනය කරන්න රුපියල් 95ක පමණ පිරිවැයක් දරන්න සිදු වෙනවා. ඒ වාගේම, පසුගිය කන්නයේ ලබා ගත් ණය ආපසු ගෙවලාත් නැහැ. "භූතයා" යන්ත්‍රය වෙනුවෙන් ඒ ගොවීන් රුපියල් 45,000ක හෝ 50,000ක පමණ ණය ගෙවන්න තිබෙනවා. මේ ඉන්න සේවකයින්ගෙන් අහලා බලන්න, කීදෙනක් තමන්ගේ කන කර උකස් කරලා තිබෙනවාද කියලා. හැම කෙනෙක්ම උකස් කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, රන් ආභරණ පමණක් උකස් කර රුපියල් බිලියන 1,200ක පමණ මුදලක් ලබාගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා ව්‍යාපාරික පවුලකින් පැවතෙන කෙනෙක්. ඔබතුමා ඉන්නේ Barnes Place එකේ. ව්‍යාපාරිකයින් ඉන්නේ කොච්චර අමාරුවෙන්ද කියලා ඔබතුමා දන්නවා. ගරු අමාත්‍යතුමා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දියුණු කරන්න ඕනෑ කියලා කථා කරනවා. නමුත් බැංකු ණය සඳහා සියයට 40ක interest එක ගෙවාගන්න බැහැ. නිෂ්පාදනවලින් සියයට 40ක් ලාභ ලෙස ලබා ගන්න බැහැ. දේශපාලනික වශයෙන් ඔබතුමන්ලාට පහර ගහන්න නොවෙයි මම මේවා කියන්නේ. ඉතාම භයානක තත්ත්වයක් මේ බිහිවෙලා තිබෙන්නේ.

ඒ වාගේම, IMF එකේ වාර්තාවලට අනුව, "2025 වසරේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.6ක අතිරික්තයක් වාර්තා කළ මෙරට ජංගම ගිණුමේ ශේෂය 2026 වසරේදී ඍණ සියයට 0.5ක් දක්වාත්, 2027 වසරේදී ඍණ සියයට 0.3ක් දක්වාත් පහත වැටී නැවත හිඟයක් බවට පත්වනු ඇතැයි වාර්තා වෙනවා" කියලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, මේවා රටට එන ආයෝජන. රටට පැමිණීමට නියමිතව තිබූ ආයෝජන ගණනාවක් ආපසු ගිහිල්ලා තිබෙනවා. අදානි සමාගම සුළං විදුලිබල ව්‍යාපෘතියෙන් ඉවත් වුණා. ඩොලර් මිලියන 500ක්. ඒ අවදානම පිළිබඳව ගරු විපක්ෂ නායකතුමා මුලින්ම සඳහන් කළා. එතුමා කිව්වා, ආයෝජකයෝ ආපසු යනවා කියලා. එමෙන්ම, HSBC එකත් යනවා. China Merchants Port Holdings එක යනවා. ඒ වාගේම LNG ව්‍යාපෘති සම්බන්ධයෙන්ද විවිධ ප්‍රශ්න මතු වී තිබෙනවා මම දැක්කා. මෙවැනි තත්ත්වයන් හමුවේ ආයෝජන විශාල ප්‍රමාණයක් රටින් බැහැර වෙනවා. එතකොට, එවැනි ආයෝජන එකක්වත් ලංකාවේ ඉතිරි වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "Rising costs leave 37.7 per cent of listed firms unable to cover interest expenses" යනුවෙන් එක් වාර්තාවක සඳහන් වෙනවා. එතකොට, මේ ආර්ථිකය විශාල වශයෙන් ඇද වැටෙනවා. ඒ වාගේම, උද්ධමනය සියයට 9යි.

ජනතාවට ජීවත් වෙන්න ඉතාම අමාරුයි. විශේෂයෙන් මධ්‍යම පන්තියට. මෙය ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. සියයට 36ක් බදු ගහනවා. ඊට පස්සේ වක්‍ර බදු තව සියයට 20ක්, 30ක් භාණ්ඩවලින් එනවා. දැන් පොලිය ඉහළ ගියා. එතැනින් සියයට 38ක් ආපසු කපනවා. එතකොට පොලිය ආපසු බිමටම එනවා.

ඊයේ ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාත්, මමත්, අපේ ගරු විපක්ෂ නායකතුමාත් ගියා විශ්‍රාමිකයන් හම්බ වෙන්න. ඔවුන්ගේ 2024 අවුරුද්දේ විශ්‍රාම වැටුප මාසයකට රුපියල් 55,000යි. සාමාන්‍ය මනුස්සයෙකුට මැරෙන්නේ නැතිව ජීවත් වෙන්න, බිම වැටිලා මැරෙන්නේ නැතිව ජීවත් වෙන්න එක මනුස්සයෙකුට මාසයකට රුපියල් 18,000ක් ඕනෑ. එතකොට මේ අයට මාසික පඩිය තිබෙන්නේ රුපියල් 55,000ක විතර ප්‍රමාණයක්. එතකොට ආර්ථිකයේ මේ තෙරපුම එන්න එන්න වැඩි වෙනවා. නමුත්, දැන් ඔබතුමන්ලා නැවතත් IMF එකට යන්න හදනවා. IMF එක කියන්නේ ගිනි පොලීකාරයෙක්. හැබැයි, ගිනි පොලීකාරයාත් අපිට ඕනෑ වෙනවා. හොම්බෙන් යනකොට, ජීවත් වෙන්න බැරි වෙනකොට, ගිනි පොලීකාරයාගෙන් හරි කීයක් හරි අරගෙන අපි ආපසු අපේ ආර්ථිකය හදාගන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැබැයි, දිගටම එහෙම හදාගන්න බැහැ. IMF එක බලන්නේ නැහැ රට දියුණු වෙනවාද, නැද්ද කියලා. IMF එක කියන්නේ, අර tax එක ගහන්න, මේ tax එක ගහන්න, දේපළ tax ගහන්න, inheritance tax ගහන්න කියලායි. රටේ ජනතාවගේ බෙල්ල මිරිකලා හෝ කොහොම හරි අපේ ණය ටික ගෙවන්න කියලායි ඒ අය කියන්නේ. සියයට 4යි, 5යි IMF එකේ ගිනි පොලිය. වෙන කවුරුවත් නැති නම්, අවශ්‍යම අවස්ථාවකදී IMF එක පාවිච්චි කළාට කමක් නැහැ. හැබැයි ඔබතුමන්ලා කිව්වා, IMF එක පාවිච්චි කරන්නේ නැහැ කියලා. ඔබතුමන්ලා කිව්වා, සමාලෝචනය කරනවා කියලා. නමුත්, ඒක කළේ නැහැ.

මේ තත්ත්වය තුළ ගොවියා කම්මුතුයි; ව්‍යාපාරිකයා කම්මුතුයි; සාමාන්‍ය මනුස්සයා කම්මුතුයි. අද පෙට්‍රල් ටිකක් ගහ ගන්න බැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඉන්ධන වරායෙන් ගොඩබාන ගාණටම දෙනවා කියලා කිව්වා. මම මේ උදව්ය විවේචනය කරන්නේ නැහැ. ආණ්ඩුවට ගහනවා නම් ගහන්න ඕනෑ තරම් දේවල් තිබෙනවා. ඒවා මම කියන්නේ නැහැ. මම කියන්නේ මේකයි. අපේ මේ රට යන්නේ විශාල අගාධයකටයි. මිනිසුන්ට ජීවත් වෙන්න බැරි තත්ත්වයක් දැන් තිබෙන්නේ. මේක හොඳ තත්ත්වයකට හැරෙන්නේ නැහැනේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ආර්ථික වර්ධන වේගය සියයට 6.5යි නම්, මේ ජනතාවට බලාපොරොත්තුවක් තියා ගන්න පුළුවන්, අපේ ජීවිත නැවත අපට හරිගස්සගන්න පුළුවන් කියලා. අපිට ආපහු අමාරුවෙන් හරි ජීවත් වෙන්න පුළුවන් කියලා ඔවුන්ට හිතන්න පුළුවන්.

දැන් බලන්න, මධ්‍යම පන්තිය දිහා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාගේ විදුලි බිල රුපියල් 15,000ක් නම් - මේ අන්තිම මාස කිහිපය තුළ සිදු වූ විනාශය බලන්න. ගල් අඟුරු වංචාව සිදු වුණා. ඒ වාගේම, කන්ටේනර් වංචාවත් සිදු වුණා. ඒ වාගේම අපි දැක්කා, harbour එකෙන් ඒ කොන්ත්‍රාත්තුව හම්බ වෙන්නේ නැති හින්දා ඊයේ දිනයේදී බිලියන 129ක විතර ආයෝජනයක් අපේ රටින් පිටත් වුණු බව. එතකොට අපි ඩොලර් මිලියන 21ක් ගෙවන්න ඕනෑ. කවුද මේ පාඩුව ගෙවන්නේ? මේ ආණ්ඩුවේ නොහැකියාව හින්දා ඒගොල්ලෝ මේක අතහැරලා යනකොට, ඒ වෙනුවෙන් රුපියල් බිලියන 7කට වඩා වැඩි ප්‍රමාණයක් අපි ගෙවන්න ඕනෑ. ඒ මුදල් පිට රටට ගෙවන්නේ. එතකොට මේ වෙන්නේ තනිකර හොරකමක්නේ. NDB බැංකුවේ පාඩුව බිලියන 13.5යි. ඒක ගෙවන්නෙත් මිනිසුන්ගේ සාක්කුවෙන් අරගෙන. ඊට පස්සේ ගල් අඟුරු වංචාවේ පාඩුව රුපියල් බිලියන එකසිය ගණනකට වැඩියි. ඒවා ගෙවන්නෙත් මිනිසුන්ගේ සාක්කුවෙන් අරගෙන. ඉතින්, මේ හැම මනුස්සයෙක්ම දුක් විඳින්නේ, මේ දුප්පත් ජනතාව දුක් විඳින්නේ මේ ආණ්ඩුවේ නොහැකියාව හින්දා. මේක දිගින් දිගටම එන ප්‍රමාණය බලන්න. දැන් අවුරුදු දෙකක් ගිහිල්ලා නේ. අපි ආපු ගමන් අපිට කියන්න පුළුවන් මොනවා හරි කරනවා කියලා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අවුරුදු දෙකක් ගිහිල්ලාත් යන්නේ පල්ලෙහාට නම්, මේ රේඛාව උඩට ඉස්සෙන්නේ නැහැ. රනිල් වික්‍රමසිංහ මහත්මයා කරපු ටිකම කරගෙන යන්න හැදුවා. හැබැයි ඒක පොඩ්ඩ පොඩ්ඩ අඩු වෙලා, අඩු වෙලා ගිහින් තිබෙනවා.

එයාර් ලංකා සමාගමේ පාඩුවට විසඳුමක් දුන්නේ නැහැ. බිලියන 25ක් විතර සාමාන්‍යයෙන් පාඩු ලබනවා. ඒක විසඳුවේ නැහැ. මම ඕනෑම ඔට්ටුවක් අල්ලනවා. මෙට්‍රෝ බස් ටික ගෙනැල්ලා ඒවා කළමනාකරණය කරන්න බැරි වුණොත්, ඒවා ටිකත් විනාශ වෙලා යන හැටි බලන්න. ඒවාට ඉඩම් තිබෙනවා. ඒවාට ගෙවන්නේ නැහැ. අනෙක් ඒවාට ගෙවන්නේ නැහැ. මේ රජයට බිස්නස් කරන්න බැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා මේක හොඳට තේරුම් ගන්න ඕනෑ. ඔබතුමන්ලා මේ මිශ්‍ර වෙලා ඉන්නේ. ඔබතුමන්ලාගේ ධනවාදයත් තිබෙනවා. ඔබතුමන්ලා ඉන්දියාව එක්කත් ගනුදෙනු කරනවා; ඇමෙරිකාව එක්කත් ගනුදෙනු කරනවා. චීනය එක්කත් side එකේ ඉඳන් ගනුදෙනු කරනවා. දැන් චීනය ඔක්කෝම අතහැරලා යනවා. චීනය කියන්නේ, ඔබතුමන්ලාගේ දකුණු අත වාගේ නේ. ඔබතුමන්ලාගේ මේ ආර්ථික සංකල්පය තේරෙන්නේ නැහැ. ඔබතුමන්ලා අතරමං වෙලා ඉන්නේ. ඔබතුමන්ලා දන්නවා විවෘත ආර්ථිකයට යන්න ඕනෑ, ලිබරල් ආර්ථිකයට යන්න ඕනෑ කියලා. හැබැයි, ඒක ඔබතුමන්ලාගේ ආර්ථික සැලැස්මේ model එක නොවෙයි. ඔබතුමන්ලාගේ model එක සමාජවාදී, ඒ වාගේම මාක්ස්වාදී model එකක්. ඒ model එකේ ඔබතුමන්ලා අතරමං වෙලා ඉන්නේ. එතකොට මේ ආණ්ඩුවට බිස්නස් කරන්න බැහැ.

ඊට පස්සේ ඔබතුමන්ලා විවෘත විශ්වවිද්‍යාල ගේනවාද, නැද්ද දන්නේ නැහැ. විශේෂයෙන්ම ඉස්පිරිතාල සම්බන්ධවත් කියන්න ඕනෑ. ඒවා privatize කරනවාද? ඒවායේ paying ward එකක්

[ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා]

දානවාද? ඒවා සම්බන්ධයෙන් ඔබතුමන්ලාට අවධානයක් නැහැ. ඒ ගැන අවබෝධයකුත් නැහැ. ඔබතුමන්ලා පුදුමයෙන් වාගේ බලා හිටියාට වැඩක් නැහැ. අපේ රටේ ආර්ථිකය එන්න එන්න පල්ලෙහාට යනවා. ණය ප්‍රමාණය වැඩි වෙනවා. ගන්නා ණය ප්‍රමාණය ආයෙත් ගන්නවා නේ. ඒක ඔබතුමන්ලා විතරක් නොවෙයි, අපි වුණත් කරනවා. හැබැයි, ආර්ථික වර්ධන වේගය සියයට 6.6කට, 7කට විතර නංවන්න ඕනෑ. ආයෝජන සියයට එකයි. ඒ ආයෝජන ගිය ආණ්ඩුව අත්සන් කරපුවා. බිලියන එකයි. අපේ දළ ජාතික නිෂ්පාදනය බිලියන 100යි. අඩුම දුප්පත් රටකත් සියයට 3ක්වත් තිබෙන්න ඕනෑ. අඩුම ගාණේ බිලියන 3ක්වත් ආයෝජන තිබෙන්න ඕනෑ. අපේ රටට ආපු ඔක්කෝම යනවා. තෙල් ටැංකිවලට ආපු ටික ගියා. වරාය දියුණු කරන්න ආපු ටික ගියා. අවුරුදු 50කට පස්සේ ඒක ලංකාවට දෙන්න හිටියේ. ඊට පස්සේ අදානි ගියා. එතැනත් ඩොලර් මිලියන 500ක්, ගිගාවොට් එකක්. අපේ විදුලිය ඒකකයක් වෙනුවෙන් වැය කරන මුදල රුපියල් 60යි. මේක අඩු කර ගන්න බැහැ. එහෙම ගෙනාවා නම් රුපියල් 25ට ගේන්න තිබුණා. එහෙම ගෙනාවා නම් මේ කර්මාන්ත එනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්ඩලික පිරිසිදු සභානායකයා)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(මාණ්ඩලික සොලිසිටර් ජනරාල්)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Give me one more minute, Sir.

දැන් කර්මාන්තකරුවෝ ඔක්කෝම වාගේ ලංකාවෙන් යනවා. තේ කර්මාන්තශාලා අරගෙන යනවා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. මොකද, දැන් මෙහේ තේ නිෂ්පාදනය කරන්න බැහැ. ඒ නිසා ඒගොල්ලෝ දැන් ඩුබායිවලට අරගෙන යනවා, ඒ කර්මාන්තශාලා ඔක්කෝම. මේ අවුරුද්දේ තේ කර්මාන්තය ඩොලර් බිලියන එකක් - US Dollars 1 billion - පාඩුයි. ඇඟලුම් කර්මාන්තයෙන් තවත් ඩොලර් බිලියනයක් අඩු වෙලා තිබෙනවා. සංචාරක කර්මාන්තයේ ආදායම ඩොලර් බිලියන 2යි, මේ වන කොට. මේ අවුරුද්දේ මාස 10කුත් දැන් ගිහිල්ලා. ඒ ආදායම ඩොලර් බිලියන 5ක් තිබෙන්න ඕනෑ. මම මේ ඔබතුමන්ලාට විරුද්ධව කථා කරනවා නොවෙයි. මේක භයානක තත්ත්වයක්. මේක මෙහෙම ගිහිල්ලා, ඊළඟ අවුරුද්ද වනකොට ආපහු IMF එකට ගියොත්, ඔබතුමන්ලාත් කම්මුතුයි; අපිත් කම්මුතුයි. මේ ඉන්න සේවකයන්ට ජීවත් වෙන්න බැරි වෙනවා. රුපියල් 50,000ක් අරගෙන කොහොමද ජීවත් වෙන්නේ? රුපියල් 30,000ක් විතර යනවා, එක මනුස්සයෙකුට කන්න විතරක්. කෑවාම ඒ සල්ලි ඉවරයි. දරුවෙකු ඉස්කෝලේ යවන්න බැහැ, වගාවක් කර ගන්න බැහැ. ගොවියෝ අනාථයි; කන්න දෙකක් අනාථයි. සහල් මෙට්‍රික්ටොන් 150,000ක් ඔබතුමන්ලා ගෙන්වා තිබෙනවා. ඒ නිසා ගොවීන්ට තම වී ටික විකුණා ගන්න බැහැ. මොකද, ඒවා මෝල්වලින් ගන්නේ නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමන්ලා මේවාට විසඳුම් දෙන්න ඕනෑ. මේවාට විසඳුම් දුන්නොත් විතරයි ගොවියාට වගා කරන්න පුළුවන් වන්නේ. ඊළඟ පාර වගා කරන්න ගොවියාට සල්ලි නැහැ. මොකද, ගත්තු ණය ටික ගෙවා ගන්න ගොවියාට බැහැ. ඒ හින්දා ඉතාම භයානක තත්ත්වයක් තමයි ඇති වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්ඩලික පිරිසිදු සභානායකයා)
(The Hon. Deputy Speaker)
Hon. Member, would you please wind up?

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(මාණ්ඩලික සොලිසිටර් ජනරාල්)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
රටේ ආර්ථිකය ඉතාම අවදානම් තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඔබතුමන්ලාට මේක තව අවුරුද්දක්, අවුරුදු එක හමාරක් ඇදගෙන යන්න පුළුවන්. අපි කිව්වා, මේ වාගේ අවදානම් තත්ත්වයක් එයි කියලා. එතකොට ඔබතුමන්ලා අපට බැන්නා. හැබැයි, අපි කියපු දේ හරි. එක පාර වැටෙන්නේ නැහැ. මෙහෙම ඇවිල්ලා ඇවිල්ලා තමයි වැටෙන්නේ. මෙහෙම තමයි ගෝඨාභයත් වැටුණේ. ඇවිල්ලා, ඇවිල්ලා අන්තිමට වැටුණා. ඔබතුමන්ලා මෝඩ වෙන්නේ නැති වෙයි, ගෝඨාභය තරම්. හැබැයි, ඉතාම අමාරු තත්ත්වයකට, රටේ ජීවත් වෙන්න බැරි තත්ත්වයකට,-

ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා
(මාණ්ඩලික ආර්.එම්. කාමිණි රත්නායක)
(The Hon. R. M. Gamini Rathnayake)
සුජීව මන්ත්‍රීතුමා කිව්වේ, ආණ්ඩුව මාස තුනකින් වැටෙනවා කියලා නේද?

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(මාණ්ඩලික සොලිසිටර් ජනරාල්)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
මාස තුනෙන් වැටෙනවා කිව්වේ කවුද? මාස තුනෙන් ආර්ථිකය ඉවරයි. මාස තුනෙන් මේ සේවකයෝ වැටිලා ඉන්නේ. මේ අයගෙන් අහන්නකෝ, කොහොමද ජීවත් වෙන්නේ කියලා. රුපියල් 50,000න් පුළුවන්ද,-

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්ඩලික සොලිසිටර් ජනරාල්)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අර මන්ත්‍රීතුමා කිව්වා නේ, කථානායක වෙනවා කියලා, ලබන සතියේ.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(මාණ්ඩලික සොලිසිටර් ජනරාල්)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ඔව්, ඔබතුමා කථානායක වෙනවා කියලා කිව්වේ. එහෙම වුණේ නැහැ නේ.

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා
(මාණ්ඩලික සොලිසිටර් ජනරාල්)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
අපට කිව්වේ, ලබන සතියේ කථානායක වෙනවා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්ඩලික පිරිසිදු සභානායකයා)
(The Hon. Deputy Speaker)
Hon. Member, would you wind up please?

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(මාණ්ඩලික සොලිසිටර් ජනරාල්)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
අපි ඔබතුමාට සහයෝගය දෙනවා. හැබැයි, අපි අපේ නියෝජ්‍ය කථානායකතුමා උඩින් කියලායි ඔබතුමා ගේන්නේ. නියෝජ්‍ය කථානායකතුමාට උඩින් ඔබතුමාට එන්න දෙන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා නියෝජ්‍ය කථානායක ධුරයට ගේනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කථානායකතුමා අයින් වුණාම අපි ඔබතුමාව කථානායක කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Kanchana Welipitiya. You have 10 minutes and the Floor is yours.

[පූ.භා. 11.41]

ගරු කංචන වැලිපිටිය මහතා
(மாண்புமிகு கஞ்சன வெலிப்பிட்டிய)
(The Hon. Kanchana Welipitiya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ යෝජනාව සහ 2026 අංක 6 දරන පරිපූරක ඇස්තමේන්තුවට අදාළ පරිපූරක මුදල් අනුමත කිරීම සඳහා වන විවාදය පැවැත්වෙන මේ මොහොතේත් විපක්ෂය තමන්ට සුපුරුදු බොරු කියන වැඩේ පටන් ගෙන තිබෙනවා. විපක්ෂය මෙතැන කියන මේ කථා ටික ඇහුවාම හිතෙනවා, රටක් තිබෙන්න විධියක් නැහැ කියලා. මේ කථා ටික අනුව නම් ලංකාවක් තිබෙන්න විධියක් නැහැ. මොකද, ඒගොල්ලෝ තමයි ලංකාව සුරපුරයක් කරලා තිබෙන්නේ. එදා රනිල් වික්‍රමසිංහ මහත්මයාට විරුද්ධව ගිහිල්ලා, දැන් රනිල් වික්‍රමසිංහ මහත්මයාව කරේ තියාගෙන යන තැනටම ඒ අය පත් වෙලා තිබෙනවා. එච්චරටම බංකොලොත් වෙලා. ගරු විපක්ෂ නායකතුමා ක්‍රීඩකයන්ගේ ගෙවල්වලට යන පාරවල් ගැන කථා කරන තරමටම විපක්ෂය බංකොලොත් වෙලා තිබෙනවා. ඒ නිසා අප ඒ කථා ලොකුවට ගණන් ගන්න ඕනෑ නැහැ.

රනිල් වික්‍රමසිංහ මහත්මයා ජනාධිපතිවරයා හැටියට රට කරපු අවුරුදු කීපය තුළ මේ රට වහලා තිබුණේ. මේ රටට වාහන ගෙන්වූයේ නැහැ. අඩුම තරමින් ගොන් කරත්තයක්වත් ගෙනාවේ නැහැ. එදා මේ රටට භාණ්ඩ 338ක් විතර ගෙන්වන්නේ නැතිව මේ රට වසා දමලා, සල්ලි ටිකක් එකතු කරගෙන ඉඳලා දැන් කියනවා, "අපි මාර වැඩක් කළා, රනිල් වික්‍රමසිංහ මහත්මයා ඩොලර් බිලියන මෙච්චර ප්‍රමාණයක් ඉතුරු කරලා තිබුණා, නියම රටක් හදලා තිබුණා" කියලා. හැබැයි, අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව පත් වුණාට පසුව තමයි අපේ රටේ ජනතාවට අවශ්‍ය කරන වාහනයක් හරි ගෙන්වා දෙන්න පුළුවන් වුණේ. එතකල් ඒ කිසි දෙයක් වුණේ නැහැ. දරුවන්ට ඕනෑ කරන ඇපල් ගෙඩියක්, දොඩම් ගෙඩියක් ගෙනැල්ලා දෙන්න බැරි රටක් තමයි තිබුණේ. ඒ තැනට බංකොලොත් වෙච්ච රටක් හදලා, අපේ ආණ්ඩුව ගැන මහා බයක්, මහා විකාරයක් රටට පෙන්වන්න දැන් උත්සාහ කරමින් ඉන්නවා. මේ ආණ්ඩුව පත් වුණාම මෙතුමන්ලා ඔය විධියටම තමයි කිව්වේ, මේ ආණ්ඩුවට මාස 6ක්වත් දුවන්න බැහැ කියලා. හැබැයි, මේ ආණ්ඩුව අවුරුදු දෙකක් දුවලා තිබෙනවා. දැන් කියනවා, තව අවුරුදු එකහමාරක් විතර දුවයි කියලා. ඉතින් ඕක තමයි හැමදාම කියන්න වෙන්නේ. 2029 වනකල් ඔය කථාව කිය කියා ඔබතුමන්ලාට ඉන්න පුළුවන්කම තිබෙනවා.

ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා මහා කනස්සල්ලකින් කියනවා, SLTB එක වැටිලා කියලා. SLTB එක කොයි කාලයේද, ගොඩ ගිහිල්ලා තිබුණේ? අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව ආවාට පස්සේ තමන්ගේ වියදම් ටික දරාගෙන කටයුතු කරන්න පුළුවන් මට්ටමට SLTB එක ගෙනැල්ලා තිබෙනවා. ඒ වාගේම ඒකේ ඇතුළේ වුණු හොරකම, වංචාව, මංකොල්ලකෑම් නතර කරලා තිබෙනවා. ඒවා නතර කරලා අපි දැන් එහි කටයුතු ටික හොඳින් කරගෙන යනවා. SLTB එක බංකොලොත් නැතිව අරගෙන යන්න පුළුවන් තැනකට අපි දැන් ගෙනැල්ලා තිබෙනවා. අපි හැම ක්ෂේත්‍රයකම, හැම තැනකම වැඩ කරලා තිබෙන්නේ එහෙමයි.

ඒ ගරු මන්ත්‍රීතුමා මහා කනස්සල්ලකින් කථා කරනවා, හාල් මිල සම්බන්ධයෙන්. ඔබතුමන්ලාට මතක ඇති, අප බලයට එන්න ඉස්සෙල්ලා හැම අවුරුද්දකම මාසයක් දෙකක් හාල් හිඟයක් ඇති වුණු බව.

ඒ කාලයේ හැම අවුරුද්දකම මාසයක් දෙකක් හාල් හිඟයක් ආවා; මහා පරිමාණ හාල් මෝල් හිමියන්ට බැණ බැණ හිටියා. එහෙම රටක් නේ තිබුණේ. හැබැයි, ජාතික ජන බලවේගය බලය අරගෙන ගෙවුණු මේ අවුරුදු දෙක ඇතුළත මේ රටේ හාල් පෝලිමක් දැක්කාද? මහා පරිමාණ මෝල් හිමියන් මිල වැඩි කරනවා වාගේ විවිධ දේවල් කියා තිබුණා. හැබැයි, ඒ එකක්වත් දැන් අපේ රටේ වෙලා නැහැ නේ. අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව, අපේ කෘෂිකර්ම ඇමතිතුමා, කෘෂිකර්ම අමාත්‍යාංශය සුදුසු වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. දැන් අපි වී අලෙවි මණ්ඩලය ශක්තිමත් කරලා, ඒකට ඕනෑ කරන මුදල් ටික පාස් කර දීලා තිබෙනවා. අපි ඒ වැඩ කටයුතු ටික කරලා ගොවීන්ගෙන් වී ටික මිල දී ගෙන ආණ්ඩුවේ වී සංචිතයක් ගොඩනඟා ගත්තාට පසුව මේ රටේ තිබුණු වී ප්‍රශ්නය, හාල් ප්‍රශ්නය නැති වෙලා තිබෙනවා. මෙය දැක්මක් ඇතිව, වැඩ පිළිවෙළක් ඇතිව වැඩ කරන ආණ්ඩුවක්. විපක්ෂය බලාගෙන ඉන්නවා, මේ ආණ්ඩුව තව අවුරුද්දකින් වැටෙයි, අවුරුදු දෙකකින් වැටෙයි කියලා. හැබැයි, මේ ආණ්ඩුව එහෙම වැටෙන්නේ නැහැ. අප යන ගමන නවත්වන්න ඔබතුමන්ලාට බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විපක්ෂය හැම වෙලාවේම අහනවා, අරක කළාද, මේක කළාද කියලා. එහෙම කරන්න තරම් හොඳ රටක් තිබුණාද, ඔබතුමන්ලා බලයේ හිටපු කාලයේ මොකද කළේ කියලා අපි ඇහුවොත් කියනවා, "නැහැ, අපි මොකුත් නොකරපු නිසා නේ ඔබතුමන්ලාට බලය දුන්නේ, ඒ නිසා ඔබතුමන්ලා කරන්න එපායැ" කියලා. ඕක තමයි විපක්ෂය හැම දාම කියන කථාව.

අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුව වැඩ පිළිවෙළක් එක්කයි යන්නේ. පසුගිය කාලයේ - 2022න් පස්සේ - අපේ රටේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ගේ ව්‍යාපාර බිඳ වැටිලායි තිබුණේ. අපේ දිස්ත්‍රික්කවල, අපේ ගම්මානවල එවැනි ජනතාවක් හිටියා. ඒ ජනතාවට මුකුත් කර ගන්න බැරිවයි හිටියේ. ඔවුන්ගේ ව්‍යාපාර බිඳ වැටිලා තිබුණේ. හැබැයි, අපි ඒ ගොල්ලන්ට නැවත වතාවක් සහන දීලා, අඩු පොලියට ණය දීලා, දැන් ඔවුන්ගේ ව්‍යාපාර ගොඩනංවලායි තිබෙන්නේ. ඒ නිසා තමයි, අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් කිව්වේ, ඒකට ඕනෑ කරන රුපියල් මිලියන 30,000ක් අපි වෙන් කර තිබුණා, ඒ රුපියල් මිලියන 30,000 මේ වන විට පාවිච්චි කරලායි තිබෙන්නේ කියලා. හැබැයි, ලියාපදිංචි වුණු, අදාළ නිර්ණායක සම්පූර්ණ කර ගත්තු, බැංකුව අදාළ කටයුතු කර තිබෙන තවත් පිරිසකට තවත් රුපියල් මිලියන 13,000ක විතර අවශ්‍යතාවක් තිබෙනවා. අන්න එය මේ වසරේ අවසන් කර ගන්න පුළුවන් ආකාරයට තමයි ඔය රුපියල් මිලියන 7,500 ලබා දීලා තවදුරටත් මේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් ගොඩනඟා ගැනීම වෙනුවෙන්, ඔවුන් දියුණු කර ගැනීම වෙනුවෙන්, ඔවුන්ට අත දීම වෙනුවෙන් මේ ආණ්ඩුව මේ යෝජනාව අනුමත කරන්න යන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රතිලාභ ගමට යන්නේ නැහැ කියලා කියනවා. මා නියෝජනය කරන කෑගල්ල දිස්ත්‍රික්කයේ මේ වන විට අපි සැලකිය යුතු මට්ටමක වැඩ කරලා තිබෙනවා. අපි කෑගල්ල දිස්ත්‍රික්කයේ බලය ගන්න කොට, අපේ දිස්ත්‍රික්කය තුළ පළාත් පාසල් අතිවිශාල ප්‍රමාණයක බිල්ඩින් හදන්න වැඩ පටන් අරගෙන නතර කරලායි තිබුණේ. හැබැයි, අපි බලය අරගෙන අවුරුදු දෙකයි ගත වුණේ. මේ අවුරුදු දෙක ගත වනකොට කෑගල්ල දිස්ත්‍රික්කයේ සියලු පාසල්වල අතරමැද නතර

[ගරු කංචන වැලිපිටිය මහතා]

වෙලා තිබුණු වැඩ ඔක්කොම අවසන් කරලා තිබෙනවා. අපි පාසල් 14ක බිල්ඩින් හදන එක අවසන් කරලා තිබෙනවා. තවත් පාසල් 3ක වැඩ කරගෙන යනවා. ඒවායින් එක් පාසලක NBRI report එක ලැබී නැති නිසා අපට ඒක අවසන් කර ගන්න බැරි වෙලා තිබෙනවා. හැබැයි, අපි අනෙක් සියලු වැඩ අවසන් කරලා තිබෙනවා. අපි පාසල් දරුවන් වෙනුවෙන්, පාසල්වලට ඕනෑ කරන යටිතල පහසුකම් ගොඩනඟලා තිබෙනවා. අනෙක් පැත්තෙන් අපි ඩෙස්ක් බංකු ලබා දීම, සංගීත උපකරණ ලබා දීම, ක්‍රීඩා උපකරණ ලබා දීම, අවශ්‍ය කරන සන්නිවේදන උපකරණ ලබා දීම වෙනුවෙන් මේ අවුරුදු දෙක ඇතුළත රුපියල් මිලියන 600කට වඩා වැඩි මුදලක් වෙන් කරලා කෑගල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාසල්වල දරුවන්ට ඕනෑ කරන ඒ යටිතල පහසුකම් ටික හදලා තිබෙනවා. අපි ඔවුන්ගේ අවශ්‍යතා ඉෂ්ට කරලා තිබෙනවා. මේගොල්ලන් නැහැ, නැහැ කිව්වාට අපේ ආණ්ඩුව ඇවිල්ලා තමයි ඒ වැඩ අවසන් කළේ. සමහර ව්‍යාපෘති 2016දී වැඩ පටන් අරගෙන නතර වෙලා තිබුණේ. තට්ටුවක් විතරක් හදලා බිල්ඩින් එකේ ඔක්කොම ටික දිර දිරායි තිබුණේ. හැබැයි, අපි ඇවිල්ලා තමයි ඒ කටයුතු අවසන් කරලා ළමයින්ට ඒ බිල්ඩින් ටික භාර දුන්නේ. අපි අධ්‍යාපන ක්ෂේත්‍රයේ එවැනි ගොඩනැඟීම් කරලා තිබෙනවා.

ඒ වාගේම, අපේ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශයෙන් ග්‍රාමීය දිළිඳුකම තුරන් කිරීම වෙනුවෙන් "ප්‍රජා ශක්ති" වැඩ පිළිවෙළ ආරම්භ කර තිබෙනවා. කෑගල්ල දිස්ත්‍රික්කය වෙනුවෙන් අපට මේ වසර තුළ රුපියල් මිලියන 1,034ක මුදලක් ලැබුණා. ගම්වල ග්‍රාම නිලධාරි වසම්වල වැඩ කිරීම වෙනුවෙන්, ව්‍යාපෘති ආරම්භ කිරීම වෙනුවෙන් අපට ඒ මුදල් පාස් වෙලා තිබෙනවා. මේ වන විට අපේ කෑගල්ල දිස්ත්‍රික්කයේ සෑම ග්‍රාම නිලධාරි වසමකම කුමන හෝ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වෙනවා, ගමේ ජනතාවගේ දිළිඳුකම තුරන් කිරීම වෙනුවෙන්. ඒක විශේෂ දෙයක් හැටියට අපි සලකනවා. කෑගල්ල දිස්ත්‍රික්කයේ සැලකිය යුතු ග්‍රාම නිලධාරි වසම් ප්‍රමාණයක කිරි ගව පාලන වැඩසටහන් අපි ආරම්භ කර තිබෙනවා. ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරි වසම් 51ක් තිබෙනවා. අපි ඒ ග්‍රාම නිලධාරි වසම් 51න් 5ක කිරි ගව ව්‍යාපෘති ආරම්භ කර තිබෙනවා. අපි එයින් බලාපොරොත්තු වන දෙයක් තිබෙනවා. දැනට අපේ රටේ කිරි අවශ්‍යතාවෙන් සියයට 30යි අප නිපදවා ගන්නේ. ඉතිරි ටික ඔක්කොම පිට රටින් ගෙනෙන්නේ.

ඒ නිසා අපේ කෘෂිකර්ම අමාත්‍යාංශය "Dairy Hub" කියන වැඩසටහන ආරම්භ කර තිබෙනවා. මේකේ ඉලක්කයක් තිබෙනවා, 2030 වර්ෂය වනකොට අපි කිරි කර්මාන්තය කොතැනටද අරගෙන යන්නේ කියන එක ගැන. මේ යටතේ අපේ රටේ අවශ්‍ය කිරි අවශ්‍යතාවෙන් අඩුම තරමින් සියයට 60ක් විතර නිෂ්පාදනය කර ගැනීමේ වුවමනාව වෙනුවෙන් අපි කටයුතු කරමින් ඉන්නවා. ඒක කරද්දි ග්‍රාමීය මට්ටමෙන් ඒකට දායකත්වය ලබා දීම සඳහා තමයි අපි "ප්‍රජා ශක්ති" වැඩ පිළිවෙළ තුළ ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට විතරක් රුපියල් දෙකෝටි හතළිස්එක්ලක්ෂයක් වියදම් කරලා කිරි ගවයින් ලබා දීලා තිබෙන්නේ. ඒ කිරි ගවයින් නඩත්තු කිරීම වෙනුවෙනුත්, ඒ සතුන්ට ඕනෑ කරන ගව ගාල් ටික හදා ගැනීමටත් අපි මුදල් ලබා දීලා තිබෙනවා. ඒ කටයුතු අපි ආරම්භ කරලා මේ වැඩ පිළිවෙළ ඉස්සරහට ගෙන යමින් ඉන්නවා. ඒකයි මම කිව්වේ, ජාතික ජන බලවේගයේ අපේ ආණ්ඩුව කටයුතු කරන්නේ විපක්ෂය කෑ ගහන විධියට, විපක්ෂයට ඕනෑ විධියට නොවෙයි කියලා. අපි වැඩ කරන්නේ දැක්මක් ඇතිව. 2030 වර්ෂය වනකොට මේ රට කොතැනටද අරගෙන යන්නේ, 2040 වර්ෂය වනකොට මේ රට කොතැනටද අරගෙන යන්නේ කියන ඉලක්කයක් එක්ක තමයි අපේ ජනාධිපතිතුමා මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කර තිබෙන්නේ.

අපේ පරිසර ඇමතිතුමා නියෝජනය කරන්නේ කෑගල්ල දිස්ත්‍රික්කය. මේ දවස්වල පරිසර ඇමතිතුමා ඉලක්ක කරගෙන දැවැන්ත ප්‍රහාරයක් එල්ල කරන්න විපක්ෂය උත්සාහ කරමින් ඉන්නවා. ඇත්තටම මේක අපි බලන්න ඕනෑකම තිබෙන්නේ, හුදෙකලා සිද්ධියකට ලඝු කරගෙන නොවෙයි. අලියෙක් ගහලා මනුස්සයෙකුගේ ජීවිතයක් නැති වුණොත්, ගොඩක් අය ඒ නැති වුණු ජීවිතය ගැන කථා කරනවා. එහෙම නැත්නම් මනුස්සයෙක් විසින් අලියෙක් ඝාතනය කළොත්, ඒ අලියා ගැන කථා කරනවා. එහෙම නොවෙයි, අපේ අමාත්‍යාංශයේ නිලධාරීන් සහ අමාත්‍යතුමා මේ කටයුතු කරමින් ඉන්නේ මේ සමස්තය ගැන හිතලායි. ඒ නිසා තමයි එතුමා අපේ රටේ අවුරුදු 26ක් තිස්සේ නොතිබුණු ජාතික පාරිසරික (සංශෝධන) පනත දැනටමත් සම්මත කරගෙන තිබෙන්නේ.

ඒ වාගේම මේ වන විට අපේ රටේ රක්ෂිත 105ක් විතර නම් කර තිබෙනවා. කෑගල්ල දිස්ත්‍රික්කයෙන් සොයා ගත් "බන්දුල පෙතියා" නැමති රටෙන් තුරන් වෙමින් යන මත්ස්‍ය විශේෂය බෝවන පරිශ්‍රය ආරක්ෂිත අභය භූමියක් ලෙස ප්‍රකාශයට පත් කිරීමටත් මේ අමාත්‍යවරයා ප්‍රමුඛ අමාත්‍යාංශය කටයුතු කර තිබුණා.

ඒ වාගේම කෑගල්ල දිස්ත්‍රික්කයේ යටියන්තොට, දැරණියගල, බුලත්කොහුපිටිය ප්‍රදේශවල ජනතාවට කඳුකර කොටින්ගෙන් දැඩි තර්ජනයක් තිබෙනවා. අපි මේ ගැන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවලදී කථා කළාම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අනුබද්ධ ආයතනවලින් එන නිලධාරින් කියන්නේ, ඔවුන්ට එන්න වාහනයක් නැහැ, වාහනය ගම්පහින් එනකල් ඉන්න ඕනෑය කියලායි. එහෙම රටක් තමයි තිබුණේ. හැබැයි, දැන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර කටයුතු ශක්තිමත් කිරීම සඳහා මේ වන විටත් කැබ රථ 100ක්, බයිසිකල් 180ක් සහ ට්‍රැක්ටර් 9ක් ගෙන්වා තිබෙනවා. එහෙම තමයි දැන් ඒ වැඩ කටයුතු කරගෙන යන්නේ. අපේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සිටින නිලධාරින්ට අවශ්‍ය යටිතල පහසුකම් හදලා දෙනවා වාගේම යම් යම් ප්‍රදේශ රක්ෂිත බවට පත් කරලා, මේ සතුන්ට නිදහසේ ජීවත් වන්න අවශ්‍ය වාසස්ථාන ටිකත් අපි හදලා දෙන්න ඕනෑ. එහෙම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගෙන යන අතරතුර තමයි මේ පොඩි පොඩි සිදුවීම් වෙන්නේ. ඒක නිසා අපි කියන්නේ, මේක තනි සිද්ධියකට ලඝු කරන්න එපා කියලායි. මෙය පොදුවේ ක්‍රියාවලියක් හැටියට ගන්න. ඒ ක්‍රියාවලිය ඇතුළේ පරිසර අමාත්‍යාංශය දැවැන්ත වැඩ කොටසක් මේ වන විට කරමින් යනවා. ඒකේ ප්‍රතිඵල ලබා ගන්න තව ටික කාලයක් යනවා. සමස්තයක් හැටියට අපි කියන්නේ එයයි.

අපි රටක් ඉදිරියට අරගෙන යනකොට විපක්ෂයේ බලාපොරොත්තුව, ප්‍රාර්ථනාව මේ රට බිඳ වැටෙන එක. හැබැයි, ජාතික ජන බලවේගයේ අපේ ප්‍රාර්ථනාව මේ රට ඉදිරියට අරගෙන ගිහින් අපේ රටේ ජනතාවට පොහොසත් රටක් හදන එක. ඒ පොහොසත් රට ඇතුළේ ජනතාවට ලස්සනට, සතුටින් ජීවත් විය හැකි පරිසරයක් නිර්මාණය කරන එක තමයි අපේ අරමුණ. ඒ වෙනුවෙන් අපි කටයුතු කරමින් ඉන්නවා කියන කාරණය මතක් කරමින් මා නිහඬ වනවා.

ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Leader of the Opposition. You have been allotted eight minutes by the Chief Opposition Whip and the Floor is yours.

[පූ.භා. 11.52]

ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩු පක්ෂය අපට චෝදනා කරනවා, අපි නිතරම කෑ ගහනවා කියලා. අපි කවුරු වෙනුවෙන්ද කෑ ගහන්නේ? අපි කෑ ගහන්නේ මේ රටේ ජනතාවගේ ඉල්ලීම් වෙනුවෙන්. ඒ නිසා ජනතාවට වුණු පොරොන්දු ටික ඔබ ඉෂ්ට කරන්න.

ඊයේ මධ්‍යම රාත්‍රියේ සිට රටේ ජනතාවට අලුත් සුබ ආරංචියක් ලැබුණා. ඒ තමයි, තිරිඟු පිටි කිලෝග්‍රෑමයක මිල රුපියල් 13කින් වැඩි වීම. ග්‍රෑම් 450 පාන් ගෙඩිය ඇතුළු බනිස්, රෝස් පාන්, සැන්ඩ්විච්, කේක්, පේස්ට්‍රි කියන සියලු බේකරි නිෂ්පාදනවලට මේක බලපානවා. එතකොට මේ මිල වැඩි වීම තුළින්ද මේ රජය රටේ ජනතාවට සහන ලබා දෙන්නේ?

තිරිඟු පිටිවල මේ මිල වැඩිවීම එළවලු රොටිවල, බිත්තර රොටිවල, පරාටාවල, රෝල්ස්වල, පැටිස්වල, කොත්තු රොටිවල මිලටත් බලපානවා. මේවා සාමාන්‍ය ජනතාවගේ ආහාර. විශේෂයෙන්ම මේක වතු ප්‍රජාවට එල්ල කරපු මරු පහරක්. ආහාර වියදම්වලට වැඩි මුදලක් වැය කරනකොට ආහාර නොවන වියදම්වලට මුදල් යෙදවීම අඩු වනවා. මේක පාසල් දරුවන්ටත් බලපානවා, රැකියාවලට යන පුද්ගලයින්ටත් බලපානවා. මතක තබාගන්න, අපි කෑ ගහන්නේ රටේ ජනතාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කරන්න කියන එක සම්බන්ධව බව.

ඊයේ පොල්දුව හන්දියේදී මොකක්ද වුණේ? විශ්‍රාම ගිය 154,000ක් නියෝජනය කරමින් ඊයේ විරෝධතාවක් පැවැත්වුවා. 2020-2024 කාලයේදී විශ්‍රාම ගිය ප්‍රජාවගේ හිඟ වැටුප, හිඟ දීමනාව අනෙක් ඔක්කෝටම දීලා, ඒගොල්ලන්ට විතරක් ඒක කප්පාදු කරලා තිබෙනවා. විශේෂයෙන්ම අපට දැනගන්න ලැබෙනවා, මුදල් අමාත්‍යාංශය හා සම්බන්ධ නිලධාරියෙක් විශ්‍රාම යෑම තුළ ඔහුටත් මේක ගළපා තිබෙන බව. හැබැයි ඔහුට මේක ගැළපුවාට 2020-2024 කාලයේදී විශ්‍රාම ගිය 154,000කගේ හිඟ වැටුප් සහ දීමනා කප්පාදු කරලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාටත් මතක ඇති, අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා ජනාධිපතිවරණයට පෙර විශ්‍රාමික සමුළුවක් පවත්වපු බව. ඒ විශ්‍රාමික සමුළුවේදී ඒ අයගේ ඉල්ලීම් ඉෂ්ට කරනවාය කියලා එතුමා පොරොන්දු වුණා. නමුත් අද ඒවා කඩ කරලා.

අද උපාධිධාරීන් 80,000ක් ඉන්නවා, රැකියා නැතිව. ගුරු සංවර්ධන නිලධාරීන් විධියට තවත් 16,000ක් ඉන්නවා. ඒ අයට පොරොන්දු වුණු පරිදි ගුරු සේවයට ඇතුළත් වීමේ කටයුත්ත ක්‍රියාත්මක නොකර මේ රටේ ජනතාවට පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් ලබා දෙනවා කියලා උපාධිධාරීන්ට ලබා දෙනවාය කියපු රැකියා ටික කෝ? ඇයි, ඒ රැකියා ටික ලබා නොදෙන්නේ?

අද ලොකුවට කියනවා, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන් වෙනුවෙන් සහන ලබා දෙන්න ලොකු මුදලක් වෙන් කළා කියලා. හැබැයි අවසානයේ මොකක්ද වෙන්නේ? මේ මුදල් ලබා දීම ක්‍රියාත්මක වන්නේත් බැංකු පද්ධතිය හරහා. බැංකු පද්ධතිය හරහා එය ක්‍රියාත්මක වනකොට ඒ බැංකු අනිවාර්යයෙන්ම මේ මුදල් ටික ලබා දෙන්නේ සුරක්ෂිත customersලාට. ඒ කියන්නේ, ඒක ලබා දෙන්නේ අමාරුවේ වැටිච්ච customersලාට නොවෙයි; අසාදුලේඛනගත - blacklist - වුණු අයට නොවෙයි. පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරය, කොරෝනා වසංගතය, බංකොලොත්භාවය, "දිට්වා" සුළි කුණාටුව, මැද පෙරදිග යුද්මය බේදවාචකය ආදියෙන් විනාශ මුඛයට ගිය ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ කර්මාන්තකරුවන්ට නොවෙයි බැංකු පද්ධතිය හරහා මේ මුදල් ලබා දෙන්නේ. බැංකුව හිතන ආකාරයට හොඳටම ණය ගෙවන අයට තමයි මේ මුදල් ටික යන්නේ. ඒ පිළිවෙත තුළ අමාරුවේ වැටුණු අයට සහන නොලැබෙනකොට මේ තුළින් බලාපොරොත්තු වන අරමුණ ඉෂ්ට වනවාද?

අද දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය කඩා වැටිලා. ආයුර්වේද, සිද්ධ, යුනානි, හෝමියෝපති, පාරම්පරික වෛද්‍යවරුන් සහනාධාර ඉල්ලන්නේ නැහැ. ඒ අය කරගෙන යන වෘත්තිය හරියට කරගෙන යන්න අවශ්‍ය රාජ්‍ය මැදිහත්වීමයි ඉල්ලන්නේ. මේ රජයේ නොහැකියාව නිසා දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ ආයුර්වේද ක්ෂේත්‍රය ඇතුළු හැම අංශයක්ම කඩා වැටිලා. ඒ විතරක් නොවෙයි.

දැන් විදුලිය ලබා දීමේදීත් අඛණ්ඩ විදුලිය ලබා දීම වෙනුවට විදුලිය කප්පාදුවක් ක්‍රියාත්මක වනවා. ඒකට ප්‍රධාන හේතුව මොකක්ද? ගල් අඟුරු වංචාව. ගල් අඟුරු වංචාව හරහා අපේ රටට රුපියල් බිලියන 18ක පාඩුවක් සිදු වුණා. නොරොච්චෝලේ විදුලි බලාගාරයේ විදුලිය මෙගාවොට් 300 බැගින් විදුලිය මෙගාවොට් 900ක් නිර්මාණය කරන ඒකක 3 බිඳ වැටිලා. ඒ, මොකක් හින්දාද? බාල ගල් අඟුරු ගෙන්වීම නිසා. ඒ රුපියල් බිලියන 18ක පාඩුව පියවන්න සිද්ධ වන්නේත් මේ රටේ පාරිභෝගික ප්‍රජාවට තමයි.

මේ රටේ ගෘහ හැටඑක්ලක්ෂයක් තිබෙනවා. අසූලක්ෂයකට ආසන්න පාරිභෝගිකයින් පිරිසක් ඉන්නවා. ඒ විදුලි පාරිභෝගිකයින්ගේ කර පිට, හිස මත තමයි මේ පීඩනය පටවා තිබෙන්නේ. ඉතින් හැම අතකින්ම මේ රජය මොකක්ද කරන්නේ? හැම අතකින්ම, දිනපතාම දුන් පොරොන්දු ටික කඩ කරනවා.

දැන් කෝ, වරායේ ගොඩබාන මිලටම ලබා දෙනවාය කියපු තෙල් ටික? බදු ටික ඔක්කෝම අයින් කරනවා කිව්වා. නිලධාරියාගේ ඉඳලා ඇමති දක්වා යන කොමිස් මුදල අයින් කරනවා කිව්වා. මහා භාණ්ඩාගාරයට දෙන මුදල් ටික ඉවත් කරනවා කිව්වා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා හොඳ පුද්ගලයෙක්. නමුත් ඔබතුමාත් ඔය පුටුවට ගියේ ජන වරමෙන්. ඒ ජන වරම තුළ වරායේ ගොඩබාන මිලට ලබා දෙනවා කියපු තෙල් ටික කෝ? ඇයි, ඒවා ලබා නොදෙන්නේ? කෝ, කරනවා කියපු සියයට 33කින් විදුලි බිල අඩු කිරීම? රුපියල් 9,000 බිල රුපියල් 6,000 කරනවා කිව්වා. රුපියල් 3,000 බිල රුපියල් 2,000 කරනවා කිව්වා. ඕකත් මහ ලොකු දෙයක්ද ඇහුවා. කරපු බරපතළම දේ මොකක්ද? අලුත් IMF debt sustainability agreement එකකට යනවා කියලා ජනතාව රැවැට්ටුවා. ණය තිරසරකරණ එකඟතාවකට යනවා කිව්වා. මතක තබාගන්න, ජනතා විමුක්ති පෙරමුණටත්, සමගි ජන බලවේගයටත් මේ රටේ ජනතාව විශාල ඡන්ද ප්‍රමාණයක් ලබා දුන්නේ, තිබුණු IMF ගිවිසුම වෙනස් කරන්න කියන එක. ඒ මොකද? පසුගිය රජය නිර්මාණය කළ IMF ගිවිසුම හරහා මේ රටේ ලක්ෂ සංඛ්‍යාත ජනතාවගේ කර පිට, හිස මත පීඩනය, අසහනය, කම්පනය, දුක, කඳුළු, වේදනාව පැටෙව්වා. ඒක තමයි ඇත්ත කථාව.

Primary bond dealersලා, ට්‍රිලියනපතියන්, බිලියනපතියන් බේරලා, බැංකු පද්ධතිය බේරලා, දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණ වැඩ පිළිවෙළ තුළ වැඩ කරන ජනතාවගේ EPF එක, ETF එක පික්පොකට් ගැහුවා, පහුගිය රජය. ඒ IMF ගිවිසුම වෙනස් කරනවා කියලා තමයි අපිත් ජනාධිපතිවරණයට ඉදිරිපත් වුණේ; ඔබත් ජනාධිපතිවරණයට ඉදිරිපත් වුණේ. හැබැයි, ඔබ මොකක්ද කළේ?

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

බලයට ආපු හැටියේම කියපු හැම දෙයක්ම අමතක කරලා, ඒ පොරොන්දු පත්‍රිකා ටික කැලි කැලිවලට ඉරලා කුණු බක්කියට විසි කරලා දැම්මා. ජනතාවට හෙණ ගැහුවත් කමක් නැහැ, මේ IMF ගිවිසුමම ක්‍රියාත්මක කරනවා කියන පදනම තුළ ඉඳගෙන කටයුතු කරන, රටේ ජනතාව රවටපු, අන්දවපු, ජනතාවගේ සම්පත් කොල්ලකන ආණ්ඩුවක් අද මේ නිර්මාණය වෙලා තිබෙන්නේ. ඒ නිසා ඔබට අපි කියන්න කැමැතියි, ඉතාම පැහැදිලිව යුතුකම් ඉෂ්ට කරන්න, යුක්තිය සාධාරණත්වය ඉෂ්ට කරන්න කියලා. ඉටු කරනවාය කියපු පොරොන්දු මාලාව ඉටු කරන්න ඔබ කටයුතු කරන්න.

විශේෂයෙන්ම සමගි ජන බලවේගයත්, සමගි ජන සන්ධානයත් මේ රටේ ජනතාවගේ දේශපාලන අයිතිය, ආර්ථික අයිතිය, සමාජයීය අයිතිය, සංස්කෘතික අයිතිය, ආගමික අයිතිය වාගේම සියලු සුබසාධන සේවා, අයිතිවාසිකම් සුරක්ෂිත කරන්නට අනිවාර්යයෙන්ම කැප වෙලා සිටිනවා. විසිහතර පැයම බොරු කියන මේ ආණ්ඩුවට කියනවා, බොරුව නතර කරලා ජනතාවට ඉටු කරනවා කියපු ඒ පොරොන්දු ටික ඉටු කරන්නට කටයුතු කරන්න කියලා. ඒ උදෙසා රජයට එල්ල කරන්න පුළුවන් ලොකුම බලපෑම, ලක්ෂ 220ක් වන ජනතාව වෙනුවෙන් එල්ල කරන්නට අපි කැප වනවාය කියලා ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තූතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Sunil Rathnasiri. You have ten minutes.

[අ.භා. 12.03]

ගරු සුනිල් රත්නසිරි මහතා
(மாண்புமிகு சுனில் ரத்னசிறி)
(The Hon. Sunil Rathnasiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ යෝජනාව අනුමත කිරීම සඳහාත්, 2026 අංක 6 දරන පරිපූරක ඇස්තමේන්තුව අනුමත කිරීම සඳහාත් අද දවසේ පැවැත්වෙන මේ විවාදයේදී ගරු විපක්ෂ නායකතුමා ඉදිරිපත් කරපු බොහොමයක් කරුණු අද දවසේ මාතෘකාවලට අදාළ නොවන කරුණු කාරණා වුණත්, එතුමාටත් යම් පිළිතුරක් ලබා දිය යුතුයි කියලා මා හිතනවා.

විශේෂයෙන්ම එතුමා ප්‍රකාශ කළා, විපක්ෂය කා වෙනුවෙන්ද කෑ ගහන්නේ කියලා. විපක්ෂය කෑ ගහන්නේ කා වෙනුවෙන්ද කියන එක අපට පසුගිය කාලය පුරාම මේ පාර්ලිමේන්තුව තුළ දක්නට ලැබුණා. ජනතාවට යමක් ලබා දෙන්නට කෑ ගහනවා වෙනුවට, ජනතාවට යමක් ලබා දෙනකොට ඒකට එරෙහිව කෑ ගහන විපක්ෂයක් තමයි අද මේ පාර්ලිමේන්තුවේ දක්නට ලැබෙන්නේ. විශේෂයෙන්ම වතුකරයේ ජනතාවගේ වැටුප වැඩි කළ වෙලාවේ එතුමාගේ පක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් ඒකට විරුද්ධව කටයුතු කළා. නීතියේ විධානයේ ආධිපත්‍යය තහවුරු කරන්න හදනකොට ඒකට එරෙහිව කටයුතු කරන්නේත් එතුමාගේ පක්ෂයේ මන්ත්‍රීවරුන්. අධ්‍යාපනයේ සාධනීය පරිවර්තනයක් කරන්න හදනකොට ඒ සාධනීය පරිවර්තනයට අකුල් හෙළුවේ, ඒ වාගේම අධ්‍යාපනය අසභ්‍යකරණයට ලක් කරනවා කිව්වේත් ඔය විපක්ෂ නායකතුමාම තමයි. සහන පොලී අනුපාතයකට ණය ලබා දීලා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ ගොවි ජනතාව නහාසිටුවන්න හදනකොට ඒකට උදව් කරනවා වෙනුවට ඒක කඩාකප්පල් කරන්නේ කොහොමද කියන සිතුවිල්ලෙන් තමයි අද දවසේත් එතුමා කටයුතු කරන්නේ. ඒ සම්බන්ධයෙන් අපට ලොකු කනගාටුවක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ණය කියපු සැනින් අපේ රටේ ජනතාව තුළ විශාල සැකයක්, කුතුහලයක්, භීතියක් මතු වනවා. ඇයි? මෙතෙක් මේ රට පාලනය කළ බොහෝ පාලකයින් ණය ලබා ගැනීම හරහා අපේ රටේ ජනතාවට සංවර්ධනය වෙනුවට දැවැන්ත ව්‍යසනයක් අත්පත් කර දීලා තිබෙනවා. ඔවුන් ණය ලබා ගෙන ප්‍රමුඛතා නොවන ව්‍යාපෘති සඳහා ඒ ණය යෙදවීම සිද්ධ කළා. ඒ ගත් ණයවලින් වත්කම් ජනනය කරන්න ඔවුන් සමත් වුණේ නැහැ. ඒ ණය ලබා ගත් ව්‍යාපෘති නිසි කාලය තුළ අවසාන කරන්න සමත් වුණේත් නැහැ. ඒ ණය කළමනාකරණය කරලා ඒවා ගෙවීමටත් ඔවුන් සමත් වුණේ නැහැ. ඒ සඳහා අපට ලංකා ඉතිහාසයේ ඕනෑ තරම් උදාහරණ කියන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හම්බන්තොට වරාය ඉදිකරන්න ඩොලර් බිලියන 1.3ක ණයක් ගන්නවා. නමුත් හෙක්ටෙයාර 2,000කට ආසන්න වරායට අයිති බිමක් විතරක් දැන් පවතිනවා. ඩොලර් බිලියන 1.3ක් වියදම් කරලා වරාය හදලා පස්සේ විකුණනවා, ඩොලර් බිලියන 1.12කට. මෙන්න, මේගොල්ලන් ණය අරගෙන කරපු වැඩේ. අපට අද මොකක්ද වෙලා තිබෙන්නේ? හෙක්ටෙයාර 2,000ක්, තව ආසන්න හෙක්ටෙයාර 6,000ක්, වරාය කියන ඒ සියල්ල නැහැ. හැබැයි ණයක් විතරක් ඉතිරි කරලා තිබෙනවා. එහෙම කටයුතු කළ අය තමයි අද අපට මේ කියන්නේ ආර්ථිකය කඩා වැටිලා කියලා.

මත්තල ගුවන් තොටුපොළ හදන්නට ඩොලර් මිලියන 244ක ණයක් ගත්තා. 2017 ඉඳලා 2022 වනකොට එමඟින් රුපියල් බිලියන 43ක් පාඩු ලබා තිබෙනවා. මෙන්න, මේගොල්ලන් ණය අරගෙන කරපු සෙල්ලම්.

අපි දන්නවා, ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් කියන්නේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 50කට වැඩි දායකත්වයක් දෙන, සේවා නියුක්තියෙන් සියයට 50කට වැඩි දායකත්වයක් දෙන, ව්‍යවසායකයින් අතරින් තුනෙන් දෙකකට වැඩි ප්‍රමාණයක් ඉන්න ක්ෂේත්‍රයක් බව. ඒ නිසා ඔවුන් බලාගැනීම අපේ රජයේ කාර්යභාරය වනවා, ඔවුන්ට පිහිටවීම අපේ රජයේ කාර්යභාරය වනවා. අපි 2026 අය වැයෙන් "ඔඩපණ ණය" සඳහා රුපියල් මිලියන 15,000ක් වෙන් කරලා දුන්නා, උපරිම ණය සීමාව රුපියල් මිලියන 50 දක්වා ලබා ගන්නට, විශේෂයෙන්ම වී මෝල් හිමියන්ට. ඒ වාගේම "සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය" යටතේ රුපියල් මිලියන 1,700ක් වෙන් කරලා දුන්නා, රුපියල් මිලියන 3 දක්වා සහන පොලියට ණය ලබා ගන්න. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සියයට 5 පොලියට ණය ලබා ගන්න රුපියල් මිලියන 25,000ක් වෙන් කර දුන්නා. ඔබතුමන්ලාත් දන්නවා, "දිවිවා" සුළි කුණාටුව ඇවිල්ලා මේ ව්‍යවසායකයින් විශාල විධියට අසරණ වුණු බව. ඒ සෑම ව්‍යවසායකයෙකුටම අපි රුපියල් ලක්ෂ 2 බැගින් ලබා දුන්නා, නැවත නොගෙවන මුදලක් විධියට. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට අමතරව ඔවුන්ට රුපියල් මිලියන 10,000ක් වෙන් කරලා දුන්නා, සියයට 3 පොලියට වසර තුනක ගෙවීමේ කාලයක් ඇතිව ණය ලබා ගන්නට.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2025 අවුරුද්දේ අපි ඇපකර රහිත ණය ලෙස රුපියල් මිලියන 4,027ක් ලබා දුන්නා. අපි ඒක තවදුරටත් ඉස්සරහට අරගෙන ඇවිල්ලා 2026 වර්ෂයේ ණය සුරැකුම් ආයතනය යටතේ ඇපකර රහිත ණය ලබා දෙන්නට රුපියල් මිලියන 7,000ක් වෙන් කර දුන්නා. පොදුවේ ගත්තොත් අපි මේ වන විට සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව හරහා රුපියල් බිලියන 95ක් වෙන් කර දීලා තිබෙනවා. මේ රුපියල් බිලියන

95න් මේ වනකොටත් සියයට 85කට ආසන්න ප්‍රමාණයක් ණය ලෙස මුදා හැරලා තිබෙනවා. ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබෙන ඩොලර් මිලියන 200ක මූල්‍ය ප්‍රතිපාදන යටතේ, සුළු, ක්ෂුද්‍ර සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ගොඩ නඟන්න ඩොලර් මිලියන 100ක මුදලක් සහ කෘෂිකාර්මික අගය දාම මූල්‍යකරණය සහ වාණිජකරණ ක්ෂේත්‍ර සංවර්ධනයට තවත් ඩොලර් මිලියන 70ක මුදලක් ලබා දීමට කටයුතු කරලා තිබෙනවා. විශේෂයෙන්ම ඒකෙන් රුපියල් මිලියන 7,750ක් වෙන් කර දීලා තිබෙනවා, ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා උපරිම රුපියල් මිලියන 75 දක්වා ණය ලබා දෙන්න. ඒ වාගේම කෘෂිකර්ම අගය දාම සංවර්ධන කටයුතු සඳහා රුපියල් මිලියන 6,200ක් වෙන් කර දීලා තිබෙනවා.

කලින් කථා කරපු විපක්ෂයේ මන්ත්‍රීතුමා කිව්වා, අපේ ආණ්ඩුව ණය බර වැඩි කර තිබෙනවා කියලා. එම නිසා එතුමාට මේ කාරණය මම මතක් කර දෙන්නට ඕනෑ. 2005 අවුරුද්දේ ඉඳලා 2015 අවුරුද්ද දක්වා පැවති මහින්ද රාජපක්ෂ මහත්තයාගේ ආණ්ඩුව රුපියල් ට්‍රිලියන 2.2 ඉඳලා රුපියල් ට්‍රිලියන 7.4 දක්වා ණය බර වැඩි කළා. ඊට පස්සේ මෛත්‍රීපාල - රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ ආණ්ඩුව 2015 අවුරුද්දේ ඉඳලා 2019 අවුරුද්ද දක්වා රුපියල් ට්‍රිලියන 7.4 ඉඳලා රුපියල් ට්‍රිලියන 13 දක්වා ණය බර වැඩි කළා. ඊට පස්සේ ගෝඨාභය රාජපක්ෂ මහත්තයාගේ ආණ්ඩුව 2019 අවුරුද්දේ ඉඳලා 2022 අවුරුද්ද දක්වා රුපියල් ට්‍රිලියන 13 ඉඳලා රුපියල් ට්‍රිලියන 17.5 දක්වා ණය බර වැඩි කළා. 2022 අවුරුද්දේ ඉඳලා 2024 සැප්තැම්බර් මාසයේ 21වැනි දා වනකොට රුපියල් ට්‍රිලියන 28.6 දක්වා ණය බර වැඩි වෙලා තිබෙනවා.

අද මොකක්ද වෙලා තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? 2025.12.31වැනි දා වනකොට අපට තිබුණා, ඩොලර් බිලියන 100.3ක ණය ප්‍රමාණයක්. මේ ඩොලර් බිලියන 100.3 දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත්තොත්, සමස්ත ණය ප්‍රමාණයෙන් 95ක්. හැබැයි, අපි 2023 අවුරුද්ද - ඒගොල්ලන් පාලනය කරපු අවුරුද්ද - ගත්තොත්, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සමස්ත ණය ප්‍රමාණය 122ක් විධියටයි තිබුණේ. ඒක තමයි අපි සියයට 95 දක්වා අඩු කර ගත්තේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හරියටම ගත්තොත්, අපට මේ අගය ළඟා කර ගන්නට තිබුණේ 2032 අවුරුද්දේ. 2032 අවුරුද්දේ ළඟා කර ගන්න තිබුණු ඉලක්කය තමයි අපි 2025 අවුරුද්දේ ළඟා කර ගත්තේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතැනින් නතර වෙන්නේ නැතිව 2026 මාර්තු මාසය වනකොට අර ඩොලර් බිලියන 100.3ක් ලෙස තිබුණු ණය ප්‍රමාණය අපි ඩොලර් බිලියන 98.9 දක්වා අඩු කර ගත්තා. අද මොකක්ද තත්ත්වය? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2026 ජූනි මාසය වනකොට එය ඩොලර් බිලියන 98.9 ඉඳලා අපි අඩු කරගෙන තිබෙනවා, ඩොලර් බිලියන 95.04 දක්වා. ඒ කියන්නේ, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සමස්ත ණය ප්‍රමාණය 88.8 දක්වා අඩු කර ගන්න අපි සමත් වෙලා තිබෙනවා.

ඒ වාගේම අපි දන්නවා, විශේෂයෙන්ම Fitch Ratings, Moody's සහ S&P කියන ජාත්‍යන්තර ආයතන මඟින් ස්වෛරී ණය ශ්‍රේණිගත කිරීම්වලින් අපේ රට ඉහළට ගෙනාවා, ණය ලබා ගැනීමේ හැකියාව වැඩි කළා, ආයෝජන අවස්ථා වැඩි කිරීම සිද්ධ කළා කියන එක.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ආණ්ඩු බලය ලබා ගන්නකොට මේගොල්ලන් කිව්වා, විදේශීය ණය ගෙවා ගන්නට බැරි වෙයි කියලා. හැබැයි, 2024දී විදේශීය ණය සේවාකරණයට ඩොලර් මිලියන 1,674ක් ගෙවා අවසාන කර තිබෙනවා. 2025දී විදේශීය ණය සේවාකරණයට ඩොලර් මිලියන 2,435ක් ගෙවා අවසාන කර තිබෙනවා. දැන් බොරු බිල්ලෙක් මවනවා, 2028දී මේ ණය ගෙවන්න බැරි වෙයි කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2028 අවුරුද්ද වනකොට අපට ගෙවන්න තිබෙන්නේ ඩොලර් මිලියන 3,259ක්. ඒ කියන්නේ, 2025දී ගෙව්වාට වඩා ඩොලර් මිලියන 824යි වැඩි වෙන්නේ.

අවසාන වශයෙන්, අපේ රටේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් මෙන්ම ගොවි ජනතාව රැක බලා ගැනීමේ කටයුත්ත අපේ ආණ්ඩුව ස්ථිර වශයෙන්ම සිද්ධ කරනවාය කියන පණිවුඩය ලබා දෙමින් මම නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. බොහොම ස්තුතියි.

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Sujeewa Senasinghe, what is your point of Order?

ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சட்டத்தரணி அர்ஜுன சுஜீவ சேனசிங்ஹ)
(The Hon. Arjuna Sujeewa Senasinghe, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සුනිල් රත්නසිරි මන්ත්‍රීතුමා මම ප්‍රකාශ කරපු කාරණයක් ගැන කියමින් "කලින් කථා කරපු මන්ත්‍රීතුමා" කියලා සඳහන් කළා. එතුමා රුපියල් ට්‍රිලියන 28කින් නැවතුණා. රුපියල් ට්‍රිලියන 32ක්, ඒ කියන්නේ මේ අවුරුදු එකහමාර තුළ ණය බරට රුපියල් ට්‍රිලියන 4ක් එකතු වෙලා තිබෙන බව එතුමා සඳහන් කළේ නැහැ. එතුමා ඩොලර්වලට කථාව මාරු කළා. අපි කියන්නේ ණය ගෙවන්න බැහැ කියන එක නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ණය කොහොම හරි ගෙවෙයි. නමුත්, මිනිස්සුන්ට ජීවත් වෙන්න බැරි වෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 12.14]

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ යෝජනාව අනුමත කිරීම සම්බන්ධව තමයි අද මේ විවාදය පවත්වන්නේ. ආණ්ඩුවේ අයට කියන්න පුළුවන්, අපි මේවා කළා, අරවා කළා, මෙහෙම කළා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට අවුරුද්දකට කලින් මම මේ පාර්ලිමේන්තුවේදී කිව්වා, ගෑස් ප්‍රශ්නයක් එනවා කියලා. දැනුත් ගෑස් ප්‍රශ්නය ඇවිල්ලා තිබෙනවා. මොකක්ද වුණේ? නැව් පහක්වත් නැති සමාගමකට ටෙන්ඩරය දෙන්න එපා කියලා tender document එකේම සඳහන් වෙලා තිබුණා. නමුත් මෙතැනට

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

මට කිව්වා, අපි ගෑස් ප්‍රශ්නය විසඳලා තිබෙන්නේ, ඒකේ කිසි ප්‍රශ්නයක් නැහැ කියලා. දැන් ඒ සිදුවීම වෙලා අවුරුද්දක් වනවා.

[ගරු වාමර සම්පත් දසනායක මහතා]

දැන් ඊළඟ ටෙන්ඩරයත් ඇවිල්ලා. මොකද වුණේ? ටෙන්ඩරය දෙන සමාගමට ගෑස් ගෙනෙන්න අවම වශයෙන් නැව් හතරක්වත් තිබෙන්න ඕනෑ කියලා කිව්වා. නමුත් ටෙන්ඩරය දීලා තිබුණේ නැව් දෙකක් තිබෙන සමාගමකට. මම මේ ගැන "දෙරණ 360°" වැඩසටහනේදීත් කිව්වා. පාර්ලිමේන්තුවේදීත් කිව්වා. අද වනකොට තිබෙන්නේත් නැව් දෙකයි. නැව් දෙකකින් තමයි මාලදිවයිනේ ඉඳලා ගෑස් ගෙනෙන්නේ. අපට දවස් තුනකට ගෑස් නැවක් ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපට දවස් තුනකට ලිට්‍රෝ ගෑස් නැවක් ඕනෑ. ඒක නිසා තමයි නැව් දෙකෙන් කරන්න බැහැ කියන එක අපි මේ පාර්ලිමේන්තුවේදී කිව්වේ. අද වනකොට ගම්බද ප්‍රදේශවලට ලිට්‍රෝ ගෑස් හිඟයක් ඇවිල්ලා තිබෙනවා. ගෑස් ප්‍රශ්නය එන බව අපි කලින් කිව්වා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟ කාරණය මෙයයි. මේ පාර්ලිමේන්තුවේදී මම විතරයි කථා නොකළේ නොරොච්චෝලේ බලාගාරය හෝ ගල් අඟුරු ගැන. විපක්ෂය පැත්තේ ඉන්න සියලු මන්ත්‍රීවරුන් ගල් අඟුරු ප්‍රශ්නය ගැන කිව්වා. හැබැයි, ආණ්ඩුව ඒක හේවුවා. අද මොකක්ද වෙලා තිබෙන්නේ? අනුර කරුණාතිලකට තිබෙන ඇමතිකම් ගණන බලන්නකෝ. වරාය, සිවිල් ගුවන් සේවා, විදුලිබල, බනිජ තෙල් වශයෙන් විෂයයන් ගණනාවක් එතුමා යටතේ තිබෙනවා. එක මනුස්සයෙකුට ඒ සියල්ලෙහි වැඩ කරන්න පුළුවන්ද? කොයි ආණ්ඩුවක්වත් එක ඇමතිවරයෙකුට ඔය තරම් විෂයයන් ප්‍රමාණයක් දුන්නේ නැහැ. කැලණිය විශ්වවිද්‍යාලයේ අනුන් වෙනුවෙන් විභාගය හොරට ලිව්වා කියලා එහෙම කාටවත් තුඩු පඬුරු දෙන්න වුවමනාවක් නැහැ. බලශක්ති අමාත්‍යාංශයේ සිටින සමහරු එතුමාගේ නමවත් දන්නේ නැහැ. පසුගිය ආණ්ඩු කාලයේ කංචන විජේසේකර කිව්වාම විදුලිබල හා බලශක්ති ඇමතිවරයා කියලා ඕනෑ කෙනෙක් දන්නවා. ඒ කාලයේ චන්ද්‍රා බණ්ඩාර කිව්වාම විදුලිබල හා බලශක්ති ඇමති කියලා ඕනෑ කෙනෙක් දන්නවා. අනුර කරුණාතිලක මහත්තයාට ඒ කටයුතු කරගෙන යන්න අමාරු නම් වෙන කාට හරි භාර දෙන්න කියන්න. මේ දවස්වල නියමයක් නැහැ. මේ දවස්වල උඩ රට ප්‍රදේශයට උතුරන්න වහිනවා. එහෙම තිබියදීත් විදුලිබල සැපයුමේ කිසිදු ප්‍රශ්නයක් නොමැතිව විදුලිය කප්පාදු කරන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ ගැනත් අපි මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

මේ ආණ්ඩුව කියනවා, රජයේ සේවකයන්ට වාහන බලපත්‍ර ලබා දෙනවා කියලා. පරිපාලන සේවයේ නිලධාරින්, මේ සභාවේ දැන් ඉන්න මහලේකම් මණ්ඩලයේ දෙදෙනාත් එක්ක විධායක ශ්‍රේණියේ නිලධාරින්ට දීපු වාහන බලපත්‍ර විසිපන්දාහක් පමණ තවම තිබෙනවා. ඒ නිලධාරින්ට දැන් ඒ වාහන බලපත්‍ර පුවරලා මූණේ අළු ගා ගන්න තමයි වෙලා තිබෙන්නේ. රාජ්‍ය සේවකයන්, පරිපාලන සේවයේ නිලධාරින්, වෛද්‍යවරුන්, විනිශ්චයකාරවරුන් වැනි විධායක ශ්‍රේණියේ නිලධාරින්ට ලබා දුන් එකඳු වාහන බලපත්‍රයකින්වත් ප්‍රයෝජනයක් ගන්න බැරි වෙලා තිබෙනවා. මම හැමදාම කිව්වා, ඒ වාහන බලපත්‍ර විසිපන්දහස පිළිබඳව. ඒවා ලබා දෙනවා, ලබා දෙනවා කියලා කිව්වා. මේ අය වැයෙන්වත් ඒ සඳහා අවස්ථාව ලබා දෙනවාද කියලා අපි බලමු.

ආණ්ඩුව කියනවා, ඒගොල්ලන්ට ඕනෑ තරම් සල්ලි තිබෙනවාය කියලා. මේ ආණ්ඩුව බලයට ගෙනෙන්න එදා රාජ්‍ය ආයතනවල ඉඳගෙන වැඩ කළේත් මේ රාජ්‍ය සේවකයන්ම තමයි. ඒක නිසා සල්ලි තිබෙනවා නම් ඒ වාහන බලපත්‍ර විසිපන්දාහට අදාළ පහසුකම් ලබා දෙන්න කියන්න. එහෙම නොකළොත් අපි ඒ වාහන බලපත්‍ර විසිපන්දහස එකතු කරලා තියා ගන්නවා. අඩුම වශයෙන් ඒවා ෆයිල් එකකට දාලා අපිවත් තියා ගන්නවා. ඔබතුමන්ලාට ඒ පහසුකම ලබා දෙන්න බැරි නම් අපේ ආණ්ඩුවක් යටතේ හරි ඒ පහසුකම ලබා දෙන්න අපි කටයුතු කරනවා. ඒ විධියට රාජ්‍ය සේවකයන්ට ලබා දුන් වාහන බලපත්‍ර විසිපන්දහසක් තිබෙනවා. අඩුම වශයෙන් ඒ අයට පොඩි වාහනයක්වත් ගෙන්වා ගන්න අවස්ථාව දෙන්න කියන්නකෝ. එහෙමත් බැරි නම් ස්කූටරයක් හරි ගෙන්වා ගන්න අවස්ථාව දෙන්න. නැත්නම් ත්‍රී වීලර් එකක් හරි ගෙන්වා ගන්න ඒ බලපත්‍රය පාවිච්චි කරන්න අවස්ථාව දෙන්න කියන්නකෝ. එහෙමවත් මේ ආණ්ඩුව කටයුතු කළේ නැහැ.

ඊළඟ කාරණය තමයි, විශ්‍රාමිකයන්ගේ වැටුප් විෂමතාව පිළිබඳ ප්‍රශ්නය. 2024 දෙසැම්බර් 31වැනි දා විශ්‍රාම ගිය නිලධාරියෙකුගේ විශ්‍රාම වැටුපට වඩා වැඩි විශ්‍රාම වැටුපක් 2025 ජනවාරිවලදී විශ්‍රාම ගිය peon කෙනෙකු ගන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා doctor කෙනෙක් නේ. ඔබතුමා 2024 දෙසැම්බර් 31වැනි දා විශ්‍රාම ගියා නම් ඔබතුමාට වඩා වැඩි විශ්‍රාම වැටුපක් 2025 ජනවාරි මාසයේදී විශ්‍රාම ගිය peon කෙනෙකු ගන්නවා. ඒ කියන්නේ, ඔබතුමාට වඩා 2025 ජනවාරි මාසයේ විශ්‍රාම ගිය peon කෙනෙකුගේ විශ්‍රාම වැටුප වැඩියි. මේ ප්‍රශ්නයට මුහුණ දෙන විශ්‍රාමිකයන් 152,000ක් පමණ ඉන්නවා. ඒ 152,000ක් පමණ වන විශ්‍රාමිකයන්ගේ ප්‍රශ්නයට අද වනතුරුත් රජයට උත්තරයක් ලබා දෙන්න බැරි වෙලා තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, මේ අය වැයෙන්වත් ඒ විශ්‍රාමිකයන්ගේ ප්‍රශ්නය විසඳයි කියලා. ප්‍රශ්න විසඳුණා, අපි දිනුවා, අපි හරි කියලා ඕනෑ තරම් කියන්න පුළුවන්. සුරතල් කථා, සුභද කථා ජනතාවට සතුටු වෙන්න කියන්න පුළුවන්. හැබැයි, ජනතාවට සතුටු වෙන්න ඒවා කිව්වාට වැඩක් නැහැ නේ, බිම් මට්ටමේ තිබෙන ප්‍රශ්න විසඳිලා නැත්නම්. ගෑස් ප්‍රශ්නය තවම විසඳිලා නැහැ. තෙල් ප්‍රශ්නයත් තවම විසඳිලා නැහැ. අද වනකොට පෙට්‍රල් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද වනකොට ෂෙඩ්වල පෙට්‍රල් හිඟයක් තිබෙනවා. හැබැයි, මේ ආණ්ඩුව බලයට ආවාම ජනතාව බලාපොරොත්තු වුණේ ෂෙඩ් එකකට ගිය ගමන් පෙට්‍රල් ටික ගහගන්න පුළුවන් වෙයි, ඩීසල් ටික ගහගන්න පුළුවන් වෙයි, ගෑස් ටික ගන්න පුළුවන් වෙයි කියායි. ඒක නේ, ජනතාව මේ ආණ්ඩුවෙන් බලාපොරොත්තු වුණේ. ඒක නිසා, රටේ ප්‍රශ්න නැහැ කියලා හිතන්න එපා.

ඊළඟට, තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රශ්නයක් තිබෙනවා. තැපැල් දෙපාර්තමේන්තුවේ බාහිර කම්කරුවන් දෙදහසකට අධික පිරිසක් ඉන්නවා. ඉස්සර තැපැල් කන්තෝරුවලට ආදේශක කම්කරුවන් බඳවා ගත්තා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථිර සේවකයන් විශ්‍රාම යන විට ආදේශක සේවකයින් ලෙස ගත් කෙනාට නිකම්ම එම තැපැල් කන්තෝරුවේම ස්ථිර රැකියාවක් ලබා ගැනීමේ අවස්ථාව කලින් තිබුණා. සමහර ආදේශක සේවකයින් අවුරුදු පහක්, දහයක් තිස්සේ සේවය කරනවා. තැපැල් සේවකයන් කියන්නේ කඳු පල්ලම්වල ඇවිදිමින් ලියුම් බෙදන පිරිසක්. සමහර අයට push cycle එකක්වත් නැහැ. ඒ අය පයින් යනවා. පයින් ගිහිල්ලා ලියුම් බෙදනවා. මේ තැපැල් සේවකයෝ දෙදහසක පමණ පිරිසකගේ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ අය ලියාපදිංචි ආදේශක තැපැල් සේවකයන්. මේ ප්‍රශ්නය ආණ්ඩුව තවම විසඳලා නැහැ. දැන් විභාග පවත්වන්න යනවා. එහෙම ප්‍රශ්නයක් තිබෙනවා. ආණ්ඩුවට අපි කියන්නේ මෙකයි. ආණ්ඩුව ස්වාධීන විය යුතුයි. ආණ්ඩුවේ අය මොන විධියට පත්වීම් දුන්නත් ස්වාධීන වෙන්න ඕනෑ. ගෝඨාභය මහත්තයා, එහෙම නැත්නම් අපි ඒ කාලයේ උපාධිධාරින් 50,000කට පත්වීම් දුන්නා; ගුරු පත්වීම් දුන්නා. ඒ අය අපිට ඡන්දය දුන්නාද? නැහැ. පසුගිය ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණයේදී රාජ්‍ය සේවකයින්ගෙන් සියයට 90ක් ඡන්දය දුන්නේ ජාතික ජන බලවේගයට.

අපි දන්නවා, රාජ්‍ය සේවකයාට වැඩියෙන්ම පඩි වැඩි කළේ 2001දී චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය බව. 2001දී ඇමෙරිකාවේ ලෝක වෙළෙඳ මධ්‍යස්ථාන කුලුනුවලට ප්‍රහාරයක්

එල්ල කළ කාලයේ තමයි චන්ද්‍රිකා මැතිනිය රාජ්‍ය සේවකයින්ට පඩි වැඩි කළේ. නමුත් 2001දී පැවති මහ මැතිවරණයේදී රනිල් වික්‍රමසිංහ මහත්තයාට ඡන්දය දුන්නා. අපි පරාදයි. 2001දී අපි පඩි වැඩි කළා කියලා අපිට ඡන්දය දුන්නේ නැහැ. එදා ඡන්දයේදී රාජ්‍ය සේවකයින් වැඩි ප්‍රමාණයක් ඡන්දය දුන්නේ රනිල් වික්‍රමසිංහ මහත්තයාට.

ඒ වාගේම අපි දන්නවා, රනිල් වික්‍රමසිංහ මහත්මයා "උරුමය" නමින් ඉඩම් ඔප්පු දෙන වැඩසටහනක් කරගෙන ගිය බව. ඒකට "උරුමය" කියන නම දාන්න බැරි නම් "කරුමය" කියලා හරි දාලා ඒ කටයුත්ත කරන්න. "උරුමය" කියන නම වෙනස් කර ගන්න ඕනෑ නම් ඔබතුමන්ලා ඒකට "කරුමය" කියලා හරි කියා ගන්න. ඒ වැඩසටහන ක්‍රියාත්මක කරන්න. "උරුමය" වැඩසටහන යටතේ ඔප්පු දෙනවා කියලා රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ කාලයේ එකතු කරපු ඔප්පු තිබෙනවා. ඒවා ගත්තා. මිනිස්සුන්ගේ ඉඩම් බලපත්‍ර ඉඩම් දෙපාර්තමේන්තුවට අරගෙන ඒවා cancel කරලා ඔප්පු දෙන්න තමයි කටයුතු කරගෙන ගියේ. ඊට අදාළව විශාල පිරිසක් ඉන්නවා. දැන් ඒ කටයුතු මොනවත් වෙන්නේ නැහැ. ඔක්කෝම නැවතිලා. එහෙම නවතින්න බැහැ නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. "උරුමය" ඔප්පු දෙන්න බැරි නම් "කරුමය" කියලා හෝ මොකක් හෝ නමක් දාගෙන ඒ cancel කරපු ඔප්පු තිබෙනවා නම් ඒවා බලලා ඒ කටයුත්ත කරන්න ඕනෑ. දැන් ඒ මිනිස්සු බලාගෙන ඉන්නවා තමන්ට කවදාද මේ "උරුමය" වැඩසටහන යටතේ ඔප්පුව ලැබෙන්නේ කියලා. "උරුමය" නැත්නම් වෙන නමක් දාලා හෝ මම කියන්නේ මේ වැඩේ ඉවර කරන්න කියලායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් තවත් ප්‍රශ්නයක් තිබෙනවා. දැන් මහ බැංකුව කියනවා පෞද්ගලික බැංකුවල රත්‍රන් බඩු උගස් තිබ්බාම ඒවාට එකපාර මුදල් ගෙවලා බේරා ගන්නලු. දැන් අපේ පැත්තේ, උඩරට වතුකරයේ ද්‍රවිඩ අය තමයි වැඩියෙන්ම රත්‍රන් බඩු පාවිච්චි කරන්නේ. තැල්ල හදනවා, මුද්ද හදනවා, මාල හදනවා, කරාබු හදනවා. ඒ මිනිස්සු නැති බැරි වෙලාවට ඒවා උගස් තියනවා. දැන් මහ බැංකුවෙන් චක්‍රලේඛයක් ගහලා තිබෙනවා, පෞද්ගලික බැංකුවල උගස් තියන ඒවා එක පාරම සල්ලි දීලා බේරා ගන්න කියලා. ඒ මිනිස්සුන්ට කොටස් වශයෙන් ගෙවලා ඒවා බේරා ගැනීමේ හැකියාව කලින් තිබුණා. එහෙම නැත්නම් ඒවා බේරා ගන්නතුරු පොලිය ගෙව ගෙවා ඉන්න පුළුවන්. සල්ලි කීයක් හරි ලැබුණාම; Employees' Provident Fund එක හෝ වෙනත් විධියකින් කීයක් හෝ ලැබුණාම ඒගොල්ලන් ඒ රත්‍රන් බඩු ටික බේරා ගන්නවා. දැන් එහෙම බැහැ. දැන් මහ බැංකුව දනුම් දීලා තිබෙනවා, මේ රත්‍රන් බඩු එක පාර මුදල් දීලා බේරා ගන්න කියලා. එතකොට වතු කම්කරුවෙක් ඒ විධියට එක පාර රත්‍රන් බඩු ටික බේරා ගන්නේ කොහොමද? මිනිස්සු රත්‍රන් බඩු උගස් තියන්නේ ඇඟේ පතේ අමාරුවට නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හදිසි අවශ්‍යතාවකට මුදල් ගන්න, මහුල් උත්සවයක් වෙනුවෙන් මුදල් ගන්න, ළමයෙකු විශ්වවිද්‍යාලයට යවා ගන්න වාගේ අත්‍යවශ්‍ය දේකට උගස් කරලා මුදල් ගන්න තමයි රත්‍රන් බඩු හදා ගෙන ඉන්නේ. දැන් මේ රත්‍රන් බඩු පිළිබඳ කාරණය උග්‍ර ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා, මහ බැංකුවේ මේ දැනුම් දීමත් එක්ක. දැන් මිනිස්සු මහ බැංකුව ළඟට ගිහිල්ලා උද්ඝෝෂණ කරනවා, උපවාස කරනවා. මේ වාගේ ගොඩක් ප්‍රශ්න තිබෙනවා.

ඊළඟ කාරණය මෙකයි. මේ රටේ කම්කරුවන්ට වැඩ කරන්න වැලි තියෙන්න ඕනෑ, සිමෙන්ති තියෙන්න ඕනෑ, ගල් තිබෙන්න ඕනෑ. එතකොට තමයි කම්කරුවන්ට වැඩ බිමට යන්න පුළුවන් වෙන්නේ. කම්කරු ක්ෂේත්‍රයේ විශාල පිරිසක් ඉන්නවා. ගල් වළවල්වල ගල් කැඩීම සඳහා අවශ්‍ය "වෝටර් ජෙල්" කියලා වෙඩි බෙහෙත් වර්ගයක් තිබෙනවා. ඉස්සර ආර්ථික අර්බුදය කාලයේ මේවා ගෙන්වීම නැවතිලා තිබුණා. දැන් රටේ ආර්ථික අර්බුදයක් නැහැ නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ "වෝටර් ජෙල්" වෙඩි බෙහෙත් දැන් එන්නේ නැහැ. මේ නිසා ගල් කොරි කඩන අයට අද විශාල ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. මේ ප්‍රශ්න පොඩි වුණාට, අද ගල් කොරිවලින් ජීවත් වෙනවා, දහස් ගණනක්. ඒගොල්ලන්ට වෙඩි බෙහෙත් නැති වුණාම කම්කරුවාගේ රැකියාවලට තමයි ප්‍රශ්නය එන්නේ. ඒ ගැනත් මම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ.

ඊළඟට මම කියන්න ඕනෑ, මේ කාරණයත්. දැන් අලුතෙන් ප්‍රශ්නයක් ඇවිල්ලා තිබෙනවා, අරක්කු බෝතල්වල අලවන ස්ටිකර් එක ගැන. අරක්කු බෝතල්වල අලවන ස්ටිකර් එක සම්බන්ධයෙන් පසුගිය කාලයේත් ලොකු ප්‍රශ්නයක් තිබුණා. එම ප්‍රශ්නය COPE එකේදී ඇදිලා එය රටේ ලොකු ප්‍රශ්නයක් බවට පත් වුණා. මෙවරත් එම ස්ටිකර් ලබා ගැනීම සඳහා ටෙන්ඩර් එකක් දාලා තිබෙනවා. එම ටෙන්ඩර් දැන්වීමේ කියලා තිබෙනවා, ටෙන්ඩරයට අයදුම් කරන අය මේ මේ කොන්දේසි සපුරන්න ඕනෑය කියලා. එකක්, අයදුම් කරන සමාගම් දූෂණ විරෝධී පනත යටතට ගැනෙන වැරදිවලට සම්බන්ධ අය නොවිය යුතු බව. දැන් ඒ දාපු ටෙන්ඩර් එක සම්බන්ධව සුරාබදු කොමසාරිස්වරයාට ජනාධිපති ලේකම් කාර්යාලයේ එක්කෙනෙක් බලපෑම් කරනවා. එයා හරහා පොඩි පොඩි බලපෑම් එනවා, මේ විධියට ටෙන්ඩර් එකේ කොන්දේසි වෙනස් කරන්න කියලා. ටෙන්ඩර් කොන්දේසි වෙනස් කළොත් ටෙන්ඩර් එකට ඉදිරිපත් වෙලා ඉන්න ටෙන්ඩර්කරුවන්ට පොඩි ගැටලුවක් ඇති වනවා.

එම ස්ටිකර් එක හඳුන්වා දී තිබෙන්නේ, හොරට පෙරන අරක්කු නිසා රජයට අහිමි වන බදු ආදායම ලබා ගන්නයි. මොකද, ඉස්සර ස්ටිකර් එකක් ගැහුවේ නැහැ නේ. ස්ටිකර් එක හඳුන්වා දී තිබෙන්නේ රජයේ ආදායම වැඩි කර ගන්නයි. එම ස්ටිකර් එකක ගණන මම හරියට දන්නේ නැහැ. පොඩි ගණනක්. මම හිතන විධියට රුපියල් 3ක්, 4ක් හෝ 5ක් ඇති. හැබැයි, ස්ටිකර් ලක්ෂ ගණනක් අවශ්‍යයි. එය පොඩි ගණනක එකක් නොවෙයි, මිලියන ගණනක ටෙන්ඩර් එකක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ ටෙන්ඩර් එක දැන් ලොකු ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ ගැනත් මම මතක් කරන්න ඕනෑ. ඒ නිසායි මම ඒ කාරණය කිව්වේ.

අපව භිර ගෙවල්වල දැම්මා කියලා, අපි භිර ගෙවල් හිටියා කියලා, ඒකේ කිසි ප්‍රශ්නයක් නැහැ. මම දැනටත් කොළඹ රක්ෂිත බන්ධනාගාරයේ ඉඳලා ඇවිත් තමයි මේ කථා කරන්නේ. අපි තවම වැරදිකාරයෝ බවට පත් වෙලා නැහැ. වැරදිකාරයන් බවට පත් වෙන්නේ නඩු අහලා, නඩු තීන්දුව ආවාට පස්සේ. එතකොට අපි ඒකට මුහුණ දෙනවා. හැබැයි, අපි කියන්නේ මේකයි. ජනාධිපතිතුමා බදුල්ලේ පැවති කාන්තා රැස්වීමේදී කිව්වා නේ, නීතිය හැමෝටම සමානව ක්‍රියාත්මක වෙන්න ඕනෑ කියලා. එම නිසා චාමර සම්පත්ට එක නීතියක්, නාමල් රාජපක්ෂට එක නීතියක්, තවත් කාටවත් එක නීතියක් වෙන්න බැහැ, ස්වාමීනි. නීතිය කාටත් සමාන වෙන්න ඕනෑ. නීතිය කාටත් සමාන වුණාම තමයි කාටත් සන්තෝෂ. හැමෝටම නීතිය සමානව ක්‍රියාත්මක වෙන්න ඕනෑ. විපක්ෂයට එක නීතියක් සහ ආණ්ඩුවට තව නීතියක් වෙන්න බැහැ නේ, ස්වාමීනි. උදාහරණයක් ගනිමු. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට "ස්වාමීනි" කියලා කියැ වුණා. මොකද, උසාවි ගිහිල්ලා, ගිහිල්ලා, ගිහිල්ලා එහෙම කියැවෙනවා. එච්චරට උසාවි යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හිටපු විදුලිබල ඇමති කුමාර ජයකොඩිට නඩු පැවරුවා. එතකොට පනතේ 149 වගන්තිය අදාළත් නැහැ. එවෙලේම ඇප දීලා එළියට දැම්මා. දැන් නඩුව

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

යනවා. අපට කොහොමද? අපට 149 වගන්තිය යටතේ බන්ධනාගාරගත කරලා, කරන්න ඕනෑ වැඩ ඔක්කෝම කරනවා. අන්න එහෙමයි අපට. ඒක තමයි මම කියන්නේ, නීතිය හැමෝටම සමාන වෙන්න ඕනෑ කියලා.

මේ බලන්න, මා ළඟ තවමත් B reports දෙකක් තිබෙනවා. ඒ, අපේ වෙළෙඳ ඇමතිතුමා දෙහිවල ගෙයක් අල්ල ගන්න ගිය සිද්ධියක් ගැන. ඒ නඩුව දෙහිවල ගල්කිස්ස උසාවියේ විභාග වනවා. හැබැයි, එතුමාට එක නීතියක්. අපට එක නීතියක්. ඒ නිසා, නීතිය කාටත් සමානව ක්‍රියාත්මක වනවා නම් කිසි ප්‍රශ්නයක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, your time is up.

ගරු චාමර සම්පත් දසනායක මහතා
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නීතිය හැමෝටම සමානව ක්‍රියාත්මක වනවා නම් අපටත් සන්තෝෂ වෙන්න පුළුවන් නේ, මේ ආණ්ඩුව හරියට නීතිය ක්‍රියාත්මක කරනවා, නීතිය ආණ්ඩු පක්ෂටත්, විපක්ෂයටත් එක සමානයි කියලා. එතකොට අපටත් කියන්න පුළුවන්, නැහැ, නැහැ එහෙම ප්‍රශ්නයක් නැහැ කියලා. දැන් ආණ්ඩුවේ කවුද සිරගත වෙලා ඉන්නේ? මේ අවුරුදු දෙක තුළ වැරැද්දක් කරපු ආණ්ඩුවේ කාවද ඇතුළට දැම්මේ? කිසි කෙනෙක් නැහැ. හැබැයි, විපක්ෂයේ ඉන්න අයට ඒ වැඩේ කරනවා. එච්චරයි මට කියන්න තිබෙන්නේ. *[බාධා කිරීම්]* පොඩ්ඩක් mike එක ඉල්ලගෙන කියන දෙයක් කිව්වා නම් හොඳයි. ඔතැන ඉඳගෙන හිකි හිකි ගෑවට අපි ඔවාට යට වෙන්නේ නැහැ. ඔතැනින් ඇවිල්ලා mike එක ඉල්ලගෙන හිකි හිකි ගාන්නකෝ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කාලය ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The ongoing Proceedings of the House shall stay suspended until 1.00 p.m. for lunch.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

අතන්පසු, අමාර්තු පි.ප. 1.00 මණිවරෙ මුදෙනිරුත්තප්පට්ටු මීණ්ටුනුං තොටඞ්කිට්රු. කුழුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ් [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] තලෙමෙ වකිත්තාර්කළ්.

Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චම්පික හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.00]

ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு சம்பிக ஹெட்டிஆரச்சி)
(The Hon. Champika Hettiarachchi)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ යෝජනාව අනුමත කිරීමත්, ඒ වාගේම 2026 අංක 6 දරන පරිපූරක ඇස්තමේන්තුව අනුමත කිරීමත් අද දිනයේ සිද්ධ වෙනවා. අපි දන්නවා, රාජ්‍ය බැංකු සහ පෞද්ගලික බැංකු හරහා සහන මිලට ණය මුදල් සැපයීමට මුදල් ලබා දීම වෙනුවෙන් පාර්ලිමේන්තුවේ යෝජනාවක් සම්මත කර ගන්න ඕනෑ බව. ඒක අපේ රාජ්‍ය ණය කළමනාකරණ පනතේ වූ විධිවිධානයක්. ඒ අනුව තමයි ආසියානු සංවර්ධන බැංකුව වෙතින් 2026 සිට 2028 දක්වා වන කාලයට අදාළව ඉදිරිපත් කොට තිබෙන, මෙම යෝජනාවේ සඳහන් බැංකු හරහා ක්‍රියාත්මක කරන ණය වැඩසටහන්වලට අදාළ අරමුදල් ලබා දීමට අනුමැතිය ලබා ගන්නේ.

මොනවාද මේ ණය කියලා අපි බලමු. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වෙනුවෙන් සහන පොලියට ණය ලබා දීම තමයි මේ අනුව කෙරෙන්නේ. ව්‍යාපාරිකයන්ගේ ව්‍යාපාරවල ධාරිතාව ඉහළ නැංවීමත්, මූල්‍ය පහසුකම් සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීමත්, තාක්ෂණය භාවිතය ප්‍රවර්ධනය කිරීමත්, වෙළෙඳ පොළ අවස්ථා පුළුල් කිරීමත් තමයි මේ ණය මුදල් ලබා දීමේ රජයේ අරමුණ හෙවත් පරමාර්ථය වන්නේ. ඒ වාගේම රජය විසින් හඳපු ප්‍රතිපත්ති තිබෙනවා. ඒ ප්‍රතිපත්ති අනුව යමින් අපේ රටේ ඉන්න ව්‍යවසායකයා, ව්‍යාපාරිකයා ශක්තිමත් කරන්න ඕනෑ. විශේෂයෙන්ම, අපනයන අභිමුඛ කර්මාන්ත. දේශීය වශයෙන් නිෂ්පාදනය කරමින් ඉන්න ඔවුන් අපනයන අභිමුඛව ඉන්නවා නම්, ඊළඟ step එකට ගෙන යන්න අවශ්‍යයි. ඒ සඳහා අපි මේ ණය මුදල් යොදවන්න බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම තමයි අපේ රටේ කාන්තාවන් මේ ආර්ථිකයට වඩවඩාත් වේගයෙන් දායක කර ගන්න ඕනෑ. ඒ නිසා කාන්තා මූලික ව්‍යවසායිකාවන් වෙනුවෙන් මේ අරමුදල් සම්පාදනය කිරීමටත් අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම අලුතින් එන ව්‍යාපාරිකයන් වෙනුවෙනුත් මුදල් වෙන් කරන්න බලාපොරොත්තු වෙනවා.

මොකද, අපි දන්නවා, පසුගිය කාලයේ තිබිච්ච අස්ථාවරත්වයන් හමුවේ ව්‍යාසායකයන් බිහි වීමේ අඩුවක් තිබුණු බව. ඒ නිසා මේ ආණ්ඩුව අලුතින් "Startup Sri Lanka" කියන programme එක හදලා තරුණ තරුණියන් සහ ව්‍යාපාර ක්ෂේත්‍රයේ අලුත් ව්‍යාපාරිකයන්, එහෙම නැත්නම් ව්‍යවසායකයන් වීමට බලාපොරොත්තු වන අය වෙනුවෙන් මුදල් වෙන් කිරීමට බලාපොරොත්තු වුණා. ඒ වාගේම අපි දන්නවා, යම් යම් අනපේක්ෂිත තත්ත්වයන් ද ඇති වන බව. ඒවායින් අදටත් අපි බැට කනවා. පසුගිය අවුරුද්දේ නොවැම්බර් 28වන දාත් අපට එවැනි ව්‍යසනයකට මුහුණ දෙන්න සිද්ධ වුණා. "දිට්වා" වාගේ අනපේක්ෂිත කුණාටු, අනපේක්ෂිත ගං වතුර තත්ත්වයන්ට මුහුණ දෙන්න අපට සිදු වෙනවා. ඒ ආකාරයට ලෝකයේ කාලගුණ දේශගුණ විපර්යාස සිදු වෙමින් තිබෙන නිසා රටක් විධියට ඒ දේශගුණික විපර්යාස ආශ්‍රිත මූල්‍යාකරණයටත් දායකත්වය දීම වෙනුවෙන් ද මේ මුදල් යොදවන්න අපි බලාපොරොත්තු වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ මුදල් එහෙම යොදවන අතරේ, මේ සඳහා අපි වෙන් කළා, රුපියල් මිලියන 7,750ක මුදලක්. එය කුමන හෝ ව්‍යවසායකයෙකුට රුපියල් මිලියන 75ක උපරිමයකටත්, වසර 2ක සහන කාලයක් සහිතවත්, වසර 10කින් ගෙවී යන පරිදිත් ඉතාම සහන පොලියට ඒ ණය මුදල් ලබා ගන්න පුළුවන්.

අද මුදල් වෙන් කරන දෙවන ක්ෂේත්‍රය තමයි කෘෂිකාර්මික අගය දාම මූල්‍යාකරණය සහ වාණිජකරණය සම්බන්ධ ක්ෂේත්‍රය. එහිදීත් අපි විශේෂයෙන්ම සලකා බැලුවා, කෘෂිකාර්මික

ක්ෂේත්‍රයේ ප්‍රාථමික නිෂ්පාදන කොහොමද වැඩිදියුණු කරන්නේ කියලා. ඒ වෙනුවෙන් මුදල් යොදවන්න අපි බලාපොරොත්තු වෙනවා. මෙහිදී කෘෂි සැලසුම්කරණය, ගබඩා කිරීම වැදගත් වනවා. මේ ගැන විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. පසුගිය රජයන් විසින් කෘෂි නිෂ්පාදන ගබඩා කිරීම කෙරෙහි තම අවධානය යොමු නොකිරීම නිසා ගොවියෝ ඉතාම අපහසුතාවට පත් වුණා. දඹුල්ල පොළේ වට්ටක්කා ගෝනි පොළොවේ ගහලා, භූමිතෙල් දාලා ගිනි තබලා යන අසරණ තත්ත්වයට එදා ඒ ගොවියෝ පත් වුණා. කෙසෙල් කැන් ඇතුළු හැම කෘෂි නිෂ්පාදනයක්ම එහෙමයි. එම නිසා කෘෂි නිෂ්පාදන සඳහා ගබඩාකරණ පහසුකම් ශක්තිමත් කළ යුතුයි කියන ප්‍රතිපත්තියේ වර්තමාන රජය ඉන්නවා. අන්න ඒ සඳහාත් යම් ව්‍යවසායකයෙකුට මුදල් යෙදවීම සඳහා සහන පොලියට ණය ගන්න පුළුවන්.

ඒ වාගේම තමයි, අගය එකතු කිරීම. අපේ රට කෘෂිකාර්මික රටක්. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙනවා, මේ රට කෘෂි කර්මාන්තයෙන් දියුණු කරන්න ඕනෑ කියලා. අන්න ඒ වෙනුවෙනුත්, අපනයනය සඳහා අගය එකතු කිරීමටත්, එහෙම නැත්නම් දේශීය වශයෙන් අගය එකතු කිරීමටත් යටත්ව ඒ ණය මුදල් ලබා ගන්න පුළුවන්. ඒ වාගේම තමයි අළෙවිකරණය. මොකද, කොච්චර නිෂ්පාදනය කළත් වැඩක් නැහැ, ඔවුන්ගේ අළෙවිකරණය නිසියාකාරව සිද්ධ වන්නේ නැත්නම්. ඒ සඳහා ඩිජිටල්කරණය, තාක්ෂණය එන්න ඕනෑ; අලුත් අළෙවිකරණ උපාය මාර්ග පාවිච්චි කරන්න ඕනෑ. ඒ වෙනුවෙන් යොමු වීමට අවශ්‍ය ව්‍යවසායකයන්ටත් මේ ණය ලබා දීමට අපි බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන් රටක් විධියට ව්‍යවසායක මෙහෙයුම් පුළුල් කිරීමට, ඵලදායීතාව ඉහළ නැංවීමට, වෙළෙඳ පොළ ප්‍රවේශය වැඩිදියුණු කිරීමට මූල්‍ය පහසුකම් සැපයීම තමයි රජය විධියට අප මෙයින් බලාපොරොත්තු වන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙහිදීත් මා අර කලින් කිව්වා වාගේම බලාපොරොත්තු වෙනවා, රටක් විධියට export-oriented factories හිමි ව්‍යවසායකයන් ඊළඟ පියවර වෙනුවෙන් ඔසවා තැබීම, කාන්තා මූලික ව්‍යවසායකයන් මේ කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රයේ ඉන්නවා නම් ඒ අය ද ශක්තිමත් කිරීම වාගේම ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම. අපි විශේෂයෙන් සඳහන් කරනවා ග්‍රාමීය ආර්ථිකය දක්වා මේ ආර්ථිකය පැතිරෙන්න ඕනෑ බව, ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් වෙන්න ඕනෑ බව. අන්න වෙනුවෙනුත් ව්‍යවසායකයන් සඳහා මුදල් වෙන් කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. මෙහිදීත් අර කියපු සහන කොන්දේසි ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක වෙනවා. මේ වෙනුවෙන් වෙන් කර තිබෙනවා, රුපියල් මිලියන 6,200ක්. එක් පුද්ගලයෙකුට රුපියල් මිලියන 75ක උපරිමයකට යටත්ව, වසර 2ක සහන කාලයක් සහිතව අවුරුදු 10කින් ආපසු ගෙවා අවසන් වන විධියට, සහන පොලියට මේ ණය ලබා ගන්න පුළුවන්. ඒ තමයි මේ ණය ලබා දීමේ ක්‍රමවේදය. ඒ වෙනුවෙන් තමයි රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ වන මේ යෝජනාව අද අනුමත කරන්නේ. මේ යෝජනාව අනුමත කරලා ඉදිරියේදී රාජ්‍ය සහ පෞද්ගලික බැංකු 16කට මේ ණය ලබා දීමේ අනුමැතිය අපි ලබා දෙනවා. ඒ සඳහා යම් මුදලක් අවශ්‍යයි. 2026 - 2028 වෙනුවෙන් මුදල් වෙන් කළත් මේ වසර අවසාන නිසා ඒ මුදල් ලබා ගැනීමට අවශ්‍ය පරිපූරක ඇස්තමේන්තුවක් තමයි ඊළඟට ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ සඳහාත් අද පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගන්න අපි බලාපොරොත්තු වෙනවා.

මෙහිදී වඩා වැදගත් වන කාරණය මෙකයි. මේ ස්ථාවර කරපු ආර්ථිකය කළමනාකරණය කරලා ඊළඟ පියවර කරා; සංවර්ධනය කරා ගෙන යන්න ඕනෑ. පසුගිය 2025 අවුරුද්දේ සියයට 7ට තිබුණු මැදි කාලීන ආර්ථික වර්ධන වේගය ඊට වඩා ඉහළට ඔසවා තැබීම ගැනයි අපේ ඊළඟ අය වැය අභිමුඛව සිට අප මේ කථා කරන්නේ. නොවැම්බර් මාසයේ 12වන දා ඉදිරිපත් කරන අය වැයෙන් විශේෂයෙන්ම මේ ආර්ථිකය ශක්තිමත් කරන්න අවශ්‍ය සහන -ජනතාවට අවශ්‍ය සහන- ලබා දීලා තිබෙනවා.

එම අය වැය ගැන කථා කරන්න කලින් අපි දන්නවා, පසුගිය අවුරුද්දේ අප හදපු අය වැයට මොකද වුණේ කියලා. ඉතිහාසයේ කවරදාටත් වඩා ඒ අය වැය ඉතාම සාර්ථකව ක්‍රියාත්මක වුණා. විශේෂයෙන්ම ඔබතුමන්ලා දන්නවා, පසුගිය අගෝස්තු මාසයේ අපේ විදේශ ප්‍රේෂණ සියයට 10කින් ඉහළ ගිය බව. එය ඩොලර් මිලියන 749ක අගයක් වාර්තා කළා. ඒ වාගේම, ජංගම ගිණුම ඩොලර් මිලියන 133ක ධන අගයක් වාර්තා කළා; ඒ වාගේම දළ නිල සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 6.9ක් දක්වා වර්ධනය වුණා. ආර්ථික වර්ධනය විතරක් නොවෙයි, අල්ලස, දූෂණය, නාස්තිය ආදියෙන් තොර රටක් බවට අපි මේ රට ක්‍රමානුකූලව පත් කරමින් ඉන්නවා. ඒ විතරකුත් නොවෙයි, විෂ මත් ද්‍රව්‍ය මුළු රටම වෙළාගත්තු යුගයක් තිබුණා. දේශපාලන අධිකාරියේ අනුග්‍රහයෙන්, ආශීර්වාදයෙන් කරපු මත් ද්‍රව්‍ය ව්‍යාපාරය අද වනකොට හකුළමින්, පිට රටවලින් මත් ද්‍රව්‍යය පැමිණෙන ජාලය හකුළමින්, මත් ද්‍රව්‍ය අත් අඩංගුවට ගනිමින් මේ රජය ක්‍රියාත්මක වෙමින් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඔන්න ඔය අතරේ තමයි ඉදිරි අය වැය එන්නේ. එම අය වැයේ තිබෙන විශේෂත්වය වන්නේ මෙකයි. රටේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් බිලියන 39,000ක් දක්වා වැඩි කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම තමයි, පසුගිය 2025 අවුරුද්දේ රුපියල් බිලියන 1,380ක් වෙන් කරපු ප්‍රාග්ධන වියදම් මේ අය වැය තුළ ට්‍රිලියන 2ක් දක්වා ඉහළ නංවා තිබෙනවා. බෙහෙත් සඳහා, පොහොර සහනාධාරය සඳහා, පාසල් දරුවන් වෙනුවෙන් පෝෂණ අවශ්‍යතා සඳහා, පාසල් උපකරණ සඳහා සුවිශේෂී සහන සපයන අය වැයක් බවට ඉදිරියේදී මෙම අය වැය පත් වෙනවා. ඒ විතරක් නොවෙයි, ගොවි විශ්‍රාම වැටුප සඳහා, අනාර්ථික මාර්ගවල බස් ධාවනය සඳහා අපි සැලකිය යුතු මුදලක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම, අධිවේගී මාර්ග නඩත්තුවට, අධිවේගී මාර්ග ඉදි කිරීමට සහ ග්‍රාමීය මාර්ග ශක්තිමත් කිරීමට විතරක් නොව, ගෙයක් නැතුව පැල්පත්වල ජීවත් වෙච්ච අය වෙනුවෙන් පසුගිය අවුරුදු දෙකේ ක්‍රියාත්මක කරපු නිවාස යෝජනා ක්‍රමය සඳහා ලබන අවුරුද්දේත් අපි සැලකිය යුතු මුදලක් වෙන් කර තිබෙනවා. ඒ බව විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. අමතක කරන්න එපා, පසුගිය අවුරුදු දෙකේම වැඩි වුණා වාගේ රාජ්‍ය සේවක වැටුප් මේ එළඹෙන 2027 ජනවාරි මාසයේත් සියයට 35කින් වැඩි කරන බව. මේ ආර්ථිකය අමාරුයි කියලා මේ විපක්ෂය කෑගහලා කිව්වාට ජනතාවට සහන දෙන අය වැයක් තමයි අප ඉදිරිපත් කරන්නේ.

මෙහිදී විශේෂයෙන් මේ කාරණයත් සඳහන් කරන්න ඕනෑ. අපට මේ ආර්ථිකය බාර දෙන කොට දැඩි සත්කාර ඒකකයේ හිටපු ලෙඩෙකු වාගෙයි තිබුණේ. පණ ඇද ඇද තිබුණු ආර්ථිකය නැමැති ඒ ලෙඩා අපි දැන් වාට්ටුවට මාරු කර තිබෙන විට විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහත්මයා උදේ පාන්දර නැඟිටලා ඇවිත් කියනවා, අපි ඡන්දය ඉල්ලුවේ IMF එකට යනවා කියලා නොවෙයි, එයාලාත් ඡන්දය ඉල්ලුවේ IMF එකට යනවා කියලා නොවෙයි, අපට ජන වරම ලැබුණේ IMF එකට යන්න නොවෙයි කියලා. එහෙම කියන ගමන් අනෙක් අතට කියනවා, මේ වැඩ පිළිවෙළ ගෙනාවේ රනිල් වික්‍රමසිංහ කියලා. අපි පසු ගිය දවස් ටිකේ දැක්කා, කාත් එක්කද එයා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

[ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා]

රනිල් වික්‍රමසිංහ එක්ක. IMF එකට රට ගෙනිච්චේ රනිල් වික්‍රමසිංහත් එක්ක එහෙම ඉඳලා කියනවා, අපට ජන වරම ලැබුණේ එහෙම එකකට නොවෙයි කියලා. ලජ්ජයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්ඩලික කටයුතු කෘත්‍යාධිකාරී අවර්ගයේ සභාපතිතුමිය)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසන්.

ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා
(මාණ්ඩලික කටයුතු කෘත්‍යාධිකාරී අවර්ගයේ සභාපතිතුමිය)
(The Hon. Champika Hettiarachchi)
මට තව තත්පර කිහිපයක් ලබා දෙන්න.

පසුගිය කාලයේ ජනාධිපතිතුමා විසින් නීතිය හරියට ක්‍රියාත්මක කරනවා, මගේ වචනය නොවෙයි නීතිය කියලා කියද්දී, ඒකට චක්‍රලේඛන හදනවා කියද්දී සජබ කණ්ඩායමක තාත්තලා, දුවලා ගිහිල්ලා හනුමන්තලා වාගේ කන්ද උඩ රට ගිනි තියන්න ලැහැස්ති කළා. එහෙම විපක්ෂයක් තමයි මේ අකුල් හෙළමින් ඉන්නේ.

ඒ වාගේම මට තව කාරණයක් කියන්න තිබෙනවා. එක මන්ත්‍රීවරයෙක් permit ගැන කථා කළා. අපි දන්නවා, ජනතාවට සහන දෙන අතරතුර බඩු මිල වෙනුවෙන් සහන දෙන්න ඕනෑ, බදු අඩු කරන්න ඕනෑ කියලා. ඒ වාගේම තහනම් කරපු වාහන සහ තහනම් කරපු භාණ්ඩ කිහිපයක් අපි ගෙන්වුවා. අපි ක්‍රමානුකූලව ආර්ථිකය නිදහස් කරමින් ඉන්නවා. අපි ඉදිරියේදී ඒ ගැන සලකා බලන්නම්. හැබැයි, මට කියන්න ඕනෑ, ඒ permit නැති කළේ අපි නොවෙයි ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් කියන එක. මම හිතන්නේ ඒ කාරණය කිව්ව මන්ත්‍රීතුමා දැන් මේ සභාවේ නැහැ. එතුමා බන්ධනාගාරයට ගිහිල්ලා වෙන්න ඇති. ඒ ගැනත් මතක් කරමින්, එළඹෙන අය වැය රටේ දිසාව වෙනස් කරන අය වැයක් බවට පත් වෙනවා, එහි ප්‍රතිලාභ ජනතාවට ලබා දෙනවා නිසැකයි කියමින්, කාලය ලබා දුන්නාට ඔබතුමියටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්ඩලික කටයුතු කෘත්‍යාධිකාරී අවර්ගයේ සභාපතිතුමිය)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (වෛද්‍ය) ඉලෙයිතම්බි සිරිනාත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[පි.ප. 1.11]

ගරු (වෛද්‍ය) ඉලෙයිතම්බි සිරිනාත් මහතා
(මාණ්ඩලික (වෛද්‍ය) இளையதம்பி சிறிநாத்)
(The Hon. (Dr.) Elayathamby Srinath)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, ஆசிய அபிவிருத்தி வங்கியின் நிதி உதவி தொடர்பான பிரேரணை மற்றும் குறைநிரப்புத் தொகை சம்பந்தமான இன்றைய விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதையிட்டு மகிழ்ச்சியடைகின்றேன்.

மிக முக்கியமாக, இளம் தொழில்முயற்சியாளர்களின் நிதி நிலைமையை வலுப்படுத்துவதற்காகவும் உற்பத்தியைப் பெருக்குவதற்காகவும் கொண்டுவரப்பட்டுள்ள இந்தப் பிரேரணையானது உண்மையிலேயே வரவேற்கத்தக்கது. மேலும், இது நாட்டின் பொருளாதாரத்தையும் பிரதேசத்தின் பொருளாதாரத்தையும் வலுப்படுத்துவதாக அமைகின்ற பொழுது, இதனை நாங்கள் வரவேற்கவேண்டிய தேவை இருக்கின்றது. நெருக்கடியான சூழலில் பொருளாதார வலுவை உறுதிப்படுத்துவதன் மூலமே நாம் இந்த விடயங்களை வெற்றிகரமாகக் கொண்டுசெல்ல முடியும். சமகாலத்தில் மக்கள் பல நெருக்கடிகளை எதிர்நோக்கிக்கொண்டு இருக்கிறார்கள். பொருட்களின் விலைவாசி அதிகரிப்பு மற்றும் பணப்புழக்கம் சம்பந்தமான நெருக்கடி நிலவும் இந்தச் சூழலில் இவ்வாறான செயற்றிட்டங்கள் உற்பத்தியாளர்களையும் விவசாயிகளையும் வலுப்படுத்தும் வகையில் இருப்பது வரவேற்கத்தக்கது. ஒருபுறம் உற்பத்தியாளர்களையும் விவசாயிகளையும் வலுப்படுத்துகின்ற செயற்றிட்டங்களைச் செய்கின்ற அதேநேரம், மறுபுறத்தில் பொருளாதாரத்தை வலுப்படுத்தக்கூடிய பண்ணையாளர்களும் விவசாயிகளும் பாதிக்கப்படக்கூடிய பல நிகழ்வுகள் எமது மாவட்டத்தில் அரங்கேறிக்கொண்டு இருக்கின்றன.

குறிப்பாக, மயிலத்தமடு, மாதவனை மேய்ச்சல் தரை சம்பந்தமாக மீண்டும் இச்சபையின் கவனத்தை ஈர்க்கவேண்டிய தேவையிருக்கின்றது. எமது மாவட்டத்தில் மிக முக்கிய பொருளாதார வலுவாக இருக்கின்ற பண்ணையாளர்களையும் விவசாயிகளையும் பாதிக்கக்கூடிய வகையில் மிகப் பெரிய சதி நடவடிக்கை மேற்கொள்ளப் படுகின்றது. உண்மையிலே பெரும்போகச் செய்கையின் பொழுது, எமது மாவட்டத்திலுள்ள பண்ணையாளர்கள் தங்களுடைய கால்நடைகளை மேய்ச்சல் தரைக்குக் கொண்டுசெல்ல வேண்டிய தேவை இருக்கின்றது. இது பல தசாப்தங்களாக அரசாங்கத்தின் திட்டமிடலின்கீழ் நடைபெற்று வருகின்ற ஒரு நடைமுறையாகும். இந்த நடைமுறையைக் குழப்பக்கூடிய செயற்பாடுகளைச் சில இனவாத சக்திகள் காலத்துக்குக் காலம் மேற்கொண்டு வருகின்றன. கால்நடைகளையும் மேய்ச்சல் தரைகளையும் பாதுகாப்பதற்காக எமது மாவட்டத்தில் நடைமுறை ரீதியாகவும் நிருவாக ரீதியாகவும் சட்ட ரீதியாகவும் பல ஏற்பாடுகள் செய்யப்பட்டு இருக்கின்றன. ஆனால், இன்று அந்த நிலைமை மாற்றமடையக்கூடிய வகையில் பல செயற்பாடுகள் முன்னெடுக்கப்படுகின்றன. மாண்புமிகு சனாதிபதி அவர்கள் எங்களுடைய மாவட்டத்துக்கு வருகைதந்தபொழுது உறுதியளித்திருந்தார், அமைச்சரவை அனுமதியினூடாக மேய்ச்சல் தரைக்கான காணி விடுவிப்பு மிக விரைவாக நடக்குமென்று. ஆனால், பல மாதங்களாகியும் அதற்கான செயற்பாடுகள் நடைபெறவில்லை.

பண்ணையாளர்கள் தமது கால்நடைகளை மேய்ச்சல் தரைக்குக் கொண்டுசெல்கின்ற இடத்தில், அத்துமீறிப் பலர் குடியமர்த்தப்பட்டு, விவசாயம் செய்வதற்கான நடவடிக்கைகளும் மேற்கொள்ளப்பட்டு இருக்கின்றன. இந்தப் பிரதேசத்தில் இனமுறுகலை ஏற்படுத்துவதற்கான ஒரு சதித்திட்டமாகவே நாங்கள் இதனைப் பார்க்கின்றோம். ஏனென்றால், பாரிய நிலப்பரப்புகள் பல மாவட்டங்களிலும் இருக்கின்ற நிலையில், ஏற்கனவே அவர்களுக்கு நீதிமன்ற உத்தரவின்மூலம் வேறு நிலங்கள் கொடுக்கப்பட்டு இருக்கின்ற நிலையில், எமது பண்ணையாளர்களின் கால்நடைகளை அந்தப் பிரதேசத்திலுள்ள மேய்ச்சல் தரையில்விட மறுப்பதன்மூலம் அந்த இடத்தில் பதற்றமான ஒரு சூழ்நிலையை ஏற்படுத்துவதற்கான செயற்பாடு இடம்பெற்றுக்கொண்டு இருக்கின்றது. எனவே, இந்த விடயத்தை அரசு நிதானமாகவும் கவனமாகவும் கையாண்டு,

මික විරෙවාකත් තීර්ත්තුවෙක්ක වේණ්ටුම්. ඉව්විටයම් තොටර්පිල් නීතිමන්ර උත්තරවු ඉරුක්කින්රතු; අරසාංකත්තින් නටෙමුරෙ ඉරුක්කින්රතු; කාලත්තුක්කුක් කාලම් අන්ත ඉටම් මේය්ච්සල් තරෙක්කාක ඔතුක්කප්පට්ටු ඉරුක්කින්රතු. මික මුක්කියමාක, ඔව්වොරු පෙරුම් පෝකත්තින්පෝතුම් අංකුළ්ළ මාටුකළෙ මේය්ච්සල් තරෙක්කුක් කොණ්ටුසෙල්ලාමල් විට්ටාල්, මට්ටක්කළප්පු මාවට්ටත්තිල් විවසායම් පාරිය අළවිල් පාතික්කප්පටුම්.

විවසායම් පාතික්කප්පටුම්පොළුතු, මාවට්ටත්තින් පොරුළාතාර අච්චාණි පාතික්කප්පටුවතර්කු වාය්ප්පු ඉරුක්කින්රතු. නාට්ටින් පොරුළාතාරත්තෙ, උර්පත්තියෙ වලුවටෙයච් සෙය්යුම් නෝක්කිල් ඉන්තක් කුරෙනිරප්පුත් තොකෙ කොණ්ටුවරප්පට්ටු ඉරුක්කින්ර ඉන්තච් චන්තර්ප්පත්තිල්, මට්ටක්කළප්පු මාවට්ටත්තිල් පොරුළාතාරත්තෙච් චිතෙක්කින්ර නටවටික්කෙකළ් මිකත් තුරිතමාක නටෙපෙර්රුක්කොණ්ටු ඉරුක්කින්රන. අංකු අන්තක් කාණියිල් අටාත්තාක විවසායම් චෙය්කින්රවර්කළුක්කු උළවු ඉයන්තිරම් වාංකික් කොටුක්කප්පට්ටු ඉරුක්කින්රතු; අංකු කූට්ටංකළ් නටාත්තප්පටුකින්රන; මුරුකල් නිලෙ ඒර්පටුත්තප්පට්ටු ඉරුක්කින්රතු. නාංකළ් ඉන්ත විටයත්තෙප් පොරුමෙයාක, නිතානමාකක් කෙයාණ්ටපොළුතුම්, අන්ත මේය්ච්සල් තරෙකළිල් ඉරුක්කින්ර මාටුකළෙක් කායප්පටුත්තුකින්ර, චුටුකින්ර නටවටික්කෙකළ් නටෙපෙර්රුක් කොණ්ටු ඉරුක්කින්රන. ඉතර්කු පොරුප්පුක්කූර වේණ්ටිය මකාවලි අතිකාරචපෙ, මාවට්ට චෙයලකම්, පොලිස් තිණෙක්කළම්, වන ඉලාකා එන්පන පොරුප්පර්ර මුරෙයිල් නටන්තුකොළ්වතෙක් කාණක්කූටියතාක ඉරුක්කින්රතු. පොරුප්පුක්කූර වේණ්ටිය තිණෙක්කළങ්කළේ තමතු පොරුප්පුක්කළෙ මරන්තු නටප්පතාල්, එමතු මාවට්ටත්තිල් එතිර්කාලත්තිල් මිකප් පෙරිය මුරුකල් නිලෙ ඒර්පටුතවර්කු වාය්ප්පු ඉරුක්කින්රතු.

ඉන්රු පණ්ණෙයාළර්කළ් මික මෝචමාකප් පාතික්කප්පටුකින්ර නිලෙමෙ ඒර්පට්ටුළ්ළතාල්, අවර්කළ් ආර්ප්පාට්ටම් අල්ලතු පෝරාට්ටම් චෙය්ය වේණ්ටිය නෙරුක්කටියාන නිලෙක්කුත් තළ්ළප්පට්ටු ඉරුක්කිරාර්කළ්. ඉන්ත විටයම් තොටර්පිල් නීතිමන්ර උත්තරවු ඉරුක්කින්රතු; චනාතිපතියිණ් ආණෙ ඉරුක්කින්රතු; මාවට්ට මට්ටත්තිල් එටුක්කප්පට්ට තීර්මානම් ඉරුක්කින්රතු. ඉවෙ එල්ලාවර්රෙයුම් මීරි, නීතික්කුප් පුරම්පාන විතත්තිල්, චට්ටත්තෙ අවමතික්කින්ර වකෙයිල්, අංකු පලර් කුටියමර්ත්තප්පට්ටු, පණ්ණෙයාළර්කළුක්කු ඉටෙයූරුකළෙ ඒර්පටුත්ති, අවර්කළිණ් කාල්නටෙකළෙ මේය්ච්සල් තරෙකළුක්කුළ් විටාතු තටුප්පතනාල්, අවර්කළ් මීණ්ටුම් අවර්රෙත් තංකළතු මාවට්ටත්තුක්කුක් කොණ්ටුවරුම් පොළුතු, විවසායම් මුර්රුමුළුතාකප් පාතික්කප්පටුම්. ඉතනාල් මාවට්ටත්තින් උර්පත්ති පාතික්කප්පටුම්; පොරුළාතාරම් පාතික්කප්පටුම්. ඉන්ත විටයත්තුක්කුප් පොරුප්පාන තුරෙචාර්න්ත අමෙච්චර්, මාවට්ට අපිවිරුත්තික් කුළුවින් තලෙවරාක ඉරුක්කින්ර අමෙච්චර් එන එල්ලෝරුම් ඉණෙන්තු ඉතර්කු විරෙවාකත් තීර්වොන්රෙක් කාණාවිට්ටාල්, මිකප් පෙරිය අනර්ත්තම් අල්ලතු මුරුකල් නිලෙ ඒර්පට වාය්ප්පු ඉරුක්කින්රතු.

ඉන මුරුකල් ඒර්පටාත වකෙයිල්, පිරයත්තනත්තුටන් චෙයර්පට්ටු, ඉණක්කප්පාට්ටින් අටිප්පටෙයිල් තීර්වු කාණ මුර්පටුම්පොළුතු, කාල්නටෙකළ් තාක්කප්පටුවතුම්, පොලිචාරාල් පණ්ණෙයාළර්කළ් විරට්ටප්පටුවතුම්, අතනෙ මාවට්ටච් චෙයලකම් කණ්ටුකොළ්ළාමල් ඉරුප්පතුම් මිකුන්ත ඒමාර්රත්තෙ අළික්කින්රතු. එනවේ, ඉන්ත විටයත්තිල් මාණ්පුමිකු චනාතිපති අවර්කළුම් අරචාංකමුම් උටනටියාකත් තලෙයිට්ටු තීර්වු කාණාවිට්ටාල්, එමතු මාවට්ටත්තිලුළ්ළ විවසායිකළ්, පණ්ණෙයාළර්කළිණ් මනංකළිල් පාරිය නම්පික්කෙයීනම් ඒර්පටුම්. කටන්ත කාලංකළිල් ඉව්වාරාන නිලෙමෙකළ්තාන් නාට්ටිල් ඒර්පට්ට මෝචමාන නිලෙමෙකළුක්කුක් කාරණමාක අමෙන්තන. අංකු අත්තුමීරික් කුටියේරියවර්කළුක්කු ඒර්කෙනවේ කාණික්කළ් වළංකප්පටුවතර්කාන ඒර්පාටුකළ් චෙය්යප්පටුවතාක උරුතියළික්කප්පට්ටුම්කූට, චිල ඉනවාත චක්තිකළිණ් තූණ්ටුතලිණ් පේරිල් අවර්කළ් මීණ්ටුම් මීණ්ටුම් අන්ත ඉටත්තිල් කුටියේරි නෙරුක්කටියෙ ඒර්පටුත්තික්කොණ්ටු ඉරුක්කින්රාර්කළ්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුළුක්කළිණ් පිරතිත් තවිචාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු (වෛද්‍ය) ඉලෙයිතම්බි සිරිනාත් මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) ඉළෙයතම්පි චිරිනාත්)
(The Hon. (Dr.) Elayathamby Srinath)
Madam, please give me one more minute.

ඉන්ත විටයම් තොටර්පිල් අරචාංකම් විරෙවාක නටවටික්කෙ එටුත්තාල් මක්කළිණ් මනංකළිල් නම්පික්කෙ ඒර්පටුම්. පල විටයංකළිල් චට්ටත්තෙ මිකච් චිරප්පාක අමුල්පටුත්ත අරචාංකම් මුනෙකින්රතු. අතනෙ නාංකළ් පාරාට්ටුකින්රෝම්. අව්වාරු ඉන්ත විටයත්තිලුම් චෙයර්පට වේණ්ටුම්. අරචාංකමානතු ඉන්ත විටයත්තිල් තීර්ක්කමාන මුටිවෙ එටුක්කාවිට්ටාල්, එතිර්කාලත්තිල් මිකප් පෙරිය නෙරුක්කටි නිලෙ ඒර්පටුමෙනක් කූරි, එනතු උරෙයෙ මුටිත්තුක් කොළ්කින්රේන්. නන්රි!

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(මාණ්පුමිකු කුළුක්කළිණ් පිරතිත් තවිචාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මංජුල සුරවීර ආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.20]

ගරු මංජුල සුරවීර ආරච්චි මහතා
(මාණ්පුමිකු මඤ්ඤුළ සුරවීර ආරච්චි)
(The Hon. Manjula Suraweera Arachchi)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද ඉතාම වැදගත් මාතෘකාවක් ගැන තමයි අපි කථා කරමින් ඉන්නේ. රටේ ආර්ථිකයට විශාල දායකත්වයක් දෙන, ඒ වාගේම ආර්ථික චලනයන් දරාගනිමින් රටේ ආර්ථික අභිවෘද්ධිය, සංවර්ධනය ආදී කාරණා වෙනුවෙන් කොන්දේසි විරහිතව කැපවන කණ්ඩායමක් තමයි, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් කියන්නේ. මෙම කණ්ඩායම රටේ ආර්ථිකය ඉහළ නැංවීම සඳහා විශාල වශයෙන් දායක වනවා. අපි දන්නවා, රටක ඒක පුද්ගල ආදායම ඉහළ දැමීමේ කාර්යය කරන්න මේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් කටයුතු කරන බව. ඒ වාගේමයි, රටක දරිද්‍රතාව පහළ හෙළීම සඳහා කරන්න පුළුවන් උපරිම කාර්යභාරයත් ඔවුන් කරමින් ඉන්නවා. සේවා නියුක්තිය ඉහළ නැංවීම වෙනුවෙන්, තුලිත ආර්ථික සංවර්ධනයක් ඇතිකිරීම වෙනුවෙන්, ග්‍රාමීය සහ නාගරික ප්‍රදේශවල සංවර්ධනය ඉහළ නැංවීම වෙනුවෙන් මෙම කර්මාන්තකරුවන් - ව්‍යවසායකයින් - විශාල වැඩ කොටසක්

[ගරු මංජුල සුරවීර ආරච්චි මහතා]

කරමින් ඉන්නවා. අපි දන්නවා, ඉතිහාසය පුරා ඔවුන්ට බලපෑ ප්‍රශ්න ගොඩක් තිබුණු බව. ඒවා විසඳා ගැනීම සඳහා ඔවුන් විවිධ ආණ්ඩු කෙරෙහි බලාපොරොත්තු තබාගනිමින් ඡන්දය දීලා තිබුණා. නමුත්, ඔවුන්ගේ අරමුණු සාක්ෂාත් කරගන්න බැරි වීම මත ගැටලු ගොඩක් පැන නැඟුණා. එතකොට ජාතික ජන බලවේගයේ ආණ්ඩුව "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" උදා කිරීම වෙනුවෙන් ගනු ලැබූ ප්‍රතිපත්ති මාලාව තුළින් ඔවුන්ට දැවැන්ත ආර්ථික සහන ප්‍රමාණයක් ලබා දෙන්න කටයුතු කළා.

සමස්ත ව්‍යාපාර ක්ෂේත්‍රයෙන් සියයට 80කට ආසන්න ප්‍රමාණයක් ආවරණය වන්නේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ පැත්තෙන්. විශේෂයෙන්ම නුවරඑළිය දිස්ත්‍රික්කය ගත්තොත්, 25,000කට ආසන්න ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ප්‍රමාණයක් ඉන්නවා. ඔවුන්ට බලපෑ ප්‍රශ්න විසඳීම සඳහා ආණ්ඩුව රුපියල් මිලියන 95,000ක් පමණ මේ වනකොට ලබා දීලා තිබෙනවා. පසුගිය කාලයේ ඇති වූ "දිට්වා" සුළි කුණාටුව වාගේ අවස්ථාවලදීත් ව්‍යාපාර බිඳ වැටීම වෙනුවෙන් ණය පහසුකම් සහ සහන විශාල වශයෙන් ලබා දීමට අපි කටයුතු කළා. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වෙනුවෙන් ආණ්ඩුව පැත්තෙන් තව ගොඩක් දේවල් කරන්න තිබෙනවා. ඒ පිළිබඳ අවබෝධයක් අපට තිබෙනවා. මොකද, රටක් ඉහළට ඔසවා තැබීමේ කටයුත්ත ක්ෂණිකව - කෙටි කාලීනව - කරන්න බැහැ. ඒ සඳහා කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් ආණ්ඩුවක් විසින් සම්පූර්ණ කරන්න ඕනෑ. අපට බලපෑ "දිට්වා" ව්‍යසනයේදීත් සියයට තුනේ පොලී පහසුකම් යටතේ අපේ රජය ණය ලබා දීලා තිබෙනවා. ඒ වෙනුවෙන් රුපියල් මිලියන 10,000කට ආසන්න මුදල් ප්‍රමාණයක් අපි වෙන් කළා. මේ වනකොට ව්‍යවසායකයින් 3,966දෙනෙකුට එයින් රුපියල් මිලියන 8,000කට වැඩි මුදල් ප්‍රමාණයක් දීලා තිබෙනවා කියලා අපි දන්නවා. මේ වාගේ වැඩ කොටසක් කරමින් රට ඉදිරියට අරගෙන යද්දි විපක්ෂය විශේෂයෙන් නඟන තර්ක කිහිපයක් තිබෙනවා. ඒ සමහර තර්ක දිහා බැලුවාම අපට හිනායනවා. මොකද, මෙතැන සංවාද සිද්ධ වන්නේ ආර්ථික, දේශපාලන, සංස්කෘතික කාරණා එක්ක නොවෙයි. ඉතාම පසුගාමී තැනක ඉඳන් තමයි විපක්ෂය පැත්තෙන් විවේචන එල්ල කරමින් තිබෙන්නේ. ඔවුන් කරන සමහර විවේචන දිහා බැලුවාම අපට හිනායනවා.

මේ දවස්වල විපක්ෂය ලොකු නැටුමක් නටමින් සිටිනවා. රටට භූනියමක් වෙච්ච ඒකාබද්ධ විපක්ෂයක් අපට ඉන්නවා. අපි දැක්කා, මේ දවස්වල ඔවුන් මැටි අනමින්, කෙසෙල් කොළවල මැටි රූප අඹමින් රටට භූනියම් කරන්න පටන් අරගෙන තිබෙන ආකාරය. ආර්ථික කාරණා, දේශපාලන කාරණා සම්බන්ධයෙන් සමාජය පෙළ ගස්වා ඊළඟට බලය ලබා ගැනීමට සැලසුම් කරන්න ඕනෑ වෙලාවක, මිථ්‍යා ලෝකවල ගිලිලා පසුගාමී සමාජයක ලක්ෂණ පෙන්වමින් ඉතාම පහත් වැඩකටයුතුවල යෙදෙමින් ඉන්න කණ්ඩායමක් බවට අද විපක්ෂය පත් වෙලා තිබෙනවා. එක අතකින් අපි සතුටු වනවා, විපක්ෂය මේ වාගේ විපතකට පත් වෙලා භූනියමක් බවට පත් වෙච්ච එක ගැන. අපි විශ්වාස කරනවා, ජනතාව ඉදිරියේදී -2029 වනකොට- ඔය භූනියම්කරුවන්ට භූනියම් කපලා ඉවර කරන්නත් සූදානම් වෙයි කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ සමහර අය කථා කරන්නේ ඇත්තටම මැරිලා ඉපදිලා වාගේයි. මම මීට පෙරත් මේ ගැන කියලා තිබෙනවා. අවුරුදු 5ට අඩු දරුවන්ගෙන් සියයට 20කට ආසන්න ප්‍රමාණයකට අඩු බර සහිත ජීවිතයක් උරුම කර දෙන්න කටයුතු කරපු විපක්ෂය, අවුරුදු පහට අඩු දරුවන්ගෙන් සියයට 15කට වැඩි දරු පිරිසක් කෘශ වීමේ - මන්දපෝෂණයට ගොදුරු වීමේ - අවදානම දීර්ඝ කාලයක් තිස්සේ ගෙනා මේ විපක්ෂය, ගැබිනි මවුවරුන්ගෙන් සියයට 26ක් රක්තහීනතාවට ගොදුරු කරපු මේ විපක්ෂය දැන් අපට ආර්ථිකය පිළිබඳව උපදෙස් දෙන්න එනවා. ළමයින්ගේ සෞඛ්‍ය ගැන, මන්දපෝෂණය ගැන මහ කයිවාරු ගහමින් මේ විපක්ෂය දැන් අපට උපදෙස් දෙන්න එනවා. මේවා ඇහෙනකොට සමහර වෙලාවට හිනාත් යනවා. නමුත් අපට මේ සභාව ඇතුළේ සතුටක් තිබෙනවා. අපට විනෝද වෙන්න පුළුවන්, විපක්ෂය පැත්තෙන් කියන දේවල් දිහා බලලා. ඔවුන්ටම පාරාවළල්ලක් වෙලා තිබෙන මේ සමහර කාරණා කියන්න වීම පිළිබඳව අපි සතුටු වනවා.

මහ බැංකු බැඳුමිකර චංචාව සිදු වුණාට පස්සේ, footnotes ගහලා ඒක කරපු අය ආරක්ෂා කරන්න ගිය අය අපට ආර්ථිකය හැදීම ගැන පාරම්බානවා, උපදෙස් දෙනවා, මේ විධියට වැඩ කළොත් ආර්ථිකය හදන්න පුළුවන් කියලා. ඒත් එක්කම ආර්ථික ඝාතකයින් ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය නම් කරපු කණ්ඩායම් අපට ආර්ථිකය හදන විධිය, රට හදන විධිය ගැන කියලා දෙන්න එනවා, මේ පැය කිහිපයකට පාර්ලිමේන්තුවට ඇවිල්ලා. සමහර අය එන්නේ හිරේ ඉඳලා. හොරකම් කරලා, ජඩ වැඩ කරලා හිරේ ගිහිල්ලා මෙතැනට ඇවිල්ලා අපට උපදෙස් දෙනවා, රට හදන ආකාරය ගැන, ආර්ථිකය හදන ආකාරය ගැන.

අපි ඉතාම කනගාටු වනවා, කාවන්තිස්ස ඇතා මිය යෑම සම්බන්ධයෙන්. විශේෂයෙන් පරිසර අමාත්‍ය දම්මික පටබැඳි මැතිතුමාගේ පැත්තෙන්, ඒ අමාත්‍යාංශය පැත්තෙන්, ඒ වෛද්‍ය නිලධාරින් විශාල කැපවීමක් කරමින් කාවන්තිස්ස ඇතා ගොඩ දමන්න උත්සාහ කළාට අවාසනාවන්ත ලෙස ඒ ඇතා මිය ගියා. ඒ පිළිබඳව අපට කම්පනයක් තිබෙනවා. නමුත් අලින් ලියාපදිංචි කරන පොත හොරකම් කරලා, ඒ පොත හංගලා, අලි පැටව් සහ අලින් ව්‍යාපාර කටයුතුවලට සහ තමන්ට අවශ්‍ය විධියට හිතුමතේ පාවිච්චි කරපු අය ඇවිල්ලා අලින් ගැන, ඇත්තු ගැන, සොබාදහම ගැන, පරිසරය රකින ආකාරය ගැන අපට කියා දෙන්න හදනවා. අපි දන්නවා, පරිසරය විනාශ කරන්න මහා පරිමාණයෙන් වනාන්තර විනාශ කරපු විධිය, වැලි ගොඩ දමපු විධිය, පස් කඳු කපපු විධිය, පරිසරයට අහිතකර තීන්දු තීරණ ගත්ත විධිය, සංවර්ධනයේ මුවාවෙන් මුළු පරිසරයම ඝාතනය කරපු විධිය. ඉතිහාසය පුරා මේ කටයුතු කරපු අය අපට රට හදන හැටි, පරිසරයේ සමතුලිතතාව ආරක්ෂා කරන ආකාරය ගැන දේශනා කරන්න පටන් අරගෙන තිබෙනවා. ලජ්ජයි, ඒ සමහර කථා අහගෙන ඉන්නත්.

ඊළඟට අධිකරණයට අත තියලා, හිටපු අග්‍ර විනිශ්චයකාරතුමියව ධුරයෙන් පන්නලා කටයුතු කරපු අය ස්වාධීන අධිකරණයක් ගැන අද කථා කරනවා. ඒත් එක්කම නීතිය පැත්තෙන් ආණ්ඩුවට උපදෙස් දෙන්න යනවා, මේ විධියට නෙවෙයි, මේ විධියට කරන්න ඕනෑය කියලා. ඉතින් අපි විශේෂයෙන් විපක්ෂයෙන් අහනවා, අපි මොකක්ද දැන් පිළිගන්න ඕනෑ කියලා. තමන් ආණ්ඩු කරපු කාලයේ අවභාවිත කරලා, අපි පිළිවෙළකට ඒ කටයුතු කරගෙන යනකොට ඒවාට විශාල බොරු ප්‍රචාර හදලා, තමන් කරපු දේවල් වහගන්න අපට චෝදනා එල්ල කරනවා. ඒ වාගේ විපක්ෂයක් එක්ක කටයුතු කරන්න ලැබීම ගැන අපි ඇත්තටම කනගාටු වෙනවා. මොකද, රටක අනාගතය තීන්දු කරද්දි විපක්ෂයකට කාර්යභාරයක් තිබෙන්න ඕනෑ. මොකද, විපක්ෂයක් තමයි ආණ්ඩුවකට ගමන් මඟ තීන්දු කරන්න උදව් කරන්නේ; අඩුපාඩු හදා ගන්න මඟ පෙන්වන්නේ; අඩුපාඩු හදා ගන්න අදාළ දේවල් පෙන්වා දෙන්නේ. ආර්ථික කරුණු, දේශපාලන කරුණු, සමාජයීය කරුණු, ජනතාවගේ ප්‍රශ්න කියන මේවා අපට වඩා මනා ලෙස පෙන්නුම් කරලා දෙන්න විපක්ෂයක් අවශ්‍යයි. හැබැයි, මේ විපක්ෂය මළ විපක්ෂයක්. මේක හොරුන්ගේ ඒකාබද්ධ පෙරමුණක් වාගේ විපක්ෂයක්. මේ

විපක්ෂය රටටවත්, ජනතාවටවත්, ආණ්ඩුවටවත් වැඩක් නැති භූනියමක් බවට පත් වෙලා තිබෙන්නේ. අපි ජනතාවට කියනවා අපේ කාල සීමාව තුළදී මේ රටට පොරොන්දු වෙච්ච දේවල් අනිවාර්යයෙන්ම ඉෂ්ට කරන බව.

මේ වෙනකොට අපි කවුරුත් දන්නවා, ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදී දර්ශකයේ ස්ථාන 7ක් ඉහළට ඔසවා තබමින්, අප මේ වැටුණු රට ජාත්‍යන්තර දර්ශකවලින් ඉහළට ගන්න සමත් වෙමින් තිබෙන බව. ඒත් එක්කම, ගෝලීය සාම දර්ශකයේ ස්ථාන 33ක් ඉදිරියට යන්න අපි සමත් වෙලා තිබෙනවා. ඒ වෙන මොනවත් නිසා නොවෙයි, ජනාධිපතිතුමා ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලය ඇතුළු වත්මන් ආණ්ඩුව විසින් ගනු ලබන ක්‍රියාමාර්ග නිසා ජාත්‍යන්තරයේ පිළිගැනීමට ලක් වෙමින්, මේ රට ඉහළට එසවෙමින් තිබෙන නිසායි. අපි ලෝක දූෂණ සංජානන දර්ශකයේ ස්ථාන 14ක් ඉස්සරහට ගිහිල්ලා තිබෙනවා. විපක්ෂය අපෙන් අහනවා, අවුරුදු දෙකකදී මොනවාද කළේ කියලා. අපි ආර්ථික ස්ථාවරත්වයක් අත්කර ගෙන තිබෙනවා. ජනතාවට සහන දෙමින් තිබෙනවා. අපි විපක්ෂයට කියනවා, ජාතික ජන බලවේගය ආණ්ඩුව ජනතාව වෙනුවෙන් දෙන සහන මොනවාද, මේ රට ඉස්සරහට ගෙනියන්නේ කොහොමද කියලා ඉදිරි අය වැයේදී බලා ගන්න පුළුවන් කියන කාරණය. ඒ දෙස හොඳට බලාගෙන ඉන්න කියලා සියලු දෙනාට ආරාධනා කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.30]

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මම මේ stopwatch එක on කරනවා. ඒ, ඔබතුමිය විශ්වාස නැති හින්දා නොවෙයි, මගේ time එක බලා ගන්න. මට සමහර දේවල් කියන්න තිබෙනවා.

මම දැක්කා, මට පෙර කථා කරපු මන්ත්‍රීතුමා කියනවා, විපක්ෂයේ ඉන්නේ හොරු, හොරු, හොරු කියලා. ඔව්, ඔව්. හොරු, හොරු. අපිත් හොරු. නිකම් එක්කෙනා දෙන්නා ඉන්නේ, නම කියලා කථා කරන්න. කොන්ද පණ නැත්නම් කට වහගෙන ඉන්න. හැමෝටම අත දිග හැරලා හොරු, හොරු කියනවා. එතකොට අර ගල් අඟුරු ටික කෑවේ මමද? කන්ටේනර් 323,- *[බාධා කිරීමක්]* ඔන්න නැඟිටලා ගියා පිටිපස්සෙන්. ඒවා කළේ අපිද? හොරු ඉන්නවා නම් කියන්න, මෙයා තමයි හොරු, මෙයා අපි හිරේ දැම්මා කියලා. මෙයා තමයි හොරු කියලා කියන්න. එහෙම නැතුව නිකම්, විපක්ෂයේ ඉන්න ඔක්කොම හොරු, අපි දැන් තමයි ඉපදිලා තිබෙන්නේ වාගේ කථා කියන්න එපා. අනේ, ඔයාලාගේ සෙල්ලම අපි දන්නේ නැද්ද? ඒ නිසා නිකම් විපක්ෂයට බණින්නේ නැතුව, හරි දේ කියන්න.

මම දැකලා තිබෙන විධියට, විපක්ෂයට විරුද්ධව මිනිස්සු පෙළපාළි අරගෙන ගිය ලෝකයේ පළමුවැනි ආණ්ඩුව තමයි මේක. අපි, අපේ පාඩුවේ සද්ද නැතුව ඉන්නවා. ඔයගොල්ලන් ගිහිල්ලා අපට විරුද්ධව මොකක් හරි නමක් දාලා, මිනිස්සු පෙළපාළි අරගෙන යනවා.

මම දැක්කා, ජනාධිපතිතුමාගේ Facebook පිටුවේ තිබුණු post එක. කරුණාකරලා ඒක අයින් කරන්න කියන්න. ඒ post එක කැතයි. එක්ලක්ෂ හයදහසක් ඒකට react කරලා තිබෙනවා. ඒකෙන් එක්ලක්ෂ තුන්දහසක් හිනා වෙලා තිබෙනවා, ඒ post එකට. බලන්න, එක්ලක්ෂ හයදහසක් react කරලා තිබෙනවා. එහෙම කරලා තිබෙන්නේ අපි කියලා නොවෙයි. ඒවා මිනිස්සුන්ගේ ඔළුවට වැදිලා තිබෙන්නේ. දැන් ඔයගොල්ලන් විදුලි බිල වැඩි කරනවා. ගල් අඟුරු ටික කෑවා. ගල් අඟුරු ටික කාලා ඉවර වෙලා කිව්වා, ඒ බර මිනිස්සුන්ගේ ඔළුවට පටවන්නේ නැහැ කියලා. අපිත් ඒක විශ්වාස කළා.

හැබැයි, ඒකට වඩා මම තව කාරණයක් කියන්න කැමැතියි. මම අද ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයක් ඉදිරිපත් කළා, ආනන්ද විජේපාල ඇමතිතුමාට. තිලීපන්ගේ පිළිම ටික ගිහිල්ලා තියපු පක්ෂයේ අය අත්අඩංගුවට ගන්නේ නැතුව අහිංසක මිනිස්සු 14දෙනෙකුට නඩුවක් දමනවා කියලා තමයි මම ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයක් ඉදිරිපත් කළේ. ඒකට ලේකම් මණ්ඩලයෙන් මට කිව්වා, MPsලාගේ නම ලියන්න බැහැ කියලා. ඒ කියන්නේ, කවුරු හරි හොරකම් කළත් නම ලියන්න බැහැ. ඒකට කිව්වා, Standing Order එක 83 කියලා. ඒකේ තිබෙන්නේ පෞද්ගලික පැවැත්ම සම්බන්ධව කිසිම දෙයක් අහන්න බැහැ කියලා. හැබැයි, ලේකම් මණ්ඩලයෙන් මට කියනවා, MPsලාගේ නම ලියන්න බැහැ කියලා. ඊට පස්සේ Hon. Speaker කිව්වා, "ඔයාට කථා කරන්න බැහැ, වාඩි වෙන්න" කියලා. අපි වාඩි වෙන්නම්. හැබැයි, මිනිස්සු නැඟිටිනවා කවදා හරි. මතක තියා ගන්න, ඔයගොල්ලන් US Dollars 18 million කාලා තිබෙනවා. ඒවා මිනිස්සුන්ගේ ඔළුවට වදිනවා. මේවා අපි කියන දේවල් නොවෙයි, මිනිස්සු කියන දේවල්. ගෙවල්වලට පෞද්ගලිකව ගිහිල්ලා මිනිස්සුන්ගෙන් අහලා බලන්න. එතකොට තේරෙයි.

දැන් අර තිලීපන්ගේ කථාව අහමුකෝ. මම මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා අවුරුදු දෙකක් වනවා. මම හැමදාම කියන්නේ මට ඡන්දය දාපු මිනිස්සුන්ට මගේ වෙනුවට නැති වෙන මිනිස්සු,- ඔයගොල්ලන් රෝහණ විජේවීරට ආතල් එකක් දීලා, දැන් ඔයගොල්ලන්ගෙන් කීදෙනෙක් දන්නවාද දන්නේ නැහැ, රෝහණ විජේවීර ඔයගොල්ලන්ගේ ලොක්කා කියලා. හැබැයි, මට ඡන්දය දාපු මිනිස්සුන්ට මම කවදාවත් එහෙම ජරා වැඩක් කරන්නේ නැහැ.

මම කවදාවත් ඒගොල්ලන්ව මෙතැන පාවා දෙන්නේත් නැහැ. මම ඇවිල්ලා මෙතැන සිංහල මිනිස්සුන්ට සිංහලෙන් කථා කරනකොට, අර මිනිස්සුන්ට සිංහල තේරෙන්නේ නැහැ. ඕනෑ නම් මට මෙතැනට ඇවිල්ලා එක කථාවක් කියන්න පුළුවන්, උතුරට ගිහිල්ලා වෙන කථාවක් කියන්න පුළුවන්. මාධ්‍යයෙන් - mediaවලින් - ප්‍රභාකරන් දෙවියන්ද කියලා අහනකොට මම නැඟිටලා කියනවා, අපේ මිනිස්සු ඒක පිළිගන්නවා, ඒක වෙනස් කරන්න ඕනෑ නම් අපි දෙදෙනා යාළු වෙලා ඉන්න ඕනෑය කියලා. අන්තිමට මම කොටි කථාවක් කිව්වා කියලා ඒකට මාව TID එකට අරගෙන යනවා කිව්වා. තවම අරගෙන ගියේ නම් නැහැ. හැබැයි, ඔබතුමන්ලා ලජ්ජා වෙන්න ඕනෑ, ප්‍රභාකරන්ගේ පිළිරුවක් හදනවා කියලා සින්දු හදා දමලා ඡන්ද ගත්ත එක ගැන. හරි, ඒ ඔක්කෝම අත්හරින්නකෝ. අර තිලීපන්ගේ පිළිමයක් නිබ්බාය කියලා,- නිබ්බා මන්ත්‍රීවරුන්. ශ්‍රීතරන් මන්ත්‍රීතුමා ගිහිල්ලා කථා කරලා තිබෙනවා. ඔහුට කිසිම නඩුවක් නැහැ. ගජේන්ද්‍රකුමාර් මන්ත්‍රීතුමා ගිහින් කථා කරලා තිබෙනවා. ඒගොල්ලන් දෙමළ පක්ෂවල ඉන්න මන්ත්‍රීතුමන්ලා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා]

කිසිම නඩුවක් නැහැ. හැබැයි, නිකම් මල් දමන්න ගියපු 14දෙනෙකුගෙන් දැන් statements අරගෙන තිබෙනවා. ඒ, නිකම්ම නිකම් කට්ටිය. කලින් හිටපු, ex-MP කෙනෙක් තමයි කඡේන්ද්‍රන් කියන්නේ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

ගිහින් කියා තිබෙනවා, තිලීපන්ගේ පිළිරුව අපි තමයි තිබ්බේ, අපේ වීරයා කියලා. නමුත් ඒගොල්ලන්ට නඩු දමන්නේ නැහැ. ඇයි, ඒ? ඒගොල්ලන් ඔයගොල්ලන්ට දෙනවා නේ, හොඳට. නවලා දෙන හින්දා ඔයගොල්ලන් ඒගොල්ලන්ට මොකුත් කරන්නේ නැහැ. මේක ලජ්ජා නැති වැඩක් නේ. අභිංසක මිනිස්සුන්ව,- *[බාධා කිරීමක්]*

මම ඒ ප්‍රශ්න ටික ඉදිරිපත් කළා, ඇයි මේ MPsලාට action ගත්තේ නැත්තේ කියලා. ඔයගොල්ලන් ඒ ප්‍රශ්නවලට උත්තර දෙන්න බැහැ කිව්වා. අන්තිමට අතුරු ප්‍රශ්න අහන්නත් බැහැ කියලා මාව වාඩි කෙරෙව්වා. මේක තමයි මේ රටේ වෙන්නේ. අපිට මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා රටේ මිනිස්සුන්ගේ ප්‍රශ්න ටිකක් කථා කරන්න ඉඩ දෙන්නේ නැත්නම්,- මේකෙන් පහර වදින්නේ කටද? එක්ලක්ෂ තුන්දහස නොවෙයි, එක්ලක්ෂ හයදහසම හිනා වෙනවා, ඔයගොල්ලන්ගේ පිටිපස්සෙන් කියන එක මතක තබා ගන්න.

ඊළඟට, මම කියන්න කැමැතියි, Chavakachcheri Hospital එක ගැන. බලන්න, මේ පින්තූර දිහා. Chavakachcheri Hospital එක තිබෙන හැටි, ඒකේ කක්කුස්සි තිබෙන හැටි බලන්න. ඔයගොල්ලන්ගේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

කෙනෙක්ව, - මම කවදාවත් සෞඛ්‍යයට ගහන කෙනෙක් නොවෙයි. මම doctor කෙනෙක්. නලින්ද අයියා මගේ මාර හිතවතා. ළඟදීත් ඇවිල්ලා රුපියල් මිලියන 300ක් දීලා ගියා, ඒ hospital එකට. හැබැයි, මේ hospital එකේ කක්කුස්සි තිබෙන හැටි බලන්න. ඔයගොල්ලන්ගේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

මුහුණ වාගේ නේද, තිබෙන්නේ මේකේ? මේ බලන්න, මේ bathrooms තිබෙන හැටි. ඔයගොල්ලන් නඩුවකුත් දාලා මට ඒ hospital එක ඇතුළට යන්නත් බැහැ කියලා කිව්වා. බලන්නකෝ, toilets තිබෙන හැටි. මේ වාගේ තමයි උතුරේ hospitalsවල toilets තිබෙන්නේ. දැන් ඔයගොල්ලන්ගේ ආණ්ඩුවට හිනා වෙන මිනිස්සු මේවාටත් හිනා වෙනවා ඇති. හැබැයි, ඔයගොල්ලන් සමහර හොඳ වැඩත් කරලා තිබෙනවා. හොඳ වැඩවලට මම නරකයි කියලා කියන්නේ නැහැ.

අනෝජන්ගේ ජීවිතය බේරා ගත්තා. ඒ ගැන මම අනුර කුමාර ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. වෙනත් ජනාධිපතිවරු කවුරුවත් එහෙම වැඩ කළේ නැහැ. හැබැයි, උතුරේ පවතින තත්ත්වය බලන්නකෝ. ඔයගොල්ලන් කිව්වා, උතුරේ KKS Harbour එක හදනවා කියලා. පලාලි ගුවන් තොටුපොළ හදනවා කිව්වා. දැන් කෝ ඒවා? අපි කියන්නේ නැහැ නේ, ප්‍රභාකරන්ට පිළිමයක් තියන්න කියලා. තමුන්නාන්සේලා මේවා ගැන ලජ්ජා වෙන්න ඕනෑ. අපි මේවා කිව්වා කියලා අපිත් එක්ක තරහ වෙන්න එපා. ඕනෑ නම් වාමර සම්පත් දසනායක අරගෙන හිරේ දමන්න. ඔහුගේ ලේකම්වරයා ඔහු හොරකම් කළා කියලා කියා තිබෙනවා නම්, ඔයගොල්ලන්ට ඒක ඔප්පු කරන්න පුළුවන් නම්, arrest කරලා හිරේ දමන්න. ඒ පිළිබඳව අපට ප්‍රශ්නයක් නැහැ. ඒ වාගේම, නාමල් රාජපක්ෂට එරෙහිව සාක්ෂි තිබෙනවා නම් ඔහුවත් අරගෙන හිරේ දමන්න. ඔහුගේ අම්මාට එරෙහිව සාක්ෂි තිබෙනවා නම් ඇයවත් හිරේ දමන්න. ඒ ගැන කිසි ප්‍රශ්නයක් නැහැ. ගෝඨාභයවත් අත්අඩංගුවට ගන්න. එතකොට උතුරේ මිනිස්සු ඔයගොල්ලන්ට තවත් ඡන්දය දෙයි. ඒක ප්‍රශ්නයක් නොවෙයි. හැබැයි, ඔයගොල්ලන් මේ කටයුතු කරන්නේ දේශපාලනය වෙනුවෙන් විතරයි. මේ hospital එකම රුපියල් මිලියන 17ක් ඩයස්පෝරාවෙන් සල්ලි එකතු කර ගත්තාය කියලා මම audit report එකකුත් ඉදිරිපත් කරමින් මේ පාර්ලිමේන්තුවේදී කියලා මේ වනකොට අවුරුදු දෙකක් වෙනවා. නමුත් ඔයගොල්ලන් ඒ audit report එක ගැන හොයා බැලුවේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
බොහොම ස්තුතියි.

ඒ audit report එක ගැන ඔයගොල්ලන් හොයා බැලුවේ නැහැ. බලන්න, දැන් මේ hospital එක තිබෙන හැටි. දකුණේ මේ වාගේ hospitals හොයා ගන්න පුළුවන්ද? මේ තිබෙන්නේ ඒ hospital එකේ කක්කුස්සි. මේ විධියට තමයි මම පාර්ලිමේන්තුව දකින්නේ. මේ විධියට තමයි තමුන්නාන්සේලාගේ මුහුණුත් මම දකින්නේ. මේ තමයි, ඒ hospital එකේ medical ward එක තිබෙන විධිය. මේවා දැකලා ඔබතුමන්ලා ලජ්ජා වෙන්න ඕනෑ.

ඔයගොල්ලන්ගේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම්වලට - DCC meetingවලට - සහභාගි වෙනකොට අපට ගහලා පන්නනවා. ඔයගොල්ලන්ගේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

ඇවිල්ලා, මම හොරු අල්ලා දුන්නා කියලා ඒ report එක අරගෙන වීසි කරලා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු.]
[Expunged on the order of the Chair.]

අන්තිමට පසුගිය වතාවේ DCC meeting එක යන අතරතුර නැඟිටලා "ටක් ගාලා" මාරු වුණා. ඒ, ඇයි? ඔහු එතැන හිටියා නම් අපි ඒ ප්‍රශ්නය අදිනවා නේ. මේවාට ඔයගොල්ලන් ලජ්ජා වෙන්න ඕනෑ නේ.

ඇත්තටම මම ඔයගොල්ලන්ට විරුද්ධ නැහැ. හැබැයි, ඔයගොල්ලන්ට වැඩ බැරි එකට මම විරුද්ධයි. ඔයගොල්ලන්ගේ ඇමතිතුමාට වැඩ බැරි නම් වැඩ පුළුවන් ඔයගොල්ලන්ගේම තව

MP කෙනෙක් දමන්න. කිසි ප්‍රශ්නයක් නැහැ. නැත්නම් සිංහල මන්ත්‍රීවරයෙක් පත් කරන්න. අපට ජාතිවාදයක් නැහැ. අපි ජාතිවාදී නැහැ. අපි කවදාවත් ජාතිවාදීව කථා කරන්නේ නැහැ. වෙන කවුරු හරි සිංහල MP කෙනෙක් හරි ඇවිල්ලා උතුරේ තත්ත්වය හොයා බලන්න. මේ බලන්න, උතුරේ තත්ත්වය.

රාමලිංගම් චන්ද්‍රසේකර්ට මේක කරන්න බැහැ කියලා අපි කොච්චර වතාවක් කිව්වාද? මේ බලන්න, hospital එක තිබෙන හැටි. රුපියල් මිලියන 300ක් දුන්නා, මිලියන 400ක් දුන්නා කියලා හෙලිකොප්ටරයෙන් යනවා. එක හෙලිකොප්ටරයකින් බැහැලා තවත් හෙලිකොප්ටරයකින් යන්නේ මොකටද? ගිහිල්ලා පනින්නද? මේවා සම්බන්ධයෙන් මෙතැන අහලා වැඩක් නැහැ, ජනාධිපතිතුමනි. ඔබතුමා මුලතිව් ප්‍රදේශයේ ව්‍යාපෘතියක් සඳහා රුපියල් මිලියන 400ක ණයක් අරගෙන, එයින් රුපියල් මිලියන 15ක් වියදම් කරලා මුල්ගල තැබුවා, හෙලිකොප්ටරයකින් ගිහිල්ලා. මේවා ගැන ඔයගොල්ලන් ලජ්ජා වෙන්න ඕනෑ. ඔයගොල්ලන් උතුරේ මුල්ගල් තියපු ඒවායෙන් එකක්වත් කරලා තිබෙනවාද?

උතුරට international stadium එකක් හදලා දෙනවා කිව්වා. කෝ, අනේ ඒ international stadium එක? ඔයගොල්ලන්ගේ ඉස්සරහ පේළියේ ඉන්න සමහර ඇමතිවරුන්ගේ ඔළුවේ තිබෙනවා, international stadium එක ගැන. හැබැයි, වෙන කොහේවත් නැහැ. කොණ්ඩය නැති හින්දායි එහෙම තිබෙන්නේ. අන්තිමට ඔයගොල්ලන් කළේ මොකක්ද? කොණ්ඩය වවන අයට නඩු දානවා කිව්වා. කොණ්ඩය නැති සමහර ඇමතිවරුන්ගේ යෝජනාවක් ඒක. කරුණාකර මේ ගැන පොඩ්ඩක් කල්පනා කරන්න.

මම තව එකක් කියන්නම්. ඔයගොල්ලන්ගේ අර

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

China ගිය flight එකට ප්‍රමාද වෙලා ආපු නිසා දාලා ගියා නේද?

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මට තව තත්පර 20ක කාලයක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

China flight එක

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]
[Expunged on the order of the Chair.]

දාලා ගියා නේද? ලජ්ජා නැද්ද? අඩුම තරමින් flight එකට යනකොටවත් හරියට වේලාවට යන්න කියන්නකෝ.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නිලංක යූ. ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.38]

ගරු නිලංක යූ. ගමගේ මහතා
(மாண்புமிகு திலங்க யூ. கமகே)
(The Hon. Thilanka U. Gamage)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දවසේ රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ ගෙනෙන යෝජනාව සහ පරිපූරක මුදල අනුමත කිරීම සම්බන්ධයෙන් පැවැත්වෙන මෙම විවාදයේදී මූලික වශයෙන් කරුණු කිහිපයක් ඉදිරිපත් කිරීමට මා බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් නහාසිටුවීම වෙනුවෙන් විශේෂ ණය යෝජනා ක්‍රමයක් සම්මත කර ගැනීමේ අරමුණින් තමයි අද දවසේ විවාදය අපි යොදාගෙන තිබෙන්නේ. අපි මුලින්ම පැහැදිලි කරගත යුතු කරුණක් තිබෙනවා. විශේෂයෙන්ම, රටක ආර්ථිකය තුළ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්වය කියන එක ඉතාම වැදගත් වෙනවා. ඒ මොකද? අපි දන්නවා, බොහෝ වෙලාවට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්වය තුළින් රටක දළ දේශීය නිෂ්පාදිතයට විශාල දායකත්වයක් සපයන බව. අනෙක් පැත්තෙන්, රටේ සේවා නියුක්තියත් මෙම කර්මාන්ත ව්‍යවසායකත්වයත් එක්ක බැඳිලා තිබෙනවා. එම නිසා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ආරක්ෂා කර ගැනීමත්, ඔවුන්ට අවශ්‍ය ණය පහසුකම් ලබා දීමත්, නව ආයෝජන සඳහා ඔවුන් කැඳවා ව්‍යාපාර දියුණු කිරීමත් තුළින් රටේ දළ දේශීය නිෂ්පාදනයට ඔවුන්ගේ දායකත්වය ලබා ගන්නත්, සේවා නියුක්තිය වර්ධනය කර ගැනීමට ඔවුන් දායක කර ගන්නත් අපි බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම, මෙම ව්‍යවසායකයින් නහාසිටුවීමත් එක්ක, අපේ රටේ දළ දේශීය නිෂ්පාදිතය ඉහළට ඔසවා තබා, ආර්ථික වර්ධනය ඉහළට එසවීම තුළ නැවත මේ රටේ ජනතාවට තමයි එහි ප්‍රතිලාභ ගලාගෙන යන්නේ. රටේ දළ දේශීය නිෂ්පාදිතය ඉහළ නැංවීම තුළින් එක පැත්තකින් අධ්‍යාපනයට මුදල් වෙන් කරන්න පුළුවන් වනවා. ඒ වාගේම සෞඛ්‍යයට, ප්‍රවාහන පද්ධතිය ඇතුළු හැම දේකටම මුදල් වෙන් කරගන්න හැකි වෙන්නේ මේ රට දියුණු වීම ඇතුළේ. ඒකට තිබෙන හොඳම අවස්ථාවක් තමයි මේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් නහා සිටුවීම.

මෙහිදී විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. එය මේ පාර්ලිමේන්තුවේ අද දවසේ වාගේම හැමදාමත් වන දෙයක්. මෙතෙක් පැවති ආණ්ඩු මේ රට සුඛිත-මුදිත කරලා අපට රට බාර දුන්නා වාගේ තමයි සමහරු කථා කරන්නේ. ඇත්තටම ගත්තොත්, මේ රටේ ජනතාව පාලන බලය අපට දුන්නේ, ඒ බලයේ හිටපු අයට අපේ රට තවදුරටත් අහලක්වත් ඉස්සරහට අරගෙන යන්න බැරි නිසායි. ඒ නිසාම තමයි මේ රටේ ජනතාව ජාතික ජන බලවේගයට මේ රටේ ආණ්ඩුව භාර දුන්නේ. 2024 වන විට මේ රටේ තරුණයාට අනාගතයක් නොමැති තත්ත්වයකට පත් වෙලා තිබුණා. රටේ කර්මාන්ත වැහිලා තිබුණා. ආයෝජකයන් මේ රට දිහා හැරිලාවත් බලන්නේ නැති තත්ත්වයට පත් වෙලා තිබුණා. තිබෙන ආයෝජනත් රටින් බැහැර කරගෙන යන තත්ත්වයට පත් වෙලා තිබුණා. සේවා වියුක්තිය වැඩි වෙලා තිබුණා. අපේ රටේ බොහෝ අය රට හැර දාලා යන තත්ත්වයට පත් වෙලා තිබුණා. මහා ණය

[ගරු තිලංක යූ. ගමගේ මහතා]

කන්දක් ගොඩ ගැහිලා, අනාගතයට ණය බරක් එකතු වෙලා තිබුණා. අය වැය මත විශාල පීඩනයක් එල්ල වෙලා තිබුණා. එවැනි රටක් තමයි අපි බාර ගත්තේ. ඒ රට බාර අරගෙන අපි ක්‍රම ක්‍රමයෙන් මේ රට ගොඩනහන, ජනතාවාදී අය වැයක් සම්මත කරලා, ඒ හරහා වැඩකටයුතු කරගෙන යනවා.

අපේ ආණ්ඩුව විශේෂයෙන් ග්‍රාමීය දුප්පත්භාවය තුරන් කරන්න විශේෂ වැඩ පිළිවෙළක් හැදුවා. ඒක ඇතුළේ, ගම් තුළ කුඩා කුඩා කර්මාන්ත දියුණු කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ අපි සකස් කර තිබෙනවා. විශේෂයෙන්ම "ප්‍රජා ශක්ති" වැඩ පිළිවෙළ යටතේ ග්‍රාම නිලධාරී වසම් 14,008ක් ආවරණය වන පරිදි, අපි හැම ග්‍රාම නිලධාරී වසමකටම ගමට නායකත්වය දෙන නිලධාරී මණ්ඩලයක් සහිත කණ්ඩායමක් හදලා තිබෙනවා. ඒ කණ්ඩායම විසින් ගමේ තිබෙන හොඳ විභවයන් මොනවාද කියලා තෝරා බේරාගෙන, ඒ ගමට කුඩා කර්මාන්ත තුළින් මොනවාද කරන්න ඕනෑ කියලා බලමින් ව්‍යාපෘති හදලා තිබෙනවා. ඒ ව්‍යාපෘති සඳහා අපි රුපියල් මිලියන 24,000කට වඩා වැඩි මුදල් ප්‍රමාණයක් වෙන් කරලා, මේ වන විට සියලුම ව්‍යාපෘතිවල වැඩකටයුතු ගොඩක් දුරට අවසන් වෙලා තිබෙනවා; සමහර ව්‍යාපෘති අවසන් වෙමින් තිබෙනවා. ගාල්ල දිස්ත්‍රික්කය ගැන කිව්වොත්, ගාල්ල දිස්ත්‍රික්කයට රුපියල් මිලියන 1,335ක් වැනි විශාල මුදල් ප්‍රමාණයක් ලැබිලා තිබෙනවා. ඒ මුදල් ප්‍රමාණයත් එක්ක විශේෂයෙන්ම ග්‍රාම නිලධාරී වසම් 898ක වාගේ ප්‍රමාණයක ව්‍යාපෘති 938ක් වැනි විශාල ප්‍රමාණයක් වෙනුවෙන් මුදල් වෙන් වෙලා, මේ වන විට විශාල කොටසක වැඩ අවසන් වෙලා තිබෙනවා. ඒ වාගේම, තවවුරටත් වැඩකටයුතු අවසන් වෙමින් තිබෙනවා. අපි එවැනි ආකාරයට හැම ගමකම ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. විශේෂයෙන්ම සුළු පරිමාණ කර්මාන්ත වැනි දේවල් හරහාත් මේ ව්‍යාපෘති හරහාත් ග්‍රාමීය දුප්පත්භාවය තුරන් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

මේ රට අපි භාර ගන්නකොට දුප්පත්භාවය සියයට 25යි. ඒ කියන්නේ, අපේ රටේ සෑම මිනිස්සු හතරදෙනෙකුගෙන් එක්කෙනෙක් දුප්පත්භාවයට පත් වෙලා තිබුණා. අපි බලයට ආපු ගමන් රටේ දැවැන්ත ආර්ථිකයක් ගොඩනඟලා, ක්ෂණිකව දුප්පත්භාවය තුරන් කරන්න බැහැ. ඒක දීර්ඝකාලීන වැඩ පිළිවෙළක්. අපි ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරමින් යනවා. අපි බලයට පත් වෙලා දැනට අවුරුදු දෙකක් ගත වෙලා තිබෙනවා. සියයට 25ක් ලෙස තිබුණු දුප්පත්භාවය ඒ අවුරුදු දෙක ඇතුළත සියයට 23.9 දක්වා අඩු කරන්න අපි සමත් වෙලා තිබෙනවා. ඒ වාගේම, "ප්‍රජා ශක්ති" වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා අපි බලාපොරොත්තු වෙන්නේ, තව අවුරුදු තුන හතරක් යනකොට මේ දුප්පත්භාවයේ රේඛාවෙන් පහළ සිටින ජනතාව එම දරිද්‍රතාවෙන් මුදා ගන්නයි. එවැනි වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කරමින් යනවා.

පසුගිය කාලය තුළ වාහන ගෙන්වීම නතර වෙලා තිබුණේ. ඒ වාගේම භාණ්ඩ වර්ග 400කට ආසන්න ප්‍රමාණයක් මේ රටට ගෙන්වීම සම්පූර්ණයෙන්ම තහනම් කරලා තිබුණේ. අපි ක්‍රම ක්‍රමයෙන් රටේ ජනතාවට අත්‍යවශ්‍ය භාණ්ඩ නැවත ගෙන්වන්න පුළුවන් විධියට ආර්ථිකය විවෘත කර ගත්තා. ඒ වාගේම මේ රටේ ජනතාවට අවශ්‍ය කරන වාහන, අවශ්‍ය කරන උපකරණ නැවත ගෙන්වන්න පුළුවන් ආර්ථිකයක් අපි හැදුවා. අපේ රටේ විදේශ සංචිත ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 6.8ක සිට බිලියන 6.9 දක්වා අපි වැඩි කරගෙන තිබෙනවා. ඒ ආකාරයට අපේ රටේ විදේශ සංචිත ප්‍රමාණය වැඩි කර ගන්නේ, ඩොලර් බිලියන 2.5කට වඩා වැඩි ප්‍රමාණයක් වාහන ඇතුළු උපකරණ ගෙන්වන්න මේ රටින් බැහැර කරමින් තිබියදීයි. එහෙම නොවුණා නම් අපට පුළුවන්කම ලැබෙනවා, මේ වන විට ඩොලර් බිලියන 9ක විතර විදේශ සංචිත ප්‍රමාණයක් අත්පත් කර ගන්න. අපි එහෙම තත්ත්වයක් තුළ තමයි මේ ආර්ථිකය අරගෙන යන්නේ.

අපි මේ රට භාර ගන්න කලින් සමහර අය කිව්වා, අපට අත්දැකීම් නැහැයි කියලා. තේ කඩයක්වත් කරලා නැහැ, පෙට්ටි කඩයක්වත් කරලා නැහැ, විදේශ සම්බන්ධතා නැහැ, මොකක්වත් නැහැ කියලා කිව්වා. ඒගොල්ලන් තමයි යහළුවෝ. ලෝකයේ රටවල් එක්ක සම්බන්ධතා තිබෙන්නේ ඒ අයට, ආර්ථික හැකියාව තිබෙන අය, ආර්ථික ඔස්තාර්ලා, ඔක්කෝම ඉන්නේ ඒගොල්ලන්ගේ අයත් එක්ක" යනාදී වශයෙන් තව ගොඩක් දේවල් කිව්වා. හැබැයි, අපි ඇවිල්ලා ඉතාම කෙටි කාලයක් තුළ විශාල ප්‍රගතියක් පෙන්නුම් කර තිබෙනවා. 2024 වෙනකොට අපේ රටේ සමස්ත දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම ඇමෙරිකානු ඩොලර් බිලියන 99.6යි. 2025 වර්ෂය අවසන් වනකොට අපි එය ඩොලර් බිලියන 108.8ක් දක්වා වැඩි කර තිබෙනවා. එය ඩොලර් බිලියන 9.2ක වර්ධනයක්. පොඩි ගණනකින් නොවෙයි වැඩි වී තිබෙන්නේ. සමස්ත දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම ඩොලර් බිලියන 9.2කින් වැඩිවෙලා තිබෙනවා. මෑත කාලයේදී එවැනි වැඩිවීමක් අපේ රටේ සිදු වුණේ නැහැ. අපි ඒක ඉතා කෙටි කාලයක් තුළ ලබා ගත් දෙයක්. ඉතිහාසයේ අවුරුදු ගණනක් කරගන්න බැරිවෙච්ච දේවල් අපි අවුරුද්දක්, දෙකක් ඇතුළත මේ රටේ සිදුකර තිබෙනවා. ඒ වාගේම 2015දී දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම ඩොලර් බිලියන 79ක වාගේ ප්‍රමාණයකයි තිබුණේ. එය, 2019දී ඩොලර් බිලියන 83යි. දැන් ඔය කථා කරන අය හිටපු යහපාලන ආණ්ඩුව කාලයේ දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම ඇමෙරිකානු ඩොලර් බිලියන 4.4කින් තමයි වැඩි වුණේ. නමුත් අපි ඩොලර් බිලියන 9.2ක වැඩිවීමක් අරගෙන තිබෙනවා.

ඒ වාගේම තමයි විරැකියාව. අපි එනකොට තරුණයින්ට රැකියා තිබුණේ නැහැ; රැකියා දෙන්නේ නැහැ. රජය සම්පූර්ණයෙන්ම රැකියා දෙන එක නතර කරලා තිබුණේ. නමුත් අපි මේ වෙනකොට රැකියා විශාල ප්‍රමාණයක් ලබා දීලා තිබෙනවා. 2024දී විරැකියාව සියයට 4.5යි. නමුත් දැන් මහ බැංකුව - මහ බැංකුව කියන්නේ ස්වාධීන ආයතනයක් - කියනවා, විරැකියාවේ අනුපාතය සියයට 3.9 දක්වා අඩුවෙලා තිබෙනවා කියලා. ඒ විධියට බැලුවාම, අපි ආර්ථිකය හදලා තිබෙනවා. අපි දන්නවා, තවත් ප්‍රශ්න තිබෙනවා කියලා. අපි වතු කම්කරුවා අමතක කළේ නැහැ. අපි වතු කම්කරුවාගේ වැටුප වැඩි කළා. රාජ්‍ය සේවකයාගේ වැටුප වැඩි කළා. අපි මේ රටේ වැඩ කරන ජනතාවගේ වැටුප වැඩි කරමින්, දරිද්‍රතාවෙන් - දුප්පත්කමින් - පෙළෙන ජනතාව ආරක්ෂා කර ගනිමින්, ඔවුන්ට ලබා දිය යුතු සහන ලබා දෙමින්, හැම කෙනෙක් ගැනම සිතමින් තමයි මේ ආර්ථිකය ගෙනියන්නේ. ඒක, නිකම් ආර්ථිකයක් නොවෙයි, බිඳ වැටිච්ච ආර්ථිකයක්. ඒ බිඳ වැටුණු ආර්ථිකය නැවත ගොඩ නහමින් කටයුතු කරගෙන යනවා. අපි දැන් ණය ගෙවනවා. ලබන අවුරුද්දේදී සම්පූර්ණ ණය වාරික ගෙවන්න පුළුවන් තත්ත්වයකට අපේ ආර්ථිකය අපි මේ වෙනකොට හදාගෙන තිබෙනවා. එහෙම සූදානමක් ඇතිව තමයි අපි මේ ආර්ථිකය ගොඩ නහලා තිබෙන්නේ.

අපි ලබන 12වැනි දා ගේනවා, අපේ තුන්වැනි ජනතාවාදී අය වැය. ඒ අය වැයත් එක්ක අපි බලාපොරොත්තු වුණු තැනට මේ රට අරගෙන යන්න; අපි බලාපොරොත්තු වන පොහොසත් රට, ලස්සන ජීවිතය මේ රටේ ජනතාවට නිර්මාණය කරන්න අපි කටයුතු කරනවා. අපි එවැනි රටක් හදනවා. ඒ පොහොසත් රට ලෝකයේ සුන්දරම මිනිසුන් සහිත රට බවට පත් කරන්න අපි කටයුතු කරනවා.

අපි එක පැත්තකින් පාතාලය මේ රටින් සම්පූර්ණයෙන්ම අයින් කරමින් යනවා. අපි හදන්නේ පාතාලයෙන් තොර රටක්. පාතාලයත් එක්ක ලස්සන ජීවිතයක් ගත කරන්න බැහැ. කුඩුත් එක්ක ලස්සන ජීවිතයක් ගත කරන්න බැහැ. ඒවා සම්පූර්ණයෙන්ම නැති රටක් බවට අපි මේ රට පත් කරනවා. මේ හැම පැත්තක් ගැනම හිතලා තමයි අපි වැඩ කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

ගරු තිලංක යූ. ගමගේ මහතා
(மாண்புமிகு திலங்க யூ. கமகே)
(The Hon. Thilanka U. Gamage)
අපේ රට කුඩා රටක්, දුප්පත් රටක්. අපිට බැරිවෙයි, ලෝකයේ දැවැන්තම රාජ්‍යයන් අතරට එකතු වෙන්න. ඒ වාගේම අපට බැරිවෙයි, ලෝකයේ තිබෙන ධනවත්ම රට බවට අපේ රට පත් කරන්න. හැබැයි, අපට පුළුවන්, ලෝකයේ සුන්දරම සහ සතුටින් ජීවත් වෙන මිනිස්සු සහිත රට බවට අපේ රට පත් කරන්න. අන්න ඒක අපි කරනවා. ඒ වෙනුවෙන් අපි වැඩ පිළිවෙළ හදනවා. ඒ වෙනුවෙන් කර්මාන්ත ගොඩ නහනවා. ඒ වෙනුවෙන් කර්මාන්තකරුවාට අවශ්‍ය ණය පහසුකම් ලබා දෙන වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කරනවා කියන පණිවුඩය ලබා දෙමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මරික්කාර් මොහමඩ් තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.49]

ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)
බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද ආසියානු සංවර්ධන බැංකුවෙන් විශාල මුදලක් ණයට ගන්න යෝජනා කරලා තිබෙනවා. ඒක අරගෙන ආර්ථිකය දියුණු කරනවා කියලා ගරු මන්ත්‍රීවරු ප්‍රකාශ කළා. කුඩා කර්මාන්ත ඇතුළු අනෙකුත් කර්මාන්ත ක්ෂේත්‍රවල ව්‍යවසායකයින් විශාල පීඩනයක සිටින අවස්ථාවක මේ වාගේ වැඩසටහනක් ආරම්භ කරලා අපේ රටේ ආර්ථිකය දියුණු කරන එක සම්බන්ධයෙන් අනිවාර්යයෙන්ම ස්තුතිය පළ කරන්න ඕනෑ. ඒක එහෙම වෙන්න ඕනෑ. අපි ඒකට අවංකවම සහාය ලබා දෙනවා.

ඒ වාගේම මම විශේෂයෙන්ම මේ කාරණය ගැනත් කියන්න ඕනෑ. සමහර ප්‍රශ්නවලදී පාර්ලිමේන්තුවේ අපි සියලු දෙනාම එකට එකතු වෙනවා. අනෝජන් සහෝදරයා සම්බන්ධයෙන් ප්‍රශ්නයක් මතු වෙන කොට අපේ සමස්ත ලංකා මහජන කොංග්‍රසයේ නායක ගරු රිසාඩ් බදියුදීන් හිටපු ඇමතිතුමා පළමුවෙන් ඔහුගේ නිවසට ගිහිල්ලා, ඔහුගේ අම්මා, තාත්තා, පවුලේ අය එක්ක කථා කළා. ඒ සංවේදී අවස්ථාවේ මුලින්ම එහි ගියේ අපේ නායක ගරු රිසාඩ් බදියුදීන් හිටපු ඇමතිතුමා. ඊට පසුව Parliament එක ඇතුළේ දෙමළ කථා කරන මන්ත්‍රීවරුන් වන අපි සියලු දෙනා ඔහුව බේරා ගැනීම සම්බන්ධයෙන් විශාල වශයෙන් කටයුතු කළා. අප ඒ සම්බන්ධයෙන් කටයුතු කරන අවස්ථාවේදී අපේ ගරු විපක්ෂ නායකතුමාත් එයට මැදිහත් වුණා, 'අපි සියලු දෙනාම එකා වාගේ මේ කටයුත්ත කරමු' කියලා. ඒ වාගේම, ගරු ජනාධිපතිතුමාත් එයට මැදිහත් වුණා. දැන් ඒ තරුණයාගේ දඬුවම ලිහිල් කරලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් කටයුතු කරපු සියලු දෙනාට පක්ෂ භේද, ජාති භේදවලින් තොරව මම අවංකවම ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම අපි, ගරු ඥානසාර ස්වාමීන් වහන්සේගේ ප්‍රශ්නය ගැනත් කියන්න ඕනෑ. හැම ආගමකටම අයිති සංස්කෘතියක් තිබෙනවා. අපි ඒ සංස්කෘතියට ගරු කරන්න ඕනෑ. මා හිතන්නේ ඒ අවස්ථාවේදී ඒකටත් ජනාධිපතිතුමා මැදිහත් වෙලා දවස් දෙකකින් උන්වහන්සේගේ ඒ සංකේත සිවුර අඳින්න අවස්ථාව ලබා දුන්නා. අපි ඒක අගය කරනවා. ඒකට අපට පාට, පක්ෂ, ජාති වැඩක් නැහැ. ශ්‍රී ලාංකිකයන් හැටියට අපි සියලුදෙනාම අනිවාර්යයෙන් සමඟියෙන් කටයුතු කරන්න ඕනෑ.

මම තවත් උදාහරණයක් කියන්නම්. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, Nagoda Hospital එකේ එක් සෞඛ්‍ය සේවිකාවක් වැඩ කරනවා. එතුමිය 2015 ඉඳලා වැඩ කරන්නේ. එතුමිය තමන්ගේ uniform එක ඇඳගෙන වැඩට යනවා. නමුත් මේ කෙටි කාලයක් තුළ Nagoda Hospital එකේ ඒ uniform එක සම්බන්ධයෙන් ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. එය තවම විසඳිලා නැහැ. ඒකත් විසඳෙන්න ඕනෑ. ගරු ජනාධිපතිතුමා ඒකටත් මැදිහත් වෙලා ඒ ප්‍රශ්නයත් දවස් දෙකකින් විසඳනවා නම් හොඳයි. ඒ බලතල ජනාධිපතිතුමාට තිබෙනවා. ගරු ජනාධිපතිතුමා ඒවාට මැදිහත් වෙන්න ඕනෑ. ඒ වාගේම, Kalmunai Hospital එකේ ප්‍රශ්නය සම්බන්ධයෙනුත් තවම ස්ථිර තීන්දුවක් නැහැ; ඒ uniform එක සම්බන්ධයෙන් තීන්දු වෙලා නැහැ. අප කියන්නේ, ඒක Parliament එකට ගේන්න ඕනෑ නැහැ, චක්‍රලේඛ වෙනස් කරලා ඒක කරන්න පුළුවන් කියලායි. සියලු ජනතාව සමඟියෙන් ඉන්න ඕනෑ කියන මතයේ අපි ඉන්නවා. එතැනදී අපට පක්ෂ, පාට වැඩක් නැහැ. ඒක සංහිඳියාව පිළිබඳ ප්‍රශ්නයක්. සමහර අය කියනවා, "මේක රෙදි කෑල්ලක්" කියලා. හැමෝටම තම තමන්ගේ ඒ රෙදි කෑල්ල වටිනවා. තමන්ගේ ආගමේ හැටියට එය තමන්ට වටිනවා. අපේ පැත්තෙන් බලලා ඒ ගැන අනිවාර්යයෙන්ම කටයුතු කරන්න. දැනට මාස දෙකතුනක් ගිහිල්ලාත් ඒකට ස්ථිර වශයෙන් විසඳුමක් ලැබිලා නැහැ.

මම මේ අවස්ථාවේ ගරු සෞඛ්‍ය ඇමතිතුමාට විශේෂ ස්තුතියක් පුද කරන්න ඕනෑ. අපේ Puttalam Hospital එකේ ප්‍රශ්නයක් මතු වුණා. ඒ සම්බන්ධයෙන් කථා කරන්න රෝහල් Committee එක රැස් වුණා. ඒ රෝහලේ හොඳ දක්ෂ නිලධාරියෙක් ඉන්නවා. එතුමා මාරු කරලා තිබුණා. එතුමා මාරු කරපු වෙලේ රෝහල් Committee එක දුරකථනයෙන් මා සමඟ සම්බන්ධ වුණා. ඒ අවස්ථාවේ මට කිව්වා, ඒ රෝහල දියුණු කිරීම වෙනුවෙන් හොඳට වැඩ කරන MS කෙනෙක් ඉන්නවා, එතුමාව මාරු කරලා, හෙට අත්සන් කරනවා කියලා. ඒ වෙලාවේ මම අපේ නායක ගරු රිසාඩ් බදියුදීන් හිටපු ඇමතිතුමාට කථා කළා. කථා කළාම එතුමා එවෙලේම අපේ සෞඛ්‍ය ඇමති ගරු නලින්ද ජයතිස්ස මැතිතුමාට කථා කරලා ඒ ප්‍රශ්නය ක්ෂණිකව විසඳලා දුන්නා. මම ඒ සම්බන්ධයෙන් මගේ ස්තුතිය ගරු ඇමතිතුමාට පුද කරනවා. Puttalam Hospital එක කියන්නේ සියලු ජනතාවට සේවය ලබා දෙන hospital එකක්. ඒ රෝහලේ එතුමා හොඳට වැඩ කරගෙන එනකොට එතුමාට බාධාවක් ඇවිල්ලා වෙනත් තැනකට මාරු කරන්න යන අවස්ථාවේදී ගරු සෞඛ්‍ය ඇමතිතුමා ඒ ප්‍රශ්නය විසඳීමේ කටයුත්ත කළා.

ඒ වාගේම මම විශේෂයෙන්ම මේ කාරණයත් කියන්න ඕනෑ. ප්‍රශ්නයක් එනකොට ඒ ප්‍රශ්නය විසඳන්න ඕනෑ. මෙතැනදී පක්ෂ ද, පාට ද, ජාති ද, කුල ද බලන්න ගියොත් රටත් පස්සට යනවා, අපේ

[ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා]

ජනතාවත් ඒ ප්‍රශ්නවලට මුහුණ දෙනවා. ඒ නිසා මම ඔබතුමන්ලාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා මෙවැනි අවස්ථාවලදී මැදිහත් වෙන්න කියලා. අපි 225දෙනාම මේ පාර්ලිමේන්තුවේ කථා කරන්නේ මොනවාද? "අපි එකට ඉන්න ඕනෑ. රට ගොඩගන්න ඕනෑ. දියුණු වෙන්න ඕනෑ. සමඟියෙන් ඉන්න ඕනෑ. ප්‍රශ්නවලට මුහුණ දෙන්න ඕනෑ" කියලා නේ. එහෙම නම්, යම් යම් කාලවලදී ඒ ඒ අවස්ථාව අනුව අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මම කියපු ප්‍රශ්න 4ම ගැන ඔබතුමන්ලා අවංකවම හිතලා බලන්න. ඇත්තටම විසඳලා නැති ප්‍රශ්න ගැනයි මම කථා කරන්නේ. මම අරයාගේ කුණු, මෙයාගේ කුණු ගැන කථා කරන්න යන්නේ නැහැ. අද ඇති වෙලා තිබෙන ප්‍රශ්නයට මුහුණ දෙන්න අපට පුළුවන්. ඒකට අවශ්‍ය සියලු බලතල තිබෙනවා. ගරු විධායක ජනාධිපතිතුමා ඉන්නවා, ගරු අගමැතිතුමිය ඉන්නවා, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 225දෙනෙක් ඉන්නවා. විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට විරුද්ධ පක්ෂයේ අපි, පිට ඉන්න ආගමික නායකවරු, doctorsලා, engineersලා කොච්චර විරුද්ධ වුණත් ඔබතුමන්ලා ඒක සම්මත කළා. ඒක සම්මත කළා කියන එක ඔබතුමන්ලාට වටිනවා. නමුත්, මේවාත් ඊට වඩා වටින ප්‍රශ්න. ඒ චක්‍රලේඛනයේ ප්‍රශ්නය විසඳුවේ නැති නිසා කල්මුණේ රෝහලේ ඇති වෙච්ච නිල ඇඳුම සම්බන්ධ ප්‍රශ්නය අද Nagoda Hospital එකටත් ගිහින් තිබෙනවා. ඒ ප්‍රශ්නයත් විසඳිලා නැහැ. එය විසඳුණේ නැත්නම් ඒක සමාජය තුළ වෙන වෙන පැතිවලට මාරු වෙනවා නේ. ඒ නිසා ඇත්තටම කථා බහ කරලා ඒ ප්‍රශ්න විසඳා ගන්න ඕනෑ. ඒකට කරන්න තිබෙන්නේ සුළු දෙයක්. ඒක කරන්න ඕනෑ. ඒක කෙරුණේ නැත්නම් ප්‍රශ්න වැඩි වෙනවා.

අපේ රටේ සියලු ආගම්වල අය ඉන්නවා. එක එක ආගමට සම්මත එක එක ඇඳුම් තිබෙනවා; එක එක පාට තිබෙනවා. අපේ මුස්ලිම් ජාතිකයෙකු මිය ගියා නම් අපේ ආගමේ හැටියට සුදු රෙදිවලින් ඔතලා තමයි අවසන් කටයුතු කරන්නේ. ඒක එතැනින් ඉවරයි. ඒ වාගේම ගරු ස්වාමීන් වහන්සේලාගේ සිවුරට පාටක් තිබෙනවා. අපි ඒක රකින්න ඕනෑ. ඒක රකින්න අපට කිසිම පක්ෂ, පාට භේදයක් අවශ්‍ය නැහැ. අපි මේ ප්‍රශ්න විසඳන්න පොඩි දෙයක්වත් කරලා නැත්නම් ඉදිරියේදී අනිවාර්යයෙන්ම ප්‍රශ්න වැඩි වෙනවා. අද මම කථා කරන්නේ පොදුවේ. මේ ප්‍රශ්න 4ම අවංකව රටේ තිබෙන ප්‍රශ්න. ඒ නිසා ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අදාළ අංශවලට යොමු කරලා මේ ප්‍රශ්න විසඳන්න ඕනෑ. නැත්නම්, වෙන ජාතියක කෙනෙක් මේ ප්‍රශ්න අරගෙන ඉස්සරහට යන්න පුළුවන්. මේක ගැන මේ පාර්ලිමේන්තුව තුළ ඉන්න අපිට තමයි කථා කරන්න පුළුවන් වෙන්නේ; වෙන කාටවත් නොවෙයි. මේ 225ටම කථා කරන්න පුළුවන්. අපි මිනිසුන්ගේ ප්‍රශ්න මෙතැන කථා කරන්නේ, ඒවා විසඳන්න ඕනෑ කියන අර්ථයෙන්. යම් දෙයක් වෙන්න ඕනෑ නිසායි ඒ ගැන කථා කරන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට ලැබී තිබෙන කාලය අවසාන වෙලා තිබෙනවා. මට වෙලාව ලබා දුන්නාට ස්තුතියි. ඉදිරියේදී ඔබතුමියලා මේ සම්බන්ධයෙන් යම්කිසි මට්ටමින් උත්තරයක් දීලා මේ ප්‍රශ්නය සමථයකට පත් කරන ලෙස මම කාරුණිකව ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මුහම්මද් ෆයිසාල් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.56]

ගරු මුහම්මද් ෆයිසාල් මහතා
(மாண்புமிகு முஹம்மட் பைசல்)
(The Hon. Muhammad Faizal)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

அஸ்ஸலாமு அலைக்கும்! ஆயுபோவன්! வணக்கம்!

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய விவாதத்தில் எனக்கும் உரையாற்றுவதற்கு நேரத்தை ஒதுக்கித்தந்தமைக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

எமது நாட்டின் பொருளாதார வளர்ச்சியானது, சிறிய மற்றும் நடுத்தர தொழில்முயற்சியாளர்களிலேயே தங்கியுள்ளது. அந்த அடிப்படையில், சிறிய மற்றும் நடுத்தர தொழில்முயற்சியாளர்களை ஊக்குவிக்கும் வகையில் எமது அரசாங்கம் அதிகமான நிதி ஒதுக்கீடுகளைச் செய்துள்ளது. குறிப்பாக, 2026ஆம் ஆண்டு 95,000 மில்லியன் ரூபாய்க்கும் அதிகமான நிதியை ஒதுக்கீடு செய்துள்ளது. அதில் 80 சதவீதத்துக்கும் அதிகமான தொகையை தொழில்முயற்சியாளர்களுக்குக் கடன் வழங்குவதற்காக எமது அரசாங்கம் 15 அரச, அரச சார்பற்ற வங்கிகளை நியமித்துள்ளது. இந்த வருடத்தின் மூன்றாவது காலாண்டு முடிவடையும்போது, இதில் 75,000 மில்லியன் ரூபாய்க்கும் அதிகமான நிதி தொழில்முயற்சியாளர்களுக்குக் கொடுக்கப்பட்டுள்ளது. அதுமட்டுமல்ல, எமது நாட்டில் பிரதான பயிர்ச்செய்கையாக உள்ள நெற்செய்கையில் ஈடுபடுகின்றவர்களுக்கு அதிகமான கடன் உதவிகளைக் கொடுப்பதற்கான ஏற்பாடுகளையும் எமது அரசாங்கம் செய்துள்ளது. மேலும், 2026ஆம் ஆண்டு சிறு தொழில்முயற்சியாளர்களுக்கு அதிகளவான கடன்களைக் கொடுப்பதற்கான ஏற்பாடுகளையும் செய்திருக்கிறது. இந்தக் கடன்களைப் பெறும்போது, பிணை வைக்கவேண்டிய ஏற்பாடுகளும் இருக்கின்றன. இதனால் அவர்கள் சில நேரம் பிணைவைப்பதற்கு ஆட்களைத் தேடிக் கஷ்டப்படுவார்கள். சிலநேரம், இவர்களது சிறு தொழிலைப் பார்த்து, இவர்களால் கடன் தவணையைச் செலுத்த முடியாமல் இருக்குமெனக் கருதி பிணை வைப்பதற்கு யாரும் முன்வரவும் மாட்டார்கள். இதைக் கருத்திற்கொண்டு, எமது அரசாங்கம் பிணை இல்லாமல் கடன் பெறுவதற்கான ஏற்பாடுகளைச் செய்துள்ளது.

இவ்வாறு தொழில்முயற்சியாளர்களுக்குக் கடன் உதவிகளைக் கொடுப்பதன்மூலம் உள்நாட்டு உற்பத்தியை அதிகரிக்கலாம். உள்நாட்டு உற்பத்தி அதிகரிக்கும்பொழுது, பொருளாதார வளர்ச்சி ஏற்படும்; தனிநபர் வருமானம் அதிகரிக்கும். தனிநபர் வருமானம் அதிகரிக்கும்பொழுது, மக்களின் வாழ்க்கைத் தரம் மேம்படும். தொழில்முயற்சியாளர்களுக்குக் கடன்களை வழங்குவதில் வங்கிகளும் சிறந்த முறையில் செயற்படுகின்றன. சிறிய மற்றும் நடுத்தர தொழில்முயற்சியாளர்கள் கடன் உதவியைப் பெறுவதில் அதிக சவால்களை எதிர்கொள்கின்றார்கள். அவற்றை இல்லாமல் செய்வதற்காக எமது அரசாங்கம் digital முறைமூலம் கடன் வழங்குவதற்கான ஏற்பாடுகளையும் செய்துள்ளது.

எமது நாட்டில் பெண்கள் அதிகமாக வாழ்கின்றார்கள். தொழில்முயற்சியில் ஈடுபடும் பெண்களுக்கு 20 சதவீத கடன் உதவியை வழங்குவதோடு, இளம் தொழில்முயற்சியாளர்களுக்கு 20 சதவீதத்துக்கும் அதிகமான கடன் உதவியைக் கொடுப்பதையும் கட்டாயமாக்கியுள்ளது. கடந்த வருடம் ஏற்பட்ட தித்வா புயல்மூலம் அதிகமான தொழில்முயற்சியாளர்கள் பாதிக்கப்பட்டார்கள். அனர்த்தத்தால் பாதிக்கப்பட்ட நாட்டு மக்களுக்கு அதிகமான நிவாரண

உதவிகளைக் கொடுத்த அரசாங்கம் எமது தேசிய மக்கள் சக்தி அரசாங்கம் என்பதைக் கூறிக்கொள்கின்றேன். அனர்த்தத்தால் பாதிக்கப்பட்ட மக்களுக்கு இந்த வருடம் 3 சதவீத வட்டியுடன் அதிகபட்சம் 25 மில்லியன் ரூபாய் வரை கடன் உதவி வழங்கப்பட்டு இருக்கின்றது. அதுமட்டுமல்ல, கடன் அனர்த்தத் திட்டத்தின்மூலம் 10,000 மில்லியன் ரூபாயும் ஒதுக்கப் பட்டுள்ளது. இந்த யூலை மாதம் வரையான காலப்பகுதியில், அதில் 8,000 மில்லியன் ரூபாய்க்கும் அதிகமான நிதி 3,966 பாதிக்கப்பட்ட தொழில்முயற்சியாளர்களுக்கு தேசிய மக்கள் சக்தி அரசாங்கத்தால் வழங்கப்பட்டுள்ளது.

எமது அரசாங்கமானது, நாட்டுக்கு அதிகமாக அந்நியச் செலாவணியை ஈட்டித்தரக்கூடிய, பொருளாதார வளர்ச்சியை ஏற்படுத்தக்கூடிய தொழிற்றுறைகளுக்கு அதிகமாக கடன் உதவிகளை வழங்குகின்றது. சென்ற அரசாங்கங்கள் நாட்டில் சுற்றுலாத்துறையை மேம்படுத்தப் போவதாகச் சொல்லிக் கொண்டு இருந்தன. அவர்களுடைய காலத்தில் சுற்றுலாத் துறை மேம்படுத்தப்பட்டதா எனத் தெரியவில்லை. எமது அரசாங்கமானது, எமது நாட்டில் சுற்றுலாத்துறையை மேம்படுத்துவதற்கும் சுற்றுலாப் பயணிகளின் வருகையை அதிகரிப்பதற்குமான திட்டங்களுக்கும் அதிகமான கடன் உதவிகளை வழங்கியுள்ளது. குறிப்பாக, எமது நாட்டின் கரையோரப் பகுதிகளிலுள்ள சுற்றுலாத்துறை சார்ந்த தொழில்முயற்சியாளர்களுக்கு இவ்வாறான உதவிகளைச் செய்துள்ளது.

இன்று எமது புத்தளம் மாவட்டத்திலுள்ள கற்பிட்டி பகுதியில் சுற்றுலாத்துறையை மேம்படுத்துவதற்கான வேலைத் திட்டங்களையும், அதற்கான நிதி ஒதுக்கீடுகளையும் தேசிய மக்கள் சக்தி அரசாங்கம் செய்து வருகின்றது. குறிப்பாக, கற்பிட்டி பகுதியில் விவசாயம், மீன்பிடி, உப்பு, தும்பு போன்ற இன்னோரன்ன சிறு கைத்தொழில்களில் ஈடுபடுகின்றவர் களுக்கு இவ்வாறான உதவிகளை வழங்கி வருகின்றது. கடந்த காலங்களில் இவ்வாறான உதவிகள் எமது நாட்டில் கொழும்பு, கம்பஹா மாவட்டங்களில் மட்டும்தான் வழங்கப்பட்டன. ஆனால், இன்று எமது அரசாங்கமானது நாட்டின் 25 மாவட் டங்களிலும் உள்ள அனைத்துத் தொழில்முயற்சியாளர் களுக்கும் இந்தக் கடன் உதவி கிடைக்க வேண்டும் என்ற எண்ணத்தில் செயற்பட்டு வருகின்றது. தனிநபர் வருமானத் தையும் உள்நாட்டு உற்பத்தியையும் அதிகரித்து, எமது நாட்டின் பொருளாதாரத்தை மேம்படுத்துவதற்காக எல்லா மாவட்டங்களுக்கும் இவ்வாறான உதவிகள் கிடைப்பதற்கான ஏற்பாடுகளை எமது தேசிய மக்கள் சக்தி அரசாங்கம் செய்துள்ளது.

அதேநேரம், நாங்கள் விவசாயத்தையும் கைவிடவில்லை. விவசாயிகளுக்கான நிவாரண உதவிகளை வழங்குவதோடு, சிறிய மற்றும் நடுத்தர விவசாயிகளை இனங்கண்டு, கிராம மட்டத்தில் 'பிரஜா சக்தி' அமைப்பின் ஊடாக அவர்களுக்கான உதவிகளையும் செய்து வருகின்றது. அதுமாத்திரமன்றி, அமைச்சின் ஊடாக அவர்களின் தேவைகளையும் நிவர்த்தி செய்து வருகின்றது. இன்று எமது நாட்டில் 'பிரஜா சக்தி' அமைப்பு சிறந்த முறையில் செயற்படுகின்றது. இன்று எமது நாட்டில் ஒவ்வொரு கிராமத்திலும் வாழக்கூடிய மக்கள் இதன் மூலம் பயன்பெற்று வருகின்றார்கள். சிறு கைத்தொழில்களில் அல்லது சிறிய தொழில்முயற்சிகளில் ஈடுபடும் பெண்களாக இருக்கலாம், இளைஞர்களாக இருக்கலாம், 'தித்வா' சூறாவளி யால் பாதிக்கப்பட்டவர்களாக இருக்கலாம், அவர்கள் தலைநிமிர்ந்து தங்களது சொந்தக் கால்களில் நிற்கக்கூடிய வகையில் தரமான உதவிகளை இந்த அமைப்பு வழங்கி வருகின்றது. அதுமட்டுமல்ல, 15 அரச மற்றும் அரச சார்பற்ற வங்கிகள் ஊடாக எமது நாட்டிலுள்ள சிறிய மற்றும் நடுத்தர தொழில்முயற்சியாளர்கள் அனைவருக்கும் இவ்வாறான கடன் உதவிகளை வழங்குவதற்கான ஏற்பாடுகளும் செய்யப் பட்டுள்ளன. எது எவ்வாறு இருந்தபோதிலும், இங்கு பேசப்பட்ட அனோஜன் சம்பந்தமான விவகாரத்தில் மாண்புமிகு சனாதிபதி அவர்களின் தலைமையில் எமது அரசாங்கம் சிறந்ததொரு முன்னெடுப்பை மேற் கொண்டுள்ளது.

எமது புத்தளம் மாவட்டத்தில் இருக்கின்ற தள வைத்தியசாலையைத் தரமுயர்த்த வேண்டும் என்பது, அங்கு வாழக்கூடிய சிங்கள, முஸ்லிம், தமிழ் என அனைத்து இன மக்களினதும் நீண்டகாலக் கனவாகவும் தேவையாகவும் இருந்து வருகின்றது. கடந்த கால அரசாங்கங்களில் இருந்த எவரும் இது தொடர்பில் கவனமெடுக்காத நிலையில், எமது மாண்புமிகு சனாதிபதி அவர்கள் புத்தளத்துக்கு வருகை தந்தபோது, இந்த வைத்தியசாலையைத் தரமுயர்த்தித் தருவதாகக் கூறினார். அதற்கு அமைவாக, கௌரவ சுகாதார அமைச்சரின் ஊடாக இன்று அந்த வைத்தியசாலையைத் தரமுயர்த்துவதற்கான ஏற்பாடுகள் நடைபெற்று வருகின்றன. இதற்கு முழுக் காரணம், தேசிய மக்கள் சக்தி அரசாங்கம் மட்டுமே! இதற்காக இன்று நடைபெறுகின்ற எல்லா செயற்பாடுகளிலும், ஒவ்வொரு விடயத்திலும், இங்கு பேசப்படுகின்ற இடமாற்றங்களில்கூட, பெயர் சொல்லக்கூடிய அளவுக்கு வேறு எவருமே சம்பந்தப்படவில்லை. இன்று இங்கு பேசப்பட்ட விடயங்களுக்குக்கூட அரசாங்கமும் அமைச்சரும்தான் ஏற்பாடுகளைச் செய்து தந்துள்ளார்கள்.

இன்று புத்தளம் மாவட்டத்தில் நடைபெறுகின்ற அனைத்து சேவைகளும் வேலைத்திட்டங்களும் தேசிய மக்கள் சக்தி ஊடாகவே நடக்கின்றன என்பதை நான் உறுதியாகக் கூறிக்கொள்ள விரும்புகின்றேன். அவை நடந்து முடிந்த பிறகு, "நாங்கள்தான் செய்தோம், நாங்கள்தான் அமைச்சருடன் கதைத்தோம்" என்று கூறி, யாரும் பெயர் போட வர வேண்டாம்; பொய்க்கு அமைச்சருக்கு நன்றி சொல்லவேண்டிய அவசியம் இல்லையெனக் கூறி விடைபெறுகின்றேன். நன்றி, வஸ்ஸலாம்!

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුරංග රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහීර් මහතා
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)
Madam, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහීර් මහතා
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)
මම තමයි මුලින් ඒ ගැන කථා කළේ. ගරු මන්ත්‍රීතුමා මම වෙනුවෙන් තමයි කථා කළේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ නම කියැවුණේ නැහැ නේ.

ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)

ඇත්තටම මම බොරු කිව්වේ නැහැ. වෙච්ච සිදුවීම ගැන තමයි කිව්වේ. රිසාඩ් බදියුදීන් මැතිතුමා සෞඛ්‍ය ඇමති ගරු නලින්ද ජයතිස්ස මැතිතුමාට කථා කරලා ඒ ස්ථාන මාරුව තහනම් කරලා දුන්නා. මේක ගැන එතුමාත් කථා කර ඇති. අපි බොරු ප්‍රකාශ කරන්න මෙතැනට ඇවිල්ලා නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

හොඳයි, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා කියන කාරණය අවබෝධයි.

ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)

මේ ගැන අවබෝධයෙන් කටයුතු කරන්න ඕනෑ. *[බාධා කිරීමක්]*

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

එතැන point of Order එකක් නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නිහඬ වෙලා ඉන්න. මුලසුන ඒ ගැන බලන්නම්. *[බාධා කිරීම්]*

ගරු සුරංග රත්නායක මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)

මට මෙතැන බොරු කියන්න අවශ්‍යතාවක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ නම කියැවුණේ නැහැ. ඒ නිසා එතැන point of Order එකක් නැහැ.

ගරු නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා
(மாண்புமிகு நெய்னா தம்பி மரிக்கார் மொஹமட் தாஹிர்)
(The Hon. Naina Thambi Marrikkar Mohamed Thahir)

මම තමයි ඒ ගැන කථා කළේ. ඔබතුමියට පුළුවන් ඒකට අවස්ථාව දෙන එක, නොදෙන එක තීරණය කරන්න. නමුත් මෙතැන සාධාරණයක් තිබෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු සුරංග රත්නායක මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

[අ.භා. 2.08]

ගරු සුරංග රත්නායක මහතා
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

විශේෂයෙන්ම අද දිනයේ රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ මේ රටේ මධ්‍ය පරිමාණ සහ සුළු පරිමාණ ව්‍යාපාරිකයන් සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ඩොලර් මිලියන 170ක ණයක් ලබා ගැනීම සඳහා වූ යෝජනාව ඉදිරිපත් කර තිබෙනවා. මේ යෝජනාව ගැන අපි විශේෂයෙන්ම සතුටු වෙනවා. අපි දන්නවා මේ රටේ ව්‍යාපාරිකයන්ට, මේ රටේ කෘෂිකර්ම අපනයන ක්ෂේත්‍රයට ආධාර ලැබෙන්න ඕනෑ, ණය මුදල් ලැබෙන්න ඕනෑ කියලා. ඒ ණය මුදල්වලින් මේ රටේ ව්‍යාපාරිකයන්ගේ ආර්ථිකය ඉහළට ඔසවා තබන්නට කටයුතු වෙන්න ඕනෑ කියන කාරණය සමඟි ජන බලවේගය විශේෂයෙන්ම යෝජනා කරනවා.

ඒ වාගේම අපි බලන්න ඕනෑ, මේ ඩොලර් මිලියන 170ක ණය මුදලින් හරියාකාරව ණය ලැබිය යුතු පුද්ගලයන්ට මේ ණය මුදල ලැබෙනවාද, මේ ණය ලැබිය යුතු පුද්ගලයන්ට මේ ණය මුදල ලබා දෙන්නට අවශ්‍ය නිර්ණායක සකස් වෙලා තිබෙනවාද කියන එක. මේ යෝජනාවේ එක තැනක අමාත්‍යවරයාට බලය පවරා තිබෙනවා මම දැක්කා. මේ රටේ අමාත්‍යවරුන්ට බලය පැවරුවාම මේක දේශපාලන වැඩ පිළිවෙළක් කරගන්නේ නැතුව, තමන්ගේ දේශපාලන හිතවතුන්ට ලබා දෙන්නේ නැතුව ඇත්තවශයෙන්ම මේ රටේ ඒ ණය මුදල ලැබිය යුතු පුද්ගලයන්ට ඒක ලැබෙනවාද කියන කාරණය පිළිබඳව විපක්ෂය විධියට අපි අවධානයෙන් ඉන්නවා කියන කාරණයත් මම මතක් කරන්න ඕනෑ. ඒ වාගේම, මේ ණය මුදල තුළින් මේ රටේ ආර්ථිකයට දායකත්වයක් ලැබෙනවාද, මේ රටේ ජනතාවගේ ආදායම් වැඩි වෙනවාද, ගොවියාගේ ජීවිතය යහපත් වෙනවාද, කුඩා ව්‍යාපාරිකයාගේ ව්‍යාපාරවලට හොඳ වෙනවාද, නිෂ්පාදකයාට නිෂ්පාදන අළෙවි කළ හැකි වෙළෙඳ පොළක් තිබෙනවාද කියන කාරණයත් විශේෂයෙන්ම සලකා බැලිය යුතුයි කියන එකත් මතක් කරන්න ඕනෑ.

හැම දාම වාගේ මේ රටේ ආණ්ඩු පක්ෂය දිගින් දිගටම කියන කථාවක් තමයි, ඒගොල්ලන් මේ භාරගත්තේ බංකොලොත් වෙලා තිබුණු ආර්ථිකයක් කියන එක. ඒ නිසා හැම දාම අපි මේ කාරණය මතක් කරනවා. මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, මේ කාරණයත්. 2024 සැප්තැම්බර්වල මේ ආණ්ඩුව බලයට පත් වෙලා 2025 මුල අය වැයත් එක්ක මූල්‍ය ප්‍රකාශනයක් නිකුත් කළා. ඒ මූල්‍ය ප්‍රකාශනයේ පැහැදිලිව තිබෙනවා, ඒ වෙලාවේ මේ රටේ තිබුණු ආර්ථික තත්ත්වය මොකක්ද කියලා. සියයට 5.5ක ආර්ථික වර්ධනයක් එක්ක, ඩොලර් බිලියන 8ක විදේශ සංචිතයකුත් එක්ක, ඍණ 1.5ක උද්ධමනයකුත් එක්ක තමයි මේ අයට මේ ආණ්ඩුව භාර දුන්නේ. හැබැයි ආණ්ඩු පක්ෂය හැම දාම ඇවිල්ලා කියනවා, "මෙන්න මෙහෙම ආණ්ඩුවක් භාරගත්තා, මෙන්න මෙහෙම ආණ්ඩුවක් භාරගත්තා" කියලා. මම කියන්නේ එහෙම වැරදි ප්‍රකාශ කරලා වැරදි දේට credit එක දාගන්න යන එක කරන්න එපා. මේ රටේ ජනතාව බොහොම බුද්ධිමත්, සබුද්ධික ජනතාවක්. මේ ජනතාව දන්නවා, ඔබතුමන්ලාට බලය ලැබෙනකොට මොන වාගේ තත්ත්වයක ද මේ ආර්ථිකය තිබුණේ කියන කාරණය. ඒක ඔබට නැවත නැවතත් මතක කරන්න ඕනෑ. අපට පෙනෙන්න තිබෙනවා, පසුගිය මාස දෙකේ මේ රටේ ආර්ථිකය සම්බන්ධව පළ වුණු වාර්තා මොනවාද කියලා. එක පැත්තකින් අපට පෙනෙන්න තිබෙනවා, මේ රටේ බදු එකතු කිරීම ඉතාම හොඳින් කරගෙන යන බවට වාර්තා පළ වෙලා තිබෙන බව. අපි දැක්කා, වසරේ පළමුවැනි මාස 6 තුළ බදු ආදායම සියයට 25.9කින් ඉහළ ගිහිල්ලා තිබෙනවා කියලා අගමැතිතුමිය පාර්ලිමේන්තුවට ඇවිල්ලා ප්‍රකාශ කළ ආකාරය. ඒත් එක්කම අපි දැක්කා, සැප්තැම්බර් මාසය වන විට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු එකතු කිරීම රුපියල් ට්‍රිලියන 2.4 ඉක්මවා ගොස් තිබුණු බව. ඒ වාගේම සුරාබදු දෙපාර්තමේන්තුවේත්, ශ්‍රී ලංකා රේගුවේත් ආදායම දෙගුණ වෙලා තිබෙනවා. ඒ වාගේම ඇමතිවරයෙකුත් ප්‍රකාශ කළා, භාණ්ඩාගාරය පිරිලා ඉතිරිලා යනවා කියන කාරණය.

අපි බලමු, ජනතාවගේ පැත්තෙන් ආර්ථිකය සම්බන්ධයෙන් පළ වන ප්‍රවෘත්ති මොනවාද කියලා. ගිය සතියේ ප්‍රවෘත්තියක පළ වුණා, මේ වසරේ පළමුවැනි මාස හයේ තමයි ඉතිහාසයේ වැඩිම රත්තරන් බඩු ප්‍රමාණයක් උකස් කර තිබෙන්නේ කියලා. ඒ අනුව රුපියල් ට්‍රිලියන 1.11ක රන් භාණ්ඩ උකස් කර තිබෙනවා. එතකොට එය, ගිය වසරට සාපේක්ෂව සියයට 23.6ක් වැඩියි. එහෙම නම්, ජනතාව රන් භාණ්ඩ උකස් කර තිබෙන්නේ මොකක් උදෙසාද? අතට මුදල් ලැබෙන සමෘද්ධිමත් ජනතාවක් ඉන්නවා නම්, ඔවුන්ගේ ආර්ථිකය හොඳයි නම්, ජනතාව මෙච්චර රන් භාණ්ඩ උකස් කරයිද කියන ප්‍රශ්නය තමයි අපට අහන්න තිබෙන්නේ. ජනතාව මෙලෙස රන් භාණ්ඩ උකස් කර තිබෙන්නේ, එක්කෝ තම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා වෙන්න පුළුවන්. එහෙම නැත්නම්, එදිනෙදා පරිභෝජනය සඳහා වෙන්නත් පුළුවන්. එහෙම නම් ආණ්ඩුවක් විධියට ඔබතුමන්ලා අවධානය යොමු කරන්න ඕනෑ, ජනතාව ආර්ථික වශයෙන් අද ඇද වැටිලා තිබෙන අර්බුදය පිළිබඳවයි. මෙතැන ලොකු පරස්පරයක් තිබෙන බව අපට පෙනෙනවා. එක පැත්තකින් රාජ්‍ය ආදායම වැඩි වෙලා, රාජ්‍ය භාණ්ඩාගාරය පිරිලා ඉතිරිලා යද්දි අනෙක් පැත්තෙන් මේ රටේ ජනතාව අද තුන්වේල කන්න බැරිව, තමන්ගේ දරුවන්ගේ අධ්‍යාපනයට අවශ්‍ය මුදල් ටික වියදම් කර ගන්න බැරිව ඉන්නවා. ඒ වාගේම අද ගොවියාට ගොවිතැන කර ගන්න බැරිව ඉන්නවා. මේ රටේ ව්‍යාපාරිකයා නැත්තටම නැති කරලා තිබෙනවා. අද ව්‍යාපාරිකයෝ තමන්ගේ ණය ගෙවා ගන්න බැරිව, ලීසිං වාරික ගෙවා ගන්න බැරිව ඉන්නවා. අද ව්‍යාපාරිකයින්ගේ cheques return වෙනවා. ඒ වාගේ ආර්ථිකයක් තමයි අද තිබෙන්නේ. ඒ නිසා අපි ආණ්ඩුවට මතක් කරනවා, ඔබතුමන්ලා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා සුන්දර විධියට කථා කරලා, මේ රටේ ජනතාව හොඳින්, සතුටින්, සුඛෝපභෝගීව ජීවත් වෙනවා කිව්වාට ඒ කාරණය බිමේ ඇත්තක් නොවෙයි කියලා. අද බිමේ ඉන්න ජනතාව ජීවත් වෙන්නේ බොහොම අමාරුවෙන්; තුන්වේල කන්නේ බොහොම අමාරුවෙන්. ඒ නිසා ඒ සම්බන්ධව ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න කියලා මතක් කරනවා.

ඔබතුමන්ලා නිතර ප්‍රකාශ කරනවා, අපේම මුදල්වලින් highways හදන්න යෝජනා කරලා තිබෙනවා කියලා. ඒ කියන්නේ ණය ගන්නේ නැතුව highways හදනවා කියනවා. ඉතින් මම මතක් කරන්න ඕනෑ, 2024 වසර අවසාන වන විට මධ්‍යම රජයේ ණය තිබුණේ, රුපියල් ට්‍රිලියන 28,739ක් බව. හැබැයි, 2025 වසර අවසාන වන විට ණය තිබෙනවා, රුපියල් ට්‍රිලියන 29,975ක්. ඒ කියන්නේ, රුපියල් ට්‍රිලියන 1.25ක වැඩිවීමක් තිබෙනවා. ඔබතුමන්ලා හොඳ සුන්දර කතන්දර ගොඩක් කියනවා. ඔබතුමන්ලා ඒ වාගේ ලස්සන කථා කිව්වාට, බිමේ ජනතාව අද ජීවත් වෙන්නේ බොහොම අමාරුවෙන්. මේ රටේ රාජ්‍ය සේවකයා ජීවත් වෙන්නේ බොහොම අමාරුවෙන්. මේ රටේ උද්ධමනය සියයට 8.1ට ඉහළ ගිහිල්ලා තිබෙනවා. ගිය වසර වෙද්දි මේ රටේ උද්ධමනය වැඩි වුණාට ජනතාවගේ මිලදී ගැනීමේ හැකියාව වැඩි වෙලා නැහැ, ආර්ථිකය වර්ධනය වෙලා නැහැ. 2024 වසර අවසානයේදී ඔබතුමන්ලාට භාර දුන්නේ සියයට 5.5ක ආර්ථික වර්ධන වේගයක් තිබුණු රටක්. හැබැයි අද වෙද්දි කොහොමද? අද වෙද්දි ආර්ථික වර්ධන වේගය සියයට 3.1ට වැටිලා තිබෙනවා. ඒ නිසා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ජනතාවට ඒ සුරංගනා කථා කිව්වාට වැඩක් නැහැ. බිමට ගිහිල්ලා බලන්න. බිමේ ජනතාව ජීවත් වෙන්නේ බොහොම අමාරුවෙන්. බිමේ ජනතාව ඉන්නේ තුන්වේල කන්න බැරිව. ඒ නිසා ඒ සඳහා හරියාකාර ක්‍රියාමාර්ග ගන්න කියලා ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිමින්, මා නිහඬ වනවා.

බොහොම ස්තූතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු චතුරංග අබේසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා, ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු සුජීව දිසානායක මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා (විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன - விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சர்)
(The Hon. (Prof.) Chrishantha Abeysena - Minister of Science and Technology)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු සුජීව දිසානායක මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සුජීව දිසානායක මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சுஜீவ திசாநாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON.SUJEEWA DISSANAYAKE took the Chair.

[අ.භා. 2.16]

ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்திப் பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයට කථා කරගෙන යනකොට හැම තිස්සේම ආර්ථික කරුණු පැටලෙනවා. අපි දන්නවා, කාලාන්තරයක් තිස්සේ මේ රටේ ආර්ථිකය අර්බුදයකට ලක් කරලා, ඒ අස්ථායී ආර්ථිකයත් එක්ක තමයි ජාතික ජන බලවේගයට මේ ආණ්ඩුව භාර දුන්නේ කියලා. ඒ වාගේම මේ ආර්ථිකය ගැන ලොකු අවබෝධයක් තිබෙන අයට දශක ගණනක් තිස්සේ බැරි වුණා, මේ ආර්ථිකයේ කරන්න ඕනෑ දැවැන්ත ආර්ථික ප්‍රතිසංස්කරණ කරන්න. නමුත් අපි විශේෂයෙන්ම කියන්න ඕනෑ, ආර්ථික වර්ධනයේ යම් කිසි අඩුවක් සිද්ධ වෙලා තිබෙනවා නම්, එය සිද්ධ වෙලා තිබෙන්නේ අපේ රටේ විතරක් නොවෙයි කියන එක. සමස්ත ගෝලීය ආර්ථිකයම මේ වනකොට downgrade වෙලා තිබෙන්නේ. හැම රටකම වාගේ ආර්ථික වර්ධන වේගය යම් කිසි ප්‍රමාණයකින් අඩු වෙලා තිබෙන්නේ.

මේ යන ගමනේදී, එහෙම නැත්නම් මේ ආර්ථික ගමනේදී අපි ඉතාම හොඳින් දත්ත කළමනාකරණය කර ගනිමින්, ණය ගෙවීම සඳහා තමයි මේ පුරෝකථන කරගෙන යන්නේ. ඒක අපි කරගෙන යන්නේ IMF එකත් එක්කයි. එතැනදි පැහැදිලිවම අපේ අවශ්‍යතාව තිබෙන්නේ, සියයට 3.7ක, නැත්නම් සියයට 3.5ක ආර්ථික වර්ධන වේගයක් පවත්වාගෙන යෑම. නමුත් ඊට වඩා සියයට 1කින් වැඩි ආර්ථික වර්ධන වේගයක් අපි පවත්වාගෙන

[ගරු චතුරංග අබේසිංහ මහතා]

යනවා. ඒ වාගේම අපේ රටේ උද්ධමන අනුපාතය පවත්වාගෙන යන්න ඕනෑ සියයට 5ක මට්ටමේය කියන එකඟතාව මහ බැංකුවත් රජයත් අතර තිබෙනවා. ඒ කියන්නේ, ආර්ථික වර්ධනයක් ළඟා කර ගන්න අවශ්‍ය කරන්නේ සියයට 5ක උද්ධමනයක්. නමුත් මේ වසරේ බලශක්ති මිල ගණන් දෙගුණයකින් ඉහළ ගිය නිසා තමයි අපට මේ cost pressure එකක් ඇවිල්ලා සියයට 8ක උද්ධමන අනුපාතයක් ඇවිල්ලා තිබෙන්නේ. ඒක ඒ අය ආර්ථිකය කළමනාකරණය කරනකොට තිබුණා වාගේ control කර ගන්න බැරි අඛණ්ඩව වැඩි වන උද්ධමන අනුපාතයක් නොවෙයි. මම ඒක සරලව සඳහන් කළේ අපේ රටේ ජනතාවට ඒ ගැන අවබෝධයක් ලබා ගන්නයි.

අද අපි මේ කරන කාර්යය ගත්තොත්, රුපියල් බිලියන 7.7ක් වෙන් කරන්නේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට. සුළු හා මධ්‍ය පරිමාණ කියලා නැවත මම කියනවා. ඒකේ micro category එකක් ඉන්නවා, මිලියන 20ට අඩු. කුඩා කියන්නේ මිලියන විස්සත්, තුන්සිය පනහත් අතර ව්‍යාපාරවලට. මධ්‍ය කියන්නේ, මිලියන තුන්සිය පනහත්, බිලියනයත් අතර ව්‍යාපාරවලට. ඒ ව්‍යාපාරවලට අපේ රජයෙන් රුපියල් බිලියන 95ක වාගේ ඉතාම විශාල ණය ප්‍රමාණයක් අඩු පොලී ණය ක්‍රමයක් ලෙස හඳුන්වා දුන්නා. ඒක ඉතිහාසයේ මෙතෙක් ආපු දැවැන්තම ණය ප්‍රමාණය. ඒ වාගේම ඒ ව්‍යාපාර අගෝස්තු මාසය වනකොටම බැංකු ක්ෂේත්‍රය හරහා ඉතාම කාර්යක්ෂමව ඒ ණය ලබාගෙන ඉවර වුණා. ඒ නිසා තමයි ජනාධිපතිතුමාත්, මුදල් අමාත්‍යාංශයත් තීරණය කරලා, වියදම් නොවූ වැය ශීර්ෂ තෝරා ගෙන, තවත් අරමුදල් එකතු කරගෙන තව රුපියල් බිලියන 7.7ක් ලබා දීලා තිබෙන්නේ. මේ රුපියල් මිලියන 7,700න් ණය ලබා දෙන්නේ මේ වනකොටත් බැංකුවලට ඉල්ලුම් කරලා, අරමුදල් අවසාන වෙච්ච නිසා නැවතුණු ඉල්ලුම්පත්වලටයි. මේ වාගේ සහන පොලී ණය ක්‍රමයක් ලබන අවුරුද්දෙත්, ඉදිරියටත් මේ රජය විසින් ක්‍රියාත්මක කරගෙන යනවා. මොකද, අපි දන්නවා, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර තමයි අපේ රටේ කොඳු නාරටිය සහ අපේ රටේ ආර්ථිකය නංවන්නට තිබෙන එකම හැකියාව කියලා. වෙළෙඳ පොළේ තිබෙන පොලී අනුපාතයට වඩා සියයට 5ක්, 6ක් අඩුවෙන් තමයි ඒ අයට මේ ණය හිමි වෙන්නේ.

අපි මේකේ distribution එකත් බලනවා, කොයි පළාත්වලටද යන්නේ, ක්ෂුද්‍ර හා සුළු පරිමාණ අයට කොච්චර හම්බ වෙනවාද කියලා. ඒ අයට දැනට දීලා තිබෙන ණය ප්‍රමාණයෙන් සියයට 60කට වැඩි ප්‍රමාණයක් ලැබිලා තිබෙනවා. ඒ අනුව අපට ඒ distribution එකෙත් වරදක් පෙනෙන්නේ නැහැ. අපි ව්‍යවසායකයන්ට කියන්නේ ණය ගැනීමට සුදුසු ව්‍යවසායකයෙක් බවට පත් වෙන්න, බැංකු සමඟ ගනුදෙනු කරන්න පටන් ගන්න, ගිණුම් හදා ගන්න, තමන් සංවිධිත ව්‍යාපාරයක් ගොඩනඟන්න කියන එකයි. ඒ සඳහා තමයි කර්මාන්ත අමාත්‍යාංශය සහාය දෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ටිකක් ලිබරල් අදහස් දක්වන අය ඊයේ කැබිනට් තීන්දුව ගැන පොඩ්ඩක් කලබල වෙලා තිබුණා. ඒ තීන්දුව තමයි, ලංකාවේ ටයර් ආනයනය කරනකොට ඒ ටයර්වලට සම්මතයන් හඳුන්වා දීම. ඇත්තටම පසුගිය රජයන් ආර්ථිකයට අවශ්‍ය කරන කිසිම ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණයක් කරලා තිබුණේ නැහැ. 1980දී ඕස්ට්‍රේලියාවත්, 1990දී ඉන්දියාව සහ නවසීලන්තයත්, 2000දී වියට්නාමයත් කරපු දේ තමයි තමන්ගේ රට කෙමෙන් කෙමෙන් ලෝකයට විවෘත කරලා, ලෝකයත් සමඟ වෙළෙඳ ගිවිසුම්වලට ගිය එක. අද වනතුරුත් අපේ රටේ එක වෙළෙඳ ගිවිසුමයි තිබෙන්නේ. ඒක ඉන්දියාව එක්ක ගහපු පරණ වෙළෙඳ ගිවිසුමක්. අපි මෙතැනින් එහාට යන්න නම්, මේ රට පුළුල් - ප්‍රසාරණය - කර ගන්න නම් අපට ලෝකයත් එක්ක වෙළෙඳ ගිවිසුම්වලින් සම්බන්ධ වෙන්න වෙනවා. ඒ සඳහා තිබුණු ප්‍රධානම බාධකයට, ලිබරල් ආර්ථික මෙහෙයවපු ලිබරල් ආණ්ඩුවලටත් කර ගන්න බැරි වුණු වෙනසට තමයි ජාතික ජන බලවේගය අත ගැහුවේ. ඒ අනුව අපි 2026 අවුරුද්දේ ඉඳලා 2029 අවුරුද්ද වෙනකොට අපේ රටේ කර්මාන්ත 7කට තීරු බදු ආරක්ෂාවක් ලබා දෙන්න තීරණය කරලා තිබෙනවා. විශේෂයෙන් ටයිල් කර්මාන්තය, ටයර් කර්මාන්තය, bathware, plastic, furniture සහ යකඩ වාගේ කර්මාන්තවලට තිබුණු ආරක්ෂණයක් තමයි CESS, PAL කියන බදු දෙක. මේ බදු දෙක නිසා අපේ රටේ පරිභෝජන වියදම වැඩි වෙලා තිබුණා, අපේ ආයෝජකයන් වැඩි වෙලා තිබුණා සහ අපේ යෙදවුම් පිරිවැය වැඩි වෙලා තිබුණා. එතකොට අපි ලෝකයේ තරගකාරී තැනක නිටියෙත් නැහැ. ඒ para-tariffs දෙක තියාගෙන වෙන රටක් එක්ක තරගකාරී ගිවිසුමකට යන්න විධියකුත් නැහැ. ඒ para-tariffs දෙක 2029 අවුරුද්ද වෙනකොට කෙමෙන් කෙමෙන් ඉවත් වෙලා යනවා. එතකොට අපේ කර්මාන්තවලටත් ලොකු හානියක් වෙන්නේ නැති වන විධියට අපි ඒක plan කරලා තිබෙනවා. සමහර ඒවායේ සියයට 50ක් 2026දී සහ ඊළඟ අවුරුදු දෙකේ සියයට 25 ගාණේ බෙදී යන විධියට එය සැලසුම් කරලා තිබෙනවා. සමහර ඒවායේ පළමුවෙනි අවුරුද්දේ බින්දුවක් සහ ඊළඟ අවුරුදුවල සියයට 25 ගාණේ බෙදී යන විධියට සැලසුම් කරලා තිබෙනවා. කර්මාන්ත එක්ක සුහද සාකච්ඡාවකින් පසුව ඒ දැවැන්ත පරිවර්තනයට අපි එකඟ වුණා. ඒ දැවැන්ත පරිවර්තනයට එකඟ වෙනවාත් එක්කම කර්මාන්ත පැත්තෙන් ආපු අදහසක් තමයි, දේශීය නිෂ්පාදකයාට සම බිමක් නැහැ කියන එක. දේශීය නිෂ්පාදකයාට සම බිමක් නැති වෙන්න හේතු වෙලා තිබෙන්නේ මීට කලින් මේ රට පාලනය කළ අය නිෂ්පාදකයෝ පැත්තකට දාලා, ආනයනය කරන ව්‍යාපාරත් එක්ක වැඩිපුරම ගනුදෙනු කරලා තිබීමයි. ඒ අනුව, ඒ අය අත්තනෝමතික විධියට ලංකාවට භාණ්ඩ එන්න loopholes ඇරලා තිබුණා. එතකොට බදු ගෙවන්නේ නැතිව Sri Lanka Customs එකෙන් පන්නාගෙන, නැත්නම් අතේ carry කරගෙන භාණ්ඩ අපේ රටට එනවා. එතකොට දේශීය කර්මාන්තකරුවන්ට ඒවාත් එක්ක තරග කරන්න බැහැ. එම නිසා අපි backward audit එක පටන් අරගෙන තිබෙනවා. ඒ නිසා දැන් කවුරු හරි වෙළෙඳාමක් කරනකොට, ඒ වෙළෙඳාම කරන්නේ ආනයනික භාණ්ඩයක් සම්බන්ධයෙන් නම් ඒ ආනයනික භාණ්ඩය ආවේ කොහෙන්ද, මොන කන්ටේනර් එකේද ආවේ, කොච්චර බදු ගෙව්වාද කියලා check වෙනවා. අපි දැන් මාස හයක් තිස්සේ ඒ ක්‍රියාවලිය සාර්ථකව කරගෙන යනවා.

ඊට අමතරව අපි දන්නවා, අපි වාගේ රටවලට dumping සම්බන්ධයෙන් විශාල ප්‍රශ්නයක් තිබෙන බව. ඒ කියන්නේ, විශේෂයෙන්ම ටයිල් කර්මාන්තය, ටයර් කර්මාන්තය වාගේ කර්මාන්ත ගත්තාම, මේ රටේ පිරිවැයට වඩා අඩුවෙන් ඒ භාණ්ඩ එම රටවලින් අපේ රටවලට එවනවා. මෙන්න මේ ක්‍රියාවලිය අඛණ්ඩව සිද්ධ වනකොට ඒක නවත්වන්න තිබෙන නීතිය තමයි, Anti-Dumping Regulation එක. අපි ඒක පාර්ලිමේන්තුවේ නීතිගත කරලා, මේ වනකොට ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග පටන් අරගෙන තිබෙනවා. මුලින්ම ටයිල් කර්මාන්තයට අදාළ application එක දැන් හදාගෙන යනවා, ටයිල් ක්ෂේත්‍රයේ ආරක්ෂණය සඳහා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ජනතාව දැනගන්න ඕනෑ, අපේ රටේ standards - SLSI standards - තිබුණාට ඒවා විවිධ කර්මාන්තවලට apply කරලා තිබුණේ නැහැ කියන එක. විශේෂයෙන්ම ආනයනික භාණ්ඩවලට ඒවා apply කරලා තිබුණේ නැහැ. එම නිසා අපි මේ අවුරුද්දේ ඉඳලා මේ කර්මාන්ත හතටම අදාළව ගත්තාම, ලංකාවේ සම්මතයන් අනුව ඒවා පිහිටුවන්නත්, ලංකාවේ එවැනි සම්මතයන් නැත්නම් ජාත්‍යන්තර සම්මතයන් අනුව ඒවා පිහිටුවන්නත් තීරණයක් ගත්තා. එතකොට තමයි අපට ගුණාත්මක වශයෙන් තරගකාරිත්වයක් ඇති කර ගන්න පුළුවන් වන්නේ. මේ සම්මතයන්ට අනුකූලව තමයි ඉදිරියේදී ආනයනික භාණ්ඩත්

ලංකාවට ගෙනෙන්න වෙන්නේ. මෙහිදී තිබුණු ගැටලුව තමයි, මේ සම්මත පිහිටෙව්වාට පස්සේ ඒ සම්මතවලට අවශ්‍ය කරන පරීක්ෂණ කරන්න පරීක්ෂණ පද්ධතියක් අපේ රටේ තිබෙනවාද කියන එක. සමහරු ගොඩක් කෑ ගැහුවාට, මේගොල්ලන් ආර්ථිකයේ මූලිකාංගවලට, ආර්ථිකයේ පදනමට ආයෝජනය කර තිබුණේ නැහැ. අඩුම ගාණේ මේගොල්ලන්ට 1990 අවුරුද්දේ ඉඳලා මේ වාගේ තීරු බදු ප්‍රතිපත්තියක් implement කර ගන්න බැරි වුණා. එම නිසා මේ සම්මතයන් පිහිටුවීමේදී ඒකේ පළමුවැනි කාරණය විධියට තමයි කර්මාන්ත අමාත්‍යාංශයත්, මුදල් අමාත්‍යාංශයත් එකතු වෙලා මේ කටයුතු කරන්නේ.

ලංකාවට ටයර් ගෙනෙන ආයතන කිහිපයක් තිබෙනවා. අපි ඒ ආයතනවලින් සොයා බැලුවාම පෙනුණා සමහර ටයර් ඒ සම්මතයන්ට අනුකූලව නිෂ්පාදනය කරලා නැහැ කියලා. හැබැයි, ලංකාවේ ටයර් නිෂ්පාදනය කරන ආයතන ඒ සම්මතයන්ට අනුව ඒවා නිෂ්පාදනය කරනවා. වෙළෙඳ පොළ තුලනයක් නැති නිසා අපි ඉස්සරහට ටයර් කර්මාන්තයට, ටයිල් කර්මාන්තයට, bathware කර්මාන්තයට, ප්ලාස්ටික්, යකඩ සහ furniture කියන මේ සියලුම දේවල්වලට ආනයනික පිරිවිතර අනිවාර්ය කරනවා. එහෙම ආනයනික පිරිවිතර අනිවාර්ය කළාම ඒ සම්මතයන්ට අනුව තමයි ලංකාවට භාණ්ඩ ගෙනෙන්න පුළුවන් වෙන්නේ.

මම සඳහන් කළ අර තීරු බදු දෙක ඉවත් කිරීමෙන් ඇති වන හානිය සම්බන්ධයෙන් කර්මාන්තකරුවන් එක්ක එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා, ඒගොල්ලන් තරගකාරී වෙලා ලෝකයත් එක්ක තරග කරන්න සූදානම් කියලා. මේ කාරණා දෙක ඉෂ්ට වුණාම තමයි අපට RCEP වාගේ agreementsවලට යන්න අවස්ථාව ලැබෙන්නේ. ඒ වාගේම වෙනත් රටවල් එක්ක තීරු බදු ගිවිසුම්වලට, Free Trade Agreementsවලට, නැත්නම් Comprehensive Economic Cooperation Agreementsවලට යන්න පුළුවන් වෙන්නේ. එහෙම වුණාම තමයි අපේ රට අපනයන සඳහා ප්‍රමුඛ රටක් විධියට නිර්මාණය වෙන්නේ. අපනයන සඳහා ප්‍රමුඛ රටක් විධියට අපේ රට නිර්මාණය කර ගත්තාම තමයි අපට විදේශ ආයෝජන කැඳවන්න පුළුවන් වෙන්නේ. මේ වෙනකොට විදේශ ආයෝජන ගැන උනන්දුවක් තිබෙනවා. නමුත්, අපේ රටෙන් ගොඩක් රටවලට තීරු බදු අඩුවෙන් භාණ්ඩ යවන්න බැරි නිසා ඒ අය ඒ ගැන කල්පනා කරමින් ඉන්නවා. දැනට ඒ විධියට භාණ්ඩ යවන්න පුළුවන්, යුරෝපයටයි, එංගලන්තයටයි, ඉන්දියාවටයි විතරයි. එම නිසා අපේ වෙළෙඳ පොළ පුළුල් කර ගැනීමේ දැවැන්ත ක්‍රියාමාර්ගයක අපි නිරත වෙලා ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙච්චර කාලයක් ආර්ථිකය හැසිරවූ අය කර්මාන්ත සඳහා අවශ්‍ය කරන මූලික පහසුකම් ටික සකසා තිබුණේ නැහැ. එකක් තමයි, ප්‍රාග්ධන ගැටලුව. අපි මේ වනකොට ඒ ගැටලුව යම්කිසි ප්‍රමාණයකට විසඳාගෙන එනවා. ඒ වාගේම තමයි, අපි ලංකාවේ කොටස් වෙළෙඳ පොළට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර එකතු කරන්න ක්‍රියාමාර්ගයක් ගනිමින් ඉන්නවා.

ඊළඟට, මේගොල්ලන් කාලයක් තිස්සේ අකර්මණ්‍ය කර තිබුණු IDB එක, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සහ SEDD කියන ආයතන තුනම අපි ප්‍රතිව්‍යුහගත කරලා, ජනවාරි මාසයේදී නව ආයතනයක් බිහි කරනවා. බස්නාහිර පළාතේ කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා විතරක් ආයෝජකයින් 300ක් විතර ඉන්නවා. නමුත්, අපට බස්නාහිර පළාතේ ඒ සඳහා ඉඩකඩක් නැහැ. ඒ සඳහා තමයි අක්කර 300කට වැඩි ප්‍රමාණයක් බස්නාහිර පළාතෙනුත්, එතැනින් එහාට කර්මාන්තපුර ඉදිකිරීමට කර්මාන්ත අමාත්‍යාංශය යටතේ කර්මාන්තපුර 11කුත්, BoI ආයතනය හරහා කර්මාන්තපුර 7කුත් නිර්මාණය වෙමින් පවතින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යටිතල පහසුකම් හැදුණාම තමයි අපේ රටට ආයෝජන ඇවිල්ලා, ඒ ආයෝජන හරහා ආර්ථිකය ප්‍රසාරණය වෙලා, එහි ප්‍රතිලාභ පහළට ගලාගෙන යන්නේ. මෙච්චර කාලයක් මේගොල්ලන් නොකරපු දේවල් අපි ආරම්භ කරලා තිබෙනවා. ඒවායේ කෙටිකාලීන ප්‍රතිඵලත් තිබෙනවා; දිගුකාලීන ප්‍රතිඵලත් තිබෙනවා. හැබැයි, අපි යන ගමන ගැන අපට කිසිම සැකයක් නැහැ. මොකද, අපේ රාජ්‍ය මූල්‍ය තත්ත්වය - fiscal position එක - ඉතාම ශක්තිමත්. ඒක නිසා තමයි ජනාධිපතිතුමා පැහැදිලිව කිව්වේ, ලබන අවුරුද්දේ අපි රුපියල් ට්‍රිලියන දෙකක පමණ ප්‍රාග්ධන වියදම් කරන්න සූදානමින් සිටිනවා කියලා. එහෙම කියන කොටම විපක්ෂය පැත්තෙන් කියනවා, "ඔයගොල්ලන් Budget එකෙන් කිව්වාට ඒ මුදල් වියදම් කරන්නේ නැහැ නේ" කියලා. ඒක නිසා නැවතත් මම සහතික කරලා කියනවා, පසුගිය අවුරුද්ද තමයි වැඩිම ප්‍රාග්ධන වියදමක් කළ අවුරුද්ද කියලා. ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කළ මුදලින් සියයට 76ක් වියදම් කරලා තිබෙනවා. ඊට කලින් වසරේ, ඔබතුමන්ලාගේ කාලයේ සියයට 65යි. ඊට කලින් අවුරුද්දේ සියයට 54යි ප්‍රාග්ධන වියදම් ලෙස වැය කරලා තිබුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

ගරු චතුරංග අබේසිංහ මහතා
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
ඒ වාගේ සාකච්ඡාවක් මීට කලින් තිබුණේත් නැහැ. හැබැයි, අපේ සමාජය දැන් දියුණු වෙලා. අපේ විපක්ෂයත් දැන් ගොඩක් දියුණු වෙලා. ආර්ථික කරුණු ගැන කථා කරන එක හොඳයි. මොකද, අපට ඉදිරියේදී වාද විවාද කරන්න පුළුවන්, 2010 ඉඳලා 2024 වෙනකල් නොකළ දේවල් සහ 2025 ඉඳලා 2035 වෙනකල් කරන දේවල් පිළිබඳව. වෙනත් රටවල් අත්කරගත් ආර්ථික පරිවර්තනය ඉදිරි දශක දෙක ඇතුළත ජාතික ජන බලවේගයේ ආණ්ඩුව හරහා අපි ළඟා කරගන්න උත්සාහ කරනවා.

කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.29]

ගරු චානක මාදුගොඩ මහතා
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)
මට කාලය ලබා දීම සම්බන්ධයෙන් බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මීට පෙර කථා කළ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා කිව්වා, විපක්ෂයට ආර්ථික ගැටලු පැටලිලාය කියලා. හැබැයි, ඔබේ පක්ෂයට, ඔබේ ආණ්ඩුවට ගමට ගියාම ආර්ථික ගැටලු පැටලිලා තිබෙන විධිය ලුණු ඇඹුල් ඇතුව අහගන්න පුළුවන් කියන එක මම මුලින්ම මතක් කරන්න ඕනෑ.

[ගරු වානක මාදුගොඩ මහතා]

අද මේ සභාව හමුවේ තබා තිබෙන රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ වන යෝජනාව පිළිබඳව මේ මොහොතේ යමක් කියන්න අවශ්‍යයි. ඒ දිහා බලද්දී අපේ රටේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් මුහුණ දෙමින් සිටින බෙදනීය තත්ත්වය පැහැදිලිව පෙනෙනවා. අද රටේ අසීරුවෙන් ව්‍යාපාර කරගෙන යන ව්‍යවසායකයන් 13,000ක් ණය ඉල්ලුම්පත් ඉදිරිපත් කරලා තිබෙන වෙලාවක තමයි ඔබතුමන්ලා මේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ. හැබැයි, 13,000ක් ඉල්ලුම් කරලා තිබෙද්දී ඔබතුමන්ලා දෙන්න පුළුවන් කියන්නේ 3,000කට පමණයි. එතකොට අපි අහනවා, ඉතිරි 10,000ට මොකද වෙන්නේ කියලා. ඒ නිසා අපි ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, 3,000කට පමණක් නොවෙයි, ඊට වඩා වැඩි පිරිසකට මෙය ලබා දීලා, අද දවසේ මේ කටයුත්තට රජයක් විධියට මීට වඩා මැදිහත් වෙන්න කියලා. අපි විශේෂයෙන් ඒ ඉල්ලීම කරනවා.

ඊළඟට මම මේ උත්තරීතර පාර්ලිමේන්තුවේදී මේ අවස්ථාව යොදා ගන්නවා, මාතෘ භූමියේ ඒකීයත්වය ආරක්ෂා කිරීම වෙනුවෙන් තම ලේ, කඳුළු සහ යෞවනත්වය කැප කළ අපේ රණ විරුවන් පිරිසක් වෙනුවෙන් කථා කරන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වත්මන් ආණ්ඩුව බලයට පත් වුණාට පසුව මේ රණ විරුවන්ට අත්වෙලා තිබෙන බෙදජනක ඉරණම පිළිබඳව මම ඉතාම කනගාටුවෙන් මතක් කරන්න ඕනෑ. අද ඔවුන්ට විවිධ පීඩන එල්ල කරමින්, විවිධ චෝදනා එල්ල කරමින් මේ ආණ්ඩුව රණ විරුවන් පහළට ඇද දමන්නත්, ඔවුන් ඉටු කළ ඒ උත්තරීතර කාර්යභාරය මකා දමන්නත් උත්සාහ ගන්නා වෙලාවක්, මේක.

මේජර් ජනරාල් සුරේෂ් සලේ අද හිරගෙදර. ඒ වාගේම හිටපු නාවික හමුදාපති උළුගේතැන්න මහත්මයා අද හිරගෙදර. අද මේ ආණ්ඩුව රණ විරුවන්ට සලකන්නේ ඒ විධියට. අද මේ ආණ්ඩුව රණ විරුවන්ට සලකමින් ඉන්නේ ඒ විධියට. ඉදිරියටත් මේ ආණ්ඩුව රණ විරුවන්ට නිසි ආකාරයෙන් සලකාවි කියලා අපට විශ්වාසයක් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි විශේෂයෙන්ම යුද්ධය අවසන් කරන්න නායකත්වය දුන් කඳවුරේ දේශපාලන බලවේගය විධියට, රණ විරුවන්ට හිමි නිසි ගෞරවය සහ නිසි තැන අහිමි කරන්න කිසි ලෙසකත් ඉඩ දෙන්නේ නැහැ කියන කාරණයත් මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යුද්ධය පැවති අතිශය දුෂ්කර සමයේදී නීත්‍යානුකූලව වසර 12ක සේවා කාලයක් සම්පූර්ණ කරලා හමුදාවෙන් ඉවත් වූ රණ විරුවන් අද විශාල ප්‍රශ්න රාශියකට මුහුණ දීලා තිබෙනවා. ඔවුන් සුළුපටු කාලයක් නොවෙයි, වසර 12ක් තමන්ගේ ජීවිත පසෙක තබා, තමන්ගේ දරු පවුල් පසෙක තබා, තමන්ගේ යෞවනත්වය කැප කරලා, මේ රටේ බිම් අඟලක අයිතිය වෙනුවෙන්, මේ රට ඒකීය රටක් බවට පත්කර ගැනීම වෙනුවෙන් තමන්ගේ ලේ, කඳුළු සහ දහඩිය මේ පොළොවට පූජා කළා. හැබැයි, එහෙම කැපවීම් කළ ඒ රණ විරුවන්ට අද ඉතාම බෙදනීය තත්ත්වයන්ට මුහුණ දෙන්න සිදු වෙමින් තිබෙනවා.

ඔවුන් එදා වෙඩි උණ්ඩවලට, බෝම්බවලට මුහුණ දුන්නා. ඔබ හිතලා බලන්න, යුද්ධයක් තිබෙන වෙලාවේ බෝම්බ ගහනකොට, වෙඩි තියනකොට අපිට ඉදිරියට යන්න පුළුවන්ද? අපිට බැහැ. හැබැයි, අපේ රණ විරුවන් එදා ඒක කළා. වසර 12ක් සේවය කරපු රණ විරුවන් 40,000ක් පමණ අපේ රටේ ඉන්නවා. පොඩි ගණනක් නොවෙයි. අද ඒ සියලුම රණ විරුවන් ප්‍රශ්න රාශියකට මුහුණ දීලා තිබෙනවා.

අපි දන්නවා, නීත්‍යානුකූලව වසර 12කින් ඉවත් වූ රණ විරුවන්ට කිසිදු විශ්‍රාම වැටුපක් ලබා ගන්න හැකියාවක් නැහැ කියලා. හැබැයි, ඔවුන් ක්‍රියාන්විත ප්‍රදේශවල ජීවිතයත් මරණයත් අතර කළ ඒ සටන; ජීවිතයත්, මරණයත් අතර කරපු ඒ අප්‍රමාණ කැප කිරීම වෙනුවෙන් අපි රටක් විධියට ඔවුන්ට යම් කෙළෙහිගුණ සැලකීමක් කරන්න ඕනෑ. ඒ නිසා අපි විශේෂයෙන්ම විපක්ෂය විධියට ඉතාම පැහැදිලිව යෝජනා කරනවා, වසර 12ක සේවය නිම කරලා නීත්‍යානුකූලව සේවයෙන් ඉවත් වුණු 40,000ක් පමණ වන ඒ රණ විරුවන්ට යම් සහනයක් සලසන්න කියලා. අපි මේක යෝජනා කරන්නේ ඉදිරි වසරේ අය වැය ලේඛනය ඉදිරිපත් කිරීමට නියමිතව තිබියදීයි. අපි ඔබේ ආණ්ඩුවෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, ඒ රණ විරුවන් 40,000ට අඩුම වශයෙන් යම් දීමනාවක්, එහෙම නැත්නම් සහන විශ්‍රාම වැටුපක් ලබා දෙන්න මැදිහත් වෙන්න කියන කාරණය.

ඊයේ පෙරේදා කථාබහ වුණු, මේ රටේ ඇති වුණු ඉතාම බෙදනීය තත්ත්වය පිළිබඳවත් මා කියන්න ඕනෑ. අන්තර්ජාතික වටිනාකමක් තිබුණු කාවන්තිස්ස ඇතා පිළිබඳව අද පරිසරවේදීන් වාගේම මුළු රටම කම්පාවට පත් වෙනවා. අපි හැමෝම දැඩි කම්පනයට පත් වෙලා ඉන්න වෙලාවක්, මේ. හැබැයි, රජයේ නොසැලකිලිමත්කම නිසා තමයි කාවන්තිස්ස ඇතාගේ මරණය සිදු වුණේ. අපිට මතකයි, ඔබේ ආණ්ඩුව තමයි වනසතුන්ට වෙඩි තියන්න නිල වශයෙන් බලය දුන්නේ. ලාල් කාන්ත ඇමතිවරයා කිව්වා, වගාවට හානි කරනවා නම්, තමන්ගේ නිවෙස්වලට එනවා නම් වනසතුන්ට වෙඩි තියන්න කියලා. ඒ ප්‍රකාශය කළේ, ලාල් කාන්ත ඇමතිවරයා. ඒ නිසා ඔබේ ආණ්ඩුව නිල වශයෙන් මිනිස්සුන්ට බලය දුන්නා වනසතුන්ට වෙඩි තියන්න. එතකොට කාවන්තිස්ස ඇතා අවසන් ගමන යාම පිළිබඳව ඔබේ ආණ්ඩුවට ඇඟිල්ල දිගු කරන්න අපට සිදු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාවන්තිස්ස ඇතාට වෙඩි තැබුවාය කියලා දෙදෙනෙක් අත්අඩංගුවට ගත්තා අපි මාධ්‍යවලින් දැක්කා. ඒ දෙදෙනා අත්අඩංගුවට ගත්තේ කොළඹින් සුපර් මෑන්ලා ගිහිල්ලා. ඒ දෙදෙනා නිල වශයෙන්ම බලපත්‍ර සහිතව තුවක්කු තිබෙන දෙදෙනෙක්. ඒ පවුලේ කට්ටිය කියනවා, ඒ දෙදෙනාගෙන් බලෙන් කටඋත්තර ගන්නවා කියලා. ඒ ඇතාට වෙඩි තිබ්බ බවට කටඋත්තර දෙන්න කියලා යෝජනා කරනවා; බලපෑම් කරනවා කියලා ඔවුන් කියනවා. ඒ නිසා අපි කොළඹින් ගිය සුපර් මෑන්ලාට මේ කාරණය කියනවා. ඔබේ ආණ්ඩුව හරි දක්ෂයි සාක්ෂි හදන්න. ඔබේ ආණ්ඩුව හරි දක්ෂයි නිවැරදි මිනිස්සු වැරදිකාරයෝ කරන්න. ඒ නිසා අපි ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, අහිංසක මිනිස්සු වැරදිකරුවන් කරන්න එපා කියලා. සැබෑ ලෙස වැරදි කරපු මිනිස්සු අල්ලන්න. කාවන්තිස්ස ඇතාට ඒ අනුවේදනීය කාර්යය කරපු මිනිස්සු අල්ලලා දඬුවම් දෙන්න. හැබැයි, සාක්ෂි හදලා, බලපෑම් කරලා, ඔබ යෝජනා කරලා කොළඹින් ගිය සුපර් මෑන්ලාට ඕනෑ විධියට මේ ප්‍රශ්නය විසඳන්න දෙන්න එපා කියන කාරණයත් අපි ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

අපි කැමැතියි, ආණ්ඩුවට යෝජනාවක් කරන්න. කාවන්තිස්ස ඇතාට වෙඩි තිබ්බාට පස්සේ ඔබ කඩිමුඩියේ ගිහිල්ලා අග්බෝ ඇතා ගැන හෙව්වා. ඒ පිළිබඳ ඉතාම ගෞරව කරනවා. හැබැයි, සිද්ධියක් වුණාම විතරක් ඒ පිළිබඳව හොයන්න එපා. මේ අලි සම්බන්ධ ගැටලුව ගැන මීට වඩා හොයන්න. අලි-මිනිස් ගැටුම පිළිබඳව මීට වඩා විසඳුම් දෙන්න බලන්න. ඒ වගා හානි වෙන, මිනිස් ජීවිත නැති වෙන දේවල් පිළිබඳව හොයන්න. ඒකට තමයි ආණ්ඩුව දීලා තිබෙන්නේ. අතීතයට වැරදි කිය කිය, අතීතය පිළිබඳ කථා කරමින් ඉන්න නොවෙයි ඔබට ආණ්ඩුව දුන්නේ කියන කාරණයත් අපි ඉතාම ගෞරවයෙන් මේ මොහොතේ සිහිපත් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම සතුටු වෙනවා, ඔබතුමා මූලාසනයේ ඉන්න වෙලාවේ කථා කරන්න ලැබීම ගැන. හැබැයි, මම ඊට වඩා සතුටු වෙනවා ගරු කථානායකතුමා හෝ නියෝජ්‍ය කථානායකතුමා හෝ මේ වෙලාවේ ඔය පුටුවේ හිටියා නම්. මම මීට අවුරුදු එකහමාරකට පෙර කියපු කාරණයක් පිළිබඳව මතක් කරන්න කැමැතියි. විශේෂයෙන් උත්තරීතර පාර්ලිමේන්තුව නැරඹීමට පැමිණෙන දූ දරුවන් කිහිප දෙනෙක් මේ මොහොතෙත් මහජන ගැලරියේ රැඳිලා ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ දූ දරුවන් අද මේ පාර්ලිමේන්තුවට ඇතුළු වෙන්න පෙර මුලින්ම එන්නේ පාර්ලිමේන්තු පිවිසුම ආසන්නයේ, බෝධිරාජ මාවත අසල තිබෙන ජයන්තිපුර වාහන නැවතුම්පොළට. මම යෝජනා කරනවා, අද පුළුවන් නම් මේ පාර්ලිමේන්තුවේ මැති ඇමතිවරු ගිහිල්ලා ඒ ස්ථානයේ තිබෙන තත්ත්වය බලන්න කියලා. අද කාටවත් එතැනට යන්න බැහැ. කුණුගොඩවල් ගහලා තිබෙනවා. අද දරුවෙකුට එතැනට ගිහිල්ලා කෑම කන්න බැහැ. ඒ වැසිකිළිවලට යන්න බැහැ. දොරවල් නැහැ. ඉටි රෙදි ගහලා තිබෙන්නේ. වතුර නැහැ. ඒකයි තත්ත්වය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එක දවසක් දැක්කා ගාල්ල ප්‍රදේශයෙන් ආපු අපේ මුස්ලිම් පාසලක දරුවන් පැදුරු එළාගෙන පලංගාන්වල දිවා ආහාරය ගන්නවා. එතැන එහෙම ආහාර ගන්න සුදුසු තැනක්ද? අපි මේ ගැන මීට අවුරුදු එකහමාරකට ඉස්සෙල්ලාත් ඔබේ ආණ්ඩුවට කිව්වා. ඔබ Clean Sri Lanka වැඩසටහන ගැන කථා කරනවා. ඔබ රටේ විවිධ තැන්වලට ගිහිල්ලා ඒ ගැන ප්‍රදර්ශන පවත්වනවා; ශ්‍රමදාන කරනවා. හැබැයි, ඔබට මේ අවුරුදු දෙක තිස්සේම තවම බැරි වෙලා තිබෙනවා පාර්ලිමේන්තුව ඉදිරිපිට තිබෙන ඒ ස්ථානය පිරිසිදු කරලා ක්‍රමවත් කරන්න. ඒ සියලු ගොඩනැඟිලි මේ වනකොට දිරාපත් වෙලා. අලංකාරයට තිබුණු ඒ තැන් අද අක්‍රමවත් වෙලා. ඒවා ක්‍රමවත් කරන්න කියලා මම ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඔබතුමන්ලා අදවත් එතැනට ගිහිල්ලා බලන්න, ඒ තැන අපේ දරුවන්ට, පිටතින් එන පුද්ගලයන්ට කෑම ගන්නවත් පහසුකම් තිබෙන සුදුසු තැනක්ද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මා නිහඬ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් අගලකඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.39]

ගරු අජිත් අගලකඩ මහතා
(மாண்புமிகு அஜித் அகலகட)
(The Hon. Ajith Agalakada)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගරු සභාවේ ඉතාම වැදගත් කාරණා දෙකක් සම්බන්ධයෙන් විවාද කරන මේ අවස්ථාවේ මටත් එයට සම්බන්ධ වීමට ලැබීම භාග්‍යයක් කොට සලකනවා.

ඒ දෙකෙන් පළමුවන එක, රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ යෝජනාවයි. ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් වෙත සහන පොලී මත ණය ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන්න අපි බැංකු තෝරාගෙන තිබෙනවා. එම බැංකු පද්ධතිය ඇතුළේ රජයේ අරමුදල් රාජ්‍ය නොවන ආයතනයකට - ඒ කියන්නේ, පළාත් සභා, පළාත් පාලන හෝ රාජ්‍ය ව්‍යවසායන් නොවන ආයතනයකට - ලබා දෙනවා නම් පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම අත්‍යවශ්‍යයි. අපි 2026 සැප්තැම්බර් මාසයේ 04වන දා පෞද්ගලික අංශයේ බැංකු 11කට ඒ සඳහා අනුමැතිය ලබා ගත්තා. අද අපි රජයේ බැංකු 5කට රජයේ අරමුදල් ලබා දීලා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට සහන පොලී මත ණය ලබා දීමේ වැඩසටහන ඉදිරියට කරගෙන යන්න බලාපොරොත්තු වෙනවා.

දෙවැනි අංගය මෙයයි. අපි අය වැය ප්‍රතිපාදන මත රුපියල් මිලියන 25,000ක් වෙන් කරලා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට ණය ලබා දුන්නා. ඒ වෙන් කළ මුදල් ප්‍රමාණය දැන් ඉක්මවා ගොස් තිබෙනවා. මේ වන විටත් බැංකු පද්ධතිය ඇතුළේ රුපියල් මිලියන 13,000ක් වටිනා ව්‍යාපෘති ගොඩගැහිලා තිබෙනවා. මට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමා කිව්වේ, ඉල්ලුම් පත්‍ර 13,000ක් කියලායි. ඉල්ලුම් පත්‍ර 13,000ක් නොවෙයි, ඒවා රුපියල් මිලියන 13,000ක් වටිනා ව්‍යාපෘති. මේ වසර අවසන් වෙන්න තවත් මාස දෙකහමාරක විතර කාලයක් තිබෙන නිසා මෙම කාලය ඇතුළත තවත් රුපියල් මිලියන 7,500ක් වෙන් කරලා ඔවුන්ට එම ණය මුදල් ලබා දීම සඳහා තමයි අපි 2026 අංක 6 දරන පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරලා තිබෙන්නේ. අප වෙන් කරන ලද රුපියල් මිලියන 25,000 වෙනුවට රුපියල් මිලියන 25,966ක් මේ වන විටත් එම ව්‍යවසායකයන් වෙත සහන පොලී මත ණය වශයෙන් ලබා දීලා තිබෙනවා. අද සවස මෙහිදී අනුමත වන මෙම පරිපූරක මුදල හරහා අපි බලාපොරොත්තු වනවා, ඉතිරි රුපියල් මිලියන 7,500ත් හැකි ඉක්මනින් ඔවුන් අතට ලබා දීලා ඔවුන්ගේ ව්‍යාපාර සඳහා සහන සලසන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි, අපේ රටේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සවිබල ගැන්විය යුත්තේ ඇයි කියන කාරණය තමයි මෙතැනදී වැදගත් වන්නේ. ඒ සඳහා අපේ රජය මේ තරම් උත්සුක වන්නේ සහ දැඩි බලාපොරොත්තුවකින් හා අවධානයකින් කටයුතු කරන්නේ ඇයි? අපේ ජාතික ආදායමෙන් සහ ජාතික නිෂ්පාදනයෙන් සියයට 51ක් රටේ ධනවත්ම සියයට 20 අතරේ බෙදිලා යනවා. දුප්පත්ම සියයට 20 අතරේ බෙදෙන්නේ, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5ක විතර ප්‍රමාණයක්. අන්න ඒ නිසා ආදායම් බෙදී යෑමේ දැඩි විෂමතාවක් අපේ රට ඇතුළේ තිබෙනවා. ආදායම් බෙදී යෑමේ විෂමතාව මනින්නේ ගිනි සංගුණකය කියන දර්ශකයෙන්. කිසියම් රටක, ගිනි සංගුණකයේ අගය බින්දුව නම්, ආදායම් බෙදී යෑම ඉතාම සාධාරණව ඒ රට ඇතුළේ සිද්ධ වෙනවා. ගිනි සංගුණකයේ අගය 1 නම්, ඒක ඉතාම අසාධාරණ විධියේ තත්ත්වයක් නිරූපණය කරනවා. අපේ රටේ ගිනි සංගුණකයේ අගය ආසන්න වශයෙන් තිබෙන්නේ 0.49 කියන අගයේ. එහෙම නම් අප ඉන්නේ හොඳ තැනක නොවෙයි. එම නිසා අපේ රටේ සමස්ත ජනතාව අතර අපේ රටේ සමස්ත දේශීය නිෂ්පාදනයේ පංගුව සාධාරණව බෙදිලා යන විධියක් අපි හඳුන්න ඕනෑ. අපි විශ්වාස කරනවා, අපේ රටේ ආදායම් බෙදී යෑමේ විෂමතාව සමනය කර ගන්න අපට පුළුවන් වන්නේ ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ඉහළට ගැනීම තුළින්ය කියලා. එම නිසා අපි ඔවුන් බලගන්වන්න, ශක්තිමත් කරන්න මැදිහත් වෙනවා.

සමස්තයක් විධියට ගත්තොත්, අපේ රටේ කුටුම්භ ආදායමේ - නිවසක ආදායමේ - සාමාන්‍ය අගය රුපියල් 76,414යි. නමුත්, මා ජීවත් වන මොනරාගල දිස්ත්‍රික්කය ගත්තොත්, කුටුම්භ ආදායමේ සාමාන්‍ය අගය රුපියල් 44,943යි. ඒ කියන්නේ, ජාතික වශයෙන් අප කියන ඉලක්කම් දිස්ත්‍රික් අනුවත් වෙනස් වෙනවා. ගිනි සංගුණකය ගත්තත් එහෙමයි. මොනරාගල දිස්ත්‍රික්කයේ ගිනි සංගුණකය තිබෙන්නේ 0.53ක් වැනි අගයක. රටේ සමස්ත අගය තිබෙන්නේ, 0.49ක් ලෙසයි. හැබැයි, මොනරාගල දිස්ත්‍රික්කයේ තිබෙන්නේ 0.53ක. එහෙම නම් ආදායම් බෙදී යෑමේ විෂමතාව

[ගරු අජිත් අගලකඩ මහතා]

පළාතෙන් පළාතටත්, දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයටත් වෙනස් වෙනවා. අපේ ජාතික ආදායමට දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට බස්නාහිර පළාතෙන් 42.4ක් එනකොට ඌව පළාතෙන් එන්නේ 4.7යි. ඒ නිසා මෙන්න මේ වෙනස්කම් සමනය කර ගන්නත් අපට පුළුවන්කම ලැබෙනවා, ක්ෂුද්‍ර පරිමාණ, සුළු පරිමාණ සහ මධ්‍ය පරිමාණ ව්‍යාසායකයන් බලගැන්වීම කරලා. ඒ නිසායි අපි ඒ වෙනුවෙන් මේ තරම් මැදිහත් වෙලා කටයුතු කරන්නේ.

අපේ රටේ ව්‍යවසායකයෝ ඉන්නවා, දළ වශයෙන් මිලියන 1.1ක්; ලක්ෂ 11ක් විතර. ඒ අයගෙන් සියයට 75-80 අතර ප්‍රමාණයක් ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයෝ. ඒගොල්ලෝ අපේ දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 52කට දායකත්වය දක්වනවා. එය ඉතා සැලකිය යුතු ප්‍රමාණයක්. සියයට 52කට ඒගොල්ලෝ දායකත්වය දක්වනවා. එතකොට ඒ සියයට 52 සේවා අංශයෙන් සියයට 43ක්, කෘෂි කර්මාන්ත අංශයෙන් සියයට 32ක්, නිෂ්පාදන අංශයෙන් සියයට 25ක් විධියට තමයි බෙදිලා යන්නේ. ශ්‍රම බලකායෙන් සියයට 45-47 අතර ප්‍රමාණයකට දායකත්වය දක්වනවා, මේ ව්‍යවසායකයන් පිරිස එකතු වෙලා. එතකොට රටක් විධියට මහා පරිමාණ ව්‍යාපාරවලට වඩා ක්ෂුද්‍ර පරිමාණ, මධ්‍ය පරිමාණ, සුළු පරිමාණ ව්‍යසායකයන්ගේ බලාපොරොත්තුව වෙලා තිබෙන්නේ මොකක්ද කියන කාරණයත් අපි මෙහිදී සැලකිල්ලට ගන්න ඕනෑ.

ආදායම් ව්‍යාප්තිය ගත්තොත්, මහා පරිමාණ ව්‍යාපාරයකදී ලාභය, එකතු වන ධනය කේන්ද්‍රගත වන්නේ අතළොස්සක් වෙච්ච කොටස්කරුවන් අතරේයි. හැබැයි, සුළු පරිමාණ ව්‍යාපාරවලදී ඒක ඉතා විශාල පිරිසක් අතරට, ආදායම් අඩු ලොකු පිරිසක් අතරට බෙදිලා යනවා. මේක හොඳ ප්‍රධාන කාරණයක්, මේ ව්‍යාපාර වැඩි වශයෙන් දියුණු කරලා ගන්න. මහා පරිමාණ ව්‍යාපාර ප්‍රාග්ධන සූක්ෂ්ම ව්‍යාපාර විධියට තමයි අප හඳුන්වන්නේ. මොකද, ඒවා වැඩිපුර යන්ත්‍ර සූත්‍ර පාවිච්චි කරලා තමයි කරන්නේ. හැබැයි, මේ කියන ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වැඩි හරියක් ශ්‍රමය මුල් කරගෙන ක්‍රියාත්මක වන නිසා ඒවායෙන් උපදින ධනය වැඩි දෙනෙකු අතට බෙදිලා යනවා. ඒක ආදායම් විෂමතාව, ධනය බෙදී යෑමේ විෂමතාව සමනය කර ගන්න අපට උදව් වෙනවා. ඒ වාගේම ප්‍රවාහන පහසුකම්, වරාය පහසුකම් වාගේ දේවල් නිසා මහා පරිමාණ ව්‍යාපාර අගනගරය, බස්නාහිර පළාත, කොළඹ දිස්ත්‍රික්කය කේන්ද්‍ර කරගෙන තිබුණත්, ග්‍රාමීය මට්ටමට යන්න හොඳම ව්‍යාපාර තමයි මේ කියන ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර. ඒ වාගේම ආර්ථිකයකට එන කම්පනයකදී - shock එකකදී - මහා පරිමාණ ව්‍යාපාර විශාල පිරිසකගේ රැකියා අහිමි කරමින්, බැංකු ක්ෂේත්‍රය අස්ථාවර කරමින් ඇද වැටුණත්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඒ කම්පන අවශෝෂණය කරගෙන, ඔවුන්ගේ ව්‍යාපාර කටයුතු වෙනස් කරමින්, ඒවාට ඔරොත්තු දෙමින් මුහුණ දීමේ හැකියාව ගොඩ නගා ගනිමින් තිබෙනවා. මෙන්න මේ කියන කාරණා වැදගත් වනවා, මේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ශක්තිමත් කර නඟාසිටුවා අපේ ආර්ථිකයේ ශක්තිමත්භාවය පවත්වා ගෙන යෑම වෙනුවෙන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප මේ තත්ත්වය අවබෝධ කරගෙන රුපියල් බිලියන 95ක්, ඒ කියන්නේ රුපියල් මිලියන 95,000කට ආසන්න මුදලක් විවිධ ව්‍යාපෘති හරහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් අතර සහනදායී පොලී මත ණය ලබා ගන්න පුළුවන් විධියට වෙන් කරලා දෙන්න මේ අය වැයෙන් කටයුතු කළා. අද මේ වැඩි කර ගන්නා රුපියල් මිලියන 7,500ත් එක්ක මේ කාලය ඇතුළත රුපියල් මිලියන 32,500ක් ව්‍යවසායකත්ව ධාරිතාව නැංවීම සඳහා වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම පසුගිය අවුරුද්දේ අන්තිමට සිද්ධ වෙච්ච "දිටිවා" සුළි කුණාටුවෙන් හානි වෙච්ච ව්‍යාපාර නංවන්නත් රුපියල් බිලියන 10ක මුදලක් සියයට 3ක පොලියට ව්‍යාපාරිකයන් අතර බෙදා දීමට අපි කටයුතු කර තිබෙනවා. ඒ වාගේම, "සපිරි" ණය යෝජනා ක්‍රමය යටතේ භෝග වගා 34ක් සඳහා ගොවීන්ට රුපියල් මිලියන 25ක මුදලක් අපි ලබා දීලා තිබෙනවා. වී මිල දී ගැනීමට රුපියල් මිලියන 15,000ක් - බිලියන 15ක් - වෙන් කර දී තිබෙනවා. මේ සියල්ල සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් වෙත තමයි ඇදී ගියේ. අද අප මේ වෙන් කරන මුදලත් බෙදී යනකොට මේ අවුරුද්දේ අපි ඉතා විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කරලා තිබෙනවා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් නඟා සිටුවන්නට. නමුත් මේ මැදිහත්වීම් ප්‍රමාණවත් කියලා අපි හිතන්නේ නැහැ. අපේ රටේ සුළු පරිමාණ, මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයෝ මහා පරිමාණ මට්ටමට ගෙන එන එක ඉතාම වැදගත්. මා හිතන විධියට ඒ අය කොටස් වෙළෙඳ පොළේ - මහජන කොටස් වෙළෙඳ පොළේ - ආයෝජනය කිරීම ඉතාම පහළ මට්ටමකයි තිබෙන්නේ. මේ සංඛ්‍යාලේඛනවලින් පෙන්වන්නේ, මේ ගතවෙච්ච අවුරුදු 50ට මහජන කොටස් වෙළෙඳ පොළට එකතු වෙන්න සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ගෙන් පුළුවන්කම ලැබී තිබෙන්නේ 5දෙනෙකුට විතරක් කියන එකයි. එහෙම නම්, අපට තවත් ලොකු ගමනක් යන්න තිබෙනවා. අපි මේ සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ගේ වාණිජමය ශක්‍යතාව අත්පත් කර ගන්න කෙටි කාලීන, දිගු කාලීන, මධ්‍ය කාලීන සැලසුම් හදන්න ඕනෑ; ව්‍යවසායකයන්ගේ ප්‍රාමාණික වර්ධනය සහතික කර ගන්න කෙටි කාලීන, දිගු කාලීන, මධ්‍ය කාලීන සැලසුම් හදන්න ඕනෑ. තුන්වනුව ව්‍යාපාරයේ තිරසරභාවය සහ අනුප්‍රාප්තික සැලසුම්කරණය වෙනුවෙනුත් අපි දැක්මක් සහිතව කටයුතු කරන්න ඕනෑ. මෙතැනදී කෙටි කාලීන කියන්නේ, අවුරුදු 1 - 5. මධ්‍යකාලීන කියන්නේ, අවුරුදු 5 - 25. එතැනින් පස්සේ තමයි, දිගු කාලීන. අන්න එහෙම දැක්මක් ඇතිව, සැලසුමක් සහිතව ගියොත් තමයි ලෝකයේ අනෙක් රටවල් අත්පත් කරගෙන තිබෙන හැකියාවන් මේ ව්‍යවසායකයන් හරහා අපටත් අත් පත් කර ගන්න පුළුවන් වන්නේ. උදාහරණයක් ගත්තොත්, ඉන්දියාවේ දළ දේශීය නිෂ්පාදිතයට මෙකී අංශ ලබා දෙන දායකත්වය සියයට 30යි; බංග්ලාදේශයේ සියයට 30යි; සිංගප්පූරුවේ සියයට 48යි. නමුත්, රැකියා උත්පාදනය ගත්තාම, ලංකාවේ සියයට 47කට, ඉන්දියාවේ මිලියන 110කට, බංගලාදේශයේ සියයට 80කට, සිංගප්පූරුවේ සියයට 65කට රැකියා ලබා දී තිබෙන්නේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් හරහායි. ඒ නිසා අපේ රටේ ආර්ථිකය මේ තිබෙන තැනින් උඩට ගන්න අපි ලබන 12වන දා ඉදිරිපත් කරන 2027 අය වැය ලේඛනයෙන් විශාල මුදල් ප්‍රමාණයක් සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා වෙන් කර තිබෙනවා. ඔවුන් ගැන අපේ විශාල බලාපොරොත්තුවක් තිබෙනවා. ආදායම් විෂමතාව අවම කරමින් අපේ රටේ ආර්ථිකයේ කොදු නාරටිය ශක්තිමත් කර ගන්න ලබන අය වැයෙන් වෙන් කරන මුදලුත්, මේ දක්වා වෙන් කරපු මුදලුත් භාවිත කරමින් ඔවුන් සාර්ථකත්වය කරා යනු ඇතැයි බලාපොරොත්තුවෙන් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තූතියි, කාලය ලබා දුන්නාට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) පී. සත්‍යලිංගම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சாகரிகா அதாவுத)
(The Hon. (Mrs.) Sagarika Athauda, Attorney-at-Law)

විසින් ස්ථිර කරන ලදී
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු සුජීව දිසානායක මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சுஜீவ திசாநாயக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SUJEEWA DISSANAYAKE left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.

[பி.ப. 2.50]

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்தச் சபையில் முன்வைக்கப்பட்டுள்ள பொதுத் தனிசு முகாமைத்துவச் சட்டத்தின் கீழான பிரேரணை மற்றும் அபிவிருத்தி நிதித் திணைக்களத்துடன் தொடர்புடைய குறைநிரப்பு மதிப்பீடு ஆகிய இரண்டு விடயங்கள் தொடர்பாக இன்று நாங்கள் விவாதிக்கின்றோம்.

ஆசிய அபிவிருத்தி வங்கியின் 170 மில்லியன் அமெரிக்க டொலர் நிதி உதவிமூலம் நுண், சிறிய மற்றும் நடுத்தர அளவிலான தொழில்முயற்சியாளர்களுக்கும் விவசாயத் துறையோடு சார்ந்தவர்களுக்கும் கடன் உதவி வழங்கி, இந்த நாட்டின் பொருளாதாரத்தில் மாற்றத்தை ஏற்படுத்துவதற்கான ஒரு நடவடிக்கையாகவே இது காணப்படுகின்றது. எனவே, இதனை நாங்கள் வரவேற்கின்றோம். இந்த நாட்டின் பொருளாதார மீட்சியில் சிறு தொழில்கள், உணவு பதப் படுத்தும் நிறுவனங்கள், உள்ளூர் சந்தைகளுடன் தொடர் புடைய தொழில்முயற்சிகள், கிராமிய உற்பத்திகள், விவசாயம் என்பன முக்கிய பங்கு வகிக்கின்றன.

நாம் வாழும் வன்னிப் பிரதேசத்தைப் பொறுத்தவரையில், விவசாயம், கால்நடை வளர்ப்பு, மீன்பிடி, சிறு வணிகம், உணவு பதப்படுத்தல், விவசாய பெறுமதிசேர் சங்கிலி ஆகியவை எங்களுடைய வாழ்வாதாரத்தின் மிக முக்கிய கூறுகளாகக் காணப்படுகின்றன. இந்த நாட்டில் நுண், சிறிய மற்றும் நடுத்தர தொழில்முயற்சிகளில் ஈடுபடுகின்றவர்கள் பல வகையான இன்னல்களையும் பிரச்சினைகளையும் எதிர்கொள்கின்றார்கள். குறிப்பாக, தங்களுடைய தொழில் முயற்சிகளை விரிவடையச் செய்வதற்கு, குறைந்த வட்டியுடனான கடன் வசதி கிடைக்காமை, கடனுக்கான போதிய பிணை வசதிகள் இல்லாமை, சந்தை வாய்ப்புக் குறைவு, சேமிப்பு மற்றும் குளிரூட்டி பாதுகாக்கக்கூடிய வசதிகள் பற்றாக்குறை, தொழில்நுட்ப அறிவு போதாமை, வணிகம் தொடர்பான போதிய அனுபவமின்மை என்பன முக்கிய தடைகளாக இருக்கின்றன. எனவே, அரசாங்கம் கடன் கொடுப்பதோடு மாத்திரம் நின்றுவிடாமல், இந்த விடயங்களிலும் கூடிய கவனம் செலுத்த வேண்டுமென இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்கின்றேன்.

தொழில்முயற்சியாளர்களுக்கு இலகு கடன்களை வங்கிகள் ஊடாக வழங்குவதன்மூலம் நிச்சயமாக அவர்களுடைய பங்களிப்பையும் இந்த நாட்டின் பொருளாதார அபிவிருத் திக்குப் பெற்றுக்கொள்ளலாமென நான் கருதுகின்றேன். அதேவேளை, கடந்த காலங்களில் இவ்வாறு வழங்கப்பட்ட அரச வாழ்வாதார உதவிகள் மற்றும் கடன்மூலம் கிடைக்கும் நிதி, உற்பத்தித் திறனை உயர்த்தி, வருமானத்தைப் பெறுவதோடு வேலைவாய்ப்பையும் உருவாக்கி, கடனைத் திருப்பிச் செலுத்தும் பொருளாதார நிலைமைக்கு உதவிபெற்றோர் வந்துள்ளார்களா? என்பதையும் ஆராய்ந்து பார்க்க வேண்டும். இவ்வாறான திட்டங்கள் மிகவும் முக்கியமானவையாக இருந்தாலும், இந்த விடயங்களையும் நிச்சயமாகக் கவனிக்கவேண்டிய தேவையிருக்கிறது.

உதாரணத்துக்கு, கடனைப் பெற்று பண்ணை ஒன்றை அமைக்கின்ற ஒருவர், அந்தப் பண்ணையிலிருந்து வருமானத்தைப் பெறும்வரை, தனது பண்ணையைக் கொண்டுநடத்துவதற்கான வசதிகள் இல்லாத நிலையில், குடும்பத்துக்கு உணவு தேவையா அல்லது பண்ணையில் இருக்கின்ற விலங்களுக்கு உணவு தேவையா? என்ற நிலை வரும்போது, கடன் பெற்று வாங்கப்பட்ட பண்ணை விலங்குகளை தனது குடும்பத்தின் உணவுத் தேவைக்காக விற்று, அந்தப் பண்ணை அப்படியே இல்லாமல் போன பல சம்பவங்களை நாங்கள் கடந்த காலங்களில் பார்த்திருக்கிறோம். ஆகவே, ஒரு தொழில்முயற்சியைத் தொடங்கும்போது, அதிலிருந்து வருமானம் கிடைக்கும் வரை அந்தத் தொழில்முயற்சியை எவ்வாறு கொண்டுநடந்தலாம் என்பது தொடர்பாகவும் சிந்திக்கவேண்டிய பொறுப்பு அரசாங்கத்துக்கு இருக்கின்றது.

மேலும், நிதியுதவி உண்மையிலே தகுதியான தொழில் முயற்சியாளர்களுக்குக் கிடைக்கிறதா என்பதே இத்திட்டத்தின் வெற்றியை அளவிடும் முக்கியமான அளவுகோலாகக் காணப்படுகின்றது. ஆகவே, கடன் உதவிகளை வழங்கும் போது, அது தகுதியானவர்களுக்குக் கிடைக்கிறதா என்பதைப் பார்க்கவேண்டிய பாரிய பொறுப்பு இந்த அரசாங்கத்துக்கு இருப்பதுடன், இந்தத் திட்டத்தின் வெற்றி அதில்தான் தங்கியிருக்கின்றது என்பதையும் புரிந்துகொள்ள வேண்டும். மேலும், 11 தனியார் வங்கிகள் மற்றும் 5 அரச வங்கிகள் ஊடாக தொழில்முயற்சியாளர்களுக்கு வழங்கப்படுகின்ற இந்தக் கடன் தொடர்பில் அதிகூடிய கவனமெடுக்க வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

அரசாங்கத்தால் வழங்கப்படுகின்ற குறைந்த வட்டியில் கடனைப் பெறுவதற்காக ஏனைய கடன்களைப் பெறும்போது நிபந்தனைகளாகக் குறிப்பிடப்படுகின்ற இரண்டு பிணையாளி களின் கையொப்பம், காணி உறுதிப்பத்திரம் போன்றவற்றை வங்கிகளில் இந்தத் தொழில்முயற்சியாளர்களிடம் கோருகின் றார்கள். இது எங்களுடைய பிரதேசத்தில் மிகவும் முக்கியமான தொரு பிரச்சினையாக இருக்கின்றது. தொழில்முயற்சியைத் தொடங்குவதற்கு கடனைப் பெறுவதற்கான விண்ணப்பத்தைச் செய்யும்போது, அந்தத் தொழில்முயற்சியை மேற்கொள்ள

[ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා]

වුල්ල කාණික්කුරිය උරුතිප්පත්තිරත්තෛක් කේට්කිරාර්කළ් අල්ලතු ඉරණ්ටු පේර් -guarantorsආක-පිණෛයාළිකළාක කෛයොප්පමිට වේණ්ටුමෙනක් කේට්කිරාර්කළ්. ඒනෙය කටන්කළෛප් පෙරුම්පෝතු ඉරුක්කින්ර අතේ නිපන්තනෛකළෛ ඉවර්කළුක්කුම් විතික්කුම්පෝතු, අවර්කළාල් ඉන්තක් කටනෛ ඉලකුවාකප් පෙරමුටියාත නිලෛ ඒර්පටුකින්රතු.

අණ්මෛයිල් නටෛපෙර්ර වවුනියා මාවට්ට අපිවිරුත්තික් කුළුක් කූට්ටත්තිල්, ඉලංකෛයිලේ ඉව්වාරාන තොළිර්රුරෛකළුක්කු කටනෛප් පෙරුකින්රවර්කළින් එණ්ණික්කෛ මිකවුම් කුරෛන්ත මාකාණමාක වට මාකාණම් ඉරුක්කින්රතෙනත් තෙරිවික්කප්පට්ටතු. ඒනෙනිල්, අංකුළ්ළවර්කළුක්කු වංකිකළ් කෝරුකින්ර උරුතිප්පත්තිරංකළෛයෝ අල්ලතු පිණෛයාළිකළෛයෝ පෙර්රුක්කොළ්ළ මුටියාත නිලෛ ඉරුක්කින්රතු. එනවේ, අරසාංකමානතු ඉව්වාරාන තොළිර්රුරෛයෛ මුන්නේර්රුවතර්කාක ඉලකු කටන්කළෛ වළංකුම්පෝතු, ඉව්වාරාන නිපන්තනෛකළෛප් පූර්ත්තිසෙය්ය මුටියාත තොළිල්මුයර්සියාළර්කළුක්කු මාර්රුත් තිට්ටමොන්රෛ මුන්වෛක්ක වේණ්ටුමෙන නාන් ඉන්තච් චන්තර්ප්පත්තිලේ කේට්ටුක්කොළ්කින්රේන්. අතේපෝල, ඉන්තක් කටන් උතවියෛ වළංකුම්පෝතු ඒර්පටුකින්ර ඉටර්පාටුකළෛ නිවර්ත්তි සෙය්වතර්කාක ඔරු විසේට කුළුවෛ අරසාංකම් නියමික්ක වේණ්ටුම්. අන්තක් කුළුවානතු, ඉව්වාරාන ඉටර්පාටුකළෛ නිවර්ත්ති සෙය්යක්කූටිය ඒර්පාට්ටෛච් සෙය්ය වේණ්ටුමෙන නාන් ඉන්තච් චන්තර්ප්පත්තිලේ කේට්ටුක් කොළ්කින්රේන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩියක අමතර කාලයක් ලැබිලා තිබෙනවා.

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) පත්මනාතන් චත්තියලිංකම්)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
නන්රි!

කෞරව අමෛච්චර් අවර්කළේ, ඉන්ත නිති එව්වාරු ඔතුක්කප්පටුකින්රතු? මාවට්ට අටිප්පටෛයිල් ඒතාවතු ඉලක්කුකළ් ඉරුක්කින්රනවා? ඉන්තක් කටන් උතවි වළංකුවතිල් පෙණ් තලෛමෛත්තුවක් කුටුම්පංකළුක්කු ඒතාවතු විසේටමාන ඒර්පාටුකළ් ඉරුක්කින්රතා? ඉළම් තොළිල්මුයර්සියාළර්කළුක්කු විසේටමාන චන්තර්ප්පංකළ් වළංකප්පටුකින්රනවා? පෝරුක්කුප් පින්තිය වාළ්වාතාරත්තෛ මීළමෛක්කුම් කුටුම්පංකළුක්කු විසේටමාන ඔළුංකුකළ් මේර්කොළ්ළප්පටුකින්රනවා? සිරු විවසායිකළ් මර්රුම් කූට්ටුරවු නිරුවනංකළුක්කු ඒර්ර කටන් නිපන්තනෛකළ් අමෛක්කප්පට්ටුළ්ළනවා? එන්පන තොටර්පිලුම් නීංකළ් කවනමෙටුක්ක වේණ්ටුමෙනක් කේට්ටුක් කොළ්කින්රේන්. අත්තුටන්, වංකික් කටනුක්කුත් තේවෛයාන පිණෛ වසතිකළ් ඉල්ලාතවර්කළුක්කු මාර්රු උත්තරවාත මුරෛයොන්රෛ නිච්චයමාක උරුවාක්ක වේණ්ටුමෙනවුම් කෞරව අමෛච්චර් අවර්කළෛක් කේට්ටුක්කොළ්කින්රේන්.

අටුත්තු, කටන් වළංකුවතු මට්ටුම් පෝතාතු. කටනුටන් තොළිල්නුට්ප ආලෝචනෛ, කණක්කියල් මර්රුම් වණික මුකාමෛත්තුවප් පයිර්චි, චන්තෛවාය්ප්පුකළෛ ඒර්පටුත්තික් කොටුත්තල්, පොරුට්කළෛච් චේමික්කුම් වසතිකළ් මර්රුම් විළෛපොරුට්කළෛ පෙරුමතිචේර් පොරුට්කළාක මාර්රුවතර් කුරිය වසතිකළ් එන්පනවුම් වළංකප්පටල් වේණ්ටුම්. ඉවෛ එල්ලාවර්රුක්කුම් මේලතිකමාක, අවර්කළුක්කාන චන්තෛ වාය්ප්පු ඉල්ලාත නිලෛ වරුම්පෝතු, අවර්කළින් උර්පත්ති නිච්චයමාක නාට්ටින් පොරුළාතාර අපිවිරුත්තික්කු උරුතුණෛයාක ඉරුක්කාතු එන්පතෛ ඉන්තච් චන්තර්ප්පත්තිලේ නාන් චොල්ලික්කොළ්ළ විරුම්පුකින්රේන්.

නාම් ඉන්නුමොරු විටයත්තෛයුම් පාර්ක්ක වේණ්ටුම්. කටන්ත අරසාංක කාලත්තිල් ඉව්වාරු වළංකප්පට්ට නිතියිල් එව්වළවු පයන්පටුත්තප්පට්ටුළ්ළතු? ඉන්ත නිති ඌටාක එත්තනෛ තොළිල්මුයර්සියාළර්කළ් පයනටෛන්තුළ්ළාර්කළ්? එත්තනෛ වේලෛවාය්ප්පුකළ් උරුවාක්කප්පට්ටුළ්ළන? පෝන්ර විටයංකළ් තොටර්පිලුම් ආරාය වේණ්ටුම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා
(මාණ්පුමිකු (වෛත්තියර්) පත්මනාතන් චත්තියලිංකම්)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)
ඔරු නිමිටම් තාරුංකළ්!

ඉරුතියාක, උලකප් පොතුමරෛයාම් තිරුක්කුරළිලිරුන්තු ඔරු කුරළෛ ඉංකු චොල්ලලාමෙන නිනෛක්කින්රේන්.

" ඉයර්රලුම් ඊට්ටලුම් කාත්තලුම් කාත්ත
වකුත්තලුම් වල්ලතු අරසු"

ඉතන් පොරුළ් එන්නවෙන්රාල්, වරුවායෛ උරුවාක්කුතල්, පොරුළෛ ඊට්ටුතල්, ඊට්ටිය වළත්තෛප් පාතුකාත්තල්, අතෛ මුරෛයාකප් පකිර්න්තු චෙලවිටුතල් ආකියවර්රිල් තිරමෛයුටෛයතේ අරසු එන්පතාකුම්. අව්වාරාන ඕර් අරසාක උංකළුටෛය අරසු ඉරුක්ක වේණ්ටුමෙනක් කේට්ටු, නන්රි කූර විටෛපෙරුකින්රේන්. වණක්කම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මුනීර් මුලාෆර් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.00]

ගරු මුනීර් මුලාෆර් මහතා (ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු මුනීර් මුලාපර් - චමය මර්රුම් කලාචාර අලුවල්කළ් පිරති අමෛච්චර්)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of Religious and Cultural Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දිනයේ අපි සංවාදයට අරගෙන තිබෙන්නේ 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ වන යෝජනාව සහ 2026 අංක 06 දරන පරිපූරක ඇස්තමේන්තුවයි. නමුත්, පසුගිය සති දෙකක් පුරාවටම අපේ රටේ සිදුවෙච්ච බොහෝ කරුණු කාරණා පිළිබඳව ශ්‍රී ලාංකික පුරවැසියන් ලෙසත්, ආණ්ඩුව ලෙසත් අවධානය යොමු කළේ කොහොමද කියන කාරණය පිළිබඳව සඳහන් කරන්න මේ වෙලාවේ මම බලාපොරොත්තු වනවා.

අපි හැම කෙනාටම මතකයි, සිවරාසා අනෝජන් කියන තරුණයා මුහුණුපොත තුළ යම් සටහනක් කිරීම නිසා සවුදි අරාබියේදී ඔහුට මුහුණ දෙන්න සිදු වුණු ඉරණම පිළිබඳව. ඒ

අවස්ථාවේදී විවිධ පාර්ශ්ව මාධ්‍ය ඉදිරියට ඇවිල්ලා, සමාජ මාධ්‍ය ඔස්සේ සහ විවිධ තැන්වල ඒ පිළිබඳව සාකච්ඡා කරන්න යෙදුණා. සමහර නායකයින් දුරකථනවලින් පවා ආමන්ත්‍රණය කළා. ඒ හැම කෙනා තුළම උත්සාහයක් තිබුණා, කෙසේ හෝ තමන් මේ ප්‍රශ්නයට මැදිහත් වුණා කියලා පෙන්වන්න. ඔවුන් සිවරාසා අනෝජන් කියන තරුණයා වෙනුවෙන් පෙනී සිටින ගමන්, මේ කාරණාවට රජයක් ලෙස අප ලබා දෙන අවධානය ප්‍රමාණවත් නැහැ කියලා ආණ්ඩු පක්ෂයට දැවැන්ත චෝදනාවක් එල්ල කරන්නත් පටන් ගත්තා. විශේෂයෙන් අපට ජාත්‍යන්තර වශයෙන් තිබෙන සම්බන්ධතාවල අඩුපාඩු පිළිබඳව මෙහිදී විවිධ කරුණු කාරණා මතු කළා. හැබැයි මා සතුටු වනවා, ඒ සංවේදී කාරණාවෙන්, ඒ සංවේදී සිද්ධියෙන් දේශපාලන වාසි ගන්න කිසිම අවස්ථාවක කටයුතු නොකොට, අවංකව ඒ තරුණයාගේ නිදහස වෙනුවෙන් ආණ්ඩුව හැම විටම කටයුතු කිරීම පිළිබඳව. මේ වෙලාවේ ඒක මට ආඩම්බරයෙන් කියන්න පුළුවන්.

අපේ ජනාධිපතිතුමා, විදේශ කටයුතු ඇමතිතුමා ඒ පවුලේ අය හා සම්බන්ධ වෙච්ච අවස්ථාවේ අපි ඔවුන්ට පොරොන්දුවක් ලබා දුන්නා, හැම විටම ඔබ ධෛර්යයවත්ව ඉන්න, ආණ්ඩුවක් ලෙස අපි මේකට මැදිහත් වනවා කියලා. මම මේ රටේ ජනතාවට ස්තුතිවන්ත වනවා. මොකද, සිංහල, දෙමළ, මුස්ලිම් කියලා ජාති භේදයකින් තොරව, බෞද්ධ, හින්දු, ඉස්ලාම්, කතෝලික කියලා ආගම් භේදයකින් තොරව මේ රටේ සුවහසක් ජනතාවට තිබුණු එකම බලාපොරොත්තුව වුණේ ඔහුව මේ ඉරණමෙන් ගලවා ගැනීමයි. ඒ වෙනුවෙන් ඔවුන් සියලුදෙනා හදවතින් ප්‍රාර්ථනා කළා. ඔවුන් හදවතින් එලෙස ප්‍රාර්ථනා කරන ගමන්, රජයේ මැදිහත් වීමෙන් ඔහුට ලැබී තිබුණු දඬුවම ලිහිල් කරගන්න පුළුවන් වුණා. මම කියන්න කැමැතියි, ආණ්ඩුවක වගකීම මාධ්‍යයට voice -cuts දීම හෝ ශබ්ද නඟා කරුණු කීම නොවෙයි කියලා. ඒ වෙනුවෙන් අවංකව, හෘදය සාක්ෂියට එකඟව කටයුතු කිරීමයි වැදගත් වන්නේ. ඒ පිළිබඳව එයට මැදිහත් වෙච්ච විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ෆයිසර් මුස්තාපා මැතිතුමා ඉතා පැහැදිලිව සඳහන් කළා.

ඒ සිද්ධිය එහෙම නොවුණා නම් සමහර පිරිස් බලාපොරොත්තුවෙන් හිටියා, ඒ මත්තෙන් තමන්ගේ දේශපාලනය උඩට අරගෙන ජාතිවාදය නැවත මතු කරමින්, රටේ පවතින සාමකාමී තත්ත්වයට පහරක් එල්ල කරමින් රජයට ඒ වගකීම පවරන්න. ඔවුන් එවැනි උත්සාහයක් දැරුවා. හැබැයි රජය ඒ වෙනුවෙන් සෘජුව, අවංකව මැදිහත් වෙලා ඒ කටයුත්ත සිද්ධ කළා.

අපි දැක්කා, විපක්ෂ නායකතුමා පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කරන හැම කථාවකම "ටොන් පව" කියන වචනය පාවිච්චි කළ ආකාරය. ආණ්ඩුව හැම විටම පව කියන වග එතුමා සඳහන් කරනවා. හැබැයි මාධ්‍ය ඉදිරියටත්, අපි හැම කෙනාම ගෞරව කරන මහා නායක ස්වාමීන් වහන්සේලා ඉදිරියටත් ගිහින් පට්ටපල් බොරු - පව - කියන්නේ කවුද කියන එක මේ රටේ ජනතාවට ඉතා පැහැදිලිව සනාථ වුණා. මම ඒක දකින්නේ දෛවයේ සරදමක් ලෙසයි. "සමගි" කියන වචනයේ තේරුම වශයෙන් මම විශ්වාස කරන්නේ, සියලු ජාතීන් ඒක රාශි කරගෙන සමගි සම්පන්නව ජීවත් වීම හා ඒ වෙනුවෙන් තමන් දරන මහජන නියෝජිතකම පාවිච්චි කිරීමයි. හැබැයි, එතුමා එදා එතැනට ගිහිල්ලා රටේ ජනතාව වැරදි දිශාවකට යොමු කිරීම සඳහා අවුස්සන්න හැදුවා. වැරදි කෝණයෙන් ජනතාව ඇවිස්සීම සඳහා කටයුතු කළා. මේ රටේ ජීවත් වන විවිධ පිරිස් සතුටු කරන්න සමහර සිද්ධිවලදී මේ මේ කාර්යයන් කළා කියන එක මතු කරන්න හැදුවා. ඇත්තටම මම විශ්වාස කරන දේ තමයි, තමන් ප්‍රසිද්ධියේ කියන දේවල්වලට වඩා තමන් අවංකව විශ්වාස කරන අය ළඟට ගිහිල්ලා යම් කාරණාවක් කියනවා නම්, එවැනි අවස්ථාවලදී එළියට එන්නේ ඔවුන්ගේ හෘදය සාක්ෂිය තුළ තිබෙන අවංක ප්‍රතිපත්තියයි කියන එක. මම හිතන විධියට, එදා ඒ සිද්ධිය හරහා ඔවුන් කොතැනද හිටගන්නේ, කාත් එක්කද හිටගන්නේ, ඔවුන්ගේ අභිලාෂය මොකක්ද කියන එක රටට ඔප්පු වුණා පමණක් නොවෙයි, සමගි ජන බලවේගය තුළ ඉන්න සමහර මන්ත්‍රීවරුන්ට සමහර අවස්ථාවලදී මාධ්‍ය ඉදිරියට ඇවිල්ලා එයට උත්තර දීගන්නත් බැරි තත්ත්වයක් උදා වුණා. අපි රටක් ලෙස හැම විටම හිතන්න ඕනෑ අපි නැවත නැවතත් මෙවැනි තත්ත්වයකට ද යා යුත්තේ කියන එකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික උරුමයන්, ඒ වාගේම සංස්කෘතිය ආරක්ෂා කිරීම පිළිබඳ ආසියානු සමුළුවකට සහභාගි වීම නිමිත්තෙන් මම දවස් පහක විදේශ සංචාරයක යෙදී සිටියා. ඒ රටවලට ගියාම අපට දැනෙනවා, අපේ ප්‍රශ්නය මොකක්ද, රටක් ලෙස අපි කොතැනද ඉන්නේ කියන එක. ඇත්තටම ඒ රටවල් හැම අතින්ම කොතැනද ඉන්නේ කියන එක එහිදී අපට හිතාගන්න පුළුවන් වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බලය ලබා ගැනීමේ අරමුණෙන් මේ රටේ ප්‍රතික්ෂේප කළ යුතු, පරාජය කළ යුතු ජාතිවාදය නැවත නැවතත් ඇවිස්සීම හා ලැබෙන හැම අවස්ථාවකම සමගිය ගැන කථා කළත්, සමගිය විනාශ කරන දේවල් වෙනුවෙන් පෙනී සිටීම කොතරම් වේදනාකාරීද කියන එක අවංකව අපට කල්පනා කරන්න වෙනවා.

මා කථා කරන්න බලාපොරොත්තු වන ඊළඟ කාරණාව වන්නේ, මීට දින දෙකකට පෙර සියලුදෙනාගේම කථා බහට ලක්වෙච්ච අකුරණ අනතුර සම්බන්ධව වෛද්‍යවරයෙකු විසින් සමාජ මාධ්‍ය තුළ කරපු ප්‍රකාශයයි. මොකද, පසුගිය දිනවල හැම කෙනාම වාගේ ඒ පිළිබඳව කථා කළා. මම හිතන විධියට, ඇත්තටම අපි කල්පනා කළ යුත්තේ ඒ වෛද්‍යවරයා පිළිබඳව නොවෙයි. අපි පසුගිය අවුරුදු 20ක කාලය තුළ දේශපාලන වාසි වෙනුවෙන් මේ රට මොන තරම් නරුම තැනකට ගෙනැත් තිබෙනවාද කියන එකේ සැබෑ විකාශනය තමයි ඒ ප්‍රකාශය තුළ තිබෙන්නේ. අපි සාමාන්‍යයෙන් වෛද්‍යවරුන්ට පාවිච්චි කරන්නේ "වෙද හාමුදුරුවරු" කියන වචනයයි. එතරම් විශ්වාසයෙන් තමයි අපි එතුමන්ලා සම්බන්ධව කටයුතු කරන්නේ. මා මෙය උච්චාරණය කරන අයුරු වැරදි නම් නිවැරදි විය යුතුයි. "යාදිසං වපතේ බීජං තාදිසං හරතේ පලං" කියන පණිවුඩය තුළ තිබෙන්නේ "අපි වපුරන දේ තමයි හැම විටම අපට නෙළන්න වෙන්නේ" කියන එකයි. ඒ සුවිශේෂී පණිවුඩය තුළ තවත් තැනක තිබෙන දෙයක් තමයි, "සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා" කියන කාරණාව. සියලුදෙනාගේම සුවපත්භාවය පිළිබඳව තමයි අපට උතුම් බෞද්ධ ධර්මය තුළිනුත් පණිවුඩය ලබා දීලා තිබෙන්නේ. හැබැයි, අවාසනාවකට අපි දේශපාලනඥයන් ලෙසත්, ශ්‍රී ලාංකික පුරවැසියන් ලෙසත් කල්පනා කළ යුතුයි, වෛද්‍යවරයෙක් යම් ජාතියක් ඉලක්ක කරමින් "ඔවුන් මැරිලා ගියාට කමක් නැහැ" කියලා ප්‍රකාශයක් කරනවා නම් කොතරම්දුරට ඒ මනසවල් සුවපත් නොවී තිබෙනවාද කියන එක. මේක මුස්ලිම් සමාජයටත් අදාළයි. මේ රටේ ඉන්න සියලුදෙනාටත් අදාළයි.

රටක් ගොඩනඟන්න නම්, අපි හැම කෙනාටම සුවපත් මනසක් අත්‍යවශ්‍යයි. සුවපත් මනසකින් තොරව අපට හොඳ රටක් කවරදාකවත් බිහි කරන්න බැහැ. අපි හැමකෙනාම බලාපොරොත්තු වන්නේත් සුවපත් ජාතියක් ලෙස හොඳින් ජීවත් වෙන්න ඕනෑය කියන පරමාර්ථයත් එක්ක ජීවත් වන සමාජයක්. මේ දේවල් පාලකයන් ලෙස අපට විශාල පණිවුඩ. මේ පණිවුඩ අරගෙන මේ සමාජය වෙනස් කරන්න අපි හැමකෙනාම එකතු වෙලා වැඩ කරමු කියමින් මම නිහඬ වෙනවා.

ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගයාන් ජනක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.10]

ගරු ගයාන් ජනක මහතා
(மாண்புமிகு கயான் ஜனக)
(The Hon. Gayan Janaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිදහසින් පස්සේ අවුරුදු 76ක් රට පාලනය කරලා, අඩුම තරමින් මිනිස්සුන්ගේ මූලික අවශ්‍යතා වන පෝෂ්‍යදායී ආහාර වේලක්, ඉන්න හිටින්න පුළුවන් නිවාසයක් ලබා දෙන්න බැරි වෙච්ච මේ අය දැන් අපි ආණ්ඩුවක් අරගෙන අවුරුදු දෙකක කාලයක් ගත වෙනකොට අපෙන් අහනවා, මොනවාද මේ ආණ්ඩුව කරලා තිබෙන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ජනතාව අපට භාර දුන්නේ එක තැන නැවතිලා තිබුණු රටක්, බංකොලොත් කරපු රටක්. ඒ බංකොලොත් කරපු රට, එක තැන නැවතී තිබුණු රට භාරගෙන තමයි අපි මේ මොහොත වනකොට ගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් මේ රට ඉතාම ස්ථාවරව ගොඩනඟමින් යන්නේ. කල්පනා කරලා බලන්න, මූලික අවශ්‍යතා ටිකවත් ජනතාවට දීගන්න බැරි වුණු පාලකයෝ හිටපු රටක, ඉතාම කෙටි කාලයක් තුළ මොන තරම් දේවල් අපි කරලා තිබෙනවාද කියලා.

අපි පුත්තලම දිස්ත්‍රික්කය ගත්තොත්, පසුගිය ආණ්ඩු ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව මඟින් "ප්‍රජා ජල අභිමානී" කියලා ව්‍යාපෘති ගණනාවක් පුත්තලම දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කරලා, ඒවා කර ගන්න බැරිව නවත්වා තිබුණේ. 2019-2020 කාලයේදී තමයි ඒ ව්‍යාපෘති ආරම්භ කරලා තිබුණේ; ව්‍යාපෘති 22ක්. ඒ ව්‍යාපෘති 22ම 2019න් පස්සේ නවත්වා තිබුණේ. ඒ විතරක් නොවෙයි, ප්‍රතිසංස්කරණය කරමින් තිබුණු ජල ව්‍යාපෘති - කලින් කිව්වේ අලුතින් ආරම්භ කරපු ඒවා - 11ක් ඒ තැන්වලම නවත්වා තිබුණේ. අපි බලයට ඇවිල්ලා මේ ගෙවුණු කාලය තුළ "ප්‍රජා ජල අභිමානී" ව්‍යාපෘති 22ම මේ මොහොත වෙනකොට ආරම්භ කරලා තිබෙනවා. ඒ ව්‍යාපෘති 22ම මේ වෙනකොට ක්‍රියාත්මක කරන්න පටන් අරගෙන තිබෙනවා. අපි ඒ වෙනුවෙන් පසුගිය කාලයේ රුපියල් මිලියන 1,017ක් වෙන් කරලා තිබෙනවා. අද වනකොට ඒ ව්‍යාපෘති ඉතාම හොඳින් ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. අපි මේ වෙනකොට ව්‍යාපෘති 2ක් අවසන් කරලා තිබෙනවා. තවත් ව්‍යාපෘති 6ක් අපි සියයට 95ක මට්ටමින් අවසන් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අනෙක් සියලු ව්‍යාපෘතිවලින් සියයට 65කට වැඩි ප්‍රගතියක් අපි මේ වෙනකොට අත්පත් කරගෙන තිබෙනවා. ඒවා නැවතී තිබුණු ව්‍යාපෘති; නවත්වා තිබුණු ව්‍යාපෘති. අපි බලයට ඇවිල්ලා ගෙවුණු ඉතා කෙටි කාලය තුළ නැවත ඒවා ආරම්භ කළා.

ප්‍රතිසංස්කරණය කරමින් තිබුණු ව්‍යාපෘති 11න්, 1ක් ඇත්තටම වතුර නැති නිසා නවත්වන්න වෙලා තිබෙනවා. තව ව්‍යාපෘතියක යම් ප්‍රමාදයක් තිබෙනවා, විශේෂිත ප්‍රශ්නයක් නිසා. නමුත් අනෙක් ව්‍යාපෘති 9ම ආරම්භ කර එයින් 4ක කටයුතු අවසන් කර තිබෙනවා. අනෙක් ව්‍යාපෘති 5 දැන් අවසන් අදියරේ තිබෙන්නේ. පුත්තලම දිස්ත්‍රික්කයේ කාලයක් තිස්සේ ජල අවශ්‍යතාවෙන් පෙළුණු මිනිස්සුන්ට ඉතා කඩිනමින් වතුර ටික ලබා දෙන්න වත්මන් රජය මේ වෙනකොට කටයුතු කරමින් ඉන්නවා. මේ ව්‍යාපෘති ටික සම්පූර්ණ කළා කියලා පුත්තලම දිස්ත්‍රික්කයේ ජීවත් වන ජනතාවගේ ජල අවශ්‍යතාව සම්පූර්ණ වෙන්නේ නැහැ. ඒ නිසා අපි මේ මොහොත වෙනකොටත් මාඔය හරස් කර වතුර ලබා ගැනීම පිළිබඳව, ඒ වාගේම කලා ඔය හරස් කර වතුර ලබා ගැනීම පිළිබඳව සාකච්ඡා කරමින් තිබෙනවා. ඒ වාගේම ඉහිනිමිටිය ජලාශයෙන් ආණමඩුව පැත්තේ ජීවත් වන මිනිස්සුන්ට වතුර ටික ලබා දෙන්නේ කොහොමද කියන සාකච්ඡාවත් මේ වෙනකොට ආරම්භ කර තිබෙනවා. ඒ අනුව ඒවා ක්‍රියාත්මක තලයකට ගෙනෙන්න අවශ්‍ය මූලික අදියර ආරම්භ කරන්න අපට පුළුවන්කම ලැබී තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, බරපතළ නිවාස ප්‍රශ්නයක් පුත්තලම දිස්ත්‍රික්කයේ ජනතාවට තිබෙනවා. වත්මන් විපක්ෂයේ සිටින අය අවුරුදු 70ක් මේ රට පාලනය කළා. මම කියන්න කැමැතියි, පුත්තලම දිස්ත්‍රික්කය තුළ ජීවත් වන 30,000කට ආසන්න ප්‍රමාණයකට නිවාස නැති බව. අපි මේවාට ක්‍රමානුකූලව උත්තර හොයමින් යනවා. තමුන්නාන්සේලා දන්නවා, මේ මොහොත වනවිටත් අපේ රටේ විවිධ අමාත්‍යාංශ ගණනාවක් හරහා නිවාස ලබා දෙන වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කරමින් සිටින බව. විශේෂයෙන්ම ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය කියන මේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු හරහා මේ රටේ මේ අවුරුද්ද තුළ නිවාස 31,000ක් හදා දෙන වැඩ පිළිවෙළක් අපි ආරම්භ කර තිබෙනවා. ඒ යටතේ අපි පුත්තලම දිස්ත්‍රික්කයේ නිවාස 500කට වැඩි ව්‍යාපෘතියක වැඩ කටයුතු ආරම්භ කළා. මේ වෙනකොට එයින් සැලකිය යුතු ප්‍රමාණයක වැඩ කටයුතු අවසන් කරමින් තිබෙන්නේ. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හරහා අපි නිවාස 430ක් හදන්න වැඩ කටයුතු ආරම්භ කර තිබෙනවා. මේ වනවිට එයින් නිවාස 200ක් හදා අවසන් කර තිබෙනවා.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හරහා ක්‍රියාත්මක වුණු නිවාස වැඩ පිළිවෙළ පසුගිය කාලයේ - වත්මන් විපක්ෂය ආණ්ඩු කළ කාලයේ - නවත්වා තිබුණේ. රුපියල් ලක්ෂ 6ක විතර මුදලක් තමයි ඔවුන් ඒ කාලයේ නිවාසයක් වෙනුවෙන් වෙන් කර තිබුණේ. ඒ විධියට නවත්වා තිබුණු, රුපියල් ලක්ෂ 6ක මුදලක් විතරක් ලබා දුන් එම ව්‍යාපෘතිය අපි නැවත ආරම්භ කළා. අපි එක නිවාසයක් වෙනුවෙන් රුපියල් ලක්ෂ 10ක මුදලක් වෙන් කර එම කටයුතු නැවත ආරම්භ කර තිබෙනවා. ඒ අනුව මේ මොහොත වෙනකොට පුත්තලම දිස්ත්‍රික්කයේ විතරක් නිවාස 500කට වැඩි ප්‍රමාණයක් සැදීමේ කටයුතු අපි ආරම්භ කර තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි ඒ විධියට තමයි නිවාස ප්‍රශ්නයට කඩිනමින් උත්තර හොයමින් යන්නේ.

ඒ විතරක් නොවෙයි, ඔබ අපි කවුරුත් දන්නවා, අපේ රටේ ඉතිහාසය තුළ අපි මුහුණ දුන් දැවැන්තම ව්‍යසනය තමයි "දිට්වා" ආපදාව කියන්නේ. පුත්තලම දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරී වසම් 548ක් තිබෙනවා. එයින් ග්‍රාම නිලධාරී වසම් 546කටම මේ "දිට්වා" ආපදාව බලපෑවා. පවුල් 125,000කට වැඩි ප්‍රමාණයකට එය බලපෑවා. පුද්ගලයින් වශයෙන් ගත්තොත්, 460,000කට වැඩි ප්‍රමාණයක් එම ව්‍යසනයට මුහුණ දුන්නා. එම ව්‍යසනය නිසා අර්ධ නිවාස හානි 17,490ක් සිද්ධ වුණා, පූර්ණ නිවාස හානි 3,285කට වැඩි ප්‍රමාණයක් සිද්ධ වුණා. පූර්ණ නිවාස හානි 3,285න් මේ මොහොත වෙනකොට අපි නිවාස 967ක් හදන්න වැඩ කටයුතු ආරම්භ කර තිබෙනවා, පළමුවැනි වාරිකය වන රුපියල් ලක්ෂ 20 මුදල ලබා දීලා. අපි ඒ ආකාරයට එම ගෙවල් හදන්න පටන් ගෙන තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "දිට්වා" ආපදාව නිසා අපේ රටේ විනාශයට පත් වුණු නිවාස සංඛ්‍යාව ගත්තොත්, 2025 වර්ෂයේ දෙසැම්බර් මාසයේ 31වැනි දා වෙනකොට පුත්තලම

දිස්ත්‍රික්කයේ විතරක් නිවාස 618ක් තිබුණා. නමුත් මේ මොහොත වෙනකොට, ඒ කියන්නේ 2026.10.01වැනි දා වෙනකොට එම ප්‍රමාණය 3,285ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. ඒ කොහොමද? අපේ රටේ නිවසක් හදා ගන්න බැරිව තාවකාලිකව පොල් අතුවලින් වසාගෙන, ඉටි රෙදි ගසාගෙන - එක එක අමුද්‍රව්‍ය යොදා ගනිමින් - අස්ථාවර නිවාස හදාගෙන හිටපු ජනතාවත් ඒ කොටසට ඇතුළත් වුණා. විශේෂයෙන්ම ජනාධිපතිතුමාගේ මහ පෙන්වීම යටතේ කලින් තිබුණු චක්‍රලේඛය වෙනස් කරලා අලුත් චක්‍රලේඛයක් නිකුත් කළ එකේ ප්‍රතිඵලයක් විධියට තමයි එම කටයුතු සිද්ධ වුණේ. කලින් තිබුණු චක්‍රලේඛය අනුව නිවාස 618ක් විතරයි හදා දෙන්න පුළුවන්කම තිබුණේ. නමුත් අලුත් චක්‍රලේඛය අනුව එම නිවාස ප්‍රමාණය 3,285ක් දක්වා වැඩි කරගන්න අපට පුළුවන්කම ලැබී තිබෙනවා. මේ විධියට චක්‍රලේඛ වෙනස් වුණේ නැත්නම් ඒ පවුල්වල මිනිසුන්ට තමන්ගේ ජීවිත කාලය තුළ සමහර විට තමන්ගේ දරුවන්ටවත් නිවාසයක් හදලා දෙන්න බැරි වෙන්න තිබුණා. පොඩ්ඩක් කල්පනා කරලා බලන්න. අපි මේ රටේ නීති වෙනස් කරලා තිබෙනවා; නීති හදලා තිබෙනවා; චක්‍රලේඛ හදලා තිබෙනවා; චක්‍රලේඛ සංශෝධනය කරලා තිබෙනවා. මේ හැම දෙයක්ම ජනතාවට වාසි ගෙනෙන විධියට තමයි අපි කරලා තිබෙන්නේ. ඒ අනුව තමයි මේ 618ක් වූ නිවාස ප්‍රමාණය පැරණි චක්‍රලේඛ සංශෝධනය කිරීම හරහා 3,285ක් දක්වා වැඩි කරගන්න අපට පුළුවන්කම ලැබී තිබෙන්නේ.

ඒ විතරක් නොවෙයි. පසුගිය කාලයේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය මඟින්, විශේෂයෙන්ම පුත්තලම දිස්ත්‍රික්කයේ ග්‍රාමීය මාර්ග සංවර්ධනය සඳහා විශාල මුදලක් වෙන් කර තිබෙනවා. අපි ඒ මාර්ග පද්ධතිය ඉතාම හොඳින් සහ ඉතා වේගයෙන් සංවර්ධනය කරගෙන යනවා. අපි පාරවල් හදනවා විතරක් නොවෙයි, ඒ පාරවල්වලට අවශ්‍ය කරන බස් රථ ලබා දෙන්නටත් කටයුතු කරනවා. විශේෂයෙන්ම නාගරික වශයෙන් ගත්තොත්, මෙට්‍රෝ බස් රථ සේවාව පටන් අරගෙන තිබෙනවා. ප්‍රමුඛතාව අනුව ග්‍රාමීය පාරවලට බස් රථ ලබා දීම සඳහා අපි මේ මොහොත වනවිට ක්‍රමානුකූලව ආරම්භක සාකච්ඡා පවත්වමින් සිටිනවා. ග්‍රාමීය මාර්ග හදනවා විතරක් නොවෙයි, ඒ විධියට බස් රථ ලබා දෙන්නත්, නගර සංවර්ධන වැඩසටහන් තුළ නගර සංවර්ධනය කරන්නත් රජයක් ලෙස අපි මේ වනවිට කටයුතු කරලා තිබෙනවා.

පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගර 8ක් තිබෙනවා. හලාවත නගරය මේ අවුරුද්දේ සංවර්ධනය කිරීමටත්, පුත්තලම නගරය සහ නාත්තන්ඩිය නගරය ලබන අවුරුද්දේ සංවර්ධනය කිරීමටත් "Life Cities" නගර සංවර්ධන වැඩසටහනට ඇතුළත් කරලා තිබෙනවා. ඒ අනුව, ලබන අවුරුද්ද අවසන් වෙනකොට ප්‍රධාන නගර 8න් නගර 3ක්ම අපි මේ නගර සංවර්ධන සැලසුම් තුළට එකතු කරලා, සංවර්ධනය කරනවා. ඉදිරි අවුරුදු කිහිපය තුළ මේ නගර ඉතාම පහසුකම් සහිත නවීන නගර බවට පත් කරන්න කටයුතු කරමින් යනවා. ඒ විතරක් නොවෙයි, කටුනායක දක්වා ඇවිත් තිබෙන අධිවේගී මාර්ගය ඉදිරි අවුරුද්ද තුළ හලාවත දක්වා දීර්ඝ කිරීමට අපි මේ වනවිට කටයුතු කරමින් සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

ගරු ගයාන් ජනක මහතා
(மாண்புமிகு கயான் ஜனக)
(The Hon. Gayan Janaka)
මට තව සුළු වේලාවක් ලබා දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ විතරක් නොවෙයි, "ප්‍රජා ශක්ති" වැඩසටහන හරහා ග්‍රාමීය දිළිඳුභාවය තුරන් කිරීමට රුපියල් මිලියන 25,000ක් වෙන් කර තිබෙනවා. ඒ මිලියන 25,000 පාවිච්චි කරලා පුත්තලම දිස්ත්‍රික්කය තුළ අපි ව්‍යාපෘති 900 ගණනක් ක්‍රියාත්මක කරනවා. සෑම ගමකටම මිලියන එක, දෙක බැගින් වෙන් කරලා ග්‍රාමීය දිළිඳුභාවය තුරන් කරන්න අපි මේ වෙනකොට කටයුතු කරමින් සිටිනවා. වැව් අමුණු හදන්න අපි රුපියල් මිලියන 24,000ක් වෙන් කර තිබෙනවා. ඒ තුළින් ග්‍රාමීය වශයෙන් තිබෙන වැව් අමුණු ටික සංවර්ධනය කරනවා. නිවාස හැදෙනවා, පාරවල් ටික හැදෙනවා, පාරවල්වලට බස් රථ වැටෙනවා, නගර සංවර්ධනය වෙනවා, වැව් අමුණු ටික හැදෙනවා. ඒ වාගේම "දිවිවා" ආපදාවෙන් විපතට පත්වුණු ජනතාවට සහන සැලසීම වෙනුවෙන් අපි උපරිම මැදිහත්වීම සිදු කරනවා. අපි අවුරුදු දෙකක කාලයක් තුළ මේ විධියේ දැවැන්ත සංවර්ධනයක් එක්ක තමයි නැවතිලා තිබුණු රටක් නැවත පණගන්වා, ආර්ථිකය ස්ථාවර කරගෙන කටයුතු කරගෙන යන්නේ.

අපි මේ රටේ මිනිසුන්ට පොරොන්දු වුණා, පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් උරුම කර දෙනවා කියලා. දවසින් දවස ඒ සිහිනය සැබෑ කර ගන්න, ඒ ඉලක්කවලට ළඟා වෙන්න වර්තමාන රජය කටයුතු කරලා තිබෙනවා. මේ රටේ සියලුම ජනතාවට තව අවුරුදු පහක්, දහයක් මේ රටේ ජීවත් වෙන්න ආසා හිතෙන විධියට, ජීවත් වෙන්න වුවමනාවක් හැදෙන විධියට මේ කෙටි කාලය තුළ මේ රට ඉදිරියට අරගෙන ඇවිල්ලා තිබෙනවා කියන එක ඉතාම ආඩම්බරයෙන් කියමින්, මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.22]

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි.

මාතෘකාවට අදාළව කථා කරන්න කලින් මම කාරණයක් කියන්න ඕනෑ. මට පෙර කථා කරපු මන්ත්‍රීතුමා කිව්වා, තව අවුරුදු පහක්, දහයක් ජීවත් වෙන්න ආසා කරන රටක් නිර්මාණය කරනවා කියලා. ගරු මන්ත්‍රීතුමනි, සියල්ලටම කලින් රෝහල්වලට අවශ්‍ය බෙහෙත් ටික දුන්නා නම් මේ රටේ ජනතාවට තව අවුරුදු පහක්, දහයක් වැඩිපුර ජීවත් වෙන්න පුළුවන්. මෙන්න මේ බෙහෙත් ටික නැහැ කියලා මට list එකකුත් එවා තිබෙනවා. බොහෝ රෝහල්වල ඒ බෙහෙත් හිඟය තිබෙනවා. මේ පිළිබඳව මම සෞඛ්‍ය ඇමතිතුමාව පෞද්ගලිකවත් දැනුවත් කළා. නමුත්, තවම ඒ ප්‍රශ්නය විසඳිලා නැහැ. ඉතින් ඒ බෙහෙත් ටිකත් දීලා මිනිසුන්ව තව අවුරුදු පහක්, දහයක් ජීවත් කෙරෙව්වොත් හොඳයි කියලා මම හිතනවා.

ඊළඟ කාරණාව මෙයයි. මහානායක හාමුදුරුවෝ කියපු කථාවක් පිළිබඳව ගරු නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කළා. මම මේ කොයි කථාවද කියලායි බැලුවේ. "බෝම්බ ගැහුවේ නැහැ, වෙඩි තැබුවා" කියපු කථාවද, එහෙම නැත්නම්, "මහණ වෙලා සිටියා" කියපු කථාවද? කොයි එකද කියලා අපටත් හරියට හොයාගන්න බැහැ.

[ගරු අමිල ප්‍රසාද් මහතා]

ඒ වාගේම එතුමා කිව්වා, අපේ පක්ෂයෙන් ජාතිවාදය අවුස්සනවා කියා. අපේ පක්ෂයේ ප්‍රධාන ප්‍රතිපත්තියක් තමයි, සියලු ජාතීන් අතර එක්සත්භාවය නිර්මාණය කරන එක. අපි කිසිම අවස්ථාවක ජාතිවාදය අවුස්සන්න උත්සාහ කළේ නැහැ. 2019දී ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා බවට පත් වෙද්දී, මුස්ලිම් ජනතාවගේ ආරක්ෂකයා ලෙස සිටීමම තමයි අපේ අපේක්ෂකයා පරාජයට පත් වෙන්න හේතුවක් බවට පත් වුණේ. ඊට පස්සේ ඇති වූ කොවිඩ් වසංගත කාලසීමාව තුළ ඒ මිය ගිය මුස්ලිම් ජනතාව ආදාහනය කිරීම සම්බන්ධව ආපු විරෝධතාවේදී ඒ වෙනුවෙන් ඉදිරිපත් වෙලා කටයුතු කළේත් අපේ පක්ෂය තමයි. ඒ නිසා අපි කිසිම අවස්ථාවක ජනතාව බෙදලා, වෙන් කරලා රටක් ගොඩ නඟන්න බැහැ කියලා විශ්වාස කරන දේශපාලන ව්‍යාපාරයක්. ඒ නිසා මම දන්නේ නැහැ, මොන අදහසකින් එතුමා මේක කිව්වාද කියලා.

හැබැයි, රටේ ජනාධිපතිවරයා උතුරට ගිහිල්ලා කියනවා, දකුණේ මිනිස්සුන්ට සිල් ගන්න උතුරට එන්න එපා කියලා. ඒක තමයි ජාතිවාදී ප්‍රකාශය. උතුරට ගිහිල්ලා කියනවා, දකුණේ මිනිස්සු සිල් ගන්න උතුරට එන්න එපා කියලා. ඒවා තමයි ප්‍රශ්න. එතැනින් තමයි මේ සිංහල බෞද්ධ අර්බුදය නිර්මාණය කරන්නේ. සිංහල බෞද්ධ මිනිස්සුන්ට, ස්වාමීන් වහන්සේලාට මේ ආණ්ඩුවේ ක්‍රියාකලාපය පිළිබඳව සැකයක් නිර්මාණය කරන වැඩේ තමන් විසින් කරගෙන, අනෙක් මිනිස්සුන්ට ඇඟිලි දිගු කරන්න එපා කියලා අපි කියනවා. ගිහිල්ලා ඕක ජනාධිපතිතුමාට කියාගන්න, අපිට කියන්න කලින්. මේක හැම වෙලාවකම මම කියන දෙයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මම අද දවසේ මාතෘකාවට අවධානය යොමු කරන්නම්. අද දවසේ මාතෘකාව ඉතා වැදගත්. ලංකාවේ ව්‍යාපාර දියුණු කරන්න කටයුතු කරන පනතක් යටතේ ගෙනෙන යෝජනාවක් සම්බන්ධයෙන් තමයි අද සාකච්ඡා වෙන්නේ. ඒ සම්බන්ධයෙන් කථා කරද්දී කර්මාන්ත කටයුතු පිළිබඳ ඇමතිවරයාත් මේ ගරු සභාවේ දැන් ඉන්න එක හොඳයි. මේක ණය හිමියන් සහ ණය ගැතියන් පිළිබඳව කරනු ලබන සංවාදයක් සහ සාකච්ඡාවක්. ණය හිමියන් කියලා කියන්නේ කවුද? ණය හිමියන් කියලා කියන්නේ රාජ්‍ය බැංකු, පෞද්ගලික බැංකු, - පෞද්ගලික බැංකු ගණනාවකින් මේ මුදල් ලබා ගන්න පුළුවන් කියලා තිබෙනවා- ඊට අමතරව වෙනත් මූලාශ්‍ර ආයතන.

දැන් මේ කාරණාව ඇතුළේ තිබෙන වැදගත් තොරතුරක් තමයි දිනෙන් දින, වසරින් වසර, විශේෂයෙන්ම රාජ්‍ය බැංකු -ඔබ බොහොම අනිශයෝක්තියෙන් ඒ ගැන කථා කරනවා- ලාභ උපයන ප්‍රමාණය වැඩි වෙනවා. රාජ්‍ය බැංකු ලාභ උපයන ප්‍රමාණය වැඩිවීම කියන එකෙන් අදහස් කරන්නේ මොකක්ද? රාජ්‍ය බැංකු ජනතාවට වඩාත් හොඳ සේවයක් කරනවා කියන එකද? එහෙම නැත්නම් ඒකේ අනෙක් පැත්තද? ජනතාව සතු මුදල් විවිධ ක්‍රමවේද ඔස්සේ බැංකුවට එකතු වීම නිසා බැංකුවේ ලාභය ඉහළ යාම ජනතාවගේ ආර්ථිකය ඉහළ නැංවීමට වාසියක් වෙලා තිබෙන විධිය මොකක්ද කියලා පැහැදිලි කිරීමක් පුළුවන් නම් ආණ්ඩුව පැත්තෙන් කරන්න කියලා මම ඉල්ලනවා.

හැබැයි, ඊළඟ කාරණාව තමයි ණය ගැතියන්. එතැන තමයි අපේ මාතෘකාව තිබෙන්නේ. ලංකාවේ වර්තමානය වන විට ණය ගැතියන් විශාල ප්‍රමාණයක් නිර්මාණය වෙලා තිබෙනවා. මම හිතන විධියට අද වෙනකොට අපේ රටේ ජනතාවගෙන් සියයට 90කටත් වඩා කුමන හෝ ණයකට අහුවෙලා තිබෙනවා; නැත්නම් කුමන හෝ ණයක් එක්ක ජීවිතය පවත්වාගෙන යන්න සිද්ධ වෙලා තිබෙනවා. පුළුවන් නම් ආණ්ඩුව පැත්තෙන් ඒ සංඛ්‍යාලේඛන ඉදිරිපත් කරන්න කියලා අපි කියනවා. මොකද, අපි රටක් හැටියට ඒ දේවල් වැදගත් වන නිසා. ඒ පිළිබඳව තොරතුරු හොයා බැලුවාම පසුගිය කාලසීමාව තුළ, ඒ කියන්නේ මේ ගෙවුණු කාලසීමාව තුළ රුපියල් ට්‍රිලියන 1.14ක් ණය වශයෙන් අරගෙන තිබෙනවා. මේකෙන් සියයට 58ක් ඍජුවම නිවාසවලට ගිහිල්ලා තිබෙනවා. සියයට 42ක් මූල්‍ය ආයතනවලට ගිහිල්ලා තිබෙනවා. එහෙම නම් ඒ ණය අතරින් වැඩි ප්‍රමාණයක් ගිහිල්ලා තිබෙන්නේ ඍජුවම නිවාසවලට. මූල්‍ය ආයතනවලට ගිහිල්ලා තිබෙන්නේ සියයට 42යි. මහ බැංකු වාර්තාවකින් තමයි මම මේ තොරතුරු ගත්තේ.

ඒ අතරවාරයේදී මම කලින් සඳහන් කළ විධියට ණය වර්ග හය - හතකින් ජනතාව මේ මොහොතේදී පීඩා විඳිමින් ඉන්න බව තමයි මට විපක්ෂය වශයෙන් ඔබට කියන්න තිබෙන්නේ. පළමුවැනි එක තමයි, ලංකාවේ මිනිස්සු බහුතරයක් තමන් කාලයක් තිස්සේ හදා ගත් කනකර, රත්‍රන් බඩු ඉතා ශීඝ්‍රව උකස් තියන්න පටන් අරගෙන තිබෙනවා. පසුගිය මාස හය තුළ රුපියල් බිලියන 211.9ක රන් භාණ්ඩ උකස් කරලා තිබෙනවා. ඒක සියයට 49ක වැඩිවීමක් විධියට තමයි වාර්තා වෙන්නේ. ඔබතුමන්ලා කියපු ශාපලත් අවුරුදු 76 ඇතුළේ මිනිස්සු කීය කීය හරි ඉතුරු කරලා හදා ගත්ත රත්‍රන් මාලය, කනේ තිබෙන කරාබු දෙක, එහෙම නැත්නම් අතේ තිබෙන වළලු්ල, මේ යහපත් රටක් නිර්මාණය වුණාට පස්සේ; පුනරුදා ආණ්ඩුව යටතේ උකස් තියනවා කියන්නේ මොකක්හරි එතැන ගැටලුවක් තිබෙන බව අපිට පේනවා, ඔබට නොපෙනුණාට. එහෙම නම් පළමුවෙන්ම මම ඔබෙන් පිළිතුරක් බලාපොරොත්තු වනවා මෙන්න මේ කාරණයට. මිනිස්සුන්ට තමන්ගේ කනකර, රත්‍රන් බඩු ගෙවල්වල තියාගන්න බැරුව, එහෙම නැත්නම් ඒවා වැඩි වෙලා උකස් තියනවා කියලාද ආණ්ඩුව හිතාගෙන ඉන්නේ? මෙය සියයට 49.2කින් වැඩි වෙලා තිබෙනවා. රුපියල් බිලියන 211.9ක මුදලක් අරගෙන තිබෙනවා.

මේ සියලු මුදල් අරගෙන බහුතරයක් මිනිස්සු කරන්නේ මොකක්ද? ඒ මුදල්වලින් ළමයාට පොත්පත් ටික අරන් දෙනවා. ළමයාගේ පාසලේ වියදම් ටික cover කරනවා. එහෙම නැත්නම් ගෙදර මොකක්හරි වැඩක් කරන්න සූදානම් වෙනවා. එහෙම නැත්නම් එදිනෙදා ජීවිතයට භාවිත කරනවා. මෙන්න මේ වැඩ කටයුතු ටිකට තමයි මිනිස්සු මේ මුදල් අරගන්නේ. එහෙම නැතිව මේ මුදල් අරගෙන බහුතරයක් ව්‍යාපාර කරන්නේ නැහැ. මේ සැබෑ ප්‍රශ්නයට ආණ්ඩුව අරගෙන තිබෙන විසඳුම මොකක්ද? මේ රන් භාණ්ඩ උකස් තැබීම අඩු කරන්න පසුගිය කාලසීමාවේදී ආණ්ඩුව අරන් තිබෙන විසඳුම මොකක්ද කියලා මම අහන්න කැමැතියි.

දෙවැනි එක තමයි, මේ personal loans. Personal loansවල මුළු වටිනාකම රුපියල් ට්‍රිලියන 2.67යි. මේ අවුරුද්දේ මේ ගෙවුණු කාලසීමාව තුළ සියයට 20කින් ඒ ණය ගැනීම් වැඩි වෙලා තිබෙනවා. Personal loans කියලා කියන්නේ මොනවාද? අර රුපියල් ට්‍රිලියන 1.14 තුළ සියයට 30ක් විතර තිබෙන්නේ ඒවා. Personal loan එකක් ගන්නේ රාජකාරි කරමින් ඉන්න අය. ඒ අයගෙන් බහුතරයක් රාජ්‍ය සේවකයන්. මේ personal loans අරගෙන ඔවුන් බොහෝ විට කරන්නේ ගෙදරට අවශ්‍ය කරන භාණ්ඩ මිලදී ගන්න එකයි. සමහර විට TV එකක්, සමහර විට fridge එකක්, සමහර විට air conditioner එකක් මිල දී ගන්නවා වෙන්න පුළුවන්; එහෙම නැත්නම් ගෙදරට tiles ටිකක් අල්ලා ගන්නවා වෙන්න පුළුවන්. ඒ වාගේ එදිනෙදා පාවිච්චි කරන භාණ්ඩ මිල දී ගන්න තමයි, ඒ වාගේ වැඩවලට තමයි personal loans අරගෙන තිබෙන්නේ. එහෙම නම්, personal loans ගන්නවා කියන එකේ තේරුම මොකක්ද? ඒක එක පැත්තකින් ආර්ථිකයට දායකත්වය සපයනවා තමයි. නමුත් මිනිසුන්ට බැරි වෙලා තිබෙනවා, තමන් උපයන ආදායමෙන් මේ කියපු වැඩ ටික

කර ගන්නට. එහෙම නම්, personal loans ගැනීම ඉහළ යෑම කියන්නේ, ණය ගැතියන් තවදුරටත් ණයෙන් හිර වෙන්න පටන් ගන්නවා කියන එකයි. එදිනෙදා ජීවිතයට අවශ්‍ය කරන සල්ලි ප්‍රමාණය, ආහාර පානවලට සහ බෙත් හේත්වලට අවශ්‍ය සල්ලි ප්‍රමාණය ක්‍රමිකව අඩු වෙමින් යනවා කියන එකයි. ඒකට හේතුව, විශාල මුදල් ප්‍රමාණයක් ණය වශයෙන් ගැනීමයි. ඒ ණයට ගත්තු සල්ලිවලින් තමයි ඒ අය තමන්ගේ ගෙවල්වල තිත්ත ටිකක් ගා ගන්නේ, ටිකක් හරි ලස්සනට ඉන්නේ. මේ රට ඇතුළේ මේ වාගේ ණය ගැතියන්ගේ ප්‍රමාණය ක්‍රමිකව වැඩි වෙනවා නම්, ආණ්ඩුවෙන් මම අහනවා මේ ගෙවුණු මාස හයක, හතක, දහයක කාල සීමාව තුළ ඔබ ඔය කියන සංවර්ධනය රට ඇතුළේ දකින්න තිබෙනවාද කියලා. කෝ, එහෙම දෙයක් රට ඇතුළේ දකින්න නැහැ නේ. මේකට අදාළව ගත්තොත්, ආණ්ඩුවේ ආදායම් වැඩි වීම ගැනත් කියන්න තිබෙනවා.

තුන්වැනි ණය වර්ගය තමයි, මූල්‍ය ආයතනවලින් ලබා දෙන ණය. ඒක, සියයට 63.8ක් වනවා. මේ තමයි වාහනවලට ලබා දෙන ණය. බොහෝ විට වාහනවලට ලීසිං පහසුකම් ලබා දෙන්නේ මේකෙන්. වාහනයක් මිල දී ගන්න යන තරුණයෙකුට එහි බදු මුදල් ද එකතුව වැඩි මිලකටයි ඒ වාහනය ගන්න වෙන්නේ. මම මීට කලිනුත් මේක පාර්ලිමේන්තුවේදී කියා තිබෙනවා. වාහනවලට බදු ගහන්නේ නැහැ, බදු නැතිව තමයි වාහන දෙන්නේ කියලා දේශපාලන වේදිකාවල කියපු අනුර, ඒ මිනිසුන්ගේ ඡන්දවලින් ආණ්ඩුව ගත්තාට පස්සේ ඒ බදු අඩු කරනවා වෙනුවට තවදුරටත් බදු වැඩි කරනවා. බදු වැඩි කළාට පස්සේ තරුණයෙකු leasing company එකකින් motorbike එකක් ගන්න ගියාම මොකද වෙන්නේ? එහි මිලෙහි බද්දත් එක්ක එකතු වෙලා තිබෙන විශාල මුදල නිසා ලොකු පොලියක් ඒ leasing companiesවලට ගෙවන්න ඔවුන්ට සිද්ධ වෙලා තිබෙනවා. තරුණයෙකු motorbike එකක් රුපියල් ලක්ෂ 15ක්, 20ක්, 25ක් දීලා ගත්තාට පස්සේ ඔහුගේ තරුණ කාලයම ගත වෙන්නේ ඒ motorbike එකට අදාළව ගත් ණය සහ පොලිය ගෙවන්නයි. තරුණයෙකු ව්‍යාපාරයකයෙකු වෙන්න ආස වුණාට, ගෙදර ඉඳලා හන්දියට යන්න අවශ්‍ය කරන motorbike එක ගන්න ඔහුට බැරි වෙනවා. "තරුණයන් වේගයෙන් යන ලොකු motorbike එකක් ගන්න ආසයි; අපි 1000cc motorbikeවලටත් අවස්ථාව දෙනවා" කියලා බලයට ආවාට, පොලීසිය දැන් හැම තැනකදීම ඒවා අල්ලනවා. තරුණයන්ගේ සිහින, බලාපොරොත්තු අළෙවි කරලා ආණ්ඩුව ගත්තාට පස්සේ, ඒ ආණ්ඩුව ඇතුළේ සියලුම දූෂණ, නාස්තිය නැවැත්තුවා කියනවා. හැබැයි, බයිසිකලය, ත්‍රිරෝද රථය ආදි හැම වාහනයකටම අසාමාන්‍ය බද්දක් ගහලා, ඒ බද්ද leasingවලටත් ඇතුළත් කරලා, leasing companiesවල ලාභය ක්‍රමිකව ඉහළ නංවමින් පවතිනවා.

මම ආණ්ඩුවෙන් අහන ප්‍රශ්නය මෙයයි. ඒ විධියට වාහන ගන්නේ, සාමාන්‍ය ජනතාව. ඒ Benz ගන්න අය නොවෙයි; BMW ගන්න අය නොවෙයි. ගමක ඉන්න කොල්ලෙක්, එහෙම නැත්නම් ව්‍යාපාරයක් කරන මනුස්සයෙක් ලොරියක් ගන්න, ට්‍රැක්ටරයක් ගන්න, motorbike එකක් ගන්න තමයි මේ ණය ගන්නේ. මොකක්ද මේ ආණ්ඩුවේ මූල්‍ය ප්‍රතිපත්තිය? තරුණ ප්‍රජාව සහ සාමාන්‍ය ජනතාව ණය ගැතියන් විධියට දිගටම තියාගෙන යනවාද? එහෙම නැත්නම් ණය ගැතියන්ගේ ණය ගැනිභාවය අඩු කරනවාද? කෝ, මේවාට විසඳුම? හැබැයි, හැමදාම ඇවිල්ලා 76 අවුරුද්දක් ගැන කියලා, දැන් භාණ්ඩාගාරය පිරිලා කියනවා. භාණ්ඩාගාරය පිරෙන්නේ ඔය බදුවලින්. ජනතාවගේ මුදල් ප්‍රමාණය ක්‍රමිකව වක්‍ර බදුවලින් අර ගන්නවා. එක පැත්තකින්, සෘජු බදු වැඩි කර ගන්නවා කියන ගමන් වක්‍ර බදු අඩු කරන්න කිසිදු ක්‍රියාමාර්ගයක් ගන්නේ නැහැ. නිෂ්පාදන ආර්ථිකයට ඕනෑ කරන ට්‍රැක්ටරයක මිල පවා අද අසාමාන්‍ය ඉහළ මිලක් වෙලා තිබෙනවා. නිෂ්පාදන පිරිවැය ඉහළ යෑමට පවා මේ මූල්‍ය ගැටලු බලපා තිබෙනවා.

මේ ණය ගැතියන් කළමනාකරණය කරන්න ආණ්ඩුව අවුරුදු දෙකක් තිස්සේ අරගෙන තිබෙන ක්‍රියාමාර්ගය මොකක්ද? අප අහන්නේ ඒක. මේ පනත යටතේ වන යෝජනාවෙන් කියන්නේ, සල්ලි දෙන්නම් කියලායි. සල්ලි දුන්නාට පස්සේ, ඒ ගන්න සල්ලිවලින් මේ රටට හිමි වෙලා තිබෙන වටිනාකම් ටික පිළිබඳව සොයා බලා තිබෙනවාද? මම ඒ ගැනත් මේ ගමන්ම කථා කරන්නම්. මුදල් අමාත්‍යාංශය ලබා දුන් තොරතුරුවලට අනුව අයදුම් පත්‍ර 13,000ක් දීලා තිබෙනවා. ණය අරගෙන තිබෙන්නේ, 3,000 දෙනෙකු විතරයි. ඉතිරි අයට මේ ටික දෙනවා කියලා තිබෙනවා. මා ආණ්ඩුවෙන් අහන ඊළඟ ප්‍රශ්නය මෙයයි. මේ ණය ලබා ගත් 3,000ක් දෙනා මේ රටේ ආර්ථිකයට අලුතින් ලබා දුන් දායකත්වය කොපමණද? රැකියා කීයක් අලුතින් නිර්මාණය වෙලා තිබෙනවාද? ආණ්ඩුවට මේවාට උත්තර තිබෙන්න ඕනෑ. එමඟින් අපේ ආදායම ඩොලර් වශයෙන් කොපමණ ප්‍රමාණයකින් ඉහළ ගිහිල්ලා තිබෙනවාද? ණය ගත්තු මේ 3,000ක් දෙනාගෙන් බහුතරයක් තමන්ගේ පරණ ණය ගෙවන්න තමයි මේ සල්ලි අරගෙන තිබෙන්නේ. ඒ නිසා තමයි මේක ආර්ථිකයට සෘජුව දැනෙන්නේ නැත්තේ. ඒ නිසා මෙතැනින් පස්සේවත් ලබා දෙන මේ මුදල් ප්‍රමාණයෙන් ආර්ථිකයට සක්‍රිය දායකත්වයක් ලබා දෙන්නට, ව්‍යවසායකයන් ශක්තිමත් කිරීමට අලුතින් තීරණ ගත යුතුයි. එහෙම නැතිව පසු ගිය ආණ්ඩු ලබා දුන් විධියටම මේ ණය ටික ලබා දෙමින් යන එක නොවෙයි උත්තරය.

මම දැක්කා නියෝජ්‍ය අමාත්‍යවරයා මේක පළමුවැනි වතාවට සිද්ධ වෙච්ච දෙයක් වාගේ කියනවා. මේවා පළමුවැනි වතාවට සිද්ධ වෙච්ච දේවල් නොවෙයි. ලංකාවේ හැම ආණ්ඩුවක්ම පසු ගිය කාල සීමාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට ණය පහසුකම් ලබා දුන්නා. එහි දිගුවක් හැටියට අලුත් පනතක් හරහා ණය ලබා දීම තමයි මෙතැනදී සිද්ධ වෙන්නේ.

මම අවසාන වශයෙන් ඒකට අදාළව ඔබෙන් අහන්නේ, ඒ ණය ගත්තු 3,000 දෙනාට අදාළව දීපු මුදල් ප්‍රමාණයෙන් අලුතින් අපේ ආර්ථිකය ප්‍රවර්ධනය වෙච්ච විධිය පිළිබඳව අදහසක් ඉදිරිපත් කරන්න කියලායි. එහෙම කරන්න පුළුවන් නම් හොඳයි. නමුත්, අවුරුදු 76ක් ගැන කියව කියවා ඉන්නවා, බලය අරගෙන දැන් අවුරුදු 2ක් වෙලාත් මේකට අදාළ මාතෘකාවක් ගැන කථා කරන්නේ නැතිව. මා ඒ කථා කළේ, මූල්‍ය ආයතනවලින් ලබා දෙන ණය පිළිබඳ අර්බුදය ගැනයි.

ඊළඟ ණය වර්ගය තමයි, credit cards. යම්කිසි රස්සාවක් කරන, බැංකුවට විශ්වාසයක් තිබෙන කෙනෙකුට credit card එකක් ලබා දෙනවා, තමන්ගේ මුදල් වෙනුවට ඒක භාවිත කරන්න. ලංකාවේ credit cardsවල පොලී අනුපාතයත් සියයට 28 සිට සියයට 32 දක්වා ඉහළ ගිහින් තිබෙනවා. ඊට අදාළව රුපියල් බිලියන 206.6ක් ණය වෙලා තිබෙනවා, පසුගිය කාල සීමාව තුළ. යමක් කරන්න පුළුවන් කියලා හිතන මිනිහාට විතරයි බැංකුවක්, මූල්‍ය ආයතනයක් credit card එකක් දෙන්නේ. Credit card එක ගත්තු මිනිස්සුන් තමන් ගත්තු භාණ්ඩවලට අදාළව credit card එකේ මුදල ගෙවා ගන්න බැරිව දහලන තත්ත්වයට පත් වෙලා ඉන්නවා.

මම මේ අහමින් ඉන්නේ ණය ගැතියන් කළමනාකරණය කරන්න මේ ආණ්ඩුව අරගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද කියලායි. ණය හිමියන්ගේ නොව ණය ගැතියන්ගේ පැත්තෙන් හිතන සමාජවාදී කථා තොගයක් කියලා බලයට ආපු ආණ්ඩුව, ණය ගැතියන් දවසින් දවස මේ ණය උගුලේ තවත් හිර කරමින් සිටිනවා. මේ තමයි ඊළඟ අර්බුදය. Credit card එකක් භාවිත කරන මනුස්සයෙකුට පවා තමන්ගේ credit card එකේ මුදල ගෙවා ගන්න බැරි මට්ටමට ජන ජීවිතය තුළ භාණ්ඩ සහ සේවාවල මිල ඉහළ ගිහින් තිබෙනවා නම්, මොකක්ද අප මේ කරන කථාව? දිගට දිගට අතිශයෝක්තියෙන් මොනවාදෝ ටිකක් කිව්වාට මේක ඇතුළේ කෝ ආදායම් උත්පාදනය කරන මාර්ග?

[ගරු අමිල ප්‍රසාද් මහතා]

ඊළඟ, ණය වර්ගය තමයි, විශේෂයෙන්ම ග්‍රාමීය මිනිස්සු මුහුණ දෙන අර්බුදය. ග්‍රාමීය මිනිසුන්ට ඇපයක් නැතිව රුපියල් 1,000ක්, 2,000ක්, 5,000ක්, 10,000ක්, 15,000ක් ගන්න ක්‍රමයක් නැහැ. ඒ නිසා ඒ මිනිස්සු මුදල් ගන්නේ පොලියට. Daily ගන්නවා කියන එක තමයි එතැනදී වෙන්නේ. එහෙම නැත්නම් සතියෙන් සතියට ගෙවන්න ණය ගන්නවා. මේ විධියට මිනිසුන්ට කරකියා ගන්න දෙයක් නැතිකමට, විශේෂයෙන්ම ගම්වල සිටින දුප්පත් ජනතාව විශාල වශයෙන් මෙන්න මේ කියන ණයට හිර වෙලා ඉන්නවා. ඒවායේ මාසික පොලී අනුපාතය සියයට 40, 50 දක්වා වනවා. ආණ්ඩුවෙන් මම අහන්න කැමැතියි, ඒ දුප්පත් මිනිසුන් එදිනෙදා කටයුතුවලට රුපියල් 10,000ක්, 15,000ක්, 20,000ක් ලබා ගන්න සියයට 30, 40, 50 වාගේ ලොකු පොලී අනුපාතයන්ට ගිහිල්ලා හිර වෙලා, පවුල් ජීවිතය විනාශ වෙලා, සියදිවි නසා ගන්නා තත්ත්වයට පත් වෙලා සිටිද්දී, මෙච්චර මුදල් තිබෙන වෙලාවකත් ආණ්ඩුව මොකක්ද කරන්නේ කියලා.

හැමදාම කියන්නේ, භාණ්ඩාගාරය පිරෙන්න මුදල් තිබෙනවා කියලා නේ. නමුත්, රටේ ජන ජීවිතය යහපත් කරන්න ඒ මුදල් ටික යොදන්න උත්සාහ කරන්නේ නැහැ. මේ ක්ෂුද්‍ර මූල්‍ය ණයවලින් හිර වෙලා ඉන්න මිනිසුන් සම්බන්ධව; විශේෂයෙන්ම ගම්වල මිනිසුන් වැඩි පොලියට ණය අරගෙන තිබීම කියන ප්‍රශ්නය සම්බන්ධව ආණ්ඩුව පසුගිය අවුරුදු දෙක තුළ ගත්තු ක්‍රියාමාර්ගය මොකක්ද කියා මම අහන්න කැමැතියි.

මේකට අදාළ ඊළඟ ණය වර්ගය තමයි, නිවාස ණය. අද වෙද්දී ලංකාවේ තරුණ තරුණියන් විවාහ වෙන්න යනකොට බලපාන ප්‍රධාන අර්බුදය තමයි, නිවාස ණයට විශාල පොලී අනුපාතිකයක් තිබීම. විශේෂයෙන්ම ලංකාවේ නාගරිකව ජීවත් වන ජනතාවට නිවාසයක් ඉදි කර ගැනීම අතිශය අමාරු සිහිනයක් බවට පත් වෙලා තිබෙනවා. නිවාස ණයවල පොලී අනුපාත අඩු කරන්න ආණ්ඩුව අරගෙන තිබෙන ක්‍රියාමාර්ගය මොකක්ද කියලා මම අහනවා. තමන්ගේ තැනක ජීවත් වෙන්න මිනිස්සු ආසයි කියලා තමුන්නාන්සේලා ගෙවල් හදාගෙන යනවා නේ, ගම්වල. ඒ විධියට නාගරික ජනතාවට, තරුණ තරුණියන්ට තමන්ගේ තරුණ ජීවිතය තුළ නිවසක් ඉදි කර ගන්න පොලී අනුපාතය අඩු කරලා, දීර්ඝ කාල සීමාවක් අරගෙන loan එකක් දෙන්න හෝ එහෙම නැත්නම් ආණ්ඩුවෙන් ක්‍රියාත්මක කරන පැහැදිලි නිවාස ව්‍යාපෘතියක් වෙනුවෙන් හෝ මුදල් ආයෝජනය කළාද කියා මම අහන්න කැමැතියි. නිවාස ණයක පොලී අනුපාතය ඉහළ ගිය ගමන් ඒ ටික බැංකුවට පඩියෙන්ම කැපිලා ගියාට පස්සේ ඉතිරි වන සොච්චම් මුදල ජීවත් වෙන්න යොදා ගන්න බැරිව යනවා. ලංකාවේ මිනිස්සු වර්ග 7ක විතර ණය system එකකට හසු වෙලා ඉන්නවා. ඒ කියන්නේ, ලංකාවේ මිනිස්සු ණය වර්ග 7ක හිර වෙලා ඉන්නවා.

අවසාන ණය වර්ගය තමයි, online ණය. මේ online ණය කියන එක දැන් මාෆියාවක් බවට පත් වෙලා තිබෙනවා. Online ණයවලින් සිද්ධ වෙන්නේ මොකක්ද? බොහොම ඉක්මනට ඒ ණය ලබා දුන්නාට ණය ගෙවන්න පොඩි දවසක් හෝ ප්‍රමාද වුණොත් ඔවුන්ගේ ආත්ම ගරුත්වය විනාශ කරමින් ඒ online system එකෙන්ම social media හරහා "මේ ගත්තු සල්ලි ටික දෙන්නේ නැහැ" කියලා ඔවුන්ගේ කීර්ති නාමය විනාශ කරනවා. මේක මාෆියාවක් වාගේ වෙලා තිබෙනවා. මම අහනවා ඔබෙන්, මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන ආයතන මෙහෙයවන ආණ්ඩුව මේ online මුදල් මාෆියාවට; loan මාෆියාවට එරෙහිව අරගෙන තිබෙන ක්‍රියාමාර්ගය මොකක්ද කියලා. මිනිස්සු මැරෙනවා, රස්සා අත් හරිනවා, හැංගෙනවා, සිය දිවි නසා ගන්නා තත්ත්වයට පත් වෙනවා, පවුල්වල ප්‍රශ්න විශාල ප්‍රමාණයක් ඇති වෙනවා. ණය ගැනියන් ක්‍රමිකව තවතවත් ණය ගැනියන් බවට පත් වන විට ආණ්ඩුව ඇවිල්ලා කියනවා සියල්ල හරියට යහපත් ලෙස කරලා තිබෙනවා කියලා.

මොකක්ද, එහෙම නම් දැන් මේකට අදාළව තිබෙන විසඳුම? මේකට අදාළව තිබෙන විසඳුම ණය ගැනියන් ප්‍රමාණය වැඩි කරන එක නොවෙයි. ලංකාවට අවශ්‍ය කරන ආදායම් උත්පාදනය කරන්න ඕනෑ. ආදායම් උත්පාදනය කරන්න නම් ඉස්සර වෙලාම කරන්න ඕනෑ දේ තමයි රස්සා ටිකක් වැඩි කිරීම. රස්සා වැඩි වෙන්න නම් අංක එකටම වෙන්න ඕනෑ, විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ආයෝජනය කරන්න ආයෝජකයන් ලංකාවට ඒමයි.

හැබැයි, මේ ආණ්ඩුව ආයෝජකයන් සම්බන්ධයෙන් කටයුතු කරන්නේ කොහොමද? මම එය උදාහරණයකින් කියන්නම් මෙතැන දැන් කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන ඇමතිතුමාත් ඉන්න නිසා. අපේ දිස්ත්‍රික්කයේ තිබෙනවා, CCL කියලා factory එකක්. Factories 3ක් තිබෙනවා ගම්පහ දිස්ත්‍රික්කය ඇතුළේ. 1997 ඉඳලා 2027 වනකල් අවුරුදු 30ක් ඒ factories ක්‍රියාත්මක වුණා. ළමයි 3,000කට වඩා වැඩ කරනවා. දළ වශයෙන් ඩොලර් මිලියන 2,000කට වඩා ඒ තුළින් ලංකාවට උපයා දීලා තිබෙනවා. ඩොලර් මිලියනයක ණය ප්‍රශ්නයක් නිසා පසුගිය දිනක මේ මලයාසියානු ජාතික ආයෝජකයා හිරේට දැම්මා. මෙහෙම වුණාම ආයෝජකයෝ ලංකාවට එයිද? ඩොලර් මිලියන 2,000ක්; කොම්පැනි 5ක්; 3,000ක් වැඩ. ඩොලර් මිලියනයක ණය ප්‍රශ්නයකට පොලීසිය ක්‍රියාත්මක වෙලා - ඔයගොල්ලන්ගේ පොලීසිය, ඔයගොල්ලන් දමපු මිනිස්සු - ඒ ආයෝජකයා හිරේ දමා තිබෙනවා. අඩුම තරමේ travel ban එක අයින් කරලා, මොකක් හරි ඇපයක් තියාගෙන ඒ මනුස්සයාගේ ව්‍යාපාර ටික කරගෙන යන්න නිදහසක් දෙන්නේ නැහැ. ඉතින්, කොහොමද ලංකාවට ආයෝජකයෝ එන්නේ?

ඊට අමතරව අද දවසේ මම දැක්කා, "නැහෙනහිර පර්යන්තය ප්‍රමාදයේ වන්දිය" යනුවෙන් පුවත් පතක සඳහන් වෙලා තිබෙනවා. මේවා මේ රටේ මිනිස්සු කියවන්නේ නැද්ද? හැම වැඩක්ම ප්‍රමාදයි. ඊළඟට, මම ඊයේ අහගෙන හිටියා ආයෝජකයෝ ලංකාවෙන් යනකොට සමහරුන් කියනවා, එහෙම යන එක හොඳයි, ඒක මැද්දේ එහෙම එකක් හදන්න දෙන්න බැහැ කියලා. අපේ ආයෝජන ප්‍රතිපත්තිය මේක නම්, කොහොමද මේ රටට ආයෝජකයෝ එන්නේ? ඒකෙන් වෙන ප්‍රතිඵලය තමයි, අවුරුදු 76ක් තිස්සේ හම්බ කර ගත්ත දේවල් ටික උකස් කරන්න සිදු වීම, ගෙවල් විකුණන්න සිදු වීම, එන්න එන්න ණය ගැනියන් බවට පත් වීම. මේ ආර්ථිකය ඇතුළේ ආදායම් උත්පාදනය කරන්න අවශ්‍ය කිසිදු ක්‍රියාමාර්ගයක් ගන්න මේ ආණ්ඩුවට මේ වනකොට බැරි වෙලා තිබෙනවා.

මේගොල්ලන් තව කාරණාවක් ගැන අපූරු දේවල් ටිකක් කථා කරනවා. ඒ, ටයිල් ප්‍රශ්න වාගේ දේවල්. ලංකාවේ මිනිස්සු දන්නවා, ටයිල් ප්‍රශ්න විධියට විසඳන්න යන්නේ කාගේ ප්‍රශ්න ද කියලා. ඒ නිසා තමන්ගේ ආණ්ඩුව බලයට ගෙනෙන්න සල්ලි දුන්නු මිනිස්සුන්ගේ ප්‍රශ්න විසඳන්න කලින් ඉස්සෙල්ලාම කළ යුත්තේ රටේ ජනතාවට ජීවත් වීම උදෙසා කළ හැකි දේවල් ටික කරන එක. මේක කියන්න ගියාම ඊට පස්සේ මොකද වෙන්නේ? අපට තිබෙන පහසුකම් ටික නැති කළා කියලා මොනවාද විකාර කථා ටිකක් කියනවා. අපට වුවමනා නැහැ, මේකට ඇවිල්ලා පහසුකම් ගන්න. පහසුකම් ගත්තේ කවුද කියලා බලන්න පුළුවන්, මීට අවුරුදු දෙකකට කලින් ගත්ත තමන්ගේ ෆොටෝ ටික බැලුවා නම්. කුරට වාගේ හිටපු මිනිස්සු මහත් වෙලා ඉන්නවා අඟේට. තමන්ගේ ෆොටෝ එක තමන්ම සැසඳුවා නම් කාටද සැප හම්බ වුණේ කියලා හොයා ගන්න පුළුවන්.

ඊළඟ කාරණාව මෙකයි. මේ, අපි කියන ඒවා නොවෙයි. මේ පාර්ලිමේන්තුවේ Research Office එකෙන් අද මම ලේඛනයක් ගත්තා, එදිනෙදා අත්‍යවශ්‍ය භාණ්ඩවල මිල කොයි තරම් ප්‍රමාණයකින් ඉහළ ගිහිල්ලා තිබෙනවාද කියලා, 2024ට සාපේක්ෂව.

අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ එක දෙයයි. ජනතාව ජීවත් කරවන්න නම් ආණ්ඩු එන්නේ, අවුරුදු 76ක් තිස්සේ පැවති ආණ්ඩුවල වැරදි කිය කියා නම් දිගටම යන්න බලාපොරොත්තු වෙන්නේ, ඔබට මේ ගමන දිගටම යන්න පුළුවන් වෙයිද? ලෝක බැංකුව කියනවා, ලංකාවේ තුනෙන් දෙකක් මේ වෙද්දි දුප්පත් වෙලා කියලා. පොහොසත් රටක්, ලස්සන ජීවිතයක් බලාපොරොත්තුවෙන් ඡන්දය දීලා තුනෙන් දෙකක බහුතර බලයකින් පත් කරපු ආණ්ඩුව අවුරුදු දෙකක් යද්දි රටේ මිනිස්සුන්ගෙන් තුනෙන් දෙකක් දුප්පතුන් බවට පත් කර තිබෙනවා. තුනෙන් දෙකක බලයක් තිබෙන ආණ්ඩුව තුනෙන් දෙකක් දුප්පතුන් බවට පත් කරපු එක තමයි, අනුර මේ අවුරුදු දෙක ඇතුළත ලංකාවට ලබා දුන් වැදගත්ම දේ. මම නිකම් නොවෙයි, අනුර පොඩි මිනිහෙක් කියන්නේ. පොඩි මිනිස්සුන්ට පුළුවන් ඔන්න ඔය වාගේ වැඩ තමයි. ලොකු සිහින දකින්න රටේ මිනිස්සුන්ට ඕනෑ නම්, ලොකු ජීවිත රටේ මිනිස්සුන්ට ඕනෑ නම්, ලොකු මිනිස්සු පාලකයෝ කර ගන්න කියලා ජනතාවට කියනවා. තැන් තැන්වල හන්දි ගානේ මිනිස්සු ගෙනැල්ලා, තැන් තැන්වල මිනිස්සුන්ට බැණ බැණ යන මිනිස්සුන්ට පොඩි මිනිස්සු කියනවා හැර අපට වෙන කියන්න කිසි දෙයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජන්ත ගම්මැද්දෙගේ මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.41]

ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා
(மாண்புமிகு அஜந்த கம்மெத்தெகே)
(The Hon. Ajantha Gammeddage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ යෝජනාවත්, ඒ වාගේම 2026 අංක 06 දරන පරිපූරක ඇස්තමේන්තුවත් විවාදයට ගන්න මේ වෙලාවේ මම විශේෂයෙන්ම කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මට කලින් කථා කරපු මන්ත්‍රීවරයා සඳහන් කළා, ලොකු මිනිස්සු, පොඩි මිනිස්සු කියලා. අපි විශ්වාස කරනවා, එතුමන්ලාට වෙලා තිබෙන්නේත් ඕකම තමයි කියලා. එතුමන්ලාට හරියට මේක තේරුම් ගන්න බැරි වෙලා තිබෙනවා.

මීට කලින් කථා කරපු ඒ මන්ත්‍රීවරයා කිව්වා, ආර්ථිකය ගැන යම් අදහසක් කියන්න කියලා. අපි එතුමාට කියනවා, ගිහිල්ලා ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව කියවා බලන්න කියලා. 2024දී අපි මේ රටේ බලය ගන්නකොට අපේ රටේ නිෂ්පාදන ආර්ථිකයේ සමස්ත වටිනාකම තිබුණේ, ඇමෙරිකානු ඩොලර් බිලියන 99.6යි. හැබැයි 2025 අවුරුද්ද ඉවර වනකොට අපට පුළුවන් වුණා, ඒ අගය ඇමෙරිකානු ඩොලර් බිලියන 108.8 දක්වා වර්ධනය කර ගන්න. ඒක තමයි අපි ලබපු ආර්ථික වර්ධනය. විශේෂයෙන්ම අපි ඇමෙරිකානු ඩොලර් බිලියන 9.02ක වර්ධනයක් අවුරුද්දක් ඇතුළත අත් කරගෙන තිබෙනවා, රටේ සමස්ත නිෂ්පාදනයෙන්. එහෙම වර්ධනයක් ළඟා කර ගන්න පුළුවන් වුණේ කර්මාන්ත කෙරෙහි අපි නැඹුරුතාවක් දක්වපු නිසායි. ඒ වාගේම සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තවලට අපි දායකත්වයක් ලබා දුන් නිසායි. ඒ වෙනුවෙන් අපි මැදිහත් වුණු නිසා තමයි අපට ඒක කර ගන්න පුළුවන් වුණේ. එතුමන්ලා පාලනය කරපු කාලයේ - විශේෂයෙන්ම 2015-2019 දක්වා යහ පාලන ආණ්ඩුව පැවති කාලයේ - මෙරට ආර්ථිකය කොහොමද තිබුණේ? 2015දී රටේ සමස්ත නිෂ්පාදනය ඩොලර් බිලියන 79යි. ඒක 2019 වනකොට - අවුරුදු 5ක් ගිහිල්ලාත් - ඩොලර් බිලියන 83 දක්වා විතරයි වර්ධනය කරගන්න පුළුවන් වුණේ. ඒ කියන්නේ, ඒගොල්ලන්ට අවුරුදු 5 ඇතුළතම ඩොලර් බිලියන 4කින් විතරයි සමස්ත ආර්ථිකය වර්ධනය කර ගන්න පුළුවන් වුණේ.

ඒවායේ ප්‍රතිඵල ක්‍රමානුකූලව ගලාගෙන ඇවිල්ලා තමයි 2019න් පස්සේ - 2022, 2023 වර්ෂ වනකොට - මේ රටේ සමස්ත ආර්ථිකය කඩාගෙන වැටුණේ. ඔබතුමන්ලා ඔය කියන ආර්ථික විද්‍යාඥයන්, ආර්ථික ඔස්තාර්ලා හිටියා නම් මේවා නවත්වාගන්න තිබුණා නේ. හැබැයි ඒවා කරන්න බැරි වුණා. ඉන් පසුව මුළු රටම බංකොලොත් වුණා. ලොකු මිනිස්සු රට පාලනය කළා කියලා ඔබතුමන්ලා කිව්වා. ලොකු මිනිස්සු රට පාලනය කරනවා කියලා කළේ ලොකු මිනිස්සුන්ට ඕනෑ විධියට රටේ ජනතාවගේ මුදල් ටික ඔවුන්ගේ සාක්කුවට දාගත්ත එක. ඒක තමයි ඔබේ පාලන කාලයේ වුණේ.

දැන් එහෙම නොවෙයි. දැන් මේ රටේ සමස්ත ආදායම, රටේ සමස්ත නිෂ්පාදනය මේ රටේ ජනතාවට ක්‍රමානුකූලව ගලාගෙන යන්න අවස්ථාව උදා කර තිබෙනවා. ඒක තමයි මෙතැන තිබෙන විශේෂත්වය. ඒ විශේෂත්වයට ඔබතුමන්ලා කොහොමත් බයයි. ඔබතුමන්ලා ඒකට බයයි කියලා අපි දන්නවා. ඔබතුමන්ලාට ඒක දරාගන්න අමාරුයි. මේ රටේ සාමාන්‍ය ජනතාවගේ ආර්ථිකය දියුණු වන එක ඔබතුමන්ලාට දරාගන්න අමාරුයි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ඔය කථාවෙන් අපි දැක්කේ ඒ වේදනාව. ඔබට ඒ වේදනාව හැම දාම ඒ විධියටම තිබෙනවා. විපක්ෂයේ ඉඳගෙන හැම දාම ඒ වේදනාවෙන් ඔබට ඉන්න පුළුවන්.

විශේෂයෙන්ම මම මේ වෙලාවේ තවත් කාරණයක් සඳහන් කරන්න ඕනෑ. අද සම්මත කරන්න යන රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ වූ යෝජනාව සහ පරිපූරක මුදල හරහා අපි විශේෂයෙන්ම මැදිහත් වන්නේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් නඟාසිටුවීමටයි. එතැනදි විශේෂයෙන්ම ව්‍යාපාර දියණු කරන්න, ඒවාට අවශ්‍ය මූල්‍ය ප්‍රවේශය ලබා දෙන්න වාගේම ඒවාට අවශ්‍ය තාක්ෂණික කාරණා වැඩිදියුණු කරන්න අපි මේ හරහා අවශ්‍ය මැදිහත්වීම් කරනවා. මම හිතන විධියට, ඒක තමයි රටේ වෙන්න ඕනෑ. සාමාන්‍යයෙන් ගත්තොත්, රටේ ආර්ථික පද්ධතියේ නහර විධියට තමයි මේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අපි හඳුන්වන්නේ. අපි ඒ ව්‍යාපාර ශක්තිමත් කරන්න, ඒ ව්‍යාපාර නිවැරදි දිශාවකට ගෙනියන්න අවශ්‍ය මැදිහත්වීම් කරමින් ඉන්නවා. එම නිසා ඒ පිළිබඳව විපක්ෂයෙන් ඔයිට වැඩිය දෙයක් අපි බලාපොරොත්තු වන්නේ නැහැ. මොකද, විපක්ෂය හැම දාම බලන්නේ කොයි වෙලාවේ මොන විධියට කොහෙන් අපට වරදියිද කියලායි. අපි දන්නවා, ඔබතුමන්ලාගේ සිහිනය ඒකයි කියලා. හැබැයි, ඒ සිහිනය කවදාවත් සැබෑ වන්නේ නැහැ කියන එකත් මේ වෙලාවේ විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම අපි දන්නවා, කෘෂිකාර්මික ක්ෂේත්‍රය සම්බන්ධයෙනුත් මේ හරහා විශේෂ මැදිහත්වීමක් කරනවා කියලා. කෘෂිකාර්මික ක්ෂේත්‍රයට අවශ්‍ය කරන මැදිහත්වීම කියන්නේ, නවීන කෘෂිකාර්මික නිෂ්පාදන ඇති කරන්න මේ හරහා ණය පහසුකම් ලබා දෙනවා. අපි දන්නවා, මේ රටේ මධ්‍යම පාන්තික ව්‍යවසායකයින්, ඒ වාගේම කුඩා පරිමාණ ව්‍යාපාරිකයින් ඇතුළු හැම කෙනෙකුටම අවශ්‍ය ණය ලබා දීලා එම ව්‍යවසායයන් සංවර්ධනය කරන්න අපේ ආණ්ඩුව අදාළ මැදිහත්වීම් කරන බව. ඒ හරහා අපි විශේෂයෙන්ම බලාපොරොත්තු වනවා, මේ රටේ විරැකියාව තුරන් කරන්න. මොකද, ව්‍යවසායකත්වය දියුණු වනවා කියන්නේ අනිවාර්යයෙන්ම ඒ හරහා විරැකියාව අඩු වනවා කියන එකයි. ඒකට එක උදාහරණයක් මම කියන්නම්.

[ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා]

විශේෂයෙන්ම අපි ආණ්ඩුව ගන්නකොට ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් විධියට මේ රටේ විරැකියාව තිබුණේ 4.5යි. හැබැයි අපි ආණ්ඩු බලය අරගෙන 2025 වර්ෂය වනකොට ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් විධියට 3.9 දක්වා විරැකියාව අඩු කරගන්න අපට පුළුවන් වුණා. ඒවා තමයි අපි ලබා ගත් ආර්ථික ඉලක්ක. ඒ ඉලක්ක ළඟා කරගෙන තමයි අපි මේ මට්ටමට ඇවිල්ලා තිබෙන්නේ. එම නිසා මේ වෙලාවේ විශේෂයෙන්ම මම කියනවා, අපට එහෙම කරන්න පුළුවන්කම ලැබුණේ මේ රටේ ජනතාව අප කෙරෙහි තැබූ විශ්වාසය නිසාය කියලා. ඔබතුමන්ලා ඔය කියන විධියේ දේවල් බිමේ තිබෙනවා නම්, ඔබතුමන්ලා ඔය කියන විධියේ දේවල් බිමේ ජනතාව ලබාගෙන තිබෙනවා නම්, ඔබතුමන්ලා කියන විධියේ පීඩනයක් ජනතාවට තිබෙනවා නම් ජනතාව අද මේ ආණ්ඩුව රැකගන්න පාරට එන්නේ නැහැ. අද ජනතාව මේ ආණ්ඩුව රැකගන්න පාරට එන තැනට පත් වෙලා තිබෙනවා.

මීට කලින් කථා කරපු මන්ත්‍රීවරයෙක් කිව්වා, ආණ්ඩුව රකින්න ජනතාව පාරට එන එකක් ඉතිහාසයේ කවදාවත් දැක්කේ නැහැ කියලා. ආණ්ඩුව රකින්න ජනතාව පාරට එන එක තමයි මේකේ විශේෂත්වය. මීට කලින් ආණ්ඩු තිබුණු හැම වෙලාවකම ජනතාව ඒ ආණ්ඩු එළවන්න තමයි කටයුතු කළේ. මොකද, ඒ ආණ්ඩු බලයට පත් වුණු දවසට පස්සේ දවසේ ඉඳලා ජනතාවට එරෙහි දේවල් තමයි කළේ. හැබැයි මේ ආණ්ඩුව පත් වුණු දවසේ ඉඳලා හැම වෙලාවකම බලන්නේ ජනතාවට අවශ්‍ය දේවල් ලබා දෙන්න, ජන ජීවිතය නහාසිටුවන්න, ඒකට අවශ්‍ය මැදිහත්වීම් කරන්න, දරුවන්ගේ අධ්‍යාපනය දියුණු කරන්න අවශ්‍ය මැදිහත්වීම් කරන්න. මේ විධියට ජනතාව එදිනෙදා මුහුණ දීපු ගැටලු විසඳීමට අදාළ මැදිහත්වීම් මේ ආණ්ඩුවෙන් සිද්ධ කරමින් යනවා. ඒක නිසා තමයි ජනතාව මේ ආණ්ඩුව රකින්න පාරට ඇවිල්ලා තිබෙන්නේ. එහෙම නැතුව ඒක හාස්කමක් නොවෙයි. විශේෂයෙන්ම කියන්න ඕනෑ, ජනතාවට එහෙම හැකියාවක්, ජනතාවට මේ ආණ්ඩුව රකින්න ඕනෑය කියන හැඟීමක් ඇවිල්ලා තිබෙන්නේ වෙන මොකක්වත් නිසා නොවෙයි, ආණ්ඩුවයි, ජනතාවයි එක පැත්තක ඉන්න නිසාය කියන එක. මේ රටේ ජනතාවයි, ආණ්ඩුවයි එක පැත්තක ඉන්න නිසා තමයි එහෙම තත්ත්වයක් අද රටේ ඇති වෙලා තිබෙන්නේ. ඒ නිසා අද විපක්ෂයට ලොකු ගැටලුවක් තිබෙන බව අපි දන්නවා. විපක්ෂයට ජනතාව ඒක රාශි කරගන්න බැහැ. විපක්ෂය හැම දාම ඔය විධියට හාමිපුතුන්ගේ පැත්තේ ඉඳගෙන විවේචන කළොත්, තමන්ගේ කඳවුර ගැන විතරක් හිතලා විවේචන කළොත්, මේ රටේ ජනතාව කොහොමත් විපක්ෂයෙන් ඈත් වනවා. ඒක වළක්වන්න බැහැ. ඒක නිසා ඊළඟට ආණ්ඩු බලයක් ගන්න සිහිනයක් හරි තිබෙනවා නම් ඒ ක්‍රමවේදය වෙනස් කරගන්න කියන ඉල්ලීම අපි කරනවා.

ඊයේ දවසේත් කථා බහට ලක් වුණු දෙයක් ගැනත් විශේෂයෙන්ම මේ වෙලාවේ මම සඳහන් කරන්න ඕනෑ. ඊයේ දවසේත් කාවන්නිස්ස හස්ති රාජයාගේ වියෝව පිළිබඳව කථා කළා. ඇත්තටම අපි කාටත් ඒ ගැන ලොකු කම්පනයත් තිබෙනවා. මේ රටේ අලි වෙනුවෙන් ඊයේ කථා කරපු මන්ත්‍රීවරයාට විශේෂයෙන්ම මම කියන්න ඕනෑ, "අලි රොෂාන්ලා" වාගේ අය හදා වඩා නඩත්තු කළේ ඒ අය බව. ඒ අය "අලි රොෂාන්ලා" නඩත්තු කළා විතරක් නොවෙයි. ඇතින්නියන් මරලා, අලි පැටව් අරගෙන, ඒ සතුන් තමන්ගේ පෞද්ගලික බූදලය විධියට පාවිච්චි කළ අය තමයි අද මේ අලින් ගැන කථා කරන්නේ. ඒ නිසා විශේෂයෙන්ම ඒ අයට කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. තමන්ට තිබෙන නඩු ටිකට අවශ්‍ය කරන නීතිමය සහාය අරගෙන ඒකට මැදිහත් වනවා වෙනුවට වෙන වෙන කතන්දර කියලා ආණ්ඩුව නිකම් බිය වද්දන්න හැදුවාට, එහෙම බය වෙන ආණ්ඩුවක් නොවෙයි මේ ආණ්ඩුව. මේ ආණ්ඩුව මේ රටේ ජනතාවගේ ජන වරම රකින, ජනතාවත් එක්ක එකට වැඩ කරන, ජනතාවගේ අවශ්‍යතා හරියට ඉෂ්ට කරන ආණ්ඩුවක්. ඒ නිසා මේ ආණ්ඩුව ලෙහෙසියෙන්, ඔබතුමන්ලා ඔය කියන විධියට බිය වද්දන්න පුළුවන් ආණ්ඩුවක් නොවෙයි කියන කාරණයත් විශේෂයෙන්ම ඊයේ කථා කළ නාමල් මන්ත්‍රීතුමාට කියන්න ඕනෑ. මොකද ඒ මන්ත්‍රීතුමා හදනවා, ආණ්ඩුව බය කරන්න; රිමාන්ඩ බන්ධනාගාරයේ ඉඳලා ඇවිල්ලා අපව බය කරන්න හදනවා. නමුත් මේ ආණ්ඩුව ඒවාට බය නැහැ කියන කාරණයත් විශේෂයෙන්ම කියන්න ඕනෑ. ඒ අයගේ බාප්පලා, හෙන්චයියලා, ඒ අය වෙනුවෙන් උසාවියේ නඩු තීන්දු දීපු නඩුකාරවරුන්ට අලින් අරන් දෙන්න වැඩ කටයුතු කරපු හැටි පසුගිය කාලයේ මේ රටේ අධිකරණවලදී හෙළි වුණා. අධිකරණවල හිටපු ඒ සමහර අයගේ විනිසුරුකම පවා නැති වුණා, ඔවුන් එක්ක එකට කටයුතු කළ එකේ ශාපයට.

මම මේ වෙලාවේ විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ, අපි මේ රටේ නිවැරදි ගමනක් යන බව. අනිවාර්යයෙන්ම මේ නිවැරදි ගමන අපි ඉදිරියට ගෙන යනවා. ඒ නිවැරදි ගමන යන නිසා තමයි මේ රටේ ජනතාව මේ ආණ්ඩුවත් එක්ක ඉන්නේ. මේ ආණ්ඩුවට විරුද්ධව යම් අශුද්ධ කණ්ඩායම් පෙළ ගැහෙනකොට, දසදහස් ගණනක් ජනතාව පාරට බැහැලා ඒ කණ්ඩායම්වලට එරෙහිව කටයුතු කරන්න සූදානම් වෙලා ඉන්නේ ඒ නිසාය කියන කාරණය විපක්ෂයට කියමින්, මා නිහඬ වනවා.

ඔබතුමාට බොහොම ස්තුතියි, මේ අවස්ථාව ලබා දුන්නාට, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සුනිල් හඳුන්නෙත්ති අමාත්‍යතුමා, ඔබතුමාට විනාඩි 21ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.51]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය බැංකුවලින් රුපියල් බිලියන 7.7ක් - මිලියන 7,700ක් - නැවත අතිරේක හැටියට වෙන් කරලා, ඒක ව්‍යවසායකයින්, කර්මාන්තකරුවන්, ව්‍යාපාරිකයින් නහාසිටුවීම සඳහා ඔවුන්ට ණය හැටියට ලබා දීම සඳහා අනුමැතිය ලබා ගැනීම සම්බන්ධයෙන් තමයි අද මේ කථා කරන්නේ. මම මීට කලිනුත් මේ පාර්ලිමේන්තුවේ අවධානය යොමු කෙරෙව්වා, මේකේ වැදගත්කම පිළිබඳව. අපේ රටේ නිෂ්පාදන ආර්ථිකයේ කොඳු නාරටිය තමයි ව්‍යාපාර, එහෙම නැත්නම් කර්මාන්ත. අපි විශේෂයෙන් දේශීය කර්මාන්ත ගොඩනැඟිය යුතුයි. මෙහිදී අපි කවුරුත් පිළිගන්නා යථාර්ථයක් තිබෙනවා. එය විපක්ෂයේ මන්ත්‍රීවරුනුත් පිළිගන්නවා; අපිත් පිළිගන්නවා.

2022-2023 කාලයේදී මේ රටේ ව්‍යවසායකයින්ට, ව්‍යාපාරිකයින්ට විශාල වශයෙන් ණය අර්බුදයකට මුහුණ දෙන්න සිදු වුණා. ඒ වාගේම 2019දී ඇති වෙච්ච තත්ත්වයන් නිසා ණය උගුලකත් ඔවුන් හිර වුණා. අපට මතකයි, එවකට පැවති රජය ව්‍යවසායකයින්ට ණය දීලා, කොරෝනා ව්‍යසනය කාලයේදී ඒ ණය ගෙවා ගන්න බැරි වුණාම ඒ අයගේ ණය නැවත අලුත්

ණයක් බවට පත් කළ බව. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත් දන්නවා, ඉන් පසුව ඒ ණයවල පොලියටත් පොලී එකතු කළ බව. ඒ විධියට පොලී පිට පොලී එකතු කළා. ඒ නිසා ඒ අයගේ ව්‍යාපාර බුන්වත් වුණා. බලය ගන්නකොට අපට තිබ්බ ප්‍රධාන ප්‍රශ්නයක් තමයි, පරාටේ නීතියට හසු වූ අයගේ ණයවලට මොකද කරන්නේ කියන එක. ඒ වෙනුවෙන් සංවිධාන බිහි වුණා. ජනාධිපති ලේකම් කාර්යාලය ළඟ උද්ඝෝෂණ කළා. අපේ කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයට ආවා. අපි ඊට පස්සේ රාජ්‍ය බැංකු සහ පෞද්ගලික බැංකු එක්ක කථා කරලා, ඒගොල්ලන්ගේ ගැටලු එකින් එක විසඳුවා. ඔබතුමන්ලාට කියන්න, අද වනකොට ඒ ප්‍රශ්නය නැහැ. අපි මාසිකව මුදල් අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණයක් කරලා, බැංකු සහ අනිකුත් මූල්‍ය ආයතන එක්ක එකතු වෙලා, එක එක ප්‍රශ්නවලට වෙන වෙනම උත්තර හෙව්වා. ඒ නිසා අද ඒ අයගේ ප්‍රශ්න නැහැ. පරාටේ නීතියට හසු වූ අය අද ලංකාවේ ඉන්නවා නම් ඒ මුළු ප්‍රමාණය, 800ක් විතර වෙන්න පුළුවන්. හැබැයි, ඒගොල්ලන් හැමෝටම අපි grace period එකක් දුන්නා.

CRIB එකට ගිහිල්ලා හිටපු අයට CRIB එකෙන් අයින් වෙන්න, කිසිවක් නොසලකා රුපියල් මිලියන 5ක් - ලක්ෂ 50ක් - දක්වා අපි ණය අනුමත කළා. ඒ කියන්නේ බැංකුවක විශ්වාසය පලුදු වෙලා, අසාදුලේඛනගත තත්ත්වයට පත් වුණු කර්මාන්තකරුවන්ටත් අපි රුපියල් ලක්ෂ 50ක් දක්වා ඇප වුණා. එහෙම කරලා අපි ඒ අය නහාසිටෙව්වා. ඒ අය දැන් තමන්ගේ කර්මාන්ත, ව්‍යාපාර ආරම්භ කරලා තිබෙනවා. අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා කියපු ප්‍රශ්නයත් මම අමාත්‍යාංශයට යොමු කළා. ඒ factory එකට කථා කරලා, ඒ අයගේ ප්‍රශ්නය මොකක්ද කියලා බලලා, ඔවුන්ටත් අපි උත්තරයක්, සහනයක් දෙන්න බලමු. මොකද, තනි තනි කර්මාන්තකරුවන්ට අපි තනි තනිව මැදිහත් වනවා. මම පක්ෂ, විපක්ෂ භේදයක් නැතිව ඔබතුමන්ලාගෙන් මෙන්න මෙහෙම ඉල්ලීමක් කරනවා. දැන් දිස්ත්‍රික්ක විසිපහේම අපි කර්මාන්ත කමිටු හදලා තිබෙනවා, ප්‍රාදේශීය කර්මාන්ත කමිටුව විධියට. ඒ කියන්නේ, ගමේ කෘෂිකර්ම කමිටුව වාගේ එකක්. ප්‍රාදේශීය ලේකම්තුමාගේ සම සභාපතිත්වයෙන් ප්‍රාදේශීය කර්මාන්ත කමිටුව තිබෙනවා. අපේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට කෝට්ටේ ප්‍රාදේශීය කර්මාන්ත කමිටුව තිබෙනවා, අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමාට ගම්පහ ඔබතුමාගේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කර්මාන්ත කමිටුව තිබෙනවා. ඒ කර්මාන්ත කමිටුවලට අපේ සියලුම නිලධාරීන් සම්බන්ධ වනවා. ප්‍රාදේශීය ලේකම්තුමා සම්බන්ධ වනවා, ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරිය, කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය, කාර්මික සංවර්ධන මණ්ඩලය, විදානා නිලධාරි, මහජන සමාජ සම්බන්ධතා නිලධාරි, වනිතා ව්‍යවසායකත්ව නිලධාරිනිය වාගේ හැමෝම සම්බන්ධ වනවා. ඒ වාගේම ඔබතුමන්ලාට ඒකට කැඳවන්න පුළුවන්, වාණිජ මණ්ඩලය, වෙළෙඳ සංගමය, ත්‍රිරෝද රථ සංගමය නියෝජනය කරන්නන් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සිටින බැංකු සියල්ල නියෝජනය කරන අය. ඒ ආයතන සහ පුද්ගලයෝ කැඳවා කර්මාන්තකරුවන්ගේ ගැටලු විසඳන්න ඉස්සෙල්ලාම එතැනදි සාකච්ඡා කරන්න. අපි එකී සියලු නිලධාරීන්ට ඒ වක්‍රලේඛය යොමු කරලා තිබෙනවා.

ගමේ කෘෂිකර්ම කමිටුව වැදගත් යම්සේද, ගමේ කර්මාන්ත කමිටුවත් ඒ වාගේම වැදගත් වනවා. කෘෂිකර්ම කමිටුව ඔබතුමන්ලාට වැදගත් වන්නේ කන්න රැස්වීම් නියන නිසා, පොහොර ටික දෙන නිසා, වතුර ටික දෙන නිසා, බීජ ටික දෙන නිසා, ඇට ටික, පැළ ටික දෙන නිසා, වී විකුණා ගැනීමට වී අලෙවි මණ්ඩලයත් එක්ක සම්බන්ධීකරණය කරන නිසායි. ඒ වාගේම හැම ව්‍යවසායකයෙකුටම, කර්මාන්තකරුවෙකුටම වැදගත් දෙයක් තමයි, ප්‍රාදේශීය කර්මාන්ත කමිටුව. මම මේ වනකොට දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට ගිහිල්ලා දිසාපතිතුමන්ලා, ප්‍රාදේශීය ලේකම්වරුන්, සම්බන්ධීකරණ කමිටුවල සභාපතිවරුන් හමු වෙලා දිස්ත්‍රික්ක විසිපහේම ප්‍රාදේශීය කර්මාන්ත කමිටු ස්ථාපිත කරලා ඉවරයි. ප්‍රාදේශීය කර්මාන්ත කමිටුවේදී ව්‍යවසායකයෙකුගේ හෝ කර්මාන්තකරුවෙකුගේ ණය ප්‍රශ්නයක්, ඉඩම් ප්‍රශ්නයක්, විදුලිය ලබා ගැනීමේ ප්‍රශ්නයක්, ඒ ප්‍රදේශයේ තිබෙන කර්මාන්ත ජනපදයක ප්‍රශ්නයක්, කර්මාන්ත පුරයක ප්‍රශ්නයක් - මීරිගම නම් BOI Zone එකේ ප්‍රශ්නයක් - ආදී ඒ ඕනෑම ප්‍රශ්නයක් සාකච්ඡා කරන්න පුළුවන්. එතැන සාකච්ඡා කරලා විසඳා ගන්න බැරි දෙයක් තිබෙනවා නම් ඔබතුමන්ලාට පුළුවන්, දිස්ත්‍රික් කර්මාන්ත කමිටුවට එය ඉදිරිපත් කරන්න.

දැන් දිස්ත්‍රික් කර්මාන්ත කමිටුව මාසිකව රැස් වනවා. දිස්ත්‍රික්කයේ ඉන්න සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයාට සහ දිස්ත්‍රික් ලේකම්තුමාට සම සභාපතිවරුන් හැටියට ඒ දිස්ත්‍රික්කයේ කර්මාන්ත කමිටුව කැඳවන්න පුළුවන්. ඒ කැඳවනකොට පළාත් සභාවේ තිබෙන කර්මාන්ත අධිකාරිය, පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තුව, පළාත් සභාව යටතේ තිබෙන කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්තුමා වාගේ හැමෝම එයට සම්බන්ධ වනවා. එතැනට වාණිජ මණ්ඩලය කැඳවන්න පුළුවන්, ඉඩම් සම්බන්ධයෙන් නම් ඉඩම් අධ්‍යක්ෂ කැඳවන්න පුළුවන්, විදුලි බලය සම්බන්ධයෙන් නම් විදුලි බලය සම්බන්ධයෙන් ඒ දිස්ත්‍රික්කයේ ඉන්න ප්‍රධානීන් කැඳවන්න පුළුවන් සහ බැංකු සියල්ලේ නියෝජිතයින් කැඳවන්නත් පුළුවන්. එතැනදි තිබෙන ගැටලු සාකච්ඡා කරලා විසඳුම් ගන්න බැරි දෙයක් තිබෙනවා නම් ඔබට අපේ අමාත්‍යාංශයට සෘජුව සම්බන්ධ වන්න පුළුවන්. ඒක තමයි ඇත්ත තත්ත්වය. එතකොට කිසි ප්‍රශ්නයක් නැහැ.

මේ වනකොට හුඟක් අය අහනවා, මේ bank loans ගන්නේ කොහොමද කියලා. අපේ සමහර අය bank loans ගන්න යන්නේ ව්‍යාපාර සැලැස්මක් - business plan එකක් - නැතිවයි. බැංකුවට ගිහිල්ලා කෙළින්ම අහනවා, කර්මාන්ත අමාත්‍යාංශයෙන් දෙන loan එක ගන්නේ කොහොමද කියලා. බැංකුවට සෘජුව කර්මාන්ත අමාත්‍යාංශය හරි මුදල් අමාත්‍යාංශය හරි ලබා දෙන ණයක් ලබා දෙන්න බැහැ. බැංකුවට කරන්න පුළුවන්කම තිබෙන්නේ, අපට එහෙම ක්‍රමයක් නැහැ, අපේ ණය යෝජනා ක්‍රම තිබෙනවා කියලා බැංකුවේ තිබෙන සාමාන්‍ය ණය යෝජනා ක්‍රම හඳුන්වා දීම පමණයි. ඒවාට සියයට 10කට වඩා වැඩි පොලියක් තිබෙනවා. සියයට 15-20 වාගේ පොලියට දෙන සාමාන්‍ය ණය යෝජනා ක්‍රම තමයි බැංකුවලට තිබෙන්නේ.

ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට තමයි අද මේ රුපියල් බිලියන 7.7ක් අනුමත කරන්නේත්, මීට කලින් අනුමත කළේත්. පසුගිය අය වැයෙන් අපි වෙන් කළ මිලියන 95,000න් - බිලියන 95න් - සියයට 78ක් දැනටමත් දීලා ඉවරයි, ඇප රහිත ණය, සියයට 5 loan එක, සියයට 7 loan එක, සියයට 12 loan එක විධියට. මේවා වෙන ක්‍රමයක්. ඒකෙදි තිබෙන දේ තමයි තනි ව්‍යාපාරයක් නම් business registration - BR - එක තිබෙන්න ඕනෑ, සමාගමක් නම් ROC එක තිබෙන්න ඕනෑ. ඊට පස්සේ ඒගොල්ලන් ව්‍යාපාර සැලැස්මක් ඉදිරිපත් කරන්න ඕනෑ. ඒ ව්‍යාපාර සැලැස්ම, ණය ගෙවන්නේ කොහොමද කියන සැලැස්ම ඉදිරිපත් කරන එක තමන්ට කර ගන්න බැරි නම් අපේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය, NEDA එක, IDB එක ඒ වෙනුවෙන් උදව් කරනවා. ඊට පස්සේ ඒ අය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් application එක ගන්න ඕනෑ. ඒක ප්‍රාදේශීය ලේකම්වරයා අනුමත කරලා, අපේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය හරි ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය හරි කාර්මික සංවර්ධන මණ්ඩලය හරි අනුමත කරලා බැංකුවට ඉදිරිපත් කරන්න ඕනෑ. එතකොට බැංකුව හරහා ඒක මුදල් අමාත්‍යාංශයට එනවා. මුදල් අමාත්‍යාංශයේ system එකක් තිබෙනවා. ඒ පද්ධතියට මේ data ටික එකතු කළාට පස්සේ automatically මුදල් අමාත්‍යාංශය

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

ඉල්ලා සිටින ලියකියවිලි බැංකුව හරහා ඉදිරිපත් කළාම කිසි ගැටලුවක් නැතිව මේ ණය ලැබෙනවා. මොකද, අපට ඕනෑකම තිබෙන්නේ ජනතාව අතට මුදල් ලබා දෙන්නයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ජනතාව අතට මුදල් දීලා ආර්ථික ක්‍රියාවලිය මෙහෙයවන්න ඕනෑ ජන සහභාගිත්වයෙනුයි. අපේ මූලික සිද්ධාන්තය, මූලික පදනම වන්නේ රටේ නිෂ්පාදන ආර්ථිකයක්, ජන සහභාගිත්වය සහිත ආර්ථිකයක් සහ ජනතාවට ප්‍රතිලාභ සාධාරණව බෙදී යන ආර්ථිකයක් ගොඩනැඟීමයි.

නමුත්, පසුගිය කාලයේදී වුණේ මොකක්ද? අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී ඇහුවා, රාජ්‍ය බැංකු ලාභ ලැබුවාම මොකක්ද වෙන්නේ කියලා. රාජ්‍ය බැංකු ලාභ ලැබුවාම ඒ රාජ්‍ය බැංකුවල ලාභයෙන් ප්‍රතිලාභයක් බැංකු ගිණුම් හරහා තැන්පතුකරුවන්ට ලැබෙනවා. අනෙක් ඒවා රාජ්‍ය බැංකු ආයෝජනය කරනවා. ඒ වාගේම රාජ්‍ය බැංකු ලාභ ලැබුවාම ඒවා මහ බැංකුව හරහා Treasury Billsවලට යොදවනවා. රාජ්‍ය බැංකු ලබන ලාභ තවත් ආයෝජන ව්‍යාපෘතිවලට යනවා. ඒ වාගේම තැන්පතුකරුවන්ට ප්‍රතිලාභ ලැබෙන විධියට ණය දෙන්නත් පුළුවන්කම ලැබෙනවා.

අපි ආර්ථික විද්‍යාවේදී හොඳට ඉගෙන ගත්ත දෙයක් තමයි velocity කියන එක. ඔබතුමන්ලාත් ඒ ගැන දන්නවා. මුදල්, මුදල් හැටියට තිබිලා වැඩක් නැහැ. දේපළ, දේපළ හැටියට තිබිලා වැඩක් නැහැ. ධනය, ධනය හැටියට තිබිලා වැඩක් නැහැ. ඒ ධනය, දේපළ, මුදල් යෙදවෙන වාර ගණන අනුව ආර්ථික යන්ත්‍රණය, ආර්ථික ක්‍රියාවලිය වැඩි වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රුපියල් 1,000 කොළයක් ඔබතුමාගේ අතේ වාගේම මගේ අතේත් තිබෙනවාය කියලා හිතමු. නමුත් ඒකෙන් වැඩක් නැහැ. ඒ රුපියල් 1,000 කොළය යොදවන වාර ගාණ වැඩි වන තරමට, ඒක සැරිසරන වාර ගණන වැඩි වන තරමට ආර්ථික යන්ත්‍රණය, ආර්ථික ක්‍රියාවලිය වැඩි වෙනවා. කවුරු හරි කෙනෙක් personal loan එකක් අරගෙන ඒකෙන් වාහනයක් ගත්තොත් වාහන වෙළෙඳාම ඉහළ යනවා, ඒ වෙළෙඳාම වර්ධනය වෙනවා. ඒ සම්බන්ධයෙන් අතුරු නිෂ්පාදන කරන අයගේ ප්‍රමාණය වැඩි වෙනවා. Sales repගේ ඉඳලා එහි ආදායම ගලාගෙන යනවා. බැංකු ණයක් ලබා දීම තුළින් ආර්ථික ක්‍රියාවලිය ප්‍රසාරණය වනවා.

පසුගිය කාලයේ සිදු වූ "දිවිවා" සුළි කුණාටුවෙන් පස්සේ අපි කළේ මොකක්ද? මුලින්ම කර්මාන්ත හානි වෙච්ච අයට රුපියල් ලක්ෂ දෙක ගාණේ දුන්නා. සමහරුන්ට රුපියල් ලක්ෂ දෙකකට වඩා හානි වෙලා තිබුණේ නැහැ. සමහරුන්ට ඊට වඩා හානි වෙලා තිබුණා. හැබැයි, මූලික සහනාධාරය විධියට රුපියල් ලක්ෂ දෙක දුන්නාට පස්සේ මොකක්ද වුණේ? ඒ මිනිස්සු කොහොම හරි තමන්ගේ ව්‍යාපාරය ආරම්භ කළා. අපි හරකා-බාන අහිමි වෙච්ච අයට, කෘෂි කර්මාන්තයට හානි වෙච්ච අයට රුපියල් 25,000, 50,000, ලක්ෂ 3, ලක්ෂ 5 දුන්නු එකේ ප්‍රතිඵලය මොකක්ද? සමහරු ඒවා විහිළුවට ලක් කළා. නමුත් එහි ප්‍රතිඵලය තමයි ආර්ථික ක්‍රියාවලිය, යන්ත්‍රණය ශක්තිමත් වීම සහ යන්ත්‍රණය පණගැන්වීම. ඒ කියන්නේ මොකක්ද? මිනිස්සුන්ට රැකියා ලැබෙනවා, ආදායම අතට එනවා, ව්‍යාපාර දියුණු වෙනවා. නමුත්, මේක අකුළා තියාගන්න එක තමයි මෙතුමන්ලාගේ කැමැත්ත.

කොරෝනා වසංගතය පැවති කාලයේ බැංකු ණය ගෙවා ගන්න බැරි අයව හිර කළාම මොකක්ද වුණේ ?

අවසානයේදී රජය එක්කෝ මේ ණය කපා හරින්න ඕනෑ. මොකද, ණයවලින් හිර වෙච්ච මනුස්සයෙකුට ආපසු ගොඩ එන්න බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක නිසා ණය ගෙවන සැලැස්මක් නොතිබුණොත් තමයි මේ ණය කියන එක උගුලක් වෙන්නේ. ණය ගෙවන සැලැස්මක් නැති කෙනෙකුට ණය දීලා වැඩක් නැහැ. හැබැයි, MSMEs, SMEs ආදී මේ හැම ණයක්ම අපි කාර්තු වශයෙන් සමාලෝචනය කරනවා. ඒගොල්ලන්ගේ ප්‍රගතිය සමාලෝචනය කරනවා. ඒගොල්ලන් රැකියා කොච්චර ලබා දීලා තිබෙනවාද, ඒගොල්ලන් වෙළෙඳ පොළේ කොහොමද ඉන්නේ, ඒගොල්ලන්ගේ ආරක්ෂණය මොකක්ද, ඒගොල්ලන්ගේ ප්‍රමිතීන් කොහොමද කියන කාරණාත් සියල්ල ඇතුළුව තමයි මේ ණය ක්‍රියාවලිය ඉදිරියට යන්නේ.

පසුගිය කාලයේ බැංකු කරපු දේවල් ගැන කථා කළොත් ඒ සම්බන්ධයෙන් ගොඩක් දේවල් කියන්න තිබෙනවා. ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව කියලා බැංකුවක් මේ රටේ තිබුණා. නමුත්, අද වනවිට එහෙම බැංකුවක් නැහැ. ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව වැහුණේ මොකද? ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව වැහුණේ තමන්ගේ ගජ මිත්‍රයන්ට ණය බෙදා දුන් නිසා. අපි COPE එකේදි ඒ ගැන විමර්ශනය කළා. ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව කියන්නේ, සුළු ව්‍යාපාරිකයෙකුට රුපියල් මිලියන දහයක් ණය දෙන්න තිබුණු බැංකුව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව හදනකොටම ඒකේ පදනම වුණේ සුළු ව්‍යාපාර දියුණු කිරීමයි. හැබැයි, ණය දුන්නේ කාටද? මහා ගාමන්ට් අයිති අයට. රුපියල් මිලියන දහයෙන් නොවෙයි ණය දෙන්න පටන් ගත්තේ, රුපියල් බිලියනයෙන් - රුපියල් මිලියන දාහෙන් -.

අපට මතකයි, ත්‍රිකුණාමලය පැත්තේ ආරියවතී ගලප්පත්ති කියලා මන්ත්‍රීතුමියක් හිටපු බව. ඔබතුමන්ලා එතුමිය ගැන දන්නවා. එතුමිය බෝට්ටු සමිතියක් හදාගෙන තිබුණා. ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවෙන් ඒ බෝට්ටු සමිතියට ණය දුන්නා, බෝට්ටු ගන්න කියලා. නමුත්, ඒ මුදල නැවත අයකර ගත්තේ නැහැ. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට මතක ඇති, අවසානයේදී ලංකාපුත්‍ර සංවර්ධන බැංකුවේ NPL rate එක සියයට 38 දක්වා ඉහළ ගියා කියන එක. අපි ඒ දවස්වල ඒ ගැන කථා කළා ඔබතුමාට මතකද?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
අපි දෙදෙනාම ඒ ගැන කථා කළා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒක තමයි, අපි ඒ ගැන කථා කළා. ඒ කියන්නේ, කිසිම ඉවක් බවක් නැතුව ණය දීලා. ඉවක් බවක් නැතුව දේශපාලන හිතවතුන්ට එහි මුදල් ණය වශයෙන් බෙදා දීලා ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව වහන්න සිදු වුණා. ඊළඟට, ප්‍රමුඛ බැංකුව වැහුණා. මේක තමයි යථාර්ථය.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මෙහෙමයි, ගරු ඇමතිතුමා. ඒවා කරපු අයයි, අපියි වෙනස්. ඒක නිසා විපක්ෂයේ හැමෝටම අත දික් කරන්නේ නැතිව ඒ අදාළ අය ඉන්න පැත්තට අත දික් කරන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒක හරි, ඒක හරි. බූරුවා ගැහුවත් එකයි, බූරු පිටිය ළඟ වාඩි වෙලා හිටියත් එකයි නේ, හර්ෂ මන්ත්‍රීතුමා. බූරු පිටිය ළඟ වාඩි වෙලා හිටියත් බූරුවා ගැහුවා වාගේ වෙනවා. මොනවා කරන්නද? බූරුවා ගැහුවත් එකයි, බූරු පිටිය ළඟ වාඩි වෙලා හිටියත් එකයි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
අපි බුරු පිටිය පැත්තේ ගියේත් නැහැ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමන්ලා ගියේ නැති වුණාට ඉතින් ගියා වාගේ තමයි. මෙහෙමයි, විපක්ෂයේ කියලා පෙන්වන්න ඒගොල්ලන් දැන් නැහැ නේ. ඒක නේ ප්‍රශ්නය. *[බාධා කිරීමක්]* ඉන්නේත් දෙදෙනාද කොහේද. ඒ දෙදෙනාත් දැන් ඇතුළේ. ප්‍රශ්නය මේකයි. ඒගොල්ලන් සම්පූර්ණයෙන්ම බැංකු පද්ධතිය දේශපාලනීකරණය කළා. ඇත්තටම සාක්ෂි සහිතව අපට ඔබතුමන්ලාට කියන්න පුළුවන්, අපි අද එහෙම කරන්නේ නැහැ කියලා. අපි අද එහෙම කරන්නේ නැහැ. ඒක නිසා අපට වගකීමක් සහ වගවීමක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, MSME sector එක යළි පණගැන්වීම සඳහා 2026.10.01 වනවිට අපි කෘෂි කර්මාන්තය ඇතුළු ක්ෂේත්‍ර දහනවයක් සඳහා පුද්ගලයින් 2,613කට ණය ලබා දීලා තිබෙනවා. ඒ යටතේ රුපියල් බිලියන 25ක් - මිලියන 25,926ක් - දීලා තිබෙනවා. අපට කියන්න පුළුවන්, දිස්ත්‍රික්ක හැටියට ඒ ණය දුන්නේ කාටද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හැටියට දුන්නේ කාටද, කවුද මේවා අරගෙන තිබෙන්නේ කියලා. දිස්ත්‍රික්ක හැටියට ගත්තොත් දිස්ත්‍රික්ක 25ටම ඒ ප්‍රමාණය බෙදිලා ගිය ආකාරය තිබෙනවා. මම ඒ විස්තර මීට කලින් පාර්ලිමේන්තුවේදී සභාගත කළා. මේ සහනය ලබා ගන්නා පෞද්ගලික අංශයේ බැංකු ගැන කළ සාකච්ඡාවේදී මම ඒ විස්තර සභාගත කළා. ඒ නිසා මම නැවත ඒ විස්තර ඉදිරිපත් කරන්නේ නැහැ. මේ කාරණා තිබෙනවා. ඒක නිසා අපට වගවීමක් තිබෙනවා.

බැංකුවක තැන්පත් කරන මුදල් කියන්නේ තැන්පත්කරුවන්ගේ මුදල්. ඒවා ඉවක් බවක් නැතුව තමන්ගේ පෞද්ගලික ධනය වාගේ බෙදා දෙන්න බැහැ. බැංකු පද්ධතිය කඩාගෙන වැටුණොත් මොකද වෙන්නේ? බැංකු ශක්තිමත් වීම ගැන, ලංකා බැංකුව ලාභ ලැබීම ගැන, මහජන බැංකුව ලාභ ලැබීම ගැන කථා කරනවා, ලාභ අරගෙන සූරා කනවා වාගේ කියලා. එහෙම නැහැ. ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව ඇතුළු රාජ්‍ය බැංකු ලාභ ලබනවා කියන්නේ ආර්ථිකය ශක්තිමත්, ආර්ථිකය ස්ථාවරයි කියන එකයි. ඒ ආර්ථිකයේ ආයෝජනය කරන්න ආයෝජකයින් කැමැතියි. මේක තමයි යථාර්ථය. ඒ වාගේම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර කර්මාන්තවලට ණය අනුමත කරන්නත් අපට පුළුවන්. ණය යෝජනා ක්‍රම ගෙනෙන්න පුළුවන්. භය වෙන්න දෙයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ජාතික ශිල්ප සභාව මඟින් හස්ත කර්මාන්ත ශිල්පීන්ට තමන්ගේ අමුද්‍රව්‍ය ටික ගන්න, යන්ත්‍ර සූත්‍ර ටික ගන්න ලංකා බැංකුවෙන් සියයට තුනක පොලී අනුපාතය යටතේ ණයක් දෙනවා. සියයට 3ක පොලියට ණයක් දෙන එක බැංකුවට පාඩුයි. හැබැයි, පුළුවන් කෙනාගෙන් උපරිම ප්‍රතිශතයකින් අරගෙන, ඒ අයට ණය දෙනකොට හොඳ අගයකට ණය දීලා, බැංකුව ලබා ගන්නා ලාභය තුළ සාමාන්‍ය පුංචි ව්‍යාපාරිකයාට; රුපියල් ලක්ෂ දෙකක, තුනක, දහයක ණයක් ගන්න කෙනාට සියයට 3 පොලියට දෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක තමයි රාජ්‍ය බැංකුවල වගවීම, විනිවිදභාවය. රාජ්‍ය බැංකු පද්ධතිය තිබෙන්නේ ඒකට.

අපට මතකයි, ඉතිහාසයේ මේ රාජ්‍ය බැංකු ප්‍රතිව්‍යුහගත කරන්න, විකුණන්න, පෞද්ගලීකරණය කරන්න යෝජනා ගෙනාවා. අද ඒ යෝජනා නැහැ. අද ඒ යෝජනා සාකච්ඡා වෙන්නේ නැහැ. අද රාජ්‍ය බැංකු තරගකාරී ලෙස ආර්ථිකය ශක්තිමත් කරලා තිබෙනවා. අද රාජ්‍ය බැංකුවලට බිලියන 7.7ක් මේ අද කථා කරන සාකච්ඡාවෙන් පස්සේ නිදහස් කරන්න පුළුවන්කම ලැබෙනවා, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, ව්‍යවසායකයින් සඳහා ණය ලබා දෙන්න. ඒක හොඳ නැද්ද? ඒක ගම් මට්ටමටම යනවා. ඒ වාගේම ඒක උතුර-නැඟෙනහිරටත් අදාළයි; දකුණටත් අදාළයි. පක්ෂ භේදයක් නැහැ. ජාති භේදයක් නැහැ, කුල භේදයක් නැහැ. ආගම් භේදයක් නැහැ. හැම දිස්ත්‍රික්කයටම මේ ණයවල ප්‍රතිලාභය සාධාරණව බෙදිලා යනවා. මේක තමයි යථාර්ථය. ඒ නිසා කියන්න සතුටුයි, අද ආර්ථිකය ස්ථාවර වෙලා තිබෙනවා; දේශපාලනයේ ස්ථාවරත්වයක් තිබෙනවා; රටේ නීතියේ ආධිපත්‍යය කාටත් සාධාරණව ක්‍රියාත්මක වෙනවා; ඒ නිසා ණය ක්‍රියාවලිය හොඳින් සිදු වෙනවා.

අද අපි අනුමත කරන මේ යෝජනාව පසුගිය අය වැය කථාවේදී ගරු ජනාධිපතිතුමා ලබා දුන්නු පොරොන්දුවක් එක්ක, අපේ රටේ ව්‍යවසායකයින්, ව්‍යාපාරිකයින්, කර්මාන්තකරුවන් ශක්තිමත් කරන්න අපේ රජය ගන්නා අලුත් පියවරක්, නව යෝජනාවක්. තවදුරටත් අපි මේක තහවුරු කරන්නේ මේ ක්ෂේත්‍රය රටේ කොඳු නාරටිය නිසායි.

ගම් මට්ටමේ පොඩි ව්‍යාපාර, ව්‍යවසායන්, කර්මාන්තකරුවන් නහා සිටුවන්න, නහා සිටුවන්න ජාතික ආර්ථිකයේ ශක්තිය වැඩි වෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒකෙන් මේ ආණ්ඩුව වට්ටන්න බැහැ නේ. මේ ආණ්ඩුව කොහොමත් ස්ථාවරයි. ඒවායින් වට්ටන්න බැරි නිසා සමහර අය වෙන වෙන කොනිත්තන දේවල් කරනවා. සමහර ප්‍රදේශවල පුංචි පුංචි සිද්ධි ඇති කරන්න හදනවා. එක්කෝ ජාතිවාදය අවුස්සන්න හදනවා. එක්කෝ ආගම ඇද ගන්නවා. දේශපාලනයේ ඉතාම බොළඳ, ගල් යුගයේ සටන් පාඨ ගෙනෙනවා. ඒවා අද මේ 21වන සියවසේ අලුත් තාක්ෂණයක් එක්ක, AIකරණය වෙච්ච සමාජයක් එක්ක ඉස්සරහට යන ලෝකය තුළ වලංගු නැහැ. ඒකයි අපි ඔබට යෝජනා කරන්නේ අලුතින් හිතන්න කියලා. මම හැම දාම කියනවා වාගේ අපිත් ආසයි, ශක්තිමත් විපක්ෂයක් එක්ක වැඩ කරන්න. අපේ අඩු පාඩුකම් පෙන්වා දෙන්න. අපිව විවේචනය කරන්න, ඔබේ අදහස් යෝජනා ඉදිරිපත් කරන්න, හොඳ දේ හොඳයි කියන්න, වැරදි දේ පෙන්වා දෙන්න, මේ රට ඉස්සරහට ගෙනියන්න සහාය දෙන්න. රට පළමුව; country, first. අපි කාගේත් අභිලාෂය ඒක. ඒ වෙනුවෙන් වැඩ කරන්න පුළුවන් විපක්ෂයේ මන්ත්‍රීවරු ඉන්නවා කියලා අපි දන්නවා. ඒ වෙනුවෙන් වැඩ කරන්න අභිලාෂයක් තිබෙන විපක්ෂයේ මන්ත්‍රීවරු ඉන්න බව අපි දන්නවා. හිතට එකඟව කිව්වොත්, අපිට මේ දේ කරන්න බැහැ කියලා සමහරු හිතාගෙන හිටියාට "දැන් ඔයගොල්ලන්ට මේක හරියට කරන්න පුළුවන්" කියලා විශ්වාස කරන, හෘදය සාක්ෂියෙන් ඒක පිළිගන්නා මන්ත්‍රීවරු විපක්ෂයේ ඉන්නවා. මගේ ඉස්සරහත් ඉන්නවා. එහෙම ඉන්නවා. ඒක අපි දන්නවා. ඉතින් අපි ඒගොල්ලන්ට සුබ පතන ගමන් මේ රට ඉදිරියට ගෙනියන්න ඔබතුමන්ලාගේ සහයෝගය දෙන්න කියා ඉල්ලා සිටිනවා. ඔබ හැමදෙනාගේම සහයෝගය දෙන්න. හොඳ දේට හොඳයි කියන්න.

ඔබතුමන්ලාටත් යෝජනා තිබෙනවා නම් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු, කර්මාන්ත කමිටු, දිස්ත්‍රික් කර්මාන්ත කමිටුවලට ඉදිරිපත් කරන්න. විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් ඒ හැම එකකටම එන්න පුළුවන්. අදහස් දෙන්න පුළුවන්. අපේ අමාත්‍යාංශය ඕනෑ වෙලාවක ඔබ හැමෝටම විවෘතයි. අපේ අමාත්‍යාංශය මේ ඉන්න විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත්, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් විවෘතයි; මහජන නියෝජිතයෝ හැටියට හැමෝටම විවෘතයි. අපි කර්මාන්තකරුවෝ බෙදලා නැහැ පක්ෂ, විපක්ෂ හැටියට. අපිට යූඑන්පී කර්මාන්තකරුවෝ, ශ්‍රී

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

ලංකා නිදහස් පක්ෂයේ කර්මාන්තකරුවෝ, පොහොට්ටුවේ කර්මාන්තකරුවෝ කියලා භේදයක් නැහැ. අපට මේ රටේ ඉන්නේ කර්මාන්තකරුවන්, ව්‍යවසායකයින්, ව්‍යාපාරිකයින් විතරයි. ඒගොල්ලන් අතර අපිට ආණ්ඩු බලය ලබා දෙන්න උදව් කරපු අය ඉන්නත් පුළුවන්, ඔබතුමන්ලාට උදව් කරපු අය ඉන්නත් පුළුවන්, අපිව පරද්දන්න වැඩ කරපු අය ඉන්නත් පුළුවන්, ඔබතුමන්ලා පරද්දන්න වැඩ කරපු අය ඉන්නත් පුළුවන්. ඒක ඒගොල්ලන්ගේ දේශපාලනය. හැබැයි, රට පාලනය කරනකොට අපි ඇස් දෙක පියාගෙනයි ඉන්නේ. අපි පක්ෂ දේශපාලනයෙන් ඒ දෙස බලන්නේ නැහැ.

බොහොම ස්තුතියි, හැමදෙනාටම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු සංජීව රණසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சானக மாதுகொட அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SANJEEWA RANASINGHA left the Chair and THE HON. CHANAKA MADUGODA took the Chair.

[අ.භා. 4.13]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි.

අපේ පරණ මිත්‍රයා වන ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමාගේ කථාවෙන් පසුව කථා කරන්න ලැබීම ගැන මම සන්තෝෂ වනවා. එතුමාත් පිළිගත්තා, සාමාන්‍යයෙන් "විපක්ෂයේ" කියලා ඇඟිල්ල දිගු කළ පළියට ඔය චෝදනා සමහරුන්ට එල්ල වෙන්නේ නැහැ කියලා. ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමනි, එදා ඔබතුමන්ලා, අපි ඔක්කෝම දූෂණයට විරුද්ධව සටන් කළා. අපි එකට පෙළපාළි ගියා. ඒ ගැන ඔබතුමාත් දන්නවා; මමත් දන්නවා. අපි කිසි දවසක සම්බන්ධ නොවුණු, ඒ වෙච්ච වැරදි සම්බන්ධයෙන් ඔබතුමාම පිළිගත්තා සමහර වෙලාවට ඒ ඇඟිල්ල දිගු වෙන එක වැරදියි කියලා. එම නිසා ගරු ඇමතිතුමනි, මින් පස්සේ "විපක්ෂයේ", "විපක්ෂයේ" කියලා කියන්න එපා. විපක්ෂයේ කවුද, කොහේද සහ කින්ද, මන්ද කියලා ඉදිරිපත් කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව මේ කාරණයෙන් පටන් ගන්නම්. ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, NPLs සම්බන්ධව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, NPL ඇස්තමේන්තුව රුපියල් ට්‍රිලියනයක්. ඒ, SMEs අතරේ පමණක්. රුපියල් ට්‍රිලියනයක් කියන්නේ, රුපියල් කෝටි ලක්ෂයක්. අද අපි සාකච්ඡා කරන්නේ රුපියල් කෝටි 60ක් ගැන නේ. රුපියල් කෝටි 60ක interest subsidy එකක් ගැන තමයි අද මේ කථා කරන්නේ; Rs. 600 million වාගේ ප්‍රමාණයක්. ඒ කියන්නේ, කෝටි 60ක්. එහෙම නේ. කෝටි 60ක විතර පොලී සහනාධාරයක් ලබා දීම සම්බන්ධයෙන් තමයි කථා කරන්නේ. හැබැයි, ගෙවා ගන්න බැරි ණය එන්න එන්නම වැඩි වෙලා තිබෙනවා. මේ ආණ්ඩුව එන්න කලින් තිබුණු ප්‍රමාණයට වඩා මේ ආණ්ඩුව ආවායින් පස්සේ කුඩා හා මධ්‍ය පරිමාණයේ ණය හිමියන්ගේ ගෙවා ගන්න බැරි ණය ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. ඒක තමයි ඇත්ත කථාව. මම කිව්වේ ඒකයි, NPL ඇස්තමේන්තුව රුපියල් ට්‍රිලියනයක් කියලා.

මෙතුමන්ලා ආණ්ඩු බලය ගන්න කලින් මොකක්ද කිව්වේ? ආණ්ඩුවට එන්න කලින් මෙතුමන්ලා ස්ටේජ්වල නැගලා කිව්වා, "ණය උගුලේ හිර වෙලා ඉන්න කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරිකයන්ට අපි සහන දෙනවා. අපි පරාටේ නීතිය අවලංගු කරනවා" කියලා. හැබැයි, පරාටේ නීතිය අවලංගු කළා ද? ගරු ඇමතිතුමා කියන්න? පරාටේ නීතිය අවලංගු කළේ නැහැ. පරාටේ නීතිය දිගට හරහාට ක්‍රියාත්මක කරගෙන යනවා. ණය ගෙවන්න බැරි නම් උකසට තැබූ දෙමව්පියන්ගේ ගෙදර විකුණා දමනවා. NPLs අඩු කරන්න මොකක්ද කරලා තිබෙන්නේ? ඊළඟට කිව්වා, සංවර්ධන බැංකුවක් හදනවා කියලා. සංවර්ධන බැංකුවක් හැදුවාද? ගරු ඇමතිතුමනි, ඒ සඳහා අඩුම ගණනේ කෙටුම්පතක්වත් හැදුවාද? දැන් සංවර්ධන බැංකුවක් හදලාත් නැහැ. පරාටේ නීතිය අවලංගු කරලාත් නැහැ.

ඊළඟට කිව්වා, bad bank එකක් ගැන. මොකක්ද bad bank කියන්නේ? Bad bank කරන්නේ අමාරුවේ වැටිලා ඉන්න කට්ටියගේ ණය බැංකු පද්ධතියෙන් එළියට ගැනීම. ඒ එළියට ගන්නේ රජයට අයිති මූල්‍ය ආයතනයක්. එයට අපි කියනවා, asset management company එකක්, එහෙමත් නැත්නම් bad bank එකක් කියලා. එතකොට මොකද වෙන්නේ? බැංකු ජාලයේ තිබෙන බැංකුවල අර ගෙවා ගන්න බැරිව තිබෙන ණය ප්‍රමාණය අඩු වනවා. එතකොට මොකද වෙන්නේ? එතකොට ඒ බැංකුවලට හැකියාවක් ලැබෙනවා තව කට්ටියට, තව අලුත් කට්ටියට නැවත ණය ලබා දෙන්න. එතකොට අලුතෙන් හදපු asset management company එකට, එහෙම නැත්නම් bad bank එකට පුළුවන් වනවා අර අමාරුවේ වැටිලා ඉන්න කට්ටියත් එක්ක සාකච්ඡා කරලා ඔවුන්ගේ ණය බේරා ගන්න වැඩ පිළිවෙළක් හදන්න. ඒක තමයි ලෝකයේ සාමාන්‍යයෙන් සිද්ධ වන ක්‍රමය. ඉතින්, අපිත් බලාපොරොත්තු වුණා ඔබතුමන්ලා MSMEsවලට දුන් පොරොන්දු, අර හදා ගත්ත ආයතනවලට, සංගම්වලට දුන් පොරොන්දු, රටේ ජනතාවට දුන් පොරොන්දු ඉටු කරයි කියලා. නමුත්, ඉටු කළේ නැහැ. ඉටු කරලා නැහැ. ඉටු කරලා තිබෙනවා නම් කරුණාකරලා කෙනෙක් නැගිටලා කියන්න.

ඇත්තවශයෙන් අද ඉදිරිපත් කළ මෙම යෝජනා දෙක සම්බන්ධයි ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්ෂේත්‍රයට. මෙතුමා කිව්වා නේ, එමඟින් වන සේවය ගැන. රටේ මිනිසුන්ට

හොඳක් වනවා නම් ඒ ගැන අපට කිසිම අවුලක් නැහැ. එයට අපේ සහයෝගය ලබා දෙනවා. ඒ නිසා මේ පනත යටතේ ගෙනෙන මේ යෝජනාවට සහ මේ පරිපූරකයට අපි සම්පූර්ණයෙන්ම පක්ෂයි. අපි හැම එකකටම විරුද්ධ නැහැ.

ආණ්ඩුව මොකක්ද මේ කරන්න හදන්නේ? ADB එකෙන් එන්න තිබුණා, ඩොලර් මිලියන 100ක ණය ප්‍රමාණයක්. හැබැයි, මේගොල්ලන්ගේ අකාර්යක්ෂමතාව නිසා ඒක පරක්කු වෙලා තිබෙනවා. අගෝස්තු මාසයේයි එය එන්න තිබුණේ. දැන් කියනවා, ඒ සල්ලි එනකොට දෙසැම්බර් මාසය විතර වෙයි කියලා. MSME ණය දෙන්න කලින් යොදා ගත්තු අරමුදල් ඉවර වෙච්ච නිසා රජයේ දේශීය අරමුදල්වලින් රුපියල් බිලියන 7.5ක් වෙන් කරලා තිබෙනවා අලුත් අරමුදල් හැටියට, ඒ ණය ලබා දෙන්න. ඉතින් ඒක හොඳයි. එහි කිසිම අවුලක් නැහැ. ආණ්ඩුව බැංකුවට ඒ ණය මුදල් ලබා දෙන්නේ සියයට 2ක පොලියට. බැංකුව සියයට 3ක් තියාගෙන ව්‍යවසායකයාට දෙනවා, සියයට 5 පොලියට. හරි නේ. එතකොට ආණ්ඩුවට සාමාන්‍ය ණය ගෙවීම සඳහා වසරකට ගෙවන්න තිබෙනවා, සියයට 10ක විතර පොලී ප්‍රමාණයක්. සියයට 2 පොලියට තමයි බැංකුවට දෙන්නේ. සියයට 8ක විතර වෙනසක් තිබෙනවා. ඔය සියය 8 වෙනස ගැන තමයි මා කලින් කිව්වේ. රුපියල් මිලියන 600ක් විතර වාර්ෂිකව වියදම් කරනවා. ඒක තමයි මේ රුපියල් කෝටි 60. මහා ලොකු දෙයක් නොවෙයි. විසඳන්න තිබෙන ප්‍රශ්නය කෝටි ලක්ෂයක්; විසඳලා තිබෙන ප්‍රශ්නය කෝටි 60ක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මම කියන්නම්, ඊයේ අපේ ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා table කරලා තිබෙන ගල් අඟුරු සම්බන්ධ වාර්තාව ගැන. මේ වාර්තාවේ තිබෙනවා, ගල් අඟුරු වංචාව නිසා පාඩුව රුපියල් මිලියන 18,000ක් කියලා. ආණ්ඩුව අද මහා ලොකුවට කෑ ගහමින්, විස්තර කරමින් මේ කියන්නේ රුපියල් කෝටි 60ක් ගැන. හරි නේ. ගල් අඟුරු වංචාවේ ප්‍රමාණය අද මේ අනුමත කරන මුදලේ ප්‍රමාණයත් එක්ක සංසන්දනය කරන කොට, ගල් අඟුරු වංචාවේ ප්‍රමාණය අද ව්‍යවසායකයන්ට ලබා දෙනවා කියා මහා ලොකුවට කියන මුදල් ප්‍රමාණයට වඩා තිස්ගුණයක් වැඩියි. එය තිස්ගුණයක් වැඩියි, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමන්ලා අද ජනතාවට යම්කිසි දෙයක් දෙනවා නේ. අපි ඒකට හොඳයි කිව්වා නේ. ඒ වාගේ තිස්ගුණයක් තමයි හොරකම. ඒක ගත්තේ කාගෙන්ද? ඒක ගත්තේ ජනතාවගෙන්. ඉතින් බලන්න, මේකද ඔය ගොල්ලන්ගේ ආණ්ඩුව? මේකටද මේ උඩ පැන පැන කියන්නේ අපි අව්වර හොඳයි; අපි මෙව්වර හොඳයි කියලා. මම දන්නේ නැහැ, මට නම් විශ්වාස කරන්න බැහැ.

ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා, ඔබතුමා මේක හොඳට අහගන්න. ඊයේ ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව ආවා, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට. එතැනදී අපි සාකච්ඡා කළා, මේ ප්‍රසම්පාදනය පිළිබඳව. මොකද, මේ ඔක්කෝම එකතු කරන සල්ලි යම්කිසි විධියකට වියදම් වනකොට ඒ ප්‍රසම්පාදනයේ තිබෙන්න ඕනෑ, යම්කිසි standard එකක්. එහිදී මතු වුණා ඔබතුමාත් විශ්වාස කරන්නේ නැති, මටත් විශ්වාස කරන්න බැරි වුණු කාරණයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලයක් තිස්සේ කථා වෙනවා නේ, අරක්කු බෝතල්වල stickers අලවන එක සම්බන්ධව. ඒකේ මහා වංචා සිද්ධ වුණා කියලා ඔබතුමාත් කියලා තිබෙනවා; මමත් කියලා තිබෙනවා. මට මතකයි, පාඨලී ඇමතිතුමා ඉන්න කොට එතුමා සහ මම ඇත්ත වශයෙන්ම Excise Department එකට ගියා. ඊට පස්සේ ඒ ගැන සොයා බැලීම COPA එකෙන් කළා; COPE එකෙන් කළා; ඒ වංචා ගැන කරුණු ඉදිරිපත් වුණා. අලුත් ටෙන්ඩර් එකක් දෙනවා කියලා තිබුණා. නමුත් තවම ඒක දීලා නැහැ. එතකොට ජනවාරි මාසයේ 02වන දා ඉඳලා පටන් ගන්නා, අලුත් අරක්කු බෝතල්වලට stickers ගහන වැඩේ කරන්න බැරි වෙනවා. ඇයි? අද ඔක්තෝබර් මාසයේ 21වන දා. හැබැයි, තවම ටෙන්ඩරය දීලා නැහැ. එහෙම නම් කොහොමද ජනවාරි 02 ඉඳලා ඒ වැඩේ පටන් ගන්නේ? අපට ආරංචි වන විධියට අර සමාගමම දිගින් දිගටම මේ වැඩේ කරගෙන යන පාටක් තමයි තිබෙන්නේ. ඒක නොවෙයි මම මේ කියන්න හදන්නේ.

විශ්වාස කරන්න බැරි වුණා කියා මා අර කියපු දේ තමයි, ඒ ටෙන්ඩර් එකට addendum එකක් ඉදිරිපත් කරලා කියා තිබෙන දේ. ගරු මුදල් නියෝජ්‍ය ඇමතිතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්න එක හොඳයි. ඒ ටෙන්ඩර් එකට addendum එකක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ addendum එකේ මොනවාද කියලා තිබෙන්නේ? ISO 37001 කියන අත්‍යවශ්‍ය - mandatory - කොන්දේසිය අයින් කර කියලා තිබෙනවා, ISO 37001 තිබෙනවා නම් ලකුණු 5ක් ලැබෙනවා කියලා. අපට මේක විශ්වාස කර ගන්න බැරි වුණා. ඊට පස්සේ අපි ඇහුවා, මොකක්ද මේකේ තේරුම කියලා. ඔවුනුත් අපේ මුහුණු දිහා බැලුවා. මේක කොහොමද වෙන්නේ? දූෂණ විරෝධී පනත ගෙනැල්ලා, දූෂණයට විරුද්ධව කථා කරනවා. ISO 37001න් වෙන්නේ, දූෂණය නැති වන විධියට තමන්ගේ ආයතනයේ ප්‍රමාණවත් ක්‍රියා පටිපාටියක් තිබෙනවාද නැද්ද කියන එක සහතික කර ගැනීමයි. ආයතනයේ දූෂණයට විරුද්ධව ක්‍රියා පටිපාටියක් තිබෙනවා නම්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවෙන් - CIABOC එකෙන් - ඒ කට්ටියට විරුද්ධව චෝදනාවක් හෝ ගෙනෙන එක ලේසි වැඩක් නොවෙයි. දූෂණයට විරුද්ධ නම්, ඉදිරිපත් කරලා තිබෙන ටෙන්ඩරයේ දූෂණ විරෝධී කොන්දේසිය අයින් කළේ ඇයි? ඒකට උත්තරයක් අපි ගරු මුදල් නියෝජ්‍ය ඇමතිතුමාගෙන් බලාපොරොත්තු වෙනවා. මම මේ කථාව කිව්වේ ඇයි? රුපියල් මිලියන 600ක් දීලා 18,000ක් ගන්න එක වෙලා තිබෙන්නේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අවුලක් නිසා. ඔබතුමන්ලා දූෂණයට විරුද්ධව ඇත්තටම වැඩ කරනවා නම්, ප්‍රසම්පාදනය හරියට තිබෙන්න ඕනෑ. එහෙම වුණා නම්, අද දුන්නා වාගේ තිස්ගුණයක මුදලක් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට දෙන්න තිබුණා.

ඔබතුමන්ලා තව දෙයක් කිව්වා නේ. ආර්ථික අර්බුදවලට මුහුණ පා සිටින කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරිකයන්ට කිව්වා, insolvency law එක ගේනවා කියලා. Chapter 11 ගැන කථා කළා. බුන්වත් නීතිය කියන්නේ, ඔවුන් අමාරුවේ වැටිලා ඉන්නවා නම්, ඇත්ත වශයෙන්ම ආයතනය වහලා දමන්නේ නැතුව යම්කිසි විධියකට එය ප්‍රතිව්‍යුහගත කර ගන්න යොදා ගන්න පුළුවන් නීතියක්. ඉතින් ඒක සංකීර්ණ - complex - නීතියක් නිසා ඔබතුමන්ලා කිව්වා, MSME කට්ටියට අදාළව සරල නීතියක් ගේනවා කියලා. හදිසියේම මේ නීතිය ගෙනාවා. මගේ අම්මේ! ඒකට තිබ්බිව හදිස්සිය. අවුරුදු එකහමාරක් තිස්සේ පසුගිය ආණ්ඩුවෙන් ගෙනාපු draft එක ගැන කිසිම දෙයක් නොකර හිටපු ආණ්ඩුව මොකක්ද මේ කරන්නේ කියලා අපිත් කලබල වුණා. බලාගෙන යනකොට ඒක කරලා තිබෙන්නේ ලෝක බැංකුවේ budgetary support එකේ සල්ලි ටික ගන්න. ගරු නියෝජ්‍ය මුදල් ඇමතිතුමාත් මෙතැන සිටිද්දීයි මම මේක කියන්නේ. අපි අහනවා, ඒ ණය උගුලේ හිර වෙලා හිටපු MSME කට්ටිය වෙනුවෙන් පියවර ගන්න insolvency law එක හරහා නෛතික පරිසරය නිර්මාණය කළාද, ඒකට අවශ්‍ය රෙගුලාසි ටික හැදුවාද, දැන් ඒ නීතිය ක්‍රියාත්මක වෙනවාද කියලා. මේ තමයි MSME කට්ටියට දීපු පොරොන්දු. පළමුවෙනි එක, පරාටෙ නීතිය ගැන දීපු පොරොන්දු. ඊළඟට තිබෙනවා, bad bank එක ගැන දීපු පොරොන්දු. ඊළඟට තිබෙනවා, insolvency law එක ගැන දීපු පොරොන්දු. මට පෙනෙන විධියට නම් මේ එකක්වත් ක්‍රියාත්මක වන්නේ නැහැ. 2025 අග වනකොට, MSME අංශයේ NPLs රුපියල් බිලියන 900ක් වාගේ තිබෙනවා කියලායි estimate

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

කරලා තිබුණේ. දැන් ඇස්තමේන්තු කර තිබෙනවා, ඒ රුපියල් බිලියන 900 ට්‍රිලියනයකට වැඩි වෙලා කියලා. ඒක තමයි මම කථාව පටන් ගන්න කොටත් කිව්වේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මීට වඩා කථා කරන්න යන්නේ නැහැ. අද ඉදිරිපත් කරලා තිබෙන මේ යෝජනාවට සහ පරිපූරක මුදලට අපි සියයට සියයක් එකඟයි. මොකද, අපටත් ඕනෑ කරලා තිබෙන්නේ මේ රටේ අමාරුවෙන් ගොඩ ගන්න උත්සාහ කරන ව්‍යවසායකයන්ට අත දෙන්නයි. මම දන්නේ නැහැ ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා මොනවා කිව්වාද කියලා. ඇත්ත වශයෙන්ම ගරු ඇමතිතුමනි, බැංකු ඒ කියපු විධියට ණය දෙන්නේ නැහැ. මමත් බැංකුවක වැඩ කරලා තිබෙනවා. බැංකුවේ ප්‍රධාන ආර්ථික විශේෂඥයා හැටියටත්, බැංකුවේ භාණ්ඩාගාරික හැටියටත් මම වැඩ කරලා තිබෙනවා. ඒ නිසා මම දන්නවා, බැංකුවක ණයක් දෙන්නේ කොහොමද කියලා. ඔව්, තර්කානුකූලව කියන්න පුළුවන්, දේශපාලනඥයාට කියන්න පුළුවන්, මේ කට්ටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙන්වා ඔවුන් එක්ක කථා කරලා ණය දෙන්න කියලා බැංකුවට කියන්න කියලා. එහෙම ණය දෙන්නේ නැහැ. ඒක තමයි ඇත්ත. ඇත්ත කථා කරනවා නම්, ඔය National Credit Guarantee Institution එක හරහා, ADB එකේ සහාය ඇතිව සියයට 60ක credit guarantee එකක් ලබා දෙනවා. ඒකට අපේ ගරු විපක්ෂ නායකතුමාටත් ස්තුති කරන්න ඕනෑ. එතුමාත් සෑහෙන කාර්යභාරයක් කළා, ADB එකේ Takafumi Kadono එක්ක සාකච්ඡා කරලා ඒක ලබා ගන්න. හැබැයි, ඒකත් කුඩා ප්‍රමාණයක්. ඇත්තටම, ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා කියපු එකත් එක්ක අපි එකඟ වෙනවා. ඒකට අපේ විරුද්ධත්වයක් නැහැ. කර්මාන්ත සම්බන්ධයෙන් රජය කම්ටු පත් කර තිබීම හොඳයි. මම ඒගොල්ලන් හොඳ නැහැ කියනවා නොවෙයි මේ. මම කියන්නේ එහි යථාර්ථය ගැනයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි. දැන් කථාව අවසන් කරන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
හොඳමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අනෙක් අතට, මම ව්‍යවසායකයෙකු හැටියටත් ඉඳලා තිබෙනවා. ව්‍යවසායකයෙකු හැටියට හිටපු මම දන්නවා, බැංකු මැනේජර් එක්ක කථා කරලා ණයක් ලබා ගන්න එක කොච්චර අමාරුද කියලා. එතකොට යථාර්ථයයි, දේශපාලන වේදිකාවල කියන එකයි, එහෙමත් නැත්නම් ඔබතුමන්ලා කාමරවල ඉඳලා මෙතැනට ඇවිල්ලා දෙන lectures අතරයි ලොකු පරස්පරයක් තිබෙනවා.

කවුද කෙනෙක් කිව්වා, ආර්ථික ඔස්තාර්ලාගෙන් advice ගන්නවා කියලා. රනිල් වික්‍රමසිංහ ළඟ හිටපු ආර්ථික ඔස්තාර් කවුද? දුමින්ද හුලංගමුව. දැන් ජනාධිපතිතුමාගේ ආර්ථික ඔස්තාර් කවුද? දුමින්ද හුලංගමුව. ඔහුට බණිනවා, මෙතැනට ඇවිල්ලා. මාර වැඩේ මේක. හරිම වැඩේ ලංකාවට වුණේ. සුනිල් හඳුන්නෙත්ති මගේ මිත්‍රයා, ඔබතුමා කියන්න ඔයගොල්ලන්ගේ ආර්ථික ඔස්තාර් රනිල් වික්‍රමසිංහගේ ආර්ථික ඔස්තාර් නොවෙයිද, දුමින්ද හුලංගමුව නොවෙයිද කියලා? එහෙම නොවෙයි නම් කියන්න. මොනවාද අනේ මේ කථා කරන්නේ?

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චන්දිම හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.29]

ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு சந்திம ஹெட்டிஆரச்சி)
(The Hon. Chandima Hettiaratchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම අද අපි ඉතාම වැදගත් කරුණක් වන රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡාවට ගන්නවා. මේක අපේ රටේ ආර්ථිකය ප්‍රසාරණය කරන්න, අපේ රටේ ආර්ථිකය සාමාන්‍ය මිනිසුන් අතරට ගෙනියන්න, විවිධ සමාජ තීරු අතරට මේ ආර්ථිකයේ ප්‍රතිලාභ ගෙනියන්න අවශ්‍ය කරන ක්‍රියාමාර්ග තෝරන්නේ කොහොමද කියන එකට ඍජුවම අදාළ වන යෝජනාවක්. අපි ආණ්ඩුවක් විධියට රුපියල් බිලියන 95ක් වෙන් කරලා මේ කාර්යය ආරම්භ කළා.

අපේ ඉලක්කය වුණේ අපි තෝරා ගත්ත ක්ෂේත්‍රවලට - කෘෂි කර්මාන්තයට, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට - අවශ්‍ය කරන ආර්ථික සහයෝගය ලබා දීමයි. ඒ ඉලක්කයට යන්න තමයි අපි මේ කටයුත්ත සූදානම් කළේ. දැනට පවතින රාජ්‍ය-පෞද්ගලික බැංකු හරහා මේ මුදල් අපේ ජනතාව අතරට, ව්‍යාපාරිකයා අතරට, ව්‍යවසායකයා අතරට ගෙනිහිල්ලා ආර්ථික ක්‍රියාවලියක් ජනිත කරලා, ඊට පස්සේ මේ ණය මුදල් අය කර ගැනීමෙන් ඇති වන ආර්ථික දාමය, ආර්ථික ක්‍රියාවලිය ශක්තිමත් කරන්න තමයි අපි උත්සාහ කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ඉලක්කය දැන් සැලකිය යුතු ප්‍රමාණයකින් සාර්ථක වෙලා තිබෙනවා. අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා, රුපියල් බිලියන 95න් සියයට 80ක ඉලක්කයක් කරා යන්න. දැන් MSME අංශයට සහ කෘෂි කර්මාන්තයට - agricultureවලට - ණය ලබා දීලා තිබෙන ප්‍රමාණය ගත්තොත්, ඒ ඉලක්කය අත්පත් කරගැනීමට ආසන්නය දක්වා යන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා. නමුත් දැන් බැංකු පද්ධතියට රුපියල් මිලියන 13,000ක් විතර අවශ්‍ය වන ප්‍රමාණයේ ඉල්ලීම් ලැබිලා තිබෙනවා. ඒ ප්‍රමාණයත් සම්පූර්ණ කරලා අපට අවශ්‍ය කරන මේ ක්‍රියාවලිය තවදුරටත් වේගවත්ව ශක්තිමත් කරගන්න තමයි අපි මේ උත්සාහ කරන්නේ. මේ මුදල් ටික එතැනට අරගෙන යන්නයි අපි උත්සාහ කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොකක්ද මේකේ තේරුම? මේකේ තේරුම තමයි, මේ ණය යෝජනා ක්‍රමයට අපේ රටේ ජනතාව කැමතියි කියන එක. අපේ රටේ ජනතාව ඒකට ආකර්ෂණය වෙලා තිබෙනවා, උනන්දුවක් දක්වලා තිබෙනවා. ඒ නිසා වැඩි-වැඩියෙන් ඉල්ලුම් ප්‍රමාණයක් ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා තමයි අපට පාර්ලිමේන්තුව රැස් කරලා, සාකච්ඡා කරලා මේක අනුමත කරලා දෙන්න සිදු වෙලා තිබෙන්නේ.

අපි මේකෙන් ආවරණය කරන්න උත්සාහ කරන ක්ෂේත්‍ර මොනවාද? අපි ජනතාව ගැන හිතන විධිය, අපි රටේ ආර්ථිකය ගැන හිතන විධිය සම්බන්ධයෙන් අදහසක් ගන්නට පුළුවන්, මේක විශ්ලේෂණය කරලා බැලුවොත්. උදාහරණයක් විධියට දැන් ණය ගෙවා ගන්න බැරිව නතර වෙලා තිබෙන non-performing loans ගත්තොත්, රුපියල් මිලියන 235ක් වෙන් කරලා කාරක ප්‍රාග්ධනය - working capital - විධියට ලබා දෙන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. අපේ හර්ෂ මන්ත්‍රීතුමාත් ඒ ගැන කථා කළා.

ඒ වාගේම ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයන්ට ව්‍යාපාර නැවත ආරම්භ කරන්න රුපියල් මිලියන 342ක් ලබා දෙන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘෂි ක්ෂේත්‍රය සඳහා වෙන් කරන ලද රුපියල් බිලියන 40.8ක මුදලෙන්, රුපියල් බිලියන 38.02ක් - සියයට 93ක ප්‍රමාණයක් - දක්වා ආර්ථික ක්‍රියාවලියට එකතු කරන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඒක තමයි මම ඔබතුමාට කිව්වේ රටේ ජනතාවට, මේක දිහා සාධාරණව, මැද ඉඳන්, විචක්ෂණශීලීව බලන කෙනෙකුට, ආණ්ඩුව මොන පැත්තද අවධානය යොමු කරලා තිබෙන්නේ කියන එක තේරුම් ගන්න පුළුවන්කම ලැබෙනවාය කියන එක. ආර්ථික අර්බුදයක් හැදුවා, ආර්ථිකය වැටිටුවා. අන්න ඒ ආර්ථික අර්බුදය නිසා තමන්ගේ ව්‍යාපාර කර ගන්න බැරි වෙලා නතර කරන්න සිදු වුණු මිනිස්සුන්ට ඒවා නැවත ආරම්භ කරන්න අවස්ථාව දෙන්න, ණය ගෙවා ගන්න බැරි වුණු මිනිස්සුන්ට අවස්ථාව දෙන්න කියන ඒ පැත්ත ගැන තමයි අපි හිතලා තිබෙන්නේ. ඒ දිහා තමයි අපි බලලා තිබෙන්නේ. ඒ නිසා, ජනතාවාදී ආණ්ඩුවක් විධියට මොන දිශාවකටද ආර්ථිකය මෙහෙයවන්නේ කියන එක මේ ක්‍රියාවලිය තුළ අපට පෙනෙන්න තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ ක්ෂේත්‍රය තවදුරටත් ශක්තිමත් කරන්න ඕනෑ ඇයි? අපේ රටේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 52ක් නියෝජනය කරන්නේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයන්. සියයට 52ක් කියන්නේ ආර්ථිකයෙන් භාගයක්. භාගයකටත් වැඩියි, ලොකු පංගුවක්. එතකොට අපි, අපේ රට නිෂ්පාදන ආර්ථිකයක් කරා ගෙනියනවා නම්, අපනයන ආර්ථිකයක් කරා ගෙනියනවා නම්, ඒකට මේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණයේ නිෂ්පාදකයාව තවත් ශක්තිමත් කරන්න ඕනෑ. ඒ නිසා තමයි අපි ඒ පැත්ත ගැන හිතලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි, සමස්ත ශ්‍රම බලකායෙන් සියයට 50ක් ඉක්මවා ඉන්නේ මේ ක්ෂේත්‍රයේ. ඒ කියන්නේ, රටේ ශ්‍රම බලකායෙන් භාගයක් ඉන්නේ මේ ක්ෂේත්‍රයේ. එතකොට ආණ්ඩුව හිතා තිබෙන්නේ රටෙන් භාගයකටත් වඩා වැඩි මිනිස්සු ගැනයි. රටෙන් භාගයකටත් වැඩිය මිනිස්සු ඒ ක්ෂේත්‍රයේ ඉන්නකොට ඔවුන් එක්ක ඉන්න ඔවුන්ගේ පවුල් - කුටුම්භ - සමඟ හැදුණු ආර්ථිකය තමයි ශක්තිමත් වෙන්නේ. ඒක නිසා තමයි අපි මේ ක්ෂේත්‍රය ශක්තිමත් කරන්න ඕනෑ කියලා ආණ්ඩුවක් විධියට කල්පනා කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකේ අවදානමක් නැතුවා නොවෙයි. අවදානමක් තිබෙනවා. ඩොලර්වලින් එනවා, රුපියල්වලින් දෙනවා. එතකොට විනිමය අනුපාත සම්බන්ධ අවදානම් තිබෙනවා. ඒ නිසා තමයි අපේ රටේ බැංකු පද්ධතිය වැදගත් වෙන්නේ. අපේ රටේ වාණිජ බැංකු එකඟ වෙලා තිබෙනවා, තමන් විනිමය අනුපාත අවදානම් දරා ගනිමින්, තමන් සතු ශක්තිය අපේ රටේ ආර්ථිකයේ වර්ධනයට, ආර්ථිකයේ ප්‍රසාරණයට අවශ්‍ය කරන ප්‍රමාණයට ලබා දෙන්න. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක ඇත්තටම අපේ රටේ මිනිස්සු ගැන හිතලා, ඔවුන්ගේ යහ පැවැත්ම ගැන හිතලා කරන කටයුත්තක්.

නමුත්, මම අද අහගෙන හිටියා, මීට සුළු මොහොතකට කලින් වාගේම අද දවස පුරාමත් අපේ රටේ විපක්ෂය විසින් සිදු කළ කථා. ඒවා හරිම ආකස්මිකයි!, හරිම ෂෝක්, ඒවා දරා ගන්න බැරි තරම් සුන්දරයි. මොකද, ඒ කථා ඇතුළේ තිබෙන්නේ අපි ආර්ථිකය හදලා නැහැ, අපි ආර්ථිකය නොහදපු විධිය, අපි මහජනයාට කාර්යක්ෂම සේවාවක් ලබා නොදෙන විධිය, අපි ආර්ථිකයේ අවස්ථාවන් ජනතාවට හදලා දෙන්නේ නැති විධිය ගැන. ඒ කියන්නේ, අද උපන්න තොත්ත බබෙක් වාගේ තමයි අපේ විපක්ෂයේ මත දැක්වීම, අදහස් දැක්වීම තිබෙන්නේ. ඇත්තටම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක දේශපාලන සාකච්ඡාවක් නොවෙයි නේ. මැතිවරණ වේදිකාවකුත් නොවෙයි. නමුත්, අපි මේ පාර්ලිමේන්තුව තුළදීත් "අපි එකඟයි" කියන ගමන්, "විපක්ෂය එකඟයි" කියන ගමන් මොකක්ද මතු කරන්න හදන්නේ? පොඩි සැකයකුත් මතු කරන්න හදනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී මට මතක් වෙනවා, දඹදෙණි යුගයේ "නැම් බඹර කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත" කියන ගෞරව නාමය ලබා හිටපු අපේ දෙවන පැරකුම්බා රජතුමා. ඇයි, ඒ? එතුමා තමයි ''විශුද්ධිමාර්ගය සන්නය'' ලිව්වේත්. මට මේ මොහොතේදී එතුමාව මතක් වුණේ එතුමාට ගෞරව නාමයක් තිබුණු නිසායි. එතුමාට එහෙම ගෞරව නාමයක් තිබුණේ මොකටද? එතුමා සාහිත්‍යයට සහ බෞද්ධ දර්ශනයට කළ සේවය වෙනුවන් තමයි ඒ ගෞරව නාමය ලැබී තිබුණේ. මේ විපක්ෂයේ අයගේ කථා ටික අහගෙන හිටියාම මම හිතනවා, අපේ රටේ විපක්ෂයටත් එහෙම සම්මානයක්, ගෞරව නාමයක් දෙන්න ඕනෑය කියලා. මොකද, සම්මානයක් දෙන්න තරම් වටිනා කියන කථා තමයි ඔවුන් කියන්නේ. රට හැදුවේ නැති, රට වට්ටපු, රට බංකොලොත් කරපු, රටේ ජනතාව පාරට ඇද දැමූ, රටේ ජනතාවට කන්න නැති කරපු අය දැන් රට හදන විධිය ගැන අපට කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මේ අයට "සැම කාල රට භක්ෂ සර්වත්‍ර" කියලා නම්බු නාමයක් දෙන්න ඕනෑ තමයි.

බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[ප.ව. 4.39]

ගරු කේ. කාදර් මස්තාන් මහතා
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இந்தச் சபையில் விவாதிக்கப்படுகின்ற விடயமானது மிகவும் முக்கியமானது. சிறிய தொழில்முயற்சியாளர்கள் உட்பட பலரும் பயனடையக்கூடிய இந்தக் கடன் உதவித் திட்டத்தின்மூலம் எமது வவுனியா, மன்னார், முல்லைத்தீவு மாவட்டங்களிலுள்ள மக்களும் கூடுதலாகப் பயன்பெறும் விதத்தில் அங்குள்ள அதிகாரிகள் செயற்பட வேண்டும். இந்தக் கடன் உதவித் திட்டத்தில் சுமார் 0.07 பில்லியன் அமெரிக்க டொலரும் இன்னும் பல நிதி உதவிகளும் இருக்கின்றன. எங்களுடைய பகுதிகளிலுள்ள முஸ்லிம் சமூகத்தினர் வட்டி இல்லாமல் இஸ்லாமிய முறைப்படி கடனைப் பெறுவதற்கான வசதிகள் செய்து கொடுக்கப்பட வேண்டும். இலங்கையில் People's Bank, இலங்கை வங்கி உட்பட பெரும்பாலான வங்கிகளில் Islamic Banking Unit இருக்கின்றது. அதனூடாக வட்டி இல்லாமல் இந்தக் கடனை வழங்குவதற்கான ஏற்பாடுகளை மேற்கொள்ளும் வகையில் திருத்தங்களைச் செய்ய வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். யுத்தத்துக்குப் பிறகு, இவ்வாறான கடன் உதவித் திட்டங்களை அரசாங்கமும் அரச சார்பற்ற நிறுவனங்களும் புலம்பெயர்ந்த சமூகமும் வழங்கினாலும், அந்த மக்களுக்குச்

[ගරු කේ. කාදර් මස්තාන් මහතා]

சந்தைப்படுத்துகின்ற வாய்ப்புக் குறைவாக இருக்கின்றது. அதற்கான சரியானதொரு பொறிமுறை இல்லாததனால், கடன் எடுத்தவர்களால் கடனை மீளச் செலுத்த முடியாமல் போகின்றது. எனவே, இது சம்பந்தமாக மக்களுக்குத் தெளிவாக விளக்கி, இந்த உதவித் திட்டத்தை நடைமுறைப்படுத்துவதுதான் பொருத்தமானதாக இருக்குமென நான் இங்கு கூறிக்கொள்கின்றேன்.

மேலும், அனோஜன் அவர்களுடைய மரண தண்டனையை இரத்துச் செய்ததற்காக சவூதி அரேபியாவின் மன்னர் அவர்களுக்கும் அந்நாட்டு அமைச்சர்கள் மற்றும் மக்களுக்கும் இந்த இடத்தில் எனது நன்றிகளைத் தெரிவித்துக்கொள்கின்றேன். எமது நாட்டைச் சேர்ந்த பலர், இதற்காகத் தங்களால் எந்தளவுக்கு முயற்சிகளை எடுக்க இயலுமோ அந்தளவுக்கு முயற்சிகளை எடுத்தார்கள். அது மாண்புமிகு சனாதிபதியாக இருக்கலாம், துறைசார்ந்த அமைச்சராக இருக்கலாம், ஏனைய அமைச்சர்களாக இருக்கலாம், பாராளுமன்ற உறுப்பினர்களாக இருக்கலாம், பொது அமைப்புகளாக இருக்கலாம். இவர்கள் அனைவரும் மேற்கொண்ட பாரிய முயற்சியால்தான் அனோஜனுக்கு விதிக்கப்பட்டிருந்த மரண தண்டனையை இரத்துச் செய்ய முடிந்தது. எனவே, இதற்காகப் பாடுபட்ட அனைவருக்கும் இந்த இடத்தில் எனது நன்றிகளையும் பாராட்டுக்களையும் தெரிவித்துக்கொள்கின்றேன்.

கடந்த காலத்தில் மேற்கொள்ளப்பட்ட தொடர் முயற்சியின் பயனாக, எமது மன்னார் மாவட்டத்தில் விபத்து மற்றும் அவசர சிகிச்சைப் பிரிவுக்காக - Accident and Emergency Unitகாக - இந்திய அரசின் grant உதவிமூலம் 600 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளது. மேலும், drainage வசதி, வைத்தியர்களுக்கான விடுதி வசதி மற்றும் ward complexக்காக கிட்டத்தட்ட 650 மில்லியன் ரூபாயை அரசாங்கம் ஒதுக்கியுள்ளது. மானிய உதவித் திட்டத்தை வழங்கிய இந்திய அரசாங்கத்துக்கு நன்றியை தெரிவித்துக்கொள்கின்ற அதேநேரம், அங்கு அபிவிருத்திக்கான நிதி ஒதுக்கீட்டைச் செய்த இந்த அரசாங்கத்துக்கும் நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். முல்லைத்தீவு மாவட்டத்துக்கும் இந்திய அரசாங்கத்தின் grant உதவிமூலம் 600 மில்லியன் ரூபாய் ஏற்பாடு செய்யப்பட்டு இருக்கிறது. கடந்த காலத்தில் மேற்கொள்ளப்பட்ட முயற்சியின் பலனாகத்தான் இவை எமக்குக் கிடைத்திருக்கின்றன.

மேலும், மன்னார் மற்றும் முல்லைத்தீவு மாவட்டங்களிலுள்ள வைத்தியசாலைகளில் cadre revision 10 வருடங்களாகச் செய்யப்படவில்லை. அதனால் வைத்தியர் களுக்கான தட்டுப்பாடு பாரியளவில் காணப்படுகிறது. இதனால் அங்கிருக்கின்ற நோயாளர்களுக்குச் சரியான வைத்தியம் கிடைப்பதில் பிரச்சினை இருக்கின்றது. எனவே, அங்கு விரைவாக cadre revision செய்யப்பட வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். முல்லைத்தீவு வைத்தியசாலையில் பயிற்சிபெறும் - internship செய்யும் - வைத்தியர்களுக்குரிய cadreகூட இல்லாமல் இருக்கின்றது. அண்மையில் மாண்புமிகு சனாதிபதி அவர்கள் வந்தபொழுது, இந்த விடயம் பற்றி கூறப்பட்டது. எனவே, இதனை விரைவாக நிவர்த்தி செய்து தர வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன்.

முஸ்லிம் பெண் தாதியர்கள் தமது கலாசார ஆடை அணிவது சம்பந்தமாகப் புதியதொரு பிரச்சினை உருவாகி இருக்கிறது. ஏன் நான் இதனை இந்த இடத்தில் குறிப்பிடுகின்றேன் என்றால், சிறைச்சாலைகளில் இருக்கின்ற தண்டனை விதிக்கப்பட்ட சமயத் தலைவர்களின் ஆடை தொடர்பான பிரச்சினையை 2-3 நாட்களில் நிவர்த்தி செய்யும் விதத்தில், சட்டத்தை மாற்றியமைப்பதற்காக committee ஒன்றை நியமிக்க முடியும் என்றால், ஏன் முஸ்லிம் பெண் தாதியர்களின் ஆடை தொடர்பான பிரச்சினையைத் தீர்க்க முடியாது என்பதற்காகத்தான். கௌரவ அமைச்சர் அவர்கள் இது தொடர்பில் circular ஒன்றை வெளியிட்டாலே போதுமானது. ஏன் இந்த விடயத்தில் இவ்வளவு கவனக்குறைவாக இருக்கின்றீர்கள்? ஏன் இந்தப் பிரச்சினை தொடர்பில் முடிவொன்றை எடுப்பதற்குத் தயங்குகிறீர்கள்? எனக் கேட்கின்றேன்.

சமயத் தலைவர்களுடைய ஆடை தொடர்பான விடயம் கட்டாயம் செய்யப்பட வேண்டியது. அதில் எந்த மாற்றுக் கருத்தும் இல்லை. ஆனால், அதனைவிட பழைய பிரச்சினைகள் பல தீர்க்கப்படாமல் இருக்கின்றன. மேற்குறித்த சமயத் தலைவர்களின் ஆடை தொடர்பான விடயத்தில் மாண்புமிகு சனாதிபதி அவர்களும் அரசாங்கமும் தலையிட்டு, எவ்வாறு துணிச்சலாக ஒரு முடிவை எடுத்துத் தீர்த்தார்களோ, அதேபோல இரண்டரை வருடங்களாக விடுவிக்கப்படாமல் இருக்கின்ற புனித அல்-குர்ஆன் பிரதிகள் சம்பந்தமான விடயத்தையும் தீர்க்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். ஏனெனில், இன்னும் அவற்றை விடுவிப்பதற்குரிய நடவடிக்கைகளை அரசாங்கம் எடுக்காமல் இருக்கின்றது. பிரச்சினைகள் தீர்க்கப்படாதபடியால்தான் நாங்கள் தொடர்ச்சியாக அந்த விடயங்களைப் பற்றி பேசிக்கொண்டு இருக்கின்றோம்.

அடுத்து, எமது பகுதிகளில் Forest Conservation Department, Wildlife Conservation Department என்பன மக்களுடைய அல்லது அரச அதிகாரிகளின் எந்தவித அனுமதியும் இல்லாமல், chopperஇல் சென்று, GPSமூலம் mark பண்ணி, gazette பண்ணிய காணிகள் இன்னும் விடுவிக்கப்படாமல் இருக்கின்றன. கடைசியாக, இந்தக் காணிகளை விடுவிப்பது குறித்து ஆராய்வதற்காக 2022ஆம் ஆண்டு காலப்பகுதியில் இருந்த சனாதிபதி அவர்களின் பணிப்புரைக்கு அமைய, மாவட்ட ரீதியில் ஒரு குழு அமைக்கப்பட்டது. பின்னர் இந்த விடயம் அமைச்சரவைக்குப் பரிந்துரைக்கப்பட்டது. இன்றும் அந்தக் காணிகளை விடுவிக்கும் விடயம் பாராமுகமாகவே இருக்கின்றது. எனவே, அந்தக் காணிகளை விடுவிப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். எமது பகுதிகளில் யுத்தம் முடிவடைந்த பின்னர் பாதுகாப்புத் தரப்பினரால் கையகப்படுத்தப்பட்ட காணிகள் கட்டங்கட்டமாக விடுவிக்கப் பட்டாலும், அவற்றில் ஆவணங்கள் உள்ள காணிகளை விடுவிப்பதில் காலதாமதம் நிலவுகின்றது. எனவே, அந்தக் காணிகளை விடுவித்து, உரியவர்களுக்குக் கொடுப்பதற்குரிய நடவடிக்கைகளை எடுக்க வேண்டும். அதேபோல், 2019ஆம் ஆண்டு 'ஈஸ்டர்' குண்டுத் தாக்குதல் காரணமாக மூடப்பட்ட பள்ளிவாசல்கள் கிட்டத்தட்ட 8 வருடங்களாகியும் இன்னும் திறக்கப்படாமல் இருக்கின்றன.

இவ்வாறு பல பிரச்சினைகள் இருக்கையில், மேற்குறித்த மதத் தலைவர்களின் ஆடை விவகாரத்தில் விரைவாகச் செயற்பட்டு முடிவெடுத்த அரசாங்கம், ஏன் இவற்றைக் கண்டுங்காணாமல் இருக்கின்றது என்பது எமக்குத் தெரியவில்லை. மக்கள் உங்களுக்கு ஆணை வழங்கியிருப்பதன் அடிப்படையில், எந்தவொரு சமூகத்துக்கும் பாதிப்பு இல்லாத பிரச்சினைகளை மிக விரைவாக நிவர்த்தி செய்து தர வேண்டும். குறிப்பாக, சிறுபான்மை மக்கள் வாழ்கின்ற எமது பகுதிகளில் Forest Conservation

Departmentஇனால் கையகப்படுத்தப்பட்டுள்ள காணிகளின் விடுவிப்பாக இருக்கலாம், பாதுகாப்புப் படையினர் கையகப்படுத்தியுள்ள காணிகளின் விடுவிப்பாக இருக்கலாம், சுகாதார ஊழியர்களுடைய ஆடை விவகாரமாக இருக்கலாம்! அப்பிரச்சினைகளை விரைவாக நிவர்த்தி செய்வதற்குரிய முயற்சிகளை எடுக்க வேண்டுமென இந்த இடத்தில் கேட்டு, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) අනිල් ජයන්ත අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

Order, please! ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු චානක මාදුගොඩ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු චානක මාදුකොට අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, මාණ්පුමිකු (පේරාසිරියර්) සේන නාණායක්කාර අවර්කළ් තලైමை වකිත්තාර්කළ්.

Whereupon THE HON. CHANAKA MADUGODA left the Chair, and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.

[අ.භා. 4.49]

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි ඉදිරිපත් කරන්නේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් නඟාසිටුවීම සඳහා රජය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග තව තවත් ශක්තිමත් කිරීමට අවශ්‍ය වුණු නීතිමය අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාදාම දෙකක්. මේ මඟින් ඒ ණය ඒ අදාළ ව්‍යවසායකයින් වෙත ලබා දීම සඳහා වූ පෞද්ගලික සහ රාජ්‍ය බැංකු පද්ධතියට අවසර ලබා ගන්නවා.

ඒ වාගේම ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් සහ ග්‍රාමීය මට්ටමේ සිටින තවත් ව්‍යවසායකයින්, නිෂ්පාදකයින් ඉලක්ක කරගෙන අපි 2026 අය වැයේදී රුපියල් බිලියන 95.6ක මූල්‍ය වැඩසටහන් ගණනාවක් ඉදිරිපත් කළා. එහි ප්‍රධාන ක්ෂේත්‍ර දෙකක් තිබෙනවා.

එකක් තමයි, රජය විසින් ප්‍රතිමූල්‍ය ලබා දීම. ඒ කියන්නේ රජය විසින් බැංකුවලට මුදල් ලබා දෙනවා, ඒකත් අඩු පොලියකට. ඒ අනුව බැංකුව අය කරන සේවා ගාස්තුවකුත් සහිතව අඩු පොලියකට ණය ලබා දීමේ ක්‍රමවේදය තමයි එක ක්‍රමයක් වන්නේ. ඒ වාගේම අපි පොලී සහනයකුත් ලබා දෙනවා. එතැනදී භාවිත කරන්නේ බැංකුවල තිබෙන මුදල්. ඒ අනුව මේ රුපියල් බිලියන 95.6න් රුපියල් බිලියන 40ක්ම ණය පොලී සහනය වෙනුවෙන් තමයි ලබා දීලා තිබෙන්නේ. එම වැඩකටයුත්ත මේ වනකොට සියයට 100ක්ම අවසානයි.

ප්‍රතිමූල්‍ය කිරීමේදී රාජ්‍ය මුදල් භාවිත කරමින් කරපු වැඩසටහන් අතර අපි එක වැඩසටහනක් යොදා ගෙන තිබුණා, ආසියානු සංවර්ධන බැංකුව මඟින් ලබා ගන්නා ණය සම්බන්ධව. එහිදීත් කෘෂිකාර්මික අගය දාම ඉලක්ක කර ගත් වැඩසටහනක් තිබුණා. ඒ වාගේම ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් දියුණු කිරීමේ වැඩසටහනකුත් තිබුණා. එහිදී කෘෂිකාර්මික අගය දාම සම්බන්ධයෙන් වෙන් වෙලා තිබුණු මුදල් ප්‍රමාණය ලබා ගැනීමේ වැඩ කටයුතු කර ගැනීමේදී යම් ප්‍රමාදයක් සිදු වෙලා තිබෙනවා. ඒ නිසා අපිට විකල්ප දෙකක් තිබෙනවා. එක විකල්පයක් තමයි ඒ වෙන් කරන ලද මුදල මේ අවුරුද්දේ භාවිත නොකිරීම. ඊළඟ විකල්පය තමයි අපිට ඒ මුදල දැනටමත් ක්‍රියාත්මක වන ණය ව්‍යාපෘතියක් වෙනුවෙන් යොදා ගන්න පුළුවන්ද කියන කාරණය. එතකොට අපි දෙවැනි විකල්පය දෙසට යොමු වෙනවා. ඒකට හේතුව මේකයි. මේ සමස්ත වැඩසටහනේ තිබෙනවා, එක්තරා ණය ක්‍රමයක් Stimulating Package for Re-energizing the MSME Sector කියලා. ඒ කියන්නේ, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත නැවත පණගැන්වීමේ වැඩසටහන. මේ වැඩසටහනට රුපියල් බිලියන 25.7ක් වෙන් වෙලා තිබුණා. ඒ ණය බෙදා හැරීම ඉතාම කාර්යක්ෂමව සිදු වුණා. ඒ වාගේම අපි "දිවිවා" සුළි කුණාටුව හමුවේදීත් මේ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර පණගැන්වීමට තවත් රුපියල් බිලියන 5ක් වෙන් කළා. මේ ක්ෂේත්‍ර දෙකම ඒකාබද්ධව ගත්තාට පස්සේ මේ ක්ෂේත්‍රයේ වේගයෙන් ණය ලබා දීම, ණය ලබා ගැනීම සිදු වෙනවා. ඉල්ලුම් කරපු විශාල ප්‍රමාණයක් තවදුරටත් බැංකු පද්ධතියේ තිබෙනවා. ඒ නිසා ආසියානු සංවර්ධන බැංකුව හරහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණය මේ ස්ථානයට මාරු කර ගන්නේ රුපියල් බිලියන 95.6ම වියදම් කිරීමේ පරමාර්ථය ඇතිවයි. දැනටමත් මේ රුපියල් බිලියන 95.6න්, රුපියල් බිලියන 81කට ආසන්න මුදල් ප්‍රමාණයක් වැය වෙනවා. ඒ නිසා අපි පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගෙන මේ විදේශීය මූල්‍යයන මාර්ගයකින් ලැබී තිබුණු වැය ශීර්ෂය මාරු කරලා නැවත පණගැන්වීමේ ව්‍යාපෘතියට එකතු කරන්න තමයි බලාපොරොත්තු වෙන්නේ.

මම පොඩි අදහසක් ඉදිරිපත් කරනවා. අපි මේ රට පුනරුදයක් කරා කැඳවීම සඳහා වන පරිවර්තනීය කාර්යයේදී අනෙකුත් කරුණුවලට අමතරව ග්‍රාමීය මට්ටමේ ක්ෂුද්‍ර හා සුළු පරිමාණ කර්මාන්ත දියුණු කිරීම ඉතාම වැදගත් වෙනවා. ඒ නිසා යෝජනා ක්‍රම කිහිපයක් තිබෙනවා. පළමුවැනි එක තමයි, නැවත පණගැන්වීමේ ව්‍යාපෘතිය. දෙවැනි එක තමයි, ආසියානු සංවර්ධන බැංකු ණය ව්‍යාපෘතිය. ඒ වාගේම තුන්වැනි එක තමයි, මේ පොලී සහනාධාරය. මේ සමස්තය ගත්තාට පස්සේ මේ වෙනකොට ඒ ණය ප්‍රමාණයෙන් රුපියල් බිලියන 81ක් පුද්ගලයින් 65,005කට වාගේ විශාල ප්‍රමාණයකට ලබා දීලා තිබෙනවා.

ඒ වාගේම මේ ව්‍යාපෘතියේ විශේෂත්වයක් තිබෙනවා. මේ සහනදායී ණය ලබා ගන්නා පුද්ගලයාට අවසානයේදී අඩු පොලියට ණය ලැබෙනවා වාගේම මෙහි ගුණාත්මක භාවය විසිරෙනවා. පළාත් මට්ටමින්, දිස්ත්‍රික්ක මට්ටමින් වාගේම ක්ෂේත්‍ර මට්ටමින් නිර්ණායක ලබා දීලා තිබෙනවා.

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

ඒ වාගේම අපි දන්නවා, ලංකාවේ කාන්තා ශ්‍රම බලකාය අඩු මට්ටමකයි තිබෙන්නේ කියලා. කාන්තාවන් සවිබලගැන්වීම, තරුණ සේවා වියුක්තිය ගත්තත් ඒක ටිකක් ඉහළ මට්ටමක තිබෙනවා. එම නිසා ඒ ප්‍රශ්නවලටත් උත්තර සොයමින් කාන්තාවන් සහ තරුණයන් වෙනුවෙන් ණය ලබා දීම සියයට 20 දක්වා වැඩි කර තිබෙනවා. අනිවාර්යයෙන්ම කාන්තාවන් සහ තරුණ කණ්ඩායම් සඳහා මේ චක්‍රීය ණය යෝජනා ක්‍රමය යටතේ සියයට 20ක් ලබා දීලා තිබෙනවා. එතකොට මේ ණය සම්බන්ධයෙන් විස්තරාත්මකව බැලුවොත්, ණය වර්ගීකරණයට අනුව කෘෂි කර්මාන්තය වෙනුවෙන් අපි පුද්ගලයින් 52,245ක් සඳහා රුපියල් බිලියන 48ක ඉහළ ණය ප්‍රමාණයක් ලබා දීලා තිබෙනවාය කියන එක අපට පෙනෙනවා. ඒ වාගේම apparel and garments, animal husbandry, beauty culture, carpentry, construction industry, educational activities, fisheries, hotels, restaurants, tourism, healthcare, IT and software development, manufacturing, mining, ornamental fish, processed foods, printing, transport and communication කියලා තව තවත් other sectors තිබෙනවා. මෙතැනින් පෙනෙනවා, කොච්චර පරාසයක් ඇතුළේ මේක විහිදෙනවාද කියන කාරණය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිස්ත්‍රික්ක වශයෙන් ගත්තත් අපි තවමත් රට ඇතුළේ ආර්ථික වෘද්ධියන් අත්පත් කරගෙන ඉදිරියට එමින් තිබෙන බව සැබෑව. 2026 වර්ෂයේ පළමුවැනි අර්ධයේ පළමුවැනි මාස 6 ඇතුළතදී "දිට්වා" සුළි කුණාටුව සහ මැද පෙරදිග පැවති යුද්මය තත්ත්වය කියන ප්‍රධාන කම්පන දෙකකට මුහුණ දෙන්න අපට සිදු වුණා. ඒ කම්පන දෙකට මුහුණ දෙමින් අපිට පුළුවන්කම ලැබිලා තිබෙනවා, පළමුවැනි අර්ධයේ පළමුවැනි මාස 6 ඇතුළතදී දළ දේශීය නිෂ්පාදිතයේ සියයට 4.7ක ආර්ථික වෘද්ධියක් අත්පත් කර ගන්න. ඒ වාගේම ඒක පුද්ගල දළ දේශීය ආදායම ඇමෙරිකානු ඩොලර් 5,000 ඉක්මවා තිබෙනවා. හැබැයි අපි දන්නවා, රට ඇතුළේ ප්‍රාදේශීය වශයෙන් විෂමතා - regional disparities - තිබෙන බව. එම ප්‍රාදේශීය විෂමතා මහ හරවා ගැනීම සඳහා සංවර්ධන ව්‍යාපෘති යටතේ ණය ලබා දීමේදී ඒවා දිස්ත්‍රික්ක වශයෙන් බෙදා හරින්න අපි වැඩි බරක් යොදනවා. මම ඒ අතරින් කිහිපයක් සඳහන් කරන්න කැමැතියි. මේ යටතේ වැඩිම ණය ප්‍රමාණයක් ලබා දී තිබෙන්නේ අම්පාර දිස්ත්‍රික්කයට වන අතර, එය රුපියල් බිලියන 12.3ක්. එම ණය මුදල් අම්පාර දිස්ත්‍රික්කයේ 14,137ක් වෙත ලබා දී තිබෙනවා. ඒ වාගේම Batticaloa, හම්බන්තොට, යාපනය, කිලිනොච්චි, මොනරාගල, මුලතිව්, නුවරඑළිය යන දිස්ත්‍රික්ක සඳහාත් මෙම ණය ලබා දී තිබෙනවා. මේ විධියට ගත්තාම, ප්‍රධාන වශයෙන් කොළඹ ඇතුළු බස්නාහිර පළාත ඉලක්ක කරගත් ප්‍රදේශවලට වඩා අනෙකුත් දිස්ත්‍රික්ක වෙත වැඩි වශයෙන් මෙම ණය ලබා දීම සිදු කර තිබෙනවා. ඒ වාගේම, බැංකු අනුව ගත්තාමත්, මේ සඳහා බැංකු 15ක් සම්බන්ධ වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! අද දින විවාදයේ වැඩ කටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)
මේ විධියට, අපි සංවර්ධනය සඳහා යොමු කරන ණයවල ව්‍යුහාත්මක සහ කැපී පෙනෙන ප්‍රගතියක් මේක ඇතුළේ පෙන්නුම් කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒවායේ ප්‍රතිඵල රටට ලැබෙන්නේ එකවර නොවෙයි. මේ ප්‍රතිඵල ඉදිරියේදී පියවරෙන් පියවර ලැබෙන අතර, ඒ හරහා ජනතාව සවිබලගැන්වෙනවා. ඒ තුළින් අපි ආර්ථික වර්ධනයක් අත්පත් කරගන්නා දිශාවට ගමන් කරමින් සිටිනවා.

ඊට අමතරව පොදුවේ බැංකු පද්ධතිය විසින් ණය පිළිබඳව තක්සේරු කරලා, ඒ ඒ ක්ෂේත්‍රවලට ණය ලබා දීමේ වැඩකටයුතු සිදු කරන අතරතුරේදීම, ඇප රහිත ණය ක්‍රමයක් යෝජනා කරනවා කියලා අපි පොරොන්දුවක් වුණා. මම කලින් සඳහන් කළ රුපියල් බිලියන 95.6ට අමතරව තමයි එම ඇප රහිත ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන්නේ. 2025දීත් අපි ඒ ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කළා. ඇත්තටම මෙහි විශේෂත්වයක් තිබෙනවා. දේශපාලනය සහ බැංකු ක්‍රමය සම්බන්ධයෙන් විශේෂ අදහස් මතු වනකොට කිව්වා, අතීතයේදී දේශපාලන අධිකාරිය බැංකු සඳහා බලපෑම් කළා කියලා. නමුත්, දැන් කිසිදු ආකාරයකට හිතවත්කම් මත හෝ වෙනත් පදනමක් මත බැංකුවලට බලපෑම් කිරීමක් හෝ මැදිහත් වීමක් සිදු වෙන්නේ නැහැ. හැබැයි, මේ ණය ගමන් කරන්නේ කෙසේද කියලා දේශපාලන මට්ටමින් සොයා බැලීමක් සිදු කරනවා.

2025 වර්ෂයේදී ආරම්භ කළ මෙම ඇප රහිත ණය ලබා දීමේ වැඩසටහනේ ප්‍රගතිය ගත්තාම, එම වර්ෂයේ ජූලි මාසය වෙනකොට එය තිබුණේ සියයට 13ක් වැනි මට්ටමකයි. නමුත්, අපි වේගයෙන් ඒ සඳහා මැදිහත් වෙලා, කම්ටු රැස් වෙලා, 2025 වර්ෂයේ නොවැම්බර් මාසයේ අග වනවිට - ඒ කියන්නේ වර්ෂය අවසන් වනවිට - එය සියයට 90 ඉක්මවා යන මට්ටමකට අරගෙන යන්න අපට පුළුවන්කම ලැබුණා.

2026 වසරේ ප්‍රගතිය පිළිබඳ විස්තර දැන් මා ළඟ තිබෙනවා. 2026 වසර වෙනුවෙනුත් ඇප රහිත ණය වෙනුවෙන් රුපියල් බිලියන 16ක් වෙන් කරලා තිබෙනවා. එතකොට සමස්ත ණය ප්‍රමාණය ඊට වඩා විශාල වෙනවා. මොකද, කලින් වෙන් කළ තුනෙන් දෙකට තව තුනෙන් එකක් එකතු වෙනවා. ඒ වාගේම, අපි පුද්ගලයින් 3,907ක් ඉලක්ක කරගත් අතර, මේ වෙනකොට 2,287කට එම ණය මුදල් ලබා දී තිබෙනවා. මේකෙනුත් පෙන්නුම් කරන්නේ ඒ ප්‍රගතිය ඉදිරියට ගමන් කරපු ආකාරයයි.

ඒ වාගේම, මේ ණය සම්බන්ධයෙන් මතු වී ඇති තවත් කාරණයක් තිබෙනවා. මෙම ණය මුදල පිළිබඳවත්, ආණ්ඩුවේ ණය ප්‍රමාණය පිළිබඳවත් වැරදි අදහස් සමාජයට ගෙන යමින්, රටේ ණය ප්‍රමාණය ඉතා විශාලයි කියලා කියනවා. ඇත්තටම ණය ප්‍රමාණය විශාලද, කුඩාද යන්න තීරණය වෙන්නේ එහි තිරසරභාවයත් එක්කයි. ඒ කියන්නේ, අපේ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් එක්කයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසා අපි ඉලක්ක සහගතව මේ වැඩසටහන් තුළින් ඉදිරියට ගමන් කරමින් සිටිනවා. 2025 වසරේ මැද භාගයේදී 98.4ක් වුණු එම ප්‍රතිශතය, 2025 අග වෙනකොට ක්‍රමිකව සියයට 95 ආසන්නයට ඇවිල්ලා තිබුණා. අපි සතුටින් කියනවා, මේ වසරේ ජූනි මාසය වෙනකොට එය සියයට 92.75ක් දක්වා පහළට ඇවිල්ලා තිබෙනවාය කියලා. ඒක තමයි ණය තිරසරභාවය කියන එකෙන් පෙන්නුම් කරන්නේ.

ඒ වාගේම තමයි, ණය ආපසු ගෙවීමේ හැකියාව පිළිබඳවත් අපි සැලකිල්ලට භාජන කරනවා. ඒ කටයුතු පිළිබඳවත් අපි විශේෂ අවධානය යොමු කරනවා. ඒ වාගේම, මෙම ණය තිරසරභාවය

ආරක්ෂා කිරීමේදී සංචිත ගොඩනඟා ගැනීම අපට වැදගත් වෙනවා. විවිධ අවස්ථාවලදී චෝදනා කළා, අපට මේ සංචිත ප්‍රමාණය ගොඩනඟා ගන්න බැහැ කියලා. ඒ සියලු අවලාද ඉවතලමින්, ඉලක්ක සහගතව ඩොලර් බිලියන 8 ඉක්මවූ විදේශ සංචිත ප්‍රමාණයක් ගොඩනඟා ගැනීමට අපට පුළුවන්කම ලැබී තිබෙනවා. ඒ වාගේම, 2031 අවුරුද්ද වනකොට ඩොලර් බිලියන 15ක් දක්වා වූ ඉලක්කයකට ගමන් කරන්නේ කෙසේදැයි සිතමින් අපි සැලසුම් සහගතව ඉදිරියට යනවා. මේවායේ ප්‍රතිඵල හැටියට තමයි ලංකාවට ජාත්‍යන්තර ආයතන විසින් පැසසුම් සහ ඇගැයීම් ලබා දෙන්නේ. මොකද, ලංකාවේ තිබුණු ආර්ථික අවදානමෙන් සහ බුන්වත්භාවයෙන් එළියට එමින්, ආයෝජකයන්ගේ විශ්වාසය නැවත ඇති කරනවාය කියන කාරණය තමයි මේ තුළින් පෙන්නුම් කරමින් තිබෙන්නේ.

ඒ වාගේම, තවත් ඉතා වැදගත් කාරණයක් කිව යුතුව තිබෙනවා. අපි මේ ස්ථාවරත්වය ගොඩනඟා ගැනීමේදී රට ඇතුළේ ආදායම් උපයා ගැනීම ගැටලුවක් වෙලා තිබුණා.

ආණ්ඩුවට තම වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් ආදායම් එකතු කර ගන්න බැරි වෙලා තිබුණා. 2022 වෙනකොට දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට ආණ්ඩුවේ ආදායම් සියයට 8කට වඩා අඩු වෙලා තිබුණා. අපි දැන් ඉලක්ක ඉක්මවා යමින් ආදායම් ස්ථාවරත්වය අත්පත් කරගෙන තිබෙනවා.

ඒ වාගේම තමයි, විදේශීය අංශයේ ගැටලුවටත් අපි දැන් මුහුණ දෙමින් අපි ප්‍රමාණවත් සංචිත අත්පත් කර ගනිමින් ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. එහිදී ඉතාමත් වැදගත් වෙනවා, රටක බැංකු පද්ධතිය සතුව තිබෙන ශුද්ධ විදේශීය වත්කම් - Net Foreign Assets - කියන එක. මෙන්න මේ තොරතුරු දිහා බැලුවාම අපට පෙනෙනවා, මේ අර්බුදය 2022දී පැන නැඟුණාට, 2019, 2020 වෙනකොට මේ ලක්ෂණ පෙන්නුම් කර තිබෙනවා කියලා. 2020දීම සමස්ත බැංකු පද්ධතිය සතු ශුද්ධ විදේශීය වත්කම් තිබුණේ ඍණ අගයක්. ඒ ඍණ අගය ක්‍රමයෙන් වර්ධනය වෙලා ඍණ රුපියල් බිලියන 2,195ක් දක්වා - ඉතා විශාල ප්‍රමාණයක් දක්වා - වර්ධනය වුණා. එය ඩොලර්වලින් ගත්තොත්, සැලකිය යුතු මුදල් ප්‍රමාණයක්. 2022 මැයි මාසය වන විට එය රුපියල් බිලියන 2,195ක් දක්වා ළඟා වුණා. ඍණ තත්වයක් තිබුණේ. ඒ ඍණ තත්ත්වය ක්‍රමිකව මෙම වැඩසටහන තුළ පියමන් වෙලා අපි ආණ්ඩුව ගන්නකොට ඉතාම සුළු ධන අගයක් තිබුණේ. දැන් අපිට පුළුවන් වෙලා තිබෙනවා මේ අවුරුදු දෙකක කාලය ඇතුළතදී බැංකු පද්ධතිය සතුව, මහ බැංකුව සහ අනෙකුත් වාණිජ බැංකු පද්ධතිය සතුව තිබෙන ශුද්ධ විදේශීය වත්කම් - Net Foreign Assets - ප්‍රමාණය අගෝස්තු වෙනකොට රුපියල් බිලියන 1,674ක් දක්වා ගෙනෙන්න. ඒක ඩොලර්වලට පරිවර්තනය කර බැලුවොත්, අද පවතින අගයට - රුපියල් 337ක් ලෙස- පරිවර්තනය කරලා බැලුවත් ඩොලර් බිලියන 5කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා. මේ තිබෙන්නේ ශුද්ධ විදේශීය වත්කම් ප්‍රමාණය.

ඒ වාගේම, අද තිබෙන තත්ත්වයේදී තේරුම් ගත යුතු කාරණයක් තමයි, යම් ආකාරයට වෙළඳපොළේ මිල ගණන්වල ඉහළ යාමක්, ඉන්ධන මිල වැඩිවීමේ තත්ත්වයක් තිබෙනවා කියන එක. එය රට ඇතුළේ ගන්නා ලද තීන්දු- තීරණ නිසා හෝ ආර්ථික ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් නිසා සිදු වන්නක් නොවෙයි. එය විශේෂයෙන්ම මැද පෙරදිග යුද්ධය නිසා ඇති වෙච්ච තත්ත්වයක්. මම ඒක පැහැදිලි කරන්නම්. මේ ඉදිරිපත් කරලා තිබෙන වාර්තාවලට අනුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවත්, මහ බැංකුවත් සකස් කරන ලද වාර්තාවකට අනුව ඉතාම පැහැදිලිව පෙන්නුම් කරනවා, මොන ආකාරයෙන්ද මේ energy shock එක අපේ රට ඇතුළේ උද්ධමනයට බලපා තිබෙන්නේ කියලා. උද්ධමනය අගෝස්තු මාසය වෙනකොට සියයට 8 දක්වා වැඩි වුණාට, ඒ සියයට 8 අපි විශ්ලේෂණය කරලා බලපුවාම, එයින් සියයට 2.8ක්ම තිබෙන්නේ ආහාර සහ alcoholic නොවන බීම වර්ග සම්බන්ධවයි. ඒ වාගේම තමයි, energy සහ fuel shock එක නිසා සියයට 2.2ක්. ඒ නිසා මෙන්න මේ ඩොලරයට ඇති වෙච්ච බලපෑමත්, ඉන්ධන මිල ඉහළ යාමත් නිසා තමයි මේ උද්ධමනකාරී තත්ත්වය ඉහළ ගිහින් තිබෙන්නේ. අපි එයත් ඉදිරියේදී පාලනය කර ගැනීමට බලාපොරොත්තු වෙනවා.

මෙම තත්වයන් මත සැලකිල්ලට භාජන කළාම අපිට ඉතා පැහැදිලිව පෙනෙනවා, අපි මේ ගමන් කරන මාර්ගය ස්ථාවරයි; ඒ ස්ථාවරත්වයෙන් ඔබ්බට ගිහිල්ලා අදාළ පරිවර්තනය අපි අත්පත් කර ගන්නවා කියන කාරණය. එවැනි අවස්ථාවලදී තවදුරටත් ආණ්ඩුව පිළිබඳ විවේචන ඉදිරිපත් කරන්න බැරි නිසා තමයි සමහර අය මිනිසුන් අතර අවිශ්වාසය සහ යම් සැක සහිත තත්වයක් නිර්මාණය කරන්න උත්සාහ කරන්නේ.

ඒ වාගේම, මේ මොහොත වෙනකොට ගෑස් හිඟයක් පිළිබඳ මතයක් සමාජය තුළ හදන්න හදනවා. ඒ සම්බන්ධයෙන් කිසිදු ආකාරයකට බියක් ඇති කරගත යුතු නැහැ. ගෑස්, ඉන්ධන, පොහොර, බෙහෙත් ඇතුළු මේ කිසි දෙයක් හිඟ වෙන්නේ නැහැ. අපි ඉතාම ක්‍රමිකව මුදල් වියදම් කරමින් මේ කටයුතු කරනවා. ගෑස් සම්බන්ධයෙන් ගත්තොත්, පවතින යුද්මය තත්ත්වය තුළ ගෑස් නැවක් මාලදිවයිනට ළඟා වෙන්න දවසක දෙකක ප්‍රමාදයක් සිදු වුණා. ඒ අනුව තමයි මේ ප්‍රශ්නය පැන නැඟුණේ. අද වෙනකොට දිනකට අවශ්‍ය කරන ගෑස් ටැංකි 80,000 වෙනුවට ලිට්රෝ සමාගම විසින් ගෑස් ටැංකි 100,000ක් බැගින් බෙදා හරිමින් තිබෙනවා. ඒ තත්ත්වයත් ඉදිරියේදී සමනය වෙනවා කියලා අපිට කියන්න පුළුවන්. ඒ වාගේම, ඉන්ධන අවශ්‍ය ප්‍රමාණයට තොග ගබඩා කරගෙන තිබෙනවා. ඒ බෙදා හැරීම් මේ වන විටත් සිදු කරනවා. ඒ නිසා කිසිදු ආකාරයකින් ඒ සම්බන්ධයෙන් ගැටුමක් ඇති වෙන්නේ නැහැ.

විපක්ෂයෙන් අපිට චෝදනා කළා, මේ ණය ලබා දුන්නාට වැඩක් නැහැ, NPLs - Non-Performing Loans - ප්‍රතිශතයේ ප්‍රමාණය වැඩි වෙලා කියලා. මට හිතෙනවා, එතුමන්ලා සමහර වෙලාවට හිතා මතාම නොමඟ යවන්න මේ කාරණය කිව්වා ද කියලා. සංඛ්‍යාවක් විධියට ගත්තාම ප්‍රමාණය වැඩි වෙන්න පුළුවන්. නමුත්, බැංකු පද්ධතියේ ස්ථාවරත්වයත්, මූල්‍ය ස්ථාවරත්වයත් බලනකොට වැදගත් වෙන්නේ ප්‍රතිශතය. Non-Performing Loansවල ප්‍රතිශතය කොහොමද වෙන්නේ කියන එකයි වැදගත් වෙන්නේ. 2024දී සියයට 12.7ක් විතර තිබුණු බැංකු පද්ධතියේ Non-Performing Loans ප්‍රතිශතය ක්‍රමිකව අඩු වෙලා අද වෙනකොට සියයට 9.3ක් දක්වා පහළට බැහැලා තිබෙනවා. 2025 අවුරුද්දේ අග වෙනකොට අපිට ඒක සියයට 10ක වාගේ මට්ටමට ගෙනෙන්න පුළුවන්කම ලැබුණා. ඒකෙන් පෙන්නුම් කරනවා, ක්‍රමිකව අපි කෙහොමද මෙන්න මේ Non-Performing Loans අඩු කරගෙන තිබෙන්නේ කියලා.

සංවර්ධන බැංකුවක් පිළිබඳ අදහසත් අපි සාකච්ඡා කරමින් සිටිනවා. සංවර්ධන බැංකුවක් එකවර ගෙනැල්ලා ස්ථාපිත කරන්න බැහැ. අපිට අවශ්‍ය කරනවා, ඊළඟ පියවර තුළදී පුළුල් දිගුකාලීන සංවර්ධන ව්‍යාපෘති සඳහා මේ බැංකු පද්ධතිය සකස් කරන්න. මේ බැංකු පද්ධතියත්, මහ බැංකුවත්, අනෙකුත් ආයතනත් එක්ක සාකච්ඡා පවත්වමින් ඉන්නවා. අනිවාර්යයෙන්ම සංවර්ධනය සඳහා, නිෂ්පාදනය සඳහා අවශ්‍ය වූ ඒ මූල්‍යනය කිරීම සඳහා අවශ්‍ය මැදිහත්වීම අපි සිදුකරනවා කියන කාරණයත් මේ මොහොතේදී සඳහන් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි, ගරු අමාත්‍යතුමනි.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද ඉදිරිපත් කරන ලද රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ යෝජනාව අනුමත කරගැනීමෙන් බලාපොරොත්තු වෙන්නේ, ග්‍රාමීය අංශයට මූල්‍ය ණය පහසුකම් ලබා දීමේ වැඩසටහන දිරිමත් කිරීමයි. ඒ කටයුත්ත කරන ගමන්ම අපේ ආණ්ඩුව, මැද පෙරදිග යුද්ධය හමුවේ විශේෂ සහන පැකේජ ගණනාවක් - ඉන්ධන, විදුලිය ඇතුළු - අස්වැසුම් ප්‍රතිලාභීන්ටත් ලබා දීලා තිබෙනවා. ඒ නිසා අපේ ආණ්ඩුව එකවර සියලුම කාර්යන්වලට අවධානය යොමු කරනවා. සංවර්ධනයේ දිශාවට සහන ලබා දීමට, ග්‍රාමීය මට්ටමේ ව්‍යුහාත්මක තත්ත්වයන් වෙනස් කරලීම සඳහා වූ කටයුතුවලට මුදල් වෙන් කරමින් ඒ සඳහා මැදිහත්වෙනවා කියන කාරණය සඳහන් කරමින් මගේ අදහස් දැක්වීම අවසාන කරනවා.

බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පරිපූරක මුදල: ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සවිබලගැන්වීම සඳහා ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම
குறைநிரப்புத் தொகை: நுண், சிறிய மற்றும் நடுத்தர அளவிலான தொழில்முயற்சித் துறையை வலுவூட்டுவதற்கு கடன் திட்டங்களைச் செயல்படுத்துதல்
SUPPLEMENTARY SUM: IMPLEMENTATION OF LOAN SCHEMES TO EMPOWER MICRO, SMALL AND MEDIUM ENTERPRISES

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2026 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2026 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබාගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් මිලියන හය දහසක් (රු. 6,000,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

උපලේඛනය

ශීර්ෂය	243	-	සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව
වැඩසටහන	02	-	සංවර්ධන වැඩසටහන
			මූලධන වියදම රු. 6,000,000,000
			මුළු වියදම රු. 6,000,000,000

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඒ අනුව, අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සහ 2 යටා පරිදි සම්මත වූ බව ප්‍රකාශ කරමි.

න්‍යාය පත්‍රයේ විෂය අංක 3 සිට 12 දක්වා අනුමත කිරීම.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය: වාර්ෂික වාර්තාව (2021)
இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சபை: வருடாந்த அறிக்கை (2021)
SRI LANKA EXPORT DEVELOPMENT BOARD: ANNUAL REPORT (2021)

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2023.08.09 දින ඉදිරිපත් කරන ලද, 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය: වාර්ෂික වාර්තාව (2022)
இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சபை: வருடாந்த அறிக்கை (2022)
SRI LANKA EXPORT DEVELOPMENT BOARD: ANNUAL REPORT (2022)

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2024.08.21 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය: වාර්ෂික වාර්තාව (2023)

இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சபை: வருடாந்த அறிக்கை (2023)

SRI LANKA EXPORT DEVELOPMENT BOARD: ANNUAL REPORT (2023)

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.05.20 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

බී සී සී ලංකා ලිමිටඩ් සමාගම: වාර්ෂික වාර්තාව (2022/2023)

பீ.சீ.சீ. லங்கா லிமிட்டட் கம்பனி: வருடாந்த அறிக்கை (2022/2023)

BCC LANKA LIMITED: ANNUAL REPORT (2022/2023)

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.06.03 දින ඉදිරිපත් කරන ලද, 2023.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් බී සී සී ලංකා ලිමිටඩ් සමාගමේ 2022/2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

බී සී සී ලංකා ලිමිටඩ් සමාගම: වාර්ෂික වාර්තාව (2021/2022)

பீ.சீ.சீ. லங்கா லிமிட்டட் கம்பனி: வருடாந்த அறிக்கை (2021/2022)

BCC LANKA LIMITED: ANNUAL REPORT (2021/2022)

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.07.24 දින ඉදිරිපත් කරන ලද, 2022.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් බී සී සී ලංකා ලිමිටඩ් සමාගමේ 2021/2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ජාතික ලුණු සමාගම: වාර්ෂික වාර්තාව සහ ගිණුම් (2021/2022)

தேசிய உப்பு நிறுவனம்: வருடாந்த அறிக்கையும் கணக்குகளும் (2021/2022)

NATIONAL SALT LIMITED: ANNUAL REPORT AND ACCOUNTS (2021/2022)

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.07.24 දින ඉදිරිපත් කරන ලද, 2022.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ලුණු සමාගමේ 2021/2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ජාතික ලුණු සමාගම: වාර්ෂික වාර්තාව සහ ගිණුම් (2022/2023)

தேசிய உப்பு நிறுவனம்: வருடாந்த அறிக்கையும் கணக்குகளும் (2022/2023)

NATIONAL SALT LIMITED: ANNUAL REPORT AND ACCOUNTS (2022/2023)

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.07.24 දින ඉදිරිපත් කරන ලද, 2023.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ලුණු සමාගමේ 2022/2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය: වාර්ෂික වාර්තාව (2022)

தேசிய இரத்தினக்கல் மற்றும் ஆபரண அதிகாரசபை: வருடாந்த அறிக்கை (2022)

NATIONAL GEM AND JEWELLERY AUTHORITY: ANNUAL REPORT (2022)

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2024.03.20 දින ඉදිරිපත් කරන ලද, 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය: වාර්ෂික වාර්තාව (2023)

தேசிய இரத்தினக்கல் மற்றும் ஆபரண அதிகாரசபை: வருடாந்த அறிக்கை (2023)

NATIONAL GEM AND JEWELLERY AUTHORITY: ANNUAL REPORT (2023)

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.03.05 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය: වාර්ෂික වාර්තාව (2023)

இரத்தினக்கல் மற்றும் ஆபரண ஆராய்ச்சி மற்றும் பயிற்சி நிறுவகம்: வருடாந்த அறிக்கை (2023)

GEM AND JEWELLERY RESEARCH AND TRAINING INSTITUTE: ANNUAL REPORT (2023)

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த)
(The Hon. (Dr.) Anil Jayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2025.03.14 දින ඉදිරිපත් කරන ලද, 2023.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.08.20 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.10.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න.

කල්තැබීමේ ප්‍රශ්න
ஒத்திவைப்பு வினாக்கள்
ADJOURNMENT QUESTIONS

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, சபை ஒத்திவைப்பு வேளையில் நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர் அவர்களிடம் பின்வரும் வினாக்களைக் கேட்கின்றேன்:

1. அம்பாறை மாவட்டத்தில் அமைந்துள்ள இறக்காமம் பிரதேச செயலகப் பிரிவில் 12 கிராம சேவகர் பிரிவுகளில் வசிக்கும் 18,000 மக்களில் 94 சதவீதமானோர் தமிழ் மொழியைத் தாய்மொழியாகக் கொண்டுள்ளனர். இறக்காமம் பிரதேசம் 2012ஆம் ஆண்டு வரை அக்கரைப்பற்று நீதி நிருவாக வலயத்தின்கீழ் உள்ளடக்கப்பட்டு இருந்தது. எந்தவித முன்னறிவித்தலும் இல்லாமல் சிங்கள மொழியை நீதிமன்ற மொழியாகக் கொண்ட அம்பாறை நீதி நிருவாக வலயத்தின்கீழ் தமிழைத் தாய் மொழியாகக்கொண்ட இறக்காமம் பிரதேசம் இணைக்கப்பட்டுள்ளதை கௌரவ அமைச்சர் அவர்கள் அறிவாரா?

2. அம்பாறை மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டம் சென்ற 2025.05.27ஆம் திகதி நடைபெற்றபோது, இறக்காமம் பிரதேசத்துக்கான சுற்றுலா நீதிமன்றம் அமைக்கப்பட வேண்டும் அல்லது அக்கரைப்பற்று நீதிமன்ற வலயத்துக்குள் இறக்காம நீதிமன்றப் பிரிவை உள்ளடக்குமாறு எடுக்கப்பட்ட தீர்மானத்தை நீதி அமைச்சின் செயலாளருக்கு அனுப்பி வைக்கப்பட்டுள்ளதை கௌரவ அமைச்சர் அவர்கள் அறிவாரா?

3. இறக்காமம் பிரதேசத்தில் வாழ்கின்ற 94 சதவீதமான தமிழ் பேசும் மக்கள் அம்பாறை நீதிமன்றங்களில் தமது வழக்கு நடவடிக்கைகளை தமக்குப் பரிட்சயமற்ற சிங்கள மொழியில் தாக்கல் செய்வதற்கு நிர்ப்பந்திக்கப்பட்டுள்ளதோடு, நீதிமன்ற நடவடிக்கைகளை தமிழில் இருந்து சிங்கள மொழிக்கும், சிங்கள மொழியிலிருந்து தமிழ் மொழிக்கும் மொழிபெயர்ப்பு செய்வதற்காக வழக்குச் செலவுகளுக்கு மேலதிகமாக பெருந்தொகையான பணத்தைச் செலவு செய்யவேண்டிய நிலைமை ஏற்பட்டுள்ளதோடு, வழக்கு நடவடிக்கைகளின்போதும் சாட்சியமளிக்கின்றபோதும் நீதிமன்றத்தின் பெறுமதியான நேரத்தை மொழிபெயர்ப்புக்காகச் செலவு செய்து வருவதை கௌரவ அமைச்சர் அவர்கள் அறிவாரா?

4. இறக்காமம் பிரதேச நீதிமன்ற பிரிவை அக்கரைப்பற்று நீதிமன்ற வலயத்துடன் இணைக்குமாறு அல்லது இறக்காமம் பிரதேசத்தில் சுற்றுலா நீதிமன்றம் ஒன்றை நிறுவுமாறு நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழுக் கூட்டத்தில் சென்ற 17.06.2025ஆம் திகதி என்னால் சமர்ப்பிக்கப்பட்ட முன்மொழிவுக்கமைய - இல. 128 - நீதி அமைச்சின் செயலாளரினால் அம்முன்மொழிவு தொடர்பான பரிந்துரைகளை வழங்குமாறு 2025.11.26ஆம் திகதி MOJ/L11/JZ/Irakkamam/2021 மற்றும் 2025.07.16 மற்றும் 2025.11.04ஆம் திகதிய கடிதத்தின்மூலம் நீதிச் சேவை ஆணைக்குழுவுக்குத் தெரிவிக்கப்பட்டும் இதுவரையும் அந்த ஆணைக்குழுவால் அமைச்சுக்குப் பதில் வழங்கப்படவில்லை என்பதனை கௌரவ அமைச்சர் அவர்கள் அறிவாரா?

5. கௌரவ நீதி அமைச்சரின் தலைமையில் நடைபெற்ற அமைச்சுசார் ஆலோசனைக் குழுக் கூட்டத்திலே இறக்காமம் பிரதேசத்தில் சுற்றுலா நீதிமன்றம் ஒன்று இயங்கி வருவதாக நீதிச் சேவை ஆணைக்குழுவின் பிரதிச் செயலாளர் திரு. இசுரு தெரிவித்தார். இறக்காமம் பிரதேச செயலாளர், இறக்காமம் பிரதேச சபையின் தவிசாளர் ஆகியோரால் அனுப்பி வைக்கப்பட்ட அறிக்கையில், இதுவரை இறக்காமம் பிரதேசத்தில் சுற்றுலா நீதிமன்றம் ஒன்று அமைக்கப்படவில்லை எனத் தெரிவித்தும், இதுவரையும் இறக்காமம் நீதிமன்றப் பிரிவை அக்கரைப்பற்று நீதிமன்ற வலயத்துக்கு மாற்றம் செய்யும் நடவடிக்கைகளை அல்லது இறக்காமம் பிரதேசத்துக்கான சுற்றுலா நீதிமன்றம் அமைப்பதற்கான எவ்வித செயற்பாடுகளும் முன்னெடுக்கப்படாமல் உள்ளதால் அந்த மக்கள் கவலைப்பட்டுக்கொண்டு இருக்கின்றார்கள் என்பதை கௌரவ அவமைச்சர் அறிவாரா?

6. இறக்காமம் பிரதேச நீதிமன்றம் விடயமாக அமைச்சுசார் ஆலோசனைக் குழுக் கூட்டத்திலே முன்மொழிவு சமர்ப்பிக்கப்பட்டு, 1 வருடமும் 4 மாதங்களும் சென்றுள்ள நிலையில், இதுவரை நீதி அமைச்சு மேற்கொண்ட நடவடிக்கைகள் என்ன என்பதை கௌரவ அமைச்சர் தெரிவிப்பாரா?

தமிழ் மொழி பேசும் மக்கள் வாழுகின்ற பிரதேசத்தில் அமைந்திருக்கின்ற அக்கரைப்பற்று நீதிமன்றத்தின் வழக்கு நடவடிக்கைகளை, 2012ஆம் ஆண்டு உடனடியாக அம்பாறை நீதி நிருவாக வலயத்தின்கீழாக மாற்றியமைத்து விட்டார்கள். இதை உங்களுடைய அரசாங்கம் அல்ல, அன்றைய அரசாங்கம்தான் செய்தது. இதனால் தமிழ் பேசும் மக்கள்

[ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා]

මිකවුම් කෂ්ටපටුකින්නාර්කළ්. කෞරව අමෙච්චර් අවර්කළේ, ඉන්ත විටයත්තිල් නීංකළ් විෂේට නටවටික්කෙ එටුක්ක වේණ්ටුම්. ඉව්වාරු පාතික්කප්පට්ට මක්කළ් කුරිත්තු, උංකළුටෙය අරචාංකත්තිල්තාන් කේට්ක වේණ්ටියිරුක්කිරතු. එනවේ, අන්ත මක්කළුටෙය නීතියාන කෝරික්කෙයෙ කෞරව නීති අමෙච්චර් අවර්කළ් නිරෙවේට්රිත් තර වේණ්ටුමෙන නාන් අම්මක්කළ් චාර්පිල් කේට්ටුක්කොළ්කින්රේන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පිළිතුරු ලබා දීම, ගරු හර්ෂණ නානායක්කාර අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මන්ත්‍රීතුමා විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුර මෙසේයි.

අප රටේ සෑම උසාවියකම දෙමළ හෝ සිංහල භාෂාවෙන් කථා කරන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමනි. ඒක තමයි නීතිය. ඒක නිසා සිංහල භාෂා අධිකරණ කලාපයක් වන අම්පාර කලාපය සමඟ එරගම ප්‍රදේශයේ අධිකරණ කටයුතු සම්බන්ධ කළා කියන එක කාටවත් නොදන්වා කරන්නේ නැහැ. ඒවා ගැසට් ප්‍රකාශයන් හරහායි කරන්නේ. එහෙම නම්, එය නොදැන කළාත් නොවෙයි.

සමහර අවස්ථාවලදී උසාවිවල ප්‍රශ්න තිබෙනවා. ඒ කියන්නේ, භාෂා පරිවර්තකයන් නොමැති වීම ආදි කාර්ය මණ්ඩල ගැටලු. ඒවා පරිපාලනමය ප්‍රශ්න. ඒ අනුව ඒවා විසඳා ගන්න අවශ්‍ය වෙනවා.

ඒ වාගේම, ඔබතුමා තුන්වනුව නඟපු ප්‍රශ්නයේ සඳහන්ව තිබෙනවා, "සිංහල භාෂාවෙන් නඩු පැවරීමට බල කෙරෙන බැවින්ද" කියලා. කිසි කෙනෙකුට බල කරන්න බැහැ, මොන භාෂාවෙන්ද නඩු පවරන්නේ කියලා. සිංහල සහ දෙමළ කියන භාෂා දෙකෙන්ම එය කරන්න පුළුවන්. ඒක වෙනම ප්‍රශ්නයක් වශයෙන් සොයා බලන්න අපට හැකියාව තිබෙනවා.

ඒ වාගේම, අධිකරණ පිහිටුවන කොට කථා කරන භාෂාව නොවෙයි සලකා බලන්නේ. යම් ප්‍රදේශයක නඩු කොච්චර ප්‍රමාණයක් තිබෙනවාද, ඒ තිබෙන නඩු වර්ග මොනවාද, ඒවා විසිරී ඇති ක්‍රමය කෙසේද, පූර්ණ කාලීන කාර්ය මණ්ඩලයක් එතැනට තබන්න ඕනෑද යනාදි සියලුම කරුණු එහිදී සලකා බලනවා. ඒ වාගේ විද්‍යාත්මක පදනමකින් තමයි අලුතින් උසාවියක් පිහිටුවන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා, මේ සම්බන්ධයෙන් කටයුතු කරන්නේ අධිකරණ සේවා කොමිෂන් සභාව බව. බොහෝ විට අධිකරණ සේවා කොමිෂන් සභාව තමයි, ඒගොල්ලන්ට අලුතින් අධිකරණයක් අවශ්‍ය නම් ඒ සම්බන්ධයෙන් අපත් එක්ක සාකච්ඡා කරන්නේ. ඒකට ඔවුන් එවැනි විද්‍යාත්මක පදනමක් භාවිත කරනවා. ඒ වාගේම ඔබතුමා දන්නවා, අධිකරණ අමාත්‍යවරයා වශයෙන් අධිකරණ සේවා කොමිෂන් සභාවට නියෝග දීමේ හැකියාවක් මට නැහැ කියලා.

කෙසේ වෙතත්, ඔබතුමාගේ ඉල්ලීම් අපි අධිකරණ සේවා කොමිෂන් සභාවට යවා තිබෙනවා. එම ප්‍රදේශයට අධිකරණයක් අවශ්‍ය නම්, වෙනසක් කිරීමට අවශ්‍ය නම් ඔවුන් අපට ඒ ගැන දැනුම් දේවි. හැබැයි ඊට අමතරව, ඒ ප්‍රදේශයේ නඩු කටයුතු කරන කට්ටිය භාෂාව නිසා හෝ වෙනයම් හේතුවක් නිසා හෝ අධිකරණයේ වැඩ කටයුතු කර ගැනීමට නොහැකිව පීඩාවක් විඳිනවා නම්, ඒවා අපට වෙන වෙනම ගෙනෙන්න. ඒවා ගැන සලකා බලා අවශ්‍ය පියවර ගන්න අපට පුළුවන්. මොකද, කථා කරන භාෂාව නිසා මේ රටේ කිසිම මනුස්සයෙකු අපහසුතාවට පත් වෙන්න ඉඩ දෙන්න අපේ රජයට බැහැ. ඒ නිසා ඒවා වෙනම ප්‍රශ්න වශයෙන් ගෙනෙන්න කියා මම ඉල්ලා සිටිනවා. ඒක තමයි මගේ මූලික අදහස් දැක්වීම.

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක් දෙන්න පුළුවන්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ පිළිතුරු දැක්වීම අවසානද, ගරු ඇමතිතුමනි?

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
අවසානයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අතුරු ප්‍රශ්න අහන්නත් බැහැ. නමුත්, පැහැදිලි කර ගැනීමක් ඉල්ලන නිසා ඒ සම්බන්ධව මගේ විරුද්ධත්වයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, පැහැදිලි කර ගැනීමකට ඔබතුමාට අවස්ථාව තිබෙනවා.

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
ගරු ඇමතිතුමනි, මම කියන්නේ මේකයි. ඉරක්කාමම් ප්‍රදේශයේ මිනිස්සු දෙමළ භාෂාව කථා කරන අය නිසා ඒගොල්ලන්ගේ උසාවි කටයුතු අක්කරෙයිපත්තුව උසාවියේ තමයි මෙච්චර කාලයක් කෙරෙමින් තිබුණේ. අමාත්‍යාංශය තීන්දුවක් ගත්තා, මේ ඉරක්කාමම් ප්‍රදේශයේ ජනතාව එක්කෝ අක්කරෙයිපත්තුව උසාවියට යොමු කරනවා, නැත්නම් ඒ අයට වෙනම උසාවියක් දානවා කියලා. තවම ඒක කරලා නැහැ නේ.

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
එය වැරදියි. අධිකරණ අමාත්‍යාංශයට තීන්දු කරන්න බැහැ, කොහේද උසාවි දාන්නේ කියලා. ඒකට JSC එකෙන් අපිට දැනුම්දීමක් කෙරෙන්න ඕනෑ. අපිටත් ඒ ගැන සාකච්ඡා කරලා උපදෙස් දෙන්න පුළුවන්. එහෙම අධිකරණ අමාත්‍යාංශයට ඕනෑ ඕනෑ තැන උසාවි දාන්න පුළුවන් නම් JSC එකක් අවශ්‍ය වෙන්නේ නැහැ නේ. එහෙම නොවෙයි මේක කෙරෙන්නේ. ඔවුන් තමයි අපිට දැනුම් දෙන්න ඕනෑ.

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)

கௌரவ அமைச்சர் அவர்களே, இறக்காமத்தில் சுற்றுலா நீதிமன்றம் ஒன்றை அமைப்பதாகச் சொன்னார்கள். இதுவரையிலும் அந்த வாக்குறுதி நிறைவேற்றப்படவில்லை. கௌரவ அமைச்சர் அவர்களே, உங்களுடைய தலைமையில் நடைபெற்ற ஆலோசனைக் கூட்டத்தில் இறக்காமம் பிரதேசத்தில் சுற்றுலா நீதிமன்றம் ஒன்று இயங்கி வருவதாக நீதிச்சேவை ஆணைக்குழுவின் பிரதிச் செயலாளர் திரு. இசுறு தெரிவித்தார். இறக்காமம் பிரதேச செயலாளர், இறக்காமம் பிரதேச சபையின் தவிசாளர் ஆகியோரால் அனுப்பி வைக்கப்பட்ட கடிதத்தில்கூட இறக்காமம் பிரதேசத்தில் அவ்வாறு ஒரு சுற்றுலா நீதிமன்றம் இதுவரை அமைக்கப் படவில்லை என்றும் தெரிவித்தார்கள். எனவே, அவர் சொன்ன அதே சுற்றுலா நீதிமன்றத்தை என்றாலும் அமைப்பதற்கு நடவடிக்கை எடுப்பீர்களா?

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා තේරුම් ගන්නට ඕනෑ, අපිට ප්‍රාදේශීය සංවර්ධන කමිටුවක හෝ Ministerial Consultative Committee එකක හෝ තීන්දු අරගෙන ඒවා කරන්න කියලා JSC එකට බල කරන්න නීතිමය ප්‍රතිපාදනයක් නැහැ කියන එක. අපිට කරන්න පුළුවන්, ඒ ගැන දැනුම් දෙන එක විතරයි. අපි ඒක කරලා තිබෙන්නේ. ඒ ප්‍රදේශයට ඒ විධියට උසාවියක් අවශ්‍ය නම් ඒගොල්ලන් තීරණය කරලා අපට කියාවි. ඒක ගැන සාකච්ඡා කරන්න පුළුවන්. නමුත් අපිට ඕනෑ ඕනෑ තැන්වල උසාවි දාන්න බැහැ. ඒක තමයි ඇත්ත කථාව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි. බොහොම ස්තූතියි, ගරු ඇමතිතුමනි.

සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන දෙවන ප්‍රශ්නය, ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා.

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) ஜீ.டி. சூரியபண்டார)
(The Hon. Major General (Rtd.) G.D. Sooriyabandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් නියෝජ්‍ය අමාත්‍යතුමා වෙත මම මේ ප්‍රශ්නය යොමු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෘජු සහ වක්‍ර බදු ආදායම තමයි රජයකට තිබෙන අත්‍යවශ්‍යම මූල්‍ය පදනම. මූලිකවම රජයේ පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් පියවා ගැනීමට එය උපකාර වන අතරම ඉන් රටට සෘජුව සහ වක්‍රව වාසි බොහොමයක් ගෙන දෙනවා. ඒ වාසි ගැන කථා කළොත්, එය පොදු සේවා සහ යටිතල පහසුකම් සැපයීමට උපකාරී වෙනවා, ඒ වාගේම ආදායම් නැවත බෙදා හැරීම තුළින් ආර්ථික අසමානතාව අඩු කිරීමට උපකාරී වෙනවා, අය වැය පාලනය කිරීම වැනි ආර්ථික ස්ථාවරත්වයට සහ ආර්ථික වර්ධනයට උපකාරී වෙනවා, ඒ වාගේම ආයෝජන සහ නවෝත්පාදන උත්තේජනයන් ඇති කිරීමට උපකාරී වෙනවා, විදේශ ආධාර සහ ණය මත යොමු වීම අඩු කිරීමට උපකාරී වෙනවා, ඒ වාගේම මහජන වගකීම සහ විනිවිදභාවය තහවුරු කිරීම තුළින් මූල්‍ය විනය වර්ධනය කිරීමටත් උපකාරී වෙනවා.

ඒ අනුව රාජ්‍ය ආදායම් ඉලක්ක සපුරා ගැනීම සහ මූල්‍ය ස්ථාවරත්වය ඇති කිරීම උදෙසා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව සක්‍රියව දායක වෙමින් පවතී. ඒ අනුව, මම පහත ප්‍රශ්නවලට පිළිතුරු බලාපොරොත්තු වෙමි.

(i) 2025 වසරේ මුල් මාස 6ට සාපේක්ෂව 2026 වසරේ මුල් මාස 6 තුළ රාජ්‍ය ආදායම සියයට 27කින් ඉහළ යාමට බලපෑ ප්‍රධානතම සාධක මොනවාද?

(ii) බදු අනුකූලතාවය තහවුරු කිරීමට සහ බදු පැහැර හැරීම වළක්වාලීමට ආදායම් එකතු කිරීමේ ආයතන ඩිජිටල්කරණය කිරීමට ගෙන ඇති පියවර කවරේද?

(iii) මෙම ආදායම් වර්ධනය ඉදිරි කාලසීමාව තුළත් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා මුදල් අමාත්‍යාංශය සතු උපාය මාර්ගික සැලසුම කුමක්ද?

(iv) මෙමඟින් අත්කරගත් මූල්‍ය ස්ථාවරත්වය හරහා ග්‍රාමීය යටිතල පහසුකම් නැංවීමට සහ සහන සේවා සඳහා අමතර ප්‍රතිපාදන වෙන් කරන්නේද?

බොහොම ස්තූතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පිළිතුරු සැපයීම, ගරු (ආචාර්ය) අනිල් ජයන්ත අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(i) ප්‍රධාන වශයෙන්ම මේ බදු ආදායම් වැඩි කර ගැනීමට අපේ වැඩසටහන ඇතුළේ තිබුණු රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව - fiscal consolidation - සහ ආදායම් එකතු කර ගැනීමේ වැඩසටහන ඇතුළේ අපි බදු පදනම පුළුල් කර ගැනීමට මැදිහත්වීම් කළා. විශේෂයෙන්ම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ අනෙකුත් ආදායම් එකතු කරන ආයතනවල මැදිහත්වීම බදු පදනම පුළුල් කර ගැනීමට හේතු වුණා. ඒ වාගේම බදු අයකර ගැනීමේ කාර්යක්ෂමතාව වැඩි කර ගැනීමට ගත්තා වූ ක්‍රියාමාර්ග, ඒ වාගේම බදු පරිපාලන කටයුතු වැඩිදියුණු කර ගත්තා වූ ක්‍රියාමාර්ග බලපෑවා. ඒත් එක්කම මේ රට ඇතුළේ අපට නව ආණ්ඩුවක් ලැබිලා පුනරුදයක් කරා අපි යන ගමන් මාර්ගය අපේ ප්‍රතිපත්තිවල පෙන්නුම් කරමින් වංචාවට, දූෂණයට අප ඉඩ නොතබන බවත්, කලින් සිදු වුණු වංචා, දූෂණයට විරුද්ධව ක්‍රියාමාර්ග ගන්නා බවත් පෙන්නුම් කළා.

ඒ වාගේම බදු මුදල් පිළිබඳ වැරදි චිත්‍රයක් සමාජයේ නිර්මාණය වෙලා තිබුණා. ඒ තමයි, ගන්නා ලද බදු මුදල් එක් එක් දේශපාලන අධිකාරිය විසින් නාස්ති කරනවා, මැති ඇමතිවරුන් හිතුමතේ වියදම් කරනවා, වංචා කරනවා, දූෂණය කරනවා කියන එක. ඒ තැන්වලදී මිනිස්සු බදු ගෙවන්න අකැමැති වෙනවා. ඔවුන් ගෙවන ලද බදු මුදල් දේශපාලන අධිකාරිය විසින් නාස්ති කරනවා නම්, වංචා කරනවා නම්, බදු ගෙවන්න අකැමැති වෙනවා. ඒක රටකට ඉතාම ගැටලු සහගත තත්වයක්. ඒ නිසා තමයි, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට ඒ අනුපාතයන් පහළ ගිහිල්ලා තිබුණේ. අපි විශ්වාස කරනවා,

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

ඉලක්ක ඉක්මවා අපේ ආදායම් බදු එකතු කර ගන්න පුළුවන් වුණේ මම කියපු කාරණාවලට අමතරව, මිනිස්සුන්ගෙන් පෙලඹවීමක් - suasion - මේ සඳහා තිබුණු නිසාය කියලා. මොකද, දැන් අලුත් ආණ්ඩුව වංචාව, දූෂණය කරන්නේ නැහැ. ගන්න මුදල් නිසියාකාරයට වියදම් කරන හැටි පෙන්වනවා, මූල්‍ය විනය පවත්වාගෙන යනවා. ඒ මූල්‍ය විනයේ ප්‍රතිඵල විධියට අපට නිසියාකාරයට වියදම් කරන්න පුළුවන් කියන කාරණාත් ප්‍රධාන වශයෙන් මෙතැනට බලපෑවා වෙනවා.

ඒ අනුව, බදු පදනම පුළුල් වීමේදී අපි බලය ගන්න පෙර VAT ලිපිගොනු තිබුණේ 19,780යි. ඒක මේ වනකොට 38,570 දක්වා විශාල ප්‍රමාණයකින් වැඩි වෙලා තිබෙනවා. ඒ පදනම පුළුල් වෙලා තිබෙනවා. ඒ වාගේම Corporate Income Tax - CIT - files 104,009යි තිබුණේ. ඒක 135,000 දක්වා වැඩි වෙලා තිබෙනවා, සියයට 30ත් 35ත් අතර ප්‍රමාණයකින්. 976,458ක්ව තිබුණු තනි පුද්ගලයන්ගේ ආදායම් බදු ලිපිගොනු සංඛ්‍යාව 1,295,000 දක්වා වැඩි වෙලා තිබෙනවා. මේවා තමයි, සමස්ත බදු ප්‍රමාණය වැඩිවීමට බලපෑ හේතු.

(ii) ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආදායම් එකතු කිරීමේ ආයතන වන්නේ, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ සුරාබදු දෙපාර්තමේන්තුවයි. බදු අනුකූලතාව ඉහළ නැංවීම, ආදායම් අහිමිවීම් අඩු කිරීම සහ ගෙවීම් පැහැර හැරීම් අවම කිරීම සඳහා වූ ඩිජිටල් ක්‍රමවේද හඳුන්වා දීමත් මේ සඳහා බලපා තිබෙනවා. ඒ කියන්නේ, තාක්ෂණයේ පැමිණීම. ඒ අනුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් පරිපාලන හා කළමනාකරණ තොරතුරු පද්ධතිය - RAMIS - හරහා බදු ලියාපදිංචිය, විද්‍යුත් ලිපිගොනු ලබා දීම, බදු ගෙවීම්, මුදල් ආපසු ගෙවීම් සහ අනුකූලතා අධීක්ෂණය සිදු කරනු ලබනවා. එකතු කළ අගය මත බදු පරිපාලනය වැඩිදියුණු කිරීම සඳහා විද්‍යුත් ඉන්වොයිස් ක්‍රමය, ආරක්ෂිත විකුණුම් ස්ථාන යන්ත්‍ර - point of sale machines - හඳුන්වාදීමට අපි වැඩ කටයුතු කරමින් තිබෙනවා. තවද, දෙපාර්තමේන්තුවෙන් පරිපාලනය කරනු ලබන බදු වර්ගවලට අදාළ වාර්තා සහ ගෙවීම් *e* -සේවාවන් - electronic services - හරහා අපි ලබා ගැනීම සිදු කරනවා. තුන්වන පාර්ශ්වයන්ගෙන් ලබා ගනු ලබන තොරතුරු බදු ගෙවන්නන්ගේ ආදායම් වාර්තාවට ඇතුළත් කරමින් pre-filing සිදු කර ඔවුන්ට වඩාත් සරල කරන ලද වාර්තාවක් *e* -සේවාවන් මඟින් ලබා දීමටත් මේ පද්ධතිය තුළින් හැකියාව ලැබී තිබෙනවා.

ඒ වාගේම, ශ්‍රී ලංකා රේගුවේ දත්ත පද්ධතිය වන ASYCUDA ඇතුළු ඩිජිටල් පද්ධති මඟින් ස්වයංක්‍රීයව ප්‍රකාශ කිරීම - self-declaration - ඉදිරිපත් කිරීම සහ තොරතුරු හුවමාරුව දැනට ස්වයංක්‍රීයගත කර තිබෙනවා. දැන් ඇත්තටම රේගු දෙපාර්තමේන්තුවේ, Long Room කියන එක කිසිදු පෞද්ගලික සම්බන්ධතාවකින් තොරව තනිකර පරිගණක පද්ධතිය හරහාම සිදු කරනවා. ඒ අනුව, වංචාවට, දූෂණයට ඇති ඉඩකඩ අහිමි වනවා වාගේම බදු අයකර ගැනීමේ කාර්යක්ෂමතාවත් වැඩි වෙනවා. සුරාබදු දෙපාර්තමේන්තුවේ ආදායම් කළමනාකරණය සහ පරිපාලන කටයුතු ඩිජිටල්කරණයකට ලක් කිරීම සඳහා හඳුන්වා දී ඇති RASED ඩිජිටල් පද්ධතිය හරහාත් බලපත්‍ර, නිෂ්පාදන අධීක්ෂණය, බදු අයකිරීම, සැපයුම්දාම කළමනාකරණය, නීතිය ක්‍රියාත්මක කිරීම, විද්‍යුත් වාර්තා ඉදිරිපත් කිරීම වැනි කටයුතු සිදු වෙනවා.

(iii) රාජ්‍ය ආදායම තිරසාරව පවත්වාගෙන යෑම සඳහා මුදල් අමාත්‍යාංශය විසින් දෛනිකව හා මාසික පදනමෙන් ආදායම් අධීක්ෂණය කරනු ලබනවා. ඒ අතර 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 8 වැනි වගන්තිය යටතේ පත් කරන ලද ආදායම් කළමනාකරණ කමිටුව විසින් ප්‍රතිපත්තිමය වශයෙන් ආදායම් සම්බන්ධව උපාය මාර්ග සමාලෝචනය කරනවා. තවද, රාජ්‍ය ආදායම් මධ්‍ය කාලීනව තිරසාරව වර්ධනය කිරීම සඳහා මධ්‍ය කාලීන ආදායම් උපාය මාර්ගයද, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් සකස් කරනවා. ආසන්නවම ගත්තොත්, ඔක්තෝබර් 19වැනි දා වනකොට ඉලක්ක අබිබවා අපේ ආදායම් ලබා ගත් හැටි මේ වාර්තාවේ තිබෙනවා. විශේෂයෙන්ම රේගුව ඔවුන්ගේ වාර්ෂික ඉලක්කය මේ වනකොටම අත්පත් කරගෙන තිබෙනවා.

(iv) අය වැයෙන් අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා රජයේ ආදායම් ඉහළ යෑම හේතුවෙන් රජයට ණය ලබා ගැනීමේ අවශ්‍යතාව ඇත්තටම අඩු වෙලා තිබෙනවා. ඒ නිසා ණය මත වැඩියෙන් රඳා සිටින්නේ නැතුව අය වැය මඟින් සැලසුම් කළ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ ජනතාවට අවශ්‍ය සහන සේවා සැපයීම සඳහා වැඩි මූල්‍ය සම්පත් ප්‍රමාණයක් යොමු කිරීමට අපට හැකියාව ලැබී තිබෙනවා. ඒ අනුව තමයි මැද පෙරදිග යුද්ධය වාතාවරණය හමුවේත් අතිරේක මුදල් ප්‍රමාණයක් වෙන් කරන්න අපට හැකියාව ලැබුණේ.

ඒ වාගේම වෙලාව තිබෙනවා නම්, අනෙකුත් සංවර්ධන කටයුතුවලට අමතරව ග්‍රාමීය සංවර්ධනය සඳහා මේ මුදල් වියදම් කරලා තිබෙන්නේ කොයි ආකාරයටද කියන එක පිළිබඳව මා සතුව තිබෙන ලේඛනයේ සඳහන් කරුණු ඉදිරිපත් කරන්නත් කැමැතියි. ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනයේදී "ප්‍රජා ශක්ති" වැඩසටහන යටතේ රුපියල් බිලියන 25ක්, සමාජ ආරක්ෂණ ව්‍යාපෘතිය යටතේ රුපියල් බිලියන 1.1ක්, ආහාර සහන වැඩසටහන යටතේ රුපියල් මිලියන 3,140ක්, අස්වැසුම ප්‍රතිලාභීන් සවිබලගැන්වීම සඳහා විශේෂ වැඩසටහනක් යටතේ රුපියල් මිලියන 4,200ක් වාගේම ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ ග්‍රාමීය මාර්ග සංවර්ධනයට, ග්‍රාමීය මාර්ග පුනර්ජීවනය සඳහා රුපියල් බිලියන 24ක් - මිලියන 24,000ක් -, ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනට තවත් රුපියල් බිලියන 20.5ක්, ග්‍රාමීය මාර්ග කිලෝමීටර 1,000ක් පමණ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වූ අන්තර්ගතික සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතියට රුපියල් මිලියන 13,390ක්, පැරණි පාලම් උපාංග යොදා ගනිමින් ග්‍රාමීය ප්‍රදේශවල පාලම් ඉදිකිරීමට රුපියල් මිලියන 2,500ක් වෙන් කර තිබෙනවා.

ඒ වාගේම පළාත් සහ හරහා වෙන් කර තිබෙනවා, උපමාන පාදක වියදම් හැටියට රුපියල් මිලියන 7,000ක්. ඒ වාගේම පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන මඟින් රුපියල් බිලියන 70ක් වෙන් කර තිබෙනවා. අඩු පහසුකම් සහිත ප්‍රදේශවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 8,000ක් වෙන් කර තිබෙනවා. ග්‍රාමීය පාලම් ව්‍යාපෘතියට රුපියල් මිලියන 755ක් වෙන් කර තිබෙනවා. විදුලි වැට සඳහා - වනඅලි ප්‍රශ්නය හා සම්බන්ධයෙන් - රුපියල් මිලියන 1,050ක් වෙන් කර තිබෙනවා, පරිසර අමාත්‍යාංශය යටතේ. නිවාස ඉදිකිරීම් පැත්තෙන් ග්‍රාමීය ජනතාව දියුණු කිරීම සඳහා, ගැටුම්වලින් පීඩනයට පත් වූ පවුල් නැවත පදිංචි කිරීමේදී ස්ථිර නිවාස සඳහා රුපියල් බිලියන 5ක් - මිලියන 5,000ක් - වෙන් කර තිබෙනවා. දකුණු පළාතේ නිවාස ව්‍යාපෘතියේ නිවාස 600ක් සඳහා රුපියල් මිලියන 343ක්, ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ නිවාස ව්‍යාපෘතියේ නිවාස 600ක් සඳහා රුපියල් මිලියන 246ක්, දකුණු පළාතේ නිවාස ව්‍යාපෘතියේ දෙවන අදියර සඳහා රුපියල් මිලියන 431ක්, ඒ වාගේම මන්නාරමේ අඩු වියදම් නිවාස ඒකක 300ක් ඉදිකිරීමට රුපියල් මිලියන 285ක්, නිවාස නොමැති දිළිඳු සහ අඩු ආදායම්ලාභී පවුල් සඳහා "තමන්ගේම තැනක් - ලස්සන ජීවිතයක්" නිවාස ප්‍රදාන වැඩසටහන යටතේ රුපියල් මිලියන 10,200ක් වෙන් කර තිබෙනවා.

කෘෂිකර්ම අමාත්‍යාංශයෙනුත් මේ ආකාරයටම විශාල ප්‍රමාණයක්, සමස්තයක් වශයෙන් ගත්තාම රුපියල් බිලියන 10කට වැඩි මුදලක් වෙන් කර තිබෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ප්‍රාථමික සෞඛ්‍ය වැඩිදියුණු කිරීමටත් රුපියල් බිලියන 20කට ආසන්න මුදල් ප්‍රමාණයක් හා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතේ රුපියල් බිලියන 4කට ආසන්න මුදල් ප්‍රමාණයක් හා කලින් අපි සඳහන් කළ සංවර්ධන මූල්‍ය අංශයෙනුත් රුපියල් බිලියන 95ක් යනාදී වශයෙන් විවිධ වූ වැඩසටහන් යටතේ මුදල් වෙන් කිරීම සිදු කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම සඳහන් කරන්න කැමැතියි, අපි එකතු කර ගන්නා ලද අතිරේක මුදල් එක් පසෙකින් ණය අඩු කිරීමට, ණය තිරසරභාවය ආරක්ෂා කිරීමට යොදවන ගමන් ඉතිරි මුදල් සැබෑ ලෙසම සංවර්ධනය ගමට අරගෙන යෑමටත්, එහි ප්‍රතිඵල ඒ ජනතාවට ලැබෙන ක්‍රියාමාර්ගවලට යොමු කරන්නත් සූදානම් බව. දැනටමත් ඒ කටයුත්ත සිදු කරමින් පවතිනවා.

බොහොම ස්තුතියි.

එකල්හී වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවීමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 5.32ට, 2026 ඔක්තෝබර් 22වන බ්‍රහස්පතින්දා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.

අප්පොழුது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

இதன்படி, பி.ப. 5.32க்கு, பாராளுமன்றம் 2026 ஒக்ரோபர் 22, வியாழக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.

It being past 5.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.

Parliament adjourned accordingly at 5.32 p.m. until 9.30 a.m. on Thursday, 22nd October, 2026.

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
வினாக்களுக்கு எழுத்துமூல விடைகள்
WRITTEN ANSWERS TO QUESTIONS

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 9වන වගන්තියට සංශෝධන නිර්දේශ කිරීම සඳහා වන කමිටුව: විස්තර
குடியியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவையின் 9ஆம் பிரிவுக்கு திருத்தங்களைப் பரிந்துரைக்கும் குழு: விபரம்
COMMITTEE TO RECOMMEND AMENDMENTS TO SECTION 9 OF CIVIL PROCEDURE CODE: DETAILS

2329/2026

1. ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 9 වගන්තියට අදාළව සංශෝධනයක් ගෙන ඒම සඳහා නිර්දේශ ලබා ගැනීම පිණිස කමිටුවක් පත් කර තිබේද;

(ii) එසේ නම්, එම කමිටුවේ සාමාජිකයින් කවුරුන්ද;

(iii) එම කමිටුව පත් කරන ලද දිනය සහ කමිටුවේ නිර්දේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මෙම වගන්තියට අදාළ සංශෝධන අනුමැතිය සඳහා කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා වන කාල රාමුව කවරේද;

(iii) මෙම වගන්තිය සංශෝධනය නොකිරීමට තීරණය කර තිබේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) குடியியல் நடவடிக்கைமுறைச் சட்டக்கோவையின் 9ஆம் பிரிவுடன் ஏற்புடையதாக திருத்தத்தை மேற்கொள்வதற்கான பரிந்துரைகளைப் பெற்றுக்கொள்வதற்காக குழுவொன்று நியமிக்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி குழுவின் அங்கத்தவர்கள் யாவர் என்பதையும்;

(iii) மேற்படி குழு நியமிக்கப்பட்ட திகதியும், குழுவின் பரிந்துரைகளும் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி பிரிவுக்குரிய திருத்தங்களை அங்கீகாரத்துக்காக துரிதமாகச் சமர்ப்பிப்பதற்கு நடவடிக்கை எடுக்கப்படுமா என்பதையும்;

(ii) ஆமெனில், அத்திருத்தங்களைப் பாராளுமன்றத்தில் சமர்ப்பிப்பதற்கான காலவரையறை யாது என்பதையும்;

(iii) மேற்படி பிரிவைத் திருத்துவதில்லை எனத் தீர்மானிக்கப்பட்டிருப்பின், அதற்கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Justice and National Integration:

(a) Will he inform this House -

(i) whether a committee has been appointed to obtain recommendations for making an amendment to Section 9 of the Civil Procedure Code;

(ii) if so, the names of the members of the said committee; and

(iii) the date on which the said committee was appointed and the recommendations of the committee?

(b) Will he also inform this House -

(i) whether actions will be taken to submit the proposed amendments to the aforesaid Section for approval expeditiously;

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

(ii) if so, the time frame within which the said amendments will be presented to Parliament; and

(iii) if it has been decided not to amend the aforesaid Section, the reasons for the same?

(c) If not, why?

ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

(අ) (i) ඔව්.

(ii) මේ සම්බන්ධව අධ්‍යයනය කර අදාළ සංශෝධන සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලෙස දන්වා 2025.08.29වන දින විශ්‍රාමික අභියාචනාධිකරණ විනිසුරු රුවන් ප්‍රනාන්දු මහතාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කර ඇත. එම කමිටුව ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ නියෝජිතයින්ගෙන් ද සමන්විතය. එම කමිටුවේ අනෙක් සාමාජිකයින් පහත පරිදි වේ.

- ජගත් වික්‍රමනායක මහතා - ජනාධිපති නීතිඥ
- ඉෂාන් රත්නපාල මහතා - ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥ, නීතිපති දෙපාර්තමේන්තුව
- හරිත් ඩී. මෙල් මහතා - නීතිඥ, ශ්‍රී ලංකා නීතිඥ සංගමය
- වී.එල්. දයාරත්න මෙනෙවිය - සහකාර නීති කෙටුම්පත් සම්පාදක, නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව
- ජලාෂි ලොකුනාරංගොඩ මිය - සහකාර ලේකම් (නීති), අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය, කමිටුවේ ලේකම්

(iii) 2025.08.29වන දින පත් කර ඇත. එම කමිටු වාර්තාව නිර්දේශ සමඟ මා වෙත ඉදිරිපත් කර ඇත. එය කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එම නිර්දේශ ඉදිරිපත් කළ හැකිය.

(ආ) (i) ඔව්, ඉදිරි සති තුන තුළදී කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිතයි.

(ii) 2027 වර්ෂයේ ප්‍රථම කාර්තුව තුළ පනත සම්මත කර ගැනීමට අපේක්ෂා කෙරේ.

(iii) අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

(a) (i) Yes.

(ii) A committee chaired by retired Court of Appeal Judge Mr. Ruwan Fernando was appointed on 29.08.2025 with instructions to study this matter and submit recommendations for the relevant amendments. This committee also consisted of representatives of the Bar Association of Sri Lanka. The other members of the committee are as follows:

- Mr. Jagath Wickramanayake - President's Counsel
- Mr. Ishan Rathnapala - Senior State Counsel, Attorney-General's Department
- Mr. Harith D. Mel - Attorney-at-Law, Bar Association of Sri Lanka
- Mr. V. L. Dayarathne - Assistant Legal Draftsman, Legal Draftsman's Department
- Mrs. Jalashi Lokunarangoda - Assistant Secretary (Legal), Ministry of Justice and National Integration, Secretary to the Committee

(iii) Appointed on 29.08.2025. The committee report had been submitted to me along with recommendations. Those recommendations can be presented after submitting it to the Cabinet of Ministers.

(අ) (i) ඔව්.

(ii) இது தொடர்பாக ஆய்வுசெய்து திருத்தம் மேற்கொள்வதற்காக பரிந்துரைகளைச் சமர்ப் பிக்குமாறு அறிவித்து 2025.08.29ஆம் திகதி யன்று ஓய்வுபெற்ற மேன்முறையீட்டு நீதிமன்ற நீதிபதி ருவன் பர்னாந்து அவர்களின் தலைமை யில் குழுவொன்று நியமிக்கப்பட்டுள்ளது. இக்குழு இலங்கை சட்டத்தரணிகள் சங்கத்தின் பிரதிநிதிகளையும் கொண்டுள்ளது.

- திரு. ஜகத் விக்கிரமநாயக்க - சனாதிபதி சட்டத்தரணி
- திரு. இஷான் ரத்னபால - சிரேஷ்ட அரசாங்க சட்டத்தரணி, சட்டமா அதிபர் திணைக்களம்
- திரு. ஹரித் டீ. மெல் - சட்டத்தரணி, இலங்கை சட்டத்தரணிகள் சங்கம்
- செல்வி வீ.எல். தயாரத்ன - உதவி சட்டவரைஞர், சட்டவரைஞர் திணைக்களம்
- திருமதி ஜலாஷி லொக்கு நாரங்கொட - உதவிச் செயலாளர் (சட்டம்), நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சு, குழுவின் செயலாளர்

(iii) 2025.08.29ஆம் திகதியன்று நியமிக்கப்பட் டுள்ளது. இக்குழுவின் அறிக்கை பரிந்துரை களுடன் எனக்கு முன்வைக்கப்பட்டுள்ளது. அதனை அமைச்சரவைக்கு சமர்ப்பித்ததன் பின்னர், குறித்த பரிந்துரைகளைச் சமர்ப்பிக்க முடியும்.

(ஆ) (i) ஆம். அடுத்த மூன்று வாரங்களுக்குள் அமைச்சர வைக்குச் சமர்ப்பிக்கப்படவுள்ளது.

(ii) 2027ஆம் ஆண்டின் முதல் காலாண்டுக்குள் சட்டம் நிறைவேற்றப்படுமென எதிர்பார்க்கப் படுகிறது.

(iii) ஏற்புடையதாகாது.

(இ) எழாது.

(b) (i) Yes, it is scheduled to be submitted to the Cabinet within the next three weeks.

(ii) It is expected to pass the Act in the first quarter of 2027.

(iii) Not applicable.

(c) Does not arise.

2026 අප්‍රේල් මාසයේදී "අස්වැසුම" ප්‍රතිලාභීන්ට දෙවරක් ගෙවීම් සිදු කිරීම: නැවත අය කර ගැනීම

2026, ஏப்பிரலில் அஸ்வெசும பயனாளிகளுக்கு இரட்டைக் கொடுப்பனவு வழங்கப்பட்டமை: மீளப்பெறல்

DOUBLE PAYMENTS MADE TO "ASWESUMA" BENEFICIARIES IN APRIL, 2026: RECOVERY

2357/2026

2. ගරු සුරංග රත්නායක මහතා
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2026 අප්‍රේල් මාසයේදී 'අස්වැසුම' දත්ත පද්ධතියේ මතු වූ තාක්ෂණික දෝෂයක් හේතුවෙන් සිදු වූ ද්විත්ව ගෙවීම් යටතේ ගෙවා ඇති මුදල සහ එලෙස ගෙවීම් ලැබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් මේ වන විට අය කරගෙන ඇති මුදල කොපමණද;

(iii) ඉතිරි මුදල අය කර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එම තාක්ෂණික දෝෂය සඳහා වගකිව යුතු පාර්ශ්ව හඳුනා ගැනීම සඳහා විමර්ශනයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එහි නිගමන කවරේද;

(iii) අස්වැසුම දත්ත පද්ධතිය සහ ගෙවීම් පද්ධතිය පිළිබඳ ස්වාධීන තොරතුරු තාක්ෂණ විගණනයක් සිදු කිරීමට කටයුතු කර තිබේද;

(iv) එසේ නම්, එම විගණනය සිදු කරන ලද දිනය සහ ආයතනය කවරේද;

(v) ඒ සඳහා වැය කර ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2026ஆம் ஆண்டு ஏப்ரல் மாதத்தில் 'அஸ்வெசும' தரவு முறைமையில் ஏற்பட்ட தொழில்நுட்பக் கோளாறு காரணமாக இடம்பெற்ற இரட்டைக் கொடுப்பனவுகளின்கீழ் செலுத்தப்பட்ட தொகையும், அவ்வாறு கொடுப்பனவுகளைப் பெற்ற பயனாளிகளின் எண்ணிக்கையும் யாது என்பதையும்;

(ii) அவற்றுள் இதுவரை அறவிடப்பட்டுள்ள தொகை எவ்வளவு என்பதையும்;

(iii) எஞ்சியுள்ள தொகையை அறவிடுவதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி தொழில்நுட்பக் கோளாறுக்குப் பொறுப் புக் கூறவேண்டிய தரப்பினரைக் கண்டறி வதற்காக விசாரணையொன்று மேற்கொள்ளப் பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அதன் முடிவுகள் யாவை என்பதையும்;

(iii) 'அஸ்வெசும' தரவு முறைமை மற்றும் கொடுப் பனவு முறைமை தொடர்பாக சுயாதீன தகவல் தொழில்நுட்பக் கணக்காய்வொன்றை மேற் கொள்வதற்கான நடவடிக்கைகள் மேற்கொள் ளப்பட்டுள்ளனவா என்பதையும்;

(iv) ஆமெனில், மேற்படி கணக்காய்வை மேற் கொண்ட திகதியும், நிறுவனமும் யாது என்பதையும்;

(v) அதற்காகச் செலவிடப்பட்ட தொகை எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House the -

(i) total amount that has been disbursed as double payments due to a technical error which occurred in the "Aswesuma" data system in April, 2026 and the number of beneficiaries to whom such payments were made;

(ii) amount that has been recovered, out of the said double payments to date; and

(iii) measures that will be taken to recover the balance amount?

(b) Will he also inform this House -

(i) whether an investigation has been conducted to identify the parties responsible for the said technical error;

(ii) if so, the conclusions thereof;

(iii) whether an independent information technology audit has been conducted in respect of the "Aswesuma" data system and its payment system;

(iv) if so, the date on which such audit was conducted and the institution by which such audit was conducted; and

(v) the amount of money that has been expended thereon?

(c) If not, why?

ගරු අනුර කුමාර දිසානායක මහතා (ජනාධිපතිතුමා, ආරක්ෂක අමාත්‍ය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය සහ ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමා)
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க - சனாதிபதியும் பாதுகாப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரும் டிஜிட்டல் பொருளாதார அமைச்சரும்)
(The Hon. Anura Kumara Dissanayake - President, Minister of Defence, Minister of Finance, Planning and Economic Development and Minister of Digital Economy)

(අ) (i)
- ගෙවා ඇති මුදල - රුපියල් මිලියන 450
- එලෙස ගෙවීම් ලැබූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව - 90,000

(ii) මුළු මුදලම, එනම් රුපියල් මිලියන 450ම අය කරගෙන ඇත.

(iii) අදාළ නොවේ.

(ආ) (i) ඔව්.

(ii) සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයට අදාළ පද්ධතිය එකම මාසය තුළ දෙවරක් ක්‍රියාත්මක කළ නොහැකි බැවින් පද්ධතියට බාහිරින් මෙම ගෙවීම් සිදු කර ඇති බව හඳුනා ගත් අතර, එම ගෙවීමේදී සිදු වූ දෝෂයක් ලෙස මෙම ද්විත්ව ගෙවීම සිදු වී ඇති බව විමර්ශනයේදී හඳුනා ගන්නා ලදී. ඒ අනුව, මෙවැනි දෝෂ වළක්වා ගැනීමට පහත කරුණු නිර්දේශ කර ඇත.

1. සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සියලුම ගෙවීම් පද්ධතිය හරහා සිදු කිරීමට පියවර ගැනීම හා ඒ සඳහා පහසුකම් ඇතිවන පරිදි පද්ධතිය සංවර්ධනය විය යුතු බව.
2. නිලධාරීන්ට අවශ්‍ය මහ පෙන්වීම් හා පුහුණුව ලබා දීම.
3. ඩිජිටල් පද්ධතිය සංවර්ධනය විය යුතු බැවින් අමාත්‍යාංශයේ සෘජු මැදිහත්වීම් හා මහ පෙන්වීම් හා අධීක්ෂණය ලබා ගැනීම.

(iii) නැත.

(iv) අදාළ නැත.

(v) අදාළ නැත.

(ඇ) අදාළ නැත.

(அ) (i)
- செலுத்தப்பட்ட தொகை - 450 மில்லியன் ரூபாய்
- அவ்வாறு கொடுப்பனவுகளைப் பெற்ற பயனாளிகளின் எண்ணிக்கை - 90,000

(ii) முழுத் தொகையும், அதாவது 450 மில்லியன் ரூபாயும் அறவிடப்பட்டுள்ளது.

(iii) பொருந்தாது.

(ஆ) (i) ஆம்.

(ii) சமுர்த்தி நலன்புரி நன்மைகள் சபையுடன் தொடர்புடைய முறைமையை ஒரே மாதத்துக்குள் இரண்டு முறை இயக்க முடியாத காரணத்தால், குறித்த கொடுப்பனவுகள் முறைமைக்கு வெளியிலிருந்து மேற்கொள்ளப்பட்டமை கண்டறியப்பட்டது. மேலும், குறித்த கொடுப்பனவுகளை மேற்கொள்ளும்போது ஏற்பட்ட தவறின் காரணமாகவே இந்த இரண்டைக் கொடுப்பனவு செலுத்தப்பட்டுள்ளதாக விசாரணையின்போது கண்டறியப்பட்டது. அதன்படி, இத்தகைய தவறுகள் மீண்டும் ஏற்படுவதைத் தடுக்கும் வகையில், பின்வரும் நடவடிக்கைகள் பரிந்துரைக்கப்பட்டுள்ளன:

1. நலன்புரி நன்மைகள் சபையின் அனைத்துக் கொடுப்பனவுகளும் முறைமையின் ஊடாக மேற்கொள்ளப்படுவதை உறுதிசெய்வதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்பட வேண்டும். அத்துடன், அனைத்துக் கொடுப்பனவுகளையும் முறைமையின் ஊடாக மேற்கொள்ளும் வகையில், தேவையான வசதிகளை ஏற்படுத்துவதற்காக குறித்த முறைமை மேலும் மேம்படுத்தப்பட வேண்டும்.
2. தொடர்புடைய உத்தியோகத்தர்களுக்குத் தேவையான வழிகாட்டுதல்களும் உரிய பயிற்சிகளும் வழங்கப்பட வேண்டும்.
3. டிஜிட்டல் முறைமை மேலும் மேம்படுத்தப்பட வேண்டியுள்ளதால், அமைச்சின் நேரடி தலையீடு, வழிகாட்டுதல் மற்றும் மேற்பார்வை பெற்றுக்கொள்ளப் பட வேண்டும்.

(iii) இல்லை.

(iv) பொருந்தாது.

(v) பொருந்தாது.

(இ) பொருந்தாது.

(a) (i)
- The amount paid - Rs. 450 million
- The number of beneficiaries who received such payments - 90,000

(ii) The total amount, which is Rs. 450 million, was recovered.

(iii) Not applicable.

(b) (i) Yes.

(ii) It was identified that, as the system pertaining to the Welfare Benefits Board cannot be operated twice within the same month, the relevant payments had been made outside the system. The investigation further revealed that the duplicate payment had occurred due to an error made in the course of processing such payments. Accordingly, the following measures had been recommended to prevent the recurrence of similar errors:

1. Steps should be taken to ensure that all payments of the Welfare Benefits Board are processed through the system, and the system should be further developed to facilitate the processing of all such payments through the system.
2. Appropriate guidance and training should be provided to the relevant officers.

3. As the digital system requires further development, the direct intervention, guidance and supervision of the Ministry should be obtained.

(iii) No.

(iv) Not relevant.

(v) Not relevant.

(c) Not relevant.

"අස්වැසුම" සුබසාධක ප්‍රතිලාභීන් තෝරා ගැනීම: අභියාචනා, විරෝධතා සහ සමාලෝචන

அஸ்வெசும நலன்புரி பயனாளிகள் தெரிவு: மேல்முறையீடுகள், ஆட்சேபனைகள் மற்றும் மறுபரிசீலனைகள்

SELECTION OF "ASWESUMA" WELFARE BENEFICIARIES: APPEALS, OBJECTIONS AND REVIEWS

2358/2026

3. ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා
(மாண்புமிகு டப்ளியூ.எச்.எம். தர்மசேன)
(The Hon. W.H.M. Dharmasena)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) 2026 ජූලි 31 දින වන විට "අස්වැසුම" සුබසාධක ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අයදුම්කරුවන්ගේ තොරතුරු යාවත්කාලීන කිරීම සම්පූර්ණ කළ පවුල් සංඛ්‍යාව සහ එය සම්පූර්ණ නොකිරීම හේතුවෙන් ප්‍රතිලාභ අහිමි වූ පවුල් සංඛ්‍යාව දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) දෙවන අදියරේ සුදුසුකම්ලාභී නාම ලේඛන සම්බන්ධයෙන් ලැබී ඇති අභියාචනා හා විරෝධතා සංඛ්‍යාව, ඉන් විභාග කර අවසන් කර ඇති සංඛ්‍යාව සහ මුල් තීරණය සංශෝධනය වූ අවස්ථා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) දෝෂ සහිත දත්ත හේතුවෙන් සුදුසුකම් නොලබන පවුල් ප්‍රතිලාභ ලබා ඇති සහ සුදුසුකම් සහිත පවුල් සඳහා ප්‍රතිලාභ අහිමි වූ බවට හඳුනා ගෙන ඇති අවස්ථා සංඛ්‍යාව කොපමණද;

(v) සුදුසුකම් නොලැබූ පවුල් සඳහා ප්‍රතිලාභ ලබා දීම හේතුවෙන් සිදුවී ඇති රාජ්‍ය මූල්‍ය පාඩුව කොපමණද;

(vi) වත්මන් නිර්ණායක සංශෝධනය කර නව නිර්ණායක යටතේ ප්‍රතිලාභීන් තෝරා ගැනීම සම්බන්ධයෙන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාව ලබා දුන් උපදෙස් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2026 யூலை 31ஆம் திகதியளவில் 'அஸ்வெசும' நலன்புரி பயனாளிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி விண்ணப்பதாரர்களின் தகவல்களை இற்றைப்படுத்தும் செயன்முறையைப் பூர்த்தி செய்துள்ள குடும்பங்களின் எண்ணிக்கையும், அதனைப் பூர்த்தி செய்யாத காரணத்தால் நலன்புரி பயன்களை இழந்துள்ள குடும்பங்களின் எண்ணிக்கையும் மாவட்ட வாரியாக வெவ் வேறாக யாது என்பதையும்;

(iii) தகுதிப் பட்டியலின் இரண்டாம் கட்டம் தொடர்பாகக் கிடைக்கப்பெற்றுள்ள மேன்முறையீடுகள் மற்றும் ஆட்சேபனைகளின் எண்ணிக்கையும், அவற்றுள் விசாரணை செய்து நிறைவு செய்யப் பட்டவற்றின் எண்ணிக்கையும், முதலில் எடுக்கப்பட்ட தீர்மானம் திருத்தப்பட்ட சந்தர்ப்பங்களின் எண்ணிக்கையும் வெவ்வேறாக யாது என்பதையும்;

(iv) பிழையான தரவுகள் காரணமாக தகைமையற்ற குடும்பங்கள் நலன்புரி பயன்களைப் பெற்றுள்ளதென மற்றும் தகைமையுடைய குடும்பங்கள் நலன்புரி பயன்களை இழந்துள்ளதென அடையாளம் காணப்பட்ட சந்தர்ப்பங்களின் எண்ணிக்கை யாது என்பதையும்;

(v) தகைமையற்ற குடும்பங்களுக்கு நலன்புரி பயன்களை வழங்கியதன் காரணமாக அரச நிதியில் ஏற்பட்ட இழப்பு யாது என்பதையும்;

(vi) தற்போதைய அளவுகோல்களைத் திருத்தம் செய்து புதிய அளவுகோல்களின்கீழ் பயனாளர் களைத் தெரிவு செய்வது தொடர்பில் அரசாங்க நிதி பற்றிய குழு வழங்கிய அறிவுறுத்தல்களை நடைமுறைப்படுத்துதல் பற்றிய முன்னேற்றம் யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House the -

(i) number of "Aswesuma" welfare beneficiaries, as at 31st July, 2026;

(ii) number of families who have completed the updating of information of their applicants and the number of families who have lost benefits due to non-completion of the same, separately by district;

(iii) number of appeals and objections received regarding the list of eligible beneficiaries in the second phase, the number of such appeals and objections that have been fully inquired into, and the number of instances where the initial decision was amended, separately;

(iv) number of instances identified where ineligible families received benefits and eligible families were deprived of benefits due to erroneous data;

(v) public financial loss incurred by the State due to the provision of benefits to ineligible families; and

[ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා]

(vi) progress made in implementing the directives issued by the Committee on Public Finance regarding the selection of beneficiaries under new criteria following amendments to the existing criteria?

(b) If not, why?

ගරු අනුර කුමාර දිසානායක මහතා (ජනාධිපතිතුමා, ආරක්ෂක අමාත්‍ය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය සහ ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමා)
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க - சனாதிபதியும் பாதுகாப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரும் டிஜிட்டல் பொருளாதார அமைச்சரும்)
(The Hon. Anura Kumara Dissanayake - President, Minister of Defence, Minister of Finance, Planning and Economic Development and Minister of Digital Economy)

(අ) (i) අදියර i - 1,012,812
අදියර ii - 211,647
මුළු එකතුව - 1,224,459

(ii) තොරතුරු යථාවත් කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කර නොමැති බැවින්, ප්‍රතිලාභ අහිමි වූ පවුල් සංඛ්‍යාව නිශ්චිතව මේ අවස්ථාවේදී කිව නොහැකිය.

(iii)

- අභියාචනා සංඛ්‍යාව - 53,582
- විරෝධතා සංඛ්‍යාව - 4,668
- ඉන් විභාග කර අවසන් කර ඇති සංඛ්‍යාව - 58,250
- මුල් තීරණය සංශෝධනය වූ අවස්ථා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන්,

අභියාචනා හා විරෝධතා ක්‍රියාවලිය පෙර මට්ටම්	ලද අභියාචනා හා විරෝධතා සංඛ්‍යාව	අභියාචනා හා විරෝධතා පරීක්ෂාවෙන් පසු තීරණය වෙනස් නොවූ ගණන	අභියාචනා හා විරෝධතා පරීක්ෂාවෙන් පසු තීරණය වෙනස් වූ ගණන
තෝරාගෙන නොමැති	29,103	20,693	8,410
අන්ත දුප්පත්	1,763	1,602	161
දුප්පත්	4,238	3,400	838
අවදානමට ලක්වූ	2,688	1,714	974
සංක්‍රාන්තික	11,939	5,943	5,996
එකතුව	49,731	33,352	16,379

අභියාචනා හා විරෝධතා පරීක්ෂාවෙන් පසු තීරණය වෙනස් වූ පිරිස් අයත් මට්ටම් සවිස්තරාත්මකව **ඇමුණුම*** මඟින් ඉදිරිපත් කර ඇත.

දැනට විභාග කර අවසන් සංඛ්‍යාව වන 58,250 අතරින්, මෙම වාර්තාවේදී සලකා බලනුයේ දත්ත පිළිගන්නා ලද (Data accepted) 49,731ක ප්‍රමාණය පමණි. කමිටුව විසින් සමාජ ආරක්ෂණ තොරතුරු ලේඛනයෙන් හෝ අස්වැසුම ලේඛනයෙන් ඉවත් කරන ලද සංඛ්‍යාව ඊට ඇතුළත් නොකෙරේ.

(iv) දැනට එවැනි අවස්ථා සංඛ්‍යාවක් හඳුනාගෙන නොමැති අතර, තොරතුරු යථාවත් කිරීමෙන් අනතුරුව කරනු ලබන විගණන විමසුමකින් පසුව ඉහත සංඛ්‍යාව නිවැරදිව දැක්විය හැකිය.

(v) දැනට එවැනි අවස්ථා සංඛ්‍යාවක් හඳුනාගෙන නොමැති අතර, තොරතුරු යථාවත් කිරීමෙන් අනතුරුව කරනු ලබන විගණන විමසුමකින් පසුව ඉහත සංඛ්‍යාව නිවැරදිව දැක්විය හැකිය.

(vi) 2025 නොවැම්බර් 12වන දින පැවති පාර්ලිමේන්තුවේ කාරක සභාව ලබා දුන් නිර්දේශයට අනුව, පස් දෙනෙකුගෙන් සමන්විත විද්වත් කමිටුවක් පත් කර ඇත.

එම විශේෂඥ කමිටුව මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක (සභාපති), මහාචාර්ය සීතා බණ්ඩාර (සාමාජික), ආචාර්ය හේරත් ගුණතිලක (සාමාජික) සහ ආචාර්ය පුලස්ති අමරසිංහ (සාමාජික) යන අයගෙන් සමන්විත වේ.

එම කමිටුව විසින් දැනට පවතින ආකෘතිය හා බර තැබීමේ ක්‍රමය සමාලෝචනය කර අවදානම මත පදනම් වූ ඉලක්කගත කිරීමේ සහ නැවත සහතික කිරීමේ ක්‍රමවේදය (Vulnerability- Based Targeting and Recertification System - VTRS) නමින් සංශෝධිත ක්‍රමවේදයක් යෝජනා කරන ලදී. එම ක්‍රමවේදය පිළිබඳව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (DCS), ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව (NPD), සහ ලෝක බැංකුව (World Bank) යන ආයතන සමඟ වැඩිදුර සාකච්ඡාකොට අදහස් හා යෝජනා ලබා ගන්නා ලදී. ඒ අනුව නියමු අධ්‍යයනයක් මඟින් මේ ක්‍රමවේදයේ ඇති යෝග්‍යතාව පිළිබඳව තහවුරු කර ගැනීමට තීරණය වී ඇත. ඒ අනුව එම යෝජිත නියමු අධ්‍යයන ඉදිරියට ගෙන යාම සඳහා 2026 ජූනි 09වන දින මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ඉල්ලා ඇත. ඒ අනුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේද එකඟතාව සහ සහාය ඇතිව නියමු පරීක්ෂාවක් සිදු කිරීමට තීරණය කර ඇති අතර, එම තීරණය මත ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය. අනතුරුව මෙම නියමු අධ්‍යයනයෙන් පසුව නිර්ණායක, ලකුණු ලබා දීමේ ක්‍රමවේදය, මෙහෙයුම් නිර්වචන, ක්ෂේත්‍ර මට්ටමේ ප්‍රායෝගික භාවිතය, දත්ත රැස් කිරීමේ ක්‍රියාවලිය හා ඇතුළත්වීමේ හා බැහැරවීමේ දෝෂ පරීක්ෂා කිරීමට අපේක්ෂා කෙරේ. අනතුරුව අනාගත ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී හා නැවත සහතික කිරීමේදී වඩාත් යෝග්‍ය ක්‍රමවේදය කුමක්ද යන්න තීරණය කර පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට නියමිතය.

(ආ) අදාළ නොවේ.

(அ) (i) கட்டம் i - 1,012,812
கட்டம் ii - 211,647
மொத்தக் கூட்டுத்தொகை - 1,224,459

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

(ii) தகவல்களை நாளதுவரைப்படுத்தும் செயன் முறை முழுமைப்படுத்தப்படவில்லை என்பதால், நன்மைகளை இழந்த குடும்பங்களின் எண்ணிக் கையை இச்சந்தர்ப்பத்தில் உறுதியாகக் கூற முடியாது.

(iii)

- மேன்முறையீடுகளின் எண்ணிக்கை - 53,582
- ஆட்சேபனைகளின் எண்ணிக்கை - 4,668
- அவற்றில் பரிசீலித்து முடிக்கப்பட்டுள்ள எண்ணிக்கை - 58,250

மேன்முறையீடுகள் மற்றும் எதிர்ப்புகள் செயன்முறைக்கு முந்திய மட்டங்கள்	**கிடைக்கப் பெற்ற மேன்முறை யீடுகள் மற்றும் ஆட்சேபனை களின் எண்ணிக்கை**	**மேன்முறை யீடுகள் மற்றும் ஆட்சேபனை களின் பின்னர் தீர்மானம் மாறாத தொகை**	**மேன்முறை யீடுகள் மற்றும் ஆட்சேப னைகள் பரிசீலனை யின் பின்னர் தீர்மானம் மாற்ற மடைந்த தொகை**
தெரிவு செய்யப்படாதவை	29,103	20,693	8,410
அதி தீவிர வறுமை நிலை	1,763	1,602	161
வறுமை நிலை	4,238	3,400	838
பாதிப்புக் குள்ளானோர்	2,688	1,714	974
இடைநிலை (இடைப்பட்டோர்)	11,939	5,943	5,996
மொத்தக் கூட்டுத்தொகை	**49,731**	**33,352**	**16,379**

மேன்முறையீடுகள் மற்றும் ஆட்சேபனைகள் பரிசீலனையின் பின்னர் தீர்மானம் மாற்றப் பட்ட தரப்பினர் சார்ந்த மட்டங்கள் விபரமாக ***இணைப்பு** ஊடாகச் சமர்ப்பிக்கப்படு கின்றது.

இதுவரை முடிக்கப்பட்ட தேர்வுகளின் எண்ணிக்கை 58,250இல், இவ்வறிக்கையில் கவனத்திற்கொள்ளப்படுவது தரவு ஏற்றுக் கொள்ளப்பட்ட (Data Accepted) 49,731 என்ற அளவு மட்டுமே ஆகும். குழுவால் சமூகப் பாதுகாப்புத் தகவல் பதிவேட்டி லிருந்தோ அல்லது அஸ்வெசும பதிவேட்டி லிருந்தோ அகற்றப்பட்ட எண்ணிக்கை இதில் உள்ளடக்கப்படவில்லை.

(iv) தற்போது அத்தகைய சந்தர்ப்பங்களின் எண்ணிக்கை அடையாளம் காணப்படவில்லை என்பதுடன், தகவல்களை நாளதுவரைப்படுத்தப் பட்டதன் பின்னர் மேற்கொள்ளப்படும் கணக்காய்வு வினாக்களுக்குப் பின்னர் மேற்படி எண்ணிக்கையைத் துல்லியமாகக் காட்டமுடியும்.

(v) தற்போது அத்தகைய சந்தர்ப்பங்களின் எண்ணிக்கை அடையாளம் காணப்படவில்லை என்பதுடன், தகவல்களை நாளதுவரைப்படுத்தப் பட்டதன் பின்னர் மேற்கொள்ளப்படும் கணக்காய்வு வினாக்களுக்குப் பின்னர் மேற்படி எண்ணிக்கையைத் துல்லியமாகக் காட்ட முடியும்.

(vi) 2025 நவம்பர் 12ஆந் திகதி நடைபெற்ற பாராளுமன்றத்தின் குழுவில் வழங்கப்பட்ட பரிந்துரைக்கு அமைவாக, ஐந்து பேரைக் கொண்ட நிபுணர் குழு ஒன்று நியமிக்கப் பட்டுள்ளது. அக்குழு பின்வருமாறு அமைகிறது. அவ்விசேட நிபுணர் குழுவில் பேராசிரியர் லக்ஷ்மன் திஸாநாயக்க (தலைவர்), பேராசிரியர் சீதா பண்டார (உறுப்பினர்), கலாநிதி ஹேரத் குணதிலக்க (உறுப்பினர்), மற்றும் கலாநிதி புலஸ்தி அமரசிங்க (உறுப்பினர்) ஆகியோர் அடங்குவர்.

அந்தக் குழுவால் தற்போதைய மாதிரி மற்றும் கனமான முறையை (ஆய்வு முறைமை) மறுபரிசீலனை செய்து "பாதிப்பு அடிப்படை யிலான இலக்கு வைப்பு மற்றும் மறு சான்றிதழ்ப் படுத்தல் முறைமை" (Vulnerability - Based Targeting and Recertification System - VTRS) எனும் திருத்தப்பட்ட முறைமை ஒன்று முன்மொழியப்பட்டது. அம்முறைமை தொடர் பாக தொகைமதிப்பு மற்றும் புள்ளிவிபரத் திணைக்களம் (DCS) , தேசிய திட்டமிடல் திணைக்களம் (NPD) மற்றும் உலக வங்கி (World Bank) ஆகிய நிறுவனங்களுடன் மேலதிகமாகக் கலந்துரையாடி யோசனைகளும் கருத்துகளும் பெறப்பட்டன. அதற்கமைய முன்னோடி ஆய்வொன்றின்மூலம் இம்முறைமை யின் பொருத்தப்பாட்டை உறுதிப் படுத்திக் கொள்ளத் தீர்மானிக்கப்பட்டுள்ளது.

அதனடிப்படையில், முன்மொழியப்பட்ட முன்னோடி ஆய்வை முன்னெடுத்துச் செல்வதற் காக 2026 யூன் 09ஆம் திகதி நிதி அமைச்சின் செயலாளரின் அனுமதி கோரப்பட்டுள்ளது. அதற்கமைய, தொகை மதிப்பு மற்றும் புள்ளிவிபரத் திணைக்களத்தினதும் உடன்பாடு மற்றும் ஒத்துழைப்புடன் முன்னோடிப் பரிசோதனையொன்றை மேற்கொள்வதற்குத் தீர்மானிக்கப்பட்டுள்ளதுடன், அத்தீர்மானத்தின் மீது மேலதிக நடவடிக்கைகள் மேற்கொள்ளப் படவுள்ளன. அதனைத் தொடர்ந்து இம் முன்னோடி ஆய்வுக்குப் பின்னர் நிபந்தனைகள், புள்ளி வழங்கும் முறைமை, செயற்பாட்டு வரைவிலக்கணங்கள், கள மட்டத்திலான நடைமுறைப் பயன்பாடு, தரவு சேகரிப்புச் செயல்முறை மற்றும் உள்ளடக்கப்படுதல் - விலக்கப்படுதல் பிழைகள் என்பவற்றைப் பரிசோதிக்க எதிர்பார்க்கப்படுகின்றது. பின்னர் எதிர்கால பயனாளிகளைத் தேர்ந்தெடுப்பதிலும் மறு சான்றளிப்பதிலும் மிகவும் பொருத்தமான முறைமை எதுவென்பதைத் தீர்மானித்து பாராளுமன்றத்துக்கு அறிக்கையிடப்படவுள்ளது.

(ஆ) உடன்படாது.

** ළඟිකොළඹයි වගා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

(a) (i) Phase I - 1,012,812

Phase II - 211,647

Total number of beneficiaries - 1,224,459

(ii) Since the process of updating the information has not yet been completed, the number of families who had lost their benefits cannot be specifically determined at this stage.

(iii)

- The number of appeals - 53,582
- The number of objections - 4,668
- The number of appeals and objections that have been fully investigated - 58,250

Beneficiary category prior to Appeal and Objection Process	Number of appeals and objections received	No. of beneficiaries whose selection decision was unchanged following the Appeal and Objection Process	No. of beneficiaries whose selection decision was changed following the Appeal and Objection Process
Unselected	29,103	20,693	8,410
Extremely Poor	1,763	1,602	161
Poor	4,238	3,400	838
Vulnerable	2,688	1,714	974
Transitional	11,939	5,943	5,996
Total	**49,731**	**33,352**	**16,379**

The number of beneficiaries whose selection decision was changed following the Appeal and Objection Process is given with details in the Annex*.

The total number of examinations completed relating to beneficiaries to date is 58,250. This report considers only 49,731 beneficiaries whose data had been accepted. It excluded the beneficiaries who were removed from the Social Protection Register or Aswesuma Register.

(iv) Such instances have not yet been identified and the number of such instances can be accurately determined following an audit investigation to be conducted after completion of the information updating process.

(v) Such instances have not yet been identified, and the number of such instances can be accurately determined following an audit investigation to be conducted after completion of the information updating process.

(vi) Pursuant to the recommendation of the Parliamentary Committee made at its Meeting held on November 12, 2025, an Expert Committee comprising the following five members was appointed: Professor Lakshman Dissanayake (Chairman), Professor Seetha Bandara (Member), Dr. Herath Gunathilaka (Member) and Dr. Pulasthi Amarasinghe (Member).

The Committee reviewed the existing model and weighted criteria and proposed a revised methodology called Vulnerability-Based Targeting and Recertification System (VTRS). After extensive deliberations with the Department of Census and Statistics, the Department of National Planning and the World Bank, views and proposals were obtained. Accordingly, it had been decided to ascertain the appropriateness of this methodology by conducting a pilot study and approval of the Secretary to the Ministry of Finance was sought on June 09, 2026 to proceed with conducting the pilot study. Thus, it was decided to initiate a pilot test with the concurrence and assistance of the Department of Census and Statistics and upon the decision of it, further action will be determined. After the pilot study, it is expected to verify the criteria, the marks awarding procedure, operational definitions, practical use at the field level, data collection process and errors of inclusion and exclusion. Thereafter, the most appropriate methodology for selection and re-verification of beneficiaries in the future will be determined and reported to Parliament.

(b) Not relevant.

---

* *පුස්තකාලයේ තබා ඇත.*

* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

* *Placed in the Library.*

සැ.යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

Contents of Proceedings :

Final set of manuscripts Received from Parliament :

Printed copies dispatched :

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්
මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්
බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.